# පරණ ගිවිසුම්

## සුභාරංචි දහම් ගුරුවරයාගේ නියමු පොත



# පරණ ගිවිසුම

සුභාරංචි දහම් ගුරුවරයාගේ නියමු පොත

ප්‍රකාශනය
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව
සෝල්ට් ලේක් නගරය, යූටා

උපුටාගැනීම
පිටකවරයඃ හන්නා ඇයගේ පුත්‍රයාවූ සාමුවෙල්ව ඒලිට ඉදිරිපත්කරයි, රොබට් ටී. බැරට් විසිනි

© 2006 by Intellectual Reserve, Inc විසින
සියලු හිමිකම් ඇව්රිණි
අමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී

ඉංග්‍රීසි අනුමැතියඃ 1/01
පරිවර්තන අනුමැතියඃ 1/01

Old Testament Gospel Doctrine Teacher’s Manual පරිවර්තනයයි

Sinhala

# පටුන


| පාඩමේ අංකය සහ මාතෘකාව | පිටුව |
|---|---|
| ගුරු උපකාර | v |
| 1 “මේ මාගේ වැඩ සහ මාගේ මහිමයයි” (මෝසස් 1) | 1 |
| 2 “නුඹව තෝරාගත්තේ නුඹ ඉපදීමටත් පෙරය” (ආබ්‍රහම් 3; මෝසස් 4:1–4) | 5 |
| 3 මැවීම (මෝසස් 1:27–42; 2–3) | 9 |
| 4 “මාගේ පාපයන් නිසා මාගේ දෙනෙත් විවෘතවිය” (මෝසස් 4; 5:1–15; 6:48–62) | 12 |
| 5 “නුඹ හොඳින් කටයුතු කලහොත්, නුඹ පිළිගනු ලබන්නෙහිය” (මෝසස් 5–7) | 17 |
| 6 “නෝවා. . .ඔහුගේ නිවැසියන් ගලවාගැනීමට නැවක් සූදානම් කලේය” (මෝසස් 8:19–30; උත්පත්ති 6–9; 11:1–9) | 23 |
| 7 ආබ්‍රහම්ගේ ගිවිසුම (ආබ්‍රහම් 1:1–4; 2:1–11; උත්පත්ති 12:1–8; 17:1–9) | 27 |
| 8 දුෂ්ඨ ලෝකයක ධර්මිෂ්ඨව ජීවත්වීම (උත්පත්ති 13–14; 18–19) | 32 |
| 9 “දෙවියන්වහන්සේ තමන්වහන්සේ විසින්ම බැටළු පැටවෙකු සපයනසේක” (ආබ්‍රහම් 1; උත්පත්ති 15–17; 21–22) | 36 |
| 10 කුළුඳුල් බවේ ආශිර්වාද; ගිවිසුම තුල විවාහය (උත්පත්ති 24–29) | 40 |
| 11 “මම මේ මහත් දුෂ්ඨකම කෙසේ කරම්ද?” (උත්පත්ති 34: 37–39) | 46 |
| 12 “මගේ විපත්තියේ දේශයේදී ඵලදායිවෙයල්ලා” (උත්පත්ති 40–45) | 51 |
| 13 වහල්භාවය, පාස්කුව, සහ නික්මයාම (නික්මයාම 1–3; 5–6; 11–14) | 56 |
| 14 “නුඹලා මාහට විශේෂ වස්තුවක් වන්නෙහුය” (නික්මයාම 15–20; 32–34) | 62 |
| 15 “දෙවියන්වහන්සේ දෙස බලා ජීවත්වන්න” (ගණන්කථාව 11–14; 21:1–9) | 68 |
| 16 “මාගේ ස්වාමීන්වහන්සේගේ වචනය ඉක්මවා යැමට මට නොහැකිය” (ගණන්කථාව 22–24; 31:1–16) | 73 |
| 17 “නුඹ සිහිනැති නොකරන්ට බලාගනින්න” (ද්වීතීය කථාව 6; 8; 11; 32) | 77 |
| 18 “ශක්තිමත්ව ධෛර්‍යමත්ව සිටපන්න” (යොෂුවා 1–6; 23–24) | 82 |
| 19 විනිශ්චයකරුවන්ගේ රාජ්‍ය පාලනය (විනිශ්චයකාරයන්ගේ පොත 2; 4; 6–7; 13–16) | |
| 20 “මාගේ නුවර සියලු මනුෂ්‍යයෝ. . නුඹ සුශීලවත් ස්ත්‍රියක් බව දනිති” (රැත්; 1 සාමුවෙල් 1) | 92 |
| 21 දෙවියන්වහන්සේට ගෞරව කරන්නන්ට උන්වහන්සේ ගෞරව කරනසේක (1 සාමුවෙල් 2–3; 8) | 96 |
| 22 “ස්වාමීන්වහන්සේ සිත බලනසේක” (1 සාමුවෙල් 9–11; 13; 15–17) | 101 |
| 23 “ස්වාමීන්වහන්සේ සැම කල්හිම නුඹත් මාත් අතරේ වෟවටිනසේක” (1 සාමුවෙල් 18–20; 23–24) | 107 |
| 24 “පවිත්‍ර සිතක් මා තුළ මැවුව මැනව” (2 සාමුවෙල් 11–12; ගීතාවලිය 51) | 111 |
| 25 “පණ ඇති සියල්ලෝම ස්වාමීන්ට ප්‍රශංසා කෙරෙත්වා” (ගීතාවලිය) | 117 |
| 26 සාලමොන් රජු: ඥානවන්ත මිනිසා, අඥානවන්ත මිනිසා (1 රාජාවලිය 3; 5–11) | 123 |

| | | |
|---|---|---|
| 27 | දුෂ්ඨ සහ ධර්මිෂ්ඨ නායකයන්ගේ බලපෑම (1 රාජාවලිය12–14; 2 කොරොන් 17; 20) | 128 |
| 28 | "ගින්නෙන් පසු සියුම් නිශ්චලතාවයේ හඬක් විය" (1 රාජාවලිය 17–19) | 134 |
| 29 | "එලියාගේ බලය...ඔහු ගත්තේය" (2 රාජාවලිය 2; 5–6) | 139 |
| 30 | "ස්වාමීන්වහන්සේගේ ගෘහයට පැමිණෙන්න" (2 ලේකම් 29–30; 32; 34) | 144 |
| 31 | "ප්‍රඥාව සොයාගන්නා මනුෂ්‍යයා වාසනාවන්තය" (හිතෝපදේශ සහ දේශනාකාරයා) | 151 |
| 32 | "මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බව මම දනිමි" (යෝබ් 1–2; 13; 19; 27; 42) | 157 |
| 33 | ලෝකයා සමග සුභාරංචිය බෙදාගැනීම (යෝනා1–4; මීකා 2; 4–7) | 162 |
| 34 | "ධර්මිෂ්ඨකමින් මම නුඹ සරණ පාවාගන්නෙමි" (හොෂෙයා 1–3; 11; 13–14) | 166 |
| 35 | දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන්ට උන්වහන්සේගේ රහස් එළිදරව්කරනසේක. (ආමොස් 3; 7–9; යෝවෙල් 2–3) | 170 |
| 36 | සයෝනයේ තේජස රක්ෂස්ථානයක් වන්නේය (යෙසායා 1–6) | 175 |
| 37 | "ඔබ පුදුම දේවල් කර ඇත" (යෙසායා 22; 24–26; 28–30) | 179 |
| 38 | "මා ඇර වෙන ගැලවුම්කාරයෙක් නැත" (යෙසායා 40–49) | 183 |
| 39 | "පාද කඳු මත කොපමණ අලංකාරද" (යෙසායා 50–53) | 187 |
| 40 | "නුඹේ කූඩාරම තිබෙන ස්ථානය විශාල කරපන්න" (යෙසායා 54–56; 63–65) | 190 |
| 41 | "අද දින මම නුඹව...යකඩ කුළුනක් කළෙමි" (යෙරමියා1–2; 15; 20; 26; 36–38) | 194 |
| 42 | "මම ඒක ඔවුන්ගේ සිත්වල ලියමි" (යෙරමියා 16; 23; 29; 31) | |
| 43 | ඉශ්‍රායෙල් එඬේරුන් (එසකියෙල් 18; 34; 37) | 201 |
| 44 | "ගංගාව ගලන කොතැනක නුමුත් ඉන්න සියල්ලන් ජීවත්ව සිටිනවා ඇත" (එසකියෙල් 43–44; 47) | 207 |
| 45 | "මා නැතිවුනොත්, නැතිවුනාවේ" (දානියෙල් 1; 3; 6; එස්තර් 3–5; 7–8) | 211 |
| 46 | "කිසිකලෙක නැති නොවන්නාවූ රාජ්‍යයක්" (දානියෙල් 2) | 216 |
| 47 | "අපි නැගිට ගොඩනගමු" (එස්රා 1–8; නෙහෙමියා 1–2; 4; 6; 8) | 220 |
| 48 | "ස්වාමීන්වහන්සේගේ මහත්වූ භයානක දවස" (සෙකරියා 10–14;මලාකි) | 225 |

# ගුරු උපකාර

ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිතුමා මෙසේ කීවේය: "ඔබ "ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීමෙන්" රාජකාරියකට වඩා බොහෝ සේ යම් තෘප්තියක් ලබන බව මම බලාපොරොත්තු වෙමි; ඒ වෙනුවට එය දෙවියන්වහන්සේගේ වචනය සමග ආදර සම්බන්ධතාවයක් බවට පත්වනු ඇත. ඔබ කියවන විට, ඔබගේ සිත් ආලෝකමත්වී ඔබගේ ආත්මය උසස්වනු ඇත" ("The Light within You," *Ensign*, මැයි 1995, 99).

සුභාරංචි දහම උගන්වන ගුරුවරයෙකු වශයෙන්, ඔබගේ පංතියේ සාමාජිකයන්ට පරණ ගිවිසුම ඉගෙනගෙන එයට ආදරය කිරීමට සහ හින්ක්ලි සභාපතිතුමා පොරොන්දුවූ ආලෝකය සොයාගැනීමට උපකාර කිරීමට ඔබට ප්‍රස්ථාවක් ඇත. ඔබ උගන්වන විට, ශුද්ධ ලියවිලිවලට ආදරය කරමින් ඒවා යොදාගෙන තම ගෝලයන්ට ඉගැන්වූ, ගැලවුම්කරුවාණන්ගේ ආදර්ශය ඔබ අනුගමනය කරනු ඇත.

යේසුස්වහන්සේ උත්ථානවූ පසුවම වාගේ, ගෝලයන් දෙදෙනෙකුට බලවත් සත්‍යයන් දෙකක් ඉගැන්වීමට උන්වහන්සේ ශුද්ධ ලියවිලි යොදාගත්සේක. ක්ලෙයෝපාස් නම් ගෝලයෙක් සහ ඔහුගේ සහායකයෙක් එම්මාවුස් බලා දිවෙන මාවතේ ගමන්කරමින්, යේසුස්වහන්සේගේ ශරීරය සොහොන්ගෙයි තවදුරටත් නොමැතිබවට ඔවුන් ඇසූ දේ ගැන සාකච්ඡාකරමින් ගියෝය. ඔවුන් ගමන්කරමින් සිටියදී යේසුස්වහන්සේ ඔවුන්ට සම්බන්ධවූවද, ඔවුහු උන්වහන්සේව හඳුනා නොගත්හ. ඔවුන් කථාකරන දෙය කුමක්ද කියාත්, ඔවුන් ශෝකීව සිටින්නේ මන්ද කියාත්, උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ විට, කුරුසප්ප්‍රාප්තිය සහ උත්ථානය ගැන ඔවුහු උන්වහන්සේට කීහ. යේසුස්වහන්සේ මෙය ඇසූ විට, "උන්වහන්සේ තමන් පිළිබඳව ශුද්ධ ලියවිලිවල සඳහන් සියල්ලම ඔවුන්ට තෝරා දුන්සේක." (ලූක් 24:27).

ක්ලෙයෝපාස් සහ ඔහුගේ සහායකයා ඔවුන් සමග නවතින ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටියහ. තවද ඔවුන් කෑමට හිඳගත් විට, ඔවුහු උත්ථානවූ ස්වාමීන්වහන්සේ ලෙස උන්වහන්සේව හඳුනාගත්හ. උන්වහන්සේ ඉන්පසුව ඔවුන්ට නොපෙනී ගියසේක. ඔවුන් එකිනෙකාට කථාකර ගනිමින්, "උන්වහන්සේ අප සමග මඟදී කථාකල කල්හිත්, ලියවිලි අපට තෝරාදුන් කල්හිත්, අපගේ සිත් දැවා නොවේද?" යයි කීහ. (ලූක් 24:32).

ගෝලයන්ගේ සිත් දැවීමට සැලැස්වූ ශුද්ධ ලියවිලි පැමිණියේ මෝසස්ගේ පොත්වල සහ ශුද්ධ ලියවිලිවලින්ය—ඒවා පරණ ගිවිසුම නමින් අප දන්නා ශුද්ධ ලියවිලිය. ඔබ මෙම පූජනීයවූ සත්‍යයන් එලෙසම උගන්වන විට, ශුද්ධාත්මයාණන් වහන්සේ ක්ලෙයෝපාස් සහ ඔහුගේ සහායකයාට කලාක් මෙන් එහි සත්‍යතාවය පිළිබඳව ඔබගේ පංතියටද සාක්ෂිදරනු ඇත.

පරණ ගිවිසුම අධ්‍යයනය කිරීම මගින් ගැලවුම්කරුවාණන් ගැන සහ සුභාරංචිය අනුව ජීවත්වීමට පංති සාමාජිකයන් දුන් ඔවුන්ගේ පොරොන්දුද ශක්තිමත් විය යුතුය. ආත්මයාණන් මගින් අධ්‍යයනය කිරීමෙන්, පංති සාමාජිකයන්ට යෝබ් මෙන් මෙලෙස සාක්ෂි දැරීමට හැකිවිය යුතුය. "එහෙත් මාගේ මිදුම්කරුවාණන් ජීවත්ව සිටින බවද, අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට සිටින බවද මම දනිමි" (බලන්න යෝබ් 19:25).

**ආත්මයාණන් මගින් ඉගැන්වීම**

සුභාරංචි දහම් පංතියට ඉගැන්වීමට සූදානම්වීමේදී, ඔබ ස්වාමීන්වහන්සේගේ ආනුභාවය සහ ආත්මික මග පෙන්වීම සෙවීම වැදගත්වේ. ඇදහිල්ලේ යාච්ඤාව මගින් අත්මයාණන්වහන්සේ නුඹට දෙනු ලබන්නේය (බලන්න ධ්‍යසහයී 42:14). ඔබගේ පංතියේ ගුරුවරයා ශුද්ධාත්මයාණන්වහන්සේ බව මතකතබා ගන්න.

ඔබ ආත්මයාණන් සොයන මාර්ගය වන්නේ, යාච්ඤාව, උපවාසය, දිනපතා ශුද්ධ ලියවිලි අධ්‍යයනය සහ පණත්වලට කීකරුවීම තුලින්ය. පංතිය සඳහා සූදානම්වීමේදී ශුද්ධ ලියවිලි සහ පංති සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් ඔබට තේරුම්ගැනීමට ආත්මයාණන් සඳහා යාච්ඤාකරන්න. ශුද්ධ ලියවිලි සාකච්ඡාකරමින්, වර්තමානයට ඒවා අර්ථවත් අන්දමින් යොදාගැනීමට සැලසුම්කිරීමට ඔබට උපකාරවත්වීමටද ආත්මයාණන්ට පුළුවන (1 නිෆායි 19:23).

ඔබගේ පංතියට ආත්මයාණන්ට ආරාධනාකිරීම පිළිබඳ යෝජනා කිහිපයක් පහත දැක්වේ:

1. පාඩම ආරම්භයේදීම මෙන්ම අවසානයේදීද යාච්ඤා කිරීමට පංති සාමාජිකයන්ට ආරාධනා කරන්න. පංති කාලයේදී, ඔබට මග පෙන්වීමට, පංති සාමාජිකයන්ගේ හදවත් පාඩමට සූදානම් කිරීමට, සහ සාක්ෂිදැරීමට සහ ප්‍රබෝධකිරීමට ඔබගේ හදවතින් යාච්ඤාකරන්න.
2. ශුද්ධ ලියවිලි පාවිච්චිකරන්න. (පහත සඳහන් "ශුද්ධ ලියවිලිවලට යොමුවීම" බලන්න).
3. පාඩම අවසානයේදී පමණක්ම නොව, ආත්මයාණන් ඔබව පොළඹවන හැම අවස්ථාවකදීම, සාක්ෂි දරන්න. පංති සාමජිකයන්ගේ සාක්ෂිය දැරීමට ඔවුන්ට නිතරම ආරාධනාකරන්න.
4. ආත්මයාණන් හැඟීමට පංති සාමාජිකයන් සූදානම්කිරීම සඳහා, ගීතිකා, ප්‍රාථමික ගීත, සහ වෙනත් පූජනීය සංගීත අංග යොදාගන්න.
5. පංති සාමාජිකයන්ට, අන් අයට, සහ ස්වර්ගික පියාණන්ට මෙන්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේටද ප්‍රේමය ප්‍රකාශකරන්න.
6. පාඩමේ මූලධර්මවලට සම්බන්ධ ඔබගේ අවබෝධය, හැඟීම්, සහ අත්දැකීම් බෙදාගන්න. එසේ කිරීමට පංති සාමාජිකයන්ටද ආරාධනාකරන්න. ඉහත පාඩම්වල සාකච්ඡාවූ දේවල් ඔවුන යොදාගත් හෝ ඉගෙනගත් අන්දම ගැනද පංති සාමාජිකයින්ට කිව හැකිය.

---

**ශුද්ධ ලියවිලිවලට යොමුවීම**

සුභාරංචි දහම් පංතියට සූදානම්වීම සඳහා, උනන්දුව සහ යාච්ඤාවෙන් යුතුව ශුද්ධ ලියවිලි අධ්‍යයනය, අවශ්‍යවේ. ස්වාමීන්වහන්සේ මෙසේ අණ කලසේක, "මගේ වචනය ප්‍රකාශකිරීම නොසොයාපල්ලා, නමුත් ප්‍රථමයෙන් මගේ වචනය ලබාගැනීම සොයාපල්ලා." ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීමෙන් ඔබ උන්වහන්සේගේ වචනය ලබාගන්නා විට, ස්වාමීන්වහන්සේ ඔබට මෙසේ පොරොන්දුවනසේක, නුඹගේ දිව ලිහිල් [වන්නේය]; ඉන්පසුව, නුඹ කැමතිවන්නේ නම්, නුඹට මාගේ ආත්මය සහ වචනය, එසේය මිනිසුන්ට ඒත්තුගැන්වීමේ බලය ලැබෙන්නේය (බලන්න ධීසහසී 11:21).

ශුද්ධ ලියවිලි ඉගැන්වීමට මෙම නියමු පොත ඔබට උපකාරත්වන උපකරණයකි. සෑම සතියකම ශුද්ධ ලියවිලි පංතියට රැගෙන ඒමට පංති සාමාජිකයන් දිරිගන්වන්න. ජෝසෆ් ස්මිත්ගේ බයිබල් පරිවර්තනයේ උපුටාගැනීම් බලන්න.

පංති වේලාවේදී, ශුද්ධ ලියවිලිවලින් සාකච්ඡා කරන්න. ඔබගේ අදහස් සහ වෙනත් ශුද්ධ ලියවිලි නොවන තොරතුරු උපකාරක පාවිච්චියේදී ප්‍රඥාවන්තවන්න. ශුද්ධ ලියවිලිවලින් සහ පසු-දවස්වල අනාගතවක්තෘවරුන්ගේ වචන තුලින් ඥානය සහ ආනුභාවය සෙවීමට පංති සාමාජිකයන්ට ඉගැන්විය යුතුය.

හැම සාමාජිකයෙකුටම පරණ ගිවිසුම පංති සාමාජිකයන්ගේ අධ්‍යයන මාර්ගෝපදේශකයා (34592) පිටපතක් ලබාදිය යුතුය. මෙම පොත් පිංච මගින් පංති සාමාජිකයන්ට ශුද්ධ ලියවිලි තේරුම්ගැනීමට, ඒවා යොදාගන්නා අන්දම ගැන සිතාබැලීමට සහ පංති සාකච්ඡාවලට සූදානම්වීමට උපකාරවත්වන සාරාංශයක් සහ උපුටාගැනීම්ද සපයයි. පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනයේදී මෙම අධ්‍යයන මාර්ගෝපදේශකයා පාවිච්චිකිරීමට දෙමාපියන් දිරිගන්වන්න.

---

**පාඩම සකස්කිරීම**

මෙම නියමු පොත ලියා තිබෙන්නේ තරුණ සහ වැඩිහිටි පංතිවලට දහම ඉගැන්වීම සඳහා වන අතර, එය සෑම වර්ෂ හතරකට වරක් පාවිච්චිකල යුතුය. පාඩම් සැලසුම් කිරීම්මේදී වැඩිමනත් තොරතුරුද ඇතුළත්කර තිබෙන බැවින් ඔබට සමහරවිට එක් පංති කාලයක් තුලදී ඉගැන්වීමට නොහැකිවිය හැකිය. පංති සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන්ට වඩා හොඳින් ගැලපෙන ශුද්ධ

ලියවිලි, විස්තර, උපුටාගැනීම් සහ ක්‍රියාකාරකම් තෝරාගැනීමේදී ස්වාමීන්වහන්සේගේ ආත්මයාණන් සොයන්න.

එක් එක් පාඩමට පහත සඳහන් කොටස් ඇතුළත්වේ:

1. අරමුණ. අරමුණ ගැන ප්‍රකාශය මගින් ඔබ පාඩමට සූදානම්ව උගන්වන විට, යොමුවිය යුතු ප්‍රධාන අදහස ඔබට ලබාදෙයි.

2. *සූදානම්වීම.* මෙම අංශයේ පළවෙනි කොටස පාඩම් තොරතුරුවල ශුද්ධ ලියවිලි විස්තර සංක්ෂේපයෙන් දක්වයි. සමහර පාඩම්වල ඇතුළත් අමතර කියවීම්වලින් ඔබට වැඩිදුර අවබෝධයක් ලබාදෙයි. මෙම අංශයේ බොහෝ පාඩම්වල, ඔබ පංතියට ගෙනඒමට අවශ්‍යවන කළමනා වැනි, වෙනත් සූදානම්වීමේ යෝජනාවන්ද ඇතුළත්ව තිබේ.

3. *අවධානශීලී ක්‍රියාකාරකම්.* මෙම අංශයේ ඇතුළත්ව තිබෙන්නේ, සරළ ක්‍රියාකාරකම්, ද්‍රව්‍ය පාඩම්, හෝ පංති සාමාජිකයන්ට ඉගෙනගැනීමට සූදනම්වීම, සහභාගිවීම සහ ස්වාමීන්වහන්සේගේ බලය අත්විදීමට උපකාරවත්වන ප්‍රශ්නය. ඔබ පාවිච්චිකරන්නේ නියමු පොතේ එන අවධානශීලී ක්‍රියාකාරකම් හෝ ඔබගේම යමක් වුවද, වැදගත්වන්නේ පාඩම ආරම්භයේදීම පංති සාමාජිකයන්ගේ අවධානය යොමුකර ගැනීමය. ක්‍රියාකාරකම් කෙටි විය යුතුය.

4. *ශුද්ධ ලියවිලි සාකච්ඡා සහ ඒවා යොදාගැනීම.,* පාඩමේ ප්‍රධාන කොටස වන්නේ මෙයයි. ශුද්ධ ලියවිලි විස්තර යාච්ඤාවෙන් යුතුව කියවීමෙන් ඔබට ඒවා සාර්ථකව උගන්වා සාකච්ඡාකල හැකිය. ඔබ උගන්වන ක්‍රමය වෙනස්කරමින්, පංති සාමාජිකයන්ගේ සැලකිල්ල පවත්වාගෙන යාමට (පහතසඳහන්) "ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ උපකාර" වල යෝජනා පාවිච්චිකරන්න.

5. *අවසන්කිරීම.* මෙම අංශය ඔබට පාඩම සංක්ෂේපකරමින් ඔබ සාකච්ඡාකල මූලධර්මවලට අනුකූලව ජීවත්වීමට පංතිසාමජිකන් දිරිගැන්වීමට ඔබට උපකාරවත් වෙයි. ඔබගේ සාක්ෂිය දැරීමටද එමගින් ඔබට සිහිපත්කරයි. හැම පාඩමක්ම අවසන්කිරීමට අවශ්‍ය කාලය ඉතිරිකිරීමට වගබලාගන්න.

6. *ඉගැන්වීමේ අමතර අදහස්.* මෙම අංශයට ඇතුළත් වන්නේ, ශුද්ධ ලියවිලි විස්තරවල අමතර සත්‍යයන්, ඉගැන්වීමේ අමතර ක්‍රම, ක්‍රියාකාරකම් සහ පාඩමේ ව්‍යුහය එක්කරන වෙනත් යෝජනාය. පාඩම්වල කොටසක් ලෙස මේවා පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවනු ඇත.

---

## ශුද්ධ ලියවිලි ඉගැන්වීම සඳහා උපකාර

ශුද්ධ ලියවිලි විස්තර වඩාත් සාර්ථක ලෙස සහ විශාල ලෙස විවිධාකාරව ඉගැන්වීම සඳහා පහත සඳහන් යෝජනා පාවිච්චිකරන්න.

1. පරණ ගිවිසුමේ අනාවැකි කී පරිදි, පරණ ගිවිසුමේ යෙහෝවාවහන්සේවන, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, උන්වහන්සේගේ උත්පත්තිය, මැරෙන සුළු දිවියේ මෙහෙය, දෙවන පැමිණීම, සහ සහස්‍රයේ රාජ්‍ය පාලනය ගැන ශුද්ධ ලියවිලිවල උගන්වන දේවල් තේරුම්ගැනීමට පංති සාමාජිකයන්ට උපකාරකරන්න.

2. ශුද්ධ ලියවිලි කොටස් පංති සාමාජිකයන්ගේ ජීවිතවලට අදාළකර ගතහැකි නිශ්චිත මාර්ග ගැන සිතා ඒවා බෙදාගැනීමට ඔවුන්ට කියන්න.

3. දහමට අමතරව, පරණ ගිවිසුමේ එන කථාන්තර, විශේෂයෙන්ම ඇදහිල්ල ගැන කථාන්තර, අවධාරනය කර, පංති සාමාජිකයන් ඒවා තේරුම්ගෙන, ඒවා අදාළකර ගන්නා ක්‍රම සාකච්ඡා කිරීම ගැන සහතික කරගන්න.

4. ශුද්ධ ලියවිලි කොටසක නිතරම එන වචන, වාක්‍ය කණ්ඩ හෝ අදහස් හෝ තමන්ට ඒවාවල ඇති විශේෂ වැදගත්කම සොයාබැලීමට පංති සාමාජිකයන්ට කියන්න.

5. ශුද්ධ ලියවිලි විස්තරවලට සම්බන්ධ යම් වාක්‍ය කණ්ඩ, වැදගත් වචන, හෝ ප්‍රශ්න හුණු ලෑල්ලේ ලියන්න. ඉන්පසුව එම විස්තරය කියන්න, නැතහෙත් සංක්ෂේප කරන්න. පංති සාමාජිකයන්ට වාක්‍ය කණ්ඩ, වැදගත් වචන හෝ ප්‍රශ්නවලට පිළිතුරු ඇසෙන විට, පාඩම නවත්වා ඒවා සාකච්ඡාකරන්න.

6. මෝර්මන්ගේ පොත මුළුල්ලේම, "තවද මෙසේ අපි දකිමු" යන වාක්‍ය කණ්ඩය පාවිච්චිවන්නේ ඉගැන්වූ මූලධර්මවල සංක්ෂේපය හඳුන්වාදීමටය. ශුද්ධ ලියවිලි කොටසක් කියවීමෙන් පසුව, ඉගැන්වූ සුභාරංචි මූලධර්මය පැහැදිළිකිරීම සඳහා, "තවද මෙසේ අපි දකිමු" යන වාක්‍යය සම්පූර්ණකිරීමට පංති සාමාජිකයන්ට කියන්න.

7. පරණ ගිවිසුම මුළුල්ලේම පාවිච්චිවන සංකේත සොයා ඒවා සාකච්ඡාකරන්න. උදාහරණයක් ලෙස, මනාලිය සහ මනාලයා නියෝජනය කරන්නේ ඉශ්‍රායෙල් සහ ගැලවුම්කරුවාණන්ය.

8. ශුද්ධ ලියවිලි එන මිනිසුන් හෝ සිද්ධීන් එකි නෙක හා සංසන්දනය කල හැක්කේ කෙසේදැයි බලන්න. උදාහරණයක් ලෙස, කේන් සහ ආබෙල් සහ ඒනොක් (මෝසස් 5–7); දාවිත් සහ බෙත්සෙබා (2 සාමුවෙල් 11) මිසරයේ යොසෙප් සහ පොතිෆර්ගේ බිරිය (උත්පත්ති 39:7–13); හෝ අනාගතවක්තෘ එලිජා දුෂ්ඨ අහබ් රජු (1 රාජාවලිය 16:29–33; 17–19) සංසන්සඳය කිරීමට ඔබට පුළුවන.

9. පංති සාමාජිකයන් ලවා ශුද්ධ ලියවිලිවල එන විවිධ පුද්ගලයන් ගැන කියවෙන වචන කියවීමට කියවන නාට්‍යයක් මෙහෙයවන්න.

10. පංතිය කුඩා කණ්ඩායම් දෙකකට හෝ ඊට වැඩියෙන් බෙදන්න. ශුද්ධ ලියවිලි විස්තර නැවත බැලීමෙන් පසුව, එම විස්තරයේ ඉගැන්වෙන මූලධර්ම එක් එක් කණ්ඩායම ලවා ලියවන්න. ඉන්පසුව ඔවුන්ගේ ජීවිතවලට එම මූලධර්ම අදාළකරගන්නේ කෙසේදැයි කණ්ඩායම්වලට වාර අනුව සාකච්ඡාකිරීමට සලස්වන්න.

11. ඔබ ඒවා සාකච්ඡාකරන විට ශුද්ධ ලියවිලිවල වැදගත් පද සලකුණුකිරීමට පැන්සලයක් රැගෙන ඒමට පංති සාමාජිකයන්ට ආරාධනාකරන්න.

---

**පංති සාකච්ඡා දිරිමත්කිරීම**

ඔබ සාමාන්‍යයෙන් දේශනා නොපැවැත්විය යුතු නමුත්, ශුද්ධ ලියවිලි අර්ථවත් ලෙස සාකච්ඡාකිරීමට පංති සාමාජිකයන්ට උදව්කරමින් සහභාගිකරගැනීමට ඔබ උත්සාහකල යුතුය. පංති සාමාජිකයන් සහභාගිවන විට, ඔවුහු වඩා සාර්ථක ලෙස ශුද්ධ ලියවිලි ගැන සහ සුභාරංචි මූලධර්ම වඩා හොඳින් අදාළකරගන්නා අන්දමද ඉගෙනගනිති. කුමන ප්‍රශ්නයක් ඇසිය යුතුද, එය වර්ධනය කරන්නේ කෙසේද, කියා තීරණය කිරීමේදී ශුද්ධාත්මයාණන්ගේ මග පෙන්වීම සොයන්න. පංති සාකච්ඡා පදනම්විය යුත්තේ සාමාජිකයන්ට යේසුස්වහන්සේ වෙතට පැමිණ, උන්වහන්සේගේ ගෝලයන් වීමේ ප්‍රතිපත්ති මතය සාකච්ඡා නැවත ඉදිරිපත් කිරීමෙන් මෙම අරමුණු ඉටුවන්නේ නැත.

ශුද්ධ ලියවිලි හරස් පද සපයාදී තිබෙන්නේ, ඔබට සහ පංති සාමාජිකයන්ට ශුද්ධ ලියවිලිවල එන බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු සොයාගැනීමට උපකාර සඳහාය. යම් ප්‍රශ්නවලට පිළිතුරු පංත සාමාජිකයන්ගේ අත්දැකීම් තුලින් ලැබෙනු ඇත.

පාඩම්වල එන සියලුම කරුණු සාකච්ඡාකිරීමට වඩා වැදගත්වන්නේ, පංති සාමාජිකයන්ට ශුද්ධ ලියවිලි වඩා හොඳින් තේරුම්ගෙන, ගෝල තත්වය දියුණුකර ගැනීමට ඔවුන්ව පොළඹවා ඔවුන්ට උදව්කිරීමය. පංති සාමජිකයන් හොඳ සාකච්ඡාවන් මගින් ඉගෙනගන්නේ නම්, එය දිගටම කරගෙන යාම, මුළු පාඩමම උගන්වනවාට වඩා යෝග්‍යවේ.

පංති සාකච්ඡා දිරිමත් කිරීමට පහත සඳහන් උපදෙස් යොදාගන්න:

1. ප්‍රශ්නයක් අසා ඉන්පසුව ශුද්ධ ලියවිලි හරස් පදයක් දෙන්න. එවිට පංති සාමාජකයන්ට පිළිතුරු සොයාගත හැකිය.

2. ඔව් හෝ නැත යන පිළිතුරු ලැබෙන ප්‍රශ්න වෙනුවට, සාකච්ඡාවලට යොමුවන ප්‍රශ්න අසන්න. සාකච්ඡා දිරිමත්කිරීම සඳහා සාමාන්‍යයෙන් වඩාත් සාර්ථකවන්නේ, මන්ද, කෙසේද, කවුද, මොකක්ද, සහ කොහේද යනුවෙන් ආරම්භවන ප්‍රශ්නය.

3. ශුද්ධ ලියවිලිවලින් පංති සාමාජිකයන් ඉගෙනගන්නා දේවල් ගැන ඔවුන්ගේ හැඟීම් බෙදාගැනීමට ඔවුන්ව දිරිගන්වන්න. එසේම ආත්මික මූලධර්ම ජීවිතයට අදාළකරගන්නේ කෙසේදැයි පෙන්වන අත්දැකීම් බෙදාගැනීමට ඔවුන්ව දිරිගන්වන්න. ඔවුන්ගේ දායකත්වය ගැන සුභවාදී අදහස් පළකරන්න.

4. එක් එක් පංති සාමාජිකයාගේ අවශ්‍යතාවයන් ගැන සංවේදීවන්න. පංති සාමාජිකයන් සියල්ලෝම පංති සාකච්ඡාවලට සහභාගිවීමට දිරිගැන්විය යුතු වුවද, සමහරෙක් ප්‍රතිචාර දැක්වීමට පසුබට විය හැකිය. ඔවුන් සමග පෞද්ගලිකව කථාකර කියවීමට හෝ පංතියට සහභාගිවීම ගැන ඔවුන්ගේ හැඟීම් සොයාගැනීමට ඔබ කැමතිවිය හැකිය. අපහසුතාවයකට පත්විය හැකි පංති සාමාජිකයන් නොකැඳවීමට ප්‍රවේශම්වන්න.

5. පවරන ලද ශුද්ධ ලියවිලි විස්තර සහ පරණ ගිවිසුම *පංති සාමාජික අධ්‍යයන මාර්ගෝපදේශකය* (34592) අධ්‍යයනය කිරීමෙන් පංතියට සූදානම්වන ලෙස, පංති සාමාජිකයන් දිරිමත්කරන්න. ඔවුන් සූදානම්ව සිටින්නේ නම්, සාකච්ඡාවලට සහභාගිවීමට ඔවුන්ට හොඳින් හැකියාව ලැබෙනු ඇත. ශුද්ධ ලියවිලි පාඨ සහ පාඩම් ඔවුන්ගේ පවුල් සමග සාකච්ඡාකරන මෙන් පංති සාමාජිකයන්ට යෝජනා කරන්න.

# “මේ මාගේ වැඩ සහ මාගේ මහිමයයි”

# 1 වෙනි පාඩම

*මෝසස් 1*

---

**අරමුණ**

(1) අපි දෙවියන්වහන්සේගේ දරුවන් බවත්, (2) අපට සාතන්ගේ පරීක්ෂාවන්ට විරුද්ධවිය හැකි බවත්, සහ (3) දෙවියන්වහන්සේගේ වැඩකටයුතු අපගේ අමරණීයත්වය සහ සදාකාලික ජීවනය ලබාදීමට බවත් තේරුම්ගැනීමට පංති සාමාජිකයන්ට උපකාර කිරීමය.

---

**සූදානම්වීම**

1. අනගි මුතුඇටය පොතේ එන පහත සඳහන් සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.

   අ. මෝසස් 1:1–11. මෝසස් දෙවියන්වහන්සේව දැක මුහුණට මුහුණ කථාකරයි. තමා පියාණන් වහන්සේගේ ඒක ජාතකයාණන්ට සමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයෙකු බව මෝසස් දැනගනියි. සටහනඃ මෙම දර්ශනය තුලින් මෝසස්ට ප්‍රකාශවුන යෙහෝවාවහන්සේ, ස්වර්ගික පියාණන්වහන්සේ නොවන බව පංති සාමාජිකයන් තේරුම්ගත යුතුය. යෙහෝවාවහන්සේ මරණයට පෙර ජීවිතයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ පරණ ගිවිසුමේ දෙවියන්වහන්සේ වනසේක. උන්වහන්සේ අරමුණක් ඇතිව සහ බලය සහ අධිකාරීබලයෙන් පියාණන්වහන්සේව නියෝජනය කිරීමට උන්වහන්සේ සමග සිටි තැනැත්වහන්සේ කෙනෙක් වනසේක. උන්වහන්සේගේ වචන පියාණන්වහන්සේගේම වචනවේ, එසේම, සමහර අවස්ථාවලදී, මෝසස් 1:6 සඳහන් පරිදිවේ; ඔහු පියාණන්වහන්සේගේ ප්‍රථමයාණන් ගැන කථාකරයි.

   ආ. මෝසස් 1: 12–23. සාතන් මෝසස්ට මුහුණ දෙයි; මෝසස් ඔහුව ඉවතට එළවා දමයි.

   ඇ. මෝසස් 1:24:39. දෙවියන්වහන්සේ නැවතත් ප්‍රකාශවී උන්වහන්සේගේ වැඩකටයුතු සහ මහිමය ගැන උගන්වනසේක.

2. පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වන අන්දම ගැන තීරණයකරන්න. හැම ප්‍රශ්නයක්ම විචාරීම සහ පාඩමේ හැම කරුණක්ම ආවරණයකිරීම අසීරු නිසා, පංති සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් හොඳින් පිරිමසාලන කරුණු යාච්ඤාවෙන් යුතුව තෝරාගන්න. පංති සාමාජිකයන්ගේ අවස්ථාවන්ට අදාළවන ප්‍රශ්න එකතුකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

3. ඔබගේ පංතියේ හැම පුද්ගලයෙකු සඳහා *පරණ ගිවිසුම පංති සාමාජික අධ්‍යයන මාර්ගෝදේශක* පිටපතක් (34592) ලබාගන්න. ( වාර්ෂික පොත් ඇනවුම් කිරීමේදී එහි කොටසක් ලෙස මෙම අධ්‍යයන උපදෙස් පොත් කොට්ඨාශය මගින් ඇනවුම් කල යුතුය; සභානායකත්වයේ සාමාජිකයෙක් ඒවා ඉරුදින පාසලේ සභාපතිත්වයට දිය යුතුය.)

4. ඔබ දෙවන අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, කඩදාසි හෝ රෙදි බෑගයක් ලබාගෙන, එහි එදිනෙදා භාණ්ඩ වන, ගලක්, පනාවක් හෝ පැන්සලයක් වැනි දේවල් කිහිපයක් දමන්න.

---

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**

**පරණ ගිවිසුම හැඳින්වීම**

පරණ ගිවිසුම යනු, මැවීමේ කාලයේ සිට ගැලවුම්කරුවාණන්ගේ උත්පත්තියට පෙර ශතවර්ෂ කිහිපයක් දක්වා දෙවියන්වහන්සේගේ ගිවිසුම් ජනතාව සමග උන්වහන්සේගේ කටයුතු පිළිබඳ විස්තරයකි. පරණ ගිවිසුම මගින් ඇදහිල්ල සහ කීකරුකම පිළිබඳ බලගතු උදාහරණ සපයයි. එසේම එමගින් අමතකකිරීම, අකීකරුකම හෝ දෙවියන්වහන්සේට විරුද්ධවීමේ ප්‍රතිඵලද පෙන්වාදෙයි. එහි එන අනාවැකිවලින් මෙසියස්වහන්සේගේ උපත, මුදවාගැනීමේ පරිත්‍යාගය, දෙවන පැමිණීම සහ සහස්‍රයේ රාජ්‍ය පාලනය ගැනද සාක්ෂිදරයි.

පරණ ගිවිසුමට අමතරව, මෙම පාඨමාලාවට අනගි මුතු ඇටයේ එන මෝසස් සහ ආබ්‍රහම් යන පොත්ද ඇතුළත්වේ. මෙම පොත්වලින් උත්පත්ති පොතේ සමහර කරුණු පිළිබඳ වැදගත් අමතර කරුණු සහ පැහැදිළිකිරීම්ද ලබාදෙයි. මෝසස්ගේ පොත ජෝසෆ් ස්මිත්ගේ බයිබල් පරිවර්තනයෙන් උපුටාගැනීමකි. ආබ්‍රහම්ගේ පොත මිසර පැපිරස් කොල කිහිපයකින් ජෝසෆ් ස්මිත් සැදූ පරිවර්තනයකි.

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් එකක් (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. පංතියට වඩාත් අදාලවිය හැකි ක්‍රියාකාරකමක් තෝරාගන්න.

1. එළිදරව්වී තිබෙන වැදගත් සත්‍යයන් හඳුනාගැනීම සඳහා මෝසස් 1:6, 20–22, සහ 39 බලන ලෙස පංති සාමාජිකයන්ට කියන්න. පිළිතුරු විවිධ විය හැකිය. මෙම පාඩම කේන්ද්‍රකරගන්නේ 1 වෙනි පාඩමේ, 1වෙනි පිටුවේ "අරමුණ" යටතේ එන සත්‍යයන් තුනක් බව පහදාදෙන්න.

2. පංති සාමාජිකයන් දෙදෙනෙක් තෝරා එදිනෙදා භාණ්ඩ කිහිපයකින් සමන්විත බෑගය ඔවුන්ට දෙන්න (බලන්න "සූදානම්වීම," පිටුව 1). සහභාගිවන අය ක්‍රීඩාවක් කිරීමට යන බව ඔවුන්ට කියන්න. නමුත් උපදෙස් දීමට හෝ ක්‍රීඩාවේ අරමුණ පැහැදිළිකිරීමට හෝ නොයන්න. බෑගය විවෘතකර ක්‍රීඩාව ආරම්භ කිරීමට සහභාගිවන්නන්ට කියන්න. බෑගයේ අඩංගු දේවලින් ක්‍රීඩාව පැහැදිළිකිරීමට ඔවුන් බලාපොරොත්තුවනු ඇත. කෙසේවෙතත්, එහි අඩංගු බඩුවලින් මෙම තොරතුරු ලබානොදෙයි. එසේම සහභාගිවන්නන්ද, ඔවුන් කලයුතු දේ කුමක්දැයි සිතා මවිතවනු ඇත.

   ක්‍රීඩාවක් තේරුම්ගැනීම සඳහා එහි ඉලක්කය හෝ අරමුණ අපි තේරුම් ගතයුතු බව පෙන්වා දෙන්න. එලෙසම, පොළොවේ අපගේ ජීවිතය තේරුම්ගැනීම සඳහා අපගේ ජීවිතවල ඉලක්කය හෝ අරමුණ අපි තේරුම්ගත යුත්තෙමු. මෝසස් 1 වැදගත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයමින් මෙය තේරුම්ගැනීමට අපට උපකාර කරයි.

   අප කවුරුද?
   අපි සාතන්ගේ පෙළඹවීම් ජයගන්නේ කෙසේද?
   දෙවියන්වහන්සේගේ වැඩකටයුතු සහ මහිමය කුමක්ද?

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ යොදාගැනීම**

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාලකර ගන්නේ කෙසේදැයි සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධිත අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න. පාඩමේ සුදුසු වෙලාවක පරණ ගිවිසුම පංති සාමාජික මාර්ගෝපදේශකය (34592) ලබාදී එය ඔවුන්ගේ පුද්ගලික සහ පවුලේ ශුද්ධ ලියවිලි පාඩම්වලදී උපයෝගී කරගැනීමට දිරිගන්වන්න.

**1. මෝසස් දෙවියන්වහන්සේගේ පුත්‍රයෙක් බව දෙවියන්වහන්සේ උගන්වනසේක.**

මෝසස් 1:1–11 උගන්වමින් සාකච්ඡාකරන්න.

- මෝසස් 1:1–7 විස්තරකෙරෙන අත්දැකීම්වලින් දෙවියන්වහන්සේ ගැන මෝසස් ඉගෙනගත්තේ කුමක්ද? මෝසස් තමන් ගැන ඉගෙනගත්තේ කුමක්ද? (මෙම පදවල මෝසස්ට දෙවියන්වහන්සේ "මගේ පුත්‍රය" යයි කොපමණ වාරයක් අමතන්නේදැයි පංති සාමාජිකයන් දැනගැනීම ඔබට අවශ්‍යවිය හැකිය.)

- මෝසස්ව මවා තිබෙන්නේ ගැලවුම්කරුවාණන්ගේ "සමානාත්මතාවයෙන්" යන්නෙහි අදහස කුමක්ද? (මෝසස් 1:6). අප දෙවියන්වහන්සේගේ දරුවන් බවත්, මවා තිබෙන්නේ උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ සමානාත්මයෙන් බවත්, දැනීමෙන් අපගේ ජීවිතවල ඇතිවන වෙනස කුමක්ද?

  වැඩිමහල් ඩැලින් එච්. ඕක්ස් මෙසේ ඉගැන්වීය: "අපගේ ප්‍රියතම 'මම දේව දරුවෙක්මි, යන ගීතයේ අදහසෙහි බලය ගැන සිතන්න....අපගේ ජීවිතයේ එක් ශ්‍රේෂ්ඨ ප්‍රශ්නයකට එහි පිළිතුරු ඇත. 'මා කවරෙක්ද?' මා ස්වර්ගික දෙමාපියන්ගේ ආත්මික පෙළපතකින් පැවතෙන දරුවෙක්මි. එම දෙමාපියත්වය අපගේ සදාකාලික හැකියාව පැහැදිළිකරයි. එම බලගතු අදහස ප්‍රබල ශක්තියකි. එමගින් අප හැම කෙනෙකුටම ධාර්මික තේරීම් කිරීමට සහ අප තුල තිබෙන

හොඳම දෙය සෙවීමටද අපට ශක්තිය ලබාදෙයි. පුද්ගලයෙකුගේ සිත තුල…ඔහු හෝ ඇය දෙවියන්වහන්සේගේ දරුවෙකු යන බලගතු අදහස ගොඩනගයි. එසේම ජීවිතයේ අනවශ්‍ය ප්‍රශ්නවලින් ඉවත්ව සිටීමට අවශ්‍ය ආත්ම ගෞරවය සහ පෙළඹවීම ඔබට ලබාදී ඇත" (Conference Report, ඔක්තෝ. 1995, 31; හෝ *Ensign*, නොවැ. 1995, 25).

- මෝසස්ට නැවත නැවත "මාගේ පුත්‍රය" යයි අමතමින් සහ ඔහුව මවා තිබෙන්නේ "මාගේ ඒක ජාතකයාණන්ගේ සමානාත්මතාවයෙනි," යයි පැවසීම මගින් දෙවියන්වහන්සේ මෝසස්ට ඔහුගේ වටිනාකම ගැන විශ්වාසයක් සහ අවබෝධයක් දුන්සේක. මෙම මූලධර්මය අනුගමනය කිරීමෙන් දෙමාපියන් ලෙස අපට ලැබෙන යහපත කුමක්ද? එමගින් විවාහ ශක්තිමත්වන්නේ කෙසේද? එමගින් මිත්‍රත්වය ශක්තිමත්වන්නේ කෙසේද?

  විවේචන සහ ප්‍රතිවිරුද්ධතාවයන්, පහත් අදහස් බලපැවැත්වෙන ලෝකයක, අපි ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනයකරමින්, දෙවියන්වහන්සේගේ දරුවන් වශයෙන් ගෞරවය සහ වටිනාකමක් අන් අය තුලද තිබෙන බව දැකීමට ඔවුන්ට උදව්කල යුතුබව යෝජනාකරයි.

- මෝසස්ගේ වැදගත්කම සදාකාලික හැකියාව මෝසස් 1:1–7 අවධාරණයකරයි. කෙසේවෙතත්, දෙවියන්වහන්සේ ඔහු සම්මුඛයෙන් ඉවත්වූ විට, මෝසස් මෙසේ කීය, "දැන්, මේ කාරණය වෙනුවෙන් මිනිසා නොවටිනා බව මම දනිමි" (මෝසස් 1:10). මෙම මත දෙක සත්‍ය වන්නේ කුමන ආකාරයෙන්ද? (දෙවියන්වහන්සේ මැරෙන සුළු මිනිසාට සහ ගැහැණියට වඩා අසීමිතව ඥානවන්ත මෙන්ම බොහෝ බලගතු වනසේක. උන්වහන්සේ නොමැතිව අපට වටිනාකමක් නැත. කෙසේවෙතත්, උන්වහන්සේගේ දරුවන් ලෙස අපට උන්වහන්සේ මෙන් වීමට හැකියාවක් ඇත.)

**2. සාතන් මෝසස්ට මුහුණදෙයි; මෝසස් ඔහු එළවාදමයි.**

මෝසස් 1:12–23 උගන්වමින් සාකච්ඡාකරන්න.

- සාතන් පැමිණිවිට, ඔහු මෝසස්ට කිරීමට අණ කලේ කුමක්ද? (බලන්න මෝසස් 1:12). සාතන් මෝසස්ට "මනුෂ්‍ය පුත්‍රයා" යයි ආමන්ත්‍රනයකිරීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (මෝසස් දෙවියන්වහන්සේගේ පුත්‍රයෙකු නොවන බව විශ්වාසකිරීම සාතන්ට අවශ්‍යවිය.) අපි දෙවියන්වහන්සේගේ දරුවන් බව සැකකිරීම හෝ නොසැලකීම සාතන්ට අවශ්‍යවන්නේ මන්ද? මෙය කිරීමට ඔහු උත්සාහකරන්නේ කෙසේද?
- සාතන් මෝසස්ට "මනුෂ්‍ය පුත්‍රයා" යයි ආමන්ත්‍රණයකල විට, මෝසස් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න මෝසස් 1:13.) අපි දෙවියන්වහන්සේගේ පුතුන් සහ දියණියන් වන බවට ශක්තිමත් සාක්ෂියකින්, පරීක්ෂාවන්ට විරුද්ධවීමට අපට උපකාර ලැබෙන්නේ කෙසේද?
- සාතන්ට පිටව යන ලෙස මෝසස් කොපමණ වාරයක් කීවේද? (බලන්න මෝසස් 1:16, 18, 20 සහ 21.) සාතන්ගේ උත්සාහයන්ට විරුද්ධවීම ගැන මෙයින් අපට උගන්වන්නේ කුමක්ද?
- සාතන්ගේ පරීක්ෂාවන්ට විරුද්ධවීමට අවශ්‍ය ශක්තිය මෝසස් ලබාගත්තේ කෙසේද? (බලන්න මෝසස් 1:18, 20–21.) මෝසස් සාතන්ට පිටවයාමට සැලැස්වූවේ කෙසේද? පරීක්ෂාවන්ට විරුද්ධවීමට අපට යාච්ඤාවෙන් ශක්තිය ලැබෙන්නේ කෙසේද? මෙම ශක්තිය ලබාගැනීමට අපට කල හැකි වෙනත් දේවල් මොනවාද?

**3. දෙවියන්වහන්සේ නැවතත් ප්‍රකාශවී උන්වහන්සේගේ වැඩකටයුතු සහ මහිමය ගැන උගන්වන**

මෝසස් 1:24–39 උගන්වමින් සාකච්ඡාකරන්න.

- සාතන් පිටවයාමෙන් පසුව, මෝසස් නැවතත් දෙවියන්වහන්සේගේ මහිමය දුටු අතර, තවත් දර්ශනයකින් පොළොව සග එහි වැසියන් පෙන්වන ලදී (මෝසස් 1:24–28). මෙම දර්ශනය ඔහුට පෙන්වීමෙන් පසුව, මෝසස් ඇසූ ප්‍රශ්න දෙක මොනවාද? (බලන්න මෝසස් 1:30). දෙවියන්වහන්සේ දුන් පිළිතුරු මොනවාද? (බලන්න මෝසස් 1:31–32, 39.)
- දෙවියන්වහන්සේ අපට ගණන්කිරීමට පවා නොහැකි ලෝක සහ මිනිසුන් මවා තිබුනද, ඒවා සියල්ලම උන්වහන්සේ දන්නා බව මෝසස්ට සහතික කලසේක (මෝසස් 1:35). ස්වර්ගික

පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔබව පෞද්ගලිකව දැනගෙන ඔබට ප්‍රේමකරන බව, හැඟීමක් ඔබට දැනුනේ කෙසේද? (උන්වහන්සේලාගේ ප්‍රේමය සහ ඔබ ගැන දක්වන සැලකිල්ල ඔබට හැඟුන අවස්ථාවක් ගැන ඔබගේ සාක්ෂිය දැරීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

- දෙවියන්වහන්සේගේ වැඩකටයුතු සහ මහිමය වන්නේ "මිනිසාගේ අමරණීයත්වය සහ සදාකාල ජීවනය සිද්ධකිරීමය" (මෝසස් 1:39). අමරණීයත්වය යනු කුමක්ද? අමරණීයත්වය ලබාගන්නෝ කවරහුද? සදාකාල ජීවනය යනු කුමක්ද? සදාකාල ජීවනය ලබාගන්නෝ කවරහුද?

  වැඩිමහල් ජේම්ස් ඊ. ෆවුස්ට් මෙසේ කීවේයඃ "අමරණීයත්වය, නැතහොත් සදාකාලික පැවත්ම, සහ සදාකාලික ජීවනය, එනම් දෙවියන්වහන්සේගේ සම්මුඛයේ ස්ථානයක් ලබාගැනීම, අතර වෙනසක් ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව තුලින්, නපුරන්ටත්, යහපතුන්ටත්, ධර්මිෂ්ඨයන්ටත්, අධර්මිෂ්ඨයන්ටත්…,සියල්ලන්ටම අමරණීයත්වය පැමිණෙන්නේය. කෙසේවෙතත්, දෙවියන් වහන්සේගේ දීමනාවන්ගෙන් සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨවන්නේ' සදාකාල ජීවනයයි (බලන්න ඕ සහගී 14:7). ස්වාමීන්වහන්සේට අනුව, මෙම ශ්‍රේෂ්ඨ දීමනාව අපට ලැබෙන්නේ, 'නුඹලා මාගේ පණත් ඉටුකරමින්, අවසානය තෙක් දරාගතහොත්ය.' අපි එසේ දරාගතහොත්, පොරොන්දුව වන්නේ, නුඹලාට සදාකාල ජීවනය ලැබෙන්නේය. (බලන්න ඕසහගී 14:7)" (in Conference Report, ඔක්තෝ. 1988, 14, හෝ *Ensign*, නොවැ. 1988, 12).

- දෙවියන්වහන්සේගේ වැඩකටයුතු සහ මහිමය කුමක්දැයි දැනගැනීම අපට අවශ්‍යවන්නේ මන්ද? මෙම ශ්‍රේෂ්ඨ වැඩකටයුතුවලදී උන්වහන්සේට සහායවීමට අපට හැකි යම් විශේෂිත මාර්ග මොනවාද?

  ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිතුමා මෙසේ කීවේයඃ "අපි මෙහි සිටින්නේ අපගේ පියාණන් වහන්සේගේ වැඩකටයුතුවලට සහ උන්වහන්සේගේ මහිමයවූ, ' මිනිසාගේ අමරණීයත්වය සහ සදාකාල ජීවනය සිද්ධකිරීමට' උන්වහන්සේට සහායවීමටය. (මෝසස් 1:39). ඔබගේ විෂය තුල ඔබගේ යුතුකම, මගේ විෂය තුල මගේ යුතුකම මෙන්ම බරපතල එකකි. මෙම සභාවේ කිසිම කැඳවීමක් කුඩා හෝ මඳ ප්‍රතිඵලදායක හෝ නොවේ. අප සියලුදෙනාම අන් අයගේ ජීවිත ස්පර්ෂකිරීමේ අපගේ රාජකාරිය ඉටුකල යුතුය. අප එකිනෙකාට අපගේ නියමිත වගකීම් ගැන ස්වාමීන්වහන්සේ මෙසේ කීසේකඃ… මේවා කිරීමෙන් නුඹගේ සහෝදර ජනතාවට නුඹ ශ්‍රේෂ්ඨතම යහපතක් කරමින්, නුඹගේ ස්වාමීන් වන එතුමාගේ මහිමය නුඹ දියුණුකරන්නෙහිය (බලන්න ඕසහගී 81:4)" (in Conference Report, අප්‍රේ. 1995, 94; හෝ *Ensign*, මැයි 1995, 71; තවද බලන්න ඕසහගී 81:5–6).

---

**අවසානය**

අපි දෙවියන්වහන්සේගේ පුතුන් සහ දියණියන් බවට බලගතු දහමක්, මෝසස් 1 අපට උගන්වයි. මෙම සත්‍යයේ වැදගත්කම ගැන සිතාබැලීමට පංති සාමාජිකයන්ට ආරාධනාකරන්න. අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අප එකිනෙකා හඳුනන බවත්, අපට ප්‍රේමකරන බවටත් සාක්ෂිදරන්න. පංති සාමාජිකයන් මෝසස් 1 කියවා ඉගෙනගත් දේවල් ගැන ඔවුන්ගේ හැඟීම්, ඔවුන්ගේ පවුල්වල අයට ප්‍රකාශකිරීමට ඔවුන්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස්වලින් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. "මෝසස්ට හුදකලාවීමට සිදුවිය" (මෝසස් 1:9)**

- මෝසස් මෙන් අපටද "[අපවම] හුදකලා කෙරෙන" අවස්ථා තිබිය හැකිය—අපට තදින්ම ආත්මයාණන් හැඟීමට නොහැකි හෝ බොහෝ පරීක්ෂාවන් තිබෙන අවස්ථාවන්ය. මෙම අවස්ථාවන්ට මුහුණදීමට උපකාර පිණිස මෝසස් 1 න් අපට ඉගෙනගත හැක්කේ මොනවාද? (පිළිතුරුවලට මේවා ඇතුළත්විය හැකියඃ එවන් අසීරුතාවයන් අපගේ කිසියම් වරදක් නිසා සිදු නොවීමට හැකිය; 1:5 පදයෙන් පෙන්වන පරිදි දෙවියන්වහන්සේ අපව සම්පූර්ණයෙන්ම හුදකලා නොකරන සේක; සහ අපි නිතරම පරීක්ෂාවන්ට මුහුණදීමෙන්, දෙවියන්වහන්සේට කථාකිරීමෙන්, සහ අපගේ ඇදහිල්ල වැඩිකිරීමෙන් විශාල ශක්තියක් ලබාගන්නෙමු.)

## 2. සියල්ලෝම දෙවියන්වහන්සේගේ දරුවෝය

- මෝසස් 1 වාර්තාකර තිබෙන දර්ශනය මෝසස්ට ලැබුනේ ඔහු ඉශ්‍රායෙල් දරුවන් මිසරයෙන් පිටතට ගෙනයාමට පෙරය. විශේෂයෙන්ම මිනිසුන්ගේ නිරන්තර කැරලිගැසීම් සහ ඇදහිල්ල අඩුකම මගින් මෝසස් අධෛර්‍යයට පත්ව සිටියද, ඔහුගේ මෙම උත්සාහයට මෙම දර්ශනය ඔහුට උපකාරවත්වීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? අප සියලු දෙනාම දෙවියන්වහන්සේගේ දරුවන් බව දැනීමෙන් ගුරුවරයෙකුට හෝ නායකයෙකුට ලැබෙන උපකාරය කුමක්ද? මෙම දැනීම පවුල් සාමාජිකයන්, මිතුරන් සහ අන් අය හා සම්බන්ධතාවලදී අපට උපකාරවත් වන්නේ කෙසේද?

## 3. ජෝසෆ් ස්මිත්ගේ බයිබල් පරිවර්තනය

පරණ ගිවිසුම වීඩියෝ ඉදිරිපත්කිරීම (53224) තිබේ නම්, "ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ බලය" නම් මිනිත්තු පහක කොටස, පාඩමේ කොටසක් ලෙස පෙන්වීමට ඔබට අවශ්‍යවිය හැකිය. මෝසස්ගේ පොත, ජෝසෆ් ස්මිත්ගේ බයිබල් පරිවර්තනයේ පිටපතක් බව පංති සාමාජිකයන්ට සිහිපත් කරන්න.

# 2
වෙනි පාඩම

# "නුඹව තෝරාගත්තේ නුඹ ඉපදීමටත් පෙරය"

*ආබ්‍රහම් 3; මෝසස් 4:1–4*

**අරමුණ**

පංති සාමාජිකයන්ට පූර්ව නියමකිරීමේ දහම ගැන දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට සහ ක්‍රිස්තුස්වහන්සේ වෙත ආත්ම රැගෙන ඒමට උපකාරකිරීම සඳහා ඔවුන්ට ඇති වගකීම තේරුම්ගැනීමට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. අනගි මුතු ඇටය සහ දහම සහ ගිවිසුමේ එන පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. ආබ්‍රහම් 3:11–12, 22–23; දහම සහ ගිවිසුම 138:53–57. ආබ්‍රහම් ස්වාමීන්වහන්සේ සමග මුහුණට මුහුණ ලා කථාකොට, මරණයට පෙර ජීවිතයේ බොහෝ උතුම් සහ ශ්‍රේෂ්ඨ ආත්ම ඔවුන්ගේ මැරෙන සුළු ජීවිතයේ දූත මෙහෙය සඳහා පූර්වයෙන් නියමකර තිබෙන බව දැනගනියි (ආබ්‍රහම් 3:11–12, 22–23). ගැලවුම්කරුවාණන් වහන්සේ උන්වහන්සේගේ උත්ථානයට පෙර ආත්ම ලෝකය බැහැදැකීම ගැන ජෝසෆ් එෆ්. ස්මිත් සභාපතිවරයා දුටු දර්ශනය තුලින්, "උතුම් සහ ශ්‍රේෂ්ඨයන්" ගැන බොහෝ දේවල් ඉගෙනගනියි (බලන්න ඩීසහසී 138:53–57).

   ආ. ආබ්‍රහම් 3:24–28; මෝසස් 4:1–4. ආබ්‍රහම්ට සහ මෝසස්ට දර්ශනයක් තුලින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ස්වර්ගීය මන්ත්‍රන සභාවකදී අපගේ ගැලවුම්කරුවාණන් වීමට තෝරාගත් බව සහ අපව උන්වහන්සේව අනුගමනයකිරීමට තෝරාගත් බවත් පෙන්වන ලදී. එසේම ඔවුන්ට ලූසිෆර් (සාතන්) සහ ඔහුව අනුගමනය කල ආත්මද, ස්වර්ගයෙන් පිටතට එළවාදැමූ බවද පෙන්වන ලදී.

2. අමතර කියවීම්: යෙසායා 14:12–15; එළිදරව් 12:7–9; ඇල්මා 13:3–5; දහම සහ ගිවිසුම 29:36–39; සහ ආබ්‍රහම් 3 සහ දහම සහ ගිවිසුම 138 ඉතිරි කොටස.

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**

**අවධානශීලී ක්‍රියාකාරීත්වය**

පාඩම ආරම්භකිරීමට පහත සඳහන් ක්‍රියාකාරකම් (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. පංතියට වඩාත් අදාලවන ක්‍රියාකාරකමක් තෝරාගන්න.

1. ශුද්ධ ලියවිලිවල ඉගැන්වීම් අපගේ ජීවිතවලට යොදාගත් විට ඒවා අපට වඩාත් අර්ථවත්වන බව පෙන්වා දෙන්න. මෙය කිරීම සඳහා, අපි නිතරම අපව පැරණි අනාගතවක්තෘවරුන්ගේ සහ ඔවුන්ගේ අනුගාමිකයන්ගේ තත්වයට දැමිය යුතු වෙමු. කෙසේවෙතත්, ආබ්‍රහම් 3:22–28 තුලින් අප තවත් කෙනෙකුගේ තත්වයට අපව නොදැමිය යුතුය. මන්ද මෙම පදවලින් අප සහභාගිවූ වැදගත් සිද්ධීන් ගැන කියවෙන නිසාය. මෙම සිද්ධීන් සිදුවූයේ අපගේ මරණයට පෙර ජීවිත කාලය තුලදීය.

2. *පූර්වනියමකිරීම* යන වචනයේ අකුරු නමය නියෝජනය වන ලෙස හිස් තැන් 9ක් හුණු ලැල්ලේ අඳින්න. මෙම හිස් ඉරිවලින් නියෝජනය වන වචනය මරණයට පෙර ජීවිතය බව පහදාදෙන්න.

   වචනය නිර්මානය වන අකුරු අනුමානකිරීමට පංති සාමාජිකයන්ට වාර 9ක් දෙන්න. ඔවුන් නිවැරදි වචනය අනුමානකල විට, එය අදාළ හිස් තැන හෝ තැන්වල ලියන්න. වචනයට පාවිච්චි නොවන අකුරක් ඔවුන් අනුමානකල විට, එම අනුමානකිරීමම නැවතත් කිරීම වැළැක්වීමට එය හුණු ලැල්ලේ වෙනත් තැනක ලියන්න.

පංති සාමාජිකයන් හිස් තැන් සියල්ලම පිරවීමෙන් හෝ වචනය අනුමාන කිරීමෙන් පසුව, එහි අර්ථය පැහැදිළිකිරීමට ඔවුන්ට උදව්කරන්න. ( පූර්වනියමය යනු දෙවියන්වහන්සේ තම ආත්මික දරුවන්ව ඔවුන්ගේ මැරෙන සුළු ජීවිතය තුලදී කිසියම් දූත මෙහෙයක් ඉටුකිරීම සඳහා මරණයට පෙර ජීවිතයේදී නියමකිරීමවේ.) මෙම පාඩම ස්වර්ගික පියාණන්වහන්සේ වෙනුවෙන් වැදගත් කාර්‍යයන් කිරීමට බොහෝ ආත්ම පූර්වයෙන්ම නියමකල, මරණයට පෙර ජීවිතය ගැන බව පහදාදෙන්න.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ සාකච්ඡාකරන විට, දිනපතා ජීවිතයට අදාළවන්නේ කෙසේදැයි සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

1. **මරණයට පෙර ජීවිතයේදී බොහෝ ආත්ම ඔවුන්ගේ මැරෙන සුළු ජීවිතයේ දූත මෙහෙයන් සඳහා පූර්වයෙන් නියමකල බව ආබ්‍රහම් දැනගනියි.**

ආබ්‍රහම් 3:11–12, 22–23, සහ දහම සහ ගිවිසුම 138:53–57 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ආබ්‍රහම් 3 වාර්තාවී තිබෙන දර්ශනය තුලින්, පොලොව නිර්මානය කිරීමට පෙර ස්වර්ගයේ පැවැත්වූ මන්ත්‍රන සභාව ස්වාමීන්වහන්සේ ආබ්‍රහම්ට පෙන්වූසේක. (පසු-දවස්වල අනාගතවක්තෘවරුන් පෙන්වාදී තිබෙන පරිදි ස්වර්ගයේ මන්ත්‍රන සභාව රැස්වීම් මාලාවක් මිස තනි රැස්වීමක් නොවන බව සලකන්න.) මෙම මන්ත්‍රන සභාවට පැමිණ සිටියේ කවුද? (ස්වර්ගික පියාණන් සහ උන්වහන්සේගේ ආත්මික දරුවන්ය.) මෙම මන්ත්‍රන සභාව ගැන ආබ්‍රහම් 3:22–23න් අපට ඉගෙන ගත හැක්කේ මොනවාද?
- ආබ්‍රහම් 3:22–23න් විස්තරවන "උතුම් සහ ශ්‍රේෂ්ඨ අය" කවරහුද? (අනාගතවක්තෘවරු සහ සභාවේ නායකයෝය) 1918දී ජෝසෆ් ස්මිත් සභාපතිවරයා ආත්මික ලෝකය ගැන දුටු දර්ශනයකින් මෙම "උතුම් සහ ශ්‍රේෂ්ඨ අයගෙන්" කිහිපදෙනෙක් දුටු බව පහදාදෙන්න. ස්මිත් සභාපතිවරයා දුටු අය කවුද? (බලන්න ඩීසහසී 138:53; දෙවන අමතර ඉගැන්වීමේ අදහස්ද බලන්න.)
- ආබ්‍රහම්ව "[ඔහු] ඉපදීමටත් පෙර සිටම තෝරාගෙන ඇත" යන්නෙහි අදහස කුමක්ද? (බලන්න ආබ්‍රහම් 3:23. අනාගතවක්තෘවරයෙකු වීමට ඔහුව පූර්වනියමකරන ලදී.) පූර්වනියමකිරීම යන්නෙහි අදහස කුමක්ද? (දෙවන අවධාශීලී ක්‍රියාකාරකමේ පැහැදිළිකිරීම බලන්න.) දහම සහ ගිවිසුමේ 138:53 සඳහන්කර තිබෙන මිනිසුන් පූර්වනියමකිරීමේ අදහස කුමක්ද? (බලන්න ඩීසහසී 138:53–56.)
- ආබ්‍රහම්, ජෝසෆ් ස්මිත් සහ අන් අය අනාගතවක්තෘවරුන් වන බවට පූර්වනියමකිරීම සහතිකවූවේද? පූර්වනියමකිරීමේ සහ නිදහස් කැමැත්ත අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? (යම් පුද්ගලයෙකු කැඳවීමට පූර්වනියමකලද, පුද්ගලයාගේ සුදුසුතාවය සහ එය පිළිගැනීමට ඇති කැමැත්ත මත එම කැඳවීම රඳාපවතී.)
- අනාගතවක්තෘවරුන්ව ඔවුන්ගේ කැඳවීම් සඳහා පූර්වනියමකිරීමට අමතරව, රාජ්‍යය ගොඩනැගීමට විවිධාකාරයෙන් උදව්කිරීම සඳහා දෙවියන්වහන්සේ වෙනත් තෝරාගත් බොහෝ ආත්ම පූර්වනියමකලසේක. අපව පූර්ව නියමකර ඇත්තේ කුමක් කිරීමට විය හැකිද? (බලන්න ඩීසහසී 138:56.)

  එස් බීස්රා ටැෆ්. බෙන්සන් මෙසේ ඉගැන්වීයඃ

  "ස්වාමීන්වහන්සේගේ දෙවන පැමිණීමට පෙර, අවසාන දිනවලදී ඔබගේ පැමිණීම සැලැස්වීම සඳහා දෙවියන්වහන්සේ ඔබව වෙන්කර නවතාගෙන ඇත. යම් පුද්ගලයෝ ඉවතට වැටී යනු ඇත. නමුත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය එහි ප්‍රධානියා—යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම පිළිගැනීමට ආරක්ෂිතව පවතිනු ඇත. අපගේ පරම්පරාව නෝවාගේ කාලයේ දුෂ්ඨකමට සමානකරන අතර, ස්වාමීන්වහන්සේ පොලොව ජලගැල්මෙන් පිරිසිදුකල විට, මේ කාලයේ විශාල වෙනසක් ඇත. අවසාන ඉනිම සඳහා තමන්වහන්සේගේ ශක්තිමත්ම මිනිසුන්ගෙන් කිහිපදෙනෙක් ඉතිරිකරගෙන සිටියේ දෙවියන්වහන්සේය. ඔවුහු විජයග්‍රාහීව රාජ්‍යය දරාසිටීමට උපකාරකරනු ඇත....

"…ඒ ගැන කිසිදු සැකයක් ඇතිකර නොගන්න—ඔබ සලකුණුකල පරම්පරාවකි. අපගේ මෙම කාලය තරම්, එතරම් කෙටි කාලයක් තුලදී ඇඳහිලිමතුන්ව වඩාත් බලාපොරොත්තුවූ වෙනත් කාලයක් කිසිදා නොවීය" (*The Teaching of Ezra Taft Benson* [1988], 104–5).

- අපි අපගේ පූර්වනියම කල කැඳවීම් ඉටුකරන බව අපට ස්ථිරව කිව හැක්කේ කෙසේද? (පිළිතුරුවලට, සුභාරංචිය අනුව ජීවත්වීම, අපගේ ආදි පීතෘ ආශිර්වාද අධ්‍යයනයකිරීම සහ පෞද්ගලික එළිදරව් සෙවීම මගින් යනාදිය ඇතුළත්විය හැකිය. මෙම කැඳවීම් ඉටුකිරීම සඳහා අපි කැමතිව සහ සුදුසුව සිටිය යුතු වෙමු. ධීසහසී 58:27–28ද බලන්න.)

**2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් වීමට ස්වර්ගයේ මන්ත්‍රන සභාවේදී තෝරාගත්සේක; අපි උන්වහන්සේව අනුගමනය කිරීම තෝරා ගත්තෙමු. ලූසිෆර් (සාතන්) සහ ඔහු අනුගමනය කල ආත්ම ස්වර්ගයෙන් පිටතට එළවාදමන ලදී.**

ආබ්‍රහම් 3:24–28 සහ මෝසස් 4:1–4 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ස්වර්ගීය මන්ත්‍රන සභාවේදී, ස්වර්ගික පියාණන් උන්වහන්සේගේ ගැලවීමේ සැලසුම ඉදිරිපත්කර අප වෙනුවෙන් ගැලවුම්කරුවෙක් තෝරාගත්සේක. අපගේ ගැලවුම්කරු වීමට ඉදිරිපත්වූ ආත්ම දෙක කවුද? (බලන්න ආබ්‍රහම් 3:27; මෝසස් 4:1–2.) ඔවුන්ගේ ඉදිරිපත්කිරීම් වෙනස්වූයේ කෙසේද? (යේසුස්වහන්සේට අවශ්‍යවූයේ ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම අනුගමනය කරමින් කීර්තිය උන්වහන්සේට ලබාදීමය. ලූසිෆර්ට අවශ්‍යවූයේ ඔහුගේම සැලසුමක් අනුගමනය කරමින් කීර්තිය ඔහුට ලබාගැනීමය.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් වීමට ස්වර්ගික පියාණන්වහන්සේ තෝරාගත්තේ මන්ද? (බලන්න මෝසස් 4:2–3.)
- අපි ස්වර්ගීය මන්ත්‍රන සභාවේදී අනුගමනයකිරීම සඳහා සෝරාගත්තේ කාවද? අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීම තොරාගත් බව අපි දන්නේ කෙසේද? (අපි පොළොවේ ඉපිද භෞතික ශරීර ලබා ඇති නිසාය.)
- ආබ්‍රහම් 3:26 සඳහන් *පළවෙනි තත්වය* සහ *දෙවෙනි තත්වය* යන වචනවල අදහස කුමක්ද? (*පළවෙනි තත්වය* යයි අමතන්නේ මරණයට පෙර ජීවිතයට වන අතර, *දෙවෙනි තත්වය* යයි අමතන්නේ මැරෙන සුළු ජීවිතයයි. ලූසිෆර් වෙනුවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තෝරාගැනීමෙන් අපි පළවෙනි තත්වය තබා ඇත.) අපි අපගේ පළවෙනි තත්වය තැබීම නිසා අප හැම කෙනෙකුටම ලැබුන ආශිර්වාදය කුමක්ද? (පොළොවේ ඉපදීමට ලැබුන අවස්ථාවය.) අපි දෙවෙනි තත්වයද තැබුවහොත්, අපට ලැබෙන ආශිර්වාද මොනවාද? (බලන්න ආබ්‍රහම් 3:26.) අපට අපගේ දෙවෙනි තත්වය තැබිය හැක්කේ කෙසේද?
- ලූසිෆර් (සාතන්) සහ ඔහුව අනුගමනය කිරීමට තෝරාගත් අයට සිදුවූයේ කුමක්ද? ( ඔවුන්ව ස්වර්ගයෙන් පිටතට එළවා දැමූ අතර, භෞතික ශරීර ලබාගැනීමේ අවස්ථාව ඔවුහු ප්‍රතික්ෂේප කළහ. බලන්න මෝසස් 4:3; ආබ්‍රහම් 3:28; එළිදරව් 12:7–9; ධීසහසී 29:36–37.)
- සාතන් සහ ඔහුගේ අනුගාමිකයන් දැන් කුමක් කරන්නේද? ( අපගේ නිදහස් කැමත්ත විනාශකිරීමට ඔවුහු තවමත් උත්සාහ කරති. ඔවුහු අදටත් පව්කිරීමට අපව පොළඹවමින් නපුරු ආත්ම ලෙස පොළොවේ සිටිති. බලන්න මෝසස් 4:4.) අපගේ නිදහස් කැමැත්ත සීමාකිරීමට හෝ විනාශකිරීම සඳහා සාතන් සහ ඔහුගේ අනුගාමිකයන් උත්සාහකරන යම් මාර්ග මොනවාද? ඔවුන්ගේ එම උත්සාහයන් හඳුනාගෙන ඒවාට විරුද්ධවීමට අපට කල හැකි දේවල් මොනවාද?
- ස්වර්ගීය මන්ත්‍රන සභාවේදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීම ඔබ තෝරාගත් බව අවබෝධවීමට එය ඔබට උපකාරවත්වන්නේ කෙසේද? මරණයට පෙර ජීවිතයේදී මෙන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීම සඳහා දිගටම තීරණ ගැනීමට පංති සාමාජිකයන්ව දිරිගන්වන්න.

---

අවසානය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සහ පූර්වනියමකල අපගේ ගැලවුම්කරුවාණන් වශයෙන් උන්වහන්සේ වැඩකොටස ගැන සක්ෂිය දරන්න. දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට

උපකාරකිරීම සඳහා පූර්වනියමකල දූත මෙහෙය ඉටුකිරීමට පංති සාමාජිකයන් තුල ඇති හැකියාව ගැන ඔබගේ විශ්වාසය පළකරන්න

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස්වලින් එකක් හෝ වැඩි ප්‍රමාණයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

1. **"තවද අපි මේ සමග ඔවුනට ඔප්පුකරන්නෙමු"**

- ස්වර්ගික පියාණන්ගේ මග පෙන්වීම යටතේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොව නිර්මානය කල එක් ප්‍රධාන අරමුණක් ආබ්‍රහම් 3:24–25 විශේෂයෙන්ම සඳහන්කරයි. පොළොව නිර්මානය කලේ මන්ද? ඔබව පොළොවේදී පරීක්ෂාකරනු ලබන බව දැනගෙනම ඔබ මෙහි පැමිණීමට තෝරාගත්බව දැනගැනීම ඔබට උපකාරවන්නේ කෙසේද?

2. **"ශ්‍රේෂ්ඨ සහ බලවත් අය"**

- දහම සහ ගිවිසුම 138 පරිච්ඡේදයේ වාර්තාකර තිබෙන, ජෝසෆ් එෆ්. ස්මිත් දුටු දර්ශනය තුලින් "ශ්‍රේෂ්ඨ සහ බලවත්" අය ක්‍රිස්තුස්වහන්සේ ඉපදීමටත් පෙර පොළොව මත ජීවත්ව සිටි බව ඔහුද දුටුවේය. ස්මිත් සභාපතිවරයා දුටු අය කව්ද? (බලන්න ඩීසහඝී 138:38–49. මෙම නම් හුණු ලෑල්ලේ ලිවීමට ඔබට අවශ්‍යවිය හැකිය. මෙම පුද්ගලයන් බොහෝ දෙනෙක් ගැන ලබන වසරේ ඉරුදින පාසලේදී පංති සාමාජිකයන්ට ඉගෙනගැනීමට ලැබෙන බව ඔවුන්ට පෙන්වා දෙන්න.)

# 3

වෙනි පාඩම

# මැවීම

*මෝසස් 1:27–42; 2–3*

**අරමුණ**

දෙවියන්වහන්සේ සියලු දේ මවා තිබෙන්නේ අපගේ යහපතට සහ අපව මවා තිබෙන්නේ උන්වහන්සේගේම ප්‍රතිරූපයෙන් බවටත් පංති සාමාජිකයන් තුල කෘතඥපූර්වක හැඟීමක් ඇතිකරගැනීමට උපකාරකිරීමටය.

**සූදානම්වීම**

1. අනගි මුතු ඇටයේ එන පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්නඃ

   අ. මෝසස් 1:27–42. මෝසස් දර්ශනයක් තුලින් දෙවියන්වහන්සේගේ මැවීම් දැක, පොළොව මැවීමේ විස්තරය ලිවීමට අණකරනු ලබයි.
   ආ. මෝසස් 2:1–25; 3:1–14. සියල්ලෙහි මැවුම්කරුවාණන් දෙවියන්වහන්සේ බව මෝසස් දැනගනියි.
   ඇ. මෝසස් 2:26–31; 3:7, 15–25. මිනිසුන් සහ ස්ත්‍රීන් මවා තිබෙන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රතිරූපයෙන් බව මෝසස් දැනගනියි.

2. අමතර කියවීම්ඃ ආබ්‍රහම් 4–5; උත්පත්ති 1–2.

3. ඔබ දෙවන අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, රූප ඇඹීමේ ක්ලේ හෝ හුණු කූරු පංතියට රැගෙනඑන්න.

4. පහත සඳහන් දෘෂ්‍ය උපකරණ තිබේ නම්, පාඩමේ කොටසක් ලෙස ඒවා කිහිපයක් පාවිච්චි කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

   අ. "දෙවියන්වහන්සේගේ ප්‍රතිරූපයෙන්" පරණ ගිවිසුම වීඩියෝ ඉදිරිපත්කිරීම මිනිත්තු තුනයි (53224).
   ආ. ආරම්භය/ආබ්‍රහම්, 1වෙනි කොටස, "මැවීම" වීඩියෝ පටයෙන් කෙටි උපුටාගැනීමක් (53150).
   ඇ. පින්තූර මැවීම—ජීවමාන සතුන් (62483; සුභාරංචි කලා පින්තූර මල්ල 100).

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් එකක් (හෝ ඔබගේම එකක්) පාඩම ආරම්භකිරීම සඳහා පාවිච්චිකිරීමට ඔබට පුළුවන. පංතියට වඩාත් යෝග්‍යවන ක්‍රියාකාරකමක් තෝරාගන්න.

1. පෙර පාසල් ළමයෙකු සඳහා පහත සඳහන් ප්‍රශ්නවලින් එකකට පිළිතුරුදීමට පංති සාමාජිකයන් උත්සාහකිරීමේදී ඔවුන්ට කොපමණ තොරතුරු දීමට හැකිදැයි සිතාබලන ලෙස ඔවුන්ගෙන් අසන්න. අහස් යාත්‍රාවක් ගුවනේ රැඳී තිබෙන්නේ කෙසේද? රූපවාහිනී යන්ත්‍රයක් ක්‍රියාකරන්නේ කෙසේද? ගස් වැවෙන්නේ කෙසේද? අප බොහෝ දෙනෙක් පෙර පාසල් ළමයෙකු තේරුම්ගැනීමට උත්සාහ කල යුතු අතර, ප්‍රධාන මත පමණක් ලබාදී, වැඩි තොරතුරු ළමයා වඩාත් මෝරන තුරු ලබා නොදෙයි.

   - මෙම උදාහරණ ස්වාමීන්වහන්සේගේ මැවීම සම්බන්ධ එළිදරව්වලට සමානවන්නේ කෙසේද? ස්වාමීන්වහන්සේ එළිදරව්කර තිබෙන්නේ අපගේ මනුෂ්‍ය මොළයට තේරුම්ගත හැකි සදාකාලික සත්‍යයේ එම කොටස පමණක් වන අතර, එය අප දැනගැනීම අවශ්‍යවන්නේ ගැලවීම ලබාගැනීම සඳහාය.)

   මැවීම සම්බන්ධව ස්වාමීන්වහන්සේ එළිදරව්කර තිබෙන සත්‍යයන් මෙම පාඩමෙන් සාකච්ඡා කරනු ලැබේ.

2. රූප ඇඹීමේ ක්ලේ හෝ හුණු කූරු පාවිච්චි කර කුඩා සතෙක් ස්වේච්ඡාවෙන් සෑදීමට හෝ ඇඳීමට පංති සාමාජිකයෙකුට කියන්න (මිනිත්තු එකක් හෝ දෙකක් පමණක් ලබාදෙන්න). ඉන්පසුව අප ජීවමාන දෙයක රූපයක් අපට නිර්මානය කලහැකි වුවද, එයට ජීවය දිය හැක්කේ දෙවියන්වහන්සේටම පමණක් බවට වන සත්‍යය ගැන සාකච්ඡා කරන්න. මෙම පාඩම දෙවියන්වහන්සේගේ මහත් ආශ්චර්‍යමත් මැවිල්ල, පොළොව සහ එහි වෙසෙන සියලු දේ ගැන සාකච්ඡාකරයි.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. දෙවියන්වහන්සේගේ මැවීම් ගැන මෝසස් දර්ශනයකින් දකියි.**

මෝසස් 1:27–42 උගන්වමින් සාකච්ඡාකරන්න.

- මැවීම ගැන විස්තරය උත්පත්ති පොතේ ලියුවේ කවුද? (බලන්න මෝසස් 1:40; 2:1.) මෝසස් මෙම විස්තරය ලියුවේ මන්ද? (බලන්න මෝසස් 1:40–41.) මෝසස් 1:27–39න් දෙවියන්වහන්සේගේ බලය ගැන අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දරුවන්ට දක්වන ප්‍රේමය ගැන අපට ඉගෙනගත හැක්කේ කුමක්ද?
- උත්පත්ති පොතේ දැක්වෙන මැවීමේ විස්තරය අනුව මෝසස් සහ ආබ්‍රහම් එකිනෙකාට වෙනස්වන්නේ කෙසේද? (ආබ්‍රහම් සහ මෝසස් මෙම පොළොව සංවිධානයකිරීම ගැන දර්ශනයකින් දැක, ඉන්පසුව ඔවුන්ගේ දර්ශන වාර්තා කළහ. එකිනෙකා මඳක් වෙනස් තොරතුරු ඇතුළත් කළහ. උත්පත්ති පොතේ එන විස්තරය මුලින්ම ලියන ලද්දේ මෝසස් විසින් නමුත්, ඔහුගේ සම්පූර්ණ විස්තරයෙන් කොටසක් නැතිවිය. මෙම සම්පූර්ණත්වය මෝසස්ගේ පොතේ නැවත පිහිටුවිය.)

**2. දෙවියන්වහන්සේ සියල්ලේම මැවුම්කරුවාණන් බව මෝසස් දැනගනියි.**

මෝසස් 2:1–25; 3:1–14 උගන්වමින් සාකච්ඡා කරන්න.

- පොළොව මැවුවේ කවුරුන්ද? (බලන්න මෝසස් 1:32; 2:1; යොහාන් 1:1–3, 14; හේබ්‍රෙව් 1:1–2; මොසායා 3:8; ඩීසහසී 14:9 ද බලන්න.) මැවුම්කරුවාණන් කවුදැයි දැනගැනීම අපට වැදගත්වන්නේ මන්ද?
- මැවීමේ අරමුණ ගැන දෙවියන්වහන්සේ එළිදරව්කර තිබෙන්නේ මොනවාද? (බලන්න මෝසස් 1:39; ආබ්‍රහම් 3:24–25; තවද බලන්න 1 නිෆායි 17:36; 2 නිෆායි 2:11–15. මැවීමේ අරමුණ වන්නේ, ස්වර්ගික පියාණන්වහන්සේගේ ආත්මික දරුවන්ට පැමිණ භෞතික ශරීරයක් ලබාගැනීමට හැකි ස්ථානයක් ලබා දී, ඔවුන් උන්වහන්සේගේ සම්මුඛයෙන් වෙන්ව සිටියදී ඔවුන් උන්වහන්සේට කීකරුවන්නේදැයි පරීක්ෂාකිරීමට හෝ ඔවුන් විසින් ඔප්පුකර පෙන්වීම බැලීම සඳහාය. ඇඳහිලිමත්ව සිටින්නන් සදාකාලික ජීවනය ලබාගනු ඇත. උත්පත්ති පොතේ මැවීම ගැන විස්තරයක් ඇතුළත්ව තිබුනද, මැවීමේ අරමුණු සහ වැදගත්කම ගැන පැහැදිළි කෙරෙන්නේ පසු-දවස්වල එළිදරව්වල පමණක්ම වන බව පෙන්වාදීම ඔබට අවශ්‍යවිය හැක.
- පෙළොවේ ජීවිතය සදාකාලික ජීවනය සඳහා අපව සූදානම් කරන්නේ කුමන ආකාරයෙන්ද? (පිළිතුරුවලට මේවා ඇතුළත්විය හැකිය: අපට භෞතික ශරීර ලැබීම, අපගේ නිදහස් කැමැත්ත පාවිච්චි කිරීමට ඉගෙනගැනීම, දැනීම ලබාගැනීම, පවුල් ලැබීම, නියෝග ලබාගැනීම, සහ ගිවිසුම් තැබීම.)
- මැවීමේ ප්‍රතිඵල ගැන දෙවියන්වහන්සේ ප්‍රකාශකලේ මොනවාද? (බලන්න මෝසස් 2:4, 10, 12, 18, 21, 25, 31; 3:2. මැවීම ගැන කෙටි විස්තරවලින් අට වතාවක්, තමන්වහන්සේගේ වැඩ හොඳ බව දෙවියන්වහන්සේ ප්‍රකාශ කලසේක.) දෙවියන්වහන්සේගේ මැවීම්වලින් ඔබට විශේෂයෙන්ම අලංකාර දෙය කුමක්ද? මැවීමේ අලංකාරය ගැන හැම දිනකම වඩාත් සැලකිල්ලෙන් දැකීම මගින් අපට ප්‍රයෝජන වන්නේ කෙසේද?

- පොළොව මවා තිබෙනේනේ කිසිවක් නොමැතිවද? (බලන්න ආබ්‍රහම් 3:24; 4:1.)

  ජෝසප් ස්මිත් අනාගතවක්තෘවරයා මෙසේ කීවේයː "මැවීම යන වචනය පැමිණියේ [හීබෲ] බෝරෝ යන වචනයෙනි. එහි අදහස කිසිවක් නොමැතිව යන්න නොවේ; එහි අදහස සංවිධානය කිරීමය; මිනිසෙක් උපකරණ සංවිධානයකර නැවක් ගොඩනැගීමට සමානය. මෙනිසා, අපි අනුමාන කරන්නේ ලෝකය සංවිධානයකිරීමට දෙවියන්වහන්සේට උපකරණ තිබූ බවය. ව්‍යාකූල භාවය —ව්‍යාකූල ද්‍රව්‍යයකි" (*Teachings of the Prophet Joseph Smith*, තෝරා, Joseph Fielding Smith [1976], 350–51).

- මැවීම පිළිබඳ වාර්තාව, ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ඔබගේ හැඟීම්වලට බලපාන්නේ කෙසේද? මැවීම් දෙවියන්වහන්සේ ගැන "වාර්තා දරන්නේ" කෙසේද? (බලන්න මෝසස් 6:63; ඇල්මා 30:44.) මැවීමේ දීමනාව ගැන අප කෘතඥතාවය පෙන්වන්නේ කෙසේද?

**3. මිනිසුන් සහ ස්ත්‍රීන් මවා තිබෙන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රතිරූපයෙන් බව මෝසස් දැනගනියි.**

මෝසස් 2:26–31; 3:7, 15–25 උගන්වමින් සාකච්ඡාකරන්න.

- අපව මවා තිබෙන්නේ කාගේ ප්‍රතිරූපයෙන්ද? (බලන්න මෝසස් 2:26–27.)

  පළවෙනි සභාපතිත්වය මෙසේ කීවේයː "මිනිසුන් සහ කාන්තාවන් සියල්ලෝම විශ්ව පියෙකු සහ මවකගේ ප්‍රතිරූපයක් දරන අතර, ස්වභාවයෙන්ම දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ සහ දියණියෝ වෙති" ("The Origin of Man," *Improvement Era*, නොවැ. 1909, 78).

- අපි දෙවියන්වහන්සේගේ ප්‍රතිරූපයෙන් මවා ඇති බවට වන අවබෝධයෙන් අපගේ ජීවිත ආශිර්වාදිතවන්නේ කෙසේද? අන් අය හා ඇති අපගේ සම්බන්ධතාවයන්ට එය බලපෑ හැක්කේ කෙසේද?

- අප හැම කෙනෙක් වෙනුවෙන්ම දෙවියන්වහන්සේ දක්වන පෞද්ගලික සැලකිල්ල ගැන මෝසස් 7:30 එන ඒනොක්ගේ වචනවලින් උගන්වන්නේ කුමක්ද? අපගේ ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඒවායින් අපට උගන්වන්නේ මොනවාද?

- ස්වාමීන්වහන්සේ අප අමතා, පොළොව මත උන්වහන්සේගේ මැවීම්වල ආධිපත්‍යය ලබාගැනීමට ප්‍රකාශකල විට, උන්වහන්සේ එයින් අදහස්කල දේ ගැන ඔබ සිතන්නේ කුමක්ද? (බලන්න මෝසස් 2:26. අපි පොළොවට ගරුකරමින් දෙවියන්වහන්සේගේ මැවීම් ගැන සැලකිලිමත් විය යුතුවෙමු.) මැවීම්වල ආධිපත්‍යය ලැබීම සඳහා අපි අපගේ වගකීම් වඩාත් හොඳින් ඉටුකරන්නේ කෙසේද?

---

අවසානය

ඔබ ඉගැන්වූ මූලධර්මවල සත්‍යතාවය ගැන සාක්ෂිය දරන්න. මැවීම ගැන පංති සාමාජිකයන්ගේ සාක්ෂිය දැරීමට ඔවුන්ට ආරාධනාකරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. පාඩමෙහි කොටසක් ලෙස එය පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**මැවීමේ ප්‍රමාණය**

මැවීමට අවශ්‍යවූ කාලය පිළිබඳ ප්‍රමාණය දැනගන්නට නැත. මැවීම ගැන ශුද්ධ ලියවිලි වාර්තාවල එන දිනය නම් වචනය මගින් පැය 24ක කාලයක් නියෝජනය නොවේ. යොම් යන හීබෲ වචනය "දිනය" "වෙලාව" "හෝ "කාලය" වශයෙන්ද පරිවර්තනය කල හැකිය. පේතෘස් ප්‍රේරිතවරයා මෙසේ කීවේය, "ස්වාමීන්වහන්සේට එක දිනයක් වසර දහසකි" (2 පේතෘස් 3:8; තවද බලන්න ආබ්‍රහම් 3:4).

# “මගේ වරද නිසා මගේ දෙනෙත් විවෘතවිය”

**4**
**වෙනි පාඩම**

*මෝසස් 4; 5:1–15; 6:48–62*

---

**අරමුණ**

ආදම්ගේ වැටීම ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුමේ අත්‍යාවශ්‍ය කොටසක් බව හැම පංති සාමාජිකයෙකුටම තේරුම්ගැනීමට උපකාරවත්වීමය.

---

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. මෝසස් 4; 5:10–11; 6:48–49, 55–56. සාතන් ආදම් උයනට පැමිණ ඒව රැවටීමට සොයයි. ඒව සහ ආදම් හොඳ නරක දැනගැනීමේ ගසේ ගෙඩිය අනුභව කරති (4:5–12). වැටීම නිසා, ආදම් සහ ඒව ආදම් උයනින් පිටමං කරයි. (4:13–31). ආදම් සහ ඒව වැටීමෙන් පසුව ලැබූ ආශිර්වාදවලින් ප්‍රීතිවෙති (5:10–11). වැටීමේ ප්‍රතිඵල ගැන ඒනොක් උගන්වයි (6:48–49, 55–56).

   ආ. මෝසස් 5:14–15; 6:50–54, 57–62. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම නිසා, මැරෙන සුළු මිනිසුන් උත්ථානය තුලින් ශාරීරික මරණයෙන් ගැලවීම ලබන අතර, ඇදහිල්ල, පසුතැවීම, බෞතීස්මය, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව සහ පණත්වලට කීකරුකම තුලින් ආත්මික මරණයෙන්ද ගැලවීම ලබාගැනීමට හැකියාව ඇත.

   ඇ. මෝසස් 5:1–9, 12. ආදම් සහ ඒව මැරෙන සුළු මිනිසුන් ලෙස ජීවිතය ආරම්භකරති. ඔවුන් දරුවන් ලැබ, ඔවුන් ඉගෙනගත් සත්‍යයන් දරුවන්ට උගන්වති (5:1–4, 12). ඒක ජාතකයන්ගේ ජීවිත පරිත්‍යාගය ආකාරයට ආදම් බිලි පූජා පිරිනමයි (5:5–9).

2. අමතර කියවීම්: උත්පත්ති 2–3; 1 කොරොන්ති 15:20–22; 2 නිෆායි 2:5–30; 2 නිෆායි 9:3–10; හීලමන් 14:15–18; දහම සහ ගිවිසුම 19:15–19; 29:34–44; ඇදහිල්ලේ කරුණු 1:2.

3. ආදම්ගේ සහ ඒවගේ වැටීම (මෝසස් 4:6–31) පිළිබඳ වාර්තාව සංක්ෂේපකිරීමට සූදානම්වන ලෙස පංති සාමාජිකයෙකුගෙන් ඉල්ලීමට සහ ආදම් බිලි පූජාකිරීමේ (මෝසස් 5:5–9) වාර්තාව සංක්සේප කිරීමට සූදානම්වන ලෙස තවත් පංති සාමජිකයෙකුගෙන් ඉල්ලීමට ඔබට අවශ්‍යවිය හැකිය.

4. පහත සඳහන් දෘෂ්‍ය වීඩියෝ උපකරණ තිබේනම්, ඒවා පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

   අ. “වැටීම,” පරණ ගිවිසුමෙන් මිනිත්තු හයක කොටසක් වීඩියෝ ඉදිරිපත්කිරීම (53224).

   ආ. ආදම් සහ ඒවගේ පින්තූරය (62461; සුභාරංචි කලා පින්තූර මල්ල 101).

---

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**


**අවධානශීලී ක්‍රියාකාරකම**

පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාඩම ආරම්භකිරීම සඳහා පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

13 වෙනි පිටුවේ සටහන හුණු ලෑල්ලේ අඳින්න. “දිව්‍යමය සිදුවීම් තුන—සදාකාලික කුළුණු තුන” නිසා අපගේ ගැලවීමට හැකියාව සලස්වා ඇති බව, වැඩිමහල් බෘස් ආර්. මැක්කොන්කි ප්‍රකාශකල බව පංති සාමාජිකයන්ට කියන්න (*A New Witness for the Article of Faith* [1985], 81). ඉන්පසුව පහත සඳහන් ප්‍රශ්න අසන්න.

- ගැලවීමට හැකියාව සැලැස්වීමට “සදාකාලයේ කුළුණු” වීමට තරම් ප්‍රමාණවත්වූ යම් වැදගත් සිද්ධීන් මොනවාද? (මෙම කුළුණු වන්නේ මැවීම, වැටීම සහ වන්දිගෙවීම බව වැඩිමහල්

මැක්කොන්කි කීවේය. ඒවා සියල්ලම අපගේ ගැලවීම සඳහා වන දෙවියන්වහන්සේගේ සැලසුමේ කොටසක්වේ. *මැවීම, වැටීම සහ වන්දිගෙවීම* හුණු ලැල්ලේ කුළුණු තුනේ ලියන්න.




අපගේ අමරණීයත්වය සහ සදාකාලීන ජීවනය සිද්ධකිරීම සඳහා වැටීම ස්වර්ගික පියාණන් වහන්සේගේ සැලසුමේ වැදගත් කොටසක් වූයේ මන්ද යන්න ගැන තේරුම්ගැනීමට මේ පාඩම අපට උපකාරවත්වන බව පහදාදෙන්න (මෝසස් 1:39).

---

ශුද්ධ ලියවිලි සහ ඒවා යොදාගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධිත අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. ආදම් සහ ඒවගේ වැටීම සහ එමගින් ඔවුන්ට සහ අපට අත්වූ ප්‍රතිඵල**

මෝසස- 4; 5:10–11; 6:48–49, 55–56 උගන්වමින් සාකච්ඡාකරන්න.

ආදම් උයනේදී, ආදම් සහ ඒවට "බෝවී, වැඩිවෙමින්, පොළොව පූර්ණකිරීමට" දෙවියන්වහන්සේ ආඥාකලසේක. (මෝසස් 2:28). උන්වහන්සේ තවදුරටත් ඔවුන්ට, යහපත සහ නපුර දැනගැනීමේ ගසේ ගෙඩිය අනුභව නොකරන ලෙසටද ආඥා කලසේක (මෝසස් 3:17). ඔවුන් තහනම් ගෙඩිය අනුභව නොකරන තාක් කල්, ඔවුන්ට උයනේ සිටිය හැකි අතර, ඔවුහු නොමැරෙන්නෝය. නමුත් එසේම ඔවුන්ට වැඩිවීමේ ආඥාවට කීකරුවීමට හැකියාවක්ද නොලැබෙන්නේය (මෝසස් 5:11; 2 නිෆායි 2:23). ස්වර්ගික පියාණන්වහන්සේ ඔවුනට පණත් දෙක අතරින් එකක් තෝරාගැනීමට නිදහස් කැමැත්ත දුන්සේක.

මෝසස් 4:6–31 විස්තරයේ එන ආදම් සහ ඒවගේ වැටීම කෙටියෙන් නැවත කියවන්න, නැතහොත් එසේ කිරීමට පත් කල පංති සාමාජිකයාට කියන්න.

- ආදම් සහ ඒවට—සහ අපට වැටීම නිසා ඇතිවූ ප්‍රතිඵල මොනවාද? (බලන්න මෝසස් 4:22–29; 5:10–11; 6:48–49, 55–56; 2 නිෆායි 2:22–23; 9:6; උත්පත්ති 3:16–23.) මෙම ප්‍රතිඵලවලින් කිහිපයක් හුණු ලැල්ලේ ලැයිස්තුගත කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. වැටීම ගැන සඳහන් මෙම සත්‍යයන්ගෙන් බොහොමයක් ජෝසෆ් ස්මිත් අනාගතවක්තෘවරයා තුලින් නැවත පිහිටුවා ඇති අතර, සාමාන්‍යයෙන් ලෝකයා ඒ ගැන නොදන්නා බවද පෙන්වා දෙන්න.

  අ. ආදම් සහ ඒවට දරුවන් ලැබීමට හැකිවූ අතර, එමගින් අපට පොළොවට පැමිණ මැරෙන සුළු ශරීර ලබාගැනීමට ඉඩ ලැබින (මෝසස් 5:11; 6:48; 2 නිෆායි 2:23. 25).
  ආ. අපි ශාරීරික මරණය නැතහොත් භෞතික ශරීරය ආත්මයෙන් වෙන්වීම අත්දකින්නෙමු (මෝසස් 4:25; 6:48; 2 නිෆායි 9:6).
  ඇ. අපි ආත්මික මරණය නැතහොත් දෙවියන්වහන්සේගේ සම්මුඛයෙන් වෙන්වීම අත්දකින්නෙමු (මෝසස් 4:29; 6:49; 2 නිෆායි 9:6).
  ඈ. අපි දුක්ඛිතකම හෝ විපත අත්විඳින්නෝ වෙමු (මෝසස් 6:48; උත්පත්ති 3:16–17).
  ඉ. අපට පව්කිරීමට හැකියාව ඇත (මෝසස් 6:49, 55; 2 නිෆායි 2:22–23).

ඊ. පොළොව ශාපකර අපට වැඩකිරීමට සලස්වා ඇත (මෝසස් 4:23–25; උත්පත්ති 3:17–19).
උ. යහපත සහ නපුර හඳුනාගැනීම ඉගෙනගැනීමට අපට පුළුවන (මෝසස් 4:28; 6:55–56; 2 නිෆායි 2:23; උත්පත්ති 3:22).
ඌ. මැරෙන සුළු ජීවිතයේ සතුට අපට විඳිය හැකිය (මෝසස් 5:10; 2 නිෆායි 2:23, 25).
එ. අපගේ මුදාගැනීමේ සතුට දැනගැනීමට අපට පුළුවන (මෝසස් 5:11).
ඒ. සදාකාලික ජීවනය ලබාගැනීමට අපට පුළුවන (මෝසස් 5:11).

වැටීමේ මෙම ප්‍රතිඵල ගැන ඔබ සාකච්ඡාකරන විට, වැටීම අපට ප්‍රයෝජනවත් වන අන්දම ගැන අවධාරනය කරන්න. පසු-දවස්වල එළිදරව් පැහැදිලිකරන්නේ, මැවීමට පෙරදී පවා ස්වර්ගික පියාණන් වහන්සේ අදහස් කලේ, අපගේ පොළොවේ ජීවිතය පරීක්ෂාකිරීමේ සහ ඔප්පුකිරීමේ කාල සීමාවක් බවය. එවිට අපට වඩාත් උන්වහන්සේ මෙන් වීමට පුළුවන (ආබ්‍රහම් 3:24–26). අපි මැරෙන සුළු මිනිසුන් වී, වැටීම තුලින් හැකියාව සලස්වා දුන්, යහපත සහ නපුර අතරින් තෝරාගැනීමට හැකිවීමට එය අවශ්‍යවන්නේය.

- වැටීම නිවැරදිව තේරුම්ගැනීමෙන් මැරෙන සුළු කාලයේදී අපට උපකාරවත් වන්නේ කෙසේද?
- වැටීම දෙවියන්වහන්සේ කලින් දුටු බව සහ අපගේ ගැලවීම සඳහා එය අත්‍යාවශ්‍ය කොටසක් බව තේරුම්ගැනීම අපට වැදගත්වන්නේ මන්ද?
- ආදම් සහ ඒව ලවා තහනම් ගෙඩිය අනුභවකිරීමට සැලැස්වීමෙන් සාතන් බලාපොරොත්තුවුනේ, ඔහුට දෙවියන්වහන්සේගේ සැලැස්ම පරාජයකිරීමට හැකිවන බවය (මෝසස් 4:6). දෙවියන්වහන්සේගේ අරමුණු පරාජය කිරීමට සාතනගේ හැකියාව ගැන වැටීම පිළිබඳ වාර්තාවෙන් අපට උගන්වන්නේ කුමක්ද? (බලන්න ඊසහසී 3:1–2).

## 2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම අපව ශාරීරික සහ ආත්මික මරණයෙන් ගැලවීම ලබාදෙයි.

මෝසස් 5:14–15; 6:50–54, 57–62 උගන්වමින් සාකච්ඡාකරන්න.

ආදම් සහ ඒවගේ වැටීම ශාරීරික සහ ආත්මික මරණය ලෝකයට රැගෙන ආවේය. ශාරීරික මරණය නම්, අපගේ මැරෙන සුළු ජීවිතය අවසානයේදී සිදුවන ශරීරය ආත්මයෙන් වෙන්වීමය. ආත්මික මරණය නම්, දෙවියන්වහන්සේගේ සම්මුඛයෙන් වෙන්වීමය. එය සිදුවූයේ ආදම් සහ ඒව උයනෙන් පිටමං කර දැමූ විටදීය. අප විසින්ම මරණය ජයගැනීමට අපට නොහැකි බව පහදාදෙන්න. එම හේතුව නිසා, ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන් පොළොවට එවා, උන්වන්සේගේ වන්දිගෙවීමේ ජීවිත පරිත්‍යාගය තුළින් මරණයෙන් අපව මුදවාගැනීමට සැලැස්වූසේක. (ඇල්මා 22:14).

- ආදම් සහ ඒවගේ වැටීම ගැන අනාගතවක්තෘවරුන් උගන්වන විට, ඔවුහු නිතරම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම ගැනද උගන්වති (මෝසස් 5:10–15; 6:48–62; 2 නිෆායි (9::6–10). වැටීම සමග වන්දිගෙවීමද ඉගැන්වීම වැදගත්වන්නේ මන්ද? (අපගේ ගැලවීම සඳහා වන දෙවියන් වහන්සේගේ සැලසුම තුල වැටීම වෙනුවෙන්, වන්දිගෙවීම අත්‍යාවශ්‍ය විය. වැටීම සමග වන්දිගෙවීම ඉගැන්වීමෙන්, ශාරීරික සහ ආත්මික මරණයෙන් අපව මුදවාගන්නේ කෙසේදැයි තේරුම්ගැනීමට අපට උපකාරවත්වේ.)

  එස්රා ටැෆ්. බෙන්සන් සභාපතිවරයා මෙසේ කීවේය: "මුදවාගැනීමේ සැලැස්ම ආරම්භවිය යුත්තේ ආදම්ගේ වැටීමත් සමගය. මොරෝනායිගේ වචනවලින් 'ආදම් මගින් මිනිසාගේ වැටීම පැමිණියේය. තවද මිනිසාගේ වැටීම නිසා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැමිණිසේක.....එසේම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මිනිසාගේ මුදවාගැනීම පැමිණියේය' (මෝර්මන් (:12). මිනිසාට කුසගිනිවන තුරු ආහාර ඔහුට සැබැවින්ම අහාර රුචියක් ඇති නොවන්නාසේ, ක්‍රිස්තුස්වහන්සේ ඔහුට අවශ්‍යවන්නේ මන්දැයි ඔහු දැනගන්නා තුරු, ක්‍රිස්තුස්වහන්සේගේ ගැලවීම ගැන එනිසා ඔහුට ආශාවක් ඇති නොවන්නේය. වැටීම් සහ සියලුම මනුෂ්‍ය වර්ගයා මත එමගින් ඇතිවූ ප්‍රතිඵලය පිළිබඳ දහම යමෙක් තේරුම්ගෙන එය පිළිගන්නා තුරු, ඔහුට ක්‍රිස්තුස්වහන්සේ අවශ්‍ය මන්දැයි කිසිවෙක් ප්‍රමාණවත් ලෙස සහ නිසියාකාරව නොදනී" (in Conference Report, අප්‍රේ. 1987, 106 හෝ *Ensign*, මැයි 1987, 85).

- අපට ශාරීරික මරණයෙන් ගැලවීම ලැබෙන්නේ කෙසේද? (බලන්න 1 කොරොන්ති 15:20–22; 2 නිෆායි 2:8; 9:6. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම තුලින් අපි මරණයෙන් නැගිටුවනු ලබන්නෙමු.)

- ආත්මික මරණයෙන් අපට ගැලවීම ලැබෙන්නේ කෙසේද? (බලන්න මෝසස් 5:14–15; 6:50–52, 59; හීලමන් 14:15–18; ඩීසහසී 19:15–19. වන්දිගෙවීම නිසා, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල, පසුතැවිල්ල, බෞතීස්මය, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව, සහ පණත්වලට කීකරුකම තුලින් අපට පිරිසිදුවීමට හැකිවී, දෙවියන්වහන්සේ සමග ජීවත්වීමට සුදුසුකම ලැබෙන්නේය.)

මෝර්මන්ගේ පොතේ අනාගතවක්තෘවරයෙක්වූ යාකොබ්, ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීම තුලින් පැමිණෙන මුදවාගැනීම තුල ප්‍රීතිමත්විය (2 නිෆායි 9:10). මෙම කොටස කියවා ඔබගේ සාක්ෂිය සහ වන්දිගෙවීම තුලින් අපට ලැබෙන ආශිර්වාද ගැන ඔබගේ හැඟීම් කිහිපයක් බෙදාගැනීමට ඔබට අවශ්‍යවිය හැකිය. පංති සාමාජිකයන්ටද එසේ කිරීමට ආරාධනා කරන්න.

**3. ආදම් සහ ඒව මැරෙන සුළු ජීවිතය ආරම්භකරමින්, දරුවන් ලබමින්, ඔවුන්ට සුභාරංචිය සහ දෙවියන්වහන්සේට නමස්කාරකිරීම සහ කීකරුවීම ගැන උගන්වති.**

මෝසස් 5:1–9, 12 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ආදම් සහ ඒව ආදම් උයනෙන් පිටමංකල පසු ඔවුන් කුමක් කලේද? (බලන්න මෝසස් 5:1–5, 12). ආදම් සහ ඒවගේ ජීවිත, අද අපගේ ජීවිතවලට සමානවන්නේ කුමන ආකාරයෙන්ද? මෝසස් 5:1–9, 12න් මැරෙන සුළු ජීවිතවල අරමුණු ගැන අපට ඉගෙනගත හැක්කේ මොනවාද?

- මෝසස් 5:5–9 එන වාර්තාව නැවත කියවන්න. නැතහොත් එසේ කිරීමට පත්කල පංති සාමාජිකයාට කියන්න. ස්වාමීන්වහන්සේ ආදම්ට දුන් පණත කුමක්ද? (බලන්න මෝසස් 5:5.) බිලි පූජාකිරීමේ හේතුව පවා නොදැන ආදම් එසේ පූජා පිරිනැමුවේ මන්ද? (බලන්න මෝසස් 5:6.)

  අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් මෙසේ කීවේය, "දෙවියන්වහන්සේට කුමක් අවශ්‍යවුවද එය නිවැරදිය,...බොහෝ කාලයකට පසුව සිද්ධීන් එළිදරව්වන තුරු එහි හේතුව අපට නොපෙනේ" (*Teaching of the Prophet Joseph Smith*, තෝරා. Joseph Fielding Smith [1976], 256).

- සම්පූර්ණ හේතුව අපට තේරුම්ගැනීමට නොහැකිවුවද, අපි ස්වාමීන්වහන්සේගේ පණත්වලට කීකරුවිය යුත්තේ මන්ද? ඔබට සම්පූර්ණයෙන්ම තේරුම්ගැනීමට නොහැකි වුවද, පණතක් රැකීමෙන් ඔබ ආශිර්වාදිතවූයේ කෙසේද?

- ආදම් පිරිනැමූ බිලි පූජාවල අරමුණ කුමක්ද? (බලන්න මෝසස් 5:7–9. ඒවා ස්වර්ගික පියාණන්වහන්සේ තමන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන් පරිත්‍යාගකිරීමට සමාන හෝ ඒ ආකාරවේ. එවන් පරිත්‍යාග පිරිනැමීම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම තුලින් සියලුම මනුෂ්‍ය වර්ගයා ආදම්ගේ වැටීමෙන් මුදවාගැනීමට හැකි බව ආදම්ට සහ ඔහුගේ අනාගත පරම්පරාවට සිහිපත්කිරීමකි.) මෙම දහම සිහිපත්කිරීම සඳහා අපට දී තිබෙන්නේ කුමක්ද? වැටීම සහ වන්දිගෙවීමට අපි අපගේ කෘතඥතාවය පෙන්වන්නේ කෙසේද?

---

**අවසානය**

වැටීමේ ආශිර්වාද පිළිබඳ ඒවගේ සාක්ෂිය නැවත කියවන්න. (මෝසස් 5:11). ආදම් සහ ඒවගේ ක්‍රියාව වෙනුවෙන්, වැටීම වෙනුවෙන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම වෙනුවෙන්ද කෘතඥතාවය පළකරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

### 1. තහනම් ගෙඩිය අනුභවකිරීම පාපයක් නොවේ

ආදම් සහ ඒව තහනම් ගෙඩිය අනුභාවකිරීමෙන් ඔවුන් පාපයක් නොකල බව පැහැදිළිකිරීමට උපකාර සඳහා, වැඩිමහල් ඩැලින් එච්. ඕක්ස්ගේ පහත සඳහන් ප්‍රකාශය කියවන්නඃ

"මැරෙන සුළු ජීවිතයේ කොන්දේසි ගෙන ඒම සඳහා ආදම් උයනේ සීමාවන් පළමුවෙන්ම කඩ කලේ ඒවය. ඇයගේ එම ක්‍රියාව, කෙසේවෙතත් එහි ස්වභාවය අනුව මුලින් කල වැරැද්දකි. නමුත් සදාකාලික වශයෙන් සදාකාලික ජීවනයට යන මාර්ගයේ දොරටුව විවෘතකිරීමේ ශ්‍රේෂ්ඨ අවශ්‍යතාවයකි. ආදම්ද එසේ කිරීමෙන් සිය ප්‍රඥාව පෙන්වීය.

"…වැටීම වශයෙන් හැඳින්වෙන ශ්‍රේෂ්ඨ සිද්ධියේ ඒවගේ ක්‍රියාව අපි සමරමින්, ඇයගේ ප්‍රඥාව සහ නිර්භීතභාවයට ගරු කරන්නෙමු. වැඩිමහල් ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් මෙසේ කීවේයඃ 'මෙම වැටීම තුල ඒවගේ කොටස පාපයක් ලෙස මම කිසිදා කථානොකරමි. එසේම ආදම්ගේ ක්‍රියාවද පාපයක් ලෙස චෝදනා නොකරමි….මෙය නීතිය කඩකිරීමක් මිස පාපයක් නොවේ.'…

මෙම යෝජනාකර තිබෙන පාපය සහ නීතිකැඩීම අතර ඇති ප්‍රති විරුද්ධතාවය, දෙවන ඇදහිල්ලේ කරුණේ දක්ෂ වචනවලින් අපට සිහිපත්කරයිඃ "මිනිසුන්ට දඬුවම් ලැබෙන්නේ ආදම්ගේ වරද නිසා නොව, ඔවුන්ගේම පාප නිසාය." එහි නීතියේ ප්‍රියජනක වෙනසක් දෝංකාරවේ. මිනීමැරීම වැනි යම් ක්‍රියා, අපරාධවන්නේ ඒවා නෛසර්ගික වැරදි නිසාය. අනෙක් ක්‍රියා, බලපත්‍රයක් නොමැතිව රිය පැදවීම වැනි දේවල්, අපරාධ වන්නේ ඒවා නීතියෙන් තහනම්කර ඇති නිසාය. මෙම වෙනස අනුව, වැටීම ගෙනහැර දක්වන ක්‍රියාව පාපයක් නොවීය—නෛසර්ගිකව වැරදිය—නමුත් වරදකි—වරදක් වන්නේ මුලින්ම තහනම්කල නිසාය. මෙම වචන යම් දෙයක වෙනසක් ඇඟවීමට නිතරම පාවිච්චි නොකරන නමුත්, වැටීමට හේතුවූ තත්වයන් තුල මෙම වෙනස අර්ථවත් බවක් පෙනේ" (in Conference Report, ඔක්තෝ. 1993, 98; හෝ *Ensign*, නොවැ. 1993, 73).

### 2. වැටීමේ ප්‍රතිඵලය සහ වගකීම අතර වෙනස පැහැදිළි කිරීම

ආදම් සහ ඒවගේ පරම්පරා සියල්ලටම, ශාරීරික සහ ආත්මික මරණයද ඇතුළුව, වැටීමේ ප්‍රතිඵල උරුමවිය. නමුත් වැටීමේ වගකීම නොවේ. දෙවන ඇදහිල්ලේ කරුණ උගන්වන පරිදි, "මිනිසුන්ට දඬුවම් ලැබෙන්නේ ආදම්ගේ වරද නිසා නොව ඔවුන්ගේම පාපවලටය." මොරෝනායි 8:5–23ද බලන්න.

### 3. "නුඹගේ ආශාව නුඹගේ ස්වාමි පුරුෂයාට වන්නේය"

ස්වාමීන්වහන්සේ ඒවට කල ප්‍රකාශයන් ගැන පංති සාමාජිකයන්ට තේරුම්ගැනීමට පහත සඳහන් ප්‍රකාශයන් උපකාරවත්වේ. උන්වහන්සේ මෙසේ කීසේක, "නුඹගේ ආශාව නුඹගේ ස්වාමි පුරුෂයාට වන්නේය, එසේම ඔහු නුඹ පාලනයකරන්නේය" (මෝසස් 4:22).

ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාපතිවරයා මෙසේ කීවේයඃ "මට පාලනය යන වචනය ගැන ප්‍රශ්නයක් ඇත. එයින් වැරදි හැඟීමක් දෙයි. *මූලාසනය දැරීම* යන වචනය පාවිච්චිකිරීමට මා කැමතිවන්නේ, ඔහු කරන්නේ එය නිසාය. ධාර්මික ස්වාමි පුරුෂයෙක් ඔහුගේ බිරිඳ සහ පවුලේ මූලාසනය දරයි" ("The Blessings and responsibilities of Womanhood," *Ensign*, මාර්. 1976, 72).

වැඩිමහල් රසල් එම්. බැලඩ් මෙසේ කීවේයඃ "දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අනාගත වක්තෘවරුන් තුලින් එළිදරව්කර තිබෙන්නේ, මිනිසුන් පූජකවරය ලබා, පියවරුන් බවට පත්ව, මහත්මා ගතියෙන් සහ පිරිසිදුව, අව්‍යාජ ප්‍රේමයකින් යුතුව, ගැලවුම්කරුවාණන් සභාව මෙහයවන ලෙස, ඔවුන්ගේ පවුල් ධර්මිෂ්ඨකමින් මෙහෙයවා පෝෂණය කිරීමය" බලන්න එපීස 5:23)" ("Equality through Diversity," *Ensign*, නොවැ. 1993, 90).

# 5
වෙනි පාඩම

# "නුඹ හොඳින් කටයුතු කලහොත් නුඹ පිළිගනු ලබන්නෙහිය"

*මෝසස් 5:7*

---

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමට තෝරාගැනීමෙන් නිදහසට, සතුටට සහ සදාකාලික ජීවනයට මග පෙන්වන බවත්, සාතන්ව අනුගමනය කිරීමට තෝරාගැනීම, දුක්ඛිතබවට සහ වහල් භාවයට මග පෙන්වන බවත් තේරුම්ගැනීමට පංති සාමාජිකයන්ට උපකාර කිරීමය.

---

**සූදානම්වීම**

1. අනගි මුතුඇටය පොතෙන් පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. මෝසස් 5:16–41. කේන් දෙවියන්වහන්සේට වඩා සාතන්ට ප්‍රේමකරමින් ස්වාමීන්වහන්සේට පූජාවක් පිරිනැමීමට සාතන්ගේ අණට කීකරුවෙයි (5:16–19). ස්වාමීන්වහන්සේ කේන්ගේ පූජාව ප්‍රතික්ෂේපකර, කේන්ට පසුතැවීමට අණකරනසේක (5:20–25). කේන් සාතන් සමග ගිවිසුම්කර ආබෙල්ව මරයි (5:26–33). ස්වාමීන්වහන්සේ කේන්ට ශාපකර, කේන්ව ස්වාමීන්වහන්සේගේ සම්මුඛයෙන් වසා දමයි (5:34–41).

   ආ.මෝසස් 6:26–63. ඒනොක්, ආදම්ගේ හතරවන මී මුණුපුරා, ජනතාවට පසුතැවිල්ල දේශනාකිරීමට ස්වාමීන්වහන්සේ විසින් කැඳවනු ලබනසේක (6:26–36). ඒනොක් ස්වාමීන්වහන්සේගේ අණට කීකරුව ජනතාවට උගන්වයි (6:37–63).

   ඇ.මෝසස් 7:13, 17–21, 23–47, 68–69. ඒනොක්ගේ ඇදහිල්ල එතරම්ම බලවත්ව, කඳු ඉවත්ව යයි, ගංගාවල ගමන්මග වෙනස් වෙමින් ජාතීන් සියල්ලෝම බලවත්සේ බියවෙති (7:13, 17). ස්වාමීන්වහන්සේ සහ ඒනොක් පොළොව මත ජනයාගේ දුෂ්ටකම නිසා කඳුළු සලති (7:23–47). ඒනොක් නුවර වැසියෝ ස්වාමීන්වහන්සේ සමග එක් හදින් සහ එක් සිතින් සිටීමෙන්, මුළු නුවරම ස්වර්ගයට ඇදගනී (7:18–21, 68–69).

2. අමතර කියවීම්: මෝසස් 5:42–55; 6:10–23; 7:14–16, 59–64; 2 නිෆායි 2:25–27; උත්පත්ති 4:1–16.

---

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

පංතියට පෙර, පහත සඳහන් යුගල ප්‍රකාශ හුණු ලෑල්ලේ එක ලඟ ලියන්න.

| *1වෙනි යුගල* | *2වනි යුගල* |
|---|---|
| "මා දැනගත යුතු ස්වාමීන්වහන්සේ කවුද?" | "මෙන්න මාගේ දෙවියන්වහන්සේ සහ නුඹගේ දෙවියන්වහන්සේ." |
| "මා නිදහස්ය" | "නුඹ නුඹටම උපදෙස් දෙමින් ස්වර්ගයේ දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේපකරන්නේ මන්ද? |
| "මා මාගේ සහෝදරයාගේ රැකවලාද?" | "නුඹලා මගේ සහෝදරයන් වෙති." |

මෙම ලැයිස්තු දෙකේ ප්‍රකාශ පංති සාමාජිකයන්ට මෙම පාඩමෙන් ඉගෙනගැනීමට ලැබෙන මිනිසුන් දෙදෙනෙක් විසින් ප්‍රකාශකල බව ඔවුන්ට කියන්න. එක් එක් මිනිසාගේ ප්‍රකාශ දෙක පදනම්කරගෙන ඔහු ගැන කුමක් නිශ්චයකිරීමට හැකි දැයි පංති සාමාජිකයන්ගෙන් අසන්න. (පංත සාමාජිකයන් කුඩා කණ්ඩායම් ලෙස එකතුව ප්‍රකාශ ගැන සාකච්ඡාකිරීම ඔබට අවශ්‍යවිය හැකිය. මිනිත්තු පහක් හෝ හයක් පමණ, ප්‍රකාශ ගැන කණ්ඩායම් සාකච්ඡාකරන විට, කණ්ඩායමේ සාකච්ඡාව අනෙකුත් පංති සාමාජිකයන්ට සාරාංශයෙන් කියන ලෙස එක් කණ්ඩායමක එක් පුද්ගලයෙකුට කියන්න.)

පංති සාමාජිකයන් ප්‍රතිචාර දැක්වූ විට, පළවෙනි යුගලේ ප්‍රකාශ, සාතන් අනුගමනය කිරීම තෝරාගත්, කේන් විසින් කල බව පහදාදෙන්න. දෙවෙනි යුගලේ ප්‍රකාශ, ස්වාමීන්වහන්සේ අනුගමනය කිරීම තෝරාගත් ඒනොක් විසින් කළේය. එක් එක් මිනිසාගේ ප්‍රකාශවලින් දෙවියන්වහන්සේ පිළිබඳ ඔහුගේ ආකල්පය විදහා දැක්වේ.

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම**

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් සාකච්ඡාකරන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට අදාල අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

***1. කේන් සාතන් සමග ගිවිසුම් කරමින්, ආබෙල් මරා, ස්වාමීන්වහන්සේ විසින් ශාපකරනු ලබයි.***

මෝසස් 5:16–41 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ආදම් සහ ඒව ඔවුන් කලාක් මෙන් ඔවුන්ගේ පුතාවන කේන්ද ස්වාමීන්වහන්සේ අනුගමනයකරනු ඇතැයි බලාපොරොත්තු වෙති. නමුත් කේන් ඔහුගේ දෙමාපියන්ට සහ ස්වාමීන්වහන්සේටද "ඇහුම්කන් නොදී" මෙසේ අසයි, "මා දැනගත යුතු ස්වාමීන්වහන්සේ කවුද?" (මෝසස් 5:16.) කේන් ස්වාමීන්වහන්සේ වෙත දක්වන ආකල්පය ගැන මෙම ප්‍රශ්නයෙන් කුමක් පෙන්වා දෙන්නේද? දෙවියන්වහන්සේ දැනගැනීම සඳහා අප කුමක් කල යුතුද? (බලන්න ඇල්මා 22:17–18.)
- කේන් ස්වාමීන්වහන්සේට පූජාවක් කලේ මන්ද? (බලන්න මෝසස් 5:18.) කේන් ඔප්පු කලේ මොනවාද? (බලන්න මෝසස් 5:19.) ස්වාමීන්වහන්සේ ආබෙල්ගේ පූජාව පිළිගෙන, කේන්ගේ පූජාව ප්‍රත්ක්ෂේප කලේ මන්ද? (බලන්න මෝසස් 5:5, 20–23. ආදම් සහ ඒවට සහ ඔවුන්ගේ ළමයින්ටද ඔවුන්ගේ රැලවල් වල කුළුඳුලන් පූජාකරන ලෙස ස්වාමීන්වහන්සේ ඔවුන්ට අණකර තිබුනේක. ආබෙල් කීකරුවූ නමුත්, කේන් සාතන්ගේ වචනවලට ඇහුම්කන් දී, භූමියේ ඵලවලින් පූජාවක් ඔප්පු කළේය.) පූජාවන් ඔප්පුකිරීම ස්වාමීන්වහන්සේ අණකල ආකාරයට කිරීම වැදගත්වූයේ මන්ද?

  අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් මෙසේ ඉගැන්වීය: "ආබෙල් දෙවියන්වහන්සේට පූජාවක් ඔප්පුකල අතර, එය පිළිගනු ලැබින. එය රැලේ කුළුඳුලෙකි. කේන් භූමියේ ඵලයක් ඔප්පුකල අතර, එය පිළිගැනුනේ නැත. මන්ද ඔහුට එය ඇදහිල්ලෙන් කිරීමට නොහැකිවිය….මිනිසා වෙනුවෙන් වන්දිගෙවීම සඳහා ඒක ජාතකයාණන්ගේ ලේ සැලීම…මුදවාගැනීමේ සැලසුම විය,…තවද යම් වර්ගයක පූජාවක් පනවා තිබෙන විට, එමගින් දෙවියන්වහන්සේ සූදානම්කර තිබෙන ශ්‍රේෂ්ඨ පූජාවක් ගැන මිනිසා විසින් කල්පනාකල යුතුය; එයට විරුද්ධව පූජාවක් ඔප්පුකිරීම, ඇදහිල්ල ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමකි….; එහි ප්‍රතිඵලයක් ලෙස කේන්ට ඇදහිල්ල තිබීමට නොහැකිය; එසේම ඇදහිල්ලෙන් නොවන කුමක්වුවද, එය පාපයකි" (*Teaching of the Prophet Joseph Smith*, sel. Joseph Fielding Smith [1976], 58).

- ස්වාමීන්වහන්සේ කේන්ගේ පූජාව ප්‍රතික්ෂේපකර, ඔහුට පසුතැවිලිවීමට කැඳවූ විට, ඔහු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න මෝසස් 5:21, 26.) පසුතැවිලිවීමට කැඳවූවිට, සමහර අවස්ථාවලදී එය අපට අසීරුවන්නේ මන්ද? පසුතැවිලිවීමේ බලවත් ආශාවක් අපි වර්ධනය කරගන්නේ කෙසේද?
- තම සොහොයුරාව මරාදැමීමෙන් පසුව "මා නිදහස්" යයි කේන් කීවේය (මෝසස් 5:33). මා නිදහස් යයි කේන් කුමක් විශ්වාස කලේ දැයි ඔබ සිතන්නේද? දෙවියන්වහන්සේගේ පණත්වලට අකීකරුවීමෙන් සත්‍ය ලෙසම අපගේ නිදහස අඩුවන්නේ කෙසේද? කීකරුවීමෙන්

අපගේ නිදහස වැඩිවන්නේ කෙසේද?

- ආබෙල් කොහේදැයි ස්වාමීන්වහන්සේ විමසූවිට, කේන් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න මෝසස් 5:34.) අපගේ සහෝදරයාගේ රැකවලාවීම යනුවෙන් අදහස්වන්නේ කුමක්ද? (බලන්න 1 යොහාන් 3:11, 17–18.) අපගේ සහෝදරයාගේ සහ සොහොයුරියගේ රැකවලාවීමට අප හැකි මාර්ග මොනවාද?

  රොබට් එල්. සිම්ස්සන් සභානායකවරයා මෙසේ කීවේය: "ඔබගේ මිතුරා හුදකලාකිරීමට වර්තමාන ලෝකයා ඔබට කියයි. ඔහුට කැමති අන්දමින් යාමට සහ ඒමට ඔහුට අයිතියක් ඇත. සභාවට හෝ පූජකවරයේ රැස්වීමට පැමිණීමට ඒත්තුගැන්වීම හෝ නරක පුරුද්දක් ඉවත ලෑම නිෂ්ඵල දෙයක් සහ නුවුමනා බලකිරීමක් බව ලෝකයා ඔබට කියයි; නමුත් මම නැවතත් ස්වාමීන්වහන්සේගේ වචන තවත් වරක් කියමි: නුඹ නුඹගේ සහෝදරයාගේ රැකවලාවන අතර, නුඹ හැරී ආ විට, නුඹගේ සහෝදරයා ශක්තිමත්කිරීමට නුඹට යුතුකමක් ඇත" (in Conference Report, ඔක්තෝ. 1971, 114; හෝ *Ensign*, දෙසැ. 1971, 103).

- දෙවියන්වහන්සේ වෙනුවට සාතන්ව අනුගමනය කිරීමට තෝරාගැනීමේ ප්‍රතිඵලය ලෙස කේන්ට සිදුවූයේ කුමක්ද? (බලන්න මෝසස් 5:23–25, 36–41.) කේන්ගේ තෝරාගැනීම් ඔහුගෙන් පැවතෙන්නන්ට මෙන්ම ඔහුටද බලපෑවේ කෙසේද? (බලන්න මෝසස් 5:41–43, 36–41.) අපගේ ධර්මිෂ්ට හෝ අධර්මිෂ්ට තෝරාගැනීම් අපගේ පවුල් සාමාජිකයන්ට බලපාන්නේ කෙසේද?

**2. ඒනොක් ජනතාවට පසුතැවිල්ල දේශනාකරයි.**

මෝසස් 6:26–63 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ජනතාවට පසුතැවිල්ල දේශනාකරන ලෙස ස්වාමීන්වහන්සේ ඒනොක් කැඳවූ විට, ඒනොක් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න මෝසස් 6:31.) නියෝගය අනුව ඉදිරියට යන්නේ නම්, ස්වාමීන්වහන්සේ ඒනොක්ට පොරොන්දුවූයේ මොනවාද? (බලන්න මෝසස් 6:32–34.) ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ නායකයන් තෝරාගැනීම ගැන ඒනොක්ගේ කථාවෙන් අපට කුමක් ඉගෙනගත හැකිද? සාමුවෙල් 16:7ද බලන්න.) අප සුදුසු යයි හැඟීමක් අපට නොමැතිවුවද, ස්වාමීන්වහන්සේට සේවයකිරීම ගැන ඒනොක්ගෙන් අපට ඉගෙනගත හැක්කේ මොනවාද?

- එනොක් පසුතැවිල්ල දේශනාකිරීම ආරම්භකල විට, ජනතාව අමනාපවීම ගැන ඔබ අදහස් කරන්නේ කුමක්ද? (බලන්න මෝසස් 6:37; 1 නිෆායි 16:2; මොසායා 13:7 ද බලන්න.) ඔවුන් අමනාපයෙන් සිටියද, ඔවුන් දිගටම ඔහුට සවන්දුන්නේ මන්ද? (බලන්න මෝසස් 6:38–39. මුලදී ඔවුන් කුතුහලට පත් වුවද, ඉන්පසුව ඔහු දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් බව පසුව ඔවුන්ට අවබෝධ විය.) ජීවමාන අනාගතවක්තෘවරයා දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙකු බවට සාක්ෂියක් අපි ලබාගන්නේ කෙසේද? අනාගතවක්තෘවරයාගේ ඉගැන්වීම් ජනප්‍රිය නොවුනද, මෙම සාක්ෂිය ඔහුව අනුගමනය කිරීමට අපට උපකාරවත්වන්නේ කෙසේද?

- ඒනොක් ජනතාවට පසුතැවිල්ලට කැඳවීමේදී ඔහු ඉගැන්වූයේ සුභාරංචියේ කුමන දහමද? (බලන්න මෝසස් 6:47–63. ඔබ 4වෙනි පාඩමේදී මෙම පද සාකච්ඡාකර තිබේනම්, ඒවා නැවත කියවීම ඔබට අවශ්‍ය නොවේ.)

- අපි "[අප] ගේම නියෝජිතයා වීමට" ස්වාමීන්වහන්සේ අපට ඉඩදුන්සේක. (මෝසස් 6:56). මෙහි අදහස කුමක්ද? (තෝරාගැනීමේ බලය අපට ඇත.) අපගේ ගැලවීම සඳහා වන දෙවියන්වහන්සේගේ සැලසුමට නිදහස් කැමැත්ත අවශ්‍යවන්නේ මන්ද? (අපට නිදහස් කැමැත්ත අවශ්‍යවේ. එවිට අපගේ තෝරාගැනීම් ගැන අප වගකිව යුතුය.) සාතන්ව අනුගමනය කිරීමට තෝරාගැනීමෙන් අත්වන ප්‍රතිඵල මොනවාද? ස්වාමීන්වහන්සේව අනුගමනය කිරීමට තෝරාගැනීමෙන් අත්වන ප්‍රතිඵල මොනවාද? (බලන්න 2 නිෆායි 2:25–27.)

**3. ඒනොක් නුවර සිටි ජනතාව ස්වාමීන්වහන්සේ සමග එක හදකින් හා එක සිතකින් සිටි අතර, මුළු නුවරම ස්වර්ගයට ගනු ලැබීය.**

මෝසස් 7:13, 17–21, 23–47, 68–69 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ඒනොක්ගේ ශ්‍රේෂ්ට ඇදහිල්ල නිසා ස්වාමීන්වහන්සේ සිදුකල ආශ්චර්‍යයන් මොනවාද? (බලන්න මෝසස් 7:13.) අපගේ කාලයේ ජනතාවගේ ඇදහිල්ල නිසා ස්වාමීන්වහන්සේ සිදුකරන ආශ්චර්‍යයන් මොනවාද?
- ඒනොක්ගේ වචන අසා තම පාපවලට පසුතැවිලිවූ ජනතාව ආශිර්වාදිතවූයේ කෙසේද? (බලන්න මෝසස් 7:17–18.) ඔවුන්ගේ නුවර සයෝනය යයි හැඳින්වූයේ මන්ද? (බලන්න මෝසස් 7:18.) "එක හදකින් හා එක සිතකින් සිටීම" යන්නෙහි අදහස කුමක්ද? ස්වාමීන්වහන්සේ සමග එක හදකින් සහ එක සිතකින් සිටින්නන් බවට පත්වීම සඳහා අපට කල හැකි දේවල් මොනවාද?
- අවසානයේදී ඒනොක්ට සහ ඔහුගේ නුවර සිටි ජනතාවට සිදුවූයේ කුමක්ද? (බලන්න මෝසස් 7:19–21, 69.)
- ස්වාමීන් වහන්සේ හඬන බව මෝසස් 7:28න් ඒනොක් දුටුවේය. ස්වාමීන්වහන්සේ හැඬුවේ මන්ද? ඒනොක් ස්වාමීන්වහන්සේගේ හැඬීම ගැන ප්‍රශ්න කලේ මන්ද? (බලන්න මෝසස් 7:29–31.) ස්වාමීන්වහන්සේගේ පිළිතුරවූයේ කුමක්ද? (බලන්න මෝසස් 7:32–33, 36–37.) මෙම පද කියවන විට ස්වාමීන්වහන්සේ ගැන ඔබට ඇතිවන හැඟීම් මොවාද?
- ඒනොක් ජනතාවගේ දුෂ්ටකම් දුටු විට, ඔහුද හැඬුවේය. (මෝසස් 7:41, 44.) ස්වාමීන්වහන්සේ ඒනොක්ව සැනසුවේ කෙසේද? (බලන්න මෝසස් 7:44–47.)

ඒනොක් දර්ශනයකින් දුටු, පසු-දවස්වලදී සයෝනය (නව යේරුසලමද ඇතුළුව), ගැලවුම් කරුවාණන්ගේ දෙවන පැමිණීම, සහ පොලොව මත උන්වහන්සේගේ සහස්‍ර රාජ්‍ය පාලනයද නැවත පිහිටුවීම, ඉදිරි පාඩම්වලදී සාකච්ඡාකරන බව පංති සාමාජිකයන්ට පැවසීමට ඔබට අවශ්‍යවනු ඇත. (මෝසස් 7:62–65).

---

අවසානය

කේන් සාතන් අනුගමනය කිරීම තෝරාගෙන ඔහුගේ නපුරු ක්‍රියා ඔහුගේ දරුවන්ට සහ අනුගාමිකයන්ටද ඉගැන්වූ බව පෙන්වා දෙන්න. එහි ප්‍රතිඵලයක් ලෙස, කේන්ගෙන් පැවතෙන්නන් දුෂ්ඨකමින් වැඩී, ඔවුන්ගේ අධර්මිෂ්ඨකම නිසා දෙවියන්වහන්සේ විසින් ශාපකරනු ලැබූහ. ඊට ප්‍රතිවිරුද්ධව, ඒනොක් ස්වාමීන්වහන්සේ අනුගමනයකිරීම තෝරාගත්තේය. ඒනොක්ගේ තේරීම වූ ස්වාමීන්වහන්සේට කීකරුව, සවන් දුන් සැමටම සුභාරංචිය ඉගැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස, මුළු නුවරම එතරම්ම ධර්මිෂ්ඨයන් බවට පත්වීමෙන්, ඔවුන්ව දෙවියන්වහන්සේ සමග වාසයකිරීමට පොළොවෙන් ඉවත්කර ගැනින.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීමට අප කරන තේරීම්, අපව උන්වහන්සේට සමීපකවරමින් අපට නිදහසට, සතුටට සහ සදාකාලික ජීවනයට මග පෙන්වන බවට සාක්ෂිදරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස්වලින් එකක් හෝ ඊට වැඩියෙන් හෝ පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

1. **පවුලේ වාර්තා තබාගැනීම**


- ආදම් සහ ඒව සහ ඔවුන්ගෙන් පැවතෙන්නන් මතක සටහන් පොතක් සහ පෙලපත් පොතක් තබාගැනීම වැදගත්වූයේ මන්ද? (බලන්න මෝසස් 6:5–8, 45–46.) එවන් වාර්තා අද අපි තබාගැනීම වැදගත්වන්නේ මන්ද? ඔබගේ මුතුන්මිත්තන් ඔවුන්ගේ ජීවිත ගැන ලියූ වාර්තා ඔබට උපකාරවූයේ කෙසේද? ඔබගේ පවුලේ සාමාජිකයන්ට ඔබගේ ජීවිතය ගැන ලියවුන වාර්තාවන් උපකාරවන්නේ කෙසේද?
- ශුද්ධ ලියවිලි පවුල් වාර්තා ලෙස සැලකෙන්නේ කෙසේද? දෙමාපියන්ට සහ ගුරුවරුන්ට ඔවුන්ගේ දරුවන්ට ශුද්ධ ලියවිලි සාර්ථකව ඉගැන්විය හැක්කේ කෙසේද?

**2. ඒනොක් සහ කේන් සංසංදනය කිරීම**

පියවර යුගල දෙකක්, එකක් ඉහළට සහ එක් පහළට සිටින ලෙස හුණු ලැල්ලේ අඳින්න (21වෙනි පිටුවේ පින්තූරය බලන්න). ඉහළට යන පියවරවල් *දෙවියන්වහන්සේ වෙතට අපට මග පෙන්වන ආකල්පයක්* ලෙස ලේබලයක් අලවා, පළවෙනි පියවරේ ඒනොක්ගේ නම ලියන්න. පහළට යන පියවරවල් *අපට විනාශයට මග පෙන්වන ආකල්පයක්* ලෙස ලේබලයක් අලවා, පළවෙනි පියවරේ කේන්ගේ නම ලියන්න.

ඒනොක්ගේ පියවරවල පෙන්වා තිබෙන පළවෙනි පදය (මෝසස් 7:59) සහ කේන්ගේ පියවරවල පෙන්වා තිබෙන පළවෙනි පදයද (මෝසස් 5:16) පංති සාමාජිකයන් ලවා කියවන්න. ඉන්පසුව හුණු ලැල්ලේ අදාළ පියවරවල් මත මූලික වචන කිහිපයක් ලියන්න. ඉතිරි පියවරවලද එසේ ලියන්න. සියලුම වචන කියවා අවසන්වූ පසුව, ඒනොක්ගේ පියවරවල කොනේ *දෙවියන්වහන්සේ සමග වාසයකිරීම* කියා ලේබලයක් අලවා, කේන්ගේ පියවරවල කොනේ, *ආත්මික විනාශය* කියා ලේබලයක් අලවන්න., ඒනොක්ගේ වචන සහ ක්‍රියා, දෙවියන්වහන්සේ වෙතට සමීපවීම සඳහා ඔහුට උපකාරකල අන්දමත්, කේන්ගේ වචන සහ ක්‍රියා ඔහුව සාතන් වෙතට සමීපකල අන්දම ගැනත් සාකච්ඡාකරන්න.

- අපට ඒනොක්ගේ ආදර්ශය අනුගමනය කරමින් දෙවියන්වහන්සේ වෙතට සමීපවීමට හැක්කේ කුමන මාර්ගවලින්ද?




**3. "නුඹගේ දෙනෙත් ආලේපකරපන්න...එවිට නුඹට පෙනෙනු ඇත" (මෝසස් 6:35)**

යේසුස්වහන්සේ වරක් අන්ධ මනුෂ්‍යයෙක්ගේ දෙනෙත් පස්වලින් ආලේපකර එම මිනිසා සුවපත් කලසේක (යොහාන් (:1–7). ඒනොක් තවමත් ආත්මික ලෙස වර්ධනයවී නොතිබුන බැවින්, යම් කරුණු සම්බන්ධව ආත්මිකව අන්ධව සිටිනිසා, [ඔහුගේ] "දෙනෙත් පස්වලින් ආලේපකර, ඒවා සෝදාගැනීමට අණකරන ලදී" (මෝසස් 6:35).

- ඒනොක් මෙය කල විට ඔහු දුටුවේ කුමක්ද? (බලන්න මෝසස් 6:36) පස් සෝදාහැරීමේ සංකේතාත්මක ක්‍රියාවෙන් අපට උගන්වන්නේ කුමක්ද?
- දෙවියන්වහන්සේගේ කරුණුවලට අපගේ ඇස් වඩාත් සම්පූර්ණයෙන් විවෘතකිරීමට අපට කල හැකි දේවල් මොනවාද? ශුද්ධ ලියවිලිවල තිබෙන වටිනාකම අපට දැකීම සඳහා අප ශුද්ධ ලියවිලි අධ්‍යයනය දියුණුකර ගන්නේ කෙසේද?

4. **නොමග යන අපගේ ආදරණීය අය**

- ආදම් සහ ඒව ඔවුන්ගේ දරුවන්ට සුභාරංචිය ඉගැන්වුවද (මෝසස් 5:12), කේන් සහ අන් අය අධර්මිෂ්ඨව ජීවත්වීම තෝරාගත්හ. ආදරණීය අය නොමගයන විට එම වේදනාව දරාගැනීම සඳහා උපකාරවත්වීමට අප කුමක් කල යුතුද?

වැඩිමහල් රිචඩ් ජී. ස්කොට් මෙසේ උපදෙස් දුන්නේය:

"ඔබලා බොහෝ දෙනෙකුට ඔබගේ පුතෙක් හෝ දියණියක්, ස්වාමි පුරුෂයෙක් හෝ භාර්යාවක්, ධර්මිෂ්ඨකමින් ඈත්වී නපුර හඹායාම නිසා දැඩි කණගාටුවක් ඇතිවේ.

"ඔබගේ ජීවිතය දුක, වේදනාව, සමහර අවස්ථාවලදී, බලාපොරොත්තු කඩවීමෙන් පිරී ඇත. ඔබව ස්වාමීන්වහන්සේ විසින් සනසන අන්දම ගැන මම ඔබට කියමි.

"පළමුවෙන් ඔබ පදනම් මූලධර්ම දෙක හඳුනාගත යුතුය:

"1. ආදරණීය යමෙකුගේ අවශ්‍යතාවයකට උදව්කිරීම සඳහා ඔබට බොහෝ දේවල් කිරීමට තිබෙන අතර, ස්වාමීන්වහන්සේ විසින් කල යුතු සමහර දේවල්ද ඇත.

"2. එසේම, නිදහස් කැමැත්ත ධර්මිෂ්ඨව ක්‍රියාත්මත කිරීමෙන් තොරව, කිසිදු පවතින දියුණුවක් සිදුවන්නේ නැත. නිදහස නැතිකරගැනීමට උත්සාහ නොකරන්න. ස්වාමීන්වහන්සේම එය නොකරනසේක. බලහත්කාරකමෙන් ලබාගන්නා කීකරුකමට අශිර්වාදයේ ඵලදරා නොමැත (බලන්න ධීසහසී 58:26–33).

"ඔබට උපකාර කල හැකි මාර්ග හතක් මම යෝජනා කරමි.

"පළමුවෙන්, සීමාවකින් තොර ප්‍රේමය…දෙවනුව, නීති කැඩීමට නිදහසට කරුණු නොසොයන්න, නමුත් වරදකරුට බලාපොරොත්තු සහ සෑම උපකාරයක්ම දිගුකරන්න….තුන්වෙනිව, සත්‍යය උගන්වන්න… හතරවැනිව, අවශ්‍ය පරිදි නිතරම, අවංකවම සමාවදෙන්න….පස්වැනිව, විශ්වාසයෙන් යුතුව යාච්ඤාකරන්න. 'ධර්මිෂ්ඨ…මනුෂ්‍යයෙකුගේ උද්යෝගීමත් යාච්ඤාව බොහෝ ප්‍රයෝජනවත්වේ'(යාකොබ් 5:16)….

"හයවෙනිව, ප්‍රශ්න දෙස දර්ශනවාදීව බලන්න….උපකාර කිරීමට ඔබට ඇති සැටියෙන්ම හැකි දේවල් කිරීමෙන් පසුව, එම කරුණ ස්වාමීන්වහන්සේට බාරදී, තවදුරටත් ඒ ගැන කණගාටු නොවන්න. ඔබට තවදුරටත් කටයුතු කිරීමට නොහැකිවීම ගැන වරදක් නොසිතන්න. ඔබගේ ශක්තිය නිෂ්ඵල කණගාටුවකට වැය නොකරන්න….නිසි වේලාවට, ඔබට සිත් කාවැද්දීමක් ඇතිවී තවදුරටත් උපකාර දීම ගැන දැනගත හැකිය. ඔබට වඩාත් සමාදානයක් සහ සතුටක් ඇතිවී, ඔබට අවශ්‍ය අන් අය නොසලකා නොහැර, සදාකාලික දර්ශනය නිසා විශාල ලෙස උදව්කිරීමට හැකිවනු ඇත….

"*අන්තිම යෝජනාව*—ආදරණීය අයෙකුට උදව්කිරීම කිසිදා නොනවත්වන්න, කිසිදාක එය නොකරන්න!" (in Conference Report, අප්‍රේ. 1988, 69–71; හෝ *Ensign*, මැයි 1988, 60–61).

# 6
වෙනි පාඩම

# "නෝවා...ඔහුගේ නිවැසියන් ගලවාගැනීමට නැවක් සූදානම් කළේය"

*මෝසස් 8:19–30; උත්පත්ති 6:9; 11:1–9*

**අරමුණ** පංති සාමාජිකයන්ට සුදුසුව ජීවත්ව, ලෝකයේ නපුර වළක්වාගැනීමට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න:

   අ. මෝසස් 8:19–30; උත්පත්ති 6:5–22; 7:1–10. නෝවා සුභාරංචිය දේශනාකරන නමුත්, ජනතාව සවන් නොදෙයි (මෝසස් 8:19–25). ජනතාවගේ දුෂ්ඨකම නිසා, පොළොවේ සියලුම මනුෂ්‍යයන් විනාශකරන බව ස්වාමීන්වහන්සේ ප්‍රකාශකරනසේක (මෝසස් 8:26–30) උත්පත්ති 6:5–13). ස්වාමීන්වහන්සේ නෝවාට ආඥාකරමින්, නැවක් ගොඩනගා ඔහුගේ පවුලේ අය සහ පණ ඇති සෑම දෙයකින්ම දෙදෙනා බැගින් නැවට ගන්නා ලෙස කීසේක (උත්පත්ති 6:14–22; 7:1–10).

   ආ. උත්පත්ති 7:11–24; 8; 9:8–17. දහවල් හතලිහක් සහ රාත්‍රී හතලිහක් වර්ෂාව පවතී (7:11–12). නැවට ඇතුළු නොවූ ජනතාව සහ සතුන් සියල්ලෝ මියයති, තවද ජලය දින 150ක්ම පොළොව වසාගෙන සිටී (7:13–24). ජලය බැසගිය පසුව, නෝවා, ඔහුගේ පවුල සහ සත්තු නැවෙන් පිටවී ගිය අතර (8:1–19), නෝවා ස්වාමීන්වහන්සේට පූජා පිරිනමයි (8:20–22). ස්වාමීන්වහන්සේ නෝවා සමග උන්වහන්සේගේ ගිවිසුම් පිහිටුවා ගනිමින්, ගිවිසුමේ සංකේතයක් ලෙස දේදුන්නක් තබනසේක (9:8–17). සටහන, ජෝසෆ් ස්මිත් පරිවර්තනය 15වෙනි පදයෙන් සඳහන්වන්නේ ගිවිසුම දෙවියන්වහන්සේ සහ නෝවා අතර මිස, දෙවියන්වහන්සේ සහ සෑම ප්‍රාණියෙක්ම අතර නොවන බවය.

   ඇ. උත්පත්ති 11:1–9. ජලගැල්මෙන් පසුව පරම්පරා කිහිපයක, ජනතාව ස්වර්ගයට කුළුනක් ගොඩනැගීමට උත්සාහ කළහ (බාබෙල් කුළුන). ස්වාමීන්වහන්සේ ඔවුන්ගේ භාෂාව ව්‍යාකූල කළ බැවින්, ඔවුන්ට එකිනෙකා තේරුම්ගැනීමට නොහැකිව, ඔවුහු මුළු පොළොවේ සෑම තැනම විසිරී ගියහ.

2. අමතර කියවීම්: හේබ්‍රෙව් 11:17; මෝසස් 7:32–36.

3. පහත සඳහන් දෘෂ්‍ය උපකරණ තිබේ නම්, ඒවා කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය:

   අ. "නෝවා සහ ජලගැල්ම" ගැන කෙටි උපුටාගැනීමක්, *ආබ්‍රහම්/ආරම්භය* වීඩියෝ කැසට්පටය (53150).

   ආ. නැව ගොඩනැගීමේ පින්තූර (62053; සුභාරංචි කලා පින්තූර මල්ල 102); නෝවා සහ සතුන් සමග නැව (62305; සුභාරංචි කලා පින්තූර මල්ල 103); සහ මැවීම—ජීවමාන සතුන් (62483; සුභාරංචි කලා පින්තූර මල්ල 100).

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම** පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් එකක් (හෝ ඔබගේම එකක්) පාඩම ආරම්භකිරීම සඳහා පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

1. ඔබගේ පංති කාමරය අවශ්‍ය පරිදි විශාල නම්, පංති සාමාජිකයන් කිහිපදෙනෙකුට පේළියට කෙලින් සිටීමට කියා, ඔවුන්ගේ අත් පිටතට විහිදුවා එහි ඇඟිලි තුඩු ඔවුන් ලඟ සිටින අනෙක් පුද්ගලයාගේ අතේ ඇඟිලි තුඩුවලට ගැවෙන ලෙස තබාගන්න කියන්න. නෝවා ගොඩනැගූ නැවේ දිග ප්‍රමානය සෑදීම සඳහා අඩු වශයෙන් පංති සාමාජිකයන් 85 දෙනෙක් වත් මේ අන්දමට සිටගෙන සිටීම අවශ්‍යවන බව පහදාදෙන්න.

2. පාඩම අවසානයේදී පංති සාමාජිකයන් වඩාත් හොඳින් දන්නා නැව් හා සසඳාබැලීමට නෝවාගේ නැවේ ප්‍රමාණය බැලීමට උපකාර කරන්න.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා යොදාගන්නා අන්දම ගැන සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. පසුතැවිල්ලට නෝවා කල කැඳවීම ජනතාව ප්‍රතික්ෂේප කරති; නෝවා නැවක් ගොඩනගයි.**

මෝසස් 8: 19–30 සහ උත්පත්ති 6:5–22; 7:1–10 උගන්වමින් සාකච්ඡාකරන්න. (පංති සාමාජිකයන්ට "පිරිසිදු" සහ "අපිරිසිදු" සතුන් ගැන ප්‍රශ්නයක් තිබේ නම්, ලෙවී කථාවේ 11:1–31 ඔවුන්ට කියවීම ඔබට අවශ්‍යවිය හැකිය).

- සුභාරංචිය දේශනාකිරීමට ස්වාමීන්වහන්සේ නෝවා කැඳවූ අවධියේ ලෝකය කෙබඳුවීද? (බලන්න මෝසස් 8:20–22.) නෝවාගේ කාලයේ සිටි ජනතාව සහ අපේ කාලයේ ජනතාව අතර ඔබට දැකිය හැකි සමානාත්මතාවයන් මොනවාද? නෝවාගේ කාලයේ ජනතාවට විනාශය මගහරවාගැනීමට හැකිව තිබුනේ කෙසේද? (බලන්න මෝසස් 8:23–24.) අනාගතවක්තෘවරුන්ට සවන්දෙමින් ඔවුන්ව අනුගමනයකිරීම ආත්මික සහ ලෞකික විනාශය මගහරවාගැනීමට අපට උපකාරවත්වන්නේ කෙසේද?
- නෝවා නැවක් ගොඩනැගුවේ මන්ද? (බලන්න හේබ්‍රෙව් 11:7.) සභා නායකයන් අප හැමකෙනෙකුටම "පෞද්ගලික නැවක් ගොඩනැගීමට උපදෙස් දී ඇත (Conference Report, ඔක්. 1994, 36; හෝ *Ensign*, නොවැ. 1994, 29). අපව මෙන්ම අපගේ පවුල්වල අයවද ආත්මිකව ආරක්ෂාකිරීමට අපට කල හැකි දේවල් මොනවාද? ඔබගේ හැඟීම අනුව වර්තමානයේදී අපව ආරක්ෂාකිරීමට විශේෂයෙන්ම වැදගත්වන්නේ කුමන පණත්ද? (ඔබගේ සාකච්ඡාවේදී *තරුණයන් ශක්තිමත්කිරීම සඳහා* යන පත්‍රිකාව (34285) පාවිච්චිකිරීම ඔබට අවශ්‍යවිය හැකිය.)
- විපත්තියක් හෝ එවන් වෙනත් අවශ්‍යතාවයකදී ලෞකිකව සූදානම්වීම සඳහා අපට කල හැකි දේවල් මොනවාද? (පහත සඳහන් උපුටාගැනීම සහ 52වෙනි පිටුවේ වැඩිමහල් ටොම් පෙරීගේ උපුටාගැනීම බලන්න.) අප බොහෝ දෙනෙක් අත්‍යාවශ්‍ය සූදානම්වීම් කිරීම පසුවට කල්තබන්නේ මන්ද? දැන්ම සූදානම්වීමට අප වඩාත් කැපවිය යුත්තේ කෙසේද?

  එස්රා ටැෆ්. බෙන්සන් සභාපතිවරයා මෙසේ කීවේය, "ආහාර නිෂ්පාදනය සහ ගබඩාකිරීම්, නෝවාගේ කාලයේ නැවට ගොඩවුන ජනතාවට අවශ්‍යවූවා මෙන්, අද අපගේ ලෞකික සුභසාධනයටද අත්‍යාවශ්‍යවේ" (in Conference Report, ඔක්තෝ. 1987, 61; *Ensign*, නොවැ. 1987, 49).

  වැඩිමහල් ඩබ්ලිව්. දොන් ලැඩ් මෙසේ ඉගැන්වීය: "වර්ෂාව ආරම්භවූ විට, නැව ගොඩනැගීම ආරම්භකිරීමට ප්‍රමාදවූවා වැඩිය....අපි...ස්වාමීන්වහන්සේගේ ප්‍රකාශකයාට සවන්දීම අවශ්‍යවේ. අපි ස්ථිර ලෙසම සිදුවන දෙයට සූදානම්වීම සඳහා සන්සුන් ලෙස දිගටම ඉදිරියට යාම අවශ්‍යවේ. තැතිගැනීම හෝ බියවීම අපට අවශ්‍ය නොවේ. මන්ද අප ආත්මිකව සහ ලෞකිකව සූදානම්ව සිටී නම්, අප සහ අපගේ පවුලේ අය ඕනෑම ජලගැල්මකින් දිවි ගලවාගනු ඇත. අපගේ ක්‍රියා නොවෙනස් ලෙස සහ ස්ථිර ලෙස අනාගතය සඳහා සූදානම්ව තිබේ නම්, අපගේ නැව් ඇදහිල්ල නමැති සාගරයේ පාවෙමින් තිබෙනු ඇත" (in Conference Report, ඔක්තෝ. 1994, 37; හෝ *Ensign*, නොවැ. 1994, 29).

- නැව ගොඩනැගීමේදී නෝවා ප්‍රදර්ශනය කල ගුණාංග මොනවාද? (පිළිතුරුවලට, ඇදහිල්ල, කීකරුකම, සහ වෙහෙසවී වැඩකිරීම ඇතුළත්විය හැකිය.) මෙම ගුණාංග අප තුල ශක්තිමත්කිරීමට අපට හැකිවන්නේ කෙසේද?

  ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාපතිවරයා පැහැදිළිකල පරිදි නෝවා නැව හොඩනැගීමේදී, "වර්ෂාවක් සහ ජලගැල්මක සාක්ෂි එහි නොවීය....ඔහුගේ අනතුරු හැඟීම් බුද්ධි ගෝචර නොවන බවට සැලකින... වියලි බිමක හිරු බැබලෙමින් තිබියදී සහ සාමාන්‍ය පරිදි ජීවිත එහා මෙහා ගමන්කරද්දී නැවක් ගොඩනැගීම කෙතරම් මෝඩ කියාවක්ද! නමුත් කාලය ගතවිය.

නැව සෑදීම නිමවිය. ජලගැල්ම පැමිණියේය. අකීකරුවූවෝ සහ හිතුවක්කාරයෝ ගිලී මළහ. නැවේ ආශ්චර්යය එය ගොඩනැගීමට පසුබිම්වූ ඇදහිල්ල ප්‍රකාශයට විය" (*Faith Precedes the Miracle* [1972], 5–6).

**2. ස්වාමීන්වහන්සේ ජලගැල්මකින් පොළොව පිරිසිදු කලසේක.**

උත්පත්ති 7:11–24; 8; සහ 9:8–17 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ජලගැල්ම පැමිණිවිට සිදුවූයේ කුමක්ද? (බලන්න උත්පත්ති 7:23.) අප වටා ඇති නපුරෙන් අපව ගලවාගැනීමට උපකාර කල හැකි අද අපට තිබෙන "නැව්" (ආරක්ෂාවල්) මොනවාද? (ප්‍රතිචාර හුණු ලෑල්ලේ ලියා, මෙම "නැව්" පංති සාමාජිකයන්ව ආරක්ෂාකිරීමට උපකාරවත්වූ අන්දම ගැන ප්‍රකාශකිරීමට ඔවුන්ට ආරාධනාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. දිය හැකි ප්‍රතිචාරවලට, අපගේ නිවාස සහ පවුල්, මිතුරන්, දේවමාළිගා, සෙමිනරි පංති, සභා රැස්වීම්, යාච්ඤාව, ශුද්ධ ලියවිලි, ජීවමාන අනාගතවක්තෘවරු ඇතුළත්විය හැකිය.) මෙම "නැව්" තුළ ආරක්ෂාව සෙවීමට අන් අයට උදව්කිරීමට අපට හැකිවන්නේ කෙසේද?
- වර්ෂාව නැවතීමෙන් පසුව, නෝවා පරවියෙක් නැවෙන් පිටත් කලේ මන්ද? (බලන්න උත්පත්ති 8:8) පළමු දෙවතාවේදී ඔහු පරෙවියන් යැවූ විට සිදුවූයේ කුමක්ද? (බලන්න උත්පත්ති 8:8–11.) තුන්වැනි වතාවේදී සිදුවූයේ කුමක්ද? (බලන්න උත්පත්ති 8:12.)
- නැවෙන් පිටවූ පසුව නෝවා කල පළවෙනි ක්‍රියාව කුමක්ද? (බලන්න උත්පත්ති 8:20; ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 9:4ද බලන්න.) අපගේ අසීරු අවස්ථාවකදී ස්වාමීන්වහන්සේ අපට උපකාර කල විට, අපි උන්වහන්සේට අපගේ කෘතඥතාවය පෙන්වන්නේ කෙසේද?
- ජලගැල්ම අවසන්වීමෙන් පසුව දෙවියන්වහන්සේ අහසේ තැබුවේ කුමක්ද? (බලන්න උත්පත්ති 9:13.) දේදුන්නෙන් නියෝජනයවන දේ ගැන දෙවියන්වහන්සේ කීවේ කුමක්ද? (බලන්න උත්පත්ති 9:12–13, 16–17.) දෙවියන්වහන්සේ නෝවා සමග තැබූ ගිවිසුම කුමක්ද? (බලන්න උත්පත්ති 9:8–11, 15; ජෝසෆ් ස්මිත් පරිවර්තනය උත්පත්ති 9:21–22, 24ද බලන්න.)

**3. ජනතාව බාබෙල් කුළුණ ගොඩනැගුහ.**

උත්පත්ති 11:1–9 උගන්වමින් සාකච්ඡාකරන්න.

- නෝවාගෙන් පැවතෙන්නන් කුළුණක් ගොඩනැගීමට තීරණය කලේ මන්ද? (බලන්න උත්පත්ති 11:4.) ඔවුන් වෙනුවෙන් "නමක් සාදාගැනීම" මගින් ඔවුන්ට ඉටුකරගැනීමට අවශ්‍යවූයේ කුමක්ද? අප වෙනුවෙන් නමක් සාදාගැනීම සහ ක්‍රිස්තුස්වහන්සේගේ නාමය අප වෙත ගැනීම අතර තිබෙන වෙනස කුමක්ද? අප ක්‍රිස්තුස්වහන්සේගේ නාමය දරාගන්නා විට, අපි අප වෙත ගන්නා වගකීම් මොනවාද? බලන්න මොසායා 18:8–10.)
- ස්වර්ගයට කුළුනක් සෑදීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලය වූයේ කුමක්ද? (බලන්න උත්පත්ති 11:5–9.) අප විසින්ම හෝ මනුෂ්‍ය උපක්‍රම මගින් අපට ස්වර්ගයට යාමට නොහැකි මන්ද? ස්වර්ගයට යාමට ස්වාමීන්වහන්සේ අපට කියා දුන් මාර්ගය කුමක්ද?

---

අවසානය

බාබෙල් කුළුණ ගොඩනැගූ ජනයාට දඬුවම් කලේ, ඔවුන් ලෝකයේ උපක්‍රම මගින් ස්වර්ගයට ළඟාවීමට උත්සාහ කල නිසා බව පහදාදෙන්න. ඊට ප්‍රතිවිරුද්ධව නෝවා සහ ඔහුගේ පවුලේ අය ජලගැල්මෙන් ගලවාගනු ලැබුවේ ඔවුන් දෙවියන්වහන්සේගේ පණත් අනුව ජීවත්වූ නිසාය.

අපට ස්වර්ගයට ළඟාවී—අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ හා ජීවත්වීමේ එකම ක්‍රමය—නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය තුලින් පමණක් බවට සාක්ෂිදරන්න. නෝවා කළාක් මෙන්, ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල ඇතිව, අපගේ පාපවලට පසුතැවිලිවී, පූජනීය නියෝග ලබාගෙන, සහ අපගේ ජීවිතවල අවසානය දක්වාම දරාසිටිමින් අප ධාර්මිකව ජීවත්විය යුතුය. අපි මේ දේවල් කරන්නේ නම්, අපට නපුර ජයගෙන දෙවියන්වහන්සේගේ සම්මුඛයට යාමට හැකියාව ලැබෙනු ඇත.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස්වලින් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.


**1. නෝවාගේ දවස් ඒනොක් දර්ශනයකින් දකියි**

ඒනොක්, නෝවාගේ මුත්තා, නෝවාගේ පරම්පරාවේ දුෂ්ඨකම් සහ එහි ප්‍රතිඵලයවූ ජලගැල්ම ගැනද දර්ශනයකින් දුටුවේය. (මෝසස් 7:41–52). මෙම දුෂ්ඨකම් නිසා ශෝකයට පත්වූ ඒනොක්, නෝවා සහ ඔහුගේ ළමයින්ට දයාවන්තවන ලෙස ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලීය. ඒනොක්ට පොරොන්දුවක් දුන් ස්වාමීන්වහන්සේ, නැවතත් කිසිදාක උන්වහන්සේ ලෝකය ජලගැල්මකින් විනාශ නොකරන බව කීසේක. (මෝසස් 7:51). ස්වාමීන්වහන්සේ ඒනොක්ට තවත් පොරොන්දුවක් දෙමින්, නෝවා ඔහුගෙන් පැවතෙන්නෙකුවී, මෙසේ ඒනොක් ගේ වංශය ජලගැල්මට පසුව පවා පොළොවේ දිගටම ජීවත්වන බවද කීසේක. (මෝසස් 7:52; 8:2; 6, 8–9). ජලගැල්මෙන් පසුව ස්වාමීන්වහන්සේ නෝවා සමග තැබූ මෙම ගිවිසුම අළුත් කලසේක (උත්පත්ති 9:8–17; ජෝසප් ස්මිත් පරිවර්තනයේ 9 සහ 11වෙනි පදවලින් ඒනොක් සමග ස්වාමීන්වහන්සේ තැබූ ගිවිසුම ගැන සඳහන්කරන බව සලකන්න; ජෝසප් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 9:21–25ද බලන්න).

**2. ස්වාමීන්වහන්සේ ධර්මිෂ්ඨයන් ආරක්ෂාකරනසේක**

ධර්මිෂ්ඨකම නිසා නෝවා සහ ඔහුගේ පවුලේ අය ජලගැල්මෙන් ආරක්ෂාකලාක් මෙන්, ස්වාමීන් වහන්සේ බාබෙල් කුළුණ කාලයේ ධර්මිෂ්ඨ ජනතාවද ආරක්ෂා කලසේක. ඊතර් 1:1–5, 33–37හි සඳහන්වන ජෙරාද් සහ ඔහුගේ සහෝදරයාගේ කථාව සහ ඔවුන්ගේ භාෂාව ව්‍යාකුල නොකලේ මන්දැයි කෙටියෙන් සාකච්ඡාකරන්න.

**විවිධ නැව් සංසන්දනාත්මක ප්‍රමාණයන් (බලන්න අවධානශීලී ක්‍රියාකාරකම)**



# 7
වෙනි පාඩම

# ආබ්‍රහම්ගේ ගිවිසුම

*ආබ්‍රහම් 1:1–4; 2:1–11; උත්පත්ති 12:1–8; 17:1–9*

**අරමුණ**

ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද සහ වගකීම් ගැන තේරුම්ගැනීමට අපට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. ආබ්‍රහම් 1:1–4; 2:1–11; උත්පත්ති 12:1–8; 17:1–9 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න. ආබ්‍රහම් ධර්මිෂ්ටව දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලැබීමට සුදුසුව ජීවත්වීමට උත්සාහකරයි. දෙවියන්වහන්සේ ආබ්‍රහම් සමග ගිවිසුම්කරමින්, ඔහුට බොහෝ පරම්පරාවන් ලැබී ඔවුන්ට පොරොන්දු දේශයක් සහ පූජකවරයේ සහ සුභාරංචියේ ආශිර්වාද හිමිවන බවටද පොරොන්දුවනසේක.
2. අමතර කියවීම්: උත්පත්ති 15; දහම සහ ගිවිසුම 132:19–24, 29–32.
3. පහත සඳහන් දෘෂ්‍ය උපකරණ තිබේ නම්, පාඩමේ කොටසක් ලෙස ඒවා පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

   ආ. ධර්මදූතයන්ගේ පින්තූර (62611) සහ ප්‍රාදේශීය දේවමාළිගාවක්

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීමට පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

- ආදිපීතෘ ආශිර්වාදයක් යනු කුමක්ද?

  පළවෙනි සභාපතිත්වය මෙසේ කීවේය: "ආදි පීතෘ ආශිර්වාද [යනු] එය ලබාගන්නාගේ පෙළපත පිළිබඳ ආනුභාසම්පන්න ප්‍රකාශකිරීමක් මෙන්ම, ආත්මයාණන් විසින් මෙහෙයවීමේදී එය ලබන්නාගේ ජීවන ගමන ගැනද ආනුභාසම්පන්න අනාවැකි ප්‍රකාශයකි. එවන් ආශිර්වාද සමග, අනතුරු ඇඟවීම්, සහ අවවාදද දීමට ආදි පීතෘවරයා පෙළඹවීම් ලැබිය හැකිය....සියලුම පොරොන්දු ආශිර්වාද අවබෝධවීම අපගේ ස්වාමීන්වහන්සේ තුල ඇදහිල්ල මත රඳාපවතී (ස්ටේක් සභාපතිවරුන්ට යවන ලද ලිපිය, 28 ජූනි 1957; උපුටාගැනීම බෲස් ආර්. මැක්කොන්කි, *Mormon Doctrine,* 2 වන ප්‍රකාශනය [1966], 558).

- ඔබලාගෙන් කී දෙනෙක් ඔබගේ ආදි පීතෘ ආශිර්වාදය ලබා තිබේද? ආදි පීතෘ ආශිර්වාදයක් තුලින් අපගේ පෙළපත ගැන ප්‍රකාශවීම යන්නෙන් අදහස්වන්නේ කුමක්ද? (ආදි පීතෘවරයා අපගේ පෙළපත ගැන ප්‍රකාශකිරීමේදී, අප ආබ්‍රහම් අනාගතවක්තෘවරයා තුලින් එප්‍රායිම් සහ මනස්සේ හෝ ආබ්‍රහම්ගේ වෙනත් පැවතෙන්නන්ගෙන් පැවතෙන අය බව අපට එළිදරව් කරන්නේය.)

අප ආබ්‍රහම්ගෙන් පැවතෙන්නන් ලෙස අපට ලබාගත හැකි ආශිර්වාද සහ අපට තිබෙන වගකීම් ගැන මෙම පාඩමෙන් සාකච්ඡාවන බව පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. දෙවියන්වහන්වහන්සේ ආබ්‍රහම් සමග ගිවිසුම්කරනසේක**

ආබ්‍රහම් 1:1–4; 2:1–4; 2:1–11; සහ උත්පත්ති 12:1–8; 17:1–9 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ආබ්‍රහම් තරුණයෙකුව සිටියදී, ධර්මිෂ්ට පුද්ගලයෙකුවී දෙවියන්වහන්සේගේ ආශිර්වාදවලට සුදුසුව ජීවත්වීම ඔහුට අවශ්‍යවිය. ආබ්‍රහම් 1:2–4ට අනුව, ආබ්‍රහම් කැමතිවූයේ කුමන ආශිර්වාද ලැබීමටද?

- අබ්‍රහම්ට සහ ඔහුගේ පවුලට ඌර් නම් නුවර ඔවුන්ගේ නිවසින් පිටත්වී ඔවුන් විසින් නම් කල හරාන් දේශයට ගමන්කරන ලෙස දෙවියන්වහන්සේ නියමකලසේක (ආබ්‍රහම් 2:1–4). එහිදී ආබ්‍රහම් යාච්ඤාකර ලැබූ දර්ශනය තුලින් දෙවියන්වහන්සේ ඔහුට සහ ඔහුගේ පරම්පරාවට ආශිර්වාද කිරීමට ගිවිසුම් කලසේක. මෙය ආබ්‍රහම් ගිවිසුම නමින් හැඳින්වේ. මෙම ගිවිසුම තුලින් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දුවූ ආශිර්වාද මොනවාද? (බලන්න ආබ්‍රහම් 2:6–11; උත්පත්ති 12:1–8; 17:1–9. මෙම පොරොන්දුවලින් සමහරක් ඉටුවීම සඳහා ආබ්‍රහම්ට වසර ගණනාවක්ම බලාසිටීමට සිදුවූ බවත්, ඒවා අද පවා තවමත් ඉටුවෙමින් පවතින බවත්, පෙන්වාදීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

  ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද සංක්ෂේපකිරීමට පහත සඳහන් සටහන ඔබට උපකාරකරනු ඇත. 29වෙනි පිටුවේ පෙන්වා තිබන "වගකීම්" කොටස ලිවීමට ඉඩ තැබීම සඳහා, මෙහි ලුහුඬු සටහනක් හුණු ලැල්ලේ ලිවීම ඔබට අවශ්‍යවිය හැකිය.

| ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද සහ වගකීම් | | | |
|---|---|---|---|
| පොළොවේ ආශිර්වාද | ජීවත්වීම සඳහා පොරෝන්දු දේශයක් (ආබ්‍රහම් 2:6, 19; උත්පත්ති 12:7; 17:8) | ශ්‍රේෂ්ඨ පරම්පරාවක් (ආබ්‍රහම් 2:9–10; උත්පත්ති 12:2–3; 17:2, 4–6) | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය සහ ආබ්‍රහම්ට සහ ඔහුගේ පරම්පරාව සඳහා පූජකවරය (ආබ්‍රහම් 2:9–11; උත්පත්ති 17:7) |
| සදාකාලික සමාන්තරː | සෙලස්ටියල් රාජ්‍යය (ධ්සහසී 88:17–20) | සදාකාලික විවාහය සහ සදාකාලික වර්ධනය (ධ්සහසී 132:19–22) | උත්කර්ෂය සහ සදාකාලික ජීවනය (ධ්සහසී 132:23–24) |

### 2. ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද සහ වගකීම්වලට අපි උරුමක්කාරයෝ වන්නෙමු

සියලුම සභා සාමාජිකයන් ආබ්‍රහම්ගේ වංශයේ අය වෙති. එහි අදහස අපි ඔහුගෙන් පැවතෙන්නන් බවය. වැඩිමහල් ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් මෙසේ කීවේයː "සභාවේ සාමාජිකයන් බවට පත්වෙන විශාල ප්‍රමාණයක් ජෝසෆ්ගේ පුත්‍රයාවූ එප්‍රායිම් තුලින් ආබ්‍රහම්ගෙන් සෘජුවම පැවතෙන්නන්වේ. ආබ්‍රහම්ගෙන් සහ ඉශ්‍රායෙල්ගෙන් සෘජුවම පැවතෙන්නන් නොවන අය, එවැන්නන් බවට පත්විය යුතු අතර, ඔවුන් බෞතීස්මවී ස්ථිරවූ විට, ඔවුන්ව ගසට බද්ධකරනු ලැබ, සියලුම අයිතිවාසිකම් සහ වරප්‍රසාද උරුමක්කාරයන් වශයෙන් ඔවුන්ට හිමිවනු ඇත" ("How One May Become of the House of Israel," *Improvement Era*, ඔක්තෝ. 1923, 1149).

- ආබ්‍රහම්ගේ වංශයේ අය ලෙස, සභා සාමාජිකයෝ ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාදවලට සහ වගකීම්වලට උරුමක්කොරයෝ වෙති. මෙම ගිවිසුමට අප උරුමක්කාරයෝ වන්නේ කෙසේද? (අපි සභාවට බෞතීස්මවන විට, ආබ්‍රහම් ගිවිසුමේ *ගලවාගැනීමේ* පොරොන්දුව අප සඳහා අළුත්වේ. අප දේවමාළිගාව තුලදී මුද්‍රා ලබන විට, ආබ්‍රහම් ගිවිසුමේ *උත්කර්ෂය* අප සඳහා අළුත්වේ. ගිවිසුමේ ආශිර්වාද ලබාගැනීම සඳහා, අපි ඊට සම්බන්ධිත වගකීම් ඉටුකරමින් සුදුසුව ජීවත්වියයුතු වෙමු.)

  වැඩිමහල් බෲස් ආර්. මැක්කොන්කි මෙසේ පැහැදිළි කළේය.

  "ආබ්‍රහම් පළමුවෙන්ම බෞතීස්මය මගින් සුභාරංචිය ලබාගත්තේය (එය ගැලවීමේ ගිවිසුම වන්නේය); ඉන්පසුව ඔහු තමා මත උසස් පූජකවරය දානයකරගෙන, සෙලස්ටියල් විවාහයට ඇතුළත්විය (එය උත්කර්ෂයේ පොරොන්දුව වන්නේය). එමගින් ඔහු සදාකාලික දියුණුව

ලබාගැනීමේ සහතිකය ලබාගත්තේය; අවසන් වශයෙන් මෙම සියලුම ආශිර්වාද ඔහුගේ මැරෙන සුළු පරම්පරාවේ සියල්ලන්ටම පිරිනමන පොරොන්දුව ඔහු ලබාගත්තේය. (ආබ්‍ර. 2:6–11; ඩී. සහ. සී 132:29–50.) ආබ්‍රහම් ලැබූ මෙම දිව්‍යමය පොරොන්දුවලට, ක්‍රිස්තුස්වහන්සේ ඔහුගේ පෙළපත තුළින් පැමිණෙන පොරොන්දුව සහ ආබ්‍රහම්ගේ පරම්පරාවට කිසියම් තෝරාගැනීමක්වන, සදාකාලික උරුමය ලෙස පොරොන්දු දේශයන් ලබාගැනීමේ සහතිකයද ඇතුළත්වේ (ආබ්‍ර. 2; උත්පත්ති 17; 22:15–18; ගලාති 3.)

"මෙම සියලුම පොරොන්දු එකට එක්වූ විට එය *ආබ්‍රහම් ගිවිසුම* යයි හැඳින්වේ. මෙම ගිවිසුම ඊසාක් සමගද (උත්ප. 24:60; 26:1–4, 24) සහ නැවතත් යාකොබ් සමගද අළුත්කරන ලදී. (උත්පත්ති 28; 35:9–13; 48:3–4.) *එහි ඇතුළත් පෞද්ගලික උත්කර්ෂයට සහ සදාකාලික දියුණුවට අදාළවන එම කොටස් සෙලස්ටියල් විවාහයේ නියමයන්ට ඇතුළත්වන ඉශ්‍රායෙල් නිවසේ සියලුම සාමාජිකයන්ට අළුත්කරනු ලැබේ;* එම නියමය තුළින් සහභාගිවන පාර්ශවයන්, ආබ්‍රහම්, ඊසාක් සහ යාකොබ්ගේ ආශිර්වාදවල උරුමක්කරුවන් බවට පත්වේ. (ඩී සහ සී 132; රෝම. 9:4; ගලා. 3:4.) Mormon Doctrine, 2වන ප්‍රකා. [1966], 13).

- ආබ්‍රහම් ගිවිසුම තුළින් අපට ලබාගත හැකි ආශිර්වාද මොනවාද? (මුල් සටහනේ පෙන්වා තිබෙන පරිදි අබ්‍රහම්ට ලැබුන සියලුම ආශිර්වාද අපටද ලබාගත හැකිය. මෙම ආශිර්වාදවලට සුභාරංචිය, පූජකවරය, උත්කර්ෂය, සහ සදාකාලික පවුල් සම්බන්ධතාවයන් ඇතුළත්වේ.)
- ආබ්‍රහම් ගිවිසුමේ උරුමක්කරුවන් ලෙස අපගේ වගකීම් මොනවාද? (බලන්න ආබ්‍රහම් 2:9, 11; උත්පත්ති 18:19. මියගිය හෝ ජීවත්වන, දෙවියන්වහන්සේගේ සියලුම දරුවන්ට, සුභාරංචියේ සම්පූර්ණ ආශිර්වාද ලබාගැනීමට අප උපකාරකල යුතුය. අපි දෙවියන්වහන්සේගේ පණත්වලටද කීකරුවිය යුතුය.)

28වෙනි පිටුවේ සටහන ඔබ හුණු ලැල්ලේ ලියා තිබේ නම්, පහත සඳහන් පරිදි අපගේ වගකීම් ලැයිස්තුගත කරමින් සටහනට යටින් තවත් කොටසක් එකතුකරන්න:

| | | |
|---|---|---|
| වගකීම් | සුභාරංචියේ සම්පූර්ණ ආශිර්වාද ලබාගැනීමට දෙවියන්වහන්සේගේ දරුවන් සියල්ලන්ටම උපකාරකරන්න (ආබ්‍රහම් 2:9, 11) | දෙවියන්වහන්සේගේ පණත්වලට කීකරුවන්න (උත්පත්ති 18:19) |

- සුභාරංචිය ලබාගැනීමට අපි අන් අයට උපකාර කරන්නේ කෙසේද? (ධර්ම දූත කටයුතු කිරීම මගින්, මියගිය අය සඳහා දේවමාළිගා නියෝග ඉටුකිරීම මගින්, සහ ධර්මිෂ්ටබවින් ආදර්ශමත් වීමෙන්ය. දේවමාළිගා සහ ධර්ම දූතයන්ගේ පින්තූර පෙන්වීම ඔබට අවශ්‍යවිය හැකිය.)

එස්රා ටැෆ්. බෙන්සන් සභාපතිවරයා මෙසේ කීවේය: "ආබ්‍රහම් වංශයේ වගකීම වන, එනම් අපි, 'මෙම දූත මෙහෙය සහ පූජකවරය සියලුම ජාතීන් වෙතට ගෙනයාමට ධර්මදූතයන්වීමය' (ආබ්‍රහම් 2:9)" (in Conference Report, අප්‍රේ, 1987, 107: හෝ *Ensign,* මැයි 1987, 85).

අන් අය සමග සුභාරංචිය බෙදාගැනීමේ අපගේ වගකීම ගැන අවධාරනය කිරීමට වැඩිමහල් බොයිඩ් කේ. පැකර් පහත සඳහන් සමතුලිතතාවය ප්‍රකාශ කළේය:

කොට්ඨාශයේ සාමාජිකයන් සඳහා විනෝදගමනක් සැලසුම් කිරීමට අපගේ සභානායකවරයා අපව පත්කර තිබෙන බව සිතින් මවාගන්න. එය කොට්ඨාශයේ ඉතිහාසයේ හොඳම ක්‍රියාකාරකම විය යුතු අතර, එයට යන මුදල ගැන අප සැලකිලිමත් නොවිය යුතුය. රට තුළ තිබෙන අලංකාර විනෝද ස්ථානයක් අපි වෙන් කරන්නෙමු. ඒ සියල්ලම අප සඳහාමය.

දිනය ලඟාවෙයි, සෑම දෙයක්ම සම්පූර්ණය. මේස ලැහැස්තිකර ඇති අතර, භෝජනය විශිෂ්ටය. ඉන්පසුව, කෑම ආශිර්වාදකරන විටම, පරණ කාරයක් විනෝද උයනට හරවා ශබ්ද නගා නවතියි. කණගාටුවට පත් මිනිසෙක් වහලය ඔසවන විට, හුමාලයක් පිටතට එයි. ළමයින් කිහිප දෙනෙක් කාරයෙන් පිටතට පැමිණෙති. අවිනිශ්චිතවූ මවක් අසල ඇති මේසයක් වෙත පෙට්ටියක් රැගෙන යයි. ඉතිරිවූ ආහාර ස්වල්පයක් එයට දමන ඇය, ඒවා කුසගින්නෙන්

පෙළෙන ළමයින්ට අහාර වේලාවක් මෙන් පෙනීමට සලස්වයි. නමුත් ප්‍රමාණවත් ලෙස එහි නොමැත.

ඉන්පසුව එක් කුඩා දැරියක් අපගේ මේසය දකියි. ඇය සිය කුඩා සොහොයුරාව අප දෙසට අදිමින් ඇයගේ හිස ඔබත් මාත් අතරින් ඉදිරියට දමයි. අපි පසෙකට හැරෙන්නෙමු. කුඩා දැරිය මෙසේ කියයි, "මේ බලන්න, මම කැමතියි එහි රස කුමක්දැයි බලන්න."

අප කළ යුත්තේ කුමක්ද? අපි ඔවුන්ව නොසලකා හරිනවාදද, නැතිනම් ඔවුන්ට නිහඬව සිටින ලෙස කියනවාද? අපි ඔවුන්ව නැවතත් ඔවුන්ගේ මේසය වෙත යවා, අපට සැබවින්ම අවශ්‍ය නොවන අහාර ස්වල්පයක් ඔවුන්ට දෙනවාද? නැතහොත් අපත් සමග එක්ව, අප අතර හිඳගෙන භෝජනය බෙදාගැනීමට ඔවුන්ට ආරාධනාකර, ඔවුන්ගේ වාහනය සාදාගැනීමට උදව්වීමට අපට ඉඩදීමට කියා, ඔවුන්ගේ ගමන සඳහා යමක් ඔවුන්ට දෙනාවාද?

වැඩිමහල් පැකර් මෙසේ ඇසීයඃ "එම කුසගිනි ළමයින්ට ආහාර කොපමණ ප්‍රමාණයක් දීමට අපට හැකිදැයි සොයා බලනවාට වඩා වැඩි වෙනත් පවිත්‍ර විනෝදයක් තවත් තිබිය හැකිද? ඔවුන්ගේ වාහනය සාදාගැනීම සඳහා [ඔවුන්ට] උදව්කිරීමට අපගේ උත්සවයට බාදා කරගැනීමට වඩා සතුටක් තවත් තිබිය හැකිද?...

"...ලෝකය මුළුල්ලේම මෙන්ම අප අවටද—අපගේ අසල්වැසියන්, අපගේ මිතුරන්, අපගේම පවුල්වල යම් අයද—ආත්මිකව කථාකිරීමේදී, මන්ද පෝෂණයෙන් පෙළෙන අය සිටිති. ඔවුන්ගෙන් සමහරෙක් කුසගින්නෙන් මියයති! අපි මේ සියල්ලම අප ලඟම තබාගතහොත්, එම කුසගින්නෙන් සිටින්නන් ඉදිරියේ අහාර ගැනීමේ අසමානතාවයක් නොමැත" (in Conference Report, අප්‍රේ. 1984, 59–61; *Ensign*, මැයි 1984, 41–42).

- මෙම සමතුලිතතාවය තුලින් සුභාරංචියේ ආශිර්වාද ලබාගැනීමට වෙනත් අයට උපකාර කිරීමේ අපගේ වගකීම ගැන උගන්වන්නේ කුමක්ද? සුභාරංචියේ පූර්ණත්වයෙන් අපි ආශිර්වාද ලබා ඇත්තෙමු. එය ලෝකයා දන්නා භෝජන සංග්‍රහවලින් උතුම්ම එකය. [ඩීසහගී 58:8–12]. දෙවියන්වහන්සේගේ අපේක්ෂාව අප මෙම ආශිර්වාද ජීවත්වන සහ මියගිය අන් අය සමග බෙදාගැනීමය.
- අපගේ ආදි පීතෘ ආශිර්වාද තුලින් පෙළපත ගැන කරන ප්‍රකාශය ආබ්‍රහම් ගිවිසුමේ උරුමක්කරුවන් වශයෙන් අපගේ වගකීම් ඉටුකිරීමේ කැඳවීමක් වන්නේ කෙසේද? (අප ආබ්‍රහම් වංශයේ අය ලෙස ප්‍රකාශකිරීම මගින්, අපගේ ආදි පීතෘ ආශිර්වාද නැවතත් අවධාරනය කරන්නේ, ආබ්‍රහම් ගිවිසුමේ වරප්‍රසාද ලබාගැනීම සහ එහි වගකීම් ඉටුකිරීම අපගේ යුතුකම බවය.)

---

**අවසානය**

අබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද ගැන සාක්ෂිය දරන්න. මෙම ගිවිසුමේ උරුමක්කරුවන් වශයෙන් පංති සාමාජිකයන්ගේ වගකීම් ඉටුකිරීම සඳහා ඔවුන්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. එය පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**ලෝකයේ ජීවත්වීමේ අභියෝගය**

පැරණි ඉශ්‍රායෙල්වරුන්ව බොහෝ ජාතීන් වටකරගෙන සිටි අතර, එම ජනතාව සත්‍ය දෙවියන් වහන්සේ තුල විශ්වාස නොකළහ. මෙම ජාතීන්ට ඇසිරියන්වරු, බාබිලෝනිවරු, මිසරවරු, සහ අන් අය ඇතුළත්වූ බව පහදා දෙන්න. ( බයිබලයේ ජේම්ස් රජතුමාගේ අනුවාදයේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ ප්‍රකාශනයේ 2වන සිතියම පංති සාමාජිකයන් ලවා බැලීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

- ස්වාමීන්වහන්සේ තමන්වහන්සේගේ ගිවිසුම් ජනතාව හුදකලාව ජීවත්වීම වෙනුවට ඔවුන්ව පැරණි ලෝකය මධ්‍යයේ දැමීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (බලන්න ද්වීතීය කථාව 4:6–8. උන්වහන්සේට අවශ්‍යවූයේ ඔවුන් අන් අයට ආදර්ශමත්ව, සියලුම ජාතීන්ට ආශිර්වාදකිරීම සඳහා ආබ්‍රහම් ගිවිසුම ඉටුකිරීමය.)

පරණ ගිවිසුමේ බොහෝ කථාවල ස්වාමීන්වහන්සේගේ ජනතාව ඔවුන්ගේ ගිවිසුම් ඉටුකරමින් අන් අය ධර්මිෂ්ඨකමට පෙළඹවීම ගැන සාර්ථකත්වය හෝ අසමත්කම හෝ පෙන්වන බව පහදාදෙන්න. ආබ්‍රහම්, යාකොබ්, දානියෙල්, එස්තර්, සහ වෙනත් බොහෝ අය ධාර්මික පෙළඹවීම් ලද අයවෙති. සැම්සන්, අහබ්, වනාන්තරයේ සංචාරය කල ඉශ්‍රායෙල් දරුවන් සහ අන් අය ඔවුන්ව පෙළඹවීමට ලෝකයාට පාලනයකිරීමට ඉඩදුන්හ.

පැරණි ඉශ්‍රායෙල්වරුන්ට කලාක් මෙන්, ස්වාමීන්වහන්සේ, උන්වහන්සේගේ පසු-දවස්වල ගිවිසුම් ජනාතාවූ අපව ලෝකයා මධ්‍යයයේ තැබූසේක. අපව අධර්මිෂ්ඨ මාර්ගයේ ගමන්කිරීමට පෙළඹවීමට ලෝකයාට ඉඩදීම වෙනුවට, අපගේ අභියෝගය වන්නේ ධර්මිෂ්ඨ මාර්ගවල යාමට ලෝකයා පෙළඹවීමය.

# දුෂ්ඨ ලෝකයක ධර්මිෂ්ටව ජීවත්වීම 8

වෙනි පාඩම

*උත්පත්ති 13–14; 18–19*

**අරමුණ**

දුෂ්ඨකම වැඩිවන කාලයන් තුලදී ධර්මිෂ්ඨ ප්‍රමිතීන් තදින්ම අල්ලාගෙන සිටීමට අධිෂ්ඨාන කරගැනීමට පංති සාමාජිකයන් ශක්තිමත්කිරීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න. සටහනඃ උත්පත්ති 17:5 ස්වාමීන්වහන්සේ ආබ්‍රම්ගේ නම ආබ්‍රහම් වශයෙන් වෙනස්කිරීම ගැන කියයි. ආබ්‍රහම් නම මෙම පාඩම මුළුල්ලේම භාවිතාවේ.

   අ. උත්පත්ති 13. කනාන් දේශයේ ඇතිවූ සාගතය නිසා මඳ කාලයක් මිසරයේ ජීවත්වූ පසුව, ආබ්‍රහම් සහ ඔහුගේ පවුල කනාන් දේශයට නැවත පැමිණෙති. ආබ්‍රහම් හෙබ්‍රන් නුවර වාසයකල අතර ඔහුගේ බෑණාවූ ලොත් සොදෙම අසල පදිංචිවෙයි.

   ආ. උත්පත්ති 14ඃ 1–2, 8–24. රජවරු හා කල සටන් වලදී ලොත්ව අල්වාගෙන ගිය අතර ආබ්‍රහම් විසින් ගලවාගනු ලබයි (14:1–2, 8–16). ආබ්‍රහම් මෙල්කිසදෙක්ට දශයෙන් කොටස ගෙවන අතර යුද්ධයෙන් නාස්තිවූවන් සොදමේ රජතුමාගෙන් පිළිගැනීම ප්‍රත්ක්ෂේප කරයි (14:17–24).

   ඇ. උත්පත්ති 18:16–33; 19:1–29. ජනතාවගේ දුෂ්ඨකම් නිසා සොදෙම සහ ගොමොරා විනාශකරන බව ස්වාමීන්වහන්සේ නිවේදනය කරනසේක (18:16–26). ධර්මිෂ්ඨ ජනතාව නගර තුල ජීවත්වන බව උන්වහන්සේට සම්භවේ නම්, ඒවා ඉතිරිකරන ලෙස ආබ්‍රහම් ස්වාමීන්වහන්සේට ආයාචනාකරයි (18:23–33). ලොත්ට සහ ඔහුගේ පවුලට සොදොමෙන් පිටවන ලෙස අණකරනු ලබයි. (19:1–23); ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ, උත්පත්ති 19:11–13හි සඳහන්වන්නේ ලොත් සිය දූවරුන් සොදොමේ මිනිසුන්ට බාර නොදී ඒ වෙනුවට ඔහු මිනිසුන්ගෙන් තම දූවරුන් ආරක්ෂා කිරීමට උත්සාහකල බවය.) ස්වාමීන්වහන්සේ සොදොම සහ ගොමොරා විනාශකලසේක (19:24–29).

2. අමතර කියවීම්ඃ උත්පත්ති 12; ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 14ඃ 25–40; 19:9–15.

3. ඔබ අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, අළුත්ම පුවත්පතක් පංතියට රැගෙන එන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

අළුත්ම පුවත්පතක් පංතියට පෙන්වන්න. විශේෂ පුවත්වලට කාලය ගත නොකර, අපව අධර්මිෂ්ඨ බලපෑම්වලින් වටවී තිබෙන අන්දම ගැන අදහස් දක්වන්න. දුෂ්ඨකම අප සියල්ලන්ම වටා තිබුනද, මෙම පාඩම ධර්මිෂ්ඨව සිටීමේ වැදගත්කම ගැන කියවෙන බව පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, ඒවා දිනපතා ජීවිතය යොදාගන්නා අන්දම ගැන සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්ම සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. ආබ්‍රහම් සහ ඔහුගේ පවුල හේබ්‍රොම්වල වාසයකරන අතර, ලොත් සහ ඔහුගේ පවුල සොදෙම අසල වාසයකරති.**

උත්පත්ති 13 උගන්වමින් සාකච්ඡාකරන්න.

ආබ්‍රහම්ගේ ජීවිතයේදී මෙම ස්ථානයට ඔහු ගමන්කිරීම ගැන කෙටි ආවර්ජනයක් කිරීම ඔබට අවශ්‍යවනු ඇත. ඔහු හැදී වැඩුනේ ඌර් නම්වූ කල්දිවරුන්ගේ නුවරය, ඉන්පසුව හාරාන් නුවර වාසයකිරීමට ස්වාමීන්වහන්සේ ඔහුට මග පෙන්වූසේක (උත්පත්ති 11:31; ආබ්‍රහම් 2:1–5). ඉන්පසුව ස්වාමීන්වහන්සේ ඔහුට හරාන් නුවරින් කනාන් දේශයට මග පෙන්වා මෙසේ පොරොන්දුවූසේක, "නුඹගේ වංශයට මම මේ දේශය දෙන්නෙමි" (උත්පත්ති 12:7). කනාන් දේශයේ සාගතයක් ඇතිවූ නිසා, ආබ්‍රහම් සහ ඔහුගේ පවුල මිසරයට ගියහ (උත්පත්ති 12:10). උත්පත්ති 13 ආරම්භවන්නේ ආබ්‍රහම් සහ ඔහුගේ පවුල මිසරයේ සිට කනාන් දේශයට පැමිණීමේ සිටය.

- ආබ්‍රහම් සහ ලොත් සහ ඔවුන්ගේ පවුල් මිසරයේ සිට කනාන්වලට නැවත පැමිණීමෙන් පසුව ඔවුන්ට එකට ජීවත්වීමට නොහැකිවූයේ මන්ද? (බලන්න උත්පත්ති 13:5–7). උත්පත්ති 13:8–9 පදවලින් ආබ්‍රහම්ගේ අදහස්වලින් අප ඉගෙනගන්නේ කුමක්ද? අපගේ පවුල් සාමාජියන් සහ අන් අය සමග අපට විරෝධතා ඇති විට අපි ආබ්‍රහම්ගේ ආදර්ශය අනුගමනය කරන්නේ කෙසේද?
- ලොත් වාසයකිරීම සඳහා තෝරාගත්තේ කොහේද? (බලන්න උත්පත්ති 13:10–12.) සොදොමේ ජනතාව තදින්ම දුෂ්ඨව සිටිබවත් (උත්පත්ති 13:13), නමුත් ලොත් තවදුරටත් ඔවුන් අසල වාසයකිරීම තෝරාගත් බව පෙන්වා දෙන්න. සොදොම අසල දේශය ලොත්ගේ සිත්ගත්තේ මන්ද? (බලන්න උත්පත්ති 13:10. එහි හොඳින් ජලය තබුන අතර අලංකාරද විය.)
- ලොත් ප්‍රථමයෙන්ම සොදොමෙන් පිටත "සමභූමියෙහි නුවරවල වාසය කළේය." නමුත් ඔහු "සිය කූඩාරම සොදොම දක්වා ගෙනගියේය" (උත්පත්ති 13:12). පසුව ඔහු සොදොමේ නුවරම වාසයකළේය (උත්පත්ති 14:12). සොදොම දක්වා අපගේ කූඩාරම් ගැසීම ආත්මිකව සමවීම සඳහා අපට කල හැකි දේවල් මොනවාද? (නපුරු දේවල් මගහැරීම වෙනුවට ඒවා සම්බන්ධකර ගැනීමට අපට සිදුවිය හැකිය. නැතහොත් විශාල පාපයන් වර්ධනයවීම ගැන නොසිතා සුළු පාපයන් කිරීමට අප අපටම ඉඩහැරීමට ඉඩ ඇත.) සුළු ප්‍රශ්න හෝ පාප විශාල ඒව වීමට ප්‍රථම, අප අපගේ හැසිරීම වෙනස්කරගන්නේ කෙසේද?
- ලොත් මෙන්, මෝර්මන්ගේ පොතේ එන බෙන්ජමින් රජතුමාගේ ජනතාවද, නියමිත දිශාවකට මුහුණලා ඔවුන්ගේ කූඩාරම් ගැසූහ. ඔවුන්ගේ කූඩාරම් මුහුණදී තිබුනේ කුමකටද? (බලන්න මොසායා 2:6.) අපි අපගේ නිවාස ලෝකයේ ස්ථානවලට මුහුණපා තැබීම වෙනුවට, වඩාත් දේව මාළිගා දෙසට හරවා තබන්නේ කෙසේද?

**2. ආබ්‍රහම් ලොත්ව ගලවාගෙන, දසයෙන් කොටස මෙල්කිසදෙක්ට ගෙවමින් සහ, යුදයෙන් නාස්තිවූවන් සොදොමේ රජතුමාගෙන් බාරගැනීම ප්‍රතික්ෂේප කරයි.**

උත්පත්ති 14:1–2, 8–24 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ලොත් සොදොමේ වාසයකරන අතර, සොදොම සහ ගොමෝරාද ඇතුළු නුවරවල් කිහිපයක ජාතීන්ගේ රජවරු එකිනෙකාට යුද්ධකිරීමට පටන්ගත්හ (උත්පත්ති 14:1–2, 8–9). මෙම යුද්ධය අතරතුරදී ලොත්ට සිදුවූයේ කුමක්ද? (බලන්න උත්පත්ති 14:10–12.) ලොත්ව අල්ලාගැනීමෙන් පසුව ආබ්‍රහම් ඔහුට උපකාර කලේ කෙසේද? (බලන්න උත්පත්ති 14:13–16.)
- ලොත්ව ගලවාගැනීමෙන් පසුව ආබ්‍රහම් හමුවූයේ කවුද? (බලන්න උත්පත්ති 14:17–18.) මෙල්සිසදෙක් යනු කවරෙක්ද? (බලන්න උත්පත්ති 14:18; ඩීසහසී 107:1–2ද බලන්න.) ආබ්‍රහම් මෙල්සිසදෙක්ට දුන්නේ මොනවාද? (බලන්න උත්පත්ති 14:20.)
- සොදොමේ රජතුමාගෙන් ත්‍යාගයක් ලෙස නූල් පොටක් පවා බාරගැනීම ආබ්‍රම් ප්‍රතික්ෂේප කලේ මන්ද? (බලන්න උත්පත්ති 14:21–24. අධර්මිෂ්ඨ රජෙක්ගෙන් කිසිවක් බාරගැනීම ඔහුට අවශ්‍ය නොවීය.) වර්තමාන ලෝකයේ දුරාචාරවල "නූලක්" ලෙස සැලකිය හැක්කේ කුමක්ද? වංචාවේ "නූලක්" විය හැක්කේ කුමක්ද? සමහර අවස්ථාවලදී අප සොයන විනෝදය තුලින් අධර්මිෂ්ඨකම බාරගැනීමට කැමතිවීමට තරම් අප පහත් තත්වයට පත්වන්නේ කෙසේද? ලෞකික දේ කුඩා ප්‍රමාණයකින් හෝ අපගේ ජීවිතවලට ඇතුල්වීමට අප ඉඩනොදිය යුත්තේ මන්ද? (බලන්න 2 නිෆායි 28:20–21).

- මෙල්කිසදෙක්ට සහ සොදොමේරජතුමාට ආබ්‍රහම් දැක්වූ ප්‍රතිචාරයෙන් ස්වාමීන්වහන්සේට ඔහු තුලවූ කැපවීම ගැන අපට ඉගෙනගත හැක්කේ මොනවාද?

**3. ස්වාමීන්වහන්සේ සොදොම සහ ගොමෝරාව විනාශකරනසේක.**

උත්පත්ති 18:16–33; 19:1–29 උගන්වමින් සාකච්ඡාකරන්න.

- සොදොමේ සහ ගොමෝරාවේ ජනතාවගේ අයුතුකම් නිසා, ස්වාමීන්වහන්සේ එම නගර විනාශකිරීමට සැලසුම් කලසේක (උත්පත්ති 18:20–21). මෙම සැලසුම ගැන දැනගැනීමෙන් පසුව ආබ්‍රහම් ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලුවේ කුමක්ද? (බලන්න උත්පත්ති 18:23–32.) එම නගර තුල ධර්මිෂ්ඨ ජනතාව සොයාගැනීමට හැකිවුනේ නම්, ඒවා ඉතුරුකිරීමට ස්වාමීන්වහන්සේ කැමතිවීමේ සත්‍යය පිළිබඳව අපට ඉගෙනගත හැක්කේ කුමක්ද?
- ලොත්ට සොදොමෙන් ඉවත්වීමට අවවාද කලේ මන්ද? (බලන්න උත්පත්ති 19:12–13, 15.) ලොත්ගේ බෑණාවරුන්ට ඉවත්ව යන ලෙස ආයාචනාකල විට, ඔවුන් ඔහුට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 19:14.) අනතුර ගැන සමහර අය දැනගෙන සිටියද, නරක බලපෑම්වලින් තමන්ව ඉවත්කරගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කරන්නේ මන්ද?
- ලොත් සහ ඔහුගේ පවුල නුවරින් පිටත්වූ විට, සුරදූතයා දුන් උපදෙස් මොනවාද? (බලන්න උත්පත්ති 19:17.) ගැලවුම්කරුවාණන්වහන්සේ තමන් වහන්සේගේ අනුගාමිකයන්ට ඒ හා සමාන උපදෙස් දී තිබෙන බව පෙන්වා දෙන්න (ලූක් 9:62; 17:29–32; ධ්සහගී 133:14–15). "ආපසු බැලීම" යන්නෙන් නියෝජනය වන්නේ කුමක්ද? (අපගෙන් ඉල්ලූ යමක් දීමට ඇති අකමැත්ත, ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමට තිබෙන සම්පූර්ණ කැපවීමේ මදකම.) අපද සමහර අවස්ථාවලදී "ආපසු බැලීම" කරන්නේ කෙසේද?
- ලොත්ගේ බිරිඳ සොදොම දෙස නැවත බැලූවිට අයට සිදුවූනේ කුමක්ද? (බලන්න උත්පත්ති 19:26.) ලොත්ගේ බිරිඳගේ කථාවෙන් පසුතැවීම ගැන අප ඉගෙනගත හැක්කේ කුමක්ද? (පසුතැවීම සඳහා අපි අපගේ සිත් සහ හැසිරීම වෙනස්කර ගත යුතුය. මෙය කිරීම සඳහා අප සමහර අවස්ථාවලදී අළුත් පරිසරයක් සහ හිතවතුන් තෝරාගත යුතුය.)
- ලොත් "සොදොම දක්වා ඔහුගේ කූඩාරම ගෙනගිය" නිසා ඔහුට අහිමිවූයේ මොනවාද? අපව පරීක්ෂාවට ලක්වන බව දැනෙන අවස්ථාවට අප පත්වූ විට අපට අහිමිවිය හැක්කේ මොනවාද? අපි ඍජුවම පාපකාරී ක්‍රියාවකට සහභාගි නොවූවද, නපුරින් අපව වටකරගැනීමට අප ඉඩදුන් විට අපව වෙනස්වන්නේ කෙසේද?
- සොදොම සහ ගොමෝරාව විනාශවූ විට ලොත්ව ඉතුරුකිරීමේ හේතුව වශයෙන් උත්පත්ති 19:26 යෝජනාකරන්නේ කුමක්ද? (ආබ්‍රහම්ගේ ධර්මිෂ්ඨකම ගැන ස්වාමීන්වහන්සේට මතක්වූසේක.) අපගේ ධර්මිෂ්ඨ හැසිරීම අන් අයට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද?

  ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාපතිවරයා මෙසේ කීවේය: "දැන් අපගේ ලෝකය නීෆායිට් අනාගතවක්තෘවරයාගේ කාලයට බොහෝ සමාන බවට ඔහු මෙසේ කීවේය: '…ධර්මිෂ්ඨයන්ගේ යාච්ඤා නිසා නොවේ නම්…දැන් වුවද බලවත් විනාශයකින් නුඹලා බැහැදකිනු ඇත…' (ඇල්. 10:22.) ඇත්ත වශයෙන්ම, සියලුම පණත් අනුව ජීවත්වන බොහෝ ඍජු, ඇදහිලිමත් අය සිටින අතර, ඔවුන්ගේ යාච්ඤාවලින් ලෝකය විනාශයෙන් මුදවා තබයි" (in Conference Report, අප්‍රේ. 1971, 7; හෝ *Ensign*, ජූනි 1971, 16).

---

අවසානය

නපුර අප අවට සෑම තැනම තිබුනද, අප පාපවලින් නිදහස්ව සිටීමේ වැදගත්කම ගැන සහතික කරන්න. ලෝකයේ දේවලින් පංති සාමාජිකයන්ට බලපෑම් කිරීමට ඉඩදීම වෙනුවට ලෝකය තුල ධර්මිෂ්ඨ බලපෑමකට උත්සාහකිරීමට ඔවුන්ව දිරිගන්වන්න.

වැඩිමහල් එම් රසල්. බැලඩ්ගේ පහත සඳහන් ප්‍රකාශයෙන් අවසන්කිරීමට ඔබට අවශ්‍යවනු ඇත:

"සභාව තුළ අපි නිතරම මෙම යුගල ප්‍රකාශය කරන්නෙමු, 'ලෝකය තුල සිටින්න නමුත් ලෝකයේ නොවන්න.' රූපවාහිනිය තුලින් අපි කෙලෙසීම, සැහැසිකම්, සහ මිථ්‍යාචාරය පවා සාමාන්‍ය දෙයක් ලෙස දකින්නෙමු. අපි නිතරම සිතන්නේ යම් ආකාරයකින් ලෝකය වසා දමා ඒ සෑම දේකින්ම අපගේ පවුල් වෙන්කර දැමීමට අපට හැකිවේවා කියාය….

"සමහර විට, කලින් සඳහන් කල යුගල ප්‍රකාශය වෙන වෙනම අවවාද දෙකක් ලෙස අප සඳහන් කල යුතුය. පළමුවෙන්, *'ලෝකය තුල සිටින්න,'* සම්බන්ධව සිටින්න, තොරතුරු ලබාගන්න. තේරුම්ගැනීමට, ඉඩදීමට සහ විවිධත්වය අගයකිරීමට උත්සාහ කරන්න. සේවය සහ සම්බන්ධවීමෙන් අර්ථවත් දායකත්වයක් ලබාදෙන්න. දෙවනුව, *'ලෝකයේ නොවන්න'* වැරදි මාර්ගවල යාම හෝ ඔබගේ ප්‍රමිතීන් වෙනස්කිරීම හෝ වැරදි දේවල් පිළිගැනීම හෝ නොකරන්න….

"අපට බලපෑම් කිරීම්වලට වඩා සභාවේ සාමාජිකයන් බලපෑම්කිරීම අවශ්‍යවේ. පාපය සහ නපුර වැඩිවීම නැවතීමට යමක් කිරීමට උත්සාහකිරීම නොකර සිටීම වෙනුවට, අපි ඒවා දිගටම කිරීම නැවත්වීමට කටයුතු කල යුතුවෙමු. ප්‍රශ්න වැළැක්වීම හෝ නොසැලකීම වෙනුවට, ඒවා විසඳාගැනීමට අපි උදව්කල යුතුවෙමු" (in Conference Report, අප්‍රේ. 1989, 100–101; හෝ *Ensign*, මැයි 1989, 80).

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස්වලින් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චි කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. සොදොමේ සහ ගොමෝරාවේ පාප**

උත්පත්ති 19:4–11 සහ ජෝසෆ් ස්මිත් පරිවර්තනය උත්පත්ති 19:9–15 යෝජනාකර තිබෙන පරිදි, සොදොමේ සහ ගොමෝරාවේ ජනතාව බරපතල ලිංගික පාපවලට සම්බන්ධව සිටිති. නමුත් මෙම පාප, බරපතලව තිබුනද, මෙම පාප පමණක් එම නගර විනාශකිරීමට හේතුව නොවීය. පංති සාමාජිකයෙක් ලවා එසිකියෙල් 16:49–50 ශබ්දනගා කියවීමට සලස්වා, සොදොමේ සහ ගොමෝරාවේ ජනතාව වරදකරුවන්වූ වෙනත් පාපයන්ද සාකච්ඡාකරන්න. සුළුවට පෙනීමට තිබෙන පාප මගින් මෙන්ම විශාල ඒවා මගින්ද අපව විනාශකිරීමට හැකි බව අවබෝධකර ගැනීමට පංති සාමාජිකයන්ට උදව්කරන්න.

**2. ආදර්ශය මගින් මග පෙන්වීම**

පසු-දවස්වල ශුද්ධවන්තයන්ට ලෝකයා බලපෑම් කරනු වෙනුවට යහපත සඳහා බලපෑම්කිරීමට හැකි බව පෙන්වාදීමට, ඔබට "ආදර්ශ මගින් මග පෙන්වීම" මිනිත්තු හතක පරණ ගිවිසුමේ වීඩියෝ ඉදිරිපත් කිරීමක් (53224) පෙන්වීමට ඔබට අවශ්‍යවිය හැකිය. මෙම කොටස තුලින්, තරුණ කාන්තාවකගේ ධර්මිෂ්ඨ ආදර්ශය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියට හැරී ඒමට මිතුරෙකුට උපකාර කරයි.

# “දෙවියන්වහන්සේ තමන්වහන්සේ විසින්ම බැටළු පැටවෙකු සපයනසේක” 9 වෙනි පාඩම

*ආබ්‍රහම් 1; උත්පත්ති 15–17; 21–22*

**අරමුණ**

ආබ්‍රහම් ඊසාක්ව පරිත්‍යාගකිරීමට කැමතිවීම ගැන පංති සාමාජිකයන් ඉගෙනගන්නා විට, ස්වර්ගික පියාණන්වහන්සේ තමන්වහන්සේගේ පුත්‍රයාණන් පුදකිරීමේ උන්වහන්සේගේ පරිත්‍යාගය ගැන ඔවුන්ට හොඳින් තේරුම්ගැනීමට උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න. සටහනඃ ආබ්‍රම්ගේ නම ආබ්‍රහම් ලෙසද, සාරායිගේ නම සාරා ලෙසද, ස්වාමීන්වහන්සේ වෙනස්කිරීම ගැන උත්පත්ති 17 කියයි. (පද 5, 15 බලන්න). *ආබ්‍රහම්* සහ *සාරා* යන නම් මෙම පාඩම මුළුල්ලේම භාවිතාවේ.

   අ. ආබ්‍රහම් 1:1, 5–20. තරුණයෙකුව සිටියදී ආබ්‍රහම්ට පාරෝවොගේ ව්‍යාජ පූජකවරුන් විසින් හිංසාකරන ලදී. ඔවුහු ඔහුව පරිත්‍යාග කිරීමටඋත්සාහ දැරූ නමුත්, යෙහෝවාවහන්සේ විසින් ඔහුව ගලවා ගන්නාසේක.

   ආ. උත්පත්ති 15–17, 21. තම ජීවිතයේ පසු කාලයකදී ආබ්‍රහම්, දරුවන්ට කැමතිව දරුවෙකු ලැබීමට පොරොන්දුවක් ලබයි (15:1–6). සාරා හාගර්ව ආබ්‍රහම්ගේ භාර්යාව වශයෙන් දෙන්නීය; හාගර් ඉෂ්මායෙල් බිහිකරයි. (16:1–16). දෙවියන්වහන්සේ නැවතත් ආබ්‍රහම් සමග තැබූ තමන්වහන්සේගේ ගිවිසුම ගැන කථාකරමින්, ආබ්‍රහම් බොහෝ ජාතීන්ගේ පියා වන බවට පොරොන්දුවනසේක (17:1–14; 7වන පාඩම බලන්න). ඊසාක්ගේ උපතද, ඔහු තුලින් ගිවිසුම පවත්වාගෙන ගන බව නිවේදනය කෙරෙයි (17:16–22). සාරා ඊසාක් බිහිකරයි (21:1–12).

   ඇ. උත්පත්ති 22. ඊසාක්ව පරිත්‍යාගකිරීමට දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට නියෝගකරනසේක (22:1–2). ඊසාක්ව පරිත්‍යාගකිරීමට ආබ්‍රහම් සූදානම්වන නමුත්, ඒ වෙනුවට පරිත්‍යාගකිරීමට දෙවියන්වහන්සේ බැටළුවෙකු සපයනසේක (22:3–19).

2. අමතර කියවීම්ඃ හෙබ්‍රෙව් 11:8–19; යාකොබ් 2:21–23; ජාකොබ් 4:5; දහම සහ ගිවිසුම 132:34–36.

3. ඔබ දෙවන අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, මෙම පාඩමට අඩුවශයෙන් සතියකටවත් පෙර, පරිත්‍යාගකිරීමට තමන් දැක්වූ කැමැත්ත නිසා ඔවුන් ආශිර්වාදිතවූ අවස්ථාවක් කීම සඳහා පංති සාමාජිකයන් සකිහිපදෙනෙකුට සූදනම්වීමට කියන්න.

4. පහත සඳහන් දෘෂ්‍ය උපකරණ තිබේ නම්, ඒවායින් කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

ආ.සුරදූතයෙක් ආබ්‍රහම් ගලවාගනියි (62607; සුභාරංචි කලා පින්තූර මල්ල 104) සහ ආබ්‍රහම් පරිත්‍යාගකිරීම සඳහා ඊසාක් රැගෙන යයි (62054; සුභාරංචි කලා පින්තූර මල්ල 105) යන පින්තූර.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් එකක් (හෝ ඔබගේම එකක්) පාවිච්චි කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. පංතියට වඩාත් ගැලපෙන ක්‍රියාකාරකමක් තෝරාගන්න.

1. පංති සමාජිකයන් වඩාත් කැමති පුද්ගලයෙක් හෝ ඔවුන්ට ඉතාමත් වටිනාකමක් ඇති යම් භාණ්ඩයක් ගැන සිතන ලෙස ඔවුන්ට කියන්න.

   - මෙම පුද්ගලයා හෝ එම භාණ්ඩය අත් හැරීමට හෝ පරිත්‍යාගකිරීමට දෙවියන්වහන්සේ ඔබට කිවහොත් ඔබට හැඟෙන්නේ කුමක්ද? ඔබ කරන්නේ කුමක්ද?

2. පංති සාමාජිකයන් කිහිපදෙනෙකුට ආරාධනාකර, ඔවුන් පරිත්‍යාග කිරීමට කැමතිවූ නිසා ඔවුන් ආශිර්වාදිතවූ අවස්ථාවක් ගැන කීමට කියන්න.

මෙම ක්‍රියාකාරකමින් පසුව වුවද, තම පුත්‍රයාවූ ඊසාක්ව පරිත්‍යාගකිරීමට දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට නියෝග කල බවත්, ආබ්‍රහම් ඔහුට බොහෝ ප්‍රේමකල බවත් පහදාදෙන්න. අවසානයේදී මෙම පරිත්‍යාගය කිරීමට ආබ්‍රහම්ගෙන් අපේක්ෂා නොකළද, එසේ කිරීමට ඔහු තුල තිබූ කැමැත්ත "ඔහුගේ ධර්මිෂ්ඨතාවයේ ගිණුමට බැරවිය" (ඩීසහසී 132:36). ආබ්‍රහම්ගේ ධර්මිෂ්ඨතාවය නිසා, ඔහු හා ඔහුගෙන් පැවතෙන්නන් විශාල ලෙස ආශිර්වාදිතවූහ.

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම**

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. එම ශුද්ධ ලියවිලි සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

1. පාරාවෝගේ ව්‍යාජ පූජකවරුන් විසින් ආබ්‍රහම්ව පරිත්‍යාගකිරීමට ආසන්නව තිබින.

ආබ්‍රහම් 1:1, 5–20 උගන්වමින් සාකච්ඡාකරන්න. මෙම පාඩමෙන් කොටසක් ආබ්‍රහම් ඊසාක් පරිත්‍යාගකිරීමේ දෙවියන්වහන්සේගේ නියෝගය විදහා දැක්වේ. මෙම නියෝගයේ වැදගත්කම සහ ආබ්‍රහම්ගේ ගැඹුරු ඇදහිල්ල ගැන පංති සාමාජිකයන්ට තේරුම්ගැනීමට උපකාරකිරීම සඳහා, ආබ්‍රහම් කුඩා කාලයේ පාරාවෝගේ ව්‍යාජ පූජකවරුන් විසින් ඔහුව පරිත්‍යාගකිරීමට ආසන්නවූ ඔහු ලත් අත්දැකීම ගැන කෙටි සාකච්ඡාවකින් පාඩම ආරම්භවේ.

- ආබ්‍රහම් කල්දියේ වාසයකල කාලයේ එහි තත්වය කෙබඳුවීද? (බලන්න ආබ්‍රහම් 1:1,5–8.) පාරාවොගේ ව්‍යාජ පූජකවරුන් උත්සාහකලේ ආබ්‍රහම්ට කුමක් කිරීමටද? (බලන්න ආබ්‍රහම් 1:7–12.) මෙම ව්‍යාජ පූජකවරුන්ගෙන් ආබ්‍රහම් ගැලවුනේ කෙසේද? (බලන්න ආබ්‍රහම් 1:15–16, 20.)
- ව්‍යාජ පූජකවරුන්ගේ අල්තාරයෙන් ආබ්‍රහම් ලත් අත්දැකීම, අනාගත පරීක්ෂාවන් සඳහා සූදානම් වීමට ඔහුට උපකාරවත්වූයේ කෙසේද? අපගේ පරීක්ෂාවන් තුලින් අනාගත අසීරුකම්වලට අපව සූදානම් කරන්නේ කෙසේද?

2. හාගර් සහ සාරා තුලින් ආබ්‍රහම් දරුවන් ලබයි

උත්පත්ති 15:17–21 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ළමයින් ගැන ස්වාමීන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව කුමක්ද? (බලන්න උත්පත්ති 15:1–6.) සාරා හාගර්ව ආබ්‍රහම්ගේ බිරිඳ වශයෙන් දුන්නේ මන්ද? (බලන්න උත්පත්ති 16:1–3; ඩීසහසී 132:34–35.) ස්වාමීන්වහන්සේ හාගර්ට දුන් පොරොන්දුව කුමක්ද? (බලන්න උත්පත්ති 16:10–11.)
- උත්පත්ති 17:15–16, 19 තුලින් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට එළිදරව්කලේ කුමක්ද? ආබ්‍රහම් ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? (බලන්න උත්පත්ති 17:17. බයිබලයේ ජේම්ස් රජතුමාගේ අනුවාදයෙන්, සාරාට දරුවෙක් ලැබෙන බව ඇසූ අබ්‍රහම් "සිනහසුන" බව කියවෙන අතර, එම හීබෘ වචනයේ පරිවර්තනය "සතුටුවිය" යන්න බවත් සලකන්න. ජෝසෆ් ස්මිත් බයිබල් පරිවර්තනය පවසන්නේ එම ප්‍රවෘත්තියෙන් ආබ්‍රහම් "සතුටුවිය" යන්නය.)
- අබ්‍රහම්ට සහ සාරාට පුතෙක් ලැබෙන බව එළිදරව්කිරීමෙන් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු තැබීම ගැන අපට ඉගෙනගත හැක්කේ මොනවාද? (අපට අවශ්‍ය අන්දමට හෝ අවශ්‍ය කාලයේදී හෝ නොවුවද, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු ඉටුකරනසේක. ආබ්‍රහම්ට සහ ශුද්ධ ලියවිලිවල එන වෙනත් බොහෝ දෙනෙකුට පොරොන්දු ආශිර්වාද ලැබෙන තුරු, වසර ගණනාවක් ඇදහිල්ලෙන් යුතුව බලාසිටීමට සිදුවූ බව පෙන්වා දෙන්න.)
- දෙවියන්වහන්සේ ඊසාක් සම්බන්ධව සහ ඉෂ්මායිල් සම්බන්ධ දුන් පොරොන්දුවල වෙනසක් ඇත්තේ කෙසේද? (බලන්න උත්පත්ති 17:19–21.)

3. **ඊසාක්ව පරිත්‍යාගකිරීමට දෙවියන්වහන්සේ ආබ්‍රහමට නියෝග කරනසේක.**

උත්පත්ති 22 උගන්වමින් සාකච්ඡාකරන්න.

- දෙවියන්වහන්සේ ආබ්‍රහම් අමතා ඊසාක්ව පරිත්‍යාගකිරීමට පැවසුවේ මන්ද? (බලන්න උත්පත්ති 22:1. පාසටහන් 1 අ. බලන්න, එමගින් කියවෙන පරීක්ෂාකිරීම යන පදයේ අදහස අත්හදාබැලීම හෝ ඔප්පුකිරීමවේ.) මෙය ආබ්‍රහම්ට දුෂ්කර පරික්ෂාවක්වූයේ මන්ද? (ඊශාක් ඔහුගේ පුතාවීම පමණක්ම නොව, නමුත් ආබ්‍රහම් ගිවිසුම ඊසාක් සහ ඔහුගෙන් පැවතෙන්නන් අතර පවතින බව දෙවියන්වහන්සේ පොරොන්දුවී තිබුසේක. [උත්පත්ති 17:19]. මෙය අසීරුවීමට හේතුවූ තවත් කරුණක් නම්, බාලකාලයේදී ආබ්‍රහම්වම පාරාවෝගේ ව්‍යාජ පූජකවරුන් විසින් පරිත්‍යාග කිරීමට ආසන්නවී තිබින [ආබ්‍රහම් 1:1, 5–20].)
- ඊසාක් පරිත්‍යාගකිරීමේ දෙවියන්වහන්සේගේ නියෝගයට ආබ්‍රහම් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 22:2–3.) ඇදහිල්ල සහ කීකරුකම ගැන ආබ්‍රහම්ගෙන් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? (හේබ්‍රෙව් 11:17–19; යාකොබ් 2:21–23.)
- මෙම තත්වයට ඊසාක් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 22:3–10. ඊසාක්ව පරිත්‍යාගකිරීමේ ආබ්‍රහම්ගේ අදහසට ඊසාක් තුල විරෝධයක්වූ බවට පෙන්වාදී නැත.)

  වැඩිමහල් ඩලින් එච්. ඕක්ස් මෙසේ පැහැදිළි කළේය: "ඔවුන් නියමකල ස්ථානයට පැමිණිවිට, ආබ්‍රහම් අල්තාරයක් සාදා එයට දර දැමීය. බයිබලයේ සඳහන්වන්නේ ඉන්පසුව, 'ආබ්‍රහම්…ඔහුගේ පුත් ඊසාක් බැඳ, ඔහුව අල්තාරයේ දරගොඩ මත තැබූ බවය' (උත්පත්ති 22:9). ආබ්‍රහම් එවැනි පුදුම සහගත දෙයක් කල විට ඊසාක් සිතුවේ කුමක්ද? බයිබලයේ සඳහන්වන්නේ පොරබැදීමක් හෝ විරුද්ධවීමක් නොවූ බවය. ඊසාක්ගේ නිහඬතාවය පැහැදිළිකල හැක්කේ තම පියාට ඔහු තුල තිබූ විශ්වාසය සහ කීකරුකම යන වචනවලින් පමණක්ය" (in Conference Report, ඔක්තෝ. 1992, 51; හෝ *Ensign*, නොවැ. 1992. 37).

- ඊසාක්ව පරිත්‍යාගකිරීමේ ආබ්‍රහම්ගේ කැමැත්ත, ස්වර්ගික පියාණන් උන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන් පරිත්‍යාගකිරීමට සමානය (යාකොබ් 4:5; උත්පත්ති 22:8, 13). ආබ්‍රහම් සහ ස්වර්ගික පියාණන්වහන්සේගේ අත්දැකීම් අතර තිබෙන සමානකම් මොනවාද? විශාලතම වෙනස කුමක්ද?
- අපව ඊසාක්ට සමානකල හැකිවන්නේ කුමන අන්දමින්ද? ඊසාක් අපව නියෝජනය කරන්නේ නම්, පඳුරේ සිටි බැටළුවා වන්නේ කවුද? තම පුත්‍රයාව පරිත්‍යාගකිරීමෙන් ස්වර්ගික පියාණන් වහන්සේ ඔබට දක්වන ප්‍රේමය වඩා හොඳින් තේරුම්ගැනීමට මෙම සමානතාවයන් ඔබට උපකාරවත්වන්නේ කෙසේද?

  වැඩිමහල් ඩලින් එච්. ඕක්ස් මෙසේ කීවේය: "මෙම කථාව…පෙන්වාදෙන්නේ, දෙවියන්වහන්සේගේ යහපත්කමය. ඊසාක්ව ගලවාගැනීමට ඔහු වෙනුවෙන් වෙනත් යමක් සපයාදීමෙන් ඔහුට මියයාමට සිදු නොවේ. අපගේ පාප සහ අපගේ මැරෙන සුළු භාවය නිසා, අපව, ඊසාක් මෙන්, මරණයට නියමකොට ඇත. බලාපොරොත්තු සියල්ලම අහිමිවූ විට, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන් සපයන නිසා උන්වහන්සේගේ පරිත්‍යාගය තුලින් අපට ගැලවීම ලැබේනේය" (in Conference Report, ඔක්තෝ. 1992, 51; හෝ *Ensign*, නොවැ. 1992, 37).

- මෙම පරීක්ෂාව තුලින් ආබ්‍රහම් ඔප්පුකලේ කුමක්ද? (උත්පත්ති 22:11–12.) ශුද්ධ ලියවිලිවලින් හෝ පෞද්ගලිකව හෝ පුද්ගලයන්ට ඔවුන්ගේ ඇදහිලිමත්බව ඔප්පුකිරීම සඳහා ඔවුන්ව පරීක්ෂාකරනු ලැබූ අවස්ථාවන් ගැන කීමට පංති සාමාජිකයන්ට ආරාධනාකරන්න. ඇදහිලිමත්බව ඔප්පුකිරීම තුලින් ලැබෙන සතුට සහ ආශිර්වාද ගැන ප්‍රකාශකරන ලෙසද පංති සාමාජිකයන්ගෙන් ඉල්ලන්න.
- උත්පත්ති 22:16න් ඊසාක් ආබ්‍රහම්ගේ එකම පුතා ලෙස සඳහන්වන්නේ මන්ද? (ගිවිසුම දිගටම පවත්වාගත හැකි පුත්‍රයා ඊසාක්වන නිසාය. ඊසාක් සහ අපගේ ගැලවුම්කරුවාණන් වන, පියාණන්වහන්සේගේ ඒක ජනක පුත්‍රයාණන් අතර සමානතාවයද මෙම සඳහන් කිරීම තුලින් අවධාරනය කෙරේ.) ආබ්‍රහම්ගේ ඇදහිලිමත්භාවය නිසා ඔහුට සහතික කල ආශිර්වාද මොනවාද? (බලන්න උත්පත්ති 22:15–18.) ආබ්‍රහම් ගිවිසුම තුලින් අපට පොරොන්දු වන

ආශිර්වාද මොනවාද? (බලන්න 7වෙනි පාඩම.) ආබ්‍රහම් ගිවිසුමේ උරුමක්කරුවන් ලෙස අපගේ වගකීම් මොනවාද?

---

අවසානය

ආබ්‍රහම් විසින් ලබාදුන් ඇදහිල්ලේ සහ කීකරුකමේ ආදර්ශය වෙනුවෙන් ඔබගේ කෘතඥතාවය පළකරන්න. ඊසාක්ව පරිත්‍යාගකිරීමේ ආබ්‍රහම්ගේ කැමැත්ත, තම ඒක ජනක පුත්‍රයාණන්ව පරිත්‍යාගලිරීමට ස්වර්ගික පියාණන්වහන්සේ තුල තිබූ කැමත්තට සමානවූ බවට සාක්ෂිදරන්න. වන්දිගෙවීම සහ ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල අප වෙනුවෙන් ඇති ප්‍රේමය ගැන පංති සාමාජිකයන්ගේ හැඟීම් බෙදාගැනීමට ඔවුන්ට ආරාධනාකරන්න.

---

අමතර ඉගැන්වීමේ අදහස්

**පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.**

**1. පරීක්ෂාවන්වලින් ඉගෙනගැනීම**

- හියු බී. බ්‍රවුන් සභාපතිවරයා ප්‍රකාශකල පරිදි ඊසාක්ව පරිත්‍යාගකිරීමට දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට නියෝග කලේ "ආබ්‍රහම් ගැන ආබ්‍රහම්ම යමක් ඉගෙනගැනීම අවශ්‍යව තිබූ නිසාය" (in Truman G. Madsen, *The Highest in Us* [1978], 49). මෙම අත්දැකීමෙන් ආබ්‍රහම් තමා ගැන ඉගෙනගත්තේ කුමක්ද? ඔබගේ පරීක්ෂාවන්ගෙන් ඔබ ඉගෙනගත්තේ මොනවාද?
- "ආබ්‍රහම් මෙන්" අපවද පරීක්ෂාකල යුතු බව ස්වාමීන්වහන්සේ එළිදරව් කලසේක (ඩීසහසී 101:4). මෙම අවශ්‍යතාවය ගැන ඔබගේ අදහස කුමක්ද? (ඩීසහසී 101:5, 35–38; 122:5–7 බලන්න.) ස්වාමීන්වහන්සේ අපගෙන් ඉල්ලීමට ඉඩ තිබෙන පරිත්‍යාගකිරීමට අපව සූදානම්කිරීම සඳහා අපට කල හැකි දේවල් මොනවාද?

**2. දෙවියන්වහන්සේ සමග ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගාගැනීම**

ආබ්‍රහම් සහ ඔහුගේ පියා දෙවියන්වහන්සේ සමග තිබූ සම්බන්ධතාවය ගැන ආබ්‍රහම් 1 සහ 2 පැහැදිළි කරයි. කරදර සහිත කාලවලදී ආබ්‍රහම්ගේ පියා දෙවියන්වහන්සේ වෙත හැරුනේය. නමුත්, ඔහුගේ ජීවිතය තුල කාරණා හොඳින් සිදුවූ විට ඔහු ප්‍රතිමා නමස්කාරය වෙත හැරුනේය (ආබ්‍රහම් 1:5, 30; 2:5). ආබ්‍රහම්, අනිත් අතට, දිගටම දෙවියන්වහන්සේ සෙවීය (ආබ්‍රහම් 1:2, 4; 2:12).

- දෙවියන්වහන්සේ සමග අපගේ සම්බන්ධතාවය විටින් විට වෙනුවට නිරන්තරයෙන්ම තබාගනිමින්, අපි උන්වහන්සේ සොයන්නේ කෙසේද? අපට සමාදානය සහ සැනසීම අවශ්‍ය කාලයේදී මෙන්ම පරීක්ෂාවන් සහිත කාලවලදීද උන්වහන්සේව සෙවීමට හැකිවීම පිණිස, අපි වඩාත් අනුරූප ලෙස දෙවියන්වහන්සේට අපගේ කැපවීම තබාගන්නේ කෙසේද?

# කුළුඳුල් බවේ ආශිර්වාද; ගිවිසුම තුල විවාහය

**10**

වෙනි පාඩම

*උත්පත්ති 24–29*

---

**අරමුණ**

කුළුඳුල් බවේ සහ සදාකාලික විවාහයේ ආශිර්වාදවලට සුදුසුව ජීවත්වීමට පංති සාමාජිකයන්ගේ අභිලාෂයන් ශක්තිමත්කිරීම සඳහාය

---

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්නඃ

   අ. උත්පතිති 24. ඊශාක්ට සුදුසු භාර්යාවක් තේරීම තුළින් ගිවිසුම තුල විවාහයේ (සදාකාලික විවාහය) ඇති වැදගත්කම ගැන ආබ්‍රහම් අවධාරනය කරයි.

   ආ. උත්පත්ති 25:20–34. රෙබෙකාට තම නූපන් නිඹුල් පුතුන් සම්බන්ධව එළිදරව්වක් ලැබේ (25:22–23). මෙම පුතුන් වැඩුනු විට, එසවු තම කුළුඳුල් භාවය යාකොබ්ට විකුණයි (25:29–34).

   ඇ. උත්පත්ති 26:29. ඊශාක්ට සහ ඔහුගෙන් පැවතෙන්නන්ට ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද පොරොන්දු ලැබේ (26: 1–5). ඒසවු ගිවිසුමෙන් පිට විවාහවී, ඔහුගේ දෙමාපියන්ට කණගාටුව ගෙන දෙයි (26:34–35). ජනතාව සහ ජාතීන් පාලනයකිරීම සඳහා ඊශාක් යාකොබ්ට ආශිර්වාද කරයි (27: 1–46). ඊශාක් විසින් ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද යාකොබ්ට ලබාදී සුදුසු බිරිඳක් සොයාගැනීමට ඔහුව පිටත යවයි (28:1–10). යාකොබ් ගිවිසුමට අනුව ලෙයා සහ රේචල් විවාහකර ගනියි (29: 1–30).

2. ඔබ පළවෙනි අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, කුඩා කෝප්පයක් හෝ පිපුනු පොරි හෝ පළතුරු කැල්ලක් රැගෙන එන්න.

3. ඔබ ගැටවර ළමුන්ට හෝ අවිවාහක වැඩිහිටි අයට උගන්වන්නේ නම්, "නිවැරදි විවාහය නිවැරදි දින යෙදීම ලාබාදෙයි" යන දෙවන අමතර ඉගැන්වීමේ අදහස පාවිච්චිකිරීම ගැන සලකාබලන්න..

4. පහත සඳහන් දෘෂ්‍ය උපකරණ තිබේ නම්, පාඩමේ කොටසක් ලෙස ඒවා කිහිපයක් පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවනු ඇත.

   අ. "ගිවිසුම තුල විවාහය," *පරණ ගිවිසුම වීඩියෝ ඉදිරිපත්කිරීම* මිනිත්තු-තිහක කොටසක් (53224).

   ආ. "රෙබෙකා" හෝ "ඊෂාක් සහ යාකොබ්" 1වෙනි සහ 2වන කොටස *ඊසාක් සහ යාකොබ්* වීඩියෝ කැසට් (53151).

   ඇ. රෙබෙකා ළිඳ ලග සිටින පින්තූරය (62160).

---

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් එකක් (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. පංතියට වඩාත් යෝග්‍ය ක්‍රියාකාරකමක් තෝරාගන්න.

1. භාජනය හෝ පොරි බෑගය හෝ පළතුරු කැබැල්ල ප්‍රදර්ශනයකර, ඉන්පසුව පහත සඳහන් ප්‍රශ්න පංති සාමාජිකයන්ගෙන් අසන්න.

- භාජනය හෝ පොරි බෑගය (හෝ පළතුරු කැබැල්ල) අතරින් යමක් ඔබට මේ දැන්ම තෝරාගැනීමට සිදුවුන හොත් හෝ අසීමිත පොරොන්දු සහිත පොරි (හෝ පළතුරු), ඔබ සිටුවා, වගාකර, එම කරල් (හෝ පළතුරු), අස්වැන්න ලබාගැනීමෙන් පසුව ඔබට තෝරාගැනීමට සිදුවුව හොත්, ඔබ තෝරාගන්නේ කුමක්ද? ඒ මන්ද?

අපට නිතරම පහසුවෙන්ම දැන්ම ලබාගත හැකි දේවල් හෝ අපි වැඩකරමින් බලාසිට තෝරාගත යුතු දේවල්වලටද මුහුණදෙන බව පැහැදිළි කරන්න. සමහර අවස්ථාවලදී එම තේරීම වැඩකර බලාසිට අවසානයේ විශාල ආශිර්වාද ලබා දුන්නද, ක්ෂණයකින්ම සංතුෂ්ටිය (සතුට හෝ ප්‍රීතිය) ගෙන එන දේවල් අපි තෝරාගන්නෙමු. පොරි (හෝ පළතුරු) දැන්ම හෝ පසුව ලබාගැනීමේ තීරණය වැදගත් නොවේ. කෙසේ වෙතත්, අපි ජීවිතයේදී වෙනත් තේරීම්වලටද මුහුණ දෙන්නෙමු— විවාහවන්නේ කවුරු සමගද, කොහේදීද වැනි තීරණවේ— ක්ෂණික සතුට තෝරාගැනීමෙන් මහිමාන්විත සදා පවතින ආශිර්වාදයන් අපට අහිමිවෙනු ඇත.

2. පහත සඳහන් ප්‍රශ්න පංති සාමාජිකයන්ගෙන් අසන්න.

- ඔබ යමක් ලබාගැනීමට මුදල් හෝ කාලය වැයකර, එයට වියදම්කිරීමේ වටිනාකමක් ලැබී නැත බව ඔබට කවදා හෝ අවබෝධවී තිබේද?

පංති සාමාජිකයන් කිහිපදෙනෙකුට ආරාධනාකර, ඔවුන්ට අවශ්‍ය යැයි සිතූ යම් දෙයකට ඔවුන් වැඩි පුර වියදම්කර තිබෙන අවස්ථාවක් ගැන ප්‍රකාශකිරීමට ඔවුන්ට කියන්න (ඔබගේම යම් අත්දැකීමක් බෙදාගැනීමට ඔබට අවශ්‍යවනු ඇත).

එම දෙයම ආත්මිකවද සිදුවිය හැකි බව පහදාදෙන්න. ධාර්මික තේරීම් කිරීම මගින්, බොහෝ අඩු වටිනාකමකින් යුත් දේවල් හා අපි සදාකාලික ආශිර්වාද හුවමාරු කරන්නෙමු. ධාර්මිකව ජීවත්වීම මගින්, කෙසේවුවද, ස්වර්ගික පියාණන්වහන්සේ අප වෙනුවෙන් සූදානම්කර තිබෙන සියලුම ආශිර්වාද අපට ලබාගත හැකිය.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ සාකච්ඡාකරන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්ම සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. ගිවිසුම තුල විවාහයේ (සදාකාලික විවාහය) ඇති වැදගත්කම ගැන ආබ්‍රහම් අවධාරනයකරයි.**

උත්පත්ති 24 උගන්වමින් සාකච්ඡාකරන්න. සදාකාලික විවාහයේ ඇති වැදගත්කම ගැන ඔබ සාකච්ඡාකරන විට, පංති සාමාජිකයන් දේවමාළිගාවේ විවාහවී නොමැති විට හෝ ඔවුන්ගේ දෙමාපියන් දේවමාළිගාවේ විවාහවී නොමැති විට ඔවුන්ගේ හැඟීම් ගැන සැලකිලිමත්වන්න.

- ආබ්‍රහම් සහ ඊසාක් කනානිවරුන්ගේ දේශයේ ජීවත්ව සිටියද ඊසාක් ඔවුන්ගෙන් කාන්තාවක් විවාහකරගැනීම වෙනුවට, තමන්ගේ ඥාතීන්ගෙන් විවාහයක් කරගැනීමට ආබ්‍රහම් එතරම් ඕනෑකමක් දැක්වූයේ මන්ද? (අබාහම්ට අවශ්‍යවූයේ ඊසාක් ඔහුගේම ආගමේ යමෙක් හා විවාහවීමය, එවිට ඔහුට ගිවිසුම තුල විවාහවීමට හැකිය. මෙය අවශ්‍යවූයේ එවිට ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද ආබ්‍රහම්ගෙන් පැවතෙන්නන්ට දීමට හැකිවන නිසාය.) අපද ගිවිසුම තුල විවාහවීම වැදගත්වන්නේ මන්ද? (අවශ්‍ය නම්, අපගේ කාලයේ, *ගිවිසුම තුල විවාහය*, *සදාකාලික විවාහය*, සහ *දේව මාළිගා විවාහය* යන වචන කාණ්ඩ නිතරම හුවමාරුවී පාවිච්චිවෙන බව පහදාදෙන්න.)
- ගිවිසුම තුල විවාහය කොපමණ කාලයක් දෙවියන්වහන්සේගේ පණතක්වී තිබුනේද? (එය සදාකාලික නියෝගයක් වන අතර, සුභාරංචියේ පූර්ණත්වය පොළොවේ තිබුන සියලුම කාලවල එය ස්වාමීන්වහන්සේගේ නියමයක්ව තිබුනේය. ආදම් සහ ඒව මෙම නියෝගයට ඇතුළත්වූ පොළොවේ සිටි පළමුවැන්නෝ වූහ.)
- ඊසාක්ට බිරියක් සෙවීම සඳහා ආබ්‍රහම් තම සේවකයා යැවීය (උත්පත්ති 24:4). ආබ්‍රහම්ගේ සේවකයා ගැන ඔබට ඇතිවන හැඟීම කුමක්ද? (බලන්න උත්පත්ති 24. පිළිතුරු විවිධ විය හැකි නමුත්, ඒවාට, ඔහු විශ්වාසකල හැකිවීම, පක්ෂපාතවීම, යාච්ඤාවන්තවීම සහ ඇදහිලිමත්වීම ඇතුළත්විය හැකිය. දීර්ඝ ගමණකින් පසුව වුවද, ආබ්‍රහම්ගේ පණිවුඩය නිමකරන තුරු ආහාරගැනීමට පවා ඔහු අකමැතිවිය. එසේම දින 10ක උත්සවය සඳහා නවතිනු වෙනුවට, ඔහු ඔහුට අවශ්‍යවූයේ රෙබෙකා රැගෙන කෙළින්ම ආබ්‍රහම් වෙත නැවත පැමිණීමය.) ස්වාමීන්වහන්සේ අපට දී තිබෙන වගකීම් හොඳින් ඉටුකිරීම සඳහා ආබ්‍රහම්ගේ සේවකයාගෙන් අපට ඉගෙනගත හැකි දේවල් මොනවාද?

- රෙබෙකා ඊසාක්ට යහපත් බිරිඳක් වනු ඇති බව ආබ්‍රහම්ගේ සේවකයාට කිව හැකිවූයේ කෙසේද? (බලන්න උත්පත්ති 24:15–20, 58. ආබ්‍රහම්ගේ සේවකයාට සහ ඔහුගේ ඔටුවන්ට දිය ඇද දීමෙන් පෙන්වූ පරිදි, රෙබෙකා කරුණාවන්ත, උදව්කිරීමට කැමති තැනැත්තියකි. ඔටුවෙකුට දිනකට ජලය ගැලුම් 30ක් බීමට හැකි අතර, ඔටුවන් 10 දෙනෙකු සන්තර්පනය කිරීමට ජලය ඇද සැපයීමේ විශාල වැඩකොටසක් රෙබෙකාට තිබිනි. ඊසාක්ව විවාහකර ගැනීම සඳහා තම පවුලෙන් පිටව යාමට රෙබෙකා කැමතිවූවාය. සමහර විට, ඇයට විශාල ඇදහිල්ලක් තිබීම සහ ඇය ඊසාක් විවාහකර ගැනීම ස්වාමීන්වහන්සේගේ කැමැත්ත බව ඇය දැනසිටියා විය හැකිය.)
- ස්වාමි පුරුෂයෙකු හෝ බිරිඳක් තුල ඔබ අපේක්ෂාකරන ගුණාංග මොනවාද? ශාරීරික පෙනීමට වඩා ආත්මික ගුණාංග වඩාත් වැදගත්වන්නේ මන්ද? යහපත් ස්වාමි පුරුෂයෙකු හෝ බිරිඳක් වීමට (අප දැනටමත් විවාහවී සිටියද, එසේ නොසිටියද) අප එකිනෙකා දියුණුකර ගත යුතු ගුණාංග මොනවාද?
- යම් පුද්ගලයෙකු සදාකාලික විවාහය සඳහා සූදානම්වීම ආරම්භකල යුත්තේ කවදාද? සදාකාලික විවාහය සඳහා සූදානම්වීමට ළමයින් සහ තරුණයන් කල යුතු යම් දේවල් මොනවාද? දේව මාළිගාවේ විවාහවීම සඳහා ළමයින්ට සහ තරුණයන්ට සූදානම්වීමට දෙමාපියන් සහ වෙනත් වැඩිහිටියන්ට උපකාරකල හැක්කේ කෙසේද?

  හොවාඩ් ඩබ්ලිව්. හන්ටර් සභාපතිවරයා මෙසේ කීවේය: "අපගේ ළමයින්ට ස්වාමීන්වහන්සේගේ ගෘහයේ විවාහවීම සඳහා අපි සැලසුම්කර, උගන්වමින් ආයාචනාකරමු. අප අතීතයේදී කිසිදා නොකල ලෙස වඩාත් ප්‍රබලව, ඔබ විවාහවන ස්ථානය සහ ඔබ මිනිසා සහ ගැහැනිය වශයෙන් ප්‍රකාශකරන අධිකාරීබලයේ වැදගත්කම ගැන නැවත ස්ථිරකරමු" (in Conference Report, ඔක්තෝ. 1994, 118; හෝ *Ensign*, නොවැ. 1994, 88).

2. **ඒසවු සිය කුළුඳුල් භාවය යාකොබ්ට විකුණයි.**

උත්පත්ති 25:20–34 උගන්වමින් සාකච්ඡාකරන්න.

- රෙබෙකාගේ නූපන් නිවුන් පුතුන් දෙදෙනා ගැන ඇයට ලැබුණු එළිදරව්ව කුමක්ද? (බලන්න උත්පත්ති 25:22–23.) "වැඩිමහල්ලා බාලයාට සේවය කරන්නේය" යන ස්වාමීන්වහන්සේගේ ප්‍රකාශය අසාමාන්‍ය එළිදරව්වක් වූයේ මන්ද? (කුළුඳුල් භාවය සාමාන්‍යයෙන් පියාගෙන් වැඩිමහල් පුත්‍රයාට පැවරෙන බැවින්ය. මෙම කුළුඳුල් භාවය ලැබීමේ අදහස වූයේ වැඩිමහල් පුත්‍රයාට පවුලේ වස්තුවෙන් දෙගුණයක් උරුමවන බැවින් සහ ඒ වෙනුවට ඔහු ඔහුගේ පියාගේ මරණයෙන් පසුව පවුලේ ප්‍රධානියාවී, ඔහුගේ මව සහ සොහොයුරියන් රැකබලා ගනියි. රෙබෙකාට ස්වාමීන්වහන්සේ දුන් එළිදරව්ව වන, "වැඩිමහල්ලා බාලයාට සේවය කරන්නේය" යන ප්‍රකාශයේ අදහස මෙම තත්වය තුල බාල පුත්‍රයා කුළුඳුල් භාවය ලැබ, ඔහුගෙන් පැවතෙන්නන් ගිවිසුමේ ජනතාව වනු ඇති බවය.)
- වැඩිමහල් පුත්‍රයාවූ, ඒසවු, සිය සීයාවූ ආබ්‍රහම් සහ ස්වාමීන්වහන්සේ අතර ඇතිකරගත් ගිවිසුම සහ ඔහුගේ කුළුඳුල් භාවය ගැන සිතුවේ කුමක්ද? (බලන්න උත්පත්ති 25:29–34. තම තාවකාලික කුසගින්න ශාරීරිකව පිනවීම සඳහා කුළුඳුල් භාවය අත්හැරීමට ඒසව් දැක්වූ කැමැත්ත, කුළුඳුල් භාවයට ඔහු කෙතරම් සුළු වටිනාකමක් දැක්වූවේදැයි පෙන්වාදෙයි.)
- සභාවේ සාමාජිකයන් වශයෙන් අප හැම කෙනෙක්ම, අපගේ ස්වර්ගික දෙමාපියන්ගෙන් ආත්මික කුළුඳුල් භාවයට හිමිකම් ලබයි. අපගේ කුළුඳුල් භාවයට ඇතුළත්වන ආශිර්වාද මොනවාද? (පිළිතුරුවලට, පූජකවරය, දේව මාළිගා ආශිර්වාද, නියෝග, එළිදරව්, සහ උත්කර්ෂයට ඇති හැකියාවන් ඇතුලත්විය හැකිය.)
- අප විවාහවන ස්ථානය අනුව අපගේ කුළුඳුල් භාවයේ අශිර්වාද ලැබීමේ හැකියාවට බලපෑම් ඇතිවන්නේ කෙසේද? (අපි දේව මාළිගා එන්ඩවුමන්ට් සහ සදාකාලික විවාහයේ ගිවිසුම් තැබීම මගින් උත්කර්ෂයට සහ සදාකාලික වැඩි දියුණුවට අදාළ ආබ්‍රහම් ගිවිසුමේ කොටසකට ඇතුල්වේ.)
- අපගේ වචන සහ ක්‍රියාවලින් අපගේ කුළුඳුල් භාවයට අප තබන වටිනාකම පෙන්වන්නේ කෙසේද? අප සමහරෙක් සදාකාලික වටිනාකමක් තිබෙන දේවල් වෙනුවට, ක්ෂණික පිනවීම ලබාදෙන දේවල් තෝරාගැනීමෙන් අපි ඒසවුගේ වැරැද්දට සමාන වැරදි කරන්නේ කෙසේද?

- ගිව්සුමට ඇති උරුමය ගැන නිශ්චයකරමින්, ස්වාමීන්වහන්සේ ඒසවුව ඔහුගේ වැඩිමහල් සොහොයුරාවූ ඉෂ්මායිල්ට ඉහළින්ද (ගලාති 4:22–23), යාකොබ්ව ඔහුගේ වැඩිමහල් සොහොයුරු ඊෂාක්ට ඉහළින්ද, යොසෙප්ව ඔහුගේ වැඩිමහල් සොහොයුරු රූබෙන්ට ඉහළින් (1 ලේඛම් 5:1–2), සහ එප්‍රායිම්ව ඔහුගේ වැඩිමහල් සොහොයුරු මනස්සේට ඉහළින්ද (උත්පත්ති 48:17–20) තෝරාගත්සේක.

**3. යාකොබ් ලෙයා සහ රාකෙල්ව ගිව්සුම තුලින් විවාහකරගත් අතර, ඔහු තුලින් ආබ්‍රහම් ගිව්සුම දිගටම පවතියි.**

උත්පත්ති 26–29 උගන්වමින් සාකච්ඡාකරන්න.

- භාර්‍යාවන් තෝරාගැනීමේ ඒසවුගේ කැමැත්ත, ඔහුගේ ප්‍රමුඛත්වයන් ගැන අපට කියන්නේ කුමක්ද? (බලන්න උත්පත්ති 26:34–35; 28:6–9.) ගිව්සුම තුල විවාහවීමට යාකොබ් දැරූ උත්සාහයෙන් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? (බලන්න උත්පත්ති 28:1–5; 29:1–28. අපට ඉගෙනගත හැකි එක් දෙයක් නම්, ගිව්සුම තුල විවාහය යාකොබ්ට ඉතා වැදගත්වූ බවය. විවාහවීම සඳහා ඇදහිලිමත් කාන්තාවක් සෙවීමට ඔහු දිගු ගමනක් ගියේය. ඉන්පසුව ඔහු, රාබෙල් හා විවාහවීමට ප්‍රථම වසර හතක් ලාබන්ට සේවයකර, ඉන්පසුව දිගටම ඔහුට සේවය කලේය.) ගිව්සුම තුල විවාහවීම අපට වැදගත් බව අප පෙන්වන්නේ කෙසේද?

  ඔස්ට්‍රේලියාවේදී සභාවට බැඳී, ඉන්පසුව නවසීලන්තයට ගමන්කර, පවුලක් ලෙස එකට මුද්‍රාකිරීමට හැකිවීම සඳහා සිය දේපළ සියල්ලම විකුණූ පවුලක් ගැන ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිතුමා කීව්ය. මෙම පවුලේ පියා මෙසේ කීවේය: "අපට ෟදේව මාළිගාවට පැමිණීමට මුදල් නොවීය. අපගේ ලෞකික දේපළවලට ඇතුළත්ව තිබුනේ පරණ කාරයක්, අපගේ ලී බඩු, සහ අපගේ වීදුරු බඩුය. මගේ පවුලේ අය ඇමතූ මම, 'නොයා සිටීම අපට දරාගත නොහැක. ස්වාමීන්වහන්සේ මට ශක්තිය ලබාදෙන්නේ නම්, මට වැඩකරමින් තවත් කාරයක්, ලී බඩු සහ වීදුරු බඩු ගැනීමට ප්‍රමාණවත් මුදලක් උපයාගත හැක. නමුත්, මේ මගේ ආදරවන්තයන් මට අහිමිවුවහොත්, මම ඇත්තවශයෙන්ම, මේ ජීවිතයේ මෙන්ම සදාකාලිකවද යන දෙකෙන්ම අසරණවන්නෙමි" (*Be Thou an Example*, [1981], 138).

- දෙදෙනෙක් දේව මාළිගාවේ විවාහවීමෙන් පසුව, ඔවුන් සත්‍ය ලෙසම සදාකාලිකව විවාහවූ බව සහතික කිරීමට ඔවුන් කල යුතු දේවල් මොනවාද? දේවමාළිගාවේ පොරොන්දුවූ ගිව්සුම් සහ ආශිර්වාද ඉටුවීමට ස්වාමි පුරුෂයෙක් සහ භාර්‍යාව විවාහ සම්බන්ධතාවයන් පවත්වාගෙන, දියුණුකරගන්නේ කෙසේද? (පංති සාමාජිකයන් කිහිපදෙනෙකුට ආරාධනාකර, විවාහයට සෙලෙස්ටියල් ආත්මික බව ගෙනදීමට ඔවුන්ගේ බිරිඳ හෝ ස්වාමි පුරුෂයා හෝ දෙමාපියන්ට කල හැකි යමක් බෙදාගැනීමට කීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

---

අවසානය

ගිව්සුම තුල විවාහවී, කුළුඳුල් භාවයේ ආශිර්වාදවලට සුදුසුව ජීවත්වීමේ වැදගත්කම ගැන අවධාරනය කරන්න. ඥානවන්ත තේරීම් කරමින්, තාවකාලික පිනවීම හෝ සතුට සඳහා සදාකාලික ආශිර්වාද හුවමාරු නොකිරීමට පංති සාමාජිකයන්ට අභියෝගකරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස්වලින් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. ඊසාක්ගේ බිරිඳ ලෙස රෙබෙකාව තෝරාගැනිත**

උත්පත්ති 24 එන පහත සඳහන් එක් එක් උපුටාගැනීම් කොලවල වෙන වෙනම ලියා, හැම පංති සාමාජිකයෙකුටම එකක් හෝ ඊට වැඩියෙන් හෝ දෙන්න. එම ප්‍රකාශය කල පුද්ගලයා සහ ප්‍රකාශය කුමන පදවල වාර්තාගතව තිබේදැයි, ශුද්ධ ලියවිලි පාවිච්චිකර සොයාගැනීමට පංති සාමාජිකයන්ට කියන්න. පංති සාමාජිකයන් එය නිමකල විට, එම ප්‍රකාශ සහ ඔවුන් කල එම ප්‍රකාශවල පාඨ සම්බන්ධය ගැන සාකච්ඡාකරන්න. ගිව්සුම තුල විවාහයේ ඇති වැදගත්කම, ආබ්‍රහම්ගේ සේවකයාගේ ඇදහිල්ල සහ පක්ෂපාතබව, සහ සදාකාලික සහකාරයෙක් ලැබීමට යහපත් තේරීමක් කිරීමට රෙබෙකා තුල තිබූ ගුණාංග පෙන්වා දෙන්න.

අ. "කනානිවරුන්ගේ දූවරුන්ගෙන් නුඹ මාගේ පුත්‍රයාට භාර්‍යාවක් නොගන්නේය."
ආ. "නුඹ මාගේම දේශයටද, මාගේම නෑයන් වෙතටද ගොස් මාගේ පුත්‍රයාට භාර්‍යාවක් ගන්නේය."
ඇ. "ස්වර්ගයේ දෙවිවූ ස්වාමීන්වහන්සේ…තමන්වහන්සේගේ දූතයා නුඹට පෙරටුව යවනසේක."
ඈ. "මාගේ ස්වාමියා කෙරෙහි ඔබවහන්සේ කරුණාව පෙන්වූ බව මම එයින් දැනගන්නෙමි."
ඉ. "ඔබගේ ඔටුවන්ටද බී නිමවන තෙක්, උන්ටත් මම ඇදදෙන්නෙමි."
ඊ. "මම වනාහි නාහෝර් නිසා මිල්කා වැදූ පුත්‍රයාවූ බෙතුයෙල්ගේ දූවය."
උ. "දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රශංසා වේවා [උන්වහන්සේ] මාගේ ස්වාමියාගේ සහෝදරයන්ගේ ගෙදරට මා පැමිණෙවූසේක."
ඌ. "තවද ඇය මට මෙසේ කීවාය, බීපන්න, නුඹේ ඔටුවන්ටත් ඇදදෙන්නෙමියි කියන්නාවූ කන්‍යාව ස්වාමීන්වහන්සේ විසින් මාගේ ස්වාමියාගේ පුත්‍රයාට නියමකල ස්ත්‍රීම වේවා."
එ. "ඉදින් නුඹලා මාගේ ස්වාමියාට කරුණාවෙන්ද අවංකකමෙන්ද ක්‍රියාකරන්නාහු නම්, මට කියාපල්ලා: එසේ නැතිනම් මට කියාපල්ලා."
ඒ. "මෙන්න, රෙබෙකා නුඹ ඉදිරියෙහිය, ඈ කැඳවාගෙන පලයන්න, ස්වාමීන්වහන්සේ කී ලෙස ඈ නුඹේ ස්වාමියාගේ පුත්‍රයාගේ භාර්‍යාව වේවා."
ඔ. "මම යන්නෙමි."
ඕ. "අපගේ සහෝදරිය, නුඹ දහස්වර දසදහස් ගණනකගේ මෑණියෝ වෙයන්න."

පිළිතුරු: අ-ආබ්‍රහම් (v. 3); ආ- ආබ්‍රහම් (v. 4); ඇ-ආබ්‍රහම් (v. 7); ඈ-සේවකයා (v. 14); ඉ-රෙබෙකා (v. 19); ඊ-රෙබෙකා (v. 24); උ-සේවකයා (v. 27); ඌ-සේවකයා (v. 44); එ-සේවකයා (v. 49); ඒ-ලාබන් සහ බෙතුයෙල් (v. 51); ඔ-රෙබෙකා (v. 58); ඕ-රෙබෙකාගේ පවුලේ අය (v. 60).

2. **"නිවැරදි විවාහය නිවැරදි දින යෙදීමෙන් ආරම්භවේ"**

- ඊසාක් සහ යාකොබ් යන දෙදෙනාටම ඔවුන්ගේ පියවරුන් උපදෙස් දුන්නේ ඔවුන්ගේම ඇදහිල්ලේ කාන්තාවන් සමග විවාහවීමටය. ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේ විශ්වාස නොකල භාර්‍යාවන් සමග විවාහවීමෙන් ඒසවු ඔහුගේ දෙමාපියන්ට ශෝකය ගෙනදුන්නේය. අපගේම ඇදහීමෙන් යුතු පුද්ගලයෙක් හා විවාහවීම වැදගත්වන්නේ මන්ද?

  ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාපතිවරයා මෙම උපදේශය දුන්නේය: "පාවුළු තුමා කොරොන්තිවරුන් අමතා, 'නොඇදහිලිකාරයන් සමග අසමලෙස සම්බන්ධ නොවෙල්ලා' යයි කීවේය…'සමහරවිට පාවුළු තුමාට අවශ්‍යවූයේ ඔවුන් ආගමික වෙනස්කම් මූලික වෙනස්කම් ලෙස දැකීමය. ආගමික වෙනස්කම් වාද විවාදවලට විශාල ලෙස මගපාදයි. සහා පක්ෂපාතකම් සහ පවුලේ පක්ෂපාතකම් ගැටීමෙන් ළමුන්ගේ ජීවිත නිරන්තරයෙන්ම නිෂ්ඵලවේ. සාමාජික නොවන්නෙක් සමහට විට එක සමාන දීප්තිමත්, හොඳින් පුහුණුවූ, කඩවසම් විය හැකි අතර, ඔහුට හෝ ඇයට බොහෝ ප්‍රියජනක පෞද්ගලිකත්වයක්ද තිබිය හැකි නමුත්, පොදු ඇදහිල්ලක් නොමැතිව, විවාහයේ කරදර ඇතිවිය හැකිය. මීට වෙනස් තත්වයන්ද ඇති නමුත්, සාමාන්‍යයෙන් ප්‍රතිඵල අසතුටුදායකය"(*The Miracle of Forgiveness* [1969], 240).

- ඔබ විවාහවන පුද්ගලයා සමග ඔබට සදාකාලික විවාහයක් ලැබීම සහතික කිරීම සඳහා ඔබට කල හැකිවන්නේ කුමක්ද? ඔබගේ වර්තමාන සම්බන්ධකම් සහ මිත්‍රත්වයන් ඔබගේ ඉදිරි ජීවිතයට සහ සදාකාලිකවද බලපාන්නේ කෙසේද?

  කිම්බල් සභාපතිතුමා තවදුරටත් මෙසේ කීවේය: "පැහැදිළිවම, නිසියාකාර විවාහය ආරම්භවන්නේ නිසියාකාර සම්බන්ධතාවයක් මගිනි. සාමන්‍යයෙන් යම් පුද්ගලයෙක් විවාහවන්නේ ඔහු සම්බන්ධකම් පවත්වන පුද්ගලයන් අතරින් කෙනෙක්…සමගය. එමනිසා, මෙම අවවාදය පැමිනෙන්නේ විශාල අවධාරනයක් සමගය. සාමාජික නොවන්නන් හෝ නුපුහුණු හෝ ඇදහිල්ල නැති අය හා දින යෙදීමේ අවදානම නොගන්න. ගැහැණු ළමයෙකු මෙසේ කිව හැකිය, "ඕ, මෙම පුද්ගලයා සමග විවාහවීමේ අදහසක් මට නැත. අප දෙදෙනා එකට පිටත්ව යන්නේ හුදෙක් විනෝදවීම සඳහාය.' නමුත් කිසිදාක සුහාරංචිය පිළිනොගන්නා කෙනෙක් සමග ප්‍රේමයෙන් බැඳීමේ අවදානම බාරගැනීමට යමෙකුට දරාගත නොහැකිය. සුළු ප්‍රමාණයක් සහා සාමාජිකයන් හා විවාහවීමෙන් පසුව අවසානයේදී බෞතීස්මවී ඇති

බව සත්‍යයකි....ඔවුහු අපගේ ආශිර්වාදිතවූ සුළුතරයක් වෙති....නමුත් බහුතරය සභාවට බැඳී නැති අතර,...විරෝධතා, විශ්වාස භංගත්වය සහ දික්කසාද විශාල වශයෙන් ඔවුන්ගේ විවාහවල ප්‍රතිඵලයවේ" (*The Miracle of Forgiveness*, 241–42).

### 3. දෙවියන්වහන්සේ මිනිසුන්ට මෙන්ම කාන්තාවන්ටද එළිදරව් දෙනසේක

එළිදරව් ගැන ශුද්ධ ලියවිලි වාර්තාවලින් වැඩිවශයෙන් ප්‍රකාශවන්නේ පූජකවරයේ නායකයන් සමග දෙවියන්වහන්සේගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයන්ය. ඔවුහු මිනිසුන් වෙති, කෙසේ වෙතත්, උත්පත්ති 25:22–23 දෙවියන්වහන්සේ කාන්තාවකට එළිදරව් දීමක් ගැන වාර්තාවක් ඇතුළත්වේ.

රෙබෙකාගේ යාච්ඤාව සම්බන්ධව, වැඩිමහල් බෲස් ආර්. මැක්කොන්කි මෙසේ කීවේය: අපගේ පොදු මුතුන්මිත්තනියකවූ රෙබෙකා, උදාහරණයක් ලෙස ගෙන ඇයගේ දියණියන් අද සභාවේ කුමක් කරන්නේදැයි බලමු?. . . රෙබෙකා කරදරයට පත්ව දිව්‍යමය මග පෙන්වීම ඇයට අවශ්‍යවී, එම කාරණය ඇය විසින්ම දෙවියන්වහන්සේට ඉදිරිපත්කල විට, ඊට පිළිතුරු දෙමින් දෙවියන්වහන්සේ ඇයට කථාකලසේක. ඇදහිල්ලෙන් යුතුව දෙවියන්වහන්සේට යාච්ඤාකරන කාන්තාවකට උන්වහන්සේ එළිදරව් දෙනසේක" (in Conference Report, ටහිටි ප්‍රාදේශීය සම්මන්ත්‍රනය 1976, 16).

- මිනිසුන් සහ කාන්තාවන් එළිදරව් ලබාගැනීමට එක සමානව තමන්ව සූදානම්කරගන්නේ කෙසේද?

### 4. ඉනිමගක් ස්වර්ගයට ලඟාවීමේ යාකොබ්ගේ දර්ශනය

- යාකොබ් බිරිඳක් සොයාගැනීමට සහ ඒසව්ගේ කෝපයෙන් බේරීම සඳහා කනාන් සිට ඔහුගේ නෑදෑයන්ගේ දේශයට ගමන්කරමින්, විවේක ගැනීමට රාත්‍රියක් නැවතී සිටියදී ඔහු අපූර්ව සිහිනයක් දුටුවේය (උත්පත්ති 28:10–19). යාකොබ් මෙම සිහිනය තුලින් දුටුවේ කුමක්ද? දෙවියන්වහන්සේ ඔහුට පොරොන්දුවූ ආශිර්වාද මොනවාද? (බලන්න උත්පත්ති 28:13–15.) මෙම දර්ශනය තුලින් යාකොබ් සමග අළුත්කල, ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද මේවාය; බලන්න 7 වෙනි පාඩම.) ඉණිමගින් සංකේතවත්වන්නේ මොනවාද?

  වැඩිමහල් මේරියන් ජී. රොම්නි මෙම සිහිනය ගැන මෙසේ කීවේය: "තමා ස්වාමීන්වහන්සේ සමග ඇතිකරගත් ගිවිසුම්. . .ඉණිමගේ හරස් පොලු බවත්, පොරොන්දු ආශිර්වාද ලබාගැනීම සඳහා තමා විසින්ම ඉහළට නැගිය යුතු බවත්— එම ආශිර්වාද ස්වර්ගයට ඇතුළුවී, ස්වාමීන්වහන්සේ සමග සම්බන්ධකම් පැවැත්වීමට තමාට හිමි බවත් යාකොබ් අවබෝධකර ගත්තේය" ("Temples— The Gates to Heaven," *Ensign*, මාර්. 1971, 16).

# "මම මේ මහත් දුෂ්ටකම කෙසේ කරම්ද?"

# 11
වෙනි පාඩම

*උත්පත්ති 34; 37–39*

**අරමුණ**

පංති සාමාජිකයන්ට (1) පංති සාමාජිකයන්ගේ අත්දැකීම් සහ අවස්ථාවන් සියලුම දේ ඔවුන්ගේ යහපත පිණිස එකට ක්‍රියාකරන හැටි දැනගැනීම සහ (2) ලිංගික සදාචාරය ගැන ස්වාමීන් වහන්සේගේ ප්‍රමිතීන්ට කීකරුවීමට ඔවුන්ගේ කැපවීම ශක්තිමත්කරගැනීමට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. උත්පත්ති 37. යාකොබ්ගේ එකොළොස්වෙනි පුත්‍රයාවූ, යෝසෙප්ට, ඔහුගේ සහෝදරයන් විසින් වෛරකරනු ලැබ වහල් කමට විකුණනු ලබයි.

   ආ. උත්පත්ති 39. යෝසෙප් වහල්කමේ සිටියදී සඵලවූ නමුත් දුශ්චරිතයට චෝදනා ලැබ සිරගෙට යවන ලදී (39:1–20). හිරගෙයි නායකයා අනෙක් සිරකරුවන්ගේ වගකීමද යෝසෙප් අතට බාරදුන්නේය (39:21–23).

   ඇ. උත්පත්ති 34:1–12; 35:22; 38:1–30. දුශ්චරිතයෙහි පාපය නිසා යාකොබ්ගේ පවුලේ අයවූ— දිනා ඔහුගේ දියණිය, (34: 1–12); ඔහුගේ වැඩිමහල් පුත්‍ර රූබන්ට (35:22); සහ ඔහුගේ තවත් පුත්‍රයෙකුවූ යුදාට (38:1–30) අසුභවාදී ප්‍රතිඵල ඇතිවේ.

2. අමතර කියවීම්: උත්පත්ති 34:13–31.

3. පහත සඳහන් දෘෂ්‍ය උපකරණ තිබේ නම්, පාඩමේ කොටසක් ලෙස ඒවායින් සමහරක් පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

   ආ. යොසෙප්ව ඔහුගේ සහෝදරයින් විසින් විකුණනු ලැබීම (62525; සුභාරංචි කලා පින්තූර මල්ල 109) සහ යොසෙප් පෝතිපර්ගේ බිරියට විරුද්ධ වෙයි (62548; සුභාරංචි කලා පින්තූර මල්ල 110).

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

ඔබගේ ප්‍රදේශයේ දැනට ජනප්‍රිය චිත්‍රපට, රූපවාහිනී දර්ශන, පොත්, හෝ සඟරා කිහිපයක් නම්කරන ලෙස පංති සාමාජිකයන්ට කියන්න.

- මෙම ජනප්‍රිය මාධ්‍ය අංශවලින් ඉදිරිපත් කෙරෙන ලිංගික සදාචාර ප්‍රමිතීන් මොනවාද? මෙම ප්‍රමිතීන්, ශුද්ධ ලියවිලිවලින් සහ සභා නායකයින් විසින් උගන්වනු ලබන ස්වාමීන්වහන්සේගේ ප්‍රමිතීන්වලින් වෙනස්වන්සේ කෙසේද?

සමාජයේ සදාචාරාත්මක හැසිරීම, ස්වාමීන්වහන්සේ පිහිටුවා තිබෙන සදාචාරාත්මක ප්‍රමිතීන් හා නිතරම වෙනස්වන බව පහදාදෙන්න. සමාජ ප්‍රමිතීන් වෙනස්විය හැකි අතර, ස්වාමීන්වහන්සේගේ ප්‍රමිතීන් නොවෙනස්වේ.

ස්වාමීන්වහන්සේගේ සදාචාර ප්‍රමිතිය අනුගමනයකල එක් මිනිසෙකු සහ එසේ නොකල වෙනත් මිනිසුන්ගේ අත්දැකීමක් මෙම පඩමෙන් සාකච්ඡාවෙයි. ස්වාමීන්වහන්සේගේ ප්‍රමිතීන් අනුගමනය කිරීමෙන් හෝ නොකිරීමෙන් ඇතිවන ප්‍රතිඵල ගැනද පාඩමෙන් සාකච්ඡාවෙයි.

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා යොදාගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් සාකච්ඡාකරන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දමද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට අදාළ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිමත්කරන්න.

**1. යෝසෙප්ව ඔහුගේ සහෝදරයන් විසින් වහල්කමට විකුණනු ලබයි.**

උත්පත්ති 37 උගන්වමින් සාකච්ඡාකරන්න.

යාකොබ් ඔහුගේ මවගේ සහොදරයාවූ ලාබන්ගේ දියණියන්වන ලෙයා සහ රාබෙල් මෙන්ම ඔවුන්ගේ දාසීන්වූ, ශිල්පා සහ බිල්හාද විවාහකර ගත්තේය. යාකොබ්ගේ බිරියෝ ඔහුට දාව පුතුන් දොළොසක් බිහිකල අතර, ඔවුහු ඉශ්‍රායෙල් ගෝත්‍ර දෙළොසේ ආරම්භකයන් වූහ (ස්වාමීන්වහන්සේ යාකොබ්ගේ නාමය ඉශ්‍රායෙල් වශයෙන් වෙනස් කලසේක; බලන්න උත්පත්ති 32:28). යාකොබ්ගේ එකොළොස්වෙනි පුත්‍රයා යෝසෙප්ය; යාකොබ් සහ රාබෙල්ගේ වැඩිමහල් පුත්‍රයා ලෙස, යෝසෙප්ට කුලුදුල්කම ලැබුනේ, යාකොබ් සහ ලෙයාගේ වැඩිමහල් පුත්‍රයාවූ රූබෙන්, අධර්මිෂ්ඨකම නිසා එය නැතිකරගත් බැවින්ය (1 ලේකම් 5:1–2).

- යෝසෙප්ගේ සහෝදරයා ඔහුට ඊර්ෂ්‍යාකලේ මන්ද? (බලන්න උත්පත්ති 37:3–8.) ඔබගේ පවුලේ අය ඔබව අමනාපකල විට හෝ ඔබට වඩා ඔවුන් වැඩි සැලකිලි ලබන විට, ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් කෙරෙහි ඊර්ෂ්‍යා සහගත හැඟීම් හෝ අමනාපකම් අප මැඩපවත්වාගන්නේ කෙසේද?
- යෝසෙප්ගේ පියා ඔහු අමතා, සෙබෙම්හි ඔහුගේ සහෝරයන් කමක් කරන්නේදැයි බලා එන ලෙස කී විට ඔහු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 37:13–14. සෙබම් පිහිටියේ සැතපුම් 45ක් පමණ දුරින් බව සලකන්න.) යෝසෙප්ට සෙබම්හිදී සිය සහෝදරයන් සොයාගැනීමට නොහැකිවූ විට ඔහු කලේ කුමක්ද? (බලන්න උත්පත්ති 37:15–17. දොතාන් පිහිටියේ අඩුම වශයෙන් තවත් සැතපුම් 12ක් දුරින් බව සලකන්න.) මෙම විස්තරයෙන් තරුණ යෝසෙප් ගැන අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? (පිළිතුරුවලට, ඔහු සිය පියාට කීකරුව සිටීම සහ ඔහුගේ පියා කියන ඕනෑම දෙයක් කිරීමට සූදානම්ව සිටීම ඇතුළත්විය හැකිය.)
- යොසෙප් තම සහෝදරයන් බැටළුවන්ට කවන කෙතට පැමිණිවිට, ඔවුන් කුමන්ත්‍රනය කලේ ඔහුට කුමක් කිරීමටද? (බලන්න උත්පත්ති 37:12–18.) යෝසෙප්ගේ ජීවිතය මුදාගැනීමට රූබෙන්ගේ සහ යුදාගේ හේතුන්වල තිබූ වෙනස කුමක්ද? (බලන්න උත්පත්ති 37:21–22, 26–27.) යෝසෙප්ව මරාදමනු වෙනුවට ඔහුගේ සහෝදරයන් අවසානයේ කලේ කුමක්ද? (බලන්න උත්පත්ති 37:28, 31–33.)

**2. "දෙවියන්වහන්සේට විරුද්ධව පව්කිරීම" යෝසෙප් ප්‍රතික්ෂේප කරයි.**

උත්පත්ති 39 උගන්වමින් සාකච්ඡාකරන්න.

- යෝසෙප්ව වහලෙකු ලෙස විකිණීමෙන් පසුව ස්වාමීන්වහන්සේ ඔහුට ආශිර්වාද කලේ කෙසේද? (බලන්න උත්පත්ති 39:1–4.) පාරාවොගේ පොහොසත් ඇමතියෙක්වූ පෝතිඵර්, වහලෙකුවූ යෝසෙප් කෙරෙහි එවන් විශ්වාසයක් තැබුවේ මන්ද? (බලන්න උත්පත්ති 39:5–6.)
- පෝතිඵර්ගේ භාර්‍යාව වරදක් කිරීමට යෝසෙප්ව පෙළඹවීමට උත්සාහකල විට, ඔහු කලේ කුමක්ද? (බලන්න උත්පත්ති 39:11–12. යෝසෙප් ක්ෂණයකින්ම එතැනින් ඉවත්ව ගිය බව පෙන්වා දෙන්න.) අපව පරීක්ෂාවකට ලක්වූ විටදී, අප යෝසෙප්ගේ ආදර්ශය අනුගමනය කරන්නේ කෙසේද?
- පෝතිඵර්ගේ බිරිඳගේ පෙළඹවීමට යටත්වීමට අවශ්‍යව තිබුනේ නම්, යෝසෙප්ට පාව්ච්චිකිරීමට ඉඩ තිබූ නිදහසට කරුණු මොනවාද? සදාචාර නීති කැඩීම සාධාරණීයකිරීමට උත්සාහකිරීම සඳහා වර්තමානයේ ජනතාව ඉදිරිපත්කරන නිදහසට කරුණු මොනවාද? මෙම නිදහසට කරුණු වළංගු හේතුන් නොවන්නේ මන්ද?
- පෝතිඵර්ගේ බිරිඳ ලඟට පැමිණි විට යෝසෙප්ගේ ගුණවත්කම නිසා ඔහුට ලැබුන දඬුවම කුමක්ද? (බලන්න උත්පත්ති 39:12–20. ඔහු පෝතිර්ගේ නිවසේ ප්‍රධානියාව සිට සිරකරුවෙක් බවට පත්විය.) අද ලෝකයේ සමහර පුද්ගලයන් ගුණවත් අයට සලකන්නේ කෙසේද? (පිළිතුරු

විවිධවිය හැකිය. ගුණවත් අය සමහර අවස්ථාවලදී අවමානයට ලක්වී, සාමාජීය වශයෙන් කොන්කරන නමුත්, නිතරම ඔවුන්ට ගරුකරනු ලැබේ.) වර්තමානයේදී ලෝකයේ දුරාචාර බලපෑමට තරුණයන්ට මුහුණ දීමට සිදුවීම සහ මෙම බලපෑමට තරුණයන්ට විරුද්ධවිය හැකි අන්දම ගැන සාකච්ඡාකිරීම ඔබට අවශ්‍යවිය හැකිය.

- යෝසෙප් සිරගෙදර සිටියදී, ස්වාමීන්වහන්සේ ඔහු සමග සිටි බව ශුද්ධ ලියවිලි අවධාරනයකරයි (උත්පත්ති 39:21–23). මෙයින් යොසෙප් ගැන එළිදරව්වන්නේ කුමක්ද? (ගුණවත්වීමේ ප්‍රතිඵලයක් ලෙස සිරගතවීමට සිදුවීම ගැන ප්‍රශ්නකිරීම හෝ දෙවියන්වහන්සේට චෝදනාකිරීම වෙනුවට ඔහු දිගටම ඇදහිල්ල පැවැත්වීය.) යෝසෙප්, අයහපත් අත්දැකීම් හෝ අවස්ථාවන් යහපත් දේවලට හරවාගැනීම ගැන අපට ඉගෙනගත හැක්කේ මොනවාද? (සාකච්ඡාව අතරතුරදී රෝම 8:28 කියවීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

  වැඩිමහල් හාට්මන් රෙක්ටර් කණි. මෙසේ පැහැදිළි කලේය: "[සෑම] දෙයක්ම යහපත් දෙයකට හරවාගැනීමේ හැකියාව පෙනීමට තිබෙන්නේ යහපත් ගුණාංගයක් බවය. මෙය කිරීමට හැකි බව අපගේ ස්වර්ගික පියාණන්වහන්සේට නිතරම පෙනීමට තිබෙනසේක. සෑම දෙයක්ම, කෙතරම් භයානකවුවද, ස්වාමීන්වහන්සේට ජයග්‍රහනයක් බවට පත්වේ. යෝසෙප්, සිරකරුවෙක්වී එම ඉරණම ගැන සම්පූර්ණයෙන්ම තේරුම්ගෙන සිටියේය. එසේවුවද, ඔහු ස්වාමීන්වහන්සේට ඇදහිලිමත්ව සිටිමින්, පණත් අනුව දිගටම ජීවත්වෙමින්, ඔහු පත්ව සිටි අවමන් තත්වය කිසියම් යහපත් තත්වයට සකස්කර ගත්තේය. මේ අන්දමේ අය පරාජයකල නොහැකිය" (in Conference Report, ඔක්තෝ. 1972, 170; හෝ *Ensign*, ජන. 1973, 130).

### 3. සෙබම්, රූබෙන් සහ යුදා, බරපතල දුරාචාර පාපයන් කළහ.

උත්පත්ති 34:1–12; 35:22; සහ 38:1–30 උගන්වමින් සාකච්ඡාකරන්න. මෙම මිනිසුන්ගේ පාප ක්‍රියා ගැන වැඩි දුර සාකච්ඡා නොකරන්න; යෝසෙප්ගේ ඇදහිලිමත්බවේ සංසන්දනයක් ලෙස ඒවා පාවිච්චි කරන්න.

- යෝසෙප්ගේ පවුලේ සාමාජිකයන් සහ හඳුනන්නන් සියලු දෙනාම පෙළඹවීම්වලට මුහුණදීමේදී යෝසෙප් මෙන් නිර්භීත නොවූ බව පෙන්වාදෙන්න. සෙබම්, රූබෙන් සහ යුදා, ලිංගික පෙළඹවීම්වලදී ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
- දිනා කෙරෙහි සෙබම් තුලවූ හැඟීම් විස්තරකෙරෙන උත්පත්ති 34:3 භාෂාව දෙස බලන්න. "ඔහුගේ සිත දීනා කෙරෙහි ඇලුම් විය…එසේම ඔහු සේවිකාවට ආදරය කළේය." මෙම විස්තරයේ සෙබම්ගේ ක්‍රියාවල අනුරූපබවක් නැත්තේ මන්ද? (සෙබම් දිනාට අවංකව ආදරය කලේ නම්, ඔහු ඇයව අපවිත්‍රකරන්නේ නැත. මිනිසුන් නිතරම දුරාචාර හැසිරීම් නිදොස්කිරීමට "අපි ආදරය කරන්නෙමු" යන නිදහසට කරුණ පාවිච්චිකරන නමුත්, එකිනෙකාට අවංකව ආදරයකරන මිනිසුන් ශාරීරික රාග හැඟීම් සහ අශාවන් පිනවීමට එකිනෙකා වරදට හෝ වේදනාවට පත්කරන්නේ නැත. යාච්ඤාකිරීම අසීරු කරන හැසිරීම, දේව මාළිගාවට ඇතුළුවීමට මිනිසුන් නුසුදුසුකරයි. නැතහොත් ආදරය මගින් ස්ථාපනය නොවූ පවුල් කැඩී බිඳී යන්නේය.)
- යාකොබ් සිය ජීවිතයේ අවසාන කාලයේදී තමාගේ හැම පුතෙකුටම ආශිර්වාදකරන විට, රූබෙන්ගේ සදාචාර නීති කැඩීම ගැන සඳහන්කල ඔහු, රූබන්ව විස්තර කලේ "ජලය මෙන් අස්ථිර බවටය (උත්පත්ති 49:3–4). මෙය නිවැරදි සැසඳීමක් වන්නේ කෙසේද? රූබෙන්ගේ පැවැත්මවූ "ජලය මෙන් අස්ථිරවීමේ" ප්‍රතිඵලය ගැන යාකොබ් රූබෙන්ට කීවේ කුමක්ද?
- ගුණවත්වීම සඳහා යෝසෙප් ගෙවූ මිල සහ දුශ්චරිතවත් වීමට රූබෙන් ගෙවූ මිලත් එකට සසඳන්න. තම දුශ්චරිතය නිසා රූබන්ට අහිමිවූයේ කුමක්ද? (බලන්න 1 ලේකම් 5:1–2.) වර්තමානයේදී ලිංගික පාපවලින් ආත්මිකව සහ ලෞකිකව ඇතිවන ප්‍රතිඵල මොනවාද?සදාචාරාත්මක පිරිසිදුකමට ස්වාමීන්වහන්සේ එතරම්ම වැදගත් ස්ථානයක් ලබාදෙන්නේ මන්ද?
- සභා නායකයන් නිරන්තරයෙන්ම උගන්වන්නේ දෙවියන්වහන්සේගේ පණත්වලට කීකරුවීම සැබෑ නිදහස බවය. මෙය අපි යෝසෙප්ගේ ජීවිතය තුල දකින්නේ කෙසේද? අකීකරුවීමේ ප්‍රතිඵලයක් ලෙස සෙබම්, රූබෙන් සහ යුදාගේ නිදහස අඩුවූයේ කෙසේද? පණත් තැබීමට තෝරාගැනීමෙන් ඒවා කඩකිරීමට වඩා අපව වඩාත් නිදහස් ලෙස තබන්නේ කෙසේද? (බලන්න යොහාන් 8:31–36.)

අවසානය

ස්වාමීන්වහන්සේගේ උපකාරය ඇතිව, අපගේ සියලුම අත්දැකීම් සහ අවස්ථාවන් අපගේම යහපතට එක්ව කටයුතුකරන බවට සාක්ෂි දරන්න. සිතිවිල්ලෙන් සහ ක්‍රියාවෙන් සදාචාරමත්ව පිරිසිදුව සිටීමේ වටිනාකම ගැනද සාකෂි දරන්න. චිත්‍රපට, සඟරා සහ වෙනත් මාධ්‍ය අගයකිරීමකට ලක්කර ලිංගික සදාචාරය පිළිබඳ ස්වාමීන්වහන්සේගේ ප්‍රමිතිය පෙන්වන ඒවා පමණක් පාවිච්චිකිරීමට පංති සාමාජිකයන්ට අභියෝගකරන්න. යෝසෙප් පතිවෘත්තාවේ නීතියට කීකරුවූ පරිදි, ඒ සඳහා කැපවීමට පංති සාමාජිකයන්ව දිරිමත්කරන්න.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

1. **බෙතෙල්—දෙවියන්වහන්සේගේ ගෘහයයි**

- යාකොබ් කනාන් සිට ඔහුගේ ඥාතීන්ගේ දේශයට ගමන්කරමින් සිටියදී, රාත්‍රියේදී විවේකගැනීම සඳහා ඔහු නැවතුන විට, මුදුන අහස දක්වා විහිදුන හිණිමගක් ඔහු ස්වප්නයකින් දුටුවේය (උත්පත්ති 28:10–19; 10 වෙනි පාඩමේ ඉගැන්වීමේ හතරවෙනි අමතර අදහස බලන්න.) මෙම ස්ථානය යාකොබ් බෙතල් යයි නම් කළේය. එහි අදහස "දෙවියන්වහන්සේගේ ගෘහය" නම්වේ (උත්පත්ති 28:19; පද සටහන් 19 අ බලන්න). වර්තමානයේ එම නම තිබෙන ස්ථානය කුමක්ද? (දේව මාළිගාවය. එය ස්වාමීන්වහන්සේගේ ගෘහය වශයෙන් හැඳින්වේ.)

  වැඩිමහල් මේරියන් ජී. රොම්නි මෙසේ සඳහන් කළේය, "යාකොබ්ට බෙතෙල් යම්සේ වටනේද, දේව මාළිගා අපටද එලෙසමය" ("Temples—The Gates to Heaven," *Ensign,* මාර්තු. 1971, 16).

- උත්පත්ති 35:1–15 සඳහන් පරිදි, යාකොබ් ඔහුගේ පවුලේ අය නැවතත් මෙම පූජනීය ස්ථානයට රැගෙන ගියේය. "දෙවියන්වහන්සේගේ ගෘහය" වූ බෙතෙල් නම් ස්ථානයට නැවත යාමට සූදානම්වීම සඳහා තම පවුලේ අයට කුමක් කිරීමට යාකොබ් කීවේද? (බලන්න උත්පත්ති 35:2.) ස්වාමීන්වහන්සේගේ ගෘහයට යාම සඳහා අපගේ සූදානම්වීම් මෙම දේවල් වලට සමානවන්නේ කෙසේද? අප අතර සිටිය හැකි "අන් දෙවිවරු" කව්ද?

  ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාපතිවරයා මෙසේ කීවේය:

  "ස්වාමීන්වහන්සේ අපටද අතීතයේ මෙන් අසහාය ලෙස සමෘධිමත් ජනතාවක් ලෙස ආශිර්වාදකර ඇත. අපගේ බලයට නතුකර දී තිබෙන උපකාරක යහපත් අතර, මෙහි පොළොවේ අපගේ කටයුතුවලට ඒවා අවශ්‍යවේ. නමුත් මා කණගාටුවන්නේ අප බොහෝ දෙනෙකුට වුවමනාවටත් වැඩියෙන් බැටළුවන්, ගවයන් සහ වතු පිටි මෙන්ම අටු කොටු සහ වස්තුව තිබෙන අතර, ව්‍යාජ දෙවිවරුන් ලෙස ඒවාට නමස්කාර කිරීමට පටන්ගෙන ඇති නිසා, ඒවා අප යටපත්කරගෙන ඇත. අපගේ ඇදහිල්ලට දරාගැනීමේ හැකියාවට වඩායහපත් දේවල් අධික ලෙස අප අතර තිබෙන්නේද?

  "අප නූතන ජනතාවක් ලෙස අපවම විග්‍රහකිරීම සහ අතීතයේදී කිසිම ජනතාවක් නොලද පාණ්ඩිත්‍යයක් අප ලබා තිබෙන බවට අපගේ ඇති නම්‍යශීලීත්වය නොකළකා හැර—අපි සාමාන්‍යයෙන්, පිළිම වන්දනාකරමින්—ස්වාමීන්වහන්සේට විශාල වරදක්කරන තත්වයක සිටින්නෙමු" ("The False Gods We Worship," *Ensign,* ජූනි 1976, 4, 6).

- අපි "[අපගේ] අන් දෙවිවරුන් පහකර දමා. . .පවිත්‍රවී" දේව මාළිගාවට යාමට සුදුස්සන් වන්නේ කෙසේද? (උත්පත්ති 35:2; ගීතාවලිය 24:3–4; 2 කොරොන්ති 7:1; මොරෝනි 10:30, 32 බලන්න.)

2. **යාකොබ් සහ ඒසව් නැවත සමගි වෙති**

- කනාන් දේශයට නැවත පැමිණීමේදී. තම සහෝදරයාවූ ඒසව් තමාට නැවතත් හමුවන බව යාකොබ් දැන සිටියේය (උත්පත්ති 32:3–23; 33:1–17). ඒසව් දැකීමට යාකොබ් බියවූයේ මන්ද?

(බලන්න උත්පත්ති 32:11.) ඒසව් මුණගැසීමට යාකොබ් සූදානම්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 32:13–20.) යාකොබ්ව නැවතත් මුණගැසුන විට ඒසව් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 33:4, 8–11,) පවුල් ආරවුල් විසඳාගැනීම සම්බන්ධයෙන් යාකොබ් සහ ඒසව්ගෙන් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද?

### 3. පරණ ගිවිසුම කාලයේ උප භාර්‍යාවන්

උත්පත්ති 35:2, සඳහන්වන්නේ රාකෙල්ගේ දාසියක් වන, බිල්හා, යාකොබ්ගේ උප භාර්‍යාවක් ලෙසය. පරණ ගිවිසුමේ එන උප භාර්‍යාව නම් වචනය පාවිච්චිකිරීම ගැන වැඩිමහල් බෲස් ආර්. මැක්කොන්කි පහත සඳහන් පැහැදිළිකිරීම කළේය:

"ඉතිහාසය මුළුල්ලේම සඳහන්ව තිබෙන දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ජනතාව සමග කල ගණුදෙනු වලදී, ඉශ්‍රායෙක් ගෘහයේ අයද ඇතුළුව, උප භාර්‍යාවන් හැඳින්වූයේ ඔවුන්ගේ ස්වාමි පුරුෂයන්ට විවාහයේ අළුත් සහ සදාකාලික ගිවිසුම තුලට විවාහවූ අය ලෙසය....පැරණි කාලයේ ඔවුන්ව සලකනු ලැබුවේ දෙවන භාර්‍යාවන් ලෙසය, එනම්, ඒ කාලයේ පැවති කුල ක්‍රමය අනුව උප භාර්‍යාවන් ලෙස හඳුන්වනු නොලැබූ භාර්‍යාවන්ට තිබූ වරප්‍රසාද සහ අයිතිවාසිකම් ඔවුන්ට නොතිබිනි" (*Mormon Doctrine,* දෙවන ප්‍රකා. [1966], 154).

# 12

වෙනි පාඩම

# “මාගේ විපත්තියේ දේශයේදී ඵලදායිවෙයල්ලා”

*උත්පත්ති 40–45*

---

**අරමුණ**

අපි ඇදහිලිවන්තව කීකරුවන්නේ නම්, අපගේ පීඩාවන් අපගේ යහපත සඳහා දෙවියන්වහන්සේ පවිත්‍ර කරනසේක.

---

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්නඃ
   - අ. උත්පත්ති 40–41. සිරගෙයි සිටියදී, යෝසෙප් පාරාවෝගේ සේවකයන්ගේ ස්වප්න නිවැරදිව අර්ථ දැක්වීය. ඔහු ඉන්පසුව එළදෙනුන් සහ කරල් ගැන පාරාවෝ දුටු ස්වප්න ගැනද අර්ථ දැක්වීය. යෝසෙප්ව පාරාවෝගේ යටතේ තිබූ මුළු මිසරයේම පාලකයා කර එළඹෙන සාගතය සඳහා ජනතාව සූදානම් කරයි.
   - ආ. උත්පත්ති 42ඃ–45. යාකොබ් තම පුත්‍රයන්ව ධාන්‍ය ගෙන ඒම සඳහා දෙවරක්ම මිසරයට යැවීය. යෝසෙප් ඔහුගේ සහෝදරයන්ට තමාව හඳුන්වා දෙමින් ඔවුන්ට සමාවදෙයි. තවද ඔවුහු එක්ව ප්‍රීතිවෙති.
2. අමතර කියවීම්ඃ 2 නිෆායි 2ඃ2; දහම සහ ගිවිසුම 64ඃ8–11; 122ඃ5–9.
3. උත්පත්ති 42–43 නේ කෙටි සාරාංශයක් ඉදිරිපත්කිරීමට සූදානම්වන ලෙස පංති සාමාජිකයෙකුගෙන් ඉල්ලීමට ඔබට අවශ්‍යවිය හැකිය.

---

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

තමන් මියගොස් ආත්මික ලෝකයට ඇතුළුවී මැරෙන සුළු ජීවිතයේදී කළ ක්‍රියාවන් දැන් නැවත සිහිපත්කරන බව සිතින් මවා ගැනීමට පංති සාමාජිකයන්ට කියන්න. ඔවුන්ගේ කරදර ඔවුන්ගේ ජීවිත හැඩගැස්වූ ආකාරය ගැන ඔවුන්ට සිතීමට උපකාරවත්වන ප්‍රශ්න හතරක් ඔබ අසන බව පැහැදිළි කරන්න. ප්‍රශ්න හතරම ඇසීමෙන් පසුව, ඔවුන්ට අවශ්‍ය ඕනෑම ප්‍රශ්නයකට අදහස් දැක්වීමට පංති සාමාජිකයන්ට ආරාධනා කරන්න.

- ඔබ මැරෙන සුළු ජීවිතයේදී මුහුණ දුන් යම් පරීක්ෂාවන් මොනවාද?
- ජීවිතයේ පරීක්ෂාවන්වලදී ඔබ ඉගෙනගත් පාඩම් මොනවාද?
- ඔබට ඔබගේ ජීවිතය ජීවත්වීමට හැකි නම්, ඔබ පරීක්ෂාවන්ට මුහුණදුන් ආකාරයෙන් ඔබ කරන වෙනස්කම් මොනවාද?
- ජීවිතයෙන් ලැබූ අත්දැකීම්වලින් වඩා හොඳ ප්‍රයෝජනයක් ඔබට ලබාගත හැකිව තිබුනේ කෙසේද?

මෙම පාඩම යාකොබ්ගේ පුත්‍රයාවූ, යොසෙප් පිළිබඳව සහ බලවත් පරීක්ෂාවන් තුලදී පවා ඔහු ඇදහිලිමත්ව සහ කීකරුව සිටි අන්දම ගැන බව පහදාදෙන්න.

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදළකර ගැනීම**

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළකරගන්නා අන්දම ගැනද සාකච්ඡා කරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධිත අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිමත්කරන්න.

1. **යොසෙප්, කුසලාන දරන්නන්ගේ නායකයා සහ පූප සාදන්නන්ගේ නායකයා සහ පාරාවෝගේ සිහින විසදයි. පාරාවෝ මුළු මිසර දේශය කෙරෙහි යොසෙප්ව අධිපති කොට තැබුවේය**

උත්පත්ති 40–41 උගන්වමින් සාකච්ඡාකරන්න.

ඉහත පාඩම සමාලෝචනයකර, යොසෙප් ඔහුගේ ජීවිතයේ මුල් කාලය තුළදී අත්දකිනු ලැබූ පරීක්ෂාවන් කිහිපයක් නම්කිරීමට පංති සාමාජිකයන්ට කියන්න (උත්පත්ති 37; 39). පංති සාමාජිකයන්ගේ ප්‍රතිචාර හුණුලෑල්ලේ ලිවීමට ඔබට අවශ්‍යවිය හැකිය. පිළිතුරුවලට ඇතුළත්විය හැකි කරුණු;

අ. ඔහුගේ සහෝදරයන් විසින් ඔහුට වෛරකරන ලදී (උත්පත්ති 37:4).
ආ. ඔහුගේ සහෝදරයන් ඔහුව මරාදැමීමට කුමන්ත්‍රනය කර, ඒවෙනුවට ඔහුව වහළෙකු සේ විකුණාදැමීය (උත්පත්ති 37:18–28).
ඇ. නපුර කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව ඔහුව අසාධාරණ ලෙස හිරගෙට දමන ලදී (උත්පත්ති 39:20).

- යොසෙප් තම පරීක්ෂාවන්ට ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? පරීක්ෂාවන් සහිත අවස්ථාවන්හිදී පවා ධර්මිෂ්ඨවීම නිසා යොසෙප්ට ස්වාමීන්වහන්සේ ආශිර්වාද කළේ කෙසේද?
- සිරගෙදර සිටියදී යොසෙප් පාරාවෝගේ කුසලාන දරන්නා සහ පූප සාදන්නා සමග එක්විය. ඔවුන් දෙදෙනාම සිහින දැක තිබූ අතර, ඒවා ඔවුන්ට තේරුම්ගැනීමට නොහැකිවිය. යොසෙප් කුසලාන දරන්නාගේ සිහිනය විසඳා දුන් විට, ඒ වෙනුවට ඔහු කුසලාන දරන්නාගෙන් ඉල්ලුවේ කුමක්ද? (බලන්න උත්පත්ති 40:14–15.) මෙය යොසෙප්ට තවත් පරීක්ෂාවක්වූයේ මන්ද? (බලන්න උත්පත්ති 41:1, 14. ඔහු තවත් වසර දෙකක් සිරගෙදර සිටියේය.)
- අවසානයේදී යොසෙප්ට සිරගෙයින් පිටවීමට ඉඩදුන්නේ මන්ද? (බලන්න උත්පත්ති 41:1, 8–15.) පාරාවෝ යොසෙප් අමතා, ඔහුට සිහින විසඳීමට හැකිබව තමා අසා තිබෙන බව කී විට, යොසෙප්ගේ ප්‍රතිචාරය වූයේ කුමක්ද? (බලන්න උත්පත්ති 41:16.) අපගේ දක්ෂතා සහ දීමනා වෙනුවෙන් අපි ස්වාමීන්වහන්සේට නිසි පිළිගැනීමක් දෙන්නේ කෙසේද? (ඒවා අපගේම කීර්තිය සඳහා නොව, දෙවියන්වහන්සේ මහිමයට පත්කිරීම සහ අන් අයට ආශිර්වාදකිරීම සඳහා අපට ඒවා පාවිච්චිකල හැකිය.)
- පාරාවෝ දුටු සිහිනය කුමක්ද? (බලන්න උත්පත්ති 41:1–7; 17:24.) පාරාවෝ දුටු සිහිනයේ විසඳුම කුමක්ද? (බලන්න උත්පත්ති 41:25–32.) යොසෙප් එය විසඳාදුන් පසුව, පාරාවෝ කල යුතු දේ ගැන ඔහු කීවේ කුමක්ද? (බලන්න උත්පත්ති 41:33–36; ඉගැන්වීමේ අදහස් දෙවන ප්‍රකාශනයද බලන්න.) සාගතයකට සූදානම්වීමට කල යොසෙප්ගේ යෝජනාවට පාරාවෝ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 41:37–43.)

2. **යොසෙප් තමාව සිය සහෝදරයන්ට හඳුන්වාදී, ඔවුන්ට සමාව දෙයි.**

උත්පත්ති 42–45 උගන්වමින් සාකච්ඡාකරන්න. උත්පත්ති 42–43 නේ කෙටි සංක්ෂේපයක් දීමට පංති සාමාජිකයෙක් පත්කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

- යොසෙප්ගේ සහෝදරයන් ප්‍රථම වරට මිසරයට පැමිණියේ මන්ද? (බලන්න උත්පත්ති 42:33–34; 43:2.) බෙන්යමින්ට ඔහුගේ සහෝදරයන් සමග මිසරයට යාමට ඉඩදීමට යාකොබ් පසුබට වුනේ මන්ද? (බලන්න උත්පත්ති 42:36, 38.) බෙන්යමින්ට යාම සඳහා ඉඩදීමට අවසානයේදී ඔහු එකඟවුනේ මන්ද? (බලන්න උත්පත්ති 43:3-5, 11–14.)
- බෙන්යමින්ව ඔහුගේ සහෝදරයන් සමග මිසරයට යැවීමෙන් තමාට තවත් පුත්‍රයෙක් නැතිවිය හැකි බව යාකොබ්ට හැඟිනි (බලන්න උත්පත්ති 42:36.) පරීක්ෂාවක් විය හැකි යයි යාකොබ් සිතූ දෙය ස්වාමීන්වහන්සේ ඔහුට ආශිර්වාදයක් බවට පත් කලේ කෙසේද?
- යොසෙප්ගේ බාල වියේදී, ඔහු දුටු සිහිනයක අනාවැකියකින් ඔහුගේ සහෝදරයන් අවසානයේදී ඔහුට වඳින බවට කියැවින. (උත්පත්ති 37:5–11.) මෙම සිහිනය ඉටුවුනේ කෙසේද? (බලන්න උත්පත්ති 42:6; 43:26–28.) මෙම සිහිනය ඉටුවුන හොත් තමන්ට විශාල පරීක්ෂාවක් විය හැකි බව සිතූ සහෝදරයන්ට, පසුව එය ආශිර්වාදයක් බවට පත්වුනේ කෙසේද?

- යොසෙප්ව වහල්කමට විකුණා වසර 20කටත් වඩා ගතව තිබියදීත්, ඔහුගේ සහෝදරයන් තවමත් ඔවුන්ගේ එම ක්‍රියාවට ඔවුන් වරදකරුවන් බව සිතුහ (උත්පත්ති 42:21). වරදක් අපගේ ජීවිතයේ සුභවාදී බලයක් විය හැක්කේ කෙසේද? එය අසුබවාදී බලයක් විය හැක්කේ කෙසේද? වරදකාරී හැඟීම් සම්පූර්ණ පසුතැවීම කෙරෙහි බලපාන්නේ කෙසේද? (බලන්න ඊනස් 1:4-6.)

- යොසෙප්ගේ සොහොයුරු යුදා, යොසෙප්ව අවසන්වරට දුටුදා සිටම කරුණාවන්ත පුද්ගලෙකුවූ බව පෙන්වූවේ කෙසේද? (බලන්න උත්පත්ති 44:18, 30–34. යොසේව වහලෙකු ලෙස විකිණීම යුදාගේ අදහසව තිබූ බව පංති සාමාජිකයන්ට සිහිපත් කරන්න.)

- යොසෙප් තම අනන්‍යතාවය ඔහුගේ සහෝදරයන්ට හෙළිකල විට, යොසෙප්ගේ සහෝදරයෝ කණගාටුවීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (බලන්න උත්පත්ති 45:1–3.) තම සහෝදරයන්ට සමාව දුන් බව යොසෙප් පෙන්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 45:4–11, 14–15.) ඔබ සිතන පරිදි, යොසේගේ සමාවදීම ඔහුගේ සහෝදරයන් ආත්මිකව එසවීමට උපකාරවූයේ කෙසේද?

- යොසෙප්ගේ සොහොයුරන් ඔහුට කලාසේ වරදක් යමෙක් අපට කල විට, ලෝකයා අපට කරන්ට කියන්නේ කුමක්ද? ස්වාමීන්වහන්සේ අපට කියන්නේ කුමක් කිරීමටද? (බලන්න ඕසහසී 64:8–11.) ඔබට වැරදි ලෙස සැලකූ අයට ඔබ කරුණාවෙන් කටයුතු කල විට, ඔබ ආශිර්වාදිත වූයේ කෙසේද? අප වඩාත් සමාව දෙන තත්වයට පත්වන්නේ කෙසේද?

- යොසේපට පරීක්ෂාවක්වූ මිසරයේ සිරගතව සිටීම, ඔහුටද, ඔහුගේ පවුලට,සහ මුළු මිසරයටම ආශිර්වාදයක් බවට පත්වුනේ කෙසේද? (බලන්න උත්පත්ති 45:4–8.) අපගේම අභියෝග සහ පරීක්ෂාවන්ට මුහුණදීමේදී අපි යොසෙප්ගේ ආදර්ශය අනුගමනය කරන්නේ කෙසේද?

- අළුත් ගිවිසුමේ, පාවුළු ප්‍රේරිතවරයා රෝමවරුන්ට මෙසේ කීවේය, "දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන්නේය." (රෝම 8:28). මෙය ඔබගේ ජීවිතය තුල සැබෑවක් වූයේ කෙසේද? පළමුවෙන් අසුභවාදීව පැමිණුන යම් සිද්ධියක් පසුව ආශිර්වාදයක් බවට පත්වීමේ පෞද්ගලික අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන්ට ආරාධනාකරන්න.

---

අවසානය

යොසෙප් තමාට පැමිණුන සෑම පරීක්ෂාවකදීම, ඇදහිලිමත්ව සිටි බව පංති සාමාජිකයන්ට සිහිපත් කරන්න. ඔහුව වහල්කමට විකුණුවිටදී පවා ඔහු තම සොහොයුරන්ට කමාව දුන්නේය. තම ධර්මිෂ්ඨකම නිසා, යොසෙප් විශාල ලෙස ආශිර්වාදිත විය. අපි ඇදහිලිවන්ත නම්, සෑම දෙයක්ම අපගේ යහපත පිණිස එක්ව ක්‍රියාකිරීමට සලස්වමින් දෙවියන්වහන්සේ අපට අශිර්වාදකරන බවට සාක්ෂි දරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනා කල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස්වලින් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චි කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. පසු-දවස්වල ශ්‍රේෂ්ඨ ජෝසෆ්**

උත්පත්ති 50:24–38 ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ, යොසෙප්ගෙන් පැවතෙන්නෙකු "තෝරාගත් දර්ශන දකින්නෙකු" බවට පත්වන බවට අනාවැකි ඇතුළත්වේ. මෝර්මන්ගේ පොතේ අනාගත වක්තෘවරයෙකු වන ලීහායි, මෙම අනාවැකි ගැන 2 නීෆායි 3:5–15 තුලින් ප්‍රකාශකර ඇත. මෙම අනාවැකිවලින් ප්‍රකාශවන පැවතෙන්නා අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ය.

මිසරයේ යොසෙෆ් ප්‍රකාශකල පහත සඳහන් අනාවැකි ජෝසෆ් ස්මිත්ගේ ජීවිතය තුල සම්පූර්ණවූ අන්දම ගැන සාකච්ඡාකරන්න.

අ. යොසෙප්ගෙන් පැවතෙන්නෙකු "තෝරාගත් දර්ශනදකින්නෙකු" වනු ඇත. (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 50:26; 2 නිෆායි 3:6).

ආ. මෙම දර්ශනදකින්නාට වෙනත් පැවතෙන්නන් විශාල ලෙස ගරුකරනු ඇත (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 50:27; 2 නිෆායි 3:7).

ඇ. ඔහුගේ මුතුන් මිත්තන් සමග දෙවියන්වහන්සේ කල ගිවිසුම් ඔහු ඔවුන්ට උගන්වනු ඇත (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 50:28; 2 නිෆායි 3:7).

ඈ. ඔහු දෙවියන්වහන්සේට කීකරුවනු ඇත (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 50:28; 2 නිෆායි 3:8).

ඉ. ඔහු මෝසස් මෙන් ශ්‍රේෂ්ඨ අනාගතවක්තෘවරයෙකු වනු ඇත (ජෝසෆ් ස්මිත්, උත්පත්ති 50:29; 2 නිෆායි 3:9).

ඊ. නව ශුද්ධ ලියවිලි ඉදිරියට ගෙන එන්නා ඔහු වනු ඇත (මෝර්මන්ගේ පොත) එය දැනට තිබෙන (බයිබලය) සමග සහයෝගයෙන් කටයුතු කරනු ඇත (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 50:30–31; 2 නිෆායි 3:11–12).

උ. ඔහු දුර්වල වුවද, ස්වාමීන්වහන්සේ ඔහුව ශකිමත් කරනසේක (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 50:32; 2 නිෆායි 3:13).

ඌ.ඔහු සහ ඔහුගේ පියා යන දෙදෙනාම ජෝසෆ් යයි නම්කරනු ඇත (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, උත්පත්ති 50:33; 2 නිෆායි 3:15).

2. **සාගතයට සූදානම්වීම**

- සාරවත් අවුරුදු හතක් පැමිණෙන බවත්, ඉන්පසුව පැමිණෙන අවුරුදු හතේ සාගතයට මිසරය සූදානම්කිරීම සඳහා එම අවුරුදු හත යොදාගන්නා ලෙස යොසෙප් පාරාවෝට උපදෙස් දුන්නේය. (උත්පත්ති 41:29–30, 34–36). සාගතයක් හෝ වෙනත් අසීරුතාවයකදී සූදානම්වීම සඳහා අපගේ සභා නායකයන් අපට දෙන උපදේශය කුමක්ද?

  වැඩිහිටි ටොම් පෙරී මෙසේ ඉගැන්වීය:

  "අපව ආත්මිකව සූදානම්කිරීම වැදගත්වන ලෙස, අපගේ ලෞකික අවශ්‍යතාවයන් සඳහාද අපි අපව සූදානම්කල යුතු වෙමු. . . . පැමිණිය හැකි අවස්ථාවකට සූදානම්ව සිටීම සඳහා අඩු වශයෙන් අවශ්‍යතාවයන් හතරක්වත් අනුගමනයකිරීමට වසර ගණනාවක්ම අපට උපදෙස් දී ඇත

  "පළමුව, ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලබාගැනීම. ඔබගේ සහ ඔබගේ පවුලේ අවශ්‍යතාවයන් මිළදීගැනීම සඳහා ප්‍රමාණවත් වැටුපක් ඔබට ලැබෙන ස්ථිර රැකියාවක් ලබාගැනීමට හැකි වෙළඳාමක් හෝ වෘත්තියක් ඉගෙනගැනීම....

  "දෙවැනිව, ඔබගේ ආදායමට සරිලන ලෙස ජීවත්වෙමින්, අසීරු අවස්ථාවක් සඳහා යමක් ඉතිරිකරන්න. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාදයක් ලෙස දුන් අයවැය පාලනය අනුව තදින්ම ඔබගේ ජීවිතය හික්මවාගන්න . ඔබ ක්‍රමානුකූලව දසයෙන් කොටස ගෙවන ලෙස, පවුලේ ඉදිරි අවශ්‍යතාවයන් වෙනුවෙන් යම් මුදලක් වෙන්කර තබන්න....

  "තුන්වැනිව, වැඩිපුර ණයවීමෙන් වළකින්න. අත්‍යාවශ්‍ය ණයගැනීම් කල යුත්තේ, යාච්ඤාවෙන් සිතාබලා, සහ හැකි හොඳම අවවාදය ලබාගැනීමෙන් පසුව පමණය. අපට නැවත ගෙවීමට හැකිබවට ආත්ම ශක්තියක් අප තුල තිබිය යුතුය.

  "හතරවැනිව, ජීවිතය පවත්වාගැනීමට හැකි ලෙස ප්‍රමාණවත් අහාර සහ ද්‍රව්‍යයන් ලබාගෙන ගබඩාකරගන්න (ප්‍රදේශයේ නීතිමගින් එවැනි ගබඩාකිරීම්වලට ඉඩ ලැබේනම් පමණි) ඇඳුම් තබාගෙන, හදිසි අවස්ථාවකදී හොඳින් ක්‍රියාත්මකවන ඉතිරිකිරීමේ ගිණුමක් බුද්ධිමත්ව, හොඳින් සැලසුම්කර ආරම්භකරන්න. මට මතක තිබෙන පරිදි, අනාගතයට සූදානම්ව, වසරකට ප්‍රමාණවත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමට අපට උගන්වා ඇත. සාරවත් වර්ෂවලදී මෙම උපදේශය අප සියලුදෙනාටම අමතකවේ. මෙම උපදේශය නොසළකා හැරීම පැවති කාලය නිමවී ඇත. අද ලෝකයේ සිදුවීම් අනුව මේ උපදේශය ගැන ඉතා බරපතල ලෙස සලකාබැලිය යුතුය" (in Conference Report, ඔක්තෝ. 1995, 46–47; හෝ *Ensign*, නොවැ. 1995, 36).

- සාගත කාලය තුලදී, "සියලු දේශ වාසීහු යොසෙප් සොයා ධාන්‍ය මිළදී ගැනීමට මිසරයට පැමිණියේ සාගතයට සූදානම්ව සිටියේ මිසරය පමණක්ම නිසාය (උත්පත්ති 41:54–57). සූදානම්ව සිටීමෙන් අන් අයට සේවයකිරීමේ ප්‍රස්ථාවන් අපට ලැබෙන්නේ කෙසේද?

3. **යොසෙප්ගේ පුත්‍රයෝ**

- පාරාවෝ යොසෙප්ව මිසරයේ පාලකයා කිරීමෙන් පසු, යොසෙප් ආසෙනත් නම් කාන්තාවක් විවාහකර ගත්තේය. ඔවුන්ට පුතුන් දෙදෙනක් ලැබුනේය (උත්පත්ති 41:45, 50). යොසෙප් සහ ආසෙනත් ඔවුන්ට තැබූ නම් මොනවාද? (බලන්න උත්පත්ති 41:51–52.) යොසෙප්ගේ පුත්‍රයන්ට මෙවැනි යෝග්‍ය නම් ලැබුනේ මන්ද? (මනසසේ යනු "අමතකකිරීම" බවත් එප්‍රායිම් යනු "සාරවත්බව" යන්නත් පංති සාමාජිකයන්ට කියාදීම ඔබට අවශ්‍යවිය හැකිය.)

# වහල්භාවය, පාස්කුව, සහ නික්මයාම

# 13
වෙනි පාඩම

*නික්මයාම 1–3; 5–6; 11–14*

**අරමුණ** පංතිසාමාජිකයන්ට (1) ස්වාමීන්වහන්සේගේ පොරොන්දු ගැන එතුමා තුල විශ්වාසය තැබීමට, (2) ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමේ දිව්‍යපූජාව වෙනුවෙන් ඔවුන්ගේ කෘතඥතාවය වැඩිකිරීමට, සහ (3) ඔවුන්ගේ ජීවිත තුල සක්‍රමේන්තුව වඩාත් අර්ථවත් කිරීමට ධෛර්‍යය ලාබඳීම සඳහාය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. නික්මයාම 1–3. මිසරයන් විසින් ඉශ්‍රායෙල් දරුවන් වහලුන් කර ගනී (1:1–14). ඉශ්‍රායෙල්වරුන්ට ඉපදෙන සියලුම පුත්‍රයන් මරාදමන ලෙස පාරාවෝ අණකරයි (1:15–22). මෝසස් උත්පත්තිය ලබා පාරාවෝගේ දියණිය විසින් හදාවඩා ගැනින (2:1–10). මෝසස් මිසරයෙකු මරා දමා මිදියන් දේශයට පලාගොස්, තවද එහිදී ඔහු ශිප්පොරා විවාහකර ගනියි (2:11–22). ස්වාමීන්වහන්සේ ගිනිගත් පඳුර ළඟින් මෝසස්ට ප්‍රකාශවී ඉශ්‍රායෙල්ව වහල්බවින් මුදවාගැනීමට ඔහු කැඳවනසේක (3:1–22; නික්මයාම 3:2 සඳහන්වන මෙම "ස්වාමීන්වහන්සේගේ දූතයා" යන වාක්‍ය කණ්ඩය ජෝසෆ් ස්මිත් බයිබල් පරිවර්තනයේ, "ස්වාමීන්වහන්සේ සම්මුඛවීම" යනුවෙන් වෙනස්කර තිබෙන බව සටහන්කර ගන්න).

   ආ. නික්මයාම 5–6. මෝසෙස් සහ ආරොන් ඉශ්‍රායෙල් නිදහස්කර ලෙස පාරාවෝගෙන් ඉල්ලන නමුත්, පාරාවෝ එය ප්‍රතික්ෂේපකරමින් ජනතාව මත තවතවත් බර පැටවීය (5:1–23). ස්වාමීන්වහන්සේ ආබ්‍රහම් සමග තැබූ ගිවිසුම සම්පූර්ණකරන බව උන්වහන්සේ පොරොන්දු වනසේක (6:1–8). සටහනඃ පරිච්ඡේද 7–10, මෝසෙස් අවස්ථා කිහිපයකදීම පාරාවෝ වෙත ගොස් ඉශ්‍රායෙල් නිදහස්කරන ලෙස ඔහුගෙන් ඉල්ලාසිටින බව කියවේ. බොහෝ සළකුනු, පුදුමයන් සහ සාගත ගැන නොසළකා හරිමින් පාරාවෝ එය ප්‍රතික්ෂේපකරයි. ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ මෙම පරිච්ඡේදවල, "ස්වාමීන්වහන්සේ පාරාවෝගේ සිත දැඩිකලසේක" යන වාක්‍ය කණ්ඩය "පාරාවෝ තම සිත දැඩිකරගත්තේය" යනුවෙන් වෙනස්කර ඇත.)

   ඇ. නික්මයාම 11–13. ස්වාමීන්වහන්සේ තවත් වසංගතයක් එවීමට පොරොන්දුවන අතර, එයින් සෑම නිවසකම කුළුඳුලන් මරණයට පත්වන්නේය (11:1–10). ස්වාමීන්වහන්සේ මෝසෙස්ට උපදෙස් දෙමින්, පාස්කුවට සූදානම්වෙන ලෙසද එයින් ඉශ්‍රායෙල්වරුන් වසංගතයෙන් ආරක්ෂාවෙනබවද කීසේක ((12:1–20). මිසරයේ කුළුඳුලන් මරාදැමීන (12:29–30).පාරාවෝ මෝසස් අමතා, ඔහුගේ සෙනග සහ ඉශ්‍රායෙල්වරුන් සමග මිසරයෙන් පිටවන ලෙස ඔහුට කියයි (12:31–42). මෝසස් ඊශ්‍රායෙල් දරුවන් අමතා, ඉදිරියේදී ඔවුන්ගේ ගැලවීම සිහිපත්කරන පිණිස මුහුන් නොමුසු රොටි මංගල්‍යය පැවැත්වීමට කියයි (13:1–16). ස්වාමීන්වහන්සේ දහවලේදී ඔවුන්ගේ කූඩාරම ඉදිරියෙන් වළාකුලකින් ගමන්කරන අතර, රාත්‍රියේදී ගිනි කුළුනක් ලෙස යනසේක (13:17–22). (සටහනඃ පාස්කු මංගල්‍යයය සහ මුහුන් නොමුසු රොටි මංගල්‍යයය යන යෙදුම් නිතරම සමාන අර්ථ දක්වයි, පාස්කුව යනු මුහුන් නොමුසු රොටි මංගල්‍යයේ පළමු දවසවේ.)

   ඇ. නික්මයාම 14. පාරාවෝ සහ ඔහුගේ හමුදාව ඉශ්‍රායෙල් දරුවන් ලුහුබැඳ ගියහ (14:1–9). ජනතාව බියට පත්වන අතර, මෝසස් උදව් ඉල්ලා ස්වාමීන්වහන්සේට ආයාචනාකරයි (14:10–18). ඉශ්‍රායෙල් දරුවෝ හමුදාවෙන් ගැලවී රතු මුහුද වියලි පොළොව මතින් තරණයකරති; ඔවුන් ලුහුබැඳ ගිය මිනිස්සු ගිලීමෙන් මරණයට පත්වෙති (14:19–31).

2. අමතර කියවීම් නික්මයාම 4:7–10; 15.

3. නික්මයාම 1 සහ 2 පරිච්ඡේදවල කෙටි සමාලෝචනයක් ඉදිරිපත්කිරීමට සූදානම්වන ලෙස පංති සාමාජිකයෙකුට කියන්න.

4. පාස්කුව සහ සක්‍රමේන්තුව යන වචනවල වචනතීරු සූදානම්කරන්න.

5. පහත සඳහන් දෘෂ්‍ය උපකරණ තිබේ නම්, පාඩමේ කොටසක් ලෙස එයින් කිහිපයක් පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

   අ. "සත්ව බිලිපූජාව සහ වන්දිගෙවීම," *පරන ගිවිසුම වීඩියෝ ඉදිරිපත්කිරීම*, මිනිත්තු නමයක කොටස (53224).

   ආ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පින්තූරය (62572); සුභාරංචි කලා පින්තූර මල්ල 240); මෝසස් පඳුරු තුල සිටියි (62063; සුභාරංචි කලා පින්තූර මල්ල 106); මෝසස් සහ ගිනිගත් පඳුර (62239; සුභාරංචි කලා පින්තූර මල්ල 107); සහ රතුමුහුද තරනයකිරීම (62100).

---

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම හෝ (ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

පංති සාමාජිකයන් කවදා හෝ යම් බියජනක අවස්ථාවකින් ගැලවී තිබේදැයි ඔවුන්ගෙන් අසන්න. ඔවුන්ගෙන් එක් අයෙකුට හෝ දෙදෙනෙකුට ඔවුන්ගේ අත්දැකීම් කෙටියෙන් බෙදාගැනීමට ආරාධනා කරන්න, නැතහොත් ඔබගේම එකක් ප්‍රකාශකරන්න. ඔවුන්ව ගලවාගත් තැනැත්තා ගැන ඔවුන්ට හැඟුන අන්දම ගැන පංති සාමාජිකයන්ගෙන් අසන්න.

මෙම පාඩම ඉශ්‍රායෙල් දරුවන් වසංගත මරණයෙන් සහ මිසරයේ වහල් බවින් මුදාගැනීම වැනි—කිසිදා නොවූ විරූ විස්මයජනක ගැලවීම් සම්බන්ධයෙන් බව පහදාදෙන්න. මෙම මුදවාගැනීම, මීට වඩා ශ්‍රේෂ්ඨ මුදවාගැනීමක්වූ ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමේ දිව්‍යපූජාව තුළින්—පාපයෙන් සහ මරණයෙන් අපව මුදවාගැනීම විවිධාකාරයෙන් සංකේතමත්වන බව පහදාදෙන්න.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකර ගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාලකර ගන්නා අන්දම ගැනද සාකච්ඡා කරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට අදාළ අත්දැකීම් ප්‍රකාශ කිරීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

යාකොබ් සහ ඔහුගේ පවුල මිසරයට පදිංචියට යාමෙන් පසුව, ඉශ්‍රායෙල්වරු වසර 430ක කාලයක් එහි ජීවත්වූහ. එම කාලය තුල පාරාවෝ කෙනෙක් නැගී සිට, ඔවුන්ව වහල්භාවයට පත් ඔවුන්ට බරපතල බර පැනවීය. යොසෙප් අනාවැකි කී ලෙස, ඉශ්‍රයෙල් දරුවන් මුදාගැනීම සහ ස්වාමීන් වහන්සේ මොසෙස්ව නැගිටවූසේක (2 නිෆායි 3:10).

**1. ඉශ්‍රායෙල් වහල්බවින් මුදාගැනීමට ස්වාමීන්වහන්සේ මෝසෙස් කැඳවනසේක.**

නික්මයාම 1 සහ 2 පරිච්ඡේදවල කෙටි විග්‍රහයක් දීමට පංති සාමාජිකයෙකු පත්කර, නික්මයාම 3 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ඉශ්‍රායෙල්ව වහල්බවින් මුදවාගැනීම සඳහා ස්වාමීන්වහන්සේ මෝසෙස් කැඳවූවේ මන්ද? (බලන්න නික්මයාම 3:1–4.) ස්වාමීන්වහන්සේ මෝසස්ව කැඳවන අතර ඔහුට කීවේ මොනවාද? (බලන්න නික්මයාම 3:5–10). මෝසෙස්ව කැඳවීම මගින් අපට ස්වාමීන්වහන්සේ ගැන ඉගෙනගත හැක්කේ කුමක්ද? (පිළිතුරුවලට, ස්වාමීන්වහන්සේ තම ජනතාව හඳුනාගෙන සිටීම, ඔවුන්ට දයාවන්තවීම, ඔවුන්ට ආශිර්වාදකිරීමට වුවමනාවීම, සහ ඔවුන්ට දුන් පොරොන්දු තැබීම යනාදිය ඇතුළත්විය හැකිය.)

- තමන් මිසරයේ ජීවත්වන ඉශ්‍රායෙල් දරුවන් ලෙස සිතාගැනීමට පංති සාමාජිකයන්ට ආරාධනාකරන්න. පරම්පරා ගණනාවක සිටම ඔවුන් දෙවියන්වහන්සේගේ ගිවිසුම්කල ජනතාව බවත් උන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු ඉටුකරන බවත්, ඔවුන්ට උගන්වා ඇත. එහෙත් දැන් ඔවුන් වහළුන් ලෙස පීඩාවිඳිමින් වහල්භාවයේ ජීවත් වෙති. අපි විපතකට පත්වූ විට, උපකාර පතා මෙම තත්වයන් තුලින් අපට ඉගෙනගත හැක්කේ මොනවාද? (උන්වහන්සේ මෝසස්ව කැඳවා අවසානයේදී ඉශ්‍රායෙල්ව මුදවාගත් ලෙස දෙවියන්වහන්සේ අපගේ ආපදාවලදී අපව අමතක නොකරනසේක. නමුත් උන්වහන්සේ සාමාන්‍යයෙන් පරීක්ෂාවන්වලින් අපව ක්ෂණිකවම මුදවා නොගන්නාසේක. පරීක්ෂාව කොපමණ කාලයක් තිබුනද, ඒ ගැන නොතකා

අපි නිතරම උන්වහන්සේට යාච්ඤාකරමින්, උන්වහන්සේ අපට ප්‍රේමකරන විශ්වාස සහිතව, අපි උන්වහන්සේව විශ්වාස කරන්නේ නම්, සියල්ලම එකට එක්ව අපගේ යහපතට ක්‍රියාකරන බව සිතිය යුතුය. බලන්න ඩීසහසී 90:24; 98:3; මොසායා 24:14–15.) ආපදා අවස්ථාවලදී ස්වාමීන්වහන්සේගේ සැනසීම සහ උපකාරය ඔබට ලැබුනේ කෙසේද?

- ස්වාමීන්වහන්සේ මෝසස් කැඳවා, ඉශ්‍රායෙල් මුදවාගැනීමට ඔහුට කී විට මෝසෙස් කීවේ කුමක්ද? (බලන්න නික්මයාම 3:11; 4:1, 10.) මෝසෙස්ට තමාගේ අඩුපාඩු ගැන හැඟුනේ කුමන මාර්ගවලින්ද? ස්වාමීන්වහන්සේ ඔහුට දුන් සහතිකය කුමක්ද? (බලන්න නික්මයාම 3:12; 4:11–12.) ඔබට ස්වාමීන්වහන්සේගෙන් කැඳවීමක් ලැබුන විට ඔබට ඇතිවන හැඟීම් මොනවාද? අඩුපාඩු පිළිබඳ සමහර හැඟීම් යහපත් නොවන්නේ මන්ද? ස්වාමීන්වහන්සේ ඔබට දුන් කැඳවීමකදී ඔබගේ අඩුපාඩු ගැන හැඟුන විට උන්වහන්සේ ඔබට උපකාර කලේ කෙසේද?
- තම ජනතාව මෙහෙයවීමේ කැඳවීම පිළිගැනීම මගින් මෝසෙස් පරිත්‍යාග කලේ කුමක්ද? (බලන්න හෙබ්‍රෙව් 11:24–26.) ස්වාමීන්වහන්සේට සේවයකිරීමේ කැඳවීම පිළිගැනීම මගින් අපි පරිත්‍යාග කරන්නේ මොනවාද? ස්වාමීන්වහන්සේ වෙනුවෙන් පරිත්‍යාගකිරීමට අප කැමතිව සිටීම වැදගත්වන්නේ මන්ද?

2. **ස්වාමීන්වහන්සේ මිසරය වෙත වසංගත යවනසේක.**

නික්මයාම 5–6 උගන්වමින් සාකච්ඡාකරන්න. නික්මයාම 7–10 කෙටියෙන් විග්‍රහයක් කර, මෝසස් කිහිප විටක්ම පාරොවෝ වෙත ගොස් ඉශ්‍රායෙල් නිදහස් කරන ලෙස ඔහුගෙන් ඉල්ලූබව පැහැදිළිකිරීමටද ඔබට අවශ්‍යවිය හැකිය. සළකුනු, පුදුමයන් සහ වසංගත ගැන නොසලකා පාරාවෝ එය ප්‍රතික්ෂේප කළේය. ඔබ සමහරවිට සළකුනු, පුදුමයන් සහ වසංගත එකිනෙක සමාලෝචනය කිරීමට පංති කාලය නොගත යුතුය.

- මෝසස් සහ ආරොන් ඉශ්‍රායෙල් දරුවන් නිදහස්කරන ලෙස පාරාවෝගෙන් ප්‍රථම වරට ඉල්ලූ විට ඔහු ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? (බලන්න නික්මයාම 5:1–9.) මෙම පරීක්ෂාවට ඉශ්‍රායෙල් දරුවන් ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? (බලන්න නික්මයාම 5:15–21.) මෝසෙස් එයට ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? (බලන්න නික්මයාම 5:22–23.) මෙම වාර්තාවෙන් අපට ඉගෙන ගත හැක්කේ කුමක්ද? (අපට ඉගෙන ගත හැකි එක් දෙයක් වන්නේ, විපත්තියේදී ඉවසීමෙන් සිටීමේ අවශ්‍යතාවයයි. සමහර අවස්ථාවලදී හෝ අප බලාපොරොත්තුවන ආකාරයට අපි එසේ නොකළද ස්වාමීන්වහන්සේ තම පොරොන්දු ඉටුකරනසේක.)
- පාරාවෝ ඉශ්‍රායෙල්ගේ බර වැඩිකල පසුව, ස්වාමීන්වහන්සේ මෝසෙස්ට දිගටම පොරොන්දු දුන්සේක. මෙම පොරොන්දු මොනවාද? (බලන්න නික්මයාම 6:4–8.) මෝසෙස් මෙම පොරොන්දු ඊශ්‍රායෙල් දරුවන්ට මතක් කල විට ඔවුන් ඒවාට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න නික්මයාම 6:9.) අප සමහරෙක් පරීක්ෂාවන් ඇති අවස්ථාවන්හිදී අනාගතවක්තෘවරුන්ට සවන්දීම හෝ දෙවියන්වහන්සේගේ පොරොන්දු ගැන විශ්වාසකිරීම නවත්වන්නේ මන්ද? විපත්ති කාලවලදී අපි දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල පවත්වන්නේ කෙසේද?
- ඉශ්‍රායෙල්ගේ නිදහස ඉල්ලා දෙවන වරටත් පාරාවෝ ඉදිරියට යන ලෙස ස්වාමීන්වහන්සේ මොසෙස්ට කී විට, මොසෙස් ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? (බලන්න නික්මයාම 6:10–12.) අපද සමහර අවස්ථාවලදී ස්වාමීන්වහන්සේ ඉල්ලන දේ කිරීමට පසුබට වන්නේ, බිය නිසා හෝ එය කල නොහැකි යයි අප සිතන නිසා බව පෙන්වා දෙන්න. ඔබට සැකයක් හෝ බියක් දැනුන විට ස්වාමීන්වහන්සේ ඔබට උපකාරකර ඇත්තේ කෙසේද?

3. **පාස්කුවට සූදානම්වීම ගැන ස්වාමීන්වහන්සේ මෝසෙස්ට උපදෙස් දෙනසේක**

නික්මයාම 11–13 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ප්‍රථම පාස්කුවේ අරමුණ වූයේ කුමක්ද? (බලන්න නික්මයාම 12:12–13, 22–23.) ඉශ්‍රායෙල් විසින් පාස්කු මංගල්‍යය ඉදිරි වර්ෂවලදීත් පවත්වාගැනීම ස්වාමීන්වහන්සේට අවශ්‍යවූයේ මන්ද? (බලන්න නික්මයාම 12:24–27, 42; 13:1–10.)

- දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙල්ව වසංගත මරණයකින් ආරක්ෂාකර ඔවුන්ව මිසරවරුන්ගෙන් මුදවාගැනීම සිහිපත්කිරීමට අමතරව, පාස්කුව වැදගත් අනාගත සිද්ධියක්ද සංකේතමත් කරයි. මෙම සිද්ධිය වූයේ කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන්ගේ වන්දිගෙවීමේ ආත්ම පරිත්‍යාගයයි. එය අපව පාපවලින් සහ මරණයෙන් මුදවාගනියි. බලන්න 1 කොරොන්ති 5:7.) පස්කුව මගින් වන්දිගෙවීම සංකේතමත්වූයේ කෙසේද?

  පාස්කුව සහ වන්දිගෙවීමේ ආත්ම පරිත්‍යාගය අතර පහත සඳහන් සමානතාවයන් පෙන්වීමට ඔබට අවශ්‍යවිය හැකිය.

  අ. පාස්කුවේදී ඉශ්‍රායෙල් පාවිච්චි කල යුත්තේ කැලැල් රහිත කුළුඳුල් පිරිමි බැටළු පැටවෙකි (නික්මයාම 12:5). ගැලවුම්කරුවාණන් දෙවියන්වහන්සේගේ කුළුඳුල් පුත්‍රයාණන්ය. පලුදු හෝ කැලැල් රහිත දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන්ය (1 පේත්‍රුස් 1:19).

  ආ. ඉශ්‍රායෙල්වරු ඔවුන්ගේ කුළුඳුලන්ව මරණයෙන් ගලවාගැනීම සඳහා බැටළු පැටවාගේ ලේ ඔවුන්ගේ උළුවස්සේ ඉසීම කල යුතුව තිබින (නික්මයාම 12:7, 22–23). ගැලවුම්කරුවාණන් ගෙත්සමනියේ සහ කුරුසිය මත හෙලූ උන්වහන්සේගේ ලේ, ඇදහිලිමතුන්ව පිරිසිදුකර, ඔවුන්ව ආත්මික මරණයෙන් ගලවාගනු ලැබේ (මොසායා 4:2).

  ඇ. ඉශ්‍රායෙල් දරුවන් මුහුන් නොමුසු රොටි අනුභවකල යුතු විය (නික්මයාම 12:8, 15–20). "මුහුන් හෝ ඊස්ට් පුරාණයේදී දූෂිතකමේ සංකේතයක්විය. මන්ද එය පහසුවෙන්ම නරක්වෙන නිසාය...ඉශ්‍රායෙල්වරුන්ට මුහුන් නොමුසු රොටි කෑම සංකේතවත්වන්නේ ඔවුන් කෑමට ගත්තේ නරක් නොවූ, අපිරිසිදු නොවූ රොටි නිසාය. එය නම්කෙරුනේ, ජීවනදායක කෑම කියාය, උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය (බලන්න යොහාන් 6:35)" (*Old Testament Student Manual: උත්පත්ති–2 සාමුවෙල්* [1981], 119). මුහුන් ඉවත්කිරීම පසුතැවීම, සංකේතවත්වීම යෝජනාවෙන අතර පුද්ගලයෙකුගේ ජීවිතයෙන් පාපය ඉවත්කිරීමද වේ.

  ඇ. ඊශ්‍රායෙල් දරුවන් පාස්කු කෑම ඉක්මණින්ම කෑ යුතුය (නික්මයාම 12:11). ඉශ්‍රායෙල්වරුන් මෙන්, අපද ගැලවුම්කරුවාණන් අපට පිරිනමන මුදාගැනීමට උනන්දුවෙන් සහ ක්ෂණයකින්ම ප්‍රතිචාර දැක්විය යුතුය.

- අවසාන රාත්‍රී භෝජනයේදී, ගැලවුම්කරුවාණන් වහන්සේ පාස්කුව වෙනුවට සක්‍රමේන්තුව පිහිටවූසේක (මතෙව් 26:19, 26–28). පාස්කුව නම් වචනතීරුව වම්පසද, සක්‍රමේන්තුව වචනතීරුව දකුණු පසද තබා ගැලවුම්කරුවාණන්ගේ පින්තූරය ප්‍රදර්ශනය කරන්න. පාස්කුව සහ සක්‍රමේන්තුව අතර පවත්නා සමනකම් මොනවාද? (බලන්න නික්මයාම 12:14; 13:9–10; ධීසහසී 20:75–79.)

  වැඩිමහල් හොවාඩ් ඩබ්ලිව්. හන්ටර් ඉගැන්වූ පරිදි, පාස්කු කෑම දැන් හඳුන්වන්නේ අවසාන භෝජන සංග්‍රහය ලෙසය, "පාන් සහ වතුර, සතුන් සහ තිත්ත පලා වෙනුවට ශ්‍රේෂ්ඨ බැටළු පැටවාණන්ගේ ශරීරය සහ ලේවල සංකේත බවට [පත්විය], එම සංකේතවූ කෑම සහ බීම, ගෞරවයෙන් කළ යුතු වන්නේ සදාකල් උන්වහන්සේව සිහිපත්කිරීම සඳහාය.

  "මෙම සරළ එහෙත් සිත් කාවදින ලෙස අන්දමින් ගැලවුම්කරුවාණන් පනවන ලද නියෝගය දැන් ස්වාමීන්වහන්සේගේ අවසාන භෝජන සංග්‍රහය වශයෙන් හැඳින්වේ. ගෙත්සමනියේ වේදනා විඳීම, කල්වාරියේ ආත්ම පරිත්‍යාගය, සහ උයනේ සොහොන් ගෙයින් නැවත නැගිටීම මගින්, යේසුස්වහන්සේ පැරණි නීතිය ඉෂ්ටකරනු ලැබ, පරිත්‍යාග නීතියේ උසස්, ශුද්ධවූ අවබෝධයකට පාදකවූ නව කාල පරිච්ඡේදයකට කැඳවනු ලැබූහ. මිනිසුන්ට තවදුරටත් ඔවුන්ගේ රැලවල් වලින් කුළුඳුලන් පරිත්‍යාගකිරීමට අවශ්‍යවන්නේ නැත. මන්ද දෙවියන්වහන්සේගේ කුළුඳුලාණන් 'විශිෂ්ටතමවූද, අන්තිම යාගයක්' පුදකිරීමට තමන්වහන්සේම පැමිණ තිබූ නිසාය" (in Conference Report, අප්‍රේ. 1985, 22; හෝ *Ensign,* මැයි 1985, 19).

- වැඩිමහල් හොවාඩ් ඩබ්ලිව්. හන්ටර් මෙසේ කීවේය, පාස්කුව පැරණි ඉශ්‍රායෙල්වරුන්ට ආරක්ෂාවක්වූ ලෙස, සක්‍රමෙන්තුව අපට "අළුත් ආරක්ෂාවක ගිවිසුමකි" (in Conference Report, අප්‍රේ. 1974, 24; හෝ *Ensign,* මැයි 1974, 18). සක්‍රමේන්තුව අපට ආරක්ෂක ගිවිසුමක් වන්නේ

කෙසේද? (සක්‍රමේන්තුව අපට ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමේ ආත්ම පරිත්‍යාගය සිහිපත් කරයි. එමගින් අපව පාපයේ සහ මරණයේ බන්ධනයෙන් නිදහස්කර සදාකාලික ආරක්ෂාව ලබා දෙයි. අප සක්‍රමේන්තුව අනුභවකරන විට අප අළුත්කරන ගිවිසුම්ද අපට සදාකාලික ආරක්ෂාව ලබාදීමට උපකාරවත්වේ.)

වැඩිමහල් ජෙෆ්රි ආර්. හොලන්ඩ් මෙසේ ඇසීය:

"අපි [සක්‍රමේන්තුව] අපගේ පාස්කුව, අපගේ ආරක්ෂාවේ සහ ගැලවීමේ සහ මුදවාගැනීමේ සිහිගැන්වීම වශයෙන් අපි දකින්නෙමුද?

"මෙතරම්ම බොහෝ උපද්‍රව සහිත අන්ධකාරයේ දේවදූතයාගෙන් අපගේ ගැලවීම සිහිපත්කරන මෙම නියෝගය, සමහර අවස්ථාවන්ට වඩා බරපතල ලෙස සැලකිය යුතුය. එය බලවත්, ගෞරවනීය සහ ගැඹුරු සිතිවිලිවලින් යුතු මොහොතක් විය යුතුය. එය ආත්මික සිතිවිලි සහ බලවත් හැඟීම් දිරිමත්කල යුතුය" (in Conference Report, ඔක්තෝ. 1995, 89; හෝ *Ensign*, නොවැ. 1995, 68).

- පාස්කුව ගැන ස්වාමීන්වහන්සේ දුන් උපදෙස් තුලින්, දෙමාපියන් තම ළමයින්ට එහි වැදගත්කම ගැන ඉගැන්වීමේ අවශ්‍යතාවය ගැන උන්වහන්සේ අවධාරනය කළසේක (නික්මයාම 12:26–27; 13:8, 14). ඉශ්‍රායෙල් දෙමාපියන් මෙය කිරීම වැදගත්වූයේ මන්ද? මෙය අපගේ කාලයට අදාළවන්නේ කෙසේද? (පැරණි ඉශ්‍රායෙල්වරුන් මෙන් අපද, පාපයෙන් සහ මරණයෙන් අපව මුදවාගැනීමට ස්වාමීන්වහන්සේ කල දෙය සිහිපත්වන සක්‍රමේන්තුව සහ අනෙකුත් නියෝගවල ඇති වැදගත්කම ගැන අපගේ ළමයින්ට ඉගැන්විය යුතුය.)

**4. ඉශ්‍රායෙල් දරුවෝ රතු මුහුද තරණය කරති.**

නික්මයාම 14 උගන්වමින් සාකච්ඡාකරන්න.

- පාරාවෝ ඉශ්‍රායෙල් දරුවන්ට මිසරයෙන් පිටවීමට ඉඩදුන් පසුව, ඔහු ඔවුන්ට විරුද්ධව හැරී, ඔහුගේ හමුදාව ඔවුන් පසුපස යැවීය (නික්මයාම 14:5–9). හමුදාව ලංවනු දුටු විට ඊශ්‍රායෙල් දරුවන් කළේ කුමක්ද? (බලන්න නික්මයාම 14:10–12). ඊශ්‍රායෙල් දරුවන්ගේ ඇදහිල්ල අඩුවන විට මෝසෙස් ඔවුන්ට කීවේ මොනවාද? (බලන්න නික්මයාම 14:13–14). අප සම්පූර්ණයෙන්ම බියට පත්වූ විටෙක, අපව ශක්තිමත්කිරීමට ප්‍රමාණවත් ලෙස අප ඇදහිල්ල දියුණුකර ගන්නේ කෙසේද?
- මිසර හමුදාව ලංවන විට, ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් දරුවන් ගලවාගත්තේ කෙසේද? (බලන්න නික්මයාම 14:21–31.) අප කරදරවලට මුහුණදෙන අවස්ථාවලදී මෙම කථාන්තරය අපට උදව්වන්නේ කෙසේද/

---

අවසානය

ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ව වහල්භාවයෙන් මුදවාගැනීමට පොරොන්දුවූ ලෙස, උන්වහන්සේ අපට දුන් පොරොන්දුද එලෙසම ඉටුකරන බවට සාක්ෂිදරන්න. ගැවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමේ ආත්ම පරිත්‍යාගයට පංති සාමාජිකයන්ගේ කෘතඥතාවය වැඩිකරගැනීමට සහ උන්වහන්සේ "නිතරම සිහිපත්කිරීම" සඳහා වන (ධ්‍රසහසී 20:77) ඔවුන්ගේ ගිවිසුම ආරක්ෂාකරමින් සුදුසුව සහ කල්පනා සහිතව සක්‍රමේන්තුව භුක්තිවිදීමට ඔවුන්ව දිරිගන්වන්න.

---

ඉගැන්වීමේ අමතර අදහස්

පහත සඳහන් කරුණු යෝජනා කල පාඩමේ සංක්ෂේපයක් ලෙස ඉදිරිපත්කර ඇත. මෙම අදහස් එකක් හෝ වැඩියෙන් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. සාතන් දෙවියන්වහන්සේගේ බලය ව්‍යාජ ලෙස යොදවයි**

- මෝසෙස් සහ ආරොන් දෙවියන්වහන්සේගේ බලයෙන් සලකුණු පෙන්වන විට, පාරාවෝ කළේ කුමක්ද? (බලන්න නික්මයාම 7:8–12, 17–22.) මෙම පදවලින් අපට සාතන් ගැන ඉගෙනගත හැක්කේ මොනවාද?

- දෙවියන්වහන්සේගේ බලය සහ ආශිර්වාද වර්තමානයේදී සාතන් ව්‍යාජ ලෙස යොදවන යම් මාර්ග මොනවාද? යහපත සහ නපුර අතරින් වටහාගැනීමට උපකාරකිරීම සඳහා ස්වාමීන්වහන්සේ අපට දී තිබෙන දීමනා මොනවාද?

2. වසංගත

- ස්වාමීන්වහන්සේ මිසරය වෙත වසංගත යැව්වේ මන්ද? (බලන්න නික්මයාම 7:5, 17; 8:10; 9:14, 29; 10:2; 14:4.) වසංගතයට පාරාවෝ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න, උදාහරණයක් ලෙස, නික්මයාම 8:8, 15, 25, 28, 32.) වසංගතයෙන් ඉශ්‍රායෙල් ළමයින්ට හානියක් සිදු නොවූයේ මන්ද? (බලන්න නික්මයාම 9:4–6, 23–26; 10:22–23; 11:4–7.)

3. පාස්කුව

පාස්කුව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම සංකේතමත්වන අන්දම ගැන ඔබ උගන්වන විට, පාස්කුවේ සංකේත ප්‍රදර්ශනය වන පහත සඳහන් උපකරණ ලබාගැනීමට ඔබට අවශ්‍යවිය හැකියඃ

අ. බැටළු පැටවාණන්ගේ සහ දොරක පින්තූර

ආ.රොටි, බිස්කට් (මුහුන් නුමුසු පැතලි රොටි නියෝජනය කිරීමට).

ඇ.සේර හෝ හෝ සලාද (තිත්ත පලා සඳහා).

ඈ.සපත්තු හෝ සෙරප්පු ජෝඩුවක් (ඉශ්‍රායෙල්වරු ආහාර ගත්තේ සපත්තු පයලා ගෙනය. ඔවුන් මිසරයෙන් ගිය ඉක්මන සංකේතවත් කිරීමටය).

4. **"සියල්ලන්ම වලාකුළෙහිද මුහුදෙහිද…බෞතීස්මකරන ලැබූහ"** (1 කොරොන්ති 10:2)

1 කොරොන්ති 10:1–4 කියවීමට ඔබට අවශ්‍යවිය හැකිය. ඉශ්‍රායෙල් දරුවන් වළාකුලෙහි සහ මුහුදෙහි බෞතීස්ම කල බව එහි පාවුළු තුමා උගන්වයි. මෙහි වැදගත්කම පැහැදිළිකරමින්, වැඩිමහල් බෘස් ආර්. මැක්කොන්කි මෙසේ කීවේය, "ඉශ්‍රායෙල්වරු ඔවුන් රතු මුහුද මැදින් ගිය විට, මිසරයේ ලෞකිකත්වයෙන්ද පවා පලාගියහ. එබැවින් ඔවුන්ගේ ක්‍රිස්තියානු පැවතෙන්නන්, බෞතීස්මය තුලින් මාංශයේ ආශාව අමතක කර යහපත් ජීවිත ගත කල යුතුය" (*Doctrinal New Testament Commentary*, 3 වන කාණ්. [1966–73], 2:355).

# “නුඹලා මා හට විශේෂ වස්තුවක් වන්නහුය”

# 14 වෙනි පාඩම

*නික්මයාම 15–20; 32–34*

**අරමුණ** ස්වාමීන්වහන්සේගේ ආත්මික වතුර සහ පාන් භුක්තිවිඳිමින්, උන්වහන්සේගේ තෝරාගත් නායකයන් අනුමතකරමින් සහ උන්වහන්සේගේ පණත්වලට කීකරුවීමට පංති සාමාජිකයන් දිරිගැන්වීමය. එවිට ඔවුන්ව ශුද්ධ ජාතියක් කිරීමට උන්වහන්සේට හැකිවනසේක.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. නික්මයාම 15:22–27; 16:1–31; 17:1–7. ඉශ්‍රායෙල් පුත්‍රයෝ කෙඳිරීමට පටන්ගත්තේ, ඔවුන්ට පිපාසය සහ කුසගිනිවූ නිසා බැවින්, ස්වාමීන්වහන්සේ වතුර, මන්නා සහ වටුවන් සපයනසේක.

   ආ. නික්මයාම 17:8–13; 18:13–26. අමලෙක්වරු ඉශ්‍රායෙල් සමග සටනට පැමිණෙති. මෝසස් තම අත උඩට එසවූ විට, ඉශ්‍රායෙල් ජය ගනී, නමුත් මෝසෙස්ට වෙහෙසවී තම අත් පහතට දැමූ විට අමලෙක්වරු ජයගනිති. ආරොන් සහ හූර් මෝසෙස්ගේ අත් උසුලාගෙන සිටින විට, ඉශ්‍රායෙල් සටන ජයගනිති (17:8–13). මෝසෙස් යෙත්‍රෝගේ උපදෙස් අනුගමනයකර විනිශ්චයකරුවන් පත්කර ඔවුන්ට බලය පවරයි (18;13–26).

   ඇ. නික්මයාම 19–20. ස්වාමීන්වහන්සේ සිනායි කන්දේදී මෝසස් හමුවී, ඉශ්‍රායෙල්ට දස පණත දෙනසේක.

   ඈ. නික්මයාම 32–34. මෝසස්ට ස්වාමීන්වහන්සේ උපදෙස් සහිත ගල් ලෑලි ලැබුන නමුත් ඔහු සිනායි කන්දෙන් බසිනවිට ඒවා කඩයි. තවද ජනතාව රත්රන් වස්සාට නමස්කාරකරනු දකියි (31:18; 32:1–24). ස්වාමීන්වහන්සේ ඔවුන් අතරින් මෙල්කිසදෙක් පූජවරය ඉවත්කරගෙන ඔවුන්ට අඩු පූජකවරයවූ මෝසෙස්ගේ නීතිය දෙනසේක (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, නික්මයාම 34:1–2). මෝසස් ඔහු අතින් කැඩුනු ලෑලි වෙනුවට අළුත් ගල්ලෑලි දෙකක් කපාගනියි. නමුත් අළුත් ලෑලිවල “ශුද්ධවූ පූජකවරයේ සදාකාලික ගිවිසුම” ඇතුළත් නොවේ (නික්මයාම 34:1–5; ජෝසෆ් ස්මිත් පරිවර්තනය, ද්වීතීය කථාව 10:2). ජනතාව මෝසෙස්ගේ නීතියට කීකරුවීමට ගිවිසුම් කරති (34:10–35).

2. අමතර කියවීම්: ගීතාවලිය 78; 1 කොරොන්ති 10:1–11; දහම සහ ගිවිසුම 84:19–27.

3. ඔබ 64–65 පිටුවල එන ද්‍රව්‍ය පාඩම පාවිච්චිකරන්නේ නම්, පොත් කිහිපයක් හෝ වෙනත් බර ද්‍රව්‍ය කිහිපයක් පංතියට රැගෙන එන්න.

4. පරණ ගිවිසුම වීඩියෝ ඉදිරිපත්කිරීම් ලබාගත හැකි නම්, “නූතන දේව නමස්කාරය” මිනිත්තු හතක කොටසක්, පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම** පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම හෝ (ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

- ඔබ කිසිදා නොගිය සහ ඔබ ගමන් මාර්ගයක් සාදා නොමැති වනාන්තරයකට ඔබ යායුතු බව සිතාගන්න. මෙම ගමනට ඔබ සූදානම්වන්නේ කෙසේද? (පිළිතුරු විවිධවිය හැකිය, නමුත් උපකාරවත් විය හැකි සූදානම්වීමක් නම්, මග පෙන්වන්නෙකු සොයාගැනීමය.)

- ඔබව වනාන්තර ප්‍රදේශයට මගපෙන්වන්නාට තිබිය යුතු ඔබට වුවමනාකරන සුදුසුකම් මොනවාද? (පිළිතුරු විවිධවිය හැකි නමුත්, මග පෙන්වන්නා ප්‍රදේශය දැනගත යුතු අතර, විශ්වාසවන්ත විය යුතුය.)

- මෝසෙස් සහ ඊශ්‍රායෙල් පුත්‍රයන් මිසරයෙන් පලාවිත් වනාන්තරයට ඇතුල්වූ විට ඔවුන්ට මග පෙන්වන්නා වූයේ කවරෙක්ද? (ස්වාමීන්වහන්සේය.)

ඉශ්‍රායෙල්වරු වනාන්තරයේ ගමන්කරන විට ලත් අත්දැකීම්වලට, අපට මෙම මැරෙන සුළු ජීවිතයේ ගමන්කිරීමට වැදගත් පාඩම් ඉගැන්විය හැකිය. එක් වැදගත් පාඩමක් වන්නේ, දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට මෙන් අපටද මග පෙන්වා සැලකිල්ලක් දක්වන බවට අපට උන්වහන්සේ තුළ විශ්වාසය තැබිය හැකිය.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ යොදාගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාළකරගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකාවන් දිරිගන්වන්න. පාඩමේ එන සෑම ප්‍රශ්නයක්ම හෝ සෑම කරුණක්ම අවධාරනයකිරීමට අපහසු නිසා පංති සාමාජිකාවන්ගේ අවශ්‍යතාවයන්ට ඉතාම හොඳින් සරිලන කරුණු යාච්ඤාවෙන් යුතුව තෝරාගන්න.

**1. ඉශ්‍රායෙල් පුත්‍රයන්ට ස්වාමීන්වහන්සේ ජලය, මන්නා සහ වටුවන් සපයනසේක.**

නික්මයාම 15:22–27; 16:1–31; සහ 17:1–7 උගන්වමින් සාකච්ඡාකරන්න.

ඉශ්‍රායෙල්වරු රතු මුහුද තරණයකල පසුව, ඔවුන්ට පොරොන්දු දේශයට මග පෙන්වන ලෙස ස්වාමීන්වහන්සේ මෝසෙස්ට උපදෙස් දුන්සේක. නමුත් ස්වාමීන්වහන්සේ වනාන්තරය තුළදී පළමුවෙන් ඉශ්‍රායෙල්වරුන්ගේ ඇදහිල්ල පරීක්ෂා කලසේක. ඇදහිල්ල අඩු බොහෝ දෙනෙක් ස්වාමීන්වහන්සේ වෙතට හැරීම වෙනුවට උන්වහන්සේට චෝදනාකරති. එසේවුවද, ස්වාමීන්වහන්සේ, ඔවුන්ගේ පිපාසයට ජලයද, ඔවුන්ගේ කුසගින්නට මන්නා සහ වටුවන්ද සපයා දුන්සේක.

- නික්මයාම 15:22–24 සහ 17:1–37 සඳහන් පරිදි ඉශ්‍රායෙල්වරුන් මුහුණුදුන් ප්‍රශ්න මොනවාද? ජනතාව මෝසේට විරුද්ධව කෙඳුරූ විට මෝසෙස් දැක්වූ ප්‍රතිචාර මොනවාද? (බලන්න නික්මයාම 15:25; 17:4. ඔහු උපකාර පතා ස්වාමීන්වහන්සේ වෙතට හැරුනේය.) මොසෙස්ගේ ප්‍රතිචාරයෙන් අපට ඉගෙනගත හැක්කේ මොනවාද? උපකාර පතා මෝසෙස් කල යාච්ඤාවලට ස්වාමීන්වහන්සේ දැක්වූ ප්‍රතිචාර මොනවාද? (බලන්න නික්මයාම 15:25–26; 17:5–7.)
- ඉශ්‍රායෙල් පුත්‍රයන්ට ස්වාමීන්වහන්සේ ශාරීරික සහ ආත්මික ජලය සපයා දුන්සේක. ශාරීරික ජලය පැමිණුනේ මෝසෙස් පර්වතයට පහරදුන් විටදීය. "ආත්මික බීම" පැමිණුනේ ක්‍රිස්තුස්වහන්සේ වන "ආත්මික පර්වතයෙන්ය" (1 කොරොන්ති 10:4.) ක්‍රිස්තුස්වහන්සේගෙන් ගලා එන ආත්මික ජලය මොනවාද? (බලන්න 1 නිෆායි 11;25). අපි එම ජලය බොන්නේ කෙසේද? එම ජලය බොන්නන්ට දෙන පොරොන්දුව කුමක්ද? (බලන්න යොහාන් 4:14; ඩීසහසී 63:23.)
- නික්මයාම 16:2–3 පරිදි ඉශ්‍රායෙල්වරු මුහුණුදුන් ප්‍රශ්න මොනවාද? ස්වාමීන්වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න නික්මයාම 16:4, 11–15.) ජනතාවගේ කුසගින්න සන්තර්පනය කිරීමට අමතරව, මන්නා යැවීමේ වෙනත් අරමුණු මොනවාද?

  අ. ස්වාමීන්වහන්සේගේ ජනතාව උන්වහන්සේට කීකරුද කියා එමගින් උන්වහන්සේට පෙන්වනු ඇත. (නික්මයාම 16:4, 16–31).
  ආ. ස්වාමීන්වහන්සේගේ බලය සහ ප්‍රේමය ගැන එමගින් ජනතාවට දිනපතාම සිහිපත් කිරීම් දෙනු ඇත (නික්මයාම 16:12).
  ඇ. එමගින් ජනතාවට "ස්වාමීන්වහන්සේගේ මුඛයෙන් පිටවන සෑම වචනයකින්ම මිස, රොටිවලින් පමණක්ම ජීවත්වීමට බැරි බව" උගන්වනු ඇත (ද්විතීය කථාව 8:3).
  ඇ. එමගින් ජනතාව නිහතමානී කර, ගැලවීම ලබාගැනීමට ඔවුන්ට උපකාර කෙරේ (ද්විතීය කතාව 8:16).

- මන්නා යැවීම මෙම හැම අරමුණක්ම ඉෂ්ඨකරගැනීමට උපකාරවීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? මෙම හැම අරමුණක්ම අපගේ ජීවිතවල ස්වාමීන්වහන්සේ ඉෂ්ටකරන්නේ කෙසේද?

- මන්නාවලින් ක්‍රිස්තුස්වහන්සේ නියෝජනය වන්නේ කෙසේද? (බලන්න යොහාන් 6:35.) ක්‍රිස්තුස්වහන්සේගේ ජීවමාන රොටි සහ මන්නා අතර වෙනස කුමක්ද? (බලන්න යොහාන් 6:48–51.) අපි දිනපතාම ක්‍රිස්තුස්වහන්සේගේ ජීවමාන රොටි අනුභවකරන්නේ කෙසේද?

- ශරීර ශක්තිය පවත්වාගැනීම සඳහා ඉශ්‍රායෙල්වරුන්ට දිනපතාම මන්නා එකතුකර ගැනීම අවශ්‍යවිය. ආත්මික ශක්තිය පවත්වාගැනීමට අපි කළ යුතු දේවලට මෙය සමානවන්නේ කෙසේද? (ශාරීරික ශක්තිය පවත්වාගැනීමට අපට දිනපතාම පෝෂණය අවශ්‍යවන ලෙස, ආත්මික ශක්තිය පවත්වා ගැනීමටද අපට දිනපතාම පෝෂණය අවශ්‍යවේ. අපි ශුද්ධ ලියවිලි අධ්‍යයනය සහ යාච්ඤාකිරීම විටින් විට කරන්නේ නම්, ආත්මිකව පෝෂණයවීම බලාපොරොත්තුවීමට අපට නොහැකිය.)

- ඉශ්‍රායෙල්වරුන් පසුදා උදය දක්වා මන්නා තබාගත්විට සාමාන්‍යයෙන් සිදුවුනේ කුමක්ද? (බලන්න නික්මයාම 16:19–20.) සබත්දිනට සූදානම්වීමේදී ඔවුන් පසුදා උදය දක්වා මන්නා තබාගත්විට සිදුවුනේ කුමක්ද? (බලන්න නික්මයාම 16:22–25.) සබත් දිනට සතිපතා අපගේ සූදානම්වීමේදී මෙම මූලධර්මය අපි අදාළකර ගන්නේ කෙසේද?

- ඉශ්‍රායෙල්වරුන් ස්වාමීන්වහන්සේගේ උපකාරය නොමැතිව වනාන්තරයේ ගමන්කිරීමට උත්සාහ කළේ නම් ඔවුන්ට කුමක් සිදුවීමට තිබුනේද? ස්වාමීන්වහන්සේගේ උපකාර නොමැතිව මෙම මැරෙන සුළු ජීවන ගමන යාමට අපි උත්සාහකරන්නේ නම්, අපට කුමක් සිදුවන්නේද?

**2. ආරොන් සහ හූර් මෝසෙස්ගේ අත් උසුලාගෙන සිටීමෙන් අමලෙක්ට විරුද්ධ සටනින් ඊශ්‍රායෙල් ජයගනී. විනිශ්චයකරුවන් පත්කර ඔවුන්ට බලය පවරමින් මෝසෙස් යෙත්‍රෝගේ උපදෙස් අනුගමනය කරයි.**

නික්මයාම 17:8–13 සහ 18:13–26 උගන්වමින් සාකච්ඡාකරන්න. ක්‍රිස්තුස්වහන්සේගේ නායකයන්ට සහයෝගය දෙමින් අනුමතකිරීමේ වැදගත්කම ගැන මෙම වාර්තා දෙකෙන්ම අපට උගන්වන බව පෙන්වා දෙන්න.

- අමලෙකයිට්ස්වරු මෝසෙස්ගේ කාලයේ සිට ආරම්භකර, බොහෝ කාලයක් ඉශ්‍රායෙල් පුත්‍රයන් සමග යුද්ධ කළහ. නික්මයාම 17:8–13 න් පැහැදිළි කෙරෙන සටනින් අමලෙකයිට්වරු පරාජයකිරීමට ඉශ්‍රායෙල්වරුන්ට හැකියාව ලැබුනේ කෙසේද? (ආරොන් සහ හූර් මෝසෙස්ගේ අත් උසුලාගෙන ඔහුට සහයෝගය දුන් විට, ඉශ්‍රායෙල් සටනින් ජයගත්හ.) අපි අද සටන්කරන්නේ කුමන අන්දමේ ආත්මික සටනක්ද? අනාගතවක්තෘවරුන්ට සහයෝගය දීමෙන් මෙම සටන්වලින් ජයගැනීමට අපට ආධාරවන්නේ කෙසේද?

එස්රා ටැෆ්. බෙන්සන් මෙසේ කීවේයː "මොසෙස් කන්ද උඩ සිටිමින් ඉශ්‍රායෙල් හමුදාවේ ජයග්‍රහනය පතා තම අත් ඔසවාගෙන සිටින අන්දම මට සිහිපත්වේ. ඔහුගේ අත් ඔසවාගෙන සිටින තාක්, ඉශ්‍රායෙල් ජයගත්හ, නමුත් වෙහෙස නිසා ඒවා පහතට වැටුන විට, සතුරා ජයගත්හ. තවද එනිසා ආරොන් සහ හූර් 'ඔහුගේ අත් උසුලාගෙන එක් කෙනෙක් එක පැත්තකත්, අනෙකා අනෙක් පැත්තේත් සිටිය නිසා' ඉශ්‍රායෙල් ජයග්‍රාහකයා විය (නික්මයාම 17:12). එබැවින් අපද ස්වාමීන් වහන්සේගේ ආලේප ලත් සේවකයන්ගේ අත් උසුලාගෙන සිටින විට, අපිද ජයග්‍රාහකයන් වෙන්නෙමු" (in Conference Report, අප්‍රේ. 1986, 98; හෝ *Ensign*, මැයි 1986, 77).

- ජනතාව මෝසෙස් වෙත උදය පටන් සවස දක්වාම පැමිණෙනු දුටුවිට යෙත්‍රෝට සිතුනේ කුමක්ද? (බලන්න නික්මයාම 18:13–18). යෙත්‍රෝ මෝසෙස්ට දුන් උපදේශය කුමක්ද? (බලන්න නික්මයාම 18:19–23.)

- නික්මයාම 18:16–20 සඳහන්වන අනාගතවක්තෘවරයෙකුගේ වගකීම් මොනවාද?

මෙම පදවල එන වගකීම් පංති සාමාජිකයන්ට ලවා සොයාබැලීමට ඔබට අවශ්‍යවිය හැකිය. ඉන්පසුව පිළිතුරු හුණුලෑල්ලේ ලියන්න. පහත සඳහන් ද්‍රව්‍ය පාඩම පාවිච්චිකිරීමටද ඔබට අවශ්‍යවිය හැකියː පංති සාමාජිකයෙකු කැඳවා ඔහුගේ ඇයගේ අත ඔසවාගෙන සිටීමට කියන්න. පළවෙනි වගකීම හඳුනාගත් විට, පොතක් හෝ යම් බර දෙයක් පංති සාමාජිකයාගේ අත් උඩ තබන්න. අනෙක් වගකීම් එකින් එක හඳුනාගන්නා විට තවත් පොතක් හෝ බර දෙයක් බැගින් ඊට එකතුකරන්න.

අ. ජනතාවගේ විනිශ්චයකරුවෙකු වෙයන්න (නික්මයාම 18:16).
ආ. දෙවියන්වහන්සේ ඉදිරියේ ජනතාව නියෝජනය කරන්න (නික්මයාම 18:19).
ඇ. "නියෝග සහ ව්‍යවස්ථා උගන්වාපන්න" (නික්මයාම 18:20).
ඈ. "ඔවුන් හැසිරිය යුතු ආකාරය ඔවුන්ට [පෙන්වාදීපන්න]" (නික්මයාම 18:20).
ඉ. "ඔවුන් කල යුතු වැඩකටයුතු…ඔවුන්ට [පෙන්වාදීපන්න]" (නික්මයාම 18:20).

- අපගේ වර්තමාන අනාගතවක්තෘවරුන් සහ ප්‍රේරිතයන්ගේ අත් උසුලාගෙන ඔවුන්ගේ බර සැහැල්ලුකිරීමට අපට හැක්කේ කෙසේද? (බලන්න ඩීසහසී 21:4–5; 107:22. පංති සාමාජිකයන් යෝජනා ඉදිරිපත්කරන විට, පංති සාමාජිකයා උසුලාගෙන සිටින පොත් හෝ වෙනත් බර ද්‍රව්‍යයන් එකිනෙක ඉවතටගන්න.)

- අපි අපගේ ප්‍රාදේශීය සභා නායකයන්ට සහයෝගයදී අනුමතකරන්නේ කෙසේද? (පිළිතුරුවලට ඇතුළත් විය හැකි කරුණු, ඔවුන් ගැන යහපත් ලෙස කථාකිරීම, අපගේ සභා කැඳවීම්වල උනන්දුවෙන් සේවයකිරීම, සහ යහපත් නිවාස සහ බැහැදකින ගුරුවරුන් වීම.)

- සභා නායකයන්ට සහයෝගය දැක්වූවිට ඔබ ආශිර්වාදිතවූයේ කෙසේද? (මෙම සාකච්ඡාවේදී ඩීසහසී 21:6, පාවිච්චිකිරීම ඔබට අවශ්‍යවිය හැකිය.)

**3. ස්වාමීන්වහන්සේ සිනායි කන්දේදී මෝසෙස්ව හමුවී ඉශ්‍රායෙල්ට දසපණත දෙනසේක.**

නික්මයාම 19–20 උගන්වමින් සාකච්ඡාකරන්න.

ඉශ්‍රායෙල් වනාන්තරයට ගොස් මාස තුනක් තුළදී, ඔවුන් සමග ගිවිසුමක් පිහිටුවීමට ස්වාමීන් වහන්සේට අවශ්‍යවූසේක (නික්මයාම 19:5–6). මෙම ගිවිසුමේ කොටසක් ලෙස උන්වහන්සේ මෝසෙස්ට දස පණත එළිදරව් කළසේක.

- ඊශ්‍රායෙල් පුත්‍රයෝ එම කන්ද ඉදිරිපිට කූඩාරම් ගසාගෙන සිටියදී, ඔවුන් කීකරුවන්නේ නම්, ස්වාමීන්වහන්සේ ඔවුන්ට පොරොන්දුවූනේ මොනවාද? (බලන්න නික්මයාම 1(:3–6. උන්වහන්සේ ඔවුන්ව "අසහාය ජාතියක්,…පූජක රාජ්‍යයක් සහ ශුද්ධ ජාතියක් කරනසේක.") මෙම පොරොන්දුවල අදහස කුමක්ද? මෙම පොරොන්දු වර්තමානයේ අපට අදාළවන්නේ කෙසේද?

මෙම පොරොන්දුවල අදහස වන්නේ, ඉශ්‍රායෙල්වරු අන් සියල්ලන්ටම වඩා අනුග්‍රහය ලත්, සහ පූජකවරය දැරීමට සහ සියල්ලන්ටම සුභාරංචිය බෙදාදීම සඳහා ස්වාමීන්වහන්සේගේ ගිවිසුම්කල ජනතාවක් වන බවය (තවද බලන්න ද්විතීය කථාව 7:6; 14:1–2; 1 පේත්‍රුස් 2:9). Note that in this context, *peculiar* carries the meaning of "being the Lord's own special people or treasure," not the meaning of "odd or eccentric" (Bible Dictionary, "Peculiar," 748).

- සිනායි කන්දේදී ස්වාමීන්වහන්සේ තම ජනතාවගෙන් බලාපොරොත්තුවූ අත්දැකීම කුමක්ද? (බලන්න නික්මයාම 19:9; 11, 16–17; ඩීසහසී 84:23.) තම ජනතාව හමුවීමට පෙර ස්වාමීන් වහන්සේ ඔවුන්ගෙන් අපේක්ෂාකලේ මොනවාද? (බලන්න නික්මයාම 19:10, 14.)

- සිනායි කන්ද ශුද්ධවූ ස්ථානයක්වූ අතර එහිදී තම ජනතාව සමග කථාකිරීමට සහ ඔවුන්ට තමන්වහන්සේව පෙන්වීමට ස්වාමීන්වහන්සේට අවශ්‍යවූසේක. මෙම ආශිර්වාදම ලබාගැනීම සඳහා උන්වහන්සේ අපට ලබාදී තිබෙන ශුද්ධවූ ස්ථාන මොනවාද? (දේවමාළිගා; බලන්න ඩීසහසී 97:15–16; 109:12–13.) ස්වාමීන්වහන්සේගේ හඬ ශබ්දය ඇසීමට සහ උන්වහන්සේගේ සමීපය හැඟීමට දේවමාළිගාව උදව්කල ආකාරය ගැන පැවසීමට පංති සාමාජිකයන්ට ආරාධනාකරන්න.

- නික්මයාම 20වෙනි පරිච්ඡේදයේ එන පළවෙනි පණත් හතරෙන්, අප සහ දෙවියන්වහන්සේ අතර තිබෙන නියම සම්බන්ධතාවය ගැන ඉගැන්වේ (නික්මයාම 20:3–11). ස්වාමීන්වහන්සේට වන්දනාකරමින් උන්වහන්සේ ඉදිරියේ වෙනත් දෙවිවරුන් නොසිටීමේ පණත වර්තමානයට යෝග්‍යවන්නේ කෙසේද? වර්තමානයේ ජනතාව වන්දනාකරන්නේ කුමන ව්‍යාජ දෙවිවරුන්ටද? (බලන්න 1 සාමුවෙල් 15:23; එපීස 5:5; සීසහසී 1:15–16.)

ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාපතිවරයා මෙසේ පැවසීය:

බරපතල පාපයන් අතර ප්‍රතිමා වන්දනාවද වේ. . . .නූතන ප්‍රතිමා හෝ ව්‍යාජ දේව ස්වරූපවලට ඇඳුම්, නිවාස, වෙළඳාම, යන්ත්‍ර, වාහන, විනෝද බෝට්ටු සහ වෙනත් විවිධ ලෞකික ද්‍රව්‍ය දෙවත්වයට නගාගත හැකිය….

"සියුම් දේවල් ව්‍යාජ දෙවිවරුන් බවට පත්වේ. උපාධි, සහ සහතික පත්‍ර සහ නිළතල ප්‍රතිමා බවට පත්විය හැකිය..

"බෙහෝ මිනිස්සු නිවසක් ගොඩනගා ගෘහ භාණ්ඩ තබා පළමුවෙන් වාහනයක් ගනිති.—තවද ඉන්පසුව ඔවුන්ට දසයෙන් කොටස ගෙවීමට වත්කමක් නැත. ඔවුන් වන්දනාකරන්නේ කාටද? සැබැවින්ම ස්වර්ගයේ හෝ පොළොවේ ස්වාමීන්වහන්සේට නොවේ….

බොහෝ අය දඩයම්කිරීම, මාළු ඇල්ලීම, නිවාඩු කාලය, සති අන්ත විනෝද ගමන්, සහ වෙනත් ගමන් වන්දනා කරති. අන් අය ඔවුන්ගේ පිළිම ලෙස, ක්‍රීඩා තරග, බේස්බෝල්, පා පන්දු, ගව පොර, හෝ ගොල්ෆ් ක්‍රීඩාව නමස්කාර කරති….

"තවදුරටත් මිනිසුන් වන්දනාකරන තවත් ප්‍රතිරූපයක් වන්නේ, බලය සහ ගෞරවයයි….මෙම බලය නැමැති දෙවියන්වන, වස්තුව, සහ බලපෑම වනාන්තරයේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට රත්රන් වස්සා මෙන් අපගේ කාලය බොහෝ ලෙස වැයවන්නකි" (*The Miracle of Forgiveness* [1969], 40–42).

- මිනිසුන් දෙවියන්වහන්සේගේ නාමය නිකරුනේ ගන්නා යම් ක්‍රම මොනවාද? අපි උන්වහන්සේගේ නාමය නිකරුනේ නොගැනීමේ වැදගත්කම කුමක්ද?
- සබත් දවස ශුද්ධව තබාගැනීම අපට වැදගත්වන්නේ මන්ද? (නික්මයාම 20:8; 31:16–17; යෙසායා 58:13–14; ඩීසහසී 59:9–10.) සබත් දවසට සුදුසු ක්‍රියාකාරකම් මොනවාදැයි අප තීරණය කල යුත්තේ කෙසේද? මෙම දවස ඔබ ශුද්ධව තබාගැනීමෙන් ඔබ ආශිර්වාදිතවූයේ කෙසේද?
- අන් අය සමග අපගේ සම්බන්ධතාවය ගැන සැළකෙන පණත් හය නැවත කියවන්න (නික්මයාම 20:12–17). මෙම පණත්වලට කීකරුවීමෙන් අන් අය සමග අපගේ සම්බන්ධතාවය වැඩිවන්නේ කෙසේද? (එක් එක් පණත වෙත යොමුවී, එහි අදහස සහ සුදුසු පරිදි ඒවා ගැන සාකච්ඡාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

**4. ස්වාමීන්වහන්සේ මෝසෙස්ගේ ව්‍යවස්ථාව හදුන්වා දෙනසේක.**

නික්මයාම 32–34 උගන්වමින් සාකච්ඡාකරන්න.

ස්වාමීන්වහන්සේ සිනායි කන්ද මත මෝසෙස් සමග කථාකල විට, මෙල්කිසදෙක් පූජකවරයේ නියෝග ඇතුළත් ව්‍යවස්ථාවක් උන්වහන්සේ එළිදරව් කලසේක (ඩීසහසී 84:19–23). කෙසේවුවද, ඉශ්‍රායෙල්වරුන්ගේ පිළිම වන්දනා හැසිරීම මගින් ඔවුන් සුභාරංචියේ සම්පූර්ණත්වය අනුව ජීවත්වීමට සූදානම්ව නොමැති බව පෙනින (නික්මයාම 32:1–9; ඩීසහසී 84:24). ඔවුන් එතරම්ම ඉක්මණින් ස්වාමීන්වහන්සේව අමතක කල නිසා, උන්වහන්සේ ඔවුන්ගෙන් මෙල්කිසදෙක් පූජකවරය නැවත ලබාගෙන, අඩු ව්‍යවස්ථාවක්වන—මෝසෙස්ගේ ව්‍යවස්ථාව ඔවුන්ට එළිදරව් කලසේක (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, නික්මයාම 34:1–2; ඩීසහසී 84:25–27).

මෝසෙස්ගේ ව්‍යවස්ථාවට පණත්, ගිවිසුම් හෝ සුභාරංචියේ මූලධර්ම ඇතුළත්වූයේ නැත. ඒ වෙනුවට එමගින් "පිළිවෙත් සහ නියෝගවල ව්‍යවස්ථාවක්, දිනපතා ඔවුන් තදින්ම පිළිපැදිය යුතු ව්‍යවස්ථාවක්, ඔවුන්ට දෙවියන්වහන්සේ සහ උන්වහන්සේ වෙත ඔවුන්ගේ යුතුකම් සිහිපත් කෙරෙන්නක් ලබාදුන්හ" (මොසායා 13:30). මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙන් ජනතාවට ඔවුන්ගේ පව් නොසඟවා කියමින්, නැවත ස්ථාපනය කරමින්, සතුන් සහ යාග පුදකිරීමේ ව්‍යවස්ථාව තදින්ම ක්‍රියාත්මක කිරීම, ඔවුන්ගේ ශරීර නිරෝගීව තබාගැනීම, ස්වාමීන්වහන්සේගේ කටයුතුවලට සහයෝගය දීම, ස්තුති කිරීම , සහ දෙවියන්වහන්සේ හා සමාදානවීම ඉගැන්වීය.

- ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මෝසෙස්ගේ ව්‍යවස්ථාව දුන්නේ මන්ද? (බලන්න ගලාති 3:23–24; මොසායා 13:29; ඇල්මා 25:15–16; ඩීසහසී 84:19–27.) ඉශ්‍රායෙල්වරුන් ශුද්ධව, ඔවුන්ව ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණවීමට මෙම ව්‍යවස්ථාව උපකාරවත් වන්නේ කෙසේද? (බලන්න මොසායා 13:30; ඇල්මා 34:14–15.)

- මෝසෙස්ගේ ව්‍යවස්ථාව සම්පූර්ණවූයේ කවදාද? (බලන්න 3 නිෆායි 15:4–10.) දැන් ස්වාමීන්වහන්සේට තවදුරටත් සත්ව පූජා අවශ්‍ය නොවේ. එය මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ වැදගත අංගයක්ව තිබින. උන්වහන්සේ අපගෙන් ඉල්ලන පරිත්‍යාගය කුමක්ද? (බලන්න 3 නිෆායි 9:19–22.) බිඳුනු හදක් සහ තැලුනු සිතක් පිදීම යන්නෙහි අදහස කුමක්ද?

වැඩිමහල් එම්. රසල් බැලඩ් මෙසේ ඉගැන්වීය:

"මෝසෙස්ගේ ව්‍යවස්ථාව සම්පූර්ණවුවද, පරිත්‍යාගයේ ව්‍යවස්ථාව සභාවේ ඉගැන්වීම්වල කොටසක් ලෙස දිගටම පවතී.

"පරිත්‍යාග ව්‍යවස්ථාවේ මූලික අරමුණ පරීක්ෂාකිරීමේ සහ ක්‍රිස්තුස්වහන්සේ වෙත පැමිණීමට අපට සහායවීම දිගටම පැවතුනද, ක්‍රිස්තුස්වහන්සේගේ අවසාන පරිත්‍යාගයේදී වෙනස්කම් දෙකක් සිදුකෙරින. පළමුවැන්න, සක්‍රමේන්තු නියෝගය, සත්ව පරිත්‍යාගකිරීමේ නියෝගය වෙනුවට පවතී. දෙවැන්න, මෙම වෙනස්කිරීම සත්වයෙකුගෙන් පුද්ගලයෙකුට යොමුවිය. එනම් පරිත්‍යාගය පිදීමෙන් පිදීමට වෙනස්විය…

". . .ක්‍රිස්තුස්වහන්සේගේ මැරෙන සුළු මෙහෙයෙන් පසුව, උන්වහන්සේ පරිත්‍යාගයේ ව්‍යවස්ථාව අළුත් මට්ටමකට නැංගුසේක. . . .ස්වාමීන්වහන්සේගේ අවශ්‍යතාවයවූ පුද්ගලයෙකුගේ සත්වයෙක් හෝ ධාන්‍ය ලබාගැනීමක් වෙනුවට, දැන් ස්වාමීන්වහන්සේට අපගෙන් අවශ්‍යවන්නේ සියලුම අයහපත් දේවල් අත්හැරීමය. මෙය පරිත්‍යාග ව්‍යවස්ථාවේ උසස් ප්‍රතිපත්තියකි; එය පුද්ගලයෙකුගේ අභ්‍යන්තර ආත්මයට ලඟාවන්නකි" (*The Law of Sacrifice* [සභාවේ අධ්‍යාපනික ලිපි සංග්‍රහ ක්‍රමය අමතාකල කථාවකි, 13 අගෝ. 1996], 5).

---

අවසානය

පංති සාමාජිකයන් ස්වාමීන්වහන්සේගේ ආත්මික ජලය සහ පාන් භුක්තිවිඳිමින්, උන්වහන්සේගේ තෝරාගත් නායකයන් අනුමතකරමින් සහ උන්වහන්සේගේ පණත්වලට කීකරුවන්නේ නම්, උන්වහන්සේ ශුද්ධවූ කන්දට —දේවමාළිගාවට ඔවුන්ව කැඳවන බවට සාක්ෂිදරන්න. එහිදී ඔවුන්ට උන්වහන්සේ මුණගැසී, උන්වහන්සේගේ ව්‍යවස්ථා ලබාගෙන, උන්වහන්සේගේ මහිමය දැකබලා, වඩාත් උන්වහන්සේ මෙන්වීමට ආනුභාවය ලැබ ඉදිරියට යාමට පුළුවන.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනා කල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. පාඩමේ කොටසක් ලෙස මෙම අදහස්වලින් එකක් හෝ වැඩියෙන් පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. දස පණත**

දස පණත, ද්විතීය කථාව 5:5–21, මොසායා 12:33–36 සහ 13:12–24, සහ ඩීසහසී 42:18–27 සහ 59:5–16 තුල නැවත දක්වා ඇති බව සළකන්න.. දස පණත ගැන තවදුරටත් අවබෝධයක් ලැබීමට මෙම කොටස් නැවත කියවන්න

**2. රත්රන් වස්සා**

නික්මයාම 32 වාර්තාකර තිබෙන රත්රන් වස්සා සෑදීම සහ නමස්කාරකිරීම පිළිබඳ කථාව සාකච්ඡාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. මෙම කථාවෙන් මූලධර්ම ගණනාවක්ම, පහත සඳහන් දෙකද ඇතුළුව ලබාගත හැකිය

අ. පරණ පුරුදු සහ විශ්වාසකිරීම් හෝ හැසිරීමේ ක්‍රම කඩා බිඳ දැමීම අපහසුය. ඉශ්‍රායෙල්වරුන් ශාරීරිකව මිසරයෙන් පිටවුවද, එහි බලපෑම්වලින් ඔවුන් තවමත් ආත්මිකව නිදහස්වී නොමැත. ස්වාමීන්වහන්සේ සිනායි කන්දේදී දස පණත ප්‍රකාශකිරීම ඔවුන් අසා තිබුනද, ඔවුහු ඉක්මණින්ම ප්‍රථම පණත් දෙක කැඩූහ.

ආ.අසුභවාදීව එල්බසිටින බලපෑම්වලට විරුද්ධවීම වැදගත්වේ. ඉශ්‍රායෙල්වරුන්ගේ අයහපත් ආශාවන්ට ආරොන් යටත්විය. යමකට වගකිව යුතු අය අමනාපවුවද, වෛරවුවද එහි අවදානම ගෙන ඒවාට යම් අවස්ථාවලදී, නායකයන් සහ දෙමාපියන් "නැත" කිව යුතුය.

# “දෙවියන්වහන්සේ දෙස බලා ජීවත්වෙයන්න”

15

වෙනි පාඩම

*ගණන් කථාව 11–14; 21:1–9*

**අරමුණ** ලෞකික ආශාවන් සහ බිය මැඩපවත්වාගෙන උපදෙස් පතා ගැලවුම්කරුවාණන් සහ උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන් දෙස බැලීමට පංති සාමාජිකයන් දිරිගැන්වීමය

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. ගණන්කථාව 11. ඉශ්‍රායෙල්වරු මන්නා ගැන චෝදනාකරමින් මස් කෑමට ප්‍රියකරති (11:1–9). මෝසෙස් ඔහුගේ බර දරාගැනීමට ස්වාමීන්වහන්සේගේ උපදෙස් සහ උපකාර ඉල්ලා සිටියි (11:10–15). ස්වාමීන්වහන්සේ විසින් උපදෙස් දුන් පරිදි, මෝසෙස් තමාට සහායවීම පිණිස වැඩිහිටියන් 70 දෙනෙක් එකතුකරගනියි (11:16–17, 24–30). ඉශ්‍රායෙල්වරුන්ගේ මස් කෑමට තිබෙන ආශාවට වුවමනාවටත් වැඩියෙන් වටුවන් යවමින් සහ ඔවුන්ගේ අසීමිත ආශාව නිසා වසංගතයකින් පහරදෙමින් ස්වාමීන්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙනසේක. (11:18–23, 31–35).

   ආ. ගණන්කථාව 12. මීරියාම් සහ ආරොන් මෝසෙස්ට විරුද්ධව කථාකරමින්, ඔහු ඉතියෝපියානු ස්ත්‍රියක හා විවාහවීම ගැන චෝදනාකරමින්, ඔවුන්ගේ නායකත්වය ඉසිලීම ගැන ඔහුට අභියෝගකරති (12:1–3). මීරියාම් සහ ආරොන්ගේ කෙඳිරීම ගැන ස්වාමීන්වහන්සේ ඔවුන්ට තරවටුකරමින් දඬුවම් කරන සේක (12:4–16).

   ඇ. ගණන්කථාව 13–14. මෝසෙස් කනාන් දේශය සෝදිසි කිරීමට මිනිසුන් 12 දෙනාට උපදෙස් දෙයි (13:1–20). 16 වෙනි පදයේ එන හොෂෙයා යන නම යොෂුවා යන නමෙන් සැඳුනක් බව සලකන්න.). ඔවුහු දේශයේ එල ගැන සතුටුදායක වාර්තාද රැගෙන නැවත පැමිණියහ. නමුත් යොෂුවා සහ කාලෙබ් හැර සියල්ලෝම දේශවාසීන්ට බියවී නැවතත් මිසරයට යාමට ආශාවූහ (13:21–14:10). ස්වාමීන්වහන්සේ මෝසෙස් අමතා, නොඇදහිලිමතුන් හා චෝදනාකරන ඉශ්‍රායෙල්වරුන් අවුරුදු 40ක්, යොෂුවා සහ කාලෙබ් හැර සියලුම වැඩිහිටි පරම්පරාව මිය යන තුරු වනාන්තරයේ ඇවිදින බවත් කීසේක (14:11–39).

   ඈ. ගණන්කථාව 21:1–9. ඉශ්‍රායෙල්වරු තමන්ට විරුද්ධව පැමිණි කනානිවරුන්ව විනාශකරති (21:1–3). ඉශ්‍රායෙල්වරුන්ගේ නිරන්තර චෝදනාවලට දඬුවම් ලෙස ස්වාමීන්වහන්සේ ගිනි සර්පයන් යවනසේක (21:4–6). මෝසෙස් පිත්තල සර්පයෙකු සාදා, එය කුඹයක් පිට තබා, ජනතාව අමතා, ඔවුන් එය දෙස බලන්නේ නම්, ඔවුන් ජීවත්වන බව කියයි (21:7–9).

2. අමතර කියවීම්: යොහාන් 3:14–16; 1 නිෆායි 17:41; ඇල්මා 33:18–22; 37:46–47; හීලමන් 8:13–15.

3. ඔබ අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, ***පොරොන්දු දේශය*** යන වචන යොදා පෝස්ටරයක් සකස්කරන්න.

4. මෝසෙස්ගේ පින්තූරය සහ පිත්තල සර්පයා ලබාගැනීමට තිබේ නම්, පාඩම අතරවාරයේදී ඒවා පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම හෝ (ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

*මිසරය* යන වචනය හුණුලෑල්ලේ ලියන්න. *පොරොන්දු දේශය* යන වචන ඇතුළත් පෝස්ටරය කාමරයේ අනෙක් පැත්තේ තබන්න. පංති සාමාජිකයෙකුට අභියෝගකර, හුණුලෑල්ලේ සිට පෝස්ටරය ඇති ස්ථානයට යනවිට *මිසරය* යන වචනය ඔහුගේ හෝ ඇයගේ උරහිසට උඩින් බලමින් යෑමට කියන්න.

පංති සාමාජිකයාට පෝස්ටරය ඇති ස්ථානයට ලඟාවීම අසීරු නම්, පහත සඳහන් ප්‍රශ්න අසන්නː

- පසුපස බලමින් කෙළින්ම ඉදිරියට යාම ඔබට අපහසු මන්ද?

පංති සාමාජිකයා පෝස්ටරය වෙත පහසුවෙන් ලඟාවන්නේ නම්, පහත සඳහන් ප්‍රශ්න අසන්නː

- කෙලින් මාර්ගයක අතරමං නොවී ඔබට කොපමණ දුරක් යා හැකිදැයි ඔබ සිතන්නේද? ඔබ පසුපස බලන විට කෙළින්ම ඉදිරියට යාම අපහසු මන්ද?

මෙම පෙන්වාදීම ඉශ්‍රායෙල්වරුන් මිසරයේ සිට ගමන්කිරීම හා සමානකිරීමට හැකි බව පැහැදිළි කරන්න. ඉශ්‍රායෙල්වරුන්ට ස්වාමීන්වහන්සේගෙන් ලැබූ ආශිර්වාද නොකළකා හැර, ඔවුන් තුලවූ බිය සහ ඇදහිල්ල අඩුවීම මගින් ඔවුන් මිසරයේ සිට නොපැමිණියා නම් හොඳයයි සිතීමට ඔවුන් පෙළඹවීය. මිසරයට යාමට ඔවුන් තුල තිබූ උනන්දුව නිසා පොරොන්දු දේශයට යන ගමනේදී ප්‍රමාදවීම් සහ ව්‍යාකුලතාවයන් ඔවුන්ට ඇතිවිය

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකරගැනීම

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාළකර ගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න. පාඩමේ එන හැම ප්‍රශ්නයක්ම ඇසීම හෝ හැම කරුණක්ම ආවරණයකිරීම හෝ අසීරු වියහැකි නිසා, පංති සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන්ට වඩා හොඳින් ගැලපෙන ඒවා යාච්ඤාවෙන් යුතුව තෝරාගන්න. පංති සාමාජිකයන්ගේ තත්වයන්ට ගැලපෙන යම් ප්‍රශ්න එක්කිරීමටද ඔබට අවශ්‍යවිය හැකිය.

1. **ඉශ්‍රායෙල්වරුන්ට වටුවන් සහ වසංගතයක් යැවීම මගින් ඔවුන්ගේ ගේ මස්වලට තිබූ ආශාවට ස්වාමීන්වහන්සේ පිළිතුරු දුන්සේක.**

ගණන්කථාව 11 උගන්වමින් සාකච්ඡාකරන්න.

- මන්නා ස්වාමීන්වහන්සේගෙන් ලත් විශාල ආශිර්වාදයක් වුවද, ඉශ්‍රායෙල්වරු ඒ ගැන චෝදනාකිරීමට පටන්ගත්හ (ගණන්කථාව 11:6). ඔවුන්ගේ චෝදනාවට හේතුවූයේ කුමක්ද? (බලන්න ගණන්කථාව 11:4–5; ඔවුන් මිසරයේදී අනුභවකල මස් සහ වෙනත් ආහාර ගැන සිතීමට සහ ඒවා ආශාකිරීමට පටන්ගත්හ.) අපට දැනට තිබෙනවාට වඩා අවශ්‍යවීමේ තිබෙන අවදානම කුමක්ද?
- ඉශ්‍රායෙල්වරු මස්වලට කෙතරම් කෑදරවූවේද යත්, පොරොන්දු දේශයට ඔවුන්ගේ යොමුවීම නැතිවීගොස් ඔවුන් මිසරයෙන් පිටවූයේ නැතිනම් හොඳයයි සිතූහ (ගණන්කථාව 11:4–6). ක්ෂණික ආශාවන් සන්තර්පනය කිරීම සඳහා ශ්‍රේෂ්ඨ ආශිර්වාද අත්හැර දමන වර්තමාන මිනිසුන් ගැන තිබෙන යම් උදාහරණ මොනවාද? මිනිසුන් මෙසේ කරන්නේ මන්ද? එවන් පෙළඹවීම් අපි ජයගන්නේ කෙසේද?
- ඉශ්‍රායෙල්වරුන්ගේ මස් සඳහා තිබූ ආශාවට ස්වාමීන්වහන්සේ පිළිතුරු දුන්නේ කෙසේද? (බලන්න ගණන්කථාව 11:18–20; 31–33.)
- ඉශ්‍රායෙල්වරුන්ගේ පාපවලින් මෝසෙස් එපමණටම බරවීමෙන් ඔහු ස්වාමීන්වහන්සේ අමතා සිය ජීවිතය ගන්නා ලෙස කීවේය (ගණන්කථාව 11:14–15). ස්වාමීන්වහන්සේ ඔහුට සහනය දුන්නේ කෙසේද? (බලන්න ගණන්කථාව 11:16–17. මෝසෙස්ට සහායවීමට මිනිසුන් හැත්තෑදෙනෙක් කැඳවන ලදී.) මෙම මිනිසුන් ලැබූ ශ්‍රේෂ්ඨ ආශිර්වාද මොනවාද? (බලන්න ගණන්කථාව 11:24–29.)

2. **මෝසෙස්ට විරුද්ධව කථාකිරීමගැන මිරියාම්ට සහ ආරොන්ට ස්වාමීන්වහන්සේ තරවටු කරනසේක.**

මණන්කථාව 12 උගන්වමින් සාකච්ඡාකරන්න.

- මිරියාම් සහ අරොන් ඔවුන්ගේ ප්‍රධානත්වය උසුලන්නා ලෙස මෝසෙස්ට විරුද්ධව කථාකරමින්, ඔවුන්ද එළිදරව් ලබාතිබෙන බව පෙන්වා දුන්හ (ගණන්කථාව 12:2). ඔවුන්ගේ චෝදනාවලට ස්වාමීන්වහන්සේ දුන් පිළිතුරු මොනවාද? (බලන්න ගණන්කථාව 12:5–9.) එළිදරව් ලබාගැනීමේ අපගේ අයිතිවාසිකමට තිබෙන සීමා මොනවාද?

වැඩිමහල් ජේම්ස් ඊ. ෆවුස්ට් මෙසේ කීවේයඃ "අනාගතවක්තෘවරුන්, දර්ශනදකින්නන් සහ එළිදරව්කරුවන් දෙවියන්වහන්සේගේ වචනය ලබාගෙන ලෝකයාට ප්‍රකාශකිරීමේ වගකීම සහ වරප්‍රසාදය ලබා තිබූ අතර එය දැනුදු ඇත. එක් එක් සාමාජිකයන්, දෙමාපියන් සහ නායකයන්ට ඔවුන්ගේම වගකීම් සඳහා එළිදරව් ලබාගැනීමේ අයිතිවාසිකම ඇති නමුත්, දෙවියන්වහන්සේගේ වචනය ඔවුන්ගේම වගකීම්වල සීමාව ඉක්මවා ප්‍රකාශකිරීමේ යුතුකමක් හෝ අයිතියක් ඔවුන්ට නැත" (in Conference Report, ඔක්තෝ. 1989, 9; හෝ *Ensign,* නොවැ. 1989, 8).

- මෝසෙස් ඉතියෝපියානු කාන්තාවක් හා විවාහවී සිටීම ගැන චෝදනාකිරීම නිසා ස්වාමීන්වහන්සේ මීරියම්ට සහ ආරොන්ට තරවටුකර දඬුවම් කරනසේක (ගණන්කථාව 12:1, 9–10). අප සභා නයකයන් විවේචනය කරන විට අපට බලපෑම් ඇතිවන්නේ කෙසේද? සභානායකයන්ව අප විවේචනයකිරීම අපගේ පවුල්වලට සහ මිතුරන්ට බලපාන්නේ කෙසේද?

- "මෝසෙස් බොහෝ මෘදු ගුණාන්විත කෙනෙක්" වූ බව ගණන්කථාව 12:3න් කියවේ. මෘදු ගුණය යන්නෙහි අදහස කුමක්ද?

ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිවරයා මෙසේ කීවේය, "මෘදු භාවයෙන් අදහස්වන්නේ, කෘතඥතාවයේ ආකල්පයකි. එය ආත්ම- අහංකාරයෙන් යුත් ආකල්පයේ විරුද්ධ පැත්තය.පුද්ගලයෙකු අභිභවා යන ශ්‍රේෂ්ඨ බලයක් ගැන පිළිගැනීමය, දෙවියන්වහන්සේ හඳුනාගැනීමක් සහ උන්වහන්සේ ගේ පණත් පිළිගැනීමය" ("With All Thy Getting Get Understanding," *Ensign,* අගෝ. 1988, 3–4).

- මීරියාම් මෝසෙස්ට විරුද්ධව කැරළි ගැසීම ගැන ඇය දඬුවම් ලැබූ විට, ඔහු තම මෘදුභාවය පෙන්නුවේ කෙසේද? (බලන්න ගණන්කථාව 12:13–15.) තම සොහොයුරිය පාලනයකිරීමේ බලය ගැන සතුටුවනු වෙනුවට, ඇයව සුවපත්කරන ලෙස ඔහු දෙවියන්වහන්සේට ආයාචනා කළේය. ඇය සුවපත්වන තුරු ඔහු සිය ජනතාවද සමග ඔවුන්ගේ ගමන කල් දැමුවේය.) මිනිසුන් අපව විවේචනයකරමින් අපට විරුද්ධවන විට්දී පවා අප මෘදු වන්නේ කෙසේද? විවේචනයට මෘදුවීමෙන් ප්‍රතිචාර දැක්වීමට එය අපට උපකාරවත්වන්නේ කෙසේද?

### 3. මෝසෙස් මිනිසුන් 12ට කනාන් දේශය සෝදිසිකරන ලෙස උපදෙස් දෙයි

ගණන්කථාව 13–14 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ඉශ්‍රායෙල්වරු කනාන් දේශයේ මායිමට ලඟාවූ විට, මෝසෙස් මිනිසුන් 12 දෙනාට දේශයත්, එහි සශ්‍රීකත්වය සහ එහි ජනයා ගැනත් සෝදිසිකිරීමට කීවේය (ගණන්කථාව 13:17–20). දේශයේ සශ්‍රීකත්වය ගැන ඔවුන් ගෙන ආ වාර්තා මොනවාද? (බලන්න ගණන්කථාව 13:23–27.) කාලෙබ් සහ යොෂුවා හැර අනෙක් මිනිසුන් 10 දෙනා කනාන් දේශයේ ජීවත්වූ මිනිසුන් ගැන වාර්තා කලේ මොනවාද? (බලන්න ගණන්කථාව 13:28–33.) මෙම මිනිසුන් 10 දෙනා කල එම වැරැද්දම අප සමහරෙක්ද කරන්නේ කෙසේද?

  ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපති තුමා මෙසේ කීවේයඃ

  "ඔත්තුකරුවන් දස දෙනාම ඔවුන්ගේම සැකයට සහ බියට ගොදුරු වූහ. ඔවුහු කනානිවරුන්ගේ ගණන් සහ ශරීර ප්‍රමානය ගැන වැරදි තොරතුරු දුන්හ….ඔවුහු දේශයේ ඔවුන් දුටු යෝධන්ට තමන්ව පළගැටියන් හා සමානකර කථාකළහ….

  "අප අවට සිටින සමහරුන්ද මෙම කටයුතුවල අනාගතය ගැන නොසතුටෙන් සිටින බව අපි දකිමු. උදාසීන අය, සීමාවන් ගැන කථාකරන අය, බිය ප්‍රකාශකරන අය, සෝදිසිකරමින් සිය කාලය ගතකරන අය, සහ දුර්වලකම් ගැන තමන් සිතන දේවල් ලියන අය ද සිටිති, සැබවින්ම එහි කිසිදු ප්‍රත්ඵලයක් නොමැත. එහි අතීත කටයුතු ගැන සැක කරන අයට සැබවින්ම එහි අනාගතය ගැන දර්ශනයක් ඇත්තේම නැත" (in Conference Report, ඔක්තෝ. 1995, 93–94; හෝ *Ensign,* නොවැ. 1995, 71).

- කාලෙබ් සහ යොසුවාගේ වාර්තාව, අනෙක් මිනිසුන් 10 දෙනාගේ වාර්තාවෙන් වෙනස්වන්නේ කෙසේද? (බලන්න ගණන්කථාව 13:30; 14:6–9.) කාලෙබ් සහ යොෂුවා කනාන් දේශවාසීන්ට බිය නොවුනේ මන්ද? (බලන්න ගණන්කථාව 14:9.) අප අසීරු අවස්ථාවන්ට මුහුණදුන් විට, කාලෙබ් සහ යොෂුවාගේ ආදර්ශය අපට අනුගමනය කලහැකි යම් මාර්ග මොනවාද?

ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිවරයා මෙසේ කීවේය:

"සුභාරංචිය තුල විනාශය සහ අන්ධකාරය පමණක්ම විශ්වාසකරන අයට මෙම වැඩකටයුතුවල ස්ථානයක් නැත. සුභාරංචිය යනු යහපත් ආරංචිය. එය ජයග්‍රහනයේ පණිවුඩයකි. එය උනන්දුවෙන් යුතුව වැළඳගත යුතු මාර්ගයකි.

"කරදර ඇති නොවන බව ස්වාමීන්වහන්සේ කිසිදා පවසා නැතිසේක. මෙම වැඩකටයුතු වලට විරුද්ධවූ අය අපගේ ජනතාවට පහරදීමට පැමිණීම නිසා, සෑම අන්දමේම හිංසා පීඩා ගැන ඔවුන්ට හොඳ අවබෝධයක් ඇත. නමුත් ඔවුන්ගේ සියලුම දුක් වේදනා තුල ඔවුන් ඇදහිල්ල පෙන්වා ඇත. මෙම කටයුතු නිරන්තරයෙන්ම ඉදිරියට ගොස් ඇති අතර, එය ආරම්භවූදා සිටම එකුදු පියවරක්වත් පසුපසට තබා නැත….

"මෙය සර්වඅසුභවාදී යුගයකි. ඇදහිල්ලේ මෙහෙය අපට අයත්වේ. සෑම තැනකම සිටින මාගේ සොහොයුරු සොහොයුරියනි, ඔබගේ ඇදහිල්ල තවත් ස්ථිර කරගෙන, මෙම වැඩකටයුතු ලෝකය හරහා ඉදිරියට ගෙනයාමට මම ඔබව කැඳවමි. ඔබ ජීවත්වන ආකාරය මගින් ඇදහිල්ල ශක්තිමත් කරගැනීමට ඔබට පුළුවන" (in Conference Report, ඔක්තෝ. 1995, 94–95; හෝ *Ensign*, නොවැ. 1995, 71–72).

- කාලෙබ් සහ යොෂුවාගේ වචනවලට සභාව ප්‍රතික්‍රියා කලේ කෙසේද? (බලන්න ගණන්කථාව 14:10.) ඉශ්‍රායෙල්වරුන්ගේ නිරන්තර කෙඳිරීමට සහ මිසරයට නැවත යාමට ඔවුන් තුල තිබූ කැමැත්තට ස්වාමීන්වහන්සේ ඔවුන්ට දඬුවම් කලේ කෙසේද? (බලන්න ගණන්කථාව 14:22–23, 26–35.) කනාන් දේශය පිළිබඳව වැරදි වාර්තාව දුන් මිනිසුන් 10 දෙනාට උන්වහන්සේ දඬුවම් කලේ කෙසේද? (බලන්න ගණන්කථාව 14:36–37.) කාලෙබ් සහ යොෂුවාගේ ඇදහිලිමත්කම වෙනුවෙන් උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කලේ කෙසේද? (ගණන්කථාව 14:24, 38.)

**4. මෝසෙස් පිත්තල සර්පයෙක් සාදා ජනතාව ඒ දෙස බලන්නේ නම්, ඔවුන් සුවපත්වෙන බව කියයි.**

ගණන්කථාව 21:1–9 උගන්වමින් සාකච්ඡාකරන්න.

- කනානිවරුන් පහරදුන් විට ඔවුන්ව පරාජයකිරීමට ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට උපකාර කළද, ඉශ්‍රායෙල්වරු දිගටම කෙඳිරූහ. ස්වාමීන්වහන්සේ ඔවුන්ට දඬුවම් කලේ කෙසේද? (බලන්න ගණන්කථාව 21:6.) මෙම දඬුවමට ඉශ්‍රායෙල්වරුන් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න ගණන්කථාව 21:7.)
- ගිනි සර්පයන් ඉවත්කරන ලෙස මෝසෙස් ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලූ විට, උන්වහන්සේ ඔහුට කුමක් කීසේක්ද? (බලන්න ගණන්කථාව 21:8–9.) ගිනි සර්පයන්ගේ දෂ්ටකිරීමෙන් ගැලවීම සඳහා එක් එක් පුද්ගලයා විසින් කල යුතුව තිබූ දේවල් මොනවාද?
- පිත්තල සර්පයා දෙස නොබැලූ නිසා ඉශ්‍රායෙල්වරුන් බොහෝ දෙනෙක් මියගිය බව, මෝර්මන්ගේ පොතේ අනාගතවක්තෘවරුන් දෙදෙනෙක් වන, නීෆායි සහ ඇල්මා ඉගැන්වූහ. ඔවුන් නොබැලුවේ මන්ද? (බලන්න 1 නිෆායි 17:41; ඇල්මා 33:18–20.)
- පිත්තල සර්පයා සංකේතමත් කලේ කවුරුන්ද? (බලන්න යොහාන් 3:14–16; හීලමන් 8:13–14.)
- ඉශ්‍රායෙල් පුත්‍රයන්ට ජීවත්වීම සඳහා පිත්තල සර්පයා දෙස බැලීමට අවශ්‍යවූ ලෙසම, සදාකාල ජීවනය ලැබීම සඳහාද අපද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙස බැලීම අවශ්‍යවේ (ඇල්මා 37:46–47; හීලමන් 8:15). ක්‍රිස්තුස්වහන්සේ දෙස බලන්න යන්නෙහි අදහස කුමක්ද? ඉශ්‍රායෙල්වරුන් පිත්තල සර්පයා දෙස නොබැලීමෙන් කල වැරැද්ද වර්තමානයේ බොහෝ ජනතාවද එලෙසම කරන්නේ කෙසේද? (බලන්න ඇල්මා 33:20. ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙස නොබලන්නේ, එසේ කිරීමෙන් ඔවුන්ට ගැලවීම ලබාගත හැකි බව ඔවුන් විශ්වාස නොකරන නිසාය.)

  වැඩිමහල් කාලෝස් ඊ. අසේ මෙසේ කීවේය: "අපි, පැරණි ඉශ්‍රායෙල්වරුන් මෙන්, සදාකාලික ජීවනය ලබාගැනීමට අපි බලාපොරොතුවන්නේ නම්. . . අපගේ ඇස් සහ සිත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙත ඉතාමත් ඕනෑකමින් යොමුකල යුතුය. . .අපගේ බැලීම් ඉවතට යොමුවීමට හෝ ලෝකයේ විනාශකාරී දේවල්වලට ඇලී සිටීමට හෝ ඉඩ නොතැබිය යුතුය.

ඇස. . .ඉහළ බැලීමට පුරුදුකල යුතුය. අපි දෙවියන්වහන්සේ දෙස බලා ජීවත්විය යුතුවෙමු!" (in Conference Report, ඔක්තෝ. 1978, 81; හෝ *Ensign*, නොවැ. 1978, 54).

- ගිනි සර්පයන්ගෙන් සුවපත්කිරීමේ මාර්ගය පහසුවූවා සේම, සදාකාලික ජීවනයට යන මාර්ගයද පහසුය (ඇල්මා 37:46). සදාකාලික ජීවනයට මාර්ගය පහසුවන්නේ කුමන අන්දමින්ද? සදාකාලික ජීවනයට යන මාර්ගය අවුල්කිරීමට සමහර අය උත්සාහ කරන්නේ කෙසේද? (බලන්න යාකොබ් 4:14. ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල, පසුතැවිල්ල, සහ කීකරුකම යන සරල මූලධර්ම වලට එහායින් බලති.) අපි ක්‍රිස්තුස්වහන්සේ තුල අපගේ ඇදහිල්ල යොමුකිරීම පවත්වාගන්නේ කෙසේද?

---

**අවසානය**

අපට වඩාත් වැදගත් දේවල්වලින් අපව වෙනතකට යොමුකරන "යෝධයන්ට" බිය නොවී, ලෝකයේ දේවල්වලට එහායින් බැලීමට පංති සාමාජිකයන් දිරිමත් කරන්න. අපි "දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් දෙස ඇදහිල්ලෙන් බලමින්" (හීලමන් 8:15) උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන්ව අනුගමනය කරන්නේ නම්, අපි මෙම ජීවිතයේදී මෙන්ම මතු පැමිණෙන ජීවිතයේදීද ආශිර්වාදිත වෙන්නෙමු.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස්වලින් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

1. "අපි මිසරයට හැරී යමු" (ගණන්කථාව 14:4)

- ඊශ්‍රායෙල්වරු මෙසේ කොටුවී සිරියදී ඔවුන්ගේ ප්‍රතිචාරයවූයේ කුමක්ද?

  අ. මිසරවරුන්ට සහ රතුමුහුද අතර කොටුවූ විටදී? (බලන්න නික්මයාම 14:10–12.)
  ආ. මන්නා හැර කෑමට වෙනත් කිසිවක් නුදුන් විටදී? (බලන්න නික්මයාම 11:4–6, 18–20.)
  ඇ. කනාන් දේශය ජයගැනීමේ කටයුත්තේ අභියෝගය තිබියදී? (බලන්න නික්මයාම 14:1–4.)
  ඈ. වනාන්තරයේ අසීරු ගමනේදී අධෛර්‍යයට පත්වීමේදී? (බලන්න නික්මයාම 21:4–5.)

- ඊශ්‍රායෙල්වරුන්ට මිසරය අමතකකිරීම එතරම්ම අසීරුවීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? වර්තමානයේදී අපට අමතක කිරීමට අපහසු යම් දේවල් මොනවාද? අපි පරණ පුරුදුවලින් හෝ ලෞකික ආකල්පවලින් ඉවත්වීමට පරිශ්‍රම දරමින් එකිනෙකා ශක්තිමත් කරන්නේ කෙසේද?

2. **මග පෙන්වීම් සඳහා බලන්නේ කොතැනද**

මග පෙන්වීම් සඳහා අපි බැලිය යුතු තැන් ගැන ගණන් කථාව පොත අපට උගන්වයි. ඔබ ශුද්ධ ලියවිලි වාර්තා කියවන විට, පහත සඳහන් මූලධර්ම හුණුලෑල්ලේ ලියා මෙම ඉගැන්වීම් අවධාරනය කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

  අ. අනාගතවක්තෘවරයා දෙස බලන්න (ගණන් කථාව 12).
  ආ. පොරොන්දු දේශය දෙස බලන්න—අප සඳහා, සෙලෙස්ටියල් රාජ්‍යයය (ගණන් කථාව 13–14).
  ඇ. ගැලවුම්කරුවාණන් දෙස බලන්න (ගණන් කථාව 21:4–9).

16

වෙනි පාඩම

# "මාගේ ස්වාමීන්වහන්සේගේ වචනය ඉක්මවා යාමට මට නොහැකිය"

*ගණන් කථාව 22–24; 31:1–16*

**අරමුණ**

දෙවියන්වහන්සේගේ කැමැත්ත පසුබටවීමෙන් තොරව ඉටුකිරීමට පංති සාමාජිකයන් දිරිගැන්වීමටය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. ගණන් කථාව 22:1–2. බාලාක්, මෝවබ්වරුන්ගේ රජතුමා, ඉශ්‍රායෙල්වරුන්ගේ පැමිණීමෙන් අතිශයින්ම භයට පත්විය. ඔහු බාලාම්ට තෑගි පිරිනමමින් ඉශ්‍රායෙල්වරුන්ට ශාපකිරීමට මෝවබ් වෙත පැමිණීමට කියයි. එය ප්‍රතික්ෂේපකිරීමට දෙවියන්වහන්සේ බාලාම්ට අණකරන අතර බාලාම් කීකරුවෙයි (22:1–14). බාලාම් මෝවබ් වෙත පැමිණ ඉශ්‍රායෙල්වරුන්ට ශාපකරන්නේ නම් ඔහුට අමතර ගෞරව සහ වස්තුව පිරිනමන බව බාලාක් කියයි. දෙවියන්වහන්සේ බාලාම් අමතා, ඔහු කැමති නම් ඔහුට යා හැකි බවත්, නමුත් ඔහු කථාකල යුත්තේ දෙවියන්වහන්සේ ඔහුට දෙන වචන පමණක් බව කියනසේක (22:15–21). බාලම් යාමට තීරණය කරයි.

   ආ. ගණන් කථාව 22:22–35. බාලාම් යම් ත්‍යාග බාලාක්ගෙන් අපේක්ෂාකරන බව දැනගැනීම නිසා, බාලාම් මෝවබ් වෙත යාම ගැන දෙවියන්වහන්සේ ඔහු සමග අමනාප වනසේක. ඔහු ගමන් කරන අතර, ඔහුගේ කොටළුදෙන හා සුරදූතයා ඔහු සමග කථාකිරීම නිසා දෙවියන්වහන්සේ අසතුටුකිරීම භයානක බව බාලාම් දැනගනියි.

   ඇ. ගණන්කථාව 22:36–24:25. බාලාම් බාලාක් මුණගැසෙයි (22:36–23:2). තුන්වතාවක්ම ඉශ්‍රායෙල්වරුන්ට ශාපකරන ලෙස බාලාම් ඔහුට කියන නමුත්, බාලාම් දෙවියන්වහන්සේට කීකරුවී ඉශ්‍රායෙල්වරුන්ට තුන් වතාවක් ආශිර්වාද කරයි (23:3–24:9). ඉන්පසුව ඔහු මෝවබ්ට ශාපකර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අනාවැකි කියයි (24:10–25).

   ඇ. ගණන් කථාව 31:1–6. ඉශ්‍රායෙල්වරු මිදියන්වරුන්ව විනාශකර දමා, බාලාම්වද මරා දමති. ඉශ්‍රායෙල්වරුන්ව පාපයට පෙළඹවීමට බාලාම් මිදියන්වරුන්ට උපදෙස් දුන් බව මෝසෙස් පැහැදිළි කරයි (බාලාම්ගේ උපදෙස්වල ප්‍රතිඵල ගණන් කථාව 25:1–3 පදවල පැහැදිළි කෙරෙයි. බාලාම් ඍජුවම ඉශ්‍රායෙල්වරුන්ට ශාප නොකලද, ඔහු අවසානයේදී බාලාක්ගෙන් කෙතරම් තදින් තෑගි අපේක්ෂාකලේද යත්, ඉශ්‍රායෙල්වරුන්ව පාපයට පොළඹවා, ඔවුන්ට දෙවියන්වහන්සේගේ ආරක්ෂාව අහිමිකිරීමට පවා යෝජනා කළේය..)

2. අමතර ඉගැන්වීම් 2 පේත්‍රුස් 2:15–16; යූද් 1:11; එළිදරව් 2:14.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

පහත සඳහන් ප්‍රකාශවලට හොඳින් සවන්දී, එමගින් කුමන අන්දමේ පුද්ගලයෙක් සැලෙන්නේදැයි සිතීමට පංති සාමාජිකයන්ගෙන් අසන්නඃ

"රජතුමා ඔහුගේ ගෙය රන් රිදියෙන් පුරවා මට දෙතත්, මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ වචනය ඉක්මවා යාමට මට නොහැකිය" (ගණන් කථාව 22:18).

"ස්වාමීන්වහන්සේ මට කියන සියල්ල මා විසින් කළ යුතුය" (ගණන් කථාව 23:26).

"මාගේම සිතින් යහපතවත් අයහපතවත් කිරීම පිණිස ස්වාමීන්වහන්සේගේ වචනය ඉක්මවායන්ට නොහැක්කෙමි; නමුත්- ස්වාමීන්වහන්සේ කියන දේම, මම කියන්නෙමි" (ගණන් කථාව 24:13).

• මෙම වචන කියන පුද්ගලයෙකු තුල තිබෙන යම් ගුණාංග මොනවාද? (එවැනි ප්‍රකාශවලින් ඇඟවෙන්නේ එම පුද්ගලයා කීකරු, ඇදහිලිමත්, සහ යටහත්බවය.)

මෙම ප්‍රකාශයන් කළේ බාලාම් නම් මිනිසෙක් බව පැහැදිළි කරන්න. ඔහු කීකරුකම තදින්ම ප්‍රකාශකල නමුත්, ඔහුගේ හදවත තුල ලෞකික ත්‍යාගවලට සහ ගෞරවයට ආශාවක්විය. මෙම පාඩමෙන් පෙන්වාදෙන්නේ, එවැනි ආශාවන් පිනවීමට අප තුලම තිබෙන මුරණ්ඩු කැමැත්තට තදින්ම සිටීමේ අවසන් ප්‍රතිඵල ගැනය.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකරගැනීම

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාළකර ගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. ඉශ්‍රායෙල්වරුන්ට ශාපකිරීමට හුවමාරු කල බාලාක්ගේ ත්‍යාග පිරිනැමීම බාලාම් ප්‍රතික්ෂේප කරයි**

ගණන් කථාව 22:1–21 උගන්වමින් සාකච්ඡාකරන්න.

• ඉශ්‍රායෙල්වරුන් පැමිණීම ගැන අතිශයින්ම බියට පත් බාලාක්, මෝවබ්වරුන්ගේ රජතුමා, බාලාම් වෙත පණිවුඩකරුවන් යවමින්, ඔහු මෝවබ් වෙත පැමිණ ඉශ්‍රායෙල්වරුන්ට ශාපකරන්නේ නම් ත්‍යාග පිරිනමන බව කීවේය (ගණන් කථාව 22:5–7). මෙම පොරොන්දුවට බාලාම් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? බලන්න ගණන් කථාව 22:8–14.) දෙවියන්වහන්සේට අකීකරුවීමට සමහර අවස්ථාවලදී අප හුවමාරුකල ඒ අන්දමේ ත්‍යාග මොනවාද?

• මෝවබ් වෙත ඒම බාලාම් ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, බාලාක්, පළමුවරට වඩා සිත්ගන්නා ලෙස දෙවන මිනිසුන් කණ්ඩායමක්, ඔහුව පෙළඹවීම සඳහා යැවීය. බාලාක්, බාලාම් වෙත පිරිනැමුවේ මොනවාද? (බලන්න ගණන් කථාව 22:15–17.) බාලම් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න ගණන් කථාව 22:18–19.) නැවත වරක් ස්වාමීන්වහන්සේගෙන් ඇසීමට ඔහුට අවශ්‍යවීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (ස්වාමීන්වහන්සේ තම අදහස වෙනස්කර, බාලාක් පිරිනැමූ ත්‍යාග ගැනීමට ඔහුට ඉඩදෙනු ඇතැයි බාලාම් බලාපොරොත්තුවූවා විය හැකිය.) දෙවියන්වහන්සේගේ පණත්වලට සහ උපදෙස්වලට නිදහසට කරුණු සෙවීමේ භයානකකම කුමක්ද?

• බාලාම් කැමති නම් බාලාක්ගේ පණිවුඩකරුවන් සමග යාමට ස්වාමීන්වහන්සේ ඔහුට අවසර දුන්සේක. නමුත් ඉන්පසුව එසේ යාම ගැන ස්වාමීන්වහන්සේ බාලාම් සමග අමනාපවූසේක. (ගණන් කථාව 22:20–22). බාලාම්ගේ සිතේ තිබූ කුමන දෙයක් ස්වාමීන්වහන්සේගේ අමනාපයට හේතුව වශයෙන් හැඟවෙන්නේද? (බලන්න 2 පේත්‍රුස් 2:15; යෙසායා 29:13.)

**2. තමාගේම කැමැත්තට අනුව කටයුතුකිරීමේ බාලාම්ගේ දැඩි මුරණ්ඩුකමේ භයානකකම ස්වාමීන්වහන්සේ පෙන්වනසේක.**

ගණන් කථාව 22:22–35 උගන්වමින් සාකච්ඡා කරන්න.

• මෝවබ් වෙත ගමන්කරන අතර, බාලාම් තුන් වතාවක්ම තම කොටළුදෙනට ඉදිරියට යාමට බල කළේය (ගණන්කථාව 22:22–30). මෙය ස්වාමීන්වහන්සේ සමග බාලාම්ට තිබූ සම්බන්ධතාවයට සමානවන්නේ කුමන අන්දමින්ද? බාලම්ට අවශ්‍යවූයේ කොටළුදෙන සහ ස්වාමීන්වහන්සේ ලවා ඔහුගේම කැමැත්ත කරවාගැනීමටය. කොටළුදෙන සුරදූතයාව දුටු නමුත්, බාලම් එය දුටුවේ නැත. ඒ අන්දමින්ම බාලම් නුදුටු බොහෝ දේවල් ස්වාමීන්වහන්සේ දුටු බව පෙන්වාදීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

• යම් පුද්ගලයන් සහ කණ්ඩායම් දැඩි මුරණ්ඩුව සිටිමින්, ස්වාමීන්වහන්සේගේ කැමැත්තට හෝ දෙමාපියන්ගේ හෝ නායකයන්ගේ ධාර්මික උපදේශයන්ට යටහත්වීම වෙනුවට, ඔවුන්ටම අවශ්‍ය දෙය කිරීමට උත්සාහකිරීම ගැන තිබෙන නූතන සමානකම් මොනවාද?

පහත සඳහන් උදාහරණ කිහිපයක් සාකච්ඡාකිරීමට ඔබට අවශ්‍යවිය හැකියඃ

අ. ළමයෙක්, එක් දෙමාපියෙකුගේ පිළිතුර ගැන අසතුටුව, වෙනස් පිළිතුරක් බලාපොරොත්තුව අනෙක් දෙමාපියා වෙත යයි.

ආ. සභාවේ සාමාජිකයෙක්, පූජකවර නායකයෙකුගේ උපදේශය ගැන සෑහීමකට පත් නොවී, වෙනත් පූජකවර නායකයෙකු වෙත යයි.

ඇ. සභා සාමාජිකයෙක්, වෙනත් සාමාජිකයන්ට අදාළවන පණතක් ඔහුට හෝ ඇයට අදාල නොවන බවට සාධාරණය කරයි.

- ස්වාමීන්වහන්සේ සුරදූතයා සහ කොටළුදෙන තුලින් බාලාම්ට තරවටු කරනසේක. සුරදූතයාගේ තරවටු වචනවලට බාලාම් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න ගණන්කථාව 22:31–35.) ස්වාමීන්වහන්සේ තම දරුවන්ට තරවටු කරන්නේ මන්ද? (බලන්න ඕසහසී 95:1.) ස්වාමීන්වහන්සේගේ තරවටුව අපට ආශිර්වාදයක් වන්නේ කෙසේද?

**3. ඉශ්‍රායෙක්වරුන්ට ශාපකිරීම බාලාම් ප්‍රතික්ෂේප කරයි.**

ගණන්කථාව 22:36–24–25 උගන්වමින් සාකච්ඡා කරන්න.

- බාලාම් මෝවබ් වෙත පැමිණීමෙන් පසුව, බාලාක් ඔහු අමතා ඉශ්‍රායෙල්වරුන්ට ශාපකරන ලෙස තුන්වතාවක්ම ඔහුට කීවේය. හැම වතාවකදීම ඉශ්‍රායෙල්වරුන්ට ආශිර්වාදකරන ලෙස ස්වාමීන්වහන්සේ බාලාම්ට කීසේක. බාලාම් කීකරුවිය. මෙම වාර්තාව තුලින් බාලාම් පෙන්වූයේ කුමන ශක්තියක්ද? (බලන්න ගණන්කථාව 22:38; 23:8; 19–20; 24:1, 12–13.) බාලාම් තුල තවදුරටත් පෙනෙන්ට තිබූ දුර්වලකම කුමක්ද? (බලන්න 22:41; 23:1–3; 13–15, 27–30.) ඉශ්‍රායෙල්වරුන්ට ශාපකිරීමේ බාලාක්ගේ ඉල්ලීම, බාලාම් ප්‍රතික්ෂේප කළද, ඔහු බාලක්ගේ ඉල්ලීමට කැමතිවී, එය වරදක් බව දැන සිටියද, ඔහු සමග තැනින් තැනට ගියේය.) අධර්මිෂ්ඨ යෝජනා, (උදාහරණයක් ලෙස, මිතුරන්ගේ සහ මාධ්‍යවල) වැරදිබව අප දැන සිටියදී, ඒවාට සවන්දීමේ භයානක කම කුමක්ද?

**4. ඉශ්‍රායෙල්වරු, මිදියන්වරුන්ව විනාශකර දමා, බාලාම්ව මරාදමති.**

ගණන්කථාව 31:1–16 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ඉශ්‍රායෙල්වරුන්, මිදියන්වරුන්ට විරුද්ධව සටනට ගියේ මන්ද? (බලන්න ගණන්කථාව 31:1–3; ගණන්කථාවේ 25:1–3 වාර්තාකර තිබෙන පරිදි, ඉශ්‍රායෙල්වරුන්ට පව්කිරීම සඳහා මිදියන්වරුන් විසින් පෙළඹවීම නිසා ස්වාමීන්වහන්සේ ඔවුන් සමග අමනාපයෙන් සිටිසේක. ඉශ්‍රායෙල් පුත්‍රයන්ව පිළිම වන්දනාකිරීමට සහ දුරාචාරයට පෙළඹවීමට මිදියන්වරුන්ට උපදෙස් දුන්නේ කවුද? (බලන්න ගණන්කථාව 31:16.) බාලාම් මෙම උපදේශය දුන්නේ මන්ද? (ඉශ්‍රායෙල්වරුන්ට ශාපකිරීම වෙනුවට ආශිර්වාදකිරීමට ස්වාමීන්වහන්සේ දුන් ආඥාවට බාලාම් කීකරුවුවද, ඔහුගේ සිත තුල ඔහු ලෞකික ගෞරවයට සහ තෑගිවලට ආශා කළේය. මෙම ත්‍යාග ලබාගැනීම සඳහා, ඉශ්‍රායෙල්වරුන්ට දෙවියන්වහන්සේගේ ආරක්ෂාව නැතිකිරීමට, ඔවුන්ව පාපයට පෙළඹවීමට ඔහු යෝජනාකළේය.) ඉශ්‍රායෙල්වරුන් මිදියන්වරුන් හා කල සටනේදී බාලම්ට සිදුවූයේ කුමක්ද? (බලන්න ගණන්කථාව 31:8.)
- අළුත් ගිවිසුමේ ලේඛකයන් තුන් දෙනෙක් බාලාම් ගැන සඳහන් කළහ (2 පේත්‍රුස් 2:15–16, යූද් 1:11; එළිදරව් 2:14). ඔහු ගැන ඔවුන්ගේ හැඟීම් මොනවාද?
- මෙම කථාවෙන් අපට ඉගෙනගත හැකි පාඩම් මොනවාද? (ලෞකික ත්‍යාග සහ ගෞරව සොයමින්, දෙවියන්වහන්සේගේ උපදෙස්වලට සහ ආඥාවලට නිදහසට කරුණු සොයමින් හෝ ලෞකික අදහස්, ප්‍රතිපත්ති හෝ ප්‍රමිතීන් සභාවට හඳුන්වාදීමට උත්සාහකරන සභා සාමාජිකයෝ බාලාම්ගේ අධර්මිෂ්ඨ ආදර්ශය අනුගමනය කරති. එළිදරව් 2:14 මෙය හඳුන්වන්නේ, "බාලාම්ගේ දහම" ලෙසය.)

  වැඩිමහල් බෘස් ආර්. මැක්කොන්කි මෙසේ කීවේය:

  "මෙය කෙතරම් විශ්මිත කථාවක්ද! දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයෙකු මෙහි සිටින අතර, ඔහු ස්ථිර ලෙසම කැපවී සිටින්නේ ස්වර්ගයේ ස්වාමීන්වහන්සේ යොමුකරන වචනය පමණක් ප්‍රකාශකිරීමටය. ඔහු හඹා යායුතු මාර්ගය ගැන ඔහු තුල සුළු වශයෙන් හෝ සැකයක්

තිබෙන බවක් පෙනෙන්ට නැත. ඔහු ස්වාමීන්වහන්සේ නියෝජනයකරන අතර, රන් හා රිදී පිරුන ගෙයක් හෝ රජතුමා පිරිනමන ලද උසස් ගෞරවයට හෝ ඔහු අධිෂ්ඨානකරගත් මාර්ගයෙන් ඔහුව හැරවීමට නොහැක. . . .

"නමුත්, වස්තුවට කෑදරකම සහ ගෞරවයට ඇති ආශාව ඔහුව පොළඹවයි. පොහොසත්වී බලවත්වීම ඔහුට කෙතරම් ආශ්චර්‍යයක්ද. . . සමහරවිට ඔහුගේ ප්‍රමිතීන් පහත හෙලා යම් ලෞකික සමෘද්ධියක් සහ බලයක් ලබාගැනීමට ස්වාමීන්වහන්සේ ඔහුට ඉඩදෙනසේක….අප සමහරෙක්ද කොයි තරම් දුරට සභාවෙන් මග පෙන්වීම ලබාගෙන, ඉන්පසුව බාලාම් කළාක් මෙන් යම් ලෞකික ත්‍යාග ලැබීමට ආයාචනා කරන්නේදැයි ගැන මම පුදුම වෙමි. . . .

"බාලාම්, . . . ආනුභාසම්පන්නව සහ බලවත්ව කාලයක් සිටි ඔහු, අවසානයේදී ඔහුගේ ආත්මය නැතිකර ගත්තේ, සදාකාලික වස්තුවට වඩා මෙම ලෝකයේ දේවලට තදින්ම අශාකල නිසාය" ("The Story of a Prophet's Madness," *New Era,* අප්‍රේ. 1972, 7).

- අවධානශීලී ක්‍රියාකාරකමේ ප්‍රකාශ නැවත බලන්න. බාලාම් දැඩි කීකරුබවකින් යුක්ත බව පෙනීමට තිබුනද, ඔහුගේ සිතේ තිබූ ආශාවන් වූයේ ලෞකික ත්‍යාග සහ ගෞරවයන් බව පෙන්වා දෙන්න. අපගේ සිතේ ආශාවන් පවිත්‍රව තබාගැනීමේ වැදගත්කම ගැන මෙම කථාව උගන්වන්නේ මොනවාද? අපගේ සිතේ ආශාවන් අප පවිත්‍රව තබාගන්නේ කෙසේද?

---

අවසානය

බාලාම් නිහතමානීව දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත්වූයේ නම්, ඔහුට සහ ඉශ්‍රායෙල්ට විඳින්ට සිදුවූ පාප සහ වේදනා බොහොමයක් වලක්වාගැනීමට ඉඩ තිබුන බවට සාක්ෂිදරන්න. මුරණ්ඩුවනවා වෙනුවට ස්ථිරව සිටිමින්—ස්වාමීන්වහන්සේගේ කැමැත්ත මගහැරීමට හෝ වෙනස්කිරීමට උත්සාහ නොකර එය අනුගමනයකිරීමට සොයන ලෙස පංති සාමාජිකයන් දිරිගන්වන්න.

---

ඉගැන්වීමේ අමතර අදහස්

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස්වලින් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවනු ඇත.

**1. ස්වාමීන්වහන්සේට කීකරුවීම**

ස්වාමීන්වහන්සේට කීකරුවීමේ වැදගත්කම ගැන අපට බාලාම්ගෙන් ඉගෙනගත හැකිය. මෙය අපට ශුද්ධ ලියවිලිවල එන වෙනත් බොහෝ යහපත් මිනිසුන් සහ කාන්තාවන්ගෙන්ද ඉගෙනගත හැකිය. පහත සඳහන් උදාහරණ දෙස යොමුවීමට ඔබට අවශ්‍යවිය හැකිය.

අ. ගෙත්සමනියේ සහ කුරුසියේ වද වේදනා විඳීමට ඉදිරියේදී සිදුවන බවට දැන සිටි ගැලවුම්කරුවාණන් වහන්සේ, "දණින් හිඳ, යාච්ඤාකරමින්: පියාණෙනි, ඔබ කැමති සේක් නම්, මේ කුසලාන මාගෙන් පහකළ මැනව, එසේවී නමුත්, මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා" යයි කීසේක. (ලූක් 22:41–42).

ආ.ආබ්‍රහම්ට ඔහුගේ පුත්‍රයාවූ ඊසාක්ව පූජාකිරීමට අණකල විට, ඔහු මොරියා කන්දට ගමන ආරම්භකිරීම සඳහා "අලුයම නැගිටුනේය" (උත්පත්ති 22:3).

ඇ.මරිය තුමිය දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ මෑණියන්වන බව ඇයට පැවසූ විට, ඇය ප්‍රතිචාර දක්වමින්, "බැලුව මැනව, ස්වාමීන්වහන්සේගේ දාසිය; ඔබගේ වචනය ලෙස මට වේවායි" කීවාය (ලූක් 1:38).

ඈ.යෙරුසලමට නැවත ගොස් ලේබන්ගෙන් පිත්තල තහඩු ගෙන ඒමට නීෆායිට කී විට, ඔහු ක්ෂණිකවම මෙසේ ප්‍රතිචාර දැක්වීය, "මම ගොස් ස්වාමීන්වහන්සේ නියම කළ දෙය කරන්නෙමි" (1 නීෆායි 3:7).

ඉ. හීලමන්ගේ පුත්‍රයන් සටනේදී සාර්ථක වූයේ "ඔවුහු අණකරන ලද සෑම වචනයක්ම සම්පූර්ණයෙන්ම ඉටුකිරීමට කීකරුව පිළිපැදීම නිසාය" (ඇල්මා 57:21).

2. **"ස්වාමීන්වහන්සේ ගෞරවයට පැමිණීමෙන් නුඹ වැළැක්වූසේක" (ගණන්කථාව 24:11)**

- බාලාම් ඉශ්‍රායෙල්ට ශාපකිරීම සහ බාලාක්ගේ ත්‍යාග සහ ගෞරවය ලැබීම ප්‍රතික්ෂේප කළ විට, බාලාක් ඔහු අමතා, "ස්වාමීන්වහන්සේ ගෞරවයට පැමිණීමෙන් නුඹ වැළැක්වූසේක" යයි කීවේය (ගණන්කථාව 24:11). ස්වාමීන්වහන්සේ අනුගමනය කිරීමෙන් සමහර අවස්ථාවලදී අපට ලෞකික ත්‍යාග සහ ගෞරව නොලැබී යන්නේ මන්ද? ලෞකික ත්‍යාග වෙනුවට ස්වාමීන්වහන්සේ අපට පොරොන්දුවන්නේ මොනවාද? (බලන්න ධීසහගී 81:6.)

# “නුඹ සිහිනැති නොකරන්ට බලාගනින්න”

# 17 වෙනි පාඩම

*ද්වීතීය කථාව 6:8; 11; 32*

**අරමුණ**

පංති සාමාජිකයන් (1) ස්වාමීන්වහන්සේව සහ ඔවුන් උන්වහන්සේ සමග තැබූ ගිවිසුම් මතකතබාගැනීමට සහ (2) එසේ කිරීමට ඔවුන්ට උපකාරවත් වන පරිසරයක් සකස්කර ගැනීමට ඔවුන්ව දිරිගැන්වීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. ද්වීතීය කථාව 6:1–9; 11:18–21. මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට උපදෙස් දෙමින් ඔවුන්ගේ ගිවිසුම් මතක්කර ගැනීමට ඔවුන්ට උදව්කරයි. දෙමාපියන්ට ඔවුන්ගේ දරුවන්ට ඔහුගේ වචනය ඉගැන්වීමටද ඔහු උපදෙස් දෙයි.

   ආ. ද්වීතීය කථාව 6:10–12; 8:1–20. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට දුන් ආශිර්වාද ගැන මෝසස් ඔවුන්ට මතක්කරයි. ඔහු ඔවුන්ට අවවාද කරමින්, ඔවුන් දෙවියන්වහන්සේගේ පණත්වලට අකීකරුව උන්වහන්සේව අමතක කරන්නේ නම්, ඔවුන් විනාශවන බව කියයි.

   ඇ. ද්වීතීය කථාව 32:1–4, 15–18, 30–40, 45–47. මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට ඔවුන්ගේ ගැලවීමේ පර්වතය (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ) සිහිතබාගන්නා ලෙස උපදෙස් දෙයි.

2. අමතර කියවීම්: ද්වීතීය කථාව 4; 7:1–4; 13:1–8; 34.

3. ඔබ ප්‍රථම අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, “අවධානශීලී ක්‍රියාකාරකම” යටතේ විස්තරකර තිබෙන ද්‍රව්‍යයන් නිවසේ සිට රැගෙන එන්න

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**

අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් එකක් (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. පංතියට වඩාත් සුදුසු විය හැකි ක්‍රියාකාරකමක් තෝරාගන්න.


1. ස්වාමීන්වහන්සේ සහ ඔබ උන්වහන්සේ සමග තැබූ ගිවිසුම් ඔබට සිහිපත් කරන ඔබ නිවෙසින් රැගෙන ආ ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරන්න. (එම ද්‍රව්‍යවලට ශුද්ධ ලියවිලි, පින්තූර, පොත්, සහ පටිගතකල සංගීත පට ඇතුළත්විය හැකිය.) ඔබට මෙම ද්‍රව්‍ය වැදගත්වන්නේ මන්දැයි පංති සාමාජිකයන්ට කියන්න. මෙම පාඩමේ කොටසක් වන්නේ, පැරණි ඉශ්‍රායෙල්වරුන්ට ස්වාමීන්වහන්සේ සහ උන්වහන්සේ සමග ඔවුන් තැබූ ගිවිසුම් ඔවුන්ටම මතක්කරගැනීම සඳහා පාවිච්චි කල භෞතික ද්‍රව්‍යයන් ගැන බව පැහැදිළි කරන්න. මෙම භෞතික ද්‍රව්‍යයන් අපට මතක්කිරීමේ බලවත් දේවල් විය හැකිබව පෙන්වා දෙන්න.

2. පහත සඳහන් වචන හුණුලැල්ලේ ලියන්න:

   Deceive, beguile, snare, cheat, devour, entice, tempt, lull, rage, blind, lie, flatter, destroy *රැවටීම, මුළාකිරීම, උගුල, වංචාකිරීම, ගිලදැමීම, පෙළඹවීම, පරීක්ෂාකිරීම, නැලවීම, වියරුව, අන්ධබව, බොරුකීම, චාටුබස් කීම, විනාශකිරීම*

- මෙම වචනවල පොදුවේ තිබෙන්නේ කුමක්ද? (එක් පොදු ගුණාංගයක් නම් ඒ සියල්ලෙන්ම විස්තරවන්නේ, අපව ස්වාමීන්වහන්සේ වෙතින් ඉවතට ඇදගැනීමට උත්සාහදැරීමේදී සාතන් යොදන උපක්‍රමය.)

- පංති සාමාජිකයෙකු ලවා ඩීසහඝී 76:28–29 කියවන්න. මෙම පද ජෝසෆ් ස්මිත්ට සහ සිඩ්නි රිග්ඩන්ට ලබාදුන් දර්ශනයකින් බව පහදාදෙන්න. සාතන්ගේ බලපෑම්වලින් ආරක්ෂාවීමට අපට කළ හැකි දේවල් මොනවාද? (සාතන්ගේ පරීක්ෂාවන්ගෙන් අපව ආරක්ෂාකරගැනීමට අපට කළ හැකි සමහර දේවල් පෙන්වාදීමට පහත සඳහන් රූපසටහන පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.)




සාතන්ගේ පරීක්ෂාවන්ට විරුද්ධවීම සඳහා උපකාරවත්වීමට සුදුසු පරිසරයක් නිර්මානයකර අන්දම ගැන ද්වීතීය කථාව පොතේ මෝසස් ඉශ්‍රායෙල්වරුන්ට ඉගැන්වූ බව පහදාදෙන්න. මෙම පාඩමෙන් මෝසස්ගේ උපදෙස් සමාලෝචනය කරමින් වර්තමානයේදී අප ඒවා යොදාගන්නා අන්දම සාකච්ඡාවේ.

---

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකරගැනීම

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට යොදාගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

වසර හතලිහක කාලයක් වනාන්තරය තුළදී ඉශ්‍රායෙල්වරුන් පරීක්ෂාකර, තරවටුකර, සහ ඉගැන්වීමෙන් පසුව, ඔවුන් පොරොන්දු දේශයට ඇතුල්වීමට සූදනම්ව සිටි බව ස්වාමීන්වහන්සේ කීසේක. නමුත් ඊට ප්‍රථම වැදගත් උපදෙස් කිහිපයක් ඔවුන්ට දීමට උන්වහන්සේට තිබුනසේක. මෝසස් දේශනා තුනකින් ප්‍රකාශ කළ මෙම උපදෙස් ද්වීතීය කථාවේ වාර්තා කරඇත.

ඉශ්‍රායෙල්වරුන් වසර 40ක් වනාන්තරය තුල ගමන්කිරීමේදී, ඔවුන්ගේ ගැලවීමට දෙවියන් වහන්සේගෙන් ලැබුන උපකාරය මෝසස් සමාලෝචනය කළේය. දෙවියන්වහන්සේගේ තෝරාගත් ජනතාවක් ලෙස ඉශ්‍රායෙල්වරුන්ගේ වගකීම් ගැනද, මෝසස් සාකච්ඡා කළේය. ඔවුන් දෙවියන්වහන්සේගේ පණත්, විශේෂයෙන්ම උන්වහන්සේ සිහිපත්කරමින්, පිළිම වන්දනාවෙන් වැළකීමේ ආඥාවලටද කීකරුවිය යුතු බවටද ඔහු අවධාරනය කළේය. ඉශ්‍රායෙල් පුත්‍රයන් පොරොන්දු දේශයට ඇතුළුවීමට සූදානම්ව සිටියද, ඔවුන් දුෂ්ටකම්වලට නැවත යොමු වුවහොත්, ඔවුන්ගේ උරුමය ඔවුන්ට නැතිවී, විසිරීයාමට සිදුවිය හැකි බවට මෝසස් අනතුරු ඇඟවීය.

1. **ඊශ්‍රායෙල්වරුන්ට ඔවුන්ගේ ගිවිසුම් සිහිපත්වීමට උපකාරකිරීම සඳහා මෝසෙස් ඔවුන්ට උපදෙස් දෙයි.**

ද්වීතීය කථාව 6:1–9 සහ 11:18–21 උගන්වමින් සාකච්ඡාකරන්න.

- මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට දුන් අවසන් වචන ද්වීතීය කථාවේ ඇතුළත්වේ. ඔබ ඔබගේ පවුලට සහ මිතුරන්ට අවසන් පණිවුඩයක් දෙන්නේ නම්, එය කුමක් විය හැකිද?
- ද්වීතීය කථාවේ 6:5–7 පදවලින් ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට කිරීමට අණකල දේවල් මොනවාද? ශුද්ධ ලියවිලිවල වචන අපි අපගේ හදවත් තුලට ගන්නේ කෙසේද? දෙමාපියන් ඔවුන්ගේ ළමයින්ට සාර්ථකව සුභාරංචිය උගන්වා, ශුද්ධ ලියවිලිවලට ආදරයකිරීම ඉගෙනගැනීමට ඔවුන්ට උපකාර කරන්නේ කෙසේද?

- ද්වීතීය කථාවේ 6:8–9 සහ 11:18–20 පදවලින් මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට කිරීමට උපදෙස් දුන් දේවල් මොනවාද? (නළල් පටි යනු "පටි වර්ගයක්වන අතර ඒ මත ශුද්ධලියවිලි කොටස් හතරක් ලියා ඇත. . .තවද ඒවා රෝල්කර හම් පටියකට අලවා. . . නළලේ හෝ අත වටා පළඳිනු ලබන බව සළකන්න" [Bible Dictionary, "Frontlets," 676]).

- ශුද්ධ ලියවිලි කොටස් ජනතාවගේ ඇස් අතර, ඔවුන්ගේ අත්වල, ඔවුන්ගේ නිවෙස්වල උළුවහුවල සහ ඔවුන්ගේ දොරවල්වලද තබාගැනීමට මෝසෙස් උපදෙස් දීම ගැන ඔබ කුමක් සිතන්නේද? එවැනි නිරන්තර සිහිපත්වීම් අපගේ ක්‍රියාවලට බලපාන්නේ කෙසේද? අපගේ නිවාසවලදී අපට ස්වාමීන්වහන්සේද, උන්වහන්සේගේ වචන සහ උන්වහන්සේ සමග අප තැබූ ගිවිසුම් සිහිපත්වීමට අපට කළ හැකි දේවල් මොනවාද? අපගේ නිවාස බිත්තිවල තිබෙන පින්තූර, අප කියවන පොත්, සහ අප නරඹන චිත්‍රපට සහ රූපවාහිනී දර්ශනවලින් අපට ස්වාමීන්වහන්සේව සිහිපත්කරන්නේද නැතහොත් එමගින් ලෝකයට ආශාවක් අප තුල ඇතිකරන්නේද?

එස්රා ටැෆ්. බෙන්සන් සභාපතිවරයා ප්‍රකාශකල ලෙස, "ක්‍රිස්තුස්වහන්සේ විසින් මග පෙන්වූ ජනතාව ක්‍රිස්තුස්වහන්සේ සමග වාසයකරති. . . . ඔවුන්ගේ නිවාසවලට ඇතුළුවී, ඔවුන්ගේ බිත්තිවල පින්තූරවලින්, ඔවුන්ගේ රාක්කවල පොතවලින්, සුළඟේ පාවෙන සංගීතයෙන්, ඔවුන්ගේ වචනවලින් සහ ක්‍රියාවලින් ඔවුන් ක්‍රිස්තියානුවන් ලෙස එළිදරව්වේ" (in Conference Report, ඔක්තෝ. 1985, 6; හෝ *Ensign,* නොවැ. 1985, 6–7).

**2. දෙවියන්වහන්සේගේ පණත්වලට කීකරුව උන්වහන්සේව මතකතබාගන්නා ලෙස මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට උපදෙස් දෙයි.**

ද්වීතීය කථාව 6:10–12 සහ 8:1–20 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ද්වීතීය කථාවේ 6:10–12 සහ 8:1–20 පදවල එන මෝසෙස්ගේ ප්‍රධාන පණිවුඩය කුමක්ද? ස්වාමීන්වහන්සේ අමතකකිරීම යන්නේ අදහස කුමක්ද? (බලන්න ද්වීතීය කථාව 8:11.) උන්වහන්සේ අමතකකිරීමේ ප්‍රතිඵල මොනවාද? (ද්වීතීය කථාව 8:19.) අපි උන්වහන්සේව අමතක නොකරන බවට අපි ස්ථිරකරගන්නේ කෙසේද?

- ජනතාවට දෙවියන්වහන්සේ අමතකවීමට සැලැස්විය හැකි යයි මෝසෙස් නම් කල තත්වයන් සහ අභියෝග මොනවාද? (බලන්න ද්වීතීය කථාව 6:10–12; 8:10–20.) සමහර මිනිසුන්ට ස්වාමීන්වහන්සේගෙන් විශාල ලෙස ආශිර්වාද ලබා පසුව ඔවුන් උන්වහන්සේව අමතකකරන්නේ මන්ද? (බලන්න ද්වීතීය කථාව 8:17.)

  බ්‍රිගම් යන්ග් සභාපතිවරයා මෙසේ ඉගැන්වීය: "[මෙම සභාවේ සාමාජිකයන් ගැන] මට තිබෙන දරුණුම බිය නම්, ඔවුන් මෙම රටේදී පොහොසතුන්වී, දෙවියන්වහන්සේ අමතක කර, පුෂ්ටිමත්වී, ඔවුන් විසින්ම සභාවෙන් පිටතට වීසිවී ගොස් නිරයට යයි කියාය. ජනතාව කොල්ලකෑම්වලට, සොරකම්වලට, දුගීබවට, සහ සියළු ආකාර හිංසා පීඩාවලට ලක්වී සත්‍යවාදීවීමට සිදුවේ. නමුත් ඔවුන් ගැන මට තිබෙන විශාලතම බිය නම්, ඔවුන්ට වස්තුව දරාගැනීමට බැරිවීම ගැනය. එහෙත් ඔවුන් මෙම පොළොවේ ධනවත්ම ජනතාවක් බවට පත්වන නිසා වස්තුව ගැන ඔවුන් පරීක්ෂාකාරී වියයුතුය" ප්‍රෙස්ටන් නිබ්ලි, *Brigham Young: The Man and His Work* [1936], 128).

- අපට තිබිය හැකි ඕනෑම සමෘද්ධියක් අපට ලබාදෙන මාර්ගය කුමක්ද? (බලන්න ද්වීතීය කථාව 8:18.) අපගේ සමෘද්ධිය අපි තවදුරටත් ස්වාමීන්වහන්සේගේ කටයුතුවලට පාවිච්චිකරන්නේ කෙසේද? (බලන්න ද්වීතීය කථාව 8:18; යාකොබ් 2:19–19.)

**3. ඉශ්‍රායෙල්වරුන් ඔවුන්ගේ ගැලවීමේ පර්වතය (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ) ගැන සිහිතබාගත යුතු බවට මෝසෙස් ඔවුන්ට උපදෙස් දෙයි**

ද්වීත්ය කථාව 32: 1–4, 15–18, 30–40, 45–47 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ද්වීතීය කථාවේ 32:3–4 සඳහන්වන පර්වතය කවරෙක්ද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ; පද 15, 18, සහ 30–31ද බලන්න.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේව සමහර අවස්ථාවලදී පර්වතය යයි හැඳින්වීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (බලන්න හීලමන් 5:12.)

- "ඔවුන්ගේ පර්වතය" (දුෂ්ටයන්ගේ ව්‍යාජ දෙවිවරු) "අපගේ පර්වතය මෙන් නොවන බව" මෝසෙස් ප්‍රකාශ කළේය (ද්විතීය කථාව 32:31). "ඔවුන්ගේ පර්වතය" "අපගේ පර්වතයට" වඩා වෙනස්වන්නේ කෙසේද? (බලන්න ද්විතීය කථාව 32:37–40.)

- පර්වතය මත ගොඩනැගීම යන්නෙහි අදහස කුමක්ද? (බලන්න ද්විතීය කථාව 32:46–47; මතෙව් 7:24–27; හීසහඝී 50:44.) අප මෙය කරන්නේ කෙසේද? (බලන්න ද්විතීය කථාව 18:18–19, එමගින්, ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම ගැන අනාවැකි කීමේදී, උන්වහන්සේගේ වචනවලට ඇහුම්කන්දීමේ අවශ්‍යතාවය ගැන කියයි.)

---

**අවසානය**

ගැලවුම්කරුවාණන් ගැන ඔබගේ සාක්ෂිය දරමින්, ඔබ උන්වහන්සේ සමග තැබූ ගිවිසුම් ගැන ඔබගේ කෘතඥතාවය පළකරන්න. දෙවියන්වහන්සේ සිහිපත්කිරීමේ සහ අපි උන්වහන්සේ සමග තබන ගිවිසුම් ආරක්ෂාකිරීමේ වැදගත්කම ගැන අවධාරනය කරන්න. අප වටා අප තබාගන්නා—පින්තූර, පොත් සහ සංගීතය වැනි දේවල් ස්වාමීන්වහන්සේ සහ උන්වහන්සේ සමග අප තැබූ ගිවිසුම් බලවත් සේ අපට සිහිපත්කරන්නන් විය හැකි බවට සාක්ෂිදරන්න. අප වටා මෙම දේවල් තබාගැනීමේ අරමුණ, පැරණි ඉශ්‍රායෙල්වරුන් නළල්පටි බැඳගැනීමේ අරමුණට සමාන වන අතර, එමගින් අපට පර්වතය මත ගොඩනැගීමට උපකාරවත් වෙමින්—අපට ස්වාමීන්වහන්සේ සිහිපත්වී, උන්වහන්සේව අනුගමනය කිරීමටද උපකාරවත්වන බව පෙන්වා දෙන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනා කළ පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස්වලින් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. "ඒවා නුඹේ ගෙයි උළුවහු පිට ලියාපන්න" (ද්විතීය කථාව 6:9).**

පංති සාමාජිකයන්ගේ ගෙවල්වල තිබෙන චිත්‍ර, පෝස්ටර්, සංගීත පට, සහ වෙනත් ද්‍රව්‍ය ලැයිස්තුගත කිරීමට ඔවුන්ට ආරාධනාකරන්න. එක් එක් ද්‍රව්‍යයට (ඔවුන්ට ස්වාමීන්වහන්සේ සිහිපත්කිරීමට මග පෙන්වන ද්‍රව්‍යයට)"+" සළකුණ යෙදීමටද නැතහොත් (ඔවුන්ට ඔවුන්ගේ හදවත් ස්වාමීන්වහන්සේගෙන් ඉවතට මග පෙන්වන ද්‍රව්‍යයට) "–" සළකුණ යොදා ලේබල් කිරීමටද ඔවුන්ට කියන්න. පවුල් සාමාජිකයන් මෙය ඔවුන්ගේ පවුල් සමග පවුල් නිවාස සැන්දෑව තුලදී කිරීමට යෝජනාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**2. "උන්වහන්සේ නුඹ අත්නොහරිනසේක" (ද්විතීය කථාව 4:31)**

- ඉශ්‍රායෙල්වරුන් අන් දෙවිවරුන්ට නමස්කාර කරමින් විසිරීයන බවට අනාවැකි කීමෙන් පසුව (ද්විතීය කථාව 4:25–28), මෝසෙස් බලාපොරොත්තුවේ වචන ඉදිරිපත් කළේය. ස්වාමීන්වහන්සේව තම මුළු හදින්ම සොයන අයට ඔහු පොරොන්දුවූයේ කුමක්ද? (බලන්න ද්විතීය කථාව 4:29–31; යෙසායා 49:14–16.) මෙම පොරොන්දුව ඔබගේ ජීවිතය තුල ඉෂ්ටවූයේ කෙසේද? ස්වාමීන්වහන්සේව අපගේ මුළු හදවතින් සහ ආත්මයෙන්ම සෙවීමට අපි කල යුතු දේවල් මොනවාද?

**3. අන් අයගේ වැරදි පෙළඹවීම්වලට විරුද්ධවීම**

- ද්විතීය කථාවේ 13:6–8 තුලින් මෝසෙස් අනතුරු ඇඟවූ භයානකකම කුමක්ද? යමෙක් අපව ස්වාමීන්වහන්සේ වෙතින් ඇදීමට තැත්කරන විට අපි එය හඳුනාගන්නේ කෙසේද? එවන් පුද්ගලයෙකුට අප ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද?

**4. "ඔවුහු ස්වාමීන්වහන්සේ ඉදිරියට හිස් අතින් නොපෙනෙන්නෝය" (ද්විතීය කථාව 16:16)**

- ද්විතීය කථාවේ 16:2, 11, සහ 16 පදවල සඳහන් ස්ථානය දේවස්ථානයවේ. එය ඉශ්‍රායෙල්වරුන්ගේ ජංගම දේවමාළිගාව විය. දේවස්ථානය තුළ මංගල්‍යයට සූදානම්වීමේදී, "ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි හිස් අතින් නොපෙනීමට" මෝසෙස් ජනතාවට උපදෙස් දුන්නේය. (ද්විතීය කථාව 16:16). දේවමාලිගාවට යාමේදී මෙය අපට අදාළවිය හැක්කේ කෙසේද? අපි "හිස් අතින්" දේවමාළිගාවට

නොයාම ස්ථිරකර ගැනීමට දේවමාළිගාවට යාමට අප සූදානම්වන්නේ කෙසේද? මෙම සූදානම්වීම, "ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි අපට ප්‍රීතිවීමට" උපකාරවත් වන්නේ කෙසේද? (ද්විතීය කථාව 16:11).

- හොවාඩ් ඩබ්ලිව්. හන්ටර් සභාපතිවරයා මෙසේ උපදෙස් දුන්නේය: "අපි දේවමාළිගා-සහභාගිවන ජනතාවක් වෙමු. පෞද්ගලිකව ඉඩ ප්‍රස්ථා ලැබෙන පරිදි නිතරම මෙන් දේවමාලිගාවට සහභාගිවන්න. දේවමාලිගා පින්තූරයක් ඔබගේ ළමයින්ට පෙනෙන පරිදි නිවසේ තබන්න" (in Conference Report, ඔක්තෝ.. 1994, 8; හෝ *Ensign*, නොවැ. 1994, 8). දේවමාළිගා පින්තූරයක් ඔබගේ නිවසේ තිබීම වැදගත්වන්නේ මන්ද?

**5. "කිසි මනුෂ්‍යයෙක් ඔහුගේ සොහොන් පළ නොදනියි" (ද්විතීය කථාව 34:6)**

ද්විතීය කථාව පොත ලියා අවසන් කල ලේඛකයා දැන සිටියේ මෝසෙස් ගොස් තිබෙන බව පමණකි එනිසා ඔහු මිය ගිය බවත්, ස්වාමීන්වහන්සේ ඔහුව භූමිදාන කරඇති බවත්, එසේම ඔහුගේ සොහොන් පළ කිසිවෙක් නොදන්නා බවත් ඔහු සිතා ඇත. කෙසේවෙතත්, මෝසෙස් පරිවර්තනයවී ඇති බව අපි දනිමු. (පරිවර්තනයවූ පුද්ගලයන් පිළිබඳ පැහැදිළිකිරීමක් සඳහා බලන්න 3 නිෆායි 28:7–9, 37–40.) මෝසෙස්ගේ පරිවර්තනය පිළිබඳව බයිබල් ශබ්දකෝෂය පහත සඳහන් පරිදි පැහැදිළි කරයි:

"පැරණි බොහෝ අනාගතවක්තෘවරුන්ගේ කරුණු අනුව, මෝසෙස්ගේ දේව මෙහෙය ඔහුගේ මැරෙන සුළු ජීවිතයේ සීමාවද අභිභවා විහිදී ඇත. එලිජාද සමග, ඔහු අන්වෙසක් ගත් කන්දට පැමිණ, පූජකවරයේ යතුරු පේත්‍රුස්, යාකොබ් සහ යොහාන් මත දානය කළේය (මතෙව් 17:3–4; මාර්ක් 9:4–9; ලූක් 9:30; ඩීසහගී 63:21; *History of the Church*, 3:387, යේසුස්වහන්සේගේ උත්ථානයට පෙර සිදුවුන මෙම සිද්ධියෙන්, මෝසෙස් පරිවර්තනයවූ පුද්ගලයෙක්වූ බවත්, ද්විතීය කථාවේ 34 හි වාර්තාකර තිබෙන පරිදි මියගියේ නැතිබවත් අපි දනිමු (ඇල්මා 45:19). මළවුන්ගෙන් නැගිටීම ඒ වන විට සිදු නොවී තිබුන බැවින්, අන් වෙසක් ගත් අවස්ථාවේදී ඔහු මස් සහ කටු සහිත ශරීරයක් ලැබීම සඳහා ඔහු පරිවර්තනයවීම අත්‍යාවශ්‍ය දෙයක්ව තිබින. ඔහු ආත්මයක් පමණක්ව සිටියේ නම්, කන්ද මතදී මැරෙන සුළු මිනිසුන්වූ පේත්‍රුස්, යාකොබ් සහ යොහාන්ට යතුරු බාරදීමේ ක්‍රියාව ඉටුකිරීමට ඔහුට නොහැකි වන්නේය (සසඳන්න ඩීසහගී 129)" (Bible Dictionary, "Moses," 735).

# 18 "ශක්තිමත්ව ධෛර්‍යවත්ව සිටපන්න"

වෙනි පාඩම

*යොෂුවා 1–6; 23–24*

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය අනුව ජීවත්වීමේදී ශක්තිමත්ව ධෛර්‍යවත්ව සිටීමට එක් එක් පංති සාමාජිකයා දිරිමත්කිරීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. යොෂුවා 1. ස්වාමීන්වහන්සේ මෝසෙස් වෙනුවට යොෂුවා කැඳවා, ඔහුට ශක්තිමත්ව, ධෛර්‍යය ඇතිව, ශුද්ධ ලියවිලි කියවීමට සහ පණත් ආරක්ෂාකිරීමට අණකරනසේක. ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට පොරොන්දුවී තිබූ දේශය අයිතිකර ගැනීමට යොෂුවා ඔවුන්ව සූදානම්කරයි.

   ආ. යොෂුවා 3–4; 6. ඉශ්‍රායෙල්වරු වියලි පොළොව මතින් යොර්දාන් ගඟ තරණය කර ඔවුන්ගේ එම තරණයකිරීම ස්මරනයකිරීම සඳහා ගල් 12ක් තබති. ඉශ්‍රායෙල්වරුන්ගේ ඇදහිල්ල තුලින් යෙරිකෝව විනාශවෙයි.

   ඇ. යොෂුවා 23; 24:14–31. යොෂුවා සහ ඔහුගේ ජනතාව ස්වාමීන්වහන්සේට සේවයකිරීමට ගිවිසුම් කරති.

2. අමතර කියවීම්: යොෂුවා 7; 14.

3. යෙරිකෝ සටන පිළිබඳ විස්තරය, ඔහු හෝ ඇය ඇසින් දුටුවෙකු ලෙස ප්‍රකාශකිරීමට පංති සාමාජිකයෙකුට කියන්න (යොෂුවා 6). වෙනත් පංති සාමාජිකයන් දෙදෙනෙකුට, දෙවියන් වහන්සේගේ බලය සහ ප්‍රේමය ඔවුන්ට සිහිපත්කෙරෙන අත්දැකීමක් බෙදාගැනීමට සූදානම්වන ලෙස කියන්න.

4. ඔබ අවධානශීලී ක්‍රියාකාරීත්වය පාවිච්චිකරන්නේ නම්, කඩදාසියක්, ටේප් හෝ රබර් පටියක්, සහ පොතක් ලබාගන්න. ඔබ පුඩු, හෝ උගුල් සම්බන්ධ ප්‍රශ්න පාවිච්චිකරන්නේ නම්, සාකච්ඡාවේදී පෙන්වාදීම සඳහා මී කතුරක් වැනි කුඩා පුඩුවක් රැගෙන ඒම ඔබට අවශ්‍යවිය හැකිය.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාඩම ආරම්භකිරීම සඳහා පාවිච්චිකිරීම ඔබට අවශ්‍යවිය හැකිය

මෙම පාඩම ඉශ්‍රායෙල් පුත්‍රයන්ව ඔවුන්ගේ පොරොන්දු දේශය ජයග්‍රහනය කිරීමට මග පෙන්වූ අනාගතවක්තෘවරයා වන යොෂුවා පිළිබඳව බව පහදා දෙන්න. යොෂුවා ආගතවක්තෘවරයෙකු වශයෙන් කැඳවූ විටදී, ඔහුට "ශක්මත්ව, සහ ධෛර්‍යමත්ව සිටීමට" ස්වාමීන්වහන්සේ ඔහුට උපදෙස් දුන්සේක. (යොෂුවා 1:6). මෙම වාක්‍ය කණ්ඩය හුණුලැල්ලේ ලියන්න. කඩදාසිය සහ පොතක් පෙන්වන්න. කඩදාසිය එහි කොනකින් සිටුවා තබා ඒ මත පොත සමබරව තැබීමට පංති සාමාජිකයෙකුට කියන්න.

පංති සාමාජිකයා මෙය කිරීමට උත්සාහ කිරීමෙන් පසුව, පොත දරා සිටීමට තරම් ප්‍රමාණවත් ශක්තියක් කඩදාසියට ලබාදීමට ක්‍රමයක් තිබෙන බව පහදාදෙන්න. කඩදාසිය නළයක් සේ රෝල්කර රබර් පටියෙන් හෝ ටේප් එකෙන් බඳින්න. පැතලි පසුබිමක කෙළවරේ නළය සිටුවා තබන්න. ප්‍රවේශමෙන් යුතුව එය මත පොත තබන්න (පංතියට පෙර මෙය පුහුණුවීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

යොෂුවා ශක්තිමත්වූයේ, ඔහුගේ චරිතය හැඩගැස්වීමට ඔහු ස්වාමීන්වහන්සේට ඉඩදුන් නිසා බව පෙන්වා දෙන්න. ඒ අන්දමින්ම, අපගේ චරිතය හැඩගැස්වීමට අපිද දෙවියන්වහන්සේට ඉඩදෙන්නේ නම්, අප ශක්තිමත්වී, ස්වාමීන්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන දේවල් ඉටුකිරීමට අපට හැකිවන්නේය.

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකරගැනීම**

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාළ කරගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

ඉශ්‍රායෙල්වරුන් වසර 40ක් වනාන්තරය තුළ ගමන්කිරීමේදී, මෝසෙස් දෙවියන්වහන්සේගේ කථිකයා ලෙස ක්‍රියාකිරීමෙන් ඔවුන්ට දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ලබා දී, ඔවුන්ගේ මග පෙන්වන්නා ලෙස සේවයකර තිබුනි. ඉශ්‍රායෙල් මුළු පරම්පරාවම දැන සිටි එකම නායකයාවූයේද ඔහුය. නමුත් ඔවුන්ගේ ගමන අවසානයේ, ඔවුන් විශාල පරීක්ෂාවකට මුහුණදුන් විටදී ස්වාමීන්වහන්සේ ඔහුව ගත්සේක. ඔහු ඉශ්‍රායෙල්වරුන්ට දුන් පොරොන්දු සිහිපත් කරමින්, ස්වාමීන්වහන්සේ යොෂුවා නම්, අළුත් නායකයෙක් ඔසවා තැබූසේක. ඔහු ජයග්‍රහනයට සහ පොරොන්දු දේශයේ වාසස්ථානයට ඔවුන්ව දක්ෂ ලෙස මෙහෙයවීය.

**1. ස්වාමීන්වහන්සේ යොෂුවා කැඳවනසේක.**

යොෂුවා 1 උගන්වමින් සාකච්ඡාකරන්න.

- මෝසෙස්ගේ තැන ගෙන ඉශ්‍රායෙල්වරුන්ට මගපෙන්වීමට ස්වාමීන්වහන්සේ යොෂුවා කැඳවූ විට, ඔබ සිතන අන්දමට ඔහුට මුහුණදීමට සිදුවූ අභියෝග මොනවාද? (ඉශ්‍රායෙල්වරුන්ට සටනෙන් ජය ලබාදී කනාන් දේශයේ වාසයකිරීමට සැලැස්වීම බලවත් ලෙස අවබෝධ කරගැනීමට තිබූදෙයකි. ඔහුට ශ්‍රේෂ්ට නායකයෙකුගේ ස්ථානය ගෙන කටයුතු කිරීමට සිදුවිය.) යොෂුවා පොරොන්දු දේශයට ඇතුළුවීමට සූදානම්වීමේදී, ස්වාමීන්වහන්සේ යොෂුවාට දුන් සහතිකය කුමක්ද? (බලන්න යොෂුවා 1:5.) මෙම සහතිකය අපගේ නව කැඳවීම්වලදී හෝ අභියෝගවලදී අපට උපකාරවත් වන්නේ කෙසේද? එවන් තත්වයන්හිදී ඔබට ස්වාමීන්වහන්සේ උදව්කර ඇත්තේ කෙසේද?
- යොෂුවා 1:6–9 තුලින් ස්වාමීන් වහන්සේ තුන්වතාවක්ම දුන් ආඥාව කුමක්ද? යොෂුවාට කිරීමට ධෛර්‍යය සහ ශක්තිය අවශ්‍ය යයි ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කළේ කුමක්ද? (බලන්න යොෂුවා 1:6. යොෂුවාට හමුදාව සමග බොහෝ සටන්කිරීමට සිදුව තිබුනද, ඔහුට සදාචාර ධෛර්‍යයය—හරි දේ කිරීමේ ධෛර්‍යයද අවශ්‍යව තිබුන බව පෙන්වා දෙන්න.) ශක්තිය සහ සදාචාරාත්මක ධෛර්‍යය අවශ්‍යවන අද අප මුහුණ දෙන අභියෝග මොනවාද?
- "යහපත් සඵලත්වයක් ලැබීමට" යොෂුවා කුමක් කලයුතු දැයි ස්වාමීන්වහන්සේ ඔහුට කීසේක්ද? (බලන්න යොෂුවා 1:8. ව්‍යවස්ථා පොත නම්, ශුද්ධ ලියවිලි බව පහදාදෙන්න.) යොෂුවාගේ කැඳවීම සඵලවීම සඳහා ශුද්ධ ලියවිලි අධ්‍යයනය ඔහුට වැදගත්ව තිබීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? නිතිපතා ශුද්ධ ලියවිලි අධ්‍යයනය අපට උපකාරවත්වන්නේ කෙසේද?

**2. ඉශ්‍රායෙල්වරු වියළි පොළව මත යොර්දාන් ගඟ තරණයකරති; ඔවුන්ගේ ඇදහිල්ල තුලින් යෙරිකෝව විනාශවෙයි.**

යොෂුවා 3–4 සහ 6, උගන්වමින් සාකච්ඡාකරන්න.

- ඉශ්‍රායෙල්වරුන්ට යෝර්දාන් ගඟ තරණයකිරීමට අවශ්‍යවූ අවස්ථාවේදී, එහි ඉවුරු පිටාරගලමින් තිබින. ස්වාමීන්වහන්සේ මෝසෙස් සමග සිටි ලෙසම යොෂුවා සමගද සිටින බව උන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට පෙන්වූවේ කෙසේද? (බලන්න යොෂුවා 3:7–8, 14–17; 4:14. අවශ්‍ය නම්, ගිවිසුම් පෙට්ටිය ජංගම අල්තාරයක් බවත්, එහි මෝසෙස්ගේ ලියවිලි සහ දස පණත ඇතුළත් ගල් ලැලිද ඇතුළු පූජනීය ලියවිලි තිබූ බව පැහැදිළි කරන්න.) ස්වාමීන්වහන්සේ පැරණි අනාගතවක්තෘවරුන් වෙනුවෙන් ක්‍රියාකල ලෙසම, වර්තමාන ජීවමාන අනාගතවක්තෘවරුන්ට මග පෙන්වමින් අදහස් පහළකරන බව උන්වහන්සේ අපට පෙන්වන්නේ කෙසේද?

- ගිවිසුම් පෙට්ටිය උසුලාගෙන ගිය පූජකවරුන් යෝර්දාන ගඟේ ජලය නැවත්වීමට පෙර කළ යුතුව තිබුනේ කුමක්ද? (බලන්න යොෂුවා 3:13–17. පෙට්ටිය ගෙනයන අතර ඔවුන්ගේ පතුල් පිටාර ගලන ජලයේ තැබිය යුතුව තිබිනි.) ස්වාමීන්වහන්සේ එවැනි දේවල් කිරීමට අපටද පවසන්නේ කෙසේද?

  වැඩිමහල් බොයිඩ් කේ. පැකර් මෙසේ කීවේය:

  "මා ප්‍රධාන අධිකාරීවරයෙකු ලෙස කැඳවා ටික දිනකින්, මම උපදෙස් පතා වැඩිමහල් හැරල්ඩ් බී. ලී වෙත ගියෙමි. මගේ ප්‍රශ්නයට ඉතා ප්‍රවේශමෙන් කන්දුන් ඔහු, මට ඩේවිඩ් ඕ. මැකේ සභාපතිවරයා හමුවීමට යෝජනා කළේය. මැකේ සභාපතිවරයා මා යා යුතු මාර්ගය ගැන මට උපදෙස් දුන්නේය. කීකරුවීමට මට බොහෝ කැමැත්තක් තිබුන නමුත්, මට කිරීම සඳහා ඔහු උපදෙස් දුන් ආකාරයට කටයුතු කිරීමේ හැකි මාර්ගයක් මට පෙනෙන්ට නොතිබිනි.

  "වැඩිමහල් ලී වෙත නැවත පැමිණි මම, මට යාමට උපදෙස් මාර්ගයේ ගමන්කිරීමේ ක්‍රමයක් නුදුටු බව ඔහුට කීවෙමි. මා ඇමතු ඔහු, ඔබට තිබෙන ප්‍රශ්නය වන්නේ ආරම්භයේදීම අවසානය දැකීමට ඔබට අවශ්‍යවීමය" යි කීවේය. මා උත්තරදෙමින්, ඉදිරි පියවර එකක් හෝ දෙකක් දැකීමට මම කැමති යයි කීවෙමි. එවිට මගේ ජීවිතයේ වැදගත්ම පාඩම මට ලැබින. 'ඔබ ආලෝකයේ කෙළවරට ඇවිදීමට ඉගෙනගත යුතුය. තවද ඉන්පසුව පියවර කිහිපයක් අඳුරට; ඉන්පසුව ආලෝකය පැමිණ ඔබ ඉදිරියේ තිබෙන මාර්ගය ඔබට පෙන්වනු ඇත" ("The Edge of the Light," *BYU Today*, මාර්තු. 1991, 22–23).

- ඉශ්‍රායෙල්වරු යෝර්දාන් ගඟ තරණයකිරීමෙන් පසුව සිහිවටන ගල් 12ක් තැන්පත් කළේ මන්ද? (බලන්න යොෂුවා 4:1–9). එය ඉදිරි පරම්පරාවන්ට ස්වාමීන්වහන්සේගේ බලය පිළිබඳ සාක්ෂියක්වීමටය. ස්වාමීන්වහන්සේ ඔවුන්ගේ පියවරුන්ට ආශිර්වාද කළාක් මෙන් ඔවුන්ටද ආශිර්වාදකරන බව සිහිපත්කිරීමටය.) දෙවියන්වහන්සේගේ බලය ගැන ඔබගේ ජීවිතය තුල ඔබට සිහිපත්කරන පෞද්ගලික සිහිවටන මොනවාද? (පිළිතුරුවලට, සක්‍රමේන්තුව, ක්‍රිස්තුස්වහන්සේගේ පින්තූර, දේවමාළිගා, සහ අනාගතවක්තෘවරුන්, ශුද්ධ ලියවිලි; සහ දිනපොත්වල වාර්තාකර තිබෙන ආත්මික අත්දැකීම් යනාදිය ඇතුළත්විය හැකිය.) මෙම සිහිවටන අන් අයගේ ජීවිතවලට ආශිර්වාද කරන්නේ කෙසේද? (බලන්න යොෂුවා 4:21–24.)

  ස්වාමීන්වහන්සේ හැම අළුත් පරම්පරාවකම යාච්ඤාවලට සවන්දී, ආශිර්වාද කරමින්, එළිදරව් දෙමින් අසිරිමත් ක්‍රියා සිදුකරනබවට සාක්ෂිදරන්න. දෙවියන්වහන්සේගේ බලය සහ ප්‍රේමය තමන්ට සිහිපත්කරවන අත්දැකීම් බෙදාගැනීමට කලින් පැවරුම් දුන් පංති සාමාජිකයන්ට කියන්න.

- යෙරිකෝවේ වැටීම තම දෙනෙත්වලින් දුටුවාසේ විස්තර කිරීමට කලින් පැවරුම් දුන් පංති සාමාජිකයන්ට කියන්න (යොෂුවා 6). යෙරිකෝවේ පවුරු කඩාවැටීමට හේතුව කුමක්ද? (බලන්න හෙබ්‍රෙව් 11:30.) ඉශ්‍රායෙල්වරුන්ගේ හැසිරීම ඇදහිල්ලේ ක්‍රියාවක් වූයේ මන්ද?

- යෙරිකොවේදී දිවි බේරාගත් එකම පදිංචිකරුවන් වූයේ කවරහුද? (බලන්න යොෂුවා 6:17, 22–25; තවද බලන්න යොෂුවා 2:1–15.) රහාබ් සහ ඇයගේ පවුලේ ගැලවීම තුලින් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද?

**3. යොෂුවා සහ ඔහුගේ ජනතාව ස්වාමීන්වහන්සේට සේවයකිරීමට ගිවිසුම් කරති.**

යොෂුවා 23 සහ 24:14–31 උගන්වමින් සාකච්ඡා කරන්න.

- දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන් වෙනුවෙන් කළ දේවල් යොෂුවා තම ජීවිතයේ අවසානයේදී ඔවුන්ට සිහිපත් කළේය. යොෂුවා ඔවුන්ට තවදුරටත් උගුල්වලින් සහ මළපුඩුවලින් වැළකීසිටීම ගැනද උපදෙස් දුන්නේය. ඔබ කුඩා උගුලක් ගෙනැවිත් තිබේ නම්, එය ක්‍රියාකරන අන්දම පෙන්වාදෙන්න. ඔබ උගුලක් නොගෙනාවේ නම්, එවැන්නක් ක්‍රියාකරන අන්දම ගැන විස්තරකර දෙන්න. උගුලකට අසුවීම වැළැක්වීම සඳහා අප කළ යුතු යම් දේවල් මොනවාද? (අප පළමුවෙන් එය උගුලක් බව හඳුනාගෙන ඉන්පසුව එයින් ඉවත්වී සිටිය යුතුය.)

- තම අවසන් උපදේශයේදී, යොෂුවා ඉශ්‍රායෙල්වරුන්ව "[කනානිවරුන්ගේ] ඉතිරිවී සිටින ජනතාවට ඇලුම්ව සිටීම" වෙනුවට "ස්වාමීන්වහන්සේට ඇලුම්ව සිටීමට" ධෛර්‍යමත් කළේය

(බලන්න යොෂුවා 23:8, 12. අප ලෝකයට ඇලුම්ව සිටීම වෙනුවට "ස්වාමීන්වහන්සේට ඇලුම්ව" සිටින්නේ කෙසේද? කනානිවරුන්ගේ ජනතාවට ඇලුම්ව සිටීම ඉශ්‍රායෙල්වරුන්ට උගුලක් හෝ මළපුඩුවක් වන්නේ කෙසේද? අද අපට ලෝකයේ මුහුණදීමට තිබෙන යම් උගුල් සහ මළපුඩු මොනවාද?

- යොෂුවා ඔහුගේ ජීවිතයේ අවසාන කාලයේදී දුන් වැදගත් උපදෙස් මොනවාද? (බලන්න යොෂුවා 24:14–15.) යොෂුවා සහ ඉශ්‍රායෙල් සේවයකිරීමට ගිවිසුම් කළේ කාටද? (බලන්න යොෂුවා 24:15–18, 21–25, 31.) යම් පුද්ගලයෙකුට සත්‍යවූ දෙවියන්වහන්සේටත්, ලෞකික දෙවිවරුන්ටත් එක විට සේවයකිරීමට නොහැක්කේ මන්ද?

- ස්වාමීන්වහන්සේට සේවයකිරීමට අදම තෝරාගැනීම වැදගත් මන්ද? දෙවියන්වහන්සේට සේවයකිරීම අප තෝරාගත් බව අප පෙන්වන්නේ කෙසේද?

  වැඩිමහල් මර්වින් ජේ. ඇෂ්ටන් මෙසේ කීවේය: "තීරණගැනීම අප්‍රමාදව කිරීමේ වැදගත්කම ගැන යොෂුවා අපට සිහිපත්කරයි. 'නුඹලා සේවයකරන්ට කැමති කාටද කියා අදම තෝරාගනිල්ලා;. . . එහෙත් අපි නම්-මමද, මාගේ පවුලද- ස්වාමීන්වහන්සේට සේවයකරමු' (යොෂුවා 24:15). හෙට නොවේ, අපි සූදානම්වූ පසුවද නොවේ, පහසු වෙලාවකදීද නොවේ—එහෙත් 'අදම' මේ මෙහොතේම, ඔබ සේවයකරන්නේ කාටදැයි තෝරාගන්න. උන්වහන්සේව අනුගමනය කරන ලෙස අපට ආරාධනාකරමින්, උන්වහන්සේගේ ආත්මයාණන් සහ පෙළඹවීම සමග අප ඉදිරියෙන් සිටිමින් අපට මග පෙන්වනසේක. උන්වහන්සේ මාර්ගය සටහන්කර සළකුණු කරමින්, දොරටුව විවෘතකර, මාර්ගය පෙන්වා ඇතිසේක. උන්වහන්සේ වෙතට ඒමට උන්වහන්සේ අපට ආරාධනාකර ඇතිසේක. එසේම උන්වහන්සේගේ මිත්‍රත්වය භුක්තිවිදීමට හැකි හොඳම වේලාව නම්, මේ මොහොතේමය. යේසුස්වහන්සේ කළාක් මෙන් අපට මාර්ගයට හොඳින් අවතීර්ණවී, මාර්ගයේ සිටීමට හැකිය—උන්වහන්සේගේ පියාණන්ගේ කැමැත්ත කිරීමට සම්පූර්ණයෙන්ම කැපවීමක් ඇතිකරගන්න" (in Conference Report, අප්‍රේ.. 1983, 41; හෝ *Ensign*, මැයි 1983, 30–31).

---

අවසානය

ඉශ්‍රායෙල්වරුන්ට දුන් යොෂුවාගේ අවසන් උපදේශයට ඔහුව අනාගතවක්තෘවරයෙකු වශයෙන් කැඳවීමේදී ස්වාමීන්වහන්සේ ඔහුට දුන් එම වගකීම—ශක්තිමත්ව, ධෛර්‍යය ඇතිව සිටීමද ඇතුළත්විය (යොෂුවා 23:1–6). අප සියලු දෙනාම යහපත සහ නපුර අතර වැදගත් ආත්මික සටනක යෙදී සිටින නිසා, එකල මෙන් අදටද එම වගකීම අදාළවේ.

වැඩිමහල් එස්රා ටැෆ්. බෙන්සන් ප්‍රකාශකල පරිදි, එම මූලධර්ම දෙක ආරක්ෂාවට සහ සාමයට අත්‍යාවශ්‍යවේ. "ප්‍රථමයෙන්, දෙවියන්වහන්සේ තුළ විශ්වාසය; දෙවැනිව, පණත් තැබීම, ස්වාමීන්වහන්සේට සේවයකිරීම, හරි දේ කිරීමට අධිෂ්ඨානයකිරීමය. . . .ස්වාමීන්වහන්සේ එළිදරව් තුළින් ඉතා පැහැදිළි ලෙස ප්‍රකාශකර තිබෙන්නේ, කාලය උපද්‍ර සහිත බවට පත්වුවද, අප පරීක්ෂාවන් සහ පාපයෙන් වටවී සිටියද, අනාරක්ෂිත බවේ හැඟීමක් තිබුනද, මිනිසුන්ගේ හදවත් වැරදී ගොස් ඔවුන්ගේ ආත්ම අවුල්වලින් පිරීගියද, අපි දෙවියන්වහන්සේ තුල විශ්වාසය තබා, උන්වහන්සේගේ පණත් ආරක්ෂාකරන්නේ නම්, අපට බියක් ඇතිකරගැනීම අවශ්‍ය නොවේ" (in Conference Report,[4] ඔක්තෝ. 1950, 146).

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනා කල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත්කරයි. මෙම අදහස් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. සාර්ථක නායකයෙකුගේ ස්ථානය ගැනීම**

- යොෂුවා සහ බ්‍රිගම් යන්ග් වැනි, බොහෝ මිනිසුන්ව, ශ්‍රේෂ්ඨ නායකයන්ගේ ස්ථානය ගැනීමට කැඳවා ඇත. ඔවුන්ට කුමන අන්දමේ අභියෝග තිබෙන්ට ඇතිද? ඔවුන්ගේ සාර්ථකත්වයට හේතුව වශයෙන් ඔබ කුමක් සිතන්නේද? සේවා ස්ථානයේදී, සභාවේදී, පාසලේදී හෝ නිවසේදී විශිෂ්ටත්වයට පත් කෙනෙකුගේ ස්ථානයට අප පත්වූ විට එය සාර්ථකව කිරීම සඳහා අපට කළ හැකි දේවල් මොනවාද?

2. පුද්ගලයෙකුගේ පාපවලින් වෙනත් මිනිසුන්ට ඇතිවන ප්‍රතිඵල

- යොෂුවා 7 හි එන ආකාන්ගේ විස්තරය උගන්වන්න. ආකාන්ගේ අකීකරුකම නිසා, හායි ජනතාව විසින් ඉශ්‍රායෙල්වරුන්ව පරාජය කරන ලදී (යොෂුවා 71–5). මෙය සිදුකිරීමට ආකාන් කළේ කුමක්ද? (බලන්න යොෂුවා 7:20–21. ඔහු යෙරිකෝගෙන් ඇඳුම් සහ මුදල් රැගෙන ස්වාමීන්වහන්සේට අකීකරුවී ඉශ්‍රායෙල්මත උන්වහන්සේගේ අප්‍රසාදය පතිත කළේය.)

- අපගේ පෞද්ගලික පාපවලින් අන් අයට ඇතිවන ප්‍රතිඵල පිළිබඳව, ආකාන්ගේ පාපයේ ප්‍රතිඵලවලින් පෙන්වාදෙන්නේ මොනවාද? අප කරන දේවල් අපටම බලපානවා මිස එයින් අන් අයට හානියක් නොවන බවට සිතීමේ ඇති මිථ්‍යාව කුමක්ද? (එක් පුද්ගලයෙකුගේ ක්‍රියාවන් අන් අයට බලපෑමට හැකිවීම පිළිබඳ උදාහරණ ගෙනහැර දැක්වීමට ඔබට අවශ්‍යවිය හැකිය: බීමත් රියදුරෙක් විසින් සිදුකරන අනතුරකින් තුවාල ලබන අහිංසක මිනිසුන්ගේ ජීවිතවලට බලපෑමක් ඇතිවිය හැකිය. ඉරුදින පාසල් පංතිය කඩාකප්පල් කරන පුද්ගලයා, එමගින් අන් අයට සිත එක්තැන්කර ආත්මයාණන් අත්විඳීමට අසීරුතාවයන් ඇතිකරයි. ලිංගික පාප කරන හෝ ප්‍රඥාවේ වචනය කඩකරන පුද්ගලයා අන් අයට සිත් වේදනා හෝ හිරිහැර ඇතිකරයි. නොඇදහිලිමත් බිරිඳට හෝ ස්වාමිපුරුෂයාට, පවුලක් කඩා බිඳදමා අහිංසක පවුල් සාමාජිකයන්ට විශාල වේදනාවක් ගෙන දිය හැකිය. ස්වාමීන්වහන්සේ අනුගමනය නොකරන සභා සමාජිකයන්ට, මුළු සභාවම ස්වාමීන්වහන්සේගෙන් ආශිර්වාද ලැබීමෙන් වළැක්වීමට හැකිය.)

  වැඩිමහල් ජේම්ස් ඊ. ෆවුස්ට් මෙසේ කීවේය: "පෞද්ගලික තේරීම් පෞද්ගලික නොවේ; ඒවා සියල්ලටම ප්‍රසිද්ධ ප්‍රතිඵල ඇත. . . .කෝටි සංඛ්‍යාත පුද්ගලයන් ඔවුන්ගේ පෞද්ගලික ජීවිතවල කරන දේවල මුළු එකතුව අපගේ සමාජය වෙයි. එම පෞද්ගලික චර්යාවේ මුළු එකතුවට අති විශාල ප්‍රසිද්ධ ආකර්ශනයක් ඇත. සම්පූර්ණයෙන්ම පෞද්ගලිකවූ තේරීම් කිසිවක් නැත" (in Conference Report, අප්‍රේ. 1987, 101; හෝ *Ensign,* මැයි 1987, 80).

3. කාලෙබ්ට හේබ්‍රොන් දේශය ලැබේ

- කාලෙබ්ට යොෂුවාගෙන් හේබ්‍රොන් දේශය ලැබුන අන්දම ගැන යොෂුවා 14 පරිච්ඡේදයෙන් නැවත කියයි (බලන්න යොෂුවා 14:6–14. මෙහි එන "සම්පූර්ණයෙන්ම ස්වාමීන්වහන්සේ අනුව ගියෙමි" යන වාක්‍ය කණ්ඩය 8, 9, සහ 14 යන පදවල නැවත කියවෙන බව සලකන්න.)

  කාලෙබ්ට ඔහු කල ප්‍රශංසාවෙන් අපට පාඩම් කිහිපයක් ඔහුගෙන් ඉගෙන ගැනීමට හැකි බව ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාපතිවරයා සඳහන් කළේය.:

  "කාලෙබ්ගේ ආදර්ශයෙන් අපට ඉතා වැදගත් පාඩම් ඉගෙනගත හැකිය. කාලෙබ්ට තම උරුමය ලබාගැනීමට පරිශ්‍රම දරමින් සත්‍යවාදීව සහ ඇදහිලිමත්ව සිටීමට සිදුවිය. එබැවින් අපි එය මතකතබා ගත යුතු වෙමු. ස්වාමීන්වහන්සේ අපට උන්වහන්සේගේ රාජධානියේ යම් ස්ථානයක් පොරොන්දුවී ඇති බැවින්, එම ත්‍යාගයට සුදුසුවීම සඳහා අපි නිරන්තරයෙන්ම පරිශ්‍රම දරමින් සදා ඇදහිලිමත් විය යුතුවෙමු.

  "කාලෙබ් ඉල්ලීමක් සහ අභියෝගයක් සමගින් නැවත නැවත කල එම අවසාන ප්‍රකාශයට මා තුල සම්පූර්ණ එකඟතාවයක් ඇත. අනාක්වරුන්ද, යෝධයන්ද තවමත් පොරොන්දු දේශයේ සිටින අතර ඔවුන්ව ජයගැනීමටද සිදුව තිබින. දැන් 85 වන වියේ සිටින කාලෙබ්, මෙසේ කීවේය, 'මේ කන්ද මට දුන මැනව' (යොෂුවා 14:12).

  "මෙම අවස්ථාවේ කටයුතු ගැන මගේ හැඟීම එයයි. විශාල අබියෝග අප ඉදිරියේ ඇත. යෝධ ප්‍රස්ථාවන්ට මුහුණදීමට තිබේ. මා එම පවත්නා සමෘද්ධියට සුභපතන අතර, නිහතමානීව ස්වාමීන්වහන්සේට මෙසේ කීමට සිතමි, 'මෙම කන්ද මට දුන මැනව,' මෙම අභියෝග මට දුන මැනව" (in Conference Report, ඔක්තෝ. 1979, 115; හෝ *Ensign,* නොවැ. 1979, 79).

4. "නුඹලා සේවයකරන්නේ කාටදැයි අදම තෝරාගන්න්ලා"

*පරණ ගිවිසුම වීඩියෝ ඉදිරිපත්කිරීම* (53224) තිබේ නම්, "නුඹලා සේවයකරන්නේ කාටදැයි අදම තෝරාගන්න්ලා," යන කුසගින්න සහ පිපාසය ඇති අවස්ථාවක කප්පාදු නොකළ අරාබි අශ්වයෙකුගේ කීකරුකම පරීක්ෂාකරන මිනිත්තු හයක කොටස පෙන්වීම ඔබට අවශ්‍යවිය හැකිය.

# විනිශ්චයකරුවන්ගේ රාජ්‍ය පාලනය

## 19
වෙනි පාඩම

*විනිශ්චයකාරයා 2; 6–7; 13–16*

**අරමුණ**

අභියෝගාත්මක ලෝකයක සුභාරංචිය අනුව ජීවත්වීමට ඔවුන්ව ශක්තිමත්කරන පෙළඹවීම් සෙවීමට පංති සාමාජිකයන් දිරිගැන්වීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න:

   අ. විනිශ්චයකාරයන්ගේ පොත 2:6–23. ඇදහිල්ලෙන් වැටීමේ ක්‍රියාවලිය ආරම්භවන්නේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ නැගී එන පරම්පරාව ඔවුන් වටා සිටි ජනතාවගේ දෙවිවරුන්ට සේවයකිරීම සඳහා ස්වාමීන්වහන්සේ අමතක කළවිටදීය.

   ආ. විනිශ්චයකාරයන්ගේ පොත 4:1–16. ඉශ්‍රායෙල්වරුන්ව කනානිවරුන්ගේ රජු වන යාබින්ගෙන් නිදහස්කිරීමට බාරාක්ට අණකරනු ලබයි (4:1–7). දෙබෝරා ඔහුත් සමග යන්නේ නම්, යාමට ඔහු එකඟවිය (4:8–9). දෙබෝරා සහ බාරාක් ඉශ්‍රායෙල්වරුන්ව කනානිවරුන්ගෙන් ගළවාගනිති (4:10–16).

   ඇ. විනිශ්චයකාරයන්ගේ පොත 6–7. ඉශ්‍රායෙල්වරුන්ව මිදියන්වරුන්ගෙන් ගළවාගැනීමට ගිඩියොන්ට අණකරනු ලබයි (6:1–24). ඔහු සහ තවත් 10 දෙනෙක් රාත්‍රී කාලයේදී බාල්ගේ අල්තාරය විනාශකරති (6:25–35). ස්වාමීන්වහන්සේ ගිඩියොන්ට සළකුණු දෙකක් ලබාදී ඔහුට උපකාරකරන බවට සහතික වනසේක (6:36–40). ගිඩියොන් සහ තවත් මිනිසුන් 300 දෙදෙනක් ඉශ්‍රායෙල්වරුන්ව මිදියන්වරුන්ගෙන් ගලවාගනිති (7:1–25).

   ඈ. විනිශ්චයකාරයන්ගේ පොත 13–16. ඔහුව නාශරියෙකු ලෙස හදාවඩා ගැනීමට දේවදූතයෙක් සම්සොන්ගේ දෙමාපියන්ට උපදෙස් දෙයි (13:1–25). සම්සොන් බලවත් ශක්තිමත් ක්‍රියා සිදුකළ නමුත් ඔහුගේ නාශරත් පොරොන්දු බොහොමයක් කඩාදමයි (14–15). සම්සොන් දෙලීලාගේ පෙළඹවීමට යටත්වී ඔහුගේ කොණ්ඩය කපන ලදුව දුර්වලයෙකු බවට පත්ව පිලිස්තිවරු විසින් අල්ලාගනු ලබති. තවද ඔවුන්ගේ දේවමාළිගාව ඇද දැමීමේදී මරණයට පත්වෙයි (16:1–31).

2. මෙ පාඩමේ එන ශුද්ධ ලියවිලි කොටස් එකක් හෝ කිහිපයක් සංක්ෂේප කිරීමට සූදානම්වන ලෙස පංති සාමාජිකයන්ගෙන් ඉල්ලීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**


අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිතුමා කුඩා ගසක් තම මිදුලේ සිටවූ නමුත් එය ඍජුව වැඩීමට අවශ්‍යවන ආධාරක කණුවක් සිටුවීම නොසළකා හැරිය අවස්ථාවක් ගැන කීවේය. කල් යාමේදී සුළං හැමීමෙන් ගස දරුණු ලෙස පැත්තකට ඇලවිය. තමා ගස කණුවකට බැඳ තැබුවේ නම්, එය ගසට ආධාරකයක් වී, ගස ශක්තිමත්ව සුළඟ දරාගැනීමට ගසට හැකියාව ලැබෙන බව හින්ක්ලි සභාපතිතුමාට අවබෝධවිය (In Conference Report, ඔක්තෝ. 1993, 77–78; හෝ *Ensign,* නොවැ. 1993, 59.)

සමහර අවස්ථාවලදී අපටද එම කුඩා ගස මෙන්, අපගේම ශක්තියෙන් සුළඟට (සාතන්ගේ පරීක්ෂාවනට) විරුද්ධවීමට නොහැකිවන බව පහදාදෙන්න. විනිශ්චයකාරයන්ගේ පොතෙන් අපට

ආධාර කල හැකි කණු කිහිපයක් ගැන අපි ඉගෙනගනිමු. කුඩා ගසක් ආධාරක කණු හතරකට බැඳ තිබෙන බව හුණුලෑල්ලේ අඳින්න.. පාඩමේ එන ශුද්ධ ලියවිලි වාර්තා ඔබ කියවන විට, එක් එක් කණුවේ පහත සඳහන් පරිදි ලේබලයක් අලවන්නඃ




---

**ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකර ගැනීම**

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාළකරගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

යොෂුවා විසින් මග පෙන්වනු ලැබ, ඉශ්‍රායෙල්වරු පොරොන්දු දේශයෙන් බොහොමයක්ම ජයගත්හ. යොෂුවා මියයාමෙන් පසුව, අනාගතවක්තෘ සාමුවෙල් සහ සාවුල් රජතුමාගේ කාලය දක්වාම ඉශ්‍රායෙල්වරුන් එක් නායකයෙක් යටතේ වත් එක්සත් නොවූහ. මෙම කාලය තුළදී ඊශ්‍රායෙල්වරුන්ගේ පාලකයන් සහ හමුදා නායකයන් ලෙස විනිශ්චයකරුවන් 12 දෙනෙක් සේවය කළහ. ඉශ්‍රායෙල්වරුන් ඇදහිල්ලෙන් වැටීම්, වහල්බාවයට පත්වීම්, පසුතැවිලිවීම් සහ කිහිප වරක්ම ගලවාගැනීම්වලට භාජනවීමෙන් ඔවුන්ගේ බොහෝ රාජ්‍ය පාලනයන් දුක්මසුවිය.

මෙම ඉතිහාසයේ වන්දිගෙවීමේ දුක්මුසුම කොටස් වන්නේ, සත්‍යවාදීව සිටිමින්, ඇදහිල්ලෙන් වැටුන ලෝකයක ඇදහිල්ල සහ ධෛර්‍යය ක්‍රියාත්මක කරන අන්දම ගැන බලවත් ආදර්ශයන්වූ මිනිසුන්ගේ කථාන්තරය. දෙබෝරා සහ ගිඩියොන් යන දෙදෙනාම ඉශ්‍රායෙල්වරුන්ව ගලවාගැනීම සඳහා ස්වාමීන්වහන්සේ නැගිටෙව් ධර්මිෂ්ට විනිශ්චයකරුවන්ය. දෙබෝරාගේ ඇදහිල්ල කනානිවරුන්ගේ හමුදාවෙන් ඉශ්‍රායෙල්වරුන්ව ගලවාගැනීමේදී විශාල ලෙස පිහිටවිය. ගිඩියොන් ස්වාමීන්වහන්සේ තුල තැබූ විශ්වාසය නිසා මිදියන්වරුන්ව පරාජයකිරීමට ඔහුගේ මිනිසුන් 300 දෙනාගේ හමුදාවට ස්වාමීන්වහන්සේ ඉඩදුන්සේක.


**1. ධර්මිෂ්ඨ දෙමාපියන්ගේ ශක්තිය සහ ඔවුන්ගේ මාවත් අමතක කිරීමේ ප්‍රතිඵල**

විනිශ්චයකාරයන්ගේ පොත 2:6–23 උගන්වමින් සාකච්ඡාකරන්න.

- විනිශ්චයකාරයන්ගේ පොතේ, ඉශ්‍රායෙල් පුත්‍රයෝ ධර්මිෂ්ඨ සහ ඇදහිල්ලෙන් වැටීමේ කාලසීමා කිහිපයක්ම අත්වින්දෝය. (බලන්න "විනිශ්චයකාරයන්ගේ ඇදහිල්ලෙන් වැටීමේ කාලසීමා" සටහන පිටුව 89). ඉශ්‍රායෙල්වරුන්ගේ නැගී එන පරම්පරාව ඇදහිල්ලෙන් වැටීමේ කාල සීමාව ආරම්භ කළේ කෙසේද? (විශේෂයෙන්ම බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 2:10, 12, 17, 20, සහ 22. මෙම පදවල ප්‍රධාන වචන සලකුණු කිරීමට පංති සාමාජිකයන්ට කියන්න. ඉශ්‍රායෙල් පුත්‍රයන් දෙවියන්වහන්සේ අත්හැර, ඔවුන්ගේ මාර්ග සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ ගිවිසුම් අත්හැර දැමූ බව පෙන්වාදෙන්න.)

  අපගේ දෙමාපියන්ගේ ධර්මිෂ්ඨ ඉගැන්වීම් සහ මාර්ග අමතකකරන්නේ මන්ද? තම ළමයින්ට ඇදහිලිවන්තවීමට දෙමාපියන්ට ඉගැන්විය හැක්කේ කෙසේද? ඔබගේ දෙමාපියන් හෝ අනෙකුත් පවුල් සාමාජිකයන් ධර්මිෂ්ඨව ජීවත්වීමට ඔබව ශක්තිමත් කලේ කෙසේද?

- ඇදහිල්ලෙන් වැටීමක සළකුණු අපි කලින්ම හඳුනාගන්නේ කෙසේද? ඇදහිල්ලෙන් වැටීමේ කාලසීමාවක් පුද්ගලයෙකුට කඩාදැමිය හැක්කේ කෙසේද? පවුල් සාමාජිකයෙක් හෝ මිතුරෙකු සත්‍යයෙන් ඉවතට වැටෙන බව පෙනෙන විට සුදුසු ලෙස ඔහුට උපකාරකිරීමට අපට හැකිවන්නේ කෙසේද?




2. දෙබෝරා—ධර්මිෂ්ඨ මිතුරෙකුගේ ශක්තියයි

විනිශ්චයකාරයන්ගේ පොතේ 4:1–16 හි දැක්වෙන දෙබෝරා සහ බාරක්ගේ කථාව කෙටියෙන් කියන්න, නැතහොත් පත්කල පංති සාමාජිකයාට එසේ කිරීමට කියන්න.

- ස්වාමීන්වහන්සේ බාරක්ට කිරීමට කුමක් අණ කළසේක්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 4:6–7.) මෙම පැවරුම ගැන බාරක්ට ඇතිවූ හැඟීම් මොනවාද? සිසෙරා සහ ඔහුගේ 900ක රථ හමුදාවට විරුද්ධ සටනට යාමට බාරක් කැමතිවූයේ කුමන කොන්දේසි මතද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 4:8.) දෙබෝරා තමන් සමග එන්නේ නම් සිසේරාට මුහුණදීම සඳහා බාරක් කැමතිවීම ගැන ඔබ සිතන්නේ කුමක්ද?

- දෙබෝරා ගැන ඔබගේ හැඟීම් මොනවාද? ඇය තුළ තිබූ බාරාක්ට නොතිබුන ගුණාංග මොනවාද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 4:4–9, 14.)

- සැබෑ මිතුරෙකුවී සිටීම ගැන දෙබෝරාගෙන් අපට ඉගෙනගැනීමට හැක්කේ මොනවාද? (අපට ඉගෙනගත හැකි එක් දෙයක් නම්, සැබෑ මිතුරන් ස්වාමීන්වහන්සේට කීකරුවීමට අපව පොළඹවමින් හරි දේ කිරීමට අපට ශක්තිය ලබාදෙන බවය.) අසීරු අභියෝගයන්ට මුහුණදීමට හෝ ස්වාමීන්වහන්සේගේ පණත්වලට කීකරුවීමට ඔබගේ මිතුරන් ඔබට උපකාරකර ඇත්තේ කෙසේද? අප අන් අයට හොඳ මිතුරන් වන්නේ කෙසේද?

  පංති සාමාජිකයන්ට තම මිතුරන්ගේ නම් ලියා තමන්ගෙන්ම මෙසේ ඇසීමට යෝජනා කරන්න (1) ඔවුන්ගේ මෙම මිතුරන්ට ඔවුන් දෙබෝරා වාගේද (2) මෙම මිතුරන් දෙබෝරා වාගේද.

3. ගිඩියොන්—දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ලේ ශක්තියයි

විනිශ්චයකාරයන්ගේ පොතේ 6–7 හි එන කථාව කෙටියෙන් කියන්න, නැතහොත් පැවරුම් දුන් පංති සාමාජිකයා ලවා එසේ කරවන්න.

- ස්වාමීන්වහන්සේ ගිඩියොන්ට කිරීමට කුමක් අණ කළසේක්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 6:14.) ගිඩියොන්ගේ ප්‍රථම ප්‍රතිචාරයවූයේ කුමක්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 6:15.)

- ගිඩියොන්ට ඉශ්‍රායෙල්වරුන්ව ගලවාගැනීමට ස්වාමීන්වහන්සේ අණකර ඇති බවත්, උන්වහන්සේ ඔහු සමග සිටිමින් ඔහුට උපකාරකරන බවත් උන්වහන්සේ ගිඩියොන්ට සහතික කළේ කෙසේද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 6:16–23, 36–40; 7:9–15.)

- ඉශ්‍රායෙල්වරුන්ව ගලවාගැනීමට ස්වාමීන්වහන්සේ තමන්ට සැබැවින්ම අණ කර ඇති බව ගිඩියොන් විශ්වාසකල විට, ඔහු ඇදහිල්ලෙන් යුතුව ඉදිරියට ගියේය. මිදියොන්වරුන් හා සටන්කිරීම සඳහා ගිඩියොන්ගේ 32,000ක හමුදාව මිනිසුන් 300 දක්වා අඩුකිරීමට ස්වාමීන්වහන්සේට අවශ්‍යවුනේ මන්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 7:2. ස්වාමීන්වහන්සේට අවශ්‍යවූයේ ඉශ්‍රායෙල්වරුන් උන්වහන්සේව විශ්වාස කර උන්වහන්සේගේ බලය මිස ඔවුන්ගේ බලය හඳුනාගැනීම නොවේ.) ස්වාමීන්වහන්සේව විශ්වාසකර, උන්වහන්සේගේ බලය හඳුනාගැනීම වර්තමානයේදී උන්වහන්සේ අපට උගන්වන්නේ කෙසේද?
- ගිඩියොන් සහ ඔහුගේ මිනිසුන් 300 දෙනා මිදියොන්වරුන්ට මුහුණදුන් විට සිදුවූයේ කුමක්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 7:16–23.) ගිඩියොන් තම මිනිසුන්ට "ස්වාමීන්වහන්සේගේද ගිඩියොන්ගේද කඩුව" යයි මොරගැසීමට සැලැස්වීම ගැන ඔබ සිතන්නේ කමක්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 7:20. ස්වාමීන්වහන්සේ ඔවුන් සමග සිටින බව—ගිඩියොන් දැනසිටි අතර—ඔහුගේ මිනිසුන්ද දැනසිටීම ඔහුට අවශ්‍යවිය.)
- අපට ගිඩියොන්ගෙන් ඉගෙනගත හැක්කේ කුමක්ද? ඔබට යම් අසීරු දෙයක් කිරීමට ස්වාමීන් වහන්සේ පවසා උන්වහන්සේ ඔබට උපකාරකර ඇත්තේ කෙසේද? (පංති සාමාජිකයන්ට ඔවුන්ගේ අත්දැකීම් බෙදාගැනීමට කියා, ස්වාමීන්වහන්සේ අපට යමක් කිරීමට අණ කළ විට, එය ඉටුකරගැනීමට උන්වහන්සේ අපට උපකාරකරන බවට සාක්ෂිදරන්න.)

### 4. සම්සොන්—ගිවිසුම්වල ශක්තිය සහ ඒවා කඩනවිට එහි ප්‍රතිඵලයයි

විනිශ්චයකාරයන්ගේ පොතේ 13–16 එන සම්සොන්ගේ කථාව කෙටියෙන් කියවන්න, නැතහොත් පැවරුම් දුන් පංති සාමාජිකයාට එසේ කිරීමට කියන්න.

- සම්සොන්ගේ මව, වඳ ස්ත්‍රියක්ව සිටියදී, ඇයට පුතෙකු ලැබෙන බව දැනගත්තේ කෙසේද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 13:2–3.) සම්සොන්ගේ මවට ලැබෙන පුත්‍රයා ගැන දේවදූතයා ඇයට කීවේ කුමක්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 13:4–5.) නාසරීයවරු ලෝකයේ දේවලින් තමන්ම වෙන්වී ස්වාමීන්වහන්සේට කැපවන බවට උන්වහන්සේ සමග ගිවිසුමක් කල බව පහදාදෙන්න. නාසරීයන්ගේ භාරය ගණන්කථාවේ 6:2–6, 8 හි දක්වා ඇත.)
- පිලිස්තිවරුන්ගෙන් ඉශ්‍රායෙල්වරුන්ව ගලවාගැනීමේ සම්සොන්ගේ දූතමෙහෙය ඉටුකරගැනීම සඳහා ස්වාමීන්වහන්සේ ඔහුට දුන් ආශිර්වාද මොනවාද? බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 13:24–25; 14:5–6, 19; 15:14–15. ස්වාමීන්වහන්සේ ඔහුට ආත්මික සහ ශාරීරික ශක්තිය දුන්සේක.)
- නාශරියෙකු සහ ඉශ්‍රායෙල් ගෘහයේ සාමාජිකයෙකු ලෙස, සම්සොන් ස්වාමීන්වහන්සේ සමග ගිවිසුම් කළේය. කෙසේ වුවද, ඔහු ඉක්මණින්ම තම නසාරීයන් භාරය සහ ඉශ්‍රායෙල් ගෘහයේ සාමාජිකයෙකු ලෙස ඔහුගේ ගිවිසුම්ද කඩ කළේය. ඔහු කඩ කළ භාර සහ ගිවිසුම් මොනවාද? (සම්සොන් කඩ කළ ගිවිසුම් කිහිපයක් පහත ලැයිස්තු ගතකර ඇත.)

  අ. ඔහු ඉශ්‍රායෙල් ගෘහයේ ගිවිසුමින් පිටත විවාහයක්කර ගත්තේය (විනිශ්චයකාරයන්ගේ පොත 14:1–3).

  ආ. ඔහු වෙශ්‍යාවක් සමග දුශ්චරිතයෙහි යෙදුනේය (විනිශ්චයකාරයන්ගේ පොත 16:1).

  ඇ. ඔහු තමාගේ හිස කෙස් කපාගත්තේය (විනිශ්චයකාරයන්ගේ පොත 16:4–20).

- සම්සොන් ඔහුගේ ගිවිසුම් කඩකිරීමෙන් ඇතිවූ ප්‍රතිඵල මොනවාද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 16:17–21. ඔහු තම ආත්මික සහ ශාරීරික ශක්තිය නැතිකර ගත් අතර, පිලිස්තිවරු ඔහු අන්ධකර ඔහුව බැඳ දැමූහ. අවශ්‍ය නම්, සම්සොන්ගේ හිස කෙස් ඔහුගේ ශාරීරික ශක්තියේ මාර්ගය නොවූ බව පැහැදිළි කරන්න. ඒ වෙනුවට ඔහුගේ හිස කෙස් ස්වාමීන්වහන්සේ සමග ඔහුගේ ගිවිසුමේ සළකුණක්ය. එසේ ඔහුගේ හිසකෙස් කැපූ විට, ස්වාමීන්වහන්සේ ඔහුගේ ශරීර ශක්තිය ඉවත්කර ගත්තේ ගිවිසුම කඩවූ නිසාය.) අපි අපගේ ගිවිසුම් කඩකරන විට සිදුවන්නේ කුමක්ද? ස්වාමීන්වහන්සේ සමග තිබෙන අපගේ ගිවිසුම් ගැන අපට තිබෙන සළකුණු මොනවාද?
- අපි ස්වාමීන්වහන්සේ සමග තබන ගිවිසුම් ශක්තියේද, මග පෙන්වීමේ සහ කැපවීමේ උල්පත් විය යුතුය. අප ස්වාමීන්වහන්සේ සමග තබන ගිවිසුම් මොනවාද? මෙම ගිවිසුම් මගින් ඔබ

ශක්තිමත්ව ඇත්තේ කෙසේද? (ගිවිසුම් අපව ශක්තිමත්කරන එක් ක්‍රමයක් වන්නේ, අපව රැවටීමට හෝ වහලෙක් කිරීමට සාතන්ගේ උත්සාහයන්ට විරුද්ධවීමට අපට උපකාරකිරීමය.)

- සම්සොන්ට විශාල හැකියාවන් තිබින. ඔහුගේ උපත ගැන නිවේදනය කල දේවදූතයා පැවසුවේ, ඔහු ඉශ්‍රායෙල්වරුන්ව පිලිස්තිවරුන්ගෙන් ගලවාගැනීම ආරම්භකරන බවය. ස්වාමීන්වහන්සේ ඔහුට විශාල ශරීර ශක්තියක්ද ඇතුළුව, බොහෝ දීමනාවලින් ආශිර්වාද කළසේක. ඔහුගේ විනාශයට හේතුවූ අභ්‍යන්තර දුර්වලකම කුමක්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 15:7; 16:1; ඩීසහසී 3:4. පිළිතුරුවලට, සැප ජීවිතයේ ඇල්ම, දුශ්චරිතය, පළිගැනීමට සෙවීම, සහ ගිවිසුම් කඩකිරීම ඇතුළත්විය හැකිය.) අපගේ හැකියාවන් ඉටකරගැනීමට බාධා පමුණුවන දුර්වලකම් අපට ජයගත හැක්කේ කෙසේද?

---

අවසානය

ඉශ්‍රායෙල්වරුන් කනානිවරුන්ට විරුද්ධව කල ශාරීරික සටන්වලින් බොහොමයක් ජයගත් බව යොෂුවා පොතේ සඳහන්වන බව පහදාදෙන්න. කෙසේ වුවද, විනිශ්චයකාරයන්ගේ පොතේ එන පරිදි, ඉශ්‍රායෙල්වරුන් ආත්මික සටන්වලින් පරාජය වීමට පටන්ගෙන, කනානිවරුන්ගේ ලෞකික පුරුදුවලට සහ ව්‍යාජ දෙවිවරුන්ගේ බලපෑම්වලට යටවීමට තමන්ටම ඉඩදුන්හ. අපද එවැනිම ආත්මික සටන්වලට මුහුණ දෙන්නෙමු. අපට මෙම සටන්වලින් සාර්ථකවීමට (1) ධාර්මික දෙමාපියන්ගේ සහ මුතුන් මිත්තන්ගේ ගමන් මග අනුගමණය කිරීම, (2) යහපත් මිතුරන් ඇතිකර ගැනීම, (3) ස්වාමීන්වහන්සේ තුල අපගේ ඇදහිල්ල වැඩිකර ගැනීම, සහ (4) අපගේ ගිවිසුම් ආරක්ෂාකිරීම. මගින් හැකි බවට සාක්ෂි දරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. පාඩමේ කොටසක් ලෙස මෙම අදහස්වලින් එකක් හෝ කිහිපයක් පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. තම දරුවන්ගේ ලෞකික ආශාවන්ට දෙමාපියන්ගේ දායකත්වය (විනිශ්චයකාරයන්ගේ පොත 1:28)**

- ඉශ්‍රායෙල්වරුන්ගේ නැගී එන පරම්පරාව ඇදහිලිමත්ව සිටීමට අසමත්වීම වනාහි සම්පූර්ණයෙන්ම ඔවුන්ගේම වරදක් නොවේ. විනිශ්චයකාරයන්ගේ පොතේ 1:21, 27–33, සහ 2:1–4 ට අනුව, පුත්‍රයන්ගේ අසමත්වීමට පදනම වැටුනේ කෙසේද? (එයට පදනම එලනු ලැබුවේ කනානිවරුන්ව එළවා දැමීමට දෙමාපියන්ගේ අසමත්වීම මගින්ය. තමන් වටා ඇති ලෝකයේ බලපෑම්වලට විරුද්ධවීමට දෙමාපියන්ට ප්‍රමාණවත් ශක්තිය තිබුනද, ඔවුන්ගේ ළමයින් එසේ නොවුනි.)
- වර්තමානයේ සමහර දෙමාපියන් ඔවුන්ගේ දරුවන්ව ලෝකයේ බලපෑම්වලට විවෘතව තබමින් ඉශ්‍රායෙල්වරුන්ගේ නැගී ආ ජනතාවගේ දෙමාපියන් කල එම වරදම කරන්නේ කෙසේද? (නියමිත පිළිතුරු වලට ධෛර්‍යය දෙන්න.)

**2. අපගේ කාලයේ ආශ්චර්‍යයන්**

- ගිඩියොන් වැනි සමහර අය, ඔවුන්ගේ කාලයට වඩා බොහෝ ආශ්චර්‍යයන් මුල් පරම්පරාවලදී ස්වාමීන්වහන්සේ සිදුකල බව සිතන්නේ මන්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 6:13.) ආශ්චර්‍යයන් සිදුකිරීම ගැන අපගේ කාර්‍යභාරය කුමක්ද? (බලන්න මොරෝනි 7:35–38.) දෙවියන්වහන්සේ වර්තමානයේදීද නොකඩවාම ආශ්චර්‍යයන් සිදුකරන බව ඔබ දන්නේ කෙසේද? අපගේ ජීවිතවල සිදුවෙන කුඩා ආශ්චර්‍යයන් අප හොඳින් හඳුනාගන්නේ කෙසේද?

**3. "ඉශ්‍රායෙල් මට විරුද්ධව ඔවුන්වම අහංකාරවීමට ඉඩ නොතබන්න" (විනිශ්චයකාරයන්ගේ පොත 7:2)**

- මිදියොන්වරුන්ට මුහුණදීමට පෙර ගිඩියොන්ගේ සේනාවෙන් වැඩි පිරිසක් ගෙදර යැවීමට ස්වාමීන්වහන්සේ ඔහුට අණ කළේ මන්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 7:2.) අපගෙන් සමහරුන් වර්තමානයේදී [අප] වම අහංකාර කරගන්නේ කෙසේද? (අපගේ ආශිර්වාද සහ ශක්තිය ස්වාමීන්වහන්සේගෙන් පැමිණෙන බව හඳුනාගැනීම වෙනුවට, අප සතු සියල්ලම අපගේම උත්සාහයන් තුළින් උපයාගත් දේවල් බවට අපගෙන් සමහරු අයිතිවාසිකම් කියති.) අපි මෙම ප්‍රශ්නය ජයගන්නේ කෙසේද?

## 4. පරීක්ෂාවන්ට විරුද්ධවීම

- දෙලීලා තුන් වතාවක්ම තමාව පාවාදීමට උත්සාහකල බව සම්සොන් දැනගැනීමෙන් පසුවද, ඔහු තම ශක්තියේ රහස ඇයට කීවේ මන්ද? (බලන්න විනිශ්චයකාරයන්ගේ පොත 16:15–17.) දෙලීලාට සම්සොන් දැක්වූ ප්‍රතිචාර, පෝතිපර්ගේ භාර්යාවට යොසෙප් දැක්වූ ප්‍රතිචාර සමග සංසන්දනය කරන්න (උත්පත්ති 39:7–12). නිරන්තර පරීක්ෂාවන් අපි මැඩපවත්වාගන්නේ හෝ ජයගන්නේ කෙසේද?

# "මාගේ නුවර සියලු මනුෂ්‍යයෝ. . . නුඹ සුශීලවත් ස්ත්‍රියක් බව දනිති"

# 20 වෙනි පාඩම

*රූත්; 1 සාමුවෙල් 1*

**අරමුණ**

රූත්, නයෝමි සහ හන්නාගේ ධර්මිෂ්ඨ ගුණධර්ම පංති සාමාජිකයන්ටද වඩවාගැනීමට දිරිගැන්වීමය

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න:

   අ. රූත් 1–2. තම ස්වාමිපුරුෂයා මියයාමෙන් පසුව, රූත් බෙත්ලෙහෙමට යාම සඳහා ඇගේ නැන්දනිය නයෝමි සමග නිවසෙන් පිටත්වෙයි. රූත් බෝවස්ගේ කෙත්වතුවල වැඩකරන අතර, ඔහු ඇයට කරුණාවෙන් සළකයි.

   ආ. රූත් 3–4. රූත් බෝවස්ගේ දෙපා ලඟ වැටෙන අතර, ඔහු ඇයව විවාහකර ගැනීමට පොරොන්දු වෙයි. ඔවුහු විවාහවී දරුවෙකු ලබති. ඔවුන්ගේ පෙළපතට දාවිත් රජතුමා සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේද ඇතුළත් වෙති.

   ඇ. 1 සාමුවෙල් 1; 2:1–2, 20–21. හන්නා පුත්‍රයෙක් ලැබීමට ආශිර්වාදිතවන අතර, ඇය පොරොන්දුවූ පරිදි ඔහුව ඇය ස්වාමීන්වහන්සේට දෙන්නීය. පසුව තවත් දරුවන් ලැබීමට ඇය ආශිර්වාදිත වන්නීය.

2. ඔබ අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, හැම සාමාජිකයෙක් සඳහාම කඩදාසියක් සහ පැන්සලයක් රැගෙන එන්න.

3. *පරණ ගිවිසුම වීඩියෝ ඉදිරිපත්කිරීම (53224)* තිබේ නම්, හන්නාගේ ඇදහිල්ල, මිනිත්තු-තුනක කොටස, පාඩමේ කොටසක් ලෙස පෙන්වීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය,

හැම පංති සාමාජිකයෙකුටම කඩදාසියක් සහ පැන්සලයක් දෙන්න.

රූත්ගේ පොත කෙටි වුවද, රූත් ධර්මිෂ්ඨ ස්ත්‍රියක්වූ බව එය පැහැදිළිවම පෙන්වන බව පහදාදෙන්න. ඉන්පසුව, පහත සඳහන් ප්‍රශ්න අසා, එක් එක් පංති සාමාජිකයාට ඔහුගේ හෝ ඇයගේ කඩදාසිවල පිළිතුරු ලිවීමට කියන්න.

- ඔබගේ චරිතය වචන කිහිපයකින් විස්තර කරන්නේ නම්, එම වචන කුමන අන්දමේ ඒවා වීම ඔබට අවශ්‍යද? ඔබ ප්‍රියකරන එම විස්තරයට සමානවීම සඳහා මෙම සතිය තුල ඔබට කල හැකි එක් දෙයක් ලියන්න.

මෙම පාඩම රූත් සහ අනෙක් කාන්තාවන් දෙදෙනා වන නයෝමි සහ හන්නාගේ ධර්මිෂ්ඨ ගුණාංගයන් ගැන සාකච්ඡාකෙරෙන බව පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළ කරගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාළ කරගන්නා අන්දම ගැන සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. රූත් බෙත්ලෙහෙමට යාම සඳහා නයෝමි සමග සිය නිවසෙන් පිටත්වන්නීය.**

රූත් 1–2 උගන්වමින් සාකච්ඡාකරන්න.

- නයෝමි සහ ඇයගේ පවුල මෝවබ් දේශයේ වාසයට ගියේ මන්ද? (බලන්න රූත් 1:1–2.) තම ස්වාමියා සහ පුතුන්ගේ මරණින් පසුව, නයෝමි බෙත්ලෙහෙමට නැවත ආවේ මන්ද? (බලන්න රූත් 1:6. බෙත්ලෙහෙම ඇයගේ නිවස වූ අතර, එහි තිබූ සාගතය නිමාවී තිබුනි.

- මෝවබ් දේශයේ ජීවත්වන අතර, නයෝමිගේ පුත්‍රයෝ ඕර්පා සහ රූත් සමග විවාහවූහ. ඔවුහු මෝවබ් දේශයේ කාන්තාවන් වූහ (රූත් 1:4). නැවත ඇයත් සමග බෙත්ලෙහෙමට යාමට යෝජනාකල විට නයෝමි තම ලේලියට ප්‍රේමය සහ සැළකිල්ල දැක්වූයේ කෙසේද? (බලන්න රූත් 1:7–13.) අපගේ පවුල් සම්බන්ධතාවයන් සඳහා යොදාගැනීමට, නයෝමි තම ලේලියට දැක්වූ සැළකිල්ලෙන් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද?

- නයෝමිගේ එක් ලේලියක්වූ ඕර්පා, ඇයගේ පවුල වෙත නැවත ගිය නමුත්, අනෙක් ලේලියවූ රූත්, නයෝමි සමග බෙත්ලෙහෙමට යායුතු යයි තදින්ම කියා සිටියාය. රූත් 1:16–17න් නයෝමිට රූත් දුන් පොරොන්දුවෙන් අපට රූත් ගැන ඉගෙනගත හැක්කේ මොනවාද? (ඇය ප්‍රේමනීය, හිතවත්, සහ පරිත්‍යාගශීලී බවය.) අපගේ පවුල්වලට විශාල හිතවත් බවක් අපට පෙන්විය හැක්කේ කෙසේද? රූත් කලාක් මෙන්, විශාල පරාර්ථකාමී බවක් අපට පෙන්විය හැක්කේ කෙසේද?

- නයෝමි සමග බෙත්ලෙහෙමට යාම මගින් රූත්ට අත්හැරීමට සිදුවුනේ මොනවාද? (පිළිතුරුවලට, උපන්ගම, පවුල, මිතුරන්, සහ ආගම යනාදිය ඇතුළත්විය හැකිය.) නයෝමි සමග යාම මගින් රූත්ට ලැබුනේ මොනවාද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය, බලන්න ප්‍රථම ඉගැන්වීමේ අමතර අදහස්.) සුභාරංචිය සඳහා පරිත්‍යාගකිරීම ගැන අපට රූත්ගෙන් ඉගෙනගත හැක්කේ මොනවාද?

- බෙත්ලෙහෙමට යාමෙන් පසුව, තමාට සහ නයෝමිට අහාර ලබාගැනීම සඳහා රූත් කළේ මොනවාද? (බලන්න රූත් 2:2. ඇහිඳින්නා යනු අස්වැන්න කැපීමෙන් පසුව කෙත්වල ඉතිරිවන ධාන්‍ය එකතුකොට තැබීමට අවසර ලැබූ අයෙක් බව පහදා දීමට ඔබට අවශ්‍යවිය හැකිය.) රූත් කරල් එකතු කලේ කාගේ කෙත්වලද? (බලන්න රූත් 2:1–3.) රූත් බෝවස්ගේ සිත්ගත්තේ මන්ද? (බලන්න රූත් 2;5–7.) රූත් වෙහෙසවී වැඩකරන බව බෝවස් දුටුවේය. රූත් නයෝමිට කල සියල්ලද ඔහු දැන සිටියේය.) බෝවස් රූත්ට කරුණාව පෙන්වූයේ කෙසේද? (බලන්න රූත් 2:8–9, 14–16.)

- රූත් කරල් එකතුකොටගෙන පැමිණීමෙන් පසුව සිය පරාර්ථකාමීත්වය පෙන්වූයේ කෙසේද? (බලන්න රූත් 2:14, 17–18. රූත් ඇහිඳගත් ධාන්‍ය නිවසට ගෙනැවිත් නයෝමිට දුන්නාය, එසේම ඇයගේ දහවල් කෑම වේලෙන් ඉතිරිකරගත් ආහාර ස්වල්පයක්ද ඇය නයෝමිට ගෙනාවාය.) අන් අයට පරාර්ථකාමීව ක්‍රියාකිරීමෙන් ඔබ ආශිර්වාදිතවූයේ කෙසේද?

**2. රූත් සහ බෝවස් විවාහවී දරුවෙකු ලබති.**

රූත් 3–4 උගන්වමින් සාකච්ඡාකරන්න.

- රූත්ගේ සහ බෝවස්ගේ විවාහයේ සාර්ථකත්වය පතා ආගමික පිළිවෙතක් ඉටුකරන ලෙස නයෝමි රූත්ට උපදෙස් දුන්නාය. (රූත් 3:1–5). බෝවස්ගේ දෙපා ලඟ නිදාසිටීමෙන් රූත්, සාර්ථක ලෙස, ඔහුට විවාහයක් යෝජනා කළාය. රූත් නයෝමිගේ උපදේශයට කීකරුවීමෙන් හෙළිදරව්වන්නේ නයෝමි කෙරෙහි ඇය තුළවූ කුමන හැඟීම්ද?

- බොවස් අවිදිවී, රූත් තම දෙපා ලඟ වැතිරී සිටිනවා දුටු විට, ඔහු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න රූත් 3:8–15. රූත් බෝවස්ට "ඔබගේ වස්ත්‍රය ඔබගේ මෙහෙකාරිය පිට. . .අතුරනු මැනවි" යයි කීවිට, ඇය අදහස් කළේ, "මා ආරක්ෂාකරන්න, මා රැකගන්න, මට සළකන්න" බව සටහන්කර ගන්න.) බෝවස් රූත්ව විවාහකරගැනීමට එකඟවූයේ කුමන කොන්දේසි යටතේද? (බලන් රූත් 3:11–13. රූත්ගේ ස්වාමි පුරුෂයා මිය ගිය පසුව, ඔහුගේ ළඟම පිරිමි ඥාතියා රූත් හා විවාහවිය යුතුව තිබූ බව පහදාදෙන්න. බෝවස් රූත්ගේ ලඟම පිරිමි ඥාතියා නොවීය. නමුත් ඔහු රූත් හා විවාහවීමට එකඟවුනේ ලඟම පිරිමි ඥාතියා එසේ කිරීමට අකමැති වුවහොත් පමණි.)

- බෙත්ලෙහෙම් ජනතාව අතර රූත්ට තිබූ පිළිගැනීම කුමක්ද? (බලන්න රූත් 3:11.) මෙම පිළිගැනීම බෝවස් හා ඇයගේ සම්බන්ධතාවයට ප්‍රයෝජනවත්වුනේ කෙසේද? අපගේ

විශ්වාසයන් සහ අප රැකගැනීමට පරිශ්‍රම දරන ගුණාංගයන් මොනවාදැයි අපගේ පවුල් සාමාජිකයන්, මිතුරන් සහ අසල්වැසියන් දැනසිටීම වැදගත්වන්නේ මන්ද?

- රූත්ව විවාහකරගැනීමට පොරොන්දුවීමෙන් පසුව බෝවස් කළේ කුමක්ද? (බලන්න රූත් 3:15; 4:1–8.) තමා අවංක මිනිසෙකු බව බෝවස් පෙන්වූයේ කෙසේද? (බලන්න රූත් 4:9–10, 13. ඔහු රූත්ට දුන් පොරොන්දුව ක්‍රියාත්මක කරමින් ඇයගේ මියගිය ස්වාමි පුරුෂයාට ඉටුවිය යුතුවූ සමාජ යුතුකම ඉටුකළේය.
- රූත්ට සහ බෝවස්ට පරම්පරාවෙන් පැවතෙන්නෙකුවූ ප්‍රසිද්ධ ඉශ්‍රායෙල් රජතුමා කවුද? (දාවිත් රජතුමා ඔවුන්ගේ එක් මී-මුණුපුරෙක් විය; බලන්න රූත් 4:17, 21–22.) රූත් සහ බෝවස්ගෙන් පැවතෙන්නෙක්ව සිටියේ වෙන කවුරුන්ද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේය; බලන්න මතෙව් 1:15–16; යොහාන් 7:42.)
- වැඩිමහල් තෝමස් එස්. මොන්සන් රූත්ව වීරවරියක් ලෙස හැඳින්වීය (in Conference Report, ඔක්තෝ. 1974, 156; හෝ *Ensign*, නොවැ. 1974, 108). ඔබ සිතන ලෙස රූත් වීරවරියක් වූයේ කුමන අන්දමින්ද? (රූත් හිතවත්කමේත් භක්තියේත් ආදර්ශයක් බව වැඩිමහල් මොන්සන් කීවේය. රූත් වීරවරියක් වීමේ අමතර කරුණු යෝජනාකිරීමට පංති සාමාජිකයන්ට හැකිය.)

### 3. හන්නා පුත්‍රයෙකු ලැබීමට ආශිර්වාදිතවූ අතර, ඇය ඔහුව පොරොන්දුවූ පරිදි ස්වාමීන්වහන්සේට බාර දෙයි.

1 සාමුවෙල් 1 උගන්වමින් සාකච්ඡාකරන්න.

- එල්කානාගේ බිරිඳවූ හන්නාට දරුවන් නොලැබින. හැම වසරකම ඇය දේවමාළිගාවේදී පුත්‍රයෙක් පතා හඬමින් යාච්ඤා කළාය (1 සාමුවෙල් 1:1–7). 1 සාමුවෙල් 1:11 තුලින් හන්නා ස්වාමීන් වහන්සේට දුන් පොරොන්දුව කුමක්ද? මෙම පොරොන්දුව තුලින් හන්නා ගැන අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? (ඇය ශ්‍රේෂ්ඨ ඇදහිලිමත් කාන්තාවක් වූ බවය; පංති සාමාජිකයන්ට අමතර පිළිතුරු යෝජනා කළ හැකිය.)
- හන්නා දේව මාළිගාවේ යාච්ඤාකරනු දුටුවේ කවුද? (බලන්න 1 සාමුවෙල් 1:9–12.) හන්නා ස්වාමීන්වහන්සේට දුන් පොරොන්දුව ගැන ඒලි ඇයට කීවේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 1:17.) ඒලිගේ වචන ඇසීමෙන් පසුව හන්නාට ඇතිවූ හැඟීම් මොනවාද? (බලන්න 1 සාමුවෙල් 1:18.) අපට කරදරයක්වූ විටදී සභා නායකයන් අපට උදව්කරන්නේ කෙසේද?
- හන්නා ඒලි අමතා, ඇය "ස්වාමීන්වහන්සේ ඉදිරියේ [තම] ආත්මය වැගිරවූබව" කීවාය (1 සාමුවෙල් 1:15). අපගේ පෞද්ගලික යාච්ඤා වඩාත් අවංක සහ අර්ථවත් කරගැනීමට අපට හැකිවන්නේ කෙසේද?
- හන්නා ස්වාමීන්වහන්සේට දුන් පොරොන්දුවට ප්‍රතිචාර වශයෙන් සිදුවූනේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 1:19–20.) සාමුවෙල් ඉපදීමෙන් පසුව හන්නා සිය පොරොන්දුව ඉටුකළේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 1:21:28.) අපි ස්වාමීන්වහන්සේට දෙන පොරොන්දු මොනවාද? (පිළිතුරුවලට, බෞතීස්මයේදී සහ දේවමාළිගාවේදී අපි උන්වහන්සේ සමග තබන ගිවිසුම් ඇතුළත්විය හැකිය.) මෙම පොරොන්දු උනන්දුවෙන් යුතුව ආරක්ෂාකිරීමට අපට උපකාරවත්වීමට හන්නාගෙන් අපට ඉගෙනගත හැක්කේ මොනවාද?
- සාමුවෙල්ව ස්වාමීන්වහන්සේගේ සේවයට දීමෙන් හන්නාට ඇතිවූ හැඟීම් ගැන ඔබ සිතන්නේ කුමක්ද? ස්වාමීන්වහන්සේට දීමට උන්වහන්සේ අපගෙන් ඉල්ලන්නේ කුමක්ද? (අපට තිබෙන හැම දෙයක්ම ස්වාමීන්වහන්සේගෙන් ලැබුන බව සිහිපත්කරමින් අපි කැමැත්තෙන් දිය යුතුය.)
- හන්නා සාමුවෙල්ව දේවමාළිගාවට ගෙන ආ විට, ඇය ස්වාමීන්වහන්සේට යාග ඔප්පුකොට ප්‍රසස්ති ගී ගායනා කළාය (බලන්න 1 සාමුවෙල් 1:24–25, 28; 2:1–2). ස්වාමීන්වහන්සේ අපට දෙන ආශර්වාදවලට අපි උන්වහන්සේට ස්තුතිකිරීම වැදගත්වන්නේ මන්ද?
- දරුවන් ලැබීමට ආශිර්වාදිතවීම සඳහා හන්නා වසර ගණනාවක් බලා සිටියාය (1 සාමුවෙල් 1:2; 2:21). ස්වාමීන්වහන්සේ කෙරෙහි ඉවසීමෙන් බලාසිටි බයිබලයේ එන වෙනත් චරිත මොනවාද? අපට අවශ්‍ය දේවල් අපට ලැබිය යුතුවීම ගැන ලෝකයා ප්‍රකාශකරන්නේ මොනවාද? ස්වාමීන්වහන්සේ කුමක් කියනසේක්ද? ස්වාමීන්වහන්සේගේ කාලයට අනුව ලැබෙන ආශිර්වාද ගැන ඉවසීමෙන් බලා සිටීමට අපි ඉගෙනගන්නේ කෙසේද?

- රූත්, නයෝමි සහ හන්නා ආදර්ශමත්ව පෙන්වූ ධර්මිෂ්ඨ ගුණාංගයන් මොනවාද? (මෙම ගුණාංග හුණුලැල්ලේ ලැයිස්තුගත කරන්න.)

---

අවසානය

රූත්, නයෝමි සහ හන්නා ප්‍රදර්ශනය කල ධර්මිෂ්ඨ ගුණාංගයන් දියුණුකර ගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න. මෙම ගුණාංගයන් දියුණුකර ගැනීමෙන්, ගැලවුම්කරුවාණන්වූ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට අපව සමීපකරවන බවට සාක්ෂිදරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනාකල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. ඔබට එම අදහස් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට අවශ්‍යවිය හැකිය.

**1. හැරී ආ අන්‍ය ජාතිකයන් ආබ්‍රහම්ගේ ගිවිසුමට පිළිගැනීම**

රූත් උත්පත්තියෙන්ම ඉශ්‍රායෙල්වරියක නොවූ බව පහදාදෙන්න. ඇය නයෝමි සමග බෙත්ලෙහෙමට යාමට මෝවබ් දේශයයෙන් පිටත්වූ විට, ඇය තම ආගමද අත්හැර නයෝමි අමතා, "නුඹගේ දෙවියන්වහන්සේ මාගේද දෙවියන්වහන්සේ [වනසේක]" යයි කියමින් ඉශ්‍රායෙල් දෙවියන්වහන්සේ අනුව ගියාය (රූත් 1:16). බෝවස් හා විවාහවීම මගින්, රූත් ඉශ්‍රායෙල් රාජකීය පෙළපතේ කොටසක්වූ, දාවිත් රජතුමා සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුතුන් මුත්තෙකු බවට පත්වූවාය.

- රූත්ගේ හැරී ඒම සහ ඉශ්‍රායෙල් ගෘහයට පිළිගැනීම, ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට සම්බන්ධවීමට කැමති අය කෙරෙහි උන්වහන්සේගේ ආකල්පය ප්‍රදර්ශනයවීමක් වන්නේ කෙසේද? (බලන්න 2 නිෆායි 26:33; ඇල්මා 19:36; 3 නිෆායි 21:6.) අළුතින් හැරී ආ අයට සභාවේ පිළිගැනීමට අප උදව්කරන්නේ කෙසේද?

**2. සුදුසු ලෙස විනිශ්චයකිරීම**

- හන්නා දේවමාළිගාවේ යාච්ඤාකරනු දුටු ඒලි පූජකවරයා, 'ඇය බීමතින් සිටී යයි' ඔහු ඇයව වැරදි ලෙස විනිශ්චය කළේය (1 සාමුවෙල් 1:13). පෙනීම පදනම්කරගෙන පමණක්ම මිනිසුන් විනිශ්චයකිරීමේ භයානකකම කුමක්ද? අප මෙවැනි විනිශ්චයකිරීම් වළක්වාගන්නේ කෙසේද?
- හියු බී. බ්‍රවුන් සභාපතිවරයා මෙසේ කීවේය, "මා ෆමිනිසුන් විනිශ්චයකිරීමෙන්ෆ යම් වරදක් කළ හොත්, ඔවුන් අනුකම්පාකිරීමකට ලක්වීම මට අවශ්‍යවේ" (ඉයුජින් ඊ. කැම්ප්බෙල් සහ රිචඩ් ඩී. පෝල්ගේ *Hugh B. Brown: His Life and Thought* [1975], 225). අපි මෙම මූලධර්මය අදාළකරගන්නේ කෙසේද?

**3. දේවමාළිගාවට යාම මගින් කරදර සහ හිරිහැර විසඳාගැනීම**

- හන්නා ස්වාමීන්වහන්සේට තම පොරොන්දුව තැබුවේ කොහේදීද? (බලන්න 1 සාමුවෙල් 1:9–11.) දේවමාළිගාවට යාමෙන් අපගේ කරදර සහ හිරිහැරවලට පිහිටක් ලැබෙන්නේ කෙසේද?

  වැඩිමහල් ජෝන් ඒ. විඩ්ට්සෝ මෙසේ කීවේයෘ "කරදර හිරිහැරවලින් යුත් කාර්යශීලී පුද්ගලයෙකුට. . .තම ප්‍රශ්න වඩාත් හොඳින් සහ ඉක්මණින් විසඳාගැනීමට වෙනත් කිසිදු ස්ථානයකට වඩා ස්වාමීන්වහන්සේගේ ගෘහය තුළින් හැකිවන බව මම විශ්වාස කරමි. ඔහු තමා වෙනුවෙන් සහ ඔහුගේ මියගිය අය වෙනුවෙන් දේවමාළිගා කටයුතු [කරන්නේ] නම්, උන්වහන්සේ ඔවුන්ගේ මියගිය අයට බලවත් ආශිර්වාද දානය කරනසේක. එසේම. . .ඔහුටද ආශිර්වාදයක් පැමිණෙන්නේය. වඩාත් බලාපොරොත්තු නොවූ අවස්ථාවක, දේවමාළිගාව තුල හෝ ඉන් පිටතදී, ඔහුගේ ජීවිතයට කරදරකල ප්‍රශ්නවලට විසඳුමක් එළිදරව්වක් ලෙස ඔහු වෙත පැමිණෙන්නේය. සුදුසු ලෙස දේවමළිගාවට ඇතුළුවන අයට ලැබෙන දීමනාව එය වන්නේය." උපුටාගැනීම ඩේවිඩ් බී. හයිට් විසිනි, in Conference Report,. ඔක්තෝ 1990, 76; හෝ *Ensign,* නොවැ. 1990, 61).

# දෙවියන්වහන්සේට ගෞරවකරන්නන්ට උන්වහන්සේත් ගෞරව කරනසේක

# 21 වෙනි පාඩම

*1 සාමුවෙල් 2–3; 8*

**අරමුණ**

තමන්ටත්, අන් අයටත්, හෝ ලෝකයටත් ඉහළින් ස්වාමීන්වහන්සේට ගෞරවකර, ප්‍රීතිමත් කිරීමෙන් ලැබෙන ආශිර්වාද ගැන පංති සාමාජිකයන්ට තේරුම්ගැනීමට උපකාරකිරීමය

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. 1 සාමුවෙල් 2:12–17, 22–25. ඒලිගේ පුත්‍රයන් පව්කරන අතර ඔවුන්ගේ පියා විසින් උපදෙස් දෙනු ලබයි.

   ආ. 1 සාමුවෙල් 2:27–36; 3:12–14. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් ඒලිගේ පවුලේ දුෂ්ඨකම්වල ප්‍රතිඵල ගැන ඒලිට අනතුරු අඟවයි.

   ඇ. 1 සාමුවෙල් 3. ස්වාමීන්වහන්සේ සාමුවෙල් කැඳවන අතර ඔහු ප්‍රතිචාර දක්වයි.

   ඈ. 1 සාමුවෙල් 8. ඉශ්‍රායෙල්වරුන්ට රජෙක් අවශ්‍යවේ. එවිට ඔවුන්ටද වෙනත් සියලුම ජාතීන් මෙන් වීමට හැකිය. එවැනි තේරීමක භයානකකම ගැන සාමුවෙල් ඔවුන්ට අනතුරු හඟවයි.

2. සාමුවෙල්ගේ කැඳවීම පිළිබඳ විස්තරය (1 සාමුවෙල් 3) සාරාංශ කිරීමට සූදානම්වන ලෙස පංති සාමාජිකයෙකුගෙන් ඉල්ලීමට සහ ඉශ්‍රායෙල්වරුන් රජෙකුට කැමතිවීම පිළිබඳ විස්තරය (1 සාමුවෙල් 8) සාරාංශකිරීමට සූදානම්වන ලෙස වෙනත් පංති සාමාජිකයෙකුගෙන් ඉල්ලීමටද ඔබට අවශ්‍යවිය හැකිය.

3. *තරුණයන් ශක්තිමත්කිරීම සඳහා,* යන පත්‍රිකාව (34285) මෙම පාඩමේ සාකච්ඡාකිරීමට ඔබ තීරණය කරන්නේ නම්, එහි පිටපතක් පංතියට රැගෙන එන්න.

4. ඔබ අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චිකරන්නේ නම්, ගැලවුම්කරුවාණන්ගේ පින්තූරයක් රැගෙන එන්න (62572; සුභාරංචි පින්තූර කලා මල්ල 240). ඔබ හුණුලෑල්ලේ චිත්‍ර ඇඳීමට අකමැති නම්, කණ්නාඩියක්, මිනිසුන් නියෝජනයවන යම් භාණ්ඩයක්, සහ සිතියමක්, ගෝලයක්, හෝ ලෝකය නියෝජනය වන වෙනත් භාණ්ඩයක් රැගෙන එන්න.

   සාමුවෙල් පිරිමි ළමයාව දෙවියන්වහන්සේ විසින් කැඳවීම, යන පින්තූරය තිබේ නම්, එය පාඩම අතරතුරදී පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවනු ඇත (62498; සුභාරංචි කලා පින්තූර මල්ල 111).

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**


අවධානශීලී ක්‍රියාකාරකම

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවනු ඇත.

පංතිය ඉදිරියේ ගැලවුම්කරුවාණන්ගේ පින්තූරය ප්‍රදර්ශනය කර ආවරණය කරන්න. 97 වෙනි පිටුවේ එන රූප තුන හුණුලෑල්ලේ ඇඳ ඒවා ආවරණය කරන්න (නැතහොත් "සූදානම්වීම" කොටසේ ලැයිස්තුගතකර තිබෙන භාණ්ඩ තුන ප්‍රදර්ශනයකර ආවරණය කරන්න). සඟවා තිබෙන හැම භාණ්ඩයකම අපි ගෞරවකරන කෙනෙක් සහ ප්‍රසන්න කිරීමට උත්සාහකරන කෙනෙක් පිළිබඳ යමක් තිබෙන බව පහදාදෙන්න

- 1 සාමුවෙල් 2:30ට අනුව ස්වාමීන්වහන්සේ ගෞරවකරන්නේ කාටද?

ස්වාමීන්වහන්සේට ගෞරවකිරීමෙන් ලැබෙන ආශිර්වාද ගැන මෙම පාඩමෙන් සාකච්ඡාවන බව පංති සාමාජිකයන්ට කියන්න. පාඩම අතරතුර සුදුසු වේලාවේදී සැඟවුන භාණ්ඩ ඔබ නිරාවරනය කරන බව පහදාදෙන්න.




ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකරගැනීම

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාලකරගන්නා අන්දම ගැන සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

**1. ඒලිගේ පුත්‍රයෝ දෙවියන්වහන්සේට ඉහළින් ඔවුන්ටම ගෞරව කළහ.**

1 සාමුවෙල් 2:12–17, 22–25 උගන්වමින් සාකච්ඡාකරන්න.

හොප්නී සහ පීනෙහාස් ඒලි නම් උත්තම පූජකවරයාගේ පුත්‍රයන්වූ අතර තමුන්ම පූජකවරු වූහ. කෙසේ වුවද, ඔවුහු දුෂ්ඨ වූහ. ඉශ්‍රායෙල්වරු පූජාවක් ඔප්පුකිරීමට දේවස්ථානයට පැමිණි විට, අල්තාරය මත තෙල දවන්ටත් පළමුවෙන් හොප්නී සහ පීනෙහාස් පූජාකරන සතුන්ගේ මස් බලෙන් ගනිති. පූජාවක් ඔප්පුකරනකල, මස් උයන අතර ඔවුහු එයින්ද මස් කොටසක් ගනිති (1 සාමුවෙල් 2:12–17). මේවා දෙවියන්වහන්සේ නීති බරපතල ලෙස කඩකිරීමක් වන අතර, දෙවියන්වහන්සේගෙන් සොරකම් කිරීමට සමානය. ඒලිගේ පුත්‍රයෝ දේවස්ථානයේ දොරකඩ රැස්වූ කළ ස්ත්‍රීන් දූෂනයකරමින් ඉතාමත් බරපතල පාපයක්ද කළහ (1 සාමුවෙල් 2:22).

- ඒලිගේ පුත්‍රයන්ගේ ක්‍රියාවලින් ඉශ්‍රායෙල් අනෙක් ජනතාවට ඇතිවූ බලපෑම් මොනවාද? (බලන්න 1 සාමුවෙල් 2:17, 24.)
- ඒලිගේ පුත්‍රයන්ගේ ක්‍රියාවලින්, ඔවුන් ගෞරව කිරීමට කවරෙක් තෝරාගෙන තිබෙන බව ඇඟවෙන්නේද? (පළමු නිරූපනය හෝ කණ්නාඩිය නිරාවරනය කරන්න. අපගේ ජීවිතවල කවර අංශවලින් අපි සමහර අවස්ථාවලදී ස්වාමීන්වහන්සේ වෙනුවට අපටම ගෞරවකිරීම සහ ප්‍රසන්නකිරීම කරන්නේද? පංති සාමාජිකයන් පහත සඳහන් අංශ යෝජනා කළ හැකිය:

  අ. විනෝදවීම්
  ආ. සබත් පිළිපැදීම
  ඇ. දිනයෙදීම සහ සදාචාරය
  ඈ. උපවාසය
  ඉ. සභා කැඳවීම්

- අපි සමහර අවස්ථාවලදී දෙවියන්වහන්සේ වෙනුවට අපවම ප්‍රසන්න කිරීමට තෝරාගැනීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? දෙවියන්වහන්සේට වඩා අපටම ගෞරව කරගැනීමේ ප්‍රතිඵල මොනවාද?

**2. ඒලි තම පුත්‍රයන්ට දෙවියන්වහන්සේට ඉහළින් ගෞරවකරයි.**

1 සාමුවෙල් 2:27–36; 3:12–14 උගන්වමින් සාකච්ඡාකරන්න.

- තම පුත්‍රයන්ගේ දුෂ්ඨකම් ගැන ඒලි දැනගත් විට, ඔහුට තිබූ වගකීම් මොනවාද? ඔහු කළේ මොනවාද? (බලන්න 1 සාමුවෙල් 2:22–25.) ඔවුන්ගේ ප්‍රතිචාරය වූයේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 2:25.)

- තම පුත්‍රයන්ට තදින්ම තරවටු කිරීමෙන් පසුව, ඒලි තම පවුලේ අය දේවස්ථානයේ කරන භයානක පාප නිවැරදි කිරීමට කිසිවක් කළේ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් පැමිණ ඔහුට තරවටුකරමින්, ඔහු දෙවියන්වහන්සේට වඩා ඔහුගේ පුත්‍රයන්ට ගෞරවකරන බව කීවේය (1 සාමුවෙල් 2:27–29). ඒලි ඔහුගේ පුත්‍රයන්ට දෙවියන්වහන්සේට වඩා ගෞරව කළේ කුමන ආකාරයෙන්ද? ඒලිගේ පවුලට සිදුවන දේ ගැන දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා කීවේ කුමක්ද?

- අපි සමහර අවස්ථාවලදී දෙවියන්වහන්සේට වඩා වෙනත් මිනිසුන්ට ගෞරවකරන මාර්ග මොනවාද? (වෙනත් මිනිසුන් නියෝජනය වන දෙවන අනුරූපය හෝ භාණ්ඩය නිරාවරනය කරන්න.) පංති සාමජිකයන් පහත දැක්වෙන මාර්ග යෝජනා කළ හැකියඃ

  අ. වරදක්බව අප දන්නා යම් දෙයක් කිරීමට අපව පෙළඹවීමට අපගේ හිතවතුන්ට අපි ඉඩදෙන්නෙමු.

  ආ. අපි වංක ලෙස කටයුතුකරන්නේ අප ගැන අන් අය කුමක් සිතාවිදැයි ඇති බිය නිසාය.

  ඇ. අපගේ පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් කරන වැරදි අපි නිවැරදි නොකරන්නේ, ඔවුන් සමග යහපත් සම්බන්ධතාවයක් පවත්වාගැනීමට අපට අවශ්‍ය නිසාය.

  ජෝසෆ් එෆ්. ස්මිත් සභාපතිවරයා මෙසේ ඉගැන්වීයඃ " අප අතර අඥාන ලෙස මඳ ප්‍රේමයකින් යුක්තව සීමාවන් හෝ බාධක [නො] පනවන කිසිවෙක් නොසිටිය යුතුය. මන්ද අපගේ ළමයින් හිතුවක්කාර ක්‍රියාවක යෙදෙන විට, වැරදි දෙයක් කරන විට, සහ ලෝකයේ දේවලට ධර්මිෂ්ඨ දේවල්වලට වඩා අඥාන ලෙස ප්‍රියකරන විට, අපි ඒවා නොනවත්වන්නේ ඔවුන්ව අමනාපකරගැනීමට ඇති බිය නිසාය (*Gospel Doctrine, 5th ed.* [1939], 286).

- දෙමාපියන් තම හිතුවක්කාර දරුවන් කෙරෙහි ප්‍රේමනීය ආකල්පයකින් යුතුව තම වගකීම් ඉටුකරන්නේ කෙසේද? දෙමාපියන් තම දරුවන්ට ධර්මිෂ්ඨව මගපෙන්වීමට පරිශ්‍රම දරන විට, ළමයින්ට ඇති වගකීම් මොනවාද?

### 3. සාමුවෙල් ස්වාමීන්වහන්සේට ගෞරවකරයි

1 සාමුවෙල් 3 උගන්වමින් සාකච්ඡා කරන්න. මෙම පරිච්ඡේදය කෙටියෙන් සංක්ෂේපකිරීමට පංති සාමාජිකයෙ ක් පත්කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. සාමුවෙල් පිරිමි ළමයා තම මවවූ හන්නා විසින් ඇය පොරොන්දුවූ පරිදි ස්වාමීන්වහන්සේගේ සේවයට දුන් පසුව, දේවමාළිගාවේ සේවයකරමින් සිටි බව පැහැදිළි කරන්න (1 සාමුවෙල් 1).

- රාත්‍රී කාලයේදී සාමුවෙල් සමග කථාකළේ කවුද? (බලන්න 1 සාමුවෙල් 3:4.) සාමුවෙල් පළමුව සිතුවේ තමාට කවරෙක් කථා කළේ කියාද? (බලන්න 1 සාමුවෙල් 3:5–6, 8). එය ස්වාමීන්වහන්සේගේ කැඳවීමක් බව සාමුවෙල් දැනගත්තේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 3:8–9.)

- ස්වාමීන්වහන්සේ අප සමග කථාකරන්නේ කෙසේද? (උන්වහන්සේ වැඩි වශයෙන් ශුද්ධාත්මයාණන් තුළින් කොඳුරා කථාකරනසේක. උන්වහන්සේ අප සමග කථාකරන අමතර ක්‍රම ගැන පංති සාමාජිකයන් යෝජනා කල හැකිය.) ස්වාමීන්වහන්සේගෙන් පණිවුඩ ලබාගෙන ඒවා තේරුම්ගැනීමට අපි අපව සූදානම්කරගන්නේ කෙසේද?

- සාමුවෙල් ස්වාමීන්වහන්සේට ගෞරවකළ මාර්ග මොනවාද? (ස්වවාමීන්වහන්සේගේ පින්තූරය නිරාවරනය කරන්න) පහත සඳහන් කොටස් ඔබගේ සාකච්ඡාව සඳහා සළකාබැලීමට ඔබට අවශ්‍යවිය හැකිය.

  "මාගේ සිතේද, මාගේ කල්පනාවේද හැටියට කරන්නාවූ විශ්වාසවූ පූජකයෙකු මම නැගිටුවමි" (1 සාමුවෙල් 2:35).

  "ස්වාමීන්වහන්සේ සාමුවෙල්ට හඬගැසූසේක. ඔහු මම මෙහි යයි කීය" (1 සාමුවෙල් 3:4).

  "එවිට සාමුවෙල්ඃ කථාකළ මැනව; ඔබවහන්සේගේ මෙහෙකරුවා අසාගෙන ඉන්නවා යයි කීවේය" (1 සාමුවෙල් 3:10).

- ස්වාමීන්වහන්සේට ගෞරව කරන්නනට ගෞරවකරන බව උන්වහන්සේ පොරොන්දුවූසේක (1 සාමුවෙල් 2:30). ස්වාමීන්වහන්සේ සාමුවෙල්ට ගෞරව කළේ කෙසේද? (බලන්න

1 සාමුවෙල් 3:19.) සාමුවෙල් කළාක් මෙන් අපි ස්වාමීන්වහන්සේට ගෞරව කළහොත් උන්වහන්සේත් අපට ගෞරවකරන බව ඔබ සිතන්නේ කෙසේද?

**4. ඉශ්‍රායෙල්වරු ලෝකයාට ගෞරවකරති.**

1 සාමුවෙල් 8 උගන්වමින් සාකච්ඡාකරන්න. මෙම පරිච්ඡේදය කෙටියෙන් සංක්ෂේපකිරීමට පත් කල පංති සාමාජිකයාට කීමට ඔබට අවශ්‍යවිය හැකිය.

- සාමුවෙල්ගේ මෙහෙය තුළදී ඉශ්‍රායෙල්ට තිබුනේ කුමන අන්දමේ ආණ්ඩු ක්‍රමයක්ද? (බලන්න 1 සාමුවෙල් 8:1. ඉශ්‍රායෙල්වරුන්ව පාලනය කළේ විනිශ්චයකරුවන්ය.) තම රජු වශයෙන් ඉශ්‍රායෙල්වරුන් සැළකුවේ කවරෙක්ද? (බලන්න 1 සාමුවෙල් 12:12.)
- ඉශ්‍රායෙල් පුත්‍රයන්ට රජෙක් අවශ්‍යවූයේ මන්ද? (බලන්න 1 සාමුවෙල් 8:5, 20.) "සියලු ජාතීන්ට මෙන්" රජෙක් ඉල්ලීමෙන් ඉශ්‍රායෙල්වරුන් ප්‍රතික්ෂේප කලේ කවුරුන්ද? (බලන්න 1 සාමුවෙල් 8:7.) රජෙක් ලබාගැනීමේ ප්‍රශ්නය ගැන පැවසීම සඳහා ස්වාමීන්වහන්සේ සාමුවෙල්ට දුන් උපදෙස් මොනවාද? (බලන්න 1 සාමුවෙල් 8:9–18.) සාමුවෙල්ගේ අනතුරු ඇඟවීමට ඉශ්‍රායෙල්වරුන්ගේ ප්‍රතිචාරය වූයේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 8:19–22.)
- රජෙක් ඉල්ලීම තුළින්, ඉශ්‍රායෙල්වරුන් ගෞරව කළේ කාටද? (ලෝකය නියෝජනය කරන තුන් වැනි නිරූපනය හෝ භාණ්ඩය නිරාවරනය කරන්න.)
- අපි සමහර අවස්ථාවලදී "සියලු ජාතීන් මෙන් වීමට" ආශාකරන්නේ කුමන මාර්ගවලින්ද? (බලන්න 1 සාමුවෙල් 8:5.)

  ස්වාමීන්වහන්සේ අප වෙනුවෙන් නියමකර තිබෙන ප්‍රමිතීන් සාකච්ඡාකිරීමට *තරුණයන් ශක්තිමත්කිරීම සඳහා* (34285) යන පත්‍රිකාව යොදාගැනීමට ඔබට අවශ්‍යවිය හැකිය. එවිට ලෝකයේ දුෂ්ඨ මාර්ගවලට අපි සහභාගි නොවනු ඇත. මෙම ප්‍රමිතීන් වැඩිහිටියන්ට මෙන්ම තරුණයන්ටද එකසේ අදාල බව පහදාදෙන්න.

- ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, ඊශ්‍රායෙල්වරුන්ගේ රජතුමාවූ ලෙසටම අපගේද රජතුමා වනසේක (ගීතාවලිය 47:7; 89:18; 149:2). මෙම අවබෝධය ලෝකයේ ක්‍රම කෙරෙහි අපගේ ආකල්පයට බලපාන්නේ කෙසේද? අපි සමහර අවස්ථාවලදී අපගේ රජතුමා ලෙස ස්වාමීන්වහන්සේව ප්‍රතික්ෂේපකරන්නේ කෙසේද?

---

අවසානය

පංති කාලය තුළදී ප්‍රදර්ශනය කල භාණ්ඩ හතරට අවධානය යොමුකරවන්න. අපි සියලුදෙනාම හැම දිනකම අපි ගෞරවකරන්නේ කාටදැයි තෝරාගත යුතු බව පහදාදෙන්න. ඔබ ස්වාමීන්වහන්සේට ගෞරවකරන විට, ඔබට ලැබුනු ආශිර්වාද සහ ප්‍රීතිය ගැන සාක්ෂිය දරන්න. පංති සාමාජිකයන්ට ආරාධනාකර ඔවුන්ගේම අත්දැකීම් හෝ සාක්ෂිය බෙදාගැනීමට කියන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනා කළ පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. අප තෝරාගන්නා දේවල වටිනාකම**

- සමහර අවස්ථාවලදී විශාල වටිනාකමක් ඇති දේවල් මඳ වටිනාකමක් ඇති දේවලට හුවමාරු කරන්නෙමු. ඒලි සහ ඔහුගේ පුත්‍රයන්ට ඔවුන්ගේ තෝරාගැනීම් නිසා අත්හැරීමට සිදුවූයේ මොනවාද? ඉශ්‍රායෙල්වරුන්ට රජෙක් අවශ්‍ය නම්, ඔවුන්ට අත්හැරීමට සිදුවන දේවල් වශයෙන් සාමුවෙල් ප්‍රකාශකල දේවල් මොනවාද? (බලන්න 1 සාමුවෙල් 8:11–17.) අපි සමහර අවස්ථාවලදී මඳ වටිනාකමක් ඇති දේවල් වෙනුවෙන් අත්හරින විශාල වටිනා දේවල් මොනවාද?

**2. "ස්වාමීන්වහන්සේ කැඳවන්නාව, ස්වාමීන්වහන්සේ සුදුසුකම් ලබාදෙනසේක**

ස්වාමීන්වහන්සේට ගෞරවකරන්නන්ට උන්වහන්සේ ගෞරවකරන බව පෙන්වා දීමට තෝමස් එස්. මොන්සන් සභාපතිවරයා පහත සඳහන් ප්‍රකාශය කළේය:

"ඔබලාගෙන් සමහරෙක් කැඳවීමකට සුහවාදීව ප්‍රතිචාර දැක්වීමට ස්වභාවයෙන්ම ලජ්ජාවීම හෝ ඔබ නොසෑහෙන්නේ යයි හෝ කල්පනාකරති. මේ වැඩ කටයුතු ඔබගේ හෝ මට පමණක් අයත් නොවන බව මතකතබාගන්න. එය ස්වාමීන්වහන්සේ වැඩ කටයුතුය. තවද අපි ස්වාමීන්වහන්සේගේ පණිවුඩවල යෙදෙන විට, අපි ස්වාමීන්වහන්සේගේ උපකාරවලට සුදුසුවෙමු. ස්වාමීන්වහන්සේ කැඳවන්නාව, ස්වාමීන්වහන්සේ සුදුසු කරනසේක" (in Conference Report, අප්‍රේ. 1996, 62; හෝ *Ensign,* මැයි 1996, 44).

ඉන්පසුව මොන්සන් සභාපතිවරයා පහත සඳහන් කථාව කීවේයඃ

"[යම්] පැවරීමක් අසීරු හෝ කාලය වැයවන්නක් බව අපි සිතිය යුතුද, IIකට නැගෙනහිර ජර්මනියෙහි සිටි එක් ඇදහිලිමත් නිවාස ගැරුවරයෙකු සහ ඔහුගේ සහායකයාගේ අත්දැකීමක් ගැන මම ඔබත් සමග බෙදාගනිමි.

"ජොහාන් ඩෙන්ඩෝෆර් සොහොයුරා ජර්මනියේදී සභාවට හැරී ආ අයෙක් විය. ඪඪවන ලෝක යුද්ධයෙන් පසුව ඔහු සැබවින්ම ඔහුගේම දේශයවූ—හංගේරියා දේශයේ ඩෙබ්රිසන් නුවර සිරකරුවෙක් විය. දේවමාළිගාවට යාමට ඔහු කෙතරම් ආශාවෙන් සිටියේද! තම ආත්මික ආශිර්වාද ලබාගැනීමට ඔහු කෙතරම් ආශාවෙන් සිටියේද! ස්විස්සර්ලන්තයේ දේවමාළිගා ගමන යාමට ඉල්ලීම් පිට ඉල්ලීම් කළද ඒවා ප්‍රතික්ෂේප වූ අතර ඔහු සම්පූර්ණයෙන්ම අධෛර්‍යයට පත්විය. ඉන්පසුව ඔහුගේ නිවාස ගුරුවරයා ඔහුව බැහැදුටුවේය. වෝල්ටර් ක්‍රෝස් සොහොයුරා ජර්මනියේ ඊශාන දිග කොටසේ සිට හංගේරියාවට ගියේය. ඔහු තම නිවාස ඉගැන්වීමේ සහායකයා අමතා, 'මේ සතියේදී මා සමග නිවාස ඉගැන්වීමට යාමට ඔබ කැමතිද?' යයි අසා ඇත.

"ඔහුගේ සහායකයාද 'අපි යන්නේ කවදාද?' යයි ඇසීය

"'හෙට' ක්‍රෝස් සොහොයුරා පිළිතුරු දුන්නේය.

"'අපි ආපසු එන්නේ කවදාද' සහායකයා ඇසීය.

"'ඕ, සතියකින් පමණ–ඒ කාලය තුල එන්ට පුළුවන් නුනොත්!"

"තවද දුර බැහැර සිටි ඩෙන්ඩෝෆර් සොහොයුරා බැහැදැකීමට ඔවුහු පිටත්වූහ. යුද්ධයට පෙර හමුවූවාට පසුව නිවාස ගුරුවරුන් ඔහුව බැහැදැක නැත. දැන්, ඔහු ස්වාමීන්වහන්සේගේ සේවකයන් දුටු විට, ඔහු සම්පූර්ණයෙන්ම යටපත්විය. ඔහු ඔවුන්ට අතට අත දුන්නේ නැත, ඒ වෙනුවට, ඔහු තම නිදන කාමරයට ගොස් රහසිගත සැඟවුන ස්ථානයකින් ඔහුගේ දසයෙන් කොටස ගත්තේය. එය ඔහු සභාවේ සාමාජිකයෙකුවූ දවසේ සිට හංගේරියාවට නැවත පැමිණීම දක්වා ඉතිරිකල මුදල්ය. තම දසයෙන් කොටස ඔහුගේ නිවාස ගුරුවරුන්ට දුන් ඔහු, 'දැන්, මා ස්වාමීන්වහන්සේ සමගය. දැන් ස්වාමීන්වහන්සේගේ සේවයකන්ගේ අත ගැනීමට මම සුදුසු යයි මට හැඟේ! යයි කීවේය.'

"ක්‍රෝස් සොහොයුරා ඔහු අමතා ස්විස්සර්ලන්තයේ දේවමාළිගාවට යාමට ඔහු තුළ පවතින කැමැත්ත ගැන ඔහුගෙන් ඇසීය. ඩෙන්ඩෝෆර් සොහොයුරා මෙසේ කීයඃ 'එය අසීරු දෙයක්, මම උත්සාහ පිට උත්සාහ කළෙමි. රජය මගේ සභා පොත් , මගේ වටිනාම වස්තුව පවා රාජසන්තක කර ඇත.'

"ආදි පීතෘවරයෙකුවූ, ක්‍රෝස් සොහොයුරා, ඩෙන්ඩෝෆර් සොහොයුරාට ආදි පීතෘ ආශිර්වාදයක් පිරිනැමීය. ආශිර්වාදය අවසන්කිරීමේදී, ඔහු ඩෙන්ඩෝෆර් සොහායුරාට, 'ස්විස්සර්ලන්තයට යාම ගැන නැවතත් රජය සමග කථාකරන්න' යයි කීවේය. ඩෙන්ඩෝෆර් සොහොයුරා නැවත වරක් බලධාරීන්ට ඉල්ලීම ඉදිරිපත් කළේය. මෙවර අනුමැතිය ලැබිනි. මහත් සතුටකින් යුතුව ඩෙන්ඩෝෆර් සොහොයුරා ස්විස් දේවමාළිගාවට ගොස් මාසයක් නැවතී සිටියේය. ඔහු තම එන්ඩවුමන්ට් ලබාගත්තේය. ඔහුගේ මියගිය බිරිඳ ඔහුට මුද්‍රාකළේය. එසේම ඔහුගේ සිය ගණනක් මුතුන් මිත්තන් වෙනුවෙන් වැඩකටයුතු කිරීමටද ඔහුට හැකියාව ලැබින. ඔහු නැවතත් නිවසට පැමිණියේ ශරීරය සහ ආත්මයද අළුත්කරගෙනය" (in Conference Report, අප්‍රේ. 1996, 64–65; හො *Ensign,* මැයි 1996, 45–46).

# 22

වෙනි පාඩම

# “ස්වාමීන්වහන්සේ සිත බලනසේක”

*1 සාමුවෙල් 9–11; 13; 15–17*

**අරමුණ**

තමන්ගේම නුවණෙහි නොපිහිටා ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසකිරීමට පංති සාමාජිකයන් දිරිගැන්වීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න;

   අ. 1 සාමුවෙල් 9–11. සාවුල් අනාගතවක්තෘ සාමුවෙල්ගෙන් උපදෙස් පතයි (9:1–14, 18–24). සාවුල් රජු බව ස්වාමීන්වහන්සේ සාමුවෙල්ට එළිදරව් කරනසේක (9:15–17). සාමුවෙල් සාවුල්ට උපදෙස් දෙමින් ඉශ්‍රායෙල් ප්‍රථම රජු ලෙස ඔහු ආලේපකරයි (9:25–27; 10:1–8). සාවුල් ආත්මිකව නැවත ඉපදී, ඔහු අනාවැකි කියයි (10: 9–13). සාමුවෙල් සාවුල්ව ජනතාවට ඉදිරිපත් කරයි (10:17–27). සාවුල් ඉශ්‍රායෙල්වරුන්ට නායකත්වය දී ඇමොනයිට්වරුන් හා සටන ජයග්‍රහනය කරයි (11:1–11). තම ජනතාවට නායකත්වය දීමට ඔහුට නොහැකි යයි සැක සිතූ මිනිසුන්ට දඬුවම්කිරීම ඔහු ප්‍රතික්ෂේප කරයි (11:12–15).

   ආ. 1 සාමුවෙල් 13:1–14. සාවුල් නිසි අධිකාරීබලයක් නොමැතිව දවන පූජ ඔප්පුකරයි.

   ඇ. 1 සාමුවෙල් 15. අමෙලිකායිවරුන් සහ ඔවුන්ට අයත් සියලුම දේවල් විනාශකිරීමට සාවුල් අණ ලබයි. නමුත් ඔහු පූජාකිරීම සඳහා ඔවුන්ගේ සතුන් කිහිපදෙනෙක් ඉතිරිකරයි (15:10–35). සාවුල්ගේ රජකම ස්වාමීන්වහන්සේ ප්‍රතික්ෂේපකරන අතර, සාමුවෙල් සාවුල් අමතා, කීකරුකම පූජාකිරීම්වලට වඩා හොඳ බව කියයි (15:10–35).

   ඈ. 1 සාමුවෙල් 16. සාවුල් වෙනුවට රජු ලෙස, තරුණ එඬේර පිරිමි ළමයෙකුවූ දාවිත්ව ස්වාමීන්වහන්සේ තෝරාගන්නාසේක (16:1–13). ශුද්ධ ආත්මයාණන් සාවුල්ගෙන් පිටත්ව යන අතර නපුරු ආත්මය ඔහුව අයත්කර ගනියි (16:14–16). සටහන, ජෝසෆ් ස්මිත්ගේ පරිවර්තනය මෙම පද නිවැරදිකරමින්, නපුරු ආත්මය දෙවියන්වහන්ගෙන් නොවන බව පෙන්වා දෙයි.) සාවුල් තමා වෙනුවෙන් වීණාව වාදනය කිරීමට දාවිත්ව තෝරාගෙන ඔහුගේ ආයුධ ගෙනයන්නාද වුණේය (16:17–23).

   ඉ. 1 සාමුවෙල් 17. දාවිත් ස්වාමීන්වහන්සේගේ ශක්තියෙන් ගෝලියත්ව මරාදමයි.

2. අමතර කියවීම්: 1 සාමුවෙල් 12; 14.

3. ස්වාමීන්වහන්සේ දාවිත්ව රජු වශයෙන් තෝරාගැනීම පිළිබඳ විස්තරය සංක්ෂේප කිරීමට සූදනම්වීම සඳහා එක් පංති සාමාජිකයෙකුගෙන් ඉල්ලීමටද (1 සාමුවෙල් 16:1–13), සහ තවත් සාමාජිකයෙකුගෙන් දාවිත් ගෝලියත්ව මරාදැමීමේ විස්තරය සංක්ෂේපකිරීමට සූදානම්වීමට ඉල්ලීමටද ඔබට අවශ්‍යවිය හැකිය (1 සාමුවෙල් 17:1–54).

4. ඔබ කුමන අවධානශීලී ක්‍රියාකරකමක් පාවිච්චි කළද, පහත සඳහන් ශුද්ධ ලියවිල්ල හුණුලැල්ලේ හෝ පෝස්ටරයක ලියන්න. “නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න. නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සළකාපන්න, එවිට උන්වහන්සේ නුඹේ මාර්ග සමතලාකරනවා ඇත” (හිතෝපදේශ 3:5–6). ඔබ පළවෙනි අවධානශීලී ක්‍රියාකාරකම පාවිච්චි කරන්නේ නම්, බයිබල් ශබ්දකෝෂයේ එන පංති සාමාජිකයන්ට නුහුරු, ඩිසප්‍රෝවා, හිසොප්, හෝ ලේවර් වැනි වචනයක් තෝරාගන්න. මෙම වචනය හුණුලැල්ලේ හෝ පෝස්ටරයෙහි ලියන්න.

5. පහත සඳහන් දෘෂ්‍ය මාධ්‍ය තිබේ නම්, පාඩමේ කොටස් ලෙස ඒවා පවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය:

   අ. දාවිත් සම්බන්ධ *පරණ ගිවිසුමේ වීඩියෝ ඉදිරිපත්කිරීමේ* මිනිත්තු- හතරක කොටසකි (53224).

   ආ. දාවිත් ගෝලියත්ව මරාදමන පින්තූරය (62073; සුභාරංචි කලා පින්තූර මල්ල 112).

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. පංතියට වඩාත් යෝග්‍ය ක්‍රියාකාරකමක් තෝරාගන්න.

1. ඔබ හුණුලෑල්ලේ හෝ පෝස්ටරයේ ලියන ලද නුහුරු වචනයට පංති සාමාජිකයන් යොමුකරන්න (ඉහත "සූදානම්වීම" බලන්න). එම වචනයේ තේරුම අනුමානයෙන් කීමට පංති සාමාජිකයන්ට කියන්න. අනුමානකිරීම් කිහිපයකට පසුව, නිවැරදි තේරුම බයිබල් ශබ්දකෝෂයේ (හෝ වෙනත් ශබ්දකෝෂයක) බලන ලෙස පංති සාමාජිකයන්ට කියන්න.

   නුහුරු වචනයක තේරුම අනුමානකිරීම, අපගේම නුවණෙහි පිහිටා තීරණගැනීම හා සමානවන බව පහදාදෙන්න. හිතෝපදේශ 3:5–6 පාඨය ප්‍රදර්ශනය කරන්න. වචනයක නිවැරදි තේරුම දැනගැනීම සඳහා අපි විශ්වාස මාර්ගයකට හැරෙන පරිදි, අපද ස්වාමීන්වහන්සේ වෙත විශ්වාසය තබා අපගේ ජීවිතවල නිවැරදි තීරණ ගැනීමට උන්වහන්සේගේ කැමැත්ත සෙවිය යුතුය. මෙම පාඩම සාවුල් සහ දාවිත්, මිනිසුන් දෙදෙනාගේ අත්දැකීම් සංසංදනය කරමින්, අප තීරණගන්නා විට ස්වාමීන්වහන්සේ විශ්වාසකර, උන්වහන්සේගේ උපදෙස් සෙවීමේ වැදගත්කම උගන්වයි.

2. පංති සාමාජිකයන් මෑතකදී ගත් වැදගත් තීරණ කිහිපයක් ප්‍රකාශකරන ලෙස ඔවුන්ට කියන්න. එම තීරනගැනීමට ඔවුන්ට උපකාර කලේ කුමක්දැයි අසන්න.

   හිතෝපදේශ 3:5–6 පාඨය ප්‍රදර්ශනය කරන්න (පංති සාමාජිකයන් මෙම ශුද්ධ ලියවිල්ල කටපාඩම්කිරීම ඔබට අවශ්‍යවිය හැකිය). මෙම පාඩම සාවුල් සහ දාවිත්, මිනිසුන් දෙදෙනාගේ අත්දැකීම් සංසංදනය කරමින්, අප තීරණගන්නා විට ස්වාමීන්වහන්සේ විශ්වාසකර, උන්වහන්සේගේ උපදෙස් සෙවීමේ වැදගත්කම උගන්වන බව පහදාදෙන්න

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡාව සහ ඒවා අදාළකරගැනීම**

ඔබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළ කරගන්නා අන්දම ගැනද සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලි මූලධර්මවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න. මෙම පාඩමේ එන සෑම ප්‍රශ්නයක්ම ඇසීම හෝ සෑම කරුණක්ම ආවරණයකිරීම අසීරු නිසා, පංති සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් හොඳින් සපුරාලන දේවල් යාච්ඤාවෙන් යුතුව තෝරාගන්න. උදාහරණයක් ලෙස, දාවිත් සහ ගෝලියත් ගැන අවධානය යොමුකිරීමට ඔබට අවශ්‍ය නම්, සාවුල්ගේ ජීවිතය ගැන සාකච්ඡාකිරීමට මඳ කාලයක් වැයකරන්න.

**1. සාවුල් සාමුවෙල්ගෙන් උපදෙස් පතන අතර ඔහුව රජු ලෙස ආලේප කරයි.**

1 සාමුවෙල් 9–11 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ඉශ්‍රායෙල්වරුන්ට ඔවුන් වටා සිටින ජාතීන්ට මෙන් රජෙක් අවශ්‍යවිය. ඉශ්‍රායෙල්වරුන්ගේ ඉල්ලීමට එකඟවුන ස්වාමීන්වහන්සේ, සාවුල්ව ඉශ්‍රායෙල්වරුන්ගේ ප්‍රථම රජු ලෙස ආලේපකිරීමට සාමුවෙල්ට කීසේක. සාවුල් වනාහි "තෝරාගත් තරුණ මනුෂ්‍යයෙක්වූ අතර,. . .ඔහුට වඩා ශෝභන කෙනෙක් ඉශ්‍රායෙල් පුත්‍රයන් අතරේ සිටියේ නැත" (1 සාමුවෙල් 9:2). සාවුල්ව රජු වශයෙන් ආලේපකිරීමට පෙර සහ එයින් කෙටි කලකට පසු ඔහුගේ යහපත් ගුණාංග ප්‍රදර්ශනයවීමට ඔහු කළ දේවල් මොනවාද?

  අ. ඔහු තම පියාගේ කොටළුවන් සෙවීමට උනන්දු විය (1 සාමුවෙල් 9:3–4).
  ආ. ඔහු තම පියාගේ සේවකයාගේ ඥානවන්ත උපදෙස්වලට සවන්දී ඒවා අනුගමනය කිරීමට කැමතිවිය (1 සාමුවෙල් 9:5–10).
  ඇ. ඔහු අනාගතවක්තෘ සාමුවෙල් විශ්වාසකර ඔහු සමග සංවාදයෙහි යෙදුනේය (1 සාමුවෙල් 9:18–25).
  ඈ. ඔහු නිහතමානී වූවේය (1 සාමුවෙල් 9:20–21).
  ඉ. ඔහු ආත්මිකව නැවත ඉපදී, අනාවැකි කීවේය (1 සාමුවෙල් 10:6–10).
  ඊ. ඔහු තමාගේ විවේචකයන්ට සමාව දුන්නේය (1 සාමුවෙල් 11:11–13).

උ. ඉශ්‍රායෙල්වරුන් අමොනායිවරුන් පරදවා ජයගැනීමේදී ස්වාමීන්වහන්සේ කළ උපකාරය ඔහු හඳුනාගත්තේය (1 සාමුවෙල් 11:13).

**2. සාවුල් නිසි අධිකාරීබලයක් නොමැතිව දවන පූජා ඔප්පුකරයි.**

1 සාමුවෙල් 13:1–14 උගන්වමින් සකච්ඡාකරන්න.

- සාවුල්ව රජු වශයෙන් ආලේපකර වසර දෙකකට පසුව, පිලිස්තිවරු ඉශ්‍රායෙල්ට විරුද්ධව සටන්කිරීමට බලවත් හමුදාවක් රැස්කළහ. බලවත් ලෙස බියට පත්වූ සාවුල්ගේ මනුෂ්‍යයන්ගෙන් බොහෝ දෙනෙක් සැඟවී, විසිර ගියහ. මේ අවස්ථාවේදී සාමුවෙල් අනාගතවක්තෘවරයා තමන් ලඟට ගෙන්වාගැනීම සාවුල්ට අවශ්‍යවූයේ මන්ද? (1 සාමුවෙල් 13:7–8. ජනතාව වෙනුවෙන් ස්වාමීන්වහන්සේට පූජා ඔප්පුකරන ලෙස සාවුල් සාමුවෙල්ට කීවේය.) නියමකරගත් වෙලාවට සාමුවෙල් නොපැමිණීම නිසා සාවුල් කළේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 13:9. සාවුල්ට පූජා ඔප්පුකිරීමට පූජකවරයේ අධිකාරීබලය නොමැතිව තිබියදී ඔහු තමා විසින්ම පූජා ඔප්පුකළේය.)

  වැඩිමහල් ජේම්ස් ඊ. තැල්මේජ් මෙසේ ලිවීය, "සාවුල් තමා විසින්ම දවන පූජා සූදානම්කළේය. ඔහු සිහසුන දරා සිටියද, ඔටුන්න පැළඳ සිටියද, ආධිපත්‍යය දරා සිටියද, දෙවියන්වහන්සේගේ පූජකවරය. . . ක්‍රියාත්මක කිරීමට ඔහුට අයිතිවාසිකමක් [තිබුනේ නැති] බව ඔහු අමතක කළේය; එසේම මේ අවස්ථාවේ සහ වෙනත් අවස්ථාවලදී ඔහුගේ අනවසර ක්‍රියා නිසා දෙවියන්වහන්සේ විසින් ඔහුව ප්‍රතික්ෂේපකර ඔහු වෙනුවට වෙනත් අයෙක් රජු බවට පත්කරන ලදහ (*The Articles of Faith*, 12 වන ප්‍රකා. [1924], 185).

- සාවුල්ගේ අනවසර පූජා ඔප්පු කිරීමට සාමුවෙල්ගේ ප්‍රතිචාරය වුනේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 13:10–14.)

- සාවුල්ගේ අනවසර පූජා ඔප්පුකිරීමෙන් ඔහු ගැන එළිදරව්වූයේ කුමක්ද? (ඔහු තවදුරටත් "[ස්වාමීන්වහන්සේගේ] සිතට එකඟ මනුෂ්‍යයෙකු නොවනබවය" [1 සාමුවෙල් 13:14]. ඔහු නොඉවසිලිමත් ලෙස හැදී වැඩුනු, ස්වාමීන්වහන්සේව විශ්වාසකිරීමට අසමත්වූ අකීකරු අයෙක් බවය. එයට අමතරව, පූජා පුදකිරීම තමාටම බාරගැනීමෙන් ඔප්පුවන්නේ ඔහු තමා සතු බලය සහ වැදගත්කම ගැන වුවමනාවට වඩා සිතාසිටි බවය.) සමහර අවස්ථාවලදී අප ස්වාමීන්වහන්සේ සහ උන්වහන්සේගේ සේවකයන් සමග නොඉවසිලිමත්වන්නේ කුමන මාර්ගවලින්ද? එවැනි නොඉවසිලිමත්වීමේ ප්‍රතිඵල විය හැක්කේ මොනවාද? ස්වාමීන්වහන්සේව සම්පූර්ණනේම විශ්වාසකිරීමට අපට හැකිවන්නේ කෙසේද?

**3. අමෙලිකායිවරුන් සමග සටනේදී සාවුල් ස්වාමීන්වහන්සේට අකීකරුවීමෙන් රජෙක් ලෙස ප්‍රතික්ෂේපවෙයි.**

1 සාමුවෙල් 15 උගන්වමින් සාකච්ඡාකරන්න.

- ස්වාමීන්වහන්සේ සාවුල්ට නියෝග කළේ අමෙලිකායිවරුන්ට කුමක් කිරීමටද? (බලන්න 1 සාමුවෙල් 15:1–3). ඒ වෙනුවට සාවුල් කුමක් කළේද? (බලන්න 1 සාමුවෙල් 15:4–9.) සාවුල්ගේ ක්‍රියාවෙන් ඔහු ගැන එළිදරව්වූයේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 15:11. ඔහු ස්වාමීන්වහන්සේගේ කැමැත්ත කිරීම වෙනුවට ඔහුගේම විනිශ්චය අනුගමනය කළේය.)

- සාවුල් අමෙලිකායිවරුන්ගේ හොඳම සතුන් ඉතිරිකරගැනීමෙන් පෙන්වූ තම අකීකරුකම සාධාරණීය කිරීමට උත්සාහ කළේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 15:13–15, 20–21, 24. සතුන් ඉතිරිකරගැනීමට අවශ්‍යවීම ගැන ඔහු තම ජනතාවට චෝදනා කළේය.) සාවුල්ගේ කීම අනුව, අමෙලිකායිවරුන්ගේ හොඳම සතුන් ඉතිරිකරගැනීමට ඔහුගේ ජනතාවට අවශ්‍යවූයේ මන්ද? (බලන්න 1 සාමුවෙල් 15:15, 21.) ස්වාමීන්වහන්සේට අකීකරුවීම සමහර අවස්ථාවලදී අපි සාධාරණීය කිරීමට උත්සාහ කරන්නේ කුමන මාර්ගවලින්ද? (අපි අපටම මෙසේ කියා ගැනීමෙනි, "එය හුදෙක් කුඩා පාපයක්" "මා කීකරුවන්නේ වචනාර්ථයේ හැටියට නොව පරමාර්ථයේ හැටියටය." "එයින් කිසිවෙකුට හිරිහැරයක් නොවේ." මා එය උත්සාහ කළේ එක්වරක් පමණි." අනෙක් අයත් එසේ කරති," නැතහොත් "එම පණත අපට අදාළ නොවේ.") පාපවලට නිදහසට කරුණුකීම හෝ එය සාධාරණීයකිරීමේ කැමැත්ත අපි පිටුදකින්නේ කෙසේද?

- අමෙලිකායිවරුන්ගේ සතුන් ඉතිරිකරගැනීම වෙනුවෙන් සාවුල්ගේ නිදහසට කරුණුකීමට සාමුවෙල් ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? (බලන්න 1 සමුවෙල් 15:22.) සාමුවෙල්ගේ වචන අපට අදාළවන්නේ කෙසේද?

- ස්වාමීන්වහන්සේගේ වචනය ඉවතලීමට මුරණ්ඩුවීම ගැන සාවුල්ට තරවටුකරමින් සාමුවෙල් ඔහු අමතා, "මුරණ්ඩුකම. . . රූප ඇදහීමට සමානබව" කීවේය (1 සාමුවෙල් 15:23). මුරණ්ඩුකම රූප ඇදහීමට සමානවන්නේ කෙසේද? සාවුල් මුරණ්ඩුවී, කැරළිකාරයෙක් වීමෙන් ඇතිවූ ප්‍රතිඵලය කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 15:23, 26, 28.) සමහර අවස්ථාවලදී අප මුරණ්ඩු සහ කැරළිකරුවන් වන්නේ කෙසේද? අප මුරණ්ඩු සහ කැරළිකරුවන්වීමෙන් ඇතිවන ප්‍රතිඵල මොනවාද? මෙම ආකල්ප හඳුනාගෙන අප ඒවා මැඩපවත්වාගන්නේ කෙසේද?

**4. ස්වාමීන්වහන්සේ දාවිත්ව රජු වශයෙන් තෝරාගන්නාසේක.**

1 සාමුවෙල් 16 උගන්වමින් සාකච්ඡාකරන්න. මෙම විස්තරය පංති සාමාජිකයෙකු ලවා කෙටියෙන් සංක්ෂේප කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. සාමුවෙල් දාවිත්ව රජු ලෙස ආලේප කළද, සාවුල් මියගොස් වසර ගණනාවක් ගතවන තුරු දාවිත් රජු බවට පත් නොවූ බව පහදාදෙන්න.

- යෙස්සේගේ කුමන පුත්‍රයා ඊළඟ රජු විය යුතුදැයි නිශ්චයකිරීමට සාවුල් උත්සාහකිරීමේදී ඔහු දැනගත්තේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 16:6–7.) දාවිත්ව තෝරාගැනීමේ ස්වාමීන්වහන්සේගේ ක්‍රමය, උන්වහන්සේ වර්තමාන නායකයන් තෝරාගැනීමට සමානවූයේ කෙසේද? ස්වාමීන්වහන්සේ අපව අගයකරන අන්දම ගැන 1 සාමුවෙල් 16:7න් අපට උගන්වන්නේ කුමක්ද? ස්වාමීන්වහන්සේ අපගේ සිතේ කුමක් සොයනසේක්ද?

  වැඩිමහල් මාර්වින් ජේ. ඈෂ්ටන් මෙසේ කීවේය:

  "අපි . . . අන්‍යයන් අගයකිරීමට නැඹුරුවන්නේ ශාරීරික, බාහිර පෙනුම: ඔවුන්ගේ 'යහපත් පෙනුම,' ඔවුන්ගේ සමාජ තත්වය, ඔවුන්ගේ පවුල් පෙළපත, ඔවුන්ගේ උපාධි හෝ ඔවුන්ගේ ආර්ථික තත්වයන් පදනම්කර ගෙනය.

  "කෙසේවෙතත්, ස්වාමීන්වහන්සේට, වෙනත් ප්‍රමිතියක් තිබෙන අතර, උන්වහන්සේ එමගින් පුද්ගලයෙක් මනිනසේක. . . .උන්වහන්සේ පුද්ගලයෙකුගේ හිස වටා මිනුම් පටියක් තබා ඔහුගේ මානසික තත්වය නිශ්චයකරන්නේවත්, ඔහුගේ පෞරුෂත්වය නිශ්චයකිරීමට එය ඔහුගේ පපුව වටා තබන්නේවත් නැත. නමුත් අන් අයට ආශිර්වාද කිරීමේ පුද්ගලයාගේ හැකියාව සහ පුළුවන්කම ගැන ඔහුගේ හදවත දර්ශකයක් ලෙස ගෙන උන්වහන්සේ මැන බලනසේක" (in Conference Report, ඔක්තෝ. 1988, 17; හෝ *Ensign*, නොවැ. 1988,

- අන් අය සමග තිබෙන අපගේ සම්බන්ධකම්වලදී, ඔවුන්ගේ බාහිර පෙනුම අභිබවා හදවත දෙස බැලීම වැදගත්වන්නේ මන්ද? මෙය කිරීම සඳහා අපගේ හැකියාව සහ කැපවීම අප දියුණුකරගන්නේ කෙසේද?

- සාවුල් අකීකරුවූ නිසා, ස්වාමීන්වහන්සේගේ ආත්මය ඔහුගෙන් පිටවී ගියසේක (1 සාමුවෙල් 16:14). තමා පිට පැමිණුන නපුරු ආත්මයෙන් සාවුල් සහනය පැතුවේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 16:15–23.) වර්තමානයේදී ජනයා සමහර අවස්ථාවලදී ඔවුන්ගේ පාපවලට සහනය සෙවීමට උත්සාහකරමින් යොමුවන බාහිර උපකාරක මොනවාද? අපගේ පාපවලට සහනය ලැබීමට ස්වාමීන්වහන්සේ අපට ලබාදී තිබෙන මාර්ගය කුමක්ද? (බලන්න මතෙව් 11:28–30; ධීසහසී 58:42.)

- දාවිත්ට නායකයෙකුවීමට සුදුස්සෙකුවීම සඳහා ඔහු සතුව තිබූ ගුණාංග මොනවාද? (බලන්න 1 සාමුවෙල් 16:18.)

**5. දාවිත් ස්වාමීන්වහන්සේගේ ශක්තිය ඇතිව ගෝලියත්ව මරාදමයි.**

1 සාමුවෙල් 17 උගන්වමින් සාකච්ඡාකරන්න. මෙම විස්තරය කෙටියෙන් සංක්ෂේපකිරීමට පංති සාමාජිකයෙකුට පැවරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

- ගෝලියත් හා සටනේදී ඉශ්‍රායෙල්වරුන්ට ලැබීමට හෝ නැතිවයාමට හැකිව තිබුනේ මොනවාද? (බලන්න 1 සාමුවෙල් 17:8–9.) සාවුල් සහ ඔහුගේ හමුදාව ගෝලියත් හා සටන්කිරීමට බියවුනේ

මන්ද? (බලන්න 1 සාමුවෙල් 17:4–11. ගෝලියත්ව පරාජයකිරීමට ඔවුන්ට හැකි වෙතැයි ඔවුන් නොසිතුවේ, ඔහුගේ ශරීර ප්‍රමානය, ශක්තිය, යුධ ඇඳුම සහ ආයුධ නිසාය.)

- ගෝලියත් සමග සටන්කිරීමට දාවිත්ට ධෛර්‍යයය ලැබුනේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 17:32–37, 45–47. දාවිත් සිය පියාගේ බැටළුවන් රැකබලාගෙන සිටියදී ස්වාමීන්වහන්සේ ඔහුව සිංහයෙකුගෙන් සහ වළසෙකුගෙන් ගලවාගත්බව තේරුම්ගෙන, ඔහු ගෝලියත් සමග සටන්කිරීමට ස්වාමීන්වහන්සේ ඔහුට උදව්කරන බව විශ්වාස කළේය.)
- දාවිත් තමා සමග සටනට එන බව දුටු ගෝලියත් කීවේ මොනවාද? (බලන්න 1 සාමුවෙල් 17:42:44.) දාවිත් ප්‍රතිචාර වශයෙන් කීවේ මොනවාද? (බලන්න 1 සාමුවෙල් 17:45–47.) මිනිසුන් අපට සමච්චල්කරන හෝ තර්ජනයකරන විට, දාවිත්ගේ ප්‍රතිචාරය සිහිපත්කිරීම අපට උපකාරවත්වන්නේ කෙසේද?
- තරුණයෙකුව සිටියදී දාවිත් සිංහයෙකු සහ වළසෙකු ජයගැනීමෙන් ගෝලියත් වැනි බලවත් අභියෝගයකට මුහුණදීමට සූදනම්වීමට ඔහුට උපකාරවත් විය. බලවත් අභියෝගවලට මුහුණදීම සඳහා අපව සූදානම්කිරීමට අපට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග මොනවාද? මෙම අභියෝගවලට අප දක්වන ප්‍රතිචාර, පසුව පැමිණිය හැකි ගෝලියත්ලා සමග සටන්කිරීමේ අපගේ හැකියාවට බලපාන්නේ කෙසේද? අපගේ ජීවිතවල සිටින සිංහයන් සහ වළසුන් සමග අප සටන්කරන විට, අපගේ ගෝලියත්ලා පරාජයකිරීමට අවශ්‍ය විශ්වාසය, චරිතය සහ ඇදහිල්ල අපි දියුණුකගන්නා බවට සාක්ෂිදරන්න
- අපට වර්තමානයේදී හමුවන ගෝලියත්ලා කවුද? ඔවුන්ව ජයගන්නා අන්දම ගැන අපට දාවිත්ගෙන් ඉගෙනගත හැක්කේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 17:45; එපීස 6:11–18.) ඔබ මුහුණදුන් ගෝලියත්ලා ජයගැනීමට ස්වාමීන්වහන්සේ ඔබට උපකාර කර තිබෙන්නේ කෙසේද?

ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිතුමා මෙසේ කීවේය:

"ඔබ සියල්ලන් වටා සෑම තැනම, අතිවිශාල යෝධයන්, නපුරු අභිමතාර්ථයන් සහිතව ඔබව විනාශ කිරීම සඳහා සිටිති. මොවුන් අඩි නමයේ මිනිසුන් නොවන නමුත්, ඔවුන් නපුරු දේවල් සිත්ගන්නා ලෙසින් පාලනයකරන මිනිසුන් සහ ආයතන වන අතර, ඒවා ඔබට අභියෝගකර, දුර්වලකර, ඔබව විනාශකරනු ඇත. මේවාට බීර සහ වෙනත් මත්පැන් සහ දුම්කොළ ඇතුළත්වේ. මේවා අලෙවිකරන අය ඒවා පාවිච්චිකිරීමට ඔබව වහලුන් කරති. විවිධ වර්ගවල මත් ද්‍රව්‍ය තිබෙන අතර, බොහෝ උසස් පාසල්වලට පහසුවෙන්ම ලබාගත හැකි බව මට කියා ඇත. මන්ද මේවා විකුණන අයට, එය ඩොලර් කෝටි ගණන් මුදල් උපයන කර්මාන්තයක්, නපුරු යෝධ දැලක්ය. දුශ්චරිතයට ආරාධනාකරන සිත්ගන්නා කාමුක සඟරාද බෙහෝය. එය යෝධ කර්මාන්තයක්වී, සඟරා, චිත්‍රපට සහ වෙනත් දේවල් නිෂ්පාදනය කරමින්, ඔබගේ මුදල් ගැනීමට සැලසුම්කර, ඔබව විනාශකරන ක්‍රියාවන්ට ඔබව යොමුකරවයි.

"මෙම උත්සාහයන් පිටුපස සිටින් යෝධයෝ දරුණු අති දක්ෂයන්ය. ඔවුන් ක්‍රියාත්මක කරන යුද්ධය තුලින් ඔවුන් අති විශාල අත්දකීම් ලබා ඇත. ඔවුන්ගේ කැමැත්ත ඔබව උගුලට හසුකර ගැනීමය.

"ඔවුන්ගේ නිෂ්පාදන පැතිරීයාම සම්පූර්ණයෙන්ම නැවැත්වීමට නොහැකිය. මෙම ද්‍රව්‍ය සෑම තැනම ඇති බව ඔබට පෙනේ. ඔබගේ අත්වල සත්‍යයේ කැටපෝලය තිබේ නම්, ඔබ බියවිය යුතු නැත. ඔබට උපදෙස්දී, උගන්වා, අවවාදකර ඇත. ඔබව ජයගැනීමට අපේක්ෂාකරන සතුරාට විරුද්ධව පාවිච්චිකිරීමට ඔබ සතුව යහපත්බව සහ ගෞරවය සහ අවංකත්වය නැමැති ගල් ඇත. ඔබ සැලකිලිමත්ව සිටීනම් ඔවුන්ව මවිත කිරීම සඳහා ඔවුන්ගේ 'ඇස් අතරට' විදීමට ඔබට පුළුවන. ඔබවම හික්මවාගෙන ඔවුන්ව මගහැරීමෙන් ඔවුන්ව ජයගැනීමට ඔබට පුළුවන. දාවිත් ගෝලියත්ට කී ලෙස ඔවුන් සියලුදෙනාටම මෙසේ කීමට ඔබට පුළුවන, "තෝ කුවක්ද, හෙල්ලයක්ද, කුඩා හෙල්ලයක්ද රැගෙන මා ළඟට එන්නෙහිය. මම වනාහි තා නින්දාකල ඉශ්‍රායෙල් හමුදාවල දෙවිවූ සේනාවල ස්වාමීන්වහන්සේගේ නාමයෙන් තා ළඟට එමි"

"ජයග්‍රහනය ඔබ අතේය. . . ඔබව දරාගැනීම සඳහා උන්වහන්සේගේ බලය ඔබ සතුව ඇත. ඔබව ආරක්ෂාකිරීමට ඔබ වටා සිටින දේවදූතයන් මෙහෙකිරීමේ අයිතිවාසිකම ඔබට ඇත. ගෝලියත්ලාට ඔබව බියකිරීමට ඉඩ නොදෙන්න. ඔබගේ විශ්වාසය ආරක්ෂාකර, ඔබගේ

ස්ථානය දරා සිටින්න, එවිට ඔබ ජයග්‍රාහී වනු ඇත" (in Conference Report, අප්‍රේ. 1983, 66; හෝ *Ensign*, මැයි 1983, 46, 51).

---

අවසානය

ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා, කීකරුවීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න. එසේ කිරීම මගින් ලැබෙන පොරොන්දුව නම්, ඔවුන් ශක්තිමත්ව වැඩී, පෞද්ගලික ගෝලියත්ලා ජයගැනීමට ස්වාමීන්වහන්සේගේ උපකාරවන බවට උන්වහන්සේගේ සහතිකය ඔවුන්ට ලැබෙනු ඇත. ස්වාමීන්වහන්සේ අපගේ සිත් දෙස මිස, අපගේ වස්තුව හෝ තත්වය හෝ ජනප්‍රිය ප්‍රමිතීන් දෙස නොබලන බව පංති සාමාජිකයන්ට සිහිපත්කරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් කරුණු යෝජනා කල පාඩමේ සංක්ෂේපයක් ඉදිරිපත් කරයි. මෙම අදහස් එකක් හෝ කිහිපයක් පාඩමේ කොටසක් ලෙස පාවිච්චි කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

**1. පාප සාධාරණීයකිරීම**

වැඩිමහල් ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් උපුටාගැනීම අමෙලිකායිවරුන් සම්බන්ධ සාවුල්ගේ අකීකරුකම ගැන ඔබ සාකච්ඡාකරන විට ඔබට උපකාරවත් විය හැකියඃ

"ජයග්‍රාහී රජවරුන් පාවිච්චිකල දේවල් ඉවතදැමීමට කීකරුවීම වඩා පහසු බව සාවුල් සාධාරණීය කළේය. නමුත් තර බැටළුවන් සහ වස්සන් තබා නොගන්නේ මන්ද? යටහත් සාමුවෙල්ට වඩා ඔහුගේ රාජකීය විනිශ්චය උසස් නොවුයේද?. . . .

"වර්තමානයේ ඉශ්‍රායෙල්වරුන් බොහොමයක් සාවුල් හා සමානවන්නේ කෙසේද? සමහරෙක් ස්වාමීන්වහන්සේගේ සෞඛ්‍යය නීතියේ නීති පිළිපදින නමුත් විටින්විට ඔහුගේ කෝපි කෝප්පය ඔහුට තිබිය යුතුය; ඇය දුම් කොළ, හෝ මත්පැන් නොබොන අතර ඒවාට ඇය තුළ මහත් ආශාවල් නැත, නමුත් කෙසේ වුවද සැනසිළිදායක තේ කෝප්පය තිබිය යුතුය.

"ඔහු සභාවේ තනතුරක සේවය කරයි, මන්ද එහි ක්‍රියාකාරකමට ඔහු ප්‍රියකරමින් ගෞරව කරයි, ඔහු එයට මහත් ආශාවක් දක්වයි,. . . .නමුත් එය ඔහුට ඉතා අසීරුව පෙනෙන දසයෙන් කොටස නොගෙවීමට ඔහුට හේතුවක් සොයාගැනීම පහසුය. ඔහුට ඒ සඳහා පුළුවන්කමක් නැත. . . එය ඔහු කළාක් මෙන් එය නිතරම බෙදාහරින බවට ඔහුට ස්ථිර නැත. තවද ඔහුගේ අසමත්කම ගැන දැන සිටින්නේ කවුද?

"තවත් අයෙක් යම් රැස්වීම්වලට සහභාගිවෙයි. නමුත් දවසේ ඉතිරි කාලය සඳහා සාවුල් මෙන් නිදහසට කරුණු දෙයි. ඔහු බෝල ක්‍රීඩාවක් හෝ චිත්‍රපට දර්ශනයක් බැලීමට යාම, හෝ වත්තේ අත්‍යාවශ්‍ය වැඩකිරීමට හෝ සාමාන්‍ය පරිදි ව්‍යාපාර කටයුතු කිරීම හෝ නොකරන්නේ මන්ද?

"තවත් අයෙක් ඔහුගේ සභාවෙන් පිටත රාජකාරිවලට ආගමානුකූලව සහභාගි වෙයි. නමුත් ඔහුගේ පවුල් ප්‍රශ්න සම්බන්ධව කෙරෙන ඕනෑම යෝජනාවකට විරුද්ධවෙයි. නැතහොත් ඔහුගේ නිවසේ පවුලේ යාච්ඤාවට පවුල එකට එකතුවීමට ඉතාම අසීරු අවස්ථාවල ඔහු මගහරියි

"සාවුල්ද එසේ විය. වාසිදායක දේවල් ඔහුට කළ හැකිවූ නමුත් ඊට ප්‍රතිවිරුද්ධ දේවලට නිදහසට කරුණු තිබින (in Conference Report, ඔක්තෝ. 1954, 51).

**2. අපගේ ගෝලියත්ලා පරාජයකිරීම**

ගෝලියත්ගේ උස ප්‍රමාණයට සමවන පරිදි අඩි 9 1/2ක (මීටර 3ක්) දිග ලණු කැල්ලක් කපාගන්න. නූල, ටේප් කැලි ස්වල්පයක්, කඩදාසි කිහිපයක් සහ ෆෙල්ට් පෑනක් පංතියට ගෙනයන්න. ලණුව සිරස් අතට බිත්තියේ අලවා එක් ටේප් කැල්ලක් උඩින් සහ තව කැල්ලක් යටින් අලවන්න (බිත්තිය උස මදිනම්, ලණුවේ අන්තිම කොටස බිම දිගේ තබන්න). ලණුව ගෝලියත්ව නියෝජනය කරන බව පංති සාමාජිකයන්ට කියන්න. පංති සාමාජියන්ට අනතුරුදායක යයි සිතෙන දේවල් කිහිපයක් නම්කිරීමට ඔවුන්ට කියන්න (පිළිතුරුවලට, ආඩම්බරකම, කාමුක සඟරා, ඊර්ෂ්‍යාව, සහ මත්ද්‍රව්‍ය ඇතුළත් විය හැකිය). එක් එක් අනතුර කඩදාසියක ලියා ලණුව ඉහළ සිට පහළට වැසීයාමට එක් එක් කඩදාසිය බිත්තිය සහ ලණුවට තබා ටේප්කරන්න.

ගෝලියත්ව පරාජය කිරීමට අපට ආයුධ අවශ්‍ය බව පහදාදෙන්න. ගෝලියත්ව පරාජය කල හැකි ආයුධ නම් කිරීමට පංති සාමාජිකයන්ට කියන්න (පිළිතුරුවලට, ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම, යාච්ඤාකිරීම, ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීම, සත්‍ය ඉගෙනගැනීම, සදාචාරාත්මකව පවිත්‍රව සිටීම, සහ යහපත් මිතුරන් තෝරාගැනීම ඇතුළත් විය හැකිය). පංති සාමාජිකයන් එක් එක් ආයුධය නම්කරන විට, කඩදාසියක් ඉවත් කරන්න. ලණුවේ ඉහළ සිට පටන්ගෙන කඩදාසිය සහ බිත්තියට අලවා තිබෙන ටේප් කෑල්ල ගලවා ලණුව ඊළඟ කඩදාසිය මතට වැටීමට සලස්වන්න. සියලුම කඩදාසි සහ ටේප් ගලවා දැමීමෙන් පසුව, ලණුව පොළාව මතට වැටෙන අතර ගෝලියත්ව පරාජයකර ඇත.

# "ස්වාමීන්වහන්සේ සෑමකල්හිම නුඹත් මාත් අතරේ වනසේක"

23

වෙනි පාඩම

*1 සාමුවෙල් 18–20; 23–24*

**අරමුණ**

යොනාතාන් සහ දාවිත් මෙන් තම මිතුරන්ට සත්‍යවාදීවීම, සහ සාවුල් මෙන්, ඊර්ෂ්‍යාව සහ වෛරය ඇතිවීම වලක්වාගැනීමට පංති සාමාජිකයන් දිරිගැන්වීමය.

**සූදානම්වීම**

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.

   අ. 1 සාමුවෙල් 18:1–16. යොනාතාන් සහ දාවිත් මිත්‍රත්වයේ ගිවිසුමක් ඇතිකර ගනිති (18:1–4). දාවිත් සටන සාර්ථකව කළ නිසා ඉශ්‍රායෙල්වරුන් විසින් ඔහුට ගෞරවකරනු ලබයි (18:5–7). සාවුල් දාවිත් කෙරෙහි ඊර්ෂ්‍යාවී හෙල්ලයකින් ඔහුව මැරීමට උත්සාහ කරයි (18:8–16; සටහන, ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ 1 සාමුවෙල් 18:10 මගින් සාවුල් වෙත පැමිණි නපුරු ආත්මය දෙවියන්වහන්සේගෙන් නොවන බව පෙන්නා දෙයි).

   ආ. 1 සාමුවෙල් 18:17–30; 19:1–18. සාවුල්ගේ දියණිය හා විවාහවීම සඳහා හුවමාරුවක් වශයෙන් දාවිත් පිලිස්තිවරුන් සමග සටන්කරන නමුත්, දාවිත් සටන් බිමේ මියයාම සාවුල්ගේ අපේක්ෂාව බව නොදනියි (18:17–25). දාවිත් පිලිස්තිවරු පරාජයකර ජයලබමින් සාවුල්ගේ දියණිය මීකායෙල් හා විවාහ වෙයි (18:26–28). යොනාතාන් දාවිත්ට සැඟවීමට කියා ඔහුව නොමරන ලෙස දාවිත්ට ඒත්තුගැන්වීමට උත්සාහකරයි 19:1–7). දාවිත්ව හෙල්ලයකින් මරාදැමීමේ සාවුල්ගේ තවත් උත්සාහයක් ව්‍යවර්ථ වෙයි (19:9–10). දාවිත්ගේ ජීවිතය ගැනීමට සාවුල්ගේ තවත් උත්සාහයකින් මීකායෙල් දාවිත්ව ගලවයි (19:11–18).

   ඇ. 1 සාමුවෙල් 20. යොනාතාන් සහ දාවිත් ඔවුන්ගේ මිත්‍රත්වයේ සහ සමාදානයේ ගිවිසුම අළුත්කරති (සටහන, මෙම ගිවිසුම යොනාතාන් සහ දාවිත් අතර පමණක් ඇතිවූවක් නොව නමුත් ඔවුන්ගේ නිවෙසියන් අතරද වූවකි). සාවුල් නැවතත් දාවිත්ව මැරීමට උත්සාහකරන විට, යොනාතාන් දාවිත්ට පලායාමට අනතුරු අඟවයි.

   ඈ. 1 සාමුවෙල් 23–24. දාවිත් පිලිස්තිවරුන් හා සටන දිගටම කරමින් සාවුල්ගෙන් පලායයි. දාවිත්ට සාවුල් හමුවන නමුත් ඔහුගේ ජීවිතය ඉතිරිකරයි.

2. අමතර කියවීම්: 1 සාමුවෙල් 14:1–16; 2 සාමුවෙල් 1.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

**අවධානශීලී ක්‍රියාකාරකම**

පාඩම ආරම්භකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම (හෝ ඔබගේම එකක්) පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

පහත සඳහන් ප්‍රශ්නය පංති සාමාජිකයන්ගෙන් අසන්න:

- ඔබ මිතුරෙක් තුල සොයන යම් ගුණාංග මොනවාද? (පංති සාමාජිකයන්ගේ පිළිතුරු හුණුලෑල්ලේ ලිවීම ඔබට අවශ්‍යවිය හැකිය. පිළිතුරුවලට, පක්ෂපාතීත්වය, අවංකත්වය, පරාර්ථකාමීත්වය, කරුණාවන්තකම සහ දයාව ඇතුළත්විය හැකිය.)

මෙම පාඩමෙන් කොටසක් සැබෑ මිතුරෙකු වීම ගැන ඉගැන්වෙන බව පහදාදෙන්න.

**ශුද්ධ ලියවිලි අධ්‍යයනය සහ ඒවා අදාළකරගැනීම**

බිබ පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් උගන්වන විට, ඒවා දිනපතා ජීවිතයට අදාලකර ගන්නා අන්දම ගැන සාකච්ඡාකරන්න. ශුද්ධ ලියවිලිවලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

1. **යොනාතාන් සහ දාවිත් මිත්‍රත්වයේ ගිවිසුමක් ඇතිකර ගනිති. සාවුල් දාවිත් කෙරෙහි ඊර්ෂ්‍යාවී ඔහු මරාදැමීමට උත්සාහකරයි.**

1 සාමුවෙල් 18:1–16 උගන්වමින් සාකච්ඡාකරන්න.

ගෝලියත්ව මරාදැමීමෙන් පසුව දාවිත් ඉක්මණින්ම වීරයෙකු බවට පත්විය. සාවුල් රජතුමා සහ මුළු රාජධානියම ඔහුට ගෞරව කළහ. කෙසේවුවද, සාවුල්ගේ පුත්‍රයාවූ යොනාතාන් හැර අන් කිසිවෙක් දාවිත්ට විශ්වාස නොවීය.

- දාවිත් සහ යොනාතාන් එකිනෙකා ගැන සිතුවේ කෙසේද? (1 සාමුවෙල් 18:1, 3.) දාවිත්ට ඊර්ෂ්‍යාවීම යොනාතාන්ට එතරම්ම පහසුවක්ව තිබුනේ මන්ද?

  අ. කෙසේවුවද, සාමුවෙල් අනාගතවක්තෘවරයා ඊළඟ රජු වශයෙන් දාවිත්ව ආලේප කළේය (1 සාමුවෙල් 16:6–13).

  ආ. දාවිත් සටනින් සාර්ථකවීම නිසා ජනතාව විසින් ඔහුට විශාල ලෙස ගෞරවකරන විට, යොනාතාන්ටද සටන්බිමේදී ඔහුගේම සාර්ථකත්වය නිසා මඳ අවධානයක් හිමිවිය (1 සාමුවෙල් 14:1–16).

- යොනාතාන් දාවිත් කෙරෙහි ඊර්ෂ්‍යා නොවීම සහ ඔහුගෙන් තර්ජනයක් නොතිබූ බව ඔබ සිතන්නේ මන්ද? (1 සාමුවෙල් 18:1, 3.) යොනාතාන් දාවිත්ට තම සහයෝගය පෙන්වූයේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 18:4. ඔහු තම රාජකීය ඇඳුම සහ ආයුධ දාවිත්ට දුන්නේය.)

- දාවිත් ගෝලියත්ව මරාදැමීම ගැන සාවුල්ට හැඟුනේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 18:2, 5. සාවුල් දාවිත්ව ඔහුගේ නිවසට ගෙන ගොස් ඔහුව තම හමුදාවේ ප්‍රධානියා කළේය.) දාවිත් තම පක්ෂපාතකම සාවුල් රජුට පෙන්වූයේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 18:5.) දාවිත්ට විරුද්ධව හැරීමට සාවුල් පෙළඹවූයේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 18:6–9.) අන් අයගේ සාර්ථකත්වය ගැන සමහර අවස්ථාවලදී සතුටුවීමට අසීරුවන්නේ මන්ද? අපගේ ආත්මික සතුටට ඊර්ෂ්‍යාව සහ ආඩම්බරය බලපාන්නේ කෙසේද?

  එස්රා ටැෆ්. බෙන්සන් සභාපතිවරයා මෙසේ කීවේය:

  "සාවුල් ආඩම්බරය තුළින් දාවිත්ගේ සතුරෙකු බවට පත්විය. ඔහු ඊර්ෂ්‍යා සහගත වූයේ, කාන්තාවෝ සියලු ඉශ්‍රායෙල් නුවරවලින් නික්ම ගායනාකරමින්ද 'සාවුල් තෙමේ දහස් ගණනින්ද, දාවිත් දස දහස් ගණනින් මැරීයයි' කී නිසාය (1 සාමුවෙල් 18:7; තවද බලන්න 18:6, 8).

  "අහංකාරය මිනිසුන්ගේ විනිශ්චයය කෙරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චයයටත් වඩා බිය ඇතිකරන්නේය. . . . 'මිනිසුන් මා ගැන සිතන්නේ කුමක්ද? යන්න දෙවියන්වහන්සේ මා ගැන සිතන්නේ කුමක්ද?' යන්නට වඩා බරින් වැඩිය. . . .

  "මිනිසුන්ගේ විනිශ්චයයට බියවීම යන්නෙන් මිනිසුන්ගේ අනුමැතිය ලැබීමේ තරඟයක් ඇති බව පැහැදිලිවේ. අහංකාර අය 'දෙවියන්වහන්සේගෙන් ලැබෙන ප්‍රශංසාවට වඩා මනුෂ්‍යයන්ගෙන් ලැබෙන ප්‍රශංසාවට' ප්‍රියවේ (යොහාන් 12:42–43). අප කරන දේවල් සඳහා අපගේ අභිප්‍රාය වන්නේ අහංකාරකමේ පාපය අපි පෙන්වීමය. යේසුස්වහන්සේ ප්‍රකාශකළේ, උන්වහන්සේ කළේ 'නිතරම දෙවියන්වහන්සේ ප්‍රසන්න වන දේවල්' බවය (යොහාන් 8:29). අපගේ සොහොයුරාට ඉහළින් සිටීමට හෝ තව කෙනෙකුට අයහපතක් කිරීම වෙනුවට දෙවියන්වහන්සේ ප්‍රසන්නකිරීම අපගේ අභිප්‍රාය වීම අපට යහපතක් නොවන්නේද?

  "සමහර අහංකාරයෙන් පිරිනු මිනිසුන් කල්පනා කරන්නේ ඔවුන්ගේ අවශ්‍යතාවයන් සඳහා ඔවුන් උපයන මුදල ප්‍රමාණවත්ද කියා නොව ඔවුන් වෙනත් අයට වඩා වැටුපක් ලබන බවය. ඔවුන්ගේ විපාකය අන් අයට වඩා මඳක් යහපත්ය. . . .

  "අහංකාරකම අපගේ සිත් අල්ලාගත් විට, ලෝකයේ නිදහස අපට නැතිවීගොස්, අපගේ නිදහස මිනිසුන්ගේ විනිශ්චයයේ බන්ධනයට පවරාදෙයි. ශුද්ධාත්මයාණන්ගේ කොඳුරා කීමට වඩා ලෝකයා කෑගසයි. මිනිසුන්ගේ නිදහසට කාරණා දෙවියන්වහන්සේගේ එළිදරව්වලට ඉහළින් සළකයි, එසේම අහංකාරය සුභාරංචියට ඉහළින් යයි (in Conference Report, අප්‍රේ. 1989, 4–5; හෝ *Ensign,* මැයි 1989, 5).

- දාවිත්ට සටන්බිමේ සාර්ථකවීමට ස්වාමීන්වහන්සේ ආශිර්වාදකිරීමෙන් පසුව, ඔහු ක්‍රියා කළේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 18:5, 14–16.) ඔහුගේ ආදර්ශයෙන් අපට ඉගෙනගැනීමට හැකිවන්නේ මොනවාද? අපි සාර්ථකවූ විට, 'ඥානවන්ත ලෙස [අපව] හසුරුවාගැනීම' එයින් අදහස්වීම ගැන ඔබ සිතන්නේ කුමක්ද?

**2. දාවිත්ගේ ජීවිතය ගැනීමට උත්සාහකිරීමේදී සාවුල් තවත් තුන් වතාවක් අසමත්වෙයි**

1 සාමුවෙල් 18:17–30; 19:1–18. උගන්වමින් සාකච්ඡාකරන්න.

- දාවිත් පිලිස්තිවරුන් සමග සටන්කරන්නේ නම්, තම දියණියක් ඔහුට විවාහකරගැනීමට ඉඩදෙන බව සාවුල් යෝජනා කළේය. මෙසේ කිරීමේදී සාවුල් තුලවූ සැබෑ අභිප්‍රාය කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 18:20–25. ඔහු බලාපොරොත්තුවූයේ පිලිස්තිවරුන් විසින් දාවිත්ව මරා දමනු ලැබීමය.)
- සාවුල් දාවිත්ව මැරීමට සෙවීමේදී යොනාතාන් අවංක මිතුරෙක්වූයේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 19:1–7.) අවංක මිතුරෙකු වීම, යන්නෙන් අදහස්වන්නේ කුමක්ද? ඔබගේ මිතුරන් ඔබට අවංක වන්නේ කුමන අන්දමින්ද? ඔබගේ මිතුරන්ට ඔබ අවංක වන්නේ කෙසේද?
- දාවිත් කෙරෙහි සාවුල්ගේ හැඟීම් වෙනස්කිරීමට යොනාතාන් ගත් උත්සාහයන් නොසළකා හැර සාවුල් දිගටම දාවිත්ගේ ජීවිතය සෙවීය (1 සාමුවෙල් 19:9–10). දාවිත්ගේ බිරිඳවූ, මීකායෙල්, තම ස්වාමි පුරුෂයාට ඇය අවංකවූ බව පෙන්නුවේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 19:11–18.)

**3. දාවිත් සහ යොනාතාන් ඔවුන්ගේ මිත්‍රත්වයේ ගිවිසුම අළුත්කරගන්නා අතර, යොනාතාන් දාවිත්ගේ ජීවිතය ගලවයි.**

1 සාමුවෙල් 20 උගන්වමින් සාකච්ඡා කරන්න.

- සාවුල්ගේ වෛරයට සහ තමාව මැරීමට උත්සාහකිරීමට දාවිත් ප්‍රතික්‍රියා දැක්වූයේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 20:1.) සාවුල් දාවිත්ව මැරීමට සොයන විට, යොනාතාන් තම මිත්‍රත්වය නොකඩවාම පෙන්වූයේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 20:2–4, 13–17, 23; තවද බලන්න 1 සාමුවෙල් 20:24–42, එය පහත සාකච්ඡා කෙරේ.)
- දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල යොනාතාන්ගේ සහ දාවිත්ගේ මිත්‍රත්වයට බලපෑමක්වූයේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 20:23.) දෙවියන්වහන්සේට අප දක්වන ප්‍රේමය අන් අයට දක්වන ප්‍රේමයට බලපාන්නේ කෙසේද?
- අපගේ ජීවිතවලදී අප පළමුවෙන්ම දෙවියන්වහන්සේට පක්ෂපාත වන්නේ නම්, අපගේ මිතුරන් වැරදි වැඩකරන විට අප කරන්නේ කුමක්ද? (අපි ප්‍රේමයෙන් යුතුව අපගේ මිතුරන්ට වෙනස්වීමට උදව් කරන්නෙමු.) අපගේ මිතුරන් වැරදි වැඩ කිරීමට අපට කිවහොත් අප කරන්නේ කුමක්ද? (සමාජ ප්‍රතිඵල කුමක් වුවද, අපගේ මිතුරන් අපට කිරීමට කියන අධර්මිෂ්ඨ ක්‍රියා අපි නොකරන්නෙමු. එසේම ධර්මිෂ්ඨ තේරීම් කිරීමට අපගේ මිතුරන් පෙළඹවීමට අපි උත්සාහ කරන්නෙමු.)
- දාවිත්ට සාවුල්ගේ මාළිගයට නැවත ආරක්ෂිතව පැමිණීමට හොඳ අවස්ථාව යොනාතාන් දාවිත්ට දන්වා යැව්වේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 20:5–7, 18–22.) සාවුල් රජතුමා දාවිත්ගේ නොපැමිණීම ගැනත්, යොනාතාන් තම මිත්‍රයා ආරක්ෂා කිරීමටත් දැක්වූ ප්‍රතිචාර මොනවාද? (බලන්න 1 සාමුවෙල් 20:24–33.) සාවුල්ගෙන් පලායන ලෙස යොනාතාන් දාවිත්ට අනතුරු ඇඟවූයේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 20:35–42.)

**4. සාවුල් දාවිත් කෙරෙහි වෛරයෙන් පිරී සිටියි. දාවිත් සාවුල්ගේ ජීවිතය ඉතිරිකරයි.**

1 සාමුවෙල් 23–24 උගන්වමින් සාකච්ඡාකරන්න.

- දාවිත් සටන්බිමේ දිගටම සාර්ථකවීමට ආශිර්වාදිතවෙයි (1 සාමුවෙල් 23:1–5). දාවිත් පිලිස්තිවරුන්ගෙන් කෙයිලා වැසියන්ව ගලවාගැනීමෙන් පසුව ඔහුට එම නුවරින් යාමට සිදුවුනේ මන්ද? (බලන්න 1 සාමුවෙල් 23:7–13.)

- දාවිත් කෙයිලා නුවර සිටින බව සාවුල් දැනගත් විට, මුළු නුවරම විනාශකිරීමට ඔහු තම හමුදාව සූදානම් කළේය (1 සාමුවෙල් 23:10). එක් පුද්ගලයෙක් මරාදැමීම සඳහා මුළු නුවරක්ම විනාශකිරීමට සාවුල් වැනි ධර්මිෂ්ඨ රජෙක් වෙනස්වීමට හේතුව කුමක්ද? ඊර්ෂ්‍යාව සහ වෛරය එතරම්ම බලවත්වන්නේ මන්ද? අපි අපව ඊර්ෂ්‍යාවෙන් හෝ වෛරයෙන් ඉවත්කරගන්නේ කෙසේද?
- දාවිත් සාවුල්ගෙන් සැඟව සිටියදී, යොනාතන් දාවිත් හමුවී, "දෙවියන්වහන්සේ කෙරෙහි ඔහුගේ අත බලවත් කළේය" (1 සාමුවෙල් 23:16). මෙහි අදහස ගැන ඔබ කුමක් සිතන්නේද? දවෙියන්වහන්සේ කෙරෙහි අපගේ මිතුරන් අපි බලවත්කරන්නේ කෙසේද?
- දාවිත්ව සොයා මරාදැමීමේ තවත් උත්සාහයකදී, සාවුල් වෙහෙස නිවා ගැනීමට ගුහාවක් තුල නැවතුනේය (1 සාමුවෙල් 24:1–3). දාවිත්ගේ මිනිසුන්ට සාවුල් හමුවූ විට ඔවුන් කීවේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 24:4.) දාවිත් කුමක් කළේද? (බලන්න 1 සාමුවෙල් 24:4–5.) 4 වන පදයේ පාද සටහන්වල එන දාවිත් සාවුල්ගේ සළුවේ කොන කපාගත්තේය—එම සළුවේ කොටස කැපීම අධිකාරීබලය සංකේතවත්කරන බව පැහැදිළි කරයි.)
- දාවිත් සාවුල්ට හිරිහැර කිරීම ප්‍රතික්ෂේප කලේ මන්ද? (බලන්න 1 සාමුවෙල් 24:6–12.) දාවිත්ගේ ආදර්ශයෙන් පළිගැනීම ගැන සහ අපට නපුරුකම් කල අයට ප්‍රතිචාර දැක්වීම ගැන අපට උගන්වන්නේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 24:12–15; තවද බලන්න මෝර්මන් 8:20.) දාවිත් සාවුල්ගේ ජීවිතය ඉතිරිකිරීම ගැන සාවුල් කීවේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 24:16–19.)

---

**අවසානය**

යොනාතාන්ගේ සහ දාවිත්ගේ කථාව අපට සිහිපත්කරන්නේ අවංක මිත්‍රත්වය සහ ප්‍රේමය අපගේ මිතුරන් සහ දෙවියන්වහන්සේ සමීපයට අපව ගෙනයන බව පෙන්වා දෙන්න. සාවුල්ගේ කථාව අපට සිහිපත් කරන්නේ, ඊර්ෂ්‍යාව සහ වෛරය අපව යටකරගෙන අපව අපගේ මිතුරන්ගෙන් සහ දෙවියන්වහන්සේගෙන් ඉවතට මග පෙන්වන බවය. පංති සාමාජිකයන්ට ඔවුන්ගේ මිතුරන්ට අවංකවීමට දිරිගන්වන්න. එවිට ඔවුන් අමතා මෙසේ කීමට ඔවුන්ට පිළිවන, "ස්වාමීන්වහන්සේ සැම කල්හිම නුඹත් මාත් අතරේ වනසේක" (1 සාමුවෙල් 20:23).

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

මිත්‍රත්වය ස්වයං- අගයකිරීමකි

අවංක මිතුරෙකු වීමේ වැදගත්කම අවධාරනයකිරීමට ඔබට අවශ්‍ය නම්, පහත සඳහන් ක්‍රියාකාරකම පාවිච්චිකරන්න.

හැම පංති සාමාජිකයෙකුටම කඩදාසි කැල්ලක් සහ පෑනක් හෝ පැන්සලයක් දෙන්න. ඔවුන් අවංක මිතුරන්දැයි නිශ්චයකිරීමට උපකාරවත් වන ප්‍රශ්න කිහිපයක් ඔබ ඇසීමට යන බව පහදාදෙන්න. පංති සාමාජිකයන්ට ඔවුන්ගේ පිළිතුරු ලිවීමට කියන්න. ඔවුන්ගේ පිළිතුරු අන් අය හා බෙදා නොගැනීමට ඔවුන්ට ස්ථිර කරන්න. ඉන්පසුව පහත සඳහන් ප්‍රශ්න අසන්නඃ

1. ඔබ යමෙක් වෙනුවෙන් කල අන්තිම කරුණාවන්ත ක්‍රියාව කුමක්ද?
2. යමෙක් තවත් පුද්ගලයෙක් ගැන අකරුණාවන්ත දේවල් කියනු ඔබට ඇසෙන විට ඔබ කරන්නේ කුමක්ද?
3. යහපත් මිනිසුන් වීමට ඔබගේ මිතුරන්ට උපකාරවත්වීම සඳහා ඔබ කර තිබෙන දේවල් මොනවාද?

# "පවිත්‍ර සිතක් මා තුළ මැවුව මැනව" 24

වෙනි පාඩම

*2. සාමුවෙල් 11–2; ගීතාවලිය 51*

**අරමුණ** සදාචාරසම්පන්න සිතුවිලි සහ ක්‍රියාවලින් යුක්තව ඔවුන්ගේ පාප උදෙසා පසුතැවිලිවීමට පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය.

**සූදානම.**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් යුතුව අධ්‍යනය කරන්න.
   - අ. 2. සාමුවෙල් 11. උරියාගේ බිරිඳ වූ බැත්ශෙබා සමග දාවිත් කාමමිථ්‍යාචාරය කළේය. (11:1–5). ඔහුගේ උත්සාහය මගින් පාපය සැඟවීමට ඔහුට නොහැකි විය. (11:6–13. යුද්ධයේදී උරියා මරණයට පත්කිරීමට ඔහු සූදානම් කරයි. (11:14–17). දාවිත් බැත්ශෙබා විවාහ කරගත් අතර, ඔවුන්ට පුතෙකු ලැබුනේය. (11:26-27).
   - ආ. 2 සාමුවෙල් 12:1–23. අනාගතවක්තෘ නාතාන් දාවිත්ට උපමාවක් කියමින් පාපයේ භයංකාරකම ගැන උගන්වයි. (12:1-6). දාවිත්ගේ පාපය නිසා ඔහුට දඬුවම් කරන බව ඔහුට කියනලදී. (12:7-14 ජෝසෆ් ස්මිත්ගේ පරිවර්තනයේ 13වෙනි පදයේ නාතාන් මෙසේ කියන බව සටහන්කරගන්න, "නුඹ නොමැරෙන බවට නුඹගේ පාපය ස්වාමීන්වහන්සේ පහ නොකළසේක"). දාවිත්ගේ සහ බැත්ශෙබාගේ පළමු පුත්‍රයා ළදරු කාළයේදීම මියගියේය. (12:15-23)
   - ඇ. ගීතාවලිය 51. පසුතැවිලි වූ දාවිත් පව්කමාව සොයයි.
2. අමතර කියවීම්: 2 සාමුවෙල් 2-10.
3. යොමුකිරීමේ ක්‍රියාකාරිත්වය ඔබ භාවිතාකරන්නේ නම් නූල් රෝදයක් සහ කතුරක් ගෙන එන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ක්‍රියාකාරීත්වයට යොමුකිරීම.

පාඩම ආරම්භකිරීමට, පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතාකිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

ඔහුගේ හෝ ඇයගේ අත් ඉදිරියට දිගුකොට පංතිය ඉදිරිපිට සිටගැනීමට ස්වකීය කැමැත්තෙන් ඉදිරිපත්වෙන කෙනෙකුට සලස්වන්න. පංති සාමාජිකයාගේ අත් දෙකේම මැණික්කටුවේ නූල් පටක් බුරුලෙන් ගැටගසන්න. මෙම තනි නූල්පට අපවිත්‍ර සිතුවිල්ලක් නිරූපණය කරන බව පහදා දෙන්න. ඔහුගේ හෝ ඇයගේ අත් වේගයෙන් පිටතට අදිමින් නූල කැඩීමට පංති සාමාජිකයාට සලස්වන්න.

- අපගේ සිතට අපවිත්‍ර සිතුවිල්ලක් ඇතුල් වූ විට අප කළ යුත්තේ කුමක්ද? (අප එය වහාම ඉවත්කළ යුතුය.)

ඔහුගේ හෝ ඇයගේ අත් නැවතත් ඉදිරියට ඇල්ලීමට පංති සාමාජිකයාව සලස්වන්න. කැඩීමට වඩාත් අපහසු අන්දමට — පංති සාමාජිකයාගේ මැණික්කටුවේ නූල්පටවල් ස්වල්පයක් ඔතන්න. අනතුරුව නූල්පටවල් කැඩීම පිණිස පංති සාමාජිකයාට උත්සාහ කිරීමට කියන්න. පහසුවෙන් කැඩීමට නොහැකිවන අන්දමට ප්‍රමාණවත් නූල් පටවල් භාවිතා කරමින් මෙම ක්‍රමය නැවත කරන්න.

- අපගේ සිත්වල අපවිත්‍ර සිතුවිලි රඳවාගැනීමට ඉඩහැරියොත් අපට කුමක් වන්නේද?

කතුරකින් නූල් කපා පංති සාමාජිකයාගේ අත් මුදා හරින්න. අපවිත්‍ර සිතිවිලි රඳවාගැනීමේ විපාක ගැන මෙම පාඩමේ කොටසකින් උගන්වන බව පහදාදෙන්න. අපවිත්‍ර සිතිවිලි වලින් නිදහස් වීමේ මාර්ගද මෙම පාඩමේදී සාකච්ඡාකරනු ලැබේ.

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ අදාලකරගැනීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට දිනපතා ජීවිතයට ඒවා අදාලකරගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ද අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිමත්කරන්න. සෑම ප්‍රශ්නයක්ම ඇසීමට හෝ පාඩමේ සෑම කරුණක්ම අනාවරණය කිරීමට අපහසු බැවින්, පංති සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් ඉතා හොඳට සපුරාලන අන්දමට, යාච්ඤාවෙන් ඒවා තොරාගන්න. පංති සාමාජිකයන්ගේ අවස්ථාවලට ගැලපෙන ප්‍රශ්න සමහරක් යොදා ගැනීමට ඔබට අවශ්‍යවෙනවා ඇත.

1 මෙම පාඩමේ ඓතිහාසික වටපිටාව පිළිබඳ වැදගත් තොරතුරු 1 සාමුවෙල් 25 සිට 2 සාමුවෙල් 10 යෙන් සලස්වා දෙයි. මේ අත්පොතෙහි මෙම පරිච්ඡේද ඇතුලත් නොවන බැවින්, පහත සඳහන් අන්දමට සාරාංශගත කිරීමට ඔබට අවශ්‍යවෙනවා ඇත.

සාමුවෙල්ගේ ජීවිතය දාවිත් ගැලවූ වහාම තව එකම වරක් දාවිත්ගේ ජීවිතය විනාශ කිරීමට සාවුල් සෙව්වේය. නැවතත් රජුව මැරීමට දාවිත්ට අවස්ථාව තිබුන නමුත්, එසේ කිරීම ඔහු ප්‍රතික්ෂේප කළේය. යුදාහි ජනතාව හා අවට ජාතීන් අතර යුද්ධය පැවතුනේය. එවන් යුද්ධයකදී සාවුල් සහ යොනතන් මරණයට පත්වූහ. සාවුල්ගෙන් පසුව දාවිත් රජවූ අතර, ඉශ්‍රායෙල් ඉතිහාසයේ ඔහු ශ්‍රේෂ්ඨ රජෙකු වූයේය. ගෝත්‍ර එක් ජාතියක් වශයෙන් ඔහු සම්බන්ධ කළේය. ඔහුගේ ජනතාවට පොරොන්දු වූ දේශ ඔහු අත්පත්කරගෙන, දෙවියන් වහන්සේගේ නීතිය පදනම් කරගත් ආණ්ඩුවක් ඔහු පිහිටවූවේය. කෙසේ වුවත්, මෙම පාඩමේ සාකච්ඡා කළ පරිදි, ඔහුගේ ජීවිතයේ අන්තිම අවුරුදු 20දී ඔහුගේ පාපිෂ්ඨ තීරණ නිසා බාධා පැමිණියේය.

**1. බැත්ශෙබා ගේ සැමියා වූ උරියාගේ මරණය සැළසුම් කොට බැත්ෂෙබා සමග දාවිත් කාමමිථ්‍යාචාරයේ යෙදුනේය.**

2 සාමුවෙල් 11 උගන්වමින් සාකච්ඡා කරන්න.

- දාවිත් ඔහුගේ පියස්ස මත සක්මන් කරන අතර බැත්ෂෙබා දැක, ඇය ඇය සමග කාමමිථ්‍යාචාරයේ යෙදීම පිණිස පරීක්ෂාවට වැටුනේය. (2 සාමුවෙල් 11:2). දාවිත් බැත්ෂෙබා දුටු විට ඔහුට කළයුතුව තිබුනේ කුමක්ද? (2 සාමුවෙල් 11:2–4 බලන්න.) ලිංගික පාප සිදුකිරීමේ පරීක්ෂාවට ජනතාවට මගපෙන්වන්නේ කුමක්ද? ලිංගික පාප සිදුකිරීමේ පරීක්ෂාවෙන් වැළකීසිටීමට අපට කුමක් කළ හැකිද?

  පහත සඳහන් සටහන භාවිතා කරමින්, පංති සාමාජිකයන්ගේ පිළිතුරු ලැයිස්තුගතකිරීමට ඔබට උවමනා වෙනවා ඇත. පහත සඳහන් පිළිතුරු අඩංගුවෙනවා ඇත.

| *වැළකිය යුතු දේවල්.* | *ඒවායෙන් වැළකෙන අන්දම.* |
|---|---|
| අපවිත්‍ර හෝ අසභ්‍ය සිතුවිලි. | යහපත් සිතුවිලි වලින් ඔබගේ මනස පුරවාගන්න. |
| රූපවාහිනී දර්ශන, නාට්‍ය, සඟරා, පොත් සහ සංගීත යන අසභ්‍ය දේවල් හෝ යම් ක්‍රමයකින් මනස දූෂණය කරන දේවල්ය. | යහපත කිරීමට ඔබව පොළඹවන මාධ්‍ය තෝරා ගන්න. |
| විවාහවීමේ අදහසින් මුණගැසීමේදී අයහපත් ක්‍රියාකාරකම්. | පසු දවස්වල අනාගතවක්තෘවරුන් විසින් උගන්වන ලද මුණගැසීමේ ප්‍රමිතිය අනුව තරුණ ශක්තිය උදෙසා යන පත්‍රිකාව (34285) සටහන් අනුගමනය කරන්න. |
| අනාචාරයේ හැසිරීම. | ඔබගේ බිරිඳට හෝ සැමියාට මුළු හදවතින්ම ප්‍රේම කරන්න. ඔබගේ බිරිඳ හෝ සැමියා සමග (ඔබගේ සම්බන්ධතාවය වර්ධනය කරමින්) ආලය කිරීම පවත්වාගෙන යන්න. |
| ශුද්ධාත්මයාණන්ගේ නිරන්තර මිත්‍රත්වය නොලැබිය හැකි අන්දමේ ස්ථාන සහ ක්‍රියාකාරකම්. | ඔබ යන ස්ථාන සහ සහභාගිවන ක්‍රියාකාරකම් වල ශුද්ධාත්මයාණන්ගේ නිරන්තර මිත්‍රත්වය ඔබට ලබාගැනීමේ හැකියාව තිබීම ගැන ස්ථිර කරගන්න. |

අපවිත්‍ර සිතිවිලි වලින් වැළකීමේ ක්‍රම සාකච්ඡා කිරීමට අමතර ඉගැන්වීමේ පළවෙනි අදහස් පාවිච්චි කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

- බැත්ෂෙබා ගැබ්ගත් බව දාවිත් දැනගත්විට ඔහු කුමක් කිරීමට උත්සාහ දැරුවේද? (2 සාමුවෙල් 11:6–13 බලන්න. බැත්ෂෙබාගේ ස්වාමිපුරුෂයා වන උරියාව, ඇය වෙතට නැවත ගෙදරට යැවීමට ඔහු උත්සාහ කළේය. එවිට නූපන් දරුවා උරියාගේ යයි පෙන්වීමට හැකිවන්නේය.) දාවිත්ගේ සැළසුම නිෂ්පල වූයේ කුමක් නිසාද? (2 සාමුවෙල් 11:11 බලන්න. යුධබිමේ ඔහුගේ සහකරුවන්ට අවංක වී ඔවුන් සමග සිටිය යුතුයැයි ඔහුට හැඟුන නිසා, උරියා ඒ වෙලාවේ ආපසු ගෙදරට නොගියේය.)

- ඔහුගේ දුෂ්චරිතය වසන් කරගැනීම සඳහා ගත් උත්සාහයේදී දාවිත් කළ එයටත් වඩා දරුණු පාපය කුමක්ද? (2 සාමුවෙල් 11:14–17 බලන්න.) ඔහුගේ පාපය කාගෙන් වසන්කරගැනීමට හැකිදැයි දාවිත් සිතුවේද කියා ඔබ සිතන්නෙහිද? අද පාපය වසන්කරගැනීමට මිනිසුන් උත්සාහ දරන්නේ කෙසේද?

  වැඩිහිටි රිචඩ්.ජී. ස්කොට් මෙසේ කීවේය.

  "ඔබගේ පාප අන්‍යයන් නොදන්නේයැයි සිතා සැනසීමට නොසිතන්න. එය පැස්බරා වැල්ලේ ඔලුව වළලනවා වැනිය. ඔහු අන්ධකාරය පමණක් දකිමින් සැනසිල්ලේ සැඟවී සිටින්නේ යැයි සිතයි. සත්‍යයෙන් ඔහු ප්‍රකටව පෙනෙන උපහාසයට ලක්වන්නෙකි. ඒ අන්දමට අපගේ සියලුම ක්‍රියා, ස්වර්ගයේ වැඩසිටින පියාණන්වහන්සේට සහ උන්වහන්සේගේ ප්‍රේමවන්ත පුත්‍රයාට පෙනෙන සේක අප ගැන සියල්ලම උන්වහන්සේලා දනිති......

  "ඔබ දරුණුම පාපයක් කර ඇති නම්, සදාකාල තෘප්තියක් හෝ සැනසීමක් එය කෙරෙහි ලබා ගැනීමට ඔබට නොහැකිවන්නේය. පාපය වසන්කරගෙන නිදහස්වීම ප්‍රශ්නය විසඳුනා යැයි පෙනෙන නමුත් එය එසේ නොවන්නේය. ඉතාම උපද්‍රව සහිත කාලයකදී, ඔබගේ ඉතාම ලැජ්ජාකාරී ක්‍රියා සියලුදෙනාටම දැන්වීම පරීක්ෂකයාගේ අභිප්‍රාය වෙයි. බොරු රටාවකට ගොතා වඩාත් ස්ථිර කරමින් සාතන් ඔබට උපද්‍රව වන අන්දමට ඔබව උගුලට හසුකරගන්නේය." (in Conference Report, අප්‍රි. 1995, 103; හෝ *Ensign*, මැයි 1995,77).

අපගේ පාප වසන්කිරීමේ උත්සාහයේ භයංකාර කම පෙන්වන, අමතර ඉගැන්වීමේ දෙවෙනි අදහස, භාවිතාකිරීමට ඔබට උවමනාවෙනවා ඇත.

**2. ඔහුගේ පාපය නිසා ඔහුට දඬුවම් කරන බවට දාවිත්ට කියා ඇත.**

2 සාමුවෙල් 12:1–23 උගන්වා සාකච්ඡා කරන්න.

- දාවිත් සමග ස්වාමීන්වහන්සේ කෙතරම් අප්‍රසන්න වූයේදැයි ගෙනහැර දැක්වීමට අනාගතවක්තෘ නාතාන් කුමන උපමාවක් කියන්නේද? (2 සාමුවෙල් 12:1–4 බලන්න.) උපමාවේ සඳහන් දිළිඳු මිනිසාට විරුද්ධව ධනවත් මිනිසාගේ ක්‍රියා ගැන දාවිත් කුමක් සිතුවේද? (2 සාමුවෙල් 12:5–6 බලන්න.) දාවිත්ගේ ක්‍රියා ධනවත් මිනිසාගේ මෙන් වූයේ කෙසේද? (2 සාමුවෙල් 12:7–9 බලන්න.) ස්වාමීන්වහන්සේගේ තරවටු කිරීම කෙරෙහි දාවිත් ප්‍රතික්‍රියා කළේ කෙසේද? (2 සාමුවෙල් 12:13 බලන්න.)

- උපමාවේ සඳහන් ධනවත් මිනිසා ඔහුව නිරූපණය කරන බව දාවිත්ට අවබෝධකරගැනීමට අපොහොසත් වූයේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? අපගේම පාපතර භාවය අවබෝධ කරගැනීමට අපට අපහසු වන්නේ කුමක් නිසාද?

- දාවිත්ගේ පාපවල විපාක මොනවාද? (2 සාමුවෙල් 12:10–14 බලන්න. මෙම අනාවැකි සම්පූර්ණ වීම 15–23 පදවල සහ ඉන් පසුව සඳහන්වන 2 සාමුවෙල්ද 1 සහ රාජාවලියේද දැකගත හැකිවේ, ඩීසහසී 132:39 ද බලන්න. කාමමිථ්‍යාචාරයේ හැසිරීම දරුණු පාපයක් බව සිහි තබාගන්න. නමුත් ඔහුගේ උතුම්භාවයට පැමිණීම දාවිත් අහිමි කරගත්තේ, මක්නිසාද? උරියාගේ මරණයට ඔහු වගකිව යුතුබව ස්වාමීන්වහන්සේ ඔහුට පැවරූ නිසාය.)

  සභාපති මැරියන් ජී. රොම්නි මෙසේ කීවේයඃ "දාවිත්... ස්වාමීන්වහන්සේගෙන් ඉහල මට්ටමින් ප්‍රසාදය ලැබූ (ඇත්ත වශයෙන්ම දෙවියන්වහන්සේගේම හදවතට සමීප වූ කෙනෙක් වශයෙන්

සඳහන් කර තිබුන නමුත්), ඔහු පරීක්ෂාවට වැටුනේය. ඔහුගේ අනාචාරයේ හැසිරීම මිණීමැරීමට තුඩුදුන් අතර, එහි ප්‍රතිපලයක් වශයෙන්, ඔහුගේ පවුල් සහ ඔහුගේ උතුම් බවට පත්වීම ඔහුට අහිමි විය" (in Conference Report, අප්‍රි, 1979, 60; හෝ *Ensign*, මැයි 1979,42).

- අද අනාචාරයේ හැසිරීමේ ක්ෂණික විපාක සමහරක් මොනවාද? පසුතැවිලි නොවන්නාට දිගුකාලීන විපාක සමහරක් මොනවාද?

**3. පසුතැවිලි වූ දාවිත් සමාව සොයයි.**

ගීතාවලිය 51 උගන්වා සාකච්ඡාකරන්න.

අන්‍යයන්ට පසුතැවිලිවීමට උපකාර කිරීමේ ආශාවක් ස්වාමීන්වහන්සේට ගීතිකා කිරීමේදී, දාවිත් මෙසේ කියමින් ප්‍රකාශ කළේය, "එවිට මම අපරාධකාරයින්ට ඔබගේ මාර්ග [උගන්වන්නෙමි], පව්කාරයෝද ඔබවෙතට හරවනු ලබන්නෝය" (ගීතාවලිය 51:13). උරියාගේ මරණය සැලසුම් කළ බැවින් ඔහුගේ උතුම් බවට පත්වීම දාවිත් අහිමි කරගත් නමුත්, කාමමිථ්‍යාචාරයේ යෙදීමේ පාපයට ඔහු සමාව සෙවීමේදී, ඔහුගේ පසුතැවිලි වීමේ ආකල්පයෙන් අපට ඉගෙනගැනීමට හැකිවේ. ගීතාවලිය 51 ඔහුගේ වචන වලින්, සත්‍යවූ පසුතැවීමේ අංග බොහෝමයක් උගන්වනු ලබයි. පංති සාමාජිකයන් සමග ගීතාවලිය ඔබ අධ්‍යනයකරනවිට, දාවිත්ගේ පසුතැවිලිවීමේ ආදර්ශය අපගේ ජීවිත වලට අදාළකරගැනීමට හැකිවන අන්දම ගැන සාකච්ඡාකරන්න.

- ගීතාවලිය 51 පළමුවෙන්ම දෙවියන්වහන්සේව සහ උන්වහන්සේගේ දයාව දාවිත් පිළිගත්තේය (ගීතාවලිය 51:1). ඔහුගේ පාපතරභාවයද දාවිත් පිළිගත්තේය. (ගීතාවලිය 51:1–3). අපගේ පාපතරභාවය ගැන අප පසුතැවිලිවෙන විට, දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය අප අවබෝධ කරගැනීමේ වැදගත්කම කුමක්ද?
- අපගේ පාප වලට කමාව ලබාගැනීම පිණිස අප පූජාකළ යුත්තේ කුමක්ද? (ගීතාවලිය 51:16–17 බලන්න.) "බිඳුණ වූ තැළුණ වූ සිතක්" තිබීමේ අර්ථය කුමක්දැයි ඔබ සිතන්නෙහිද?
- අපට කමාව ලැබෙන්නට පෙර "නිතර [අප] ඉදිරියේ" කෙසේවීද? (ගීතාවලිය 51:3). අපට කමාව ලැබුනාට පසු එය වෙනස්වනුයේ කෙසේද? (ගීතාවලිය 51:10; ඇල්මා 36:17–19 බලන්න.) අපගේ අතීතයේ පාප වලට අප කමාවුනාට පසු දෙවියන්වහන්සේ අප දෙස බලන්නේ කෙසේද? (ගීතාවලිය 51:9; යෙසායා 43:25; ඩී සහ සී 58:42.)
- කමාවීම පවිත්‍රකිරීමක් මෙන් දාවිත් විස්තර කරයි. (ගීතාවලිය 51:1–2, 7, 9–10), නැවත පිහිටුවීම (ගීතාවලිය 51:12). මුදාගැනීම (ගීතාවලිය 51:14). දෙවියන්වහන්සේගේ කමාවේ ආශිර්වාදයට මෙම විස්තර යෝග්‍යවන්නේ කුමක් නිසාද?

---

**අවසානය.**

අප කොතරම් සාර්ථක හෝ ශක්තිමත් වුවත්, අප තවමත් පරීක්ෂාවට වැටීමට හැකිබව පහදා දෙන්න. සිතිවිල්ලෙන් හා ක්‍රියාවෙන් සදාචාර වීමට උපකාර වන අවශ්‍ය වෙනස්කම් ඔවුන්ගේ ජීවිත තුල ඇතිකර ගැනීමට පංති සාමාජිකයින් දිරිමත්කරන්න. යේසුස් වහන්සේට ඔබගේ ප්‍රේමයත්, උන්වහන්සේගේ වන්දි ගෙවීමට ඔබගේ කෘතඥතාවයත් ප්‍රකාශ කරන්න. වන්දිගෙවීම නිසා, අපගේ පාප වලට කමාව ලබාගැනීමට හැකිවීම ගැන සාක්ෂිදරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්.**

පහත සඳහන් තොරතුරු (උපකරණ) අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. අපගේ සිත් වලින් අපවිත්‍ර සිතුවිලි පහකිරීම**

අපගේ සිත් තුලට අනාරාධිතව ඇතුල්වන අපවිත්‍ර සිතුවිලි පහකරගන්නා අන්දම විස්තර කරන වැඩිහිටි බොයිඩ්.කේ. පැකර්ගේ පහත සඳහන් ප්‍රකාශය ඔබගේම වචන වලින් බෙදාගන්න:

"මනස වේදිකාවක් වැනිය. අප නිදාගත්විට හැරෙන්නට, තිරය නිතරම උඩය. එම වේදිකාවේ නිතරම යම් ක්‍රියාවක් ඉටුකරනු ලැබේ. එය හාස්‍යජනක නාට්‍යයක්, ශෝකාන්ත නාට්‍යයක්,

ප්‍රසන්න හෝ අප්‍රසන්න, හොඳ හෝ නරක එකක් විය හැකිය. නමුත් නිරන්තරයෙන්ම මනසේ වේදිකාවේ යම් කිසි ක්‍රියාවක් (නාට්‍යයක්) රඟපානවා ඇත.

"ඕනෑම රඟපෑමක මධ්‍යයෙහි, ඔබගේ සත්‍යවූ අදහසක් නොමැතිව, වේදිකාවේ අඳුර්ශමාන පැත්තකින් ඔබව ආකර්ෂණය කරගැනීමේ සියුම් අයහපත් සිතුවිල්ලක් රිංගාගැනීමට හැකි වේ. මෙම අයහපත් සිතුවිලි සියලු දෙනාගේම මනස වෙන අතකට යොමු කිරීමට උත්සාහදරයි. ඒවා දුරදිග යෑමට ඔබ ඉඩදෙන්නේ නම්, සියලුම සදාචාර සිතුවිලි වේදිකාව හැරයන්නේය ඔබ එය අනුමත කළ නිසා, අධර්මිෂ්ඨ සිතුවිලි වල බලපෑමට ඔබ හසුවන බව ඔබ දැක ඇත.

"ඔබ ඒවාට අවනත වන්නේ නම්, ඔබගේ මනසේ වේදිකාවේ ඉවසීමේ සීමාව දක්වා වුවද ඒවා ඔබට නියෝග කරනවා ඇත. තිත්තකම, ඊර්ෂ්‍යාව හෝ වෛරය වැනි දේවලට නියෝග කරනවා ඇත. අසභ්‍ය, අනාචාර හා පව්වු හැසිරීම පවා විය හැකිය. වේදිකාවෙහි ඔවුන්ට ඔබ ඉඩ දුන් විට, ඔබව අල්ලා ගැනීමට, ඉතාම දක්ෂ උපාය මාර්ග වලින් ඔබව පොළඹවන්නේය. ඒවා ඉතා ප්‍රසන්න විය හැකි අතර, එය අහිංසක බවද ඔබට ඒත්තුගැන්විය හැකිය— මක්නිසාද ඒවා සිතුවිලිය.

"ඔබගේ මනසේ වේදිකාව අපවිත්‍ර සිතුවිලිවල කුඩා යක්ෂයින් විසින් අත්පත් කරගත් මෙවැනි අවස්ථාවක ඔබ කුමක් කරන්නෙහිද? ඒවා අඳුරු පැහැය වුනත් සම්පූර්ණයෙන්ම පවිත්‍ර බව පෙනීමට හැකිය. නැතහොත් ඒවා නරක වැරදි පිළිකුල් සහගත දේවල් බව දනියි. ඔබගේ සිතුවිලි පාලනය කරගැනීමට හැකි නම්, සිරිත් සහ ආත්ම ගෞරවය කෙළෙසෙන පෞද්ගලික සිරිත් පවා ජය ගැනීමට ඔබට හැකිය. ඒවා දමනය කිරීම ඔබට ඉගෙන ගැනීමට හැකි නම්, ඔබට ප්‍රීතිමත් ජීවිතයක් ගතකළ හැකිය.

"මා ඔබට උගන්වන්නේ මෙයයි. ඔබව පොළඹවීමට සමාන හැඟීම් උපදවන, ඔබ ප්‍රිය කරන, ඔසවා තැබීමට හැකි වචන අඩංගු ගෞරවනීය සංගීතයෙන් යුත් සභාවේ පූජනීය සංගීත අතරින් ගීතිකාවක් තෝරා ගන්න. සැලකිළිමත්ව ඔබගේ සිතෙන් එය කියවන්න. එය කටපාඩම් කරගන්න. සංගීතමය පුහුණුවක් ඔබට නැති (වුවත්), ඔබට ගීතකාවක් ගැන සිතීමට හැකිය.


"දැන්, ඔබගේ සිතිවිලි යෑමේ ස්ථානය ලෙස මෙම ගීතිකාව භාවිතා කරන්න. එය ඔබගේ අනතුරු (උපායමාර්ගය) නාලිකාව කර ගන්න. ඔබගේ මනසේ වේදිකාවේ සිතුවිලි වලට පැතිකඩින් අයහපත් සිතුවිලි ලිස්සා එන ඕනෑම අවස්ථාවක, ඔබගේ මනසෙහි ශබ්ද නාලිකාවක් මෙන් මෙය වාදනය කරන්න. සංගීතය පටන්ගෙන ඔබගේ සිතුවිලි වල වචන සකස්වන විට, නුසුදුසු දේ ලැජ්ජාශීලීව ඉවතට ලිස්සා යනු ඇත. ඔබගේ මනසේ වේදිකාවේ සම්පූර්ණ ස්වභාවය එමගින් වෙනස්වන්නේය. මක් නිසාද එය ඔසවා තබන හා පවිත්‍ර බැවින්ද, පහත් සිතුවිලි පහව යන්නේය. ස්වභාවයෙන්ම සදාචාරය පිළිකුල සමග මිශ්‍රනොවන අතර, දුෂ්ඨකමට ආලෝකය දරාගත නොහැකිවනු ඇත.

"යථාකාලයේදී ඔබගේ සිත්තුල සිහින් හඬ නගන සංගීතය දැනෙන අවස්ථාවන් ඔබට සොයාගත හැකිවේ. ඔබගේ සිතුවිලි දෙස ආපසු බලන විට, ඔබගේ මනසේ වේදිකාවට නුසුදුසු සිතුවිල්ලක් ගැන දිරිගැන්වීමකට ලෞකික බලපෑමක් ඔබ සොයාගන්නවා ඇත, එවිට සංගීතය ඉබේටම පටන්ගනී.

"නුසුදුසු සිතුවිලි වලින් ඔබගේ මනසේ වේදිකාව පිරිසිදු කිරීමට ඉගෙනගත් පසු, සුදුසු දේවල් ඉගෙනීමෙන් එය ක්‍රියාශීලිව තබන්න. යහපත් සහ ඔසවා තැබීමේ සිතුවිලි පොළඹවන ආකාරයට ඔබට තබාගැනීමට, ඔබගේ පරිසරය වෙනස්කර ගන්න. ධර්මිෂ්ඨ දේවල් කෙරෙහි ක්‍රියාශීලිව තබන්න."("in Conference Report, ඔක් 1976, 99–100.)

### 2. අපගේ පාප වසන්කර ගැනීමට උත්සහදැරීමේ භයංකාරකම

කාමමිථ්‍යාචාරයේ හැසිරීමේ ඔහුගේ පාපය වසන් කිරීමට දාවිත් උත්සාහ කළ බැවින් ඊටත් වඩා වැඩි පාපයක් ඔහු කළේය. අපගේ පාප වසන්කිරීමේ උත්සාහයේ ඇති භයංකාරකම සාකච්ඡා කිරීම පිණිස, පාපය කුණුගොඩකට සමාන කරන්න. 116 වෙනි පිටුවෙහි පළවෙනි චිත්‍රයෙන් පෙන්වන පරිදි මෙම සංකල්පය රටහුනු ලෑල්ලේ විස්තර කරන්න.



- කුඩා කුණුගොඩක් වැසීමට අප උත්සාහ කරන්නේ නම් සිදුවන්නේ කුමක්ද? (කුණුගොඩ වඩාත් විශාල වෙමින් වඩා හොඳට පෙනේ. ඉහත සඳහන් දෙවෙනි චිත්‍රයෙන් පෙන්වන පරිදි මෙම සංකල්පය විස්තර කරනන.)
- කුණුගොඩක් වසනවා මෙන් අපගේ පාප වැසීම කෙසේද? (අපගේ පාප වසන්කිරීමට අප උත්සහ ගන්නා විට අපගේ පාපතර භාවය මහත්සේ වැඩිවන අතර වඩාත් දරුණුවන්නේය.)
- ජනතාව කුණුගොඩ දැකීම අපට උවමනා නොවන්නේ නම්, අප කුමක් කළ යුතුද? (එය ඔසවා දමනවාට වඩා, කුණුගොඩ අප ඉවත්කළ යුතුය.) අපගේ ජීවිත වලින් පාපය ඉවත්කළ හැකි වන්නේ කෙසේද?

**3. "එවිට අම්නොන් ඉතා මහත් වෛරයකින් ඈට වෛරවුණේය." (2 සාමුවෙල් 13:15)**

2. දාවිත්ගේ පුත් අම්නොන් සහ දාවිත්ගේ දුව තාමර් ගැන කථාන්තරය 2 සාමුවෙල් 13 අඩංගුවේ. අම්නොන් තාමර් කෙරෙහි සිත්ඇදී, ඔහු සමග අනාචාරයේ හැසිරීමට ඈයට බලකළේය.

- අම්නොන් තාමර්ට ප්‍රේම කළ බව 2 සාමුවෙල් 13:1 කියයි. ඈයට විරුද්ධව ඔහු පව් කළාට පසු, තාමර් කෙරෙහි අම්නොන් ගේ හැඟීම් වෙනස්වූයේ කෙසේද? (2 සාමුවෙල් 13:15 බලන්න.) සදාචාර ප්‍රතිපත්ති කඩකරන ජනතාව අතර, ප්‍රෙමයට වඩා වෛරය බොහෝ විට ඇතිවන්නේ කුමක් නිසාද?

  සභාපති ගෝර්ඩන්. බී. හින්ක්ලි මෙසේ කීවේයඃ "වැඩිහිටි ජෝන් ඒ. විඩ්ස්ටෝ... මෙසේ කියනවා මට ඇසුනි, තරුණ මිනිසෙක් සහ තරුණ කාන්තාවක් සදාචාර ප්‍රතිපත්ති කඩකිරීමෙන් පසු එකිනෙකාට වෛර කිරීමෙන් කෙළවර වන ආකාරය මා දැක ඇත.මාද එවැනි දේවල් දැක ඇත.ආරම්භයේදී ප්‍රේමවන්ත වචන හුවමාරු කරගෙන ඇත, නමුත් පසුව කෝපයේ හා වෛරයෙ වචන හුවමාරු වී ඇත."("True to the Faith," *Ensign*, ජූනි 1996,5).

**4. පසුතැවෙන්නාට බලාපොරොත්තුව.**

පසුතැවිලි වීමට කිසිදා ප්‍රමාද නැත යන්න ඔබ අවධාරණය කරනවා නම්, වැඩිහිටි බොයිඩ් කේ. පැකර්ගේ පහත සඳහන් ප්‍රකාශය, බෙදාගැනීමට ඔබට උවමනා වෙනවා ඇත.

"වැරැද්දක් (හෝ එවැනි පෙළක්ම) කළ විට සදාකාලයටම පසුතැවිලි කමාව ලැබීමට නොහැකි යයි යන අධෛර්‍ය්‍යය වීමේ අදහස ස්වාමීන්වහන්සේගෙන් පැමිණි දෙයක් නොවේ. අප පසුතැවිලි වෙනවා නම්, අපගේ පාප වලට කමාව දෙනවා පමණක් නොව උන්වහන්සේ ඒවා අමතකකොට, තවද අපගේ පාප තවත් සිහි නොකරන බව උන්වහන්සේ කී සේක....පසුතැවිලිවීම සබන් වැනිය. එයට පාපය සෝදා හැරිය හැකිය. යමෙකු තුල ඇති දරුණු පාප පහකොට පැල්ලම් ඉවත්කිරීම පිණිස ප්‍රබල විනයානුකුල සැලැස්මක් මගින් ඒවා ඉවත්කළ හැකිය." (in Conference Report, අප්‍රි 1989, 72; හෝ *Ensign*, මැයි 1989, 59).

# “පණ ඇති සියල්ලෝම ස්වාමීන්ට ප්‍රශංසා කෙරෙත්වා”

25

වෙනි පාඩම.

*ගීතාවලිය.*

---

**අරමුණ.**

ගැලවුම්කරුවාණන් සහ අපගේ ස්වර්ගීය පියාණන්වහන්සේ අපට දෙන ලද බොහෝ ආශිර්වාද වලට උන්වහන්සේට කෘතඥතාවය දැක්වීමට පංති සාමාජිකයින්ට උපකාර කිරීමටය.

---

**සූදානම**

1. ඔබට හැකිතරම් ගීතාවලිය පොතේද පාඩමේ සාකච්ඡා කර තිබෙන ශුද්ධ ලියවිලිද යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. පංති සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් ඉතාම හොඳට සරිලනසේ පාඩම අධ්‍යනය කර යාච්ඤාවෙන් ශුද්ධ ලියවිලි, තේමාවන් සහ ප්‍රශ්න තෝරාගන්න. ගීතාවලිය සම්පූර්ණ පොතම මෙම පාඩම ආවරණය නොකරයි. මුලු පොතේම වැදගත් තේමාවන් ස්වල්පයක් පමණක් සාකච්ඡා කරනු ලැබේ.
3. යොමුවීමේ පළවෙනි ක්‍රියාකාරීත්වය ඔබ භාවිතාකරන්නේ නම් ගැලවුම්කරුවාණන්ගේ පිංතූරයක්ද, ඔබ කෘතඥවිය යුතු බව දක්වෙන උපකරණ හතරක් හෝ පහක්, එනම්, ශුද්ධ ලියවිලි, ආදරය කරන කෙනෙකුගේ පිංතූරයක්, ඔබගේ දක්ෂතාවයන් දක්වෙන උපකරණයක්, නැතහොත් කෑම වර්ගයක් ගෙන එන්න. යොමුවීමේ දෙවෙනි ක්‍රියාකාරීත්වය ඔබ භාවිතාකරන්නේ නම්, ඔවුන් ප්‍රියකරන ගීතිකා හා ඒවායේ වැදගත්කම කීමට පංති සාමාජිකයින් එක්කෙනෙකුට හෝ දෙදෙනෙකුට සූදානම්වීමට කියන්න.
4. දේවමාලිගා පිංතූර එකක් හෝ එයට වැඩියෙන් ගෙනෙන්න.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමුකිරීම.**

පංතිය පටන්ගන්නා විට, පහත සඳහන් එක් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතාකිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

1. ගැලවුම්කරුවාණන්ගේ පිංතූරයක් පෙන්වා, උන්වහන්සේගේ ජීවිතයට හා දූතමෙහෙයට ඔබගේ කෘතඥතාවය ප්‍රකාශකරන්න.ඔබ කෘතඥවෙන වෙනත් දේවල් පෙන්නුම්කරන වෙනත් දේවල් පෙන්වන්න. එකින් එකට ඔබගේ කෘතඥතාවය ප්‍රකාශකරන්න. අනතුරුව පහත සඳහන් ප්‍රශ්න අසන්න.

   - ස්වාමීන්වහන්සේගෙන් ලැබුනු කුමණ දීමනාවන් සහ අවස්ථාවන්ට ඔබ විශේෂයෙන් කෘතඥවන්නෙහිද? මෙම දීමනා නොමැති නම් ඔබගේ ජීවිත කෙසේ වෙනස් වනුයේද?

   ස්වාමීන්වහන්සේ දෙනලද ආශිර්වාද වලට කෘතඥතාවය ප්‍රකාශකිරීම බොහෝ ගීතිකා වලින් කෙරෙන බව පහදා දෙන්න. මෙම පාඩමෙන් කොටසක් එම ආශිර්වාද කෙරෙහි යොමුවන අතර, ඒවාට අපගේ කෘතඥතාවය පෙන්වීමට අපට කළහැකි දේවල් ගැනය.

2. 23 වෙනි ගීතිකාව ෂබ්දනගා කියවීමට පංති සාමාජිකයෙකුට කියන්න. අනතුරුව පහත සඳහන් ප්‍රශ්න අසන්නඃ

   - මෙම ගීතිකාවේ කුමණ හැඟීම් ප්‍රකාශකර තිබේද? ඔබ මෙම ගීතිකාව කියවනවිට හෝ එයට සවන්දෙන විට ඔබගේ හැඟීම් මොනවාද?

   පැවරුම් දෙනලද පංති සාමාජිකයින් එක්කෙනෙකුට හෝ දෙදෙනෙකුට ඔවුන් ප්‍රියකරන ගීතිකාවක් බෙදාගනිමින්, එය ඔවුන්ට වැදගත්වන්නේ මන්දැයි කීමට සලස්වන්න.

ශුද්ධ ලියවිලි සාකච්ඡා කිරීම සහ යෙදවීම.

පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා යොදවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින් දිරිමත් කරන්න.

මුලදි ප්‍රශංසා මෙන් ගායනා කරන ලද හෝ දෙවියන් වහන්සේට උනන්දු ඉල්ලීම් වල ගීතාවලිය ගීත එකතුවක් බව පහදා දෙන්න. බොහොමයක් ලියනලද්දේ දාවිත් විසිනි. මෙය පැරණි ඊශ්‍රායෙල් වරුන්ගේ ගීතමය පොතක් වැනිය. ලෝකයේ ඉතාම හොඳ පෙළඹවීමෙන් යුත් සාහිත්‍ය මෙම භාවනා කාව්‍ය වල අඩංගුවන අතර, ස්වාමීන්වහන්සේ තුල ඇදහීම ප්‍රකාශ කරමින්, ධර්මිෂ්ඨව ජීවත්වීමේ උනන්දු අභිප්‍රාය විදහාදක්වයි.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ සහ මෙහෙයේ අනාවැකි**

මෙසියස්වහන්සේ වශයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ දූතමෙහෙය ගැන බොහෝ ගීතිකා අනාවැකි පළකරයි.මළවුන්ගෙන් නැවත නැගිටි ගැලවුම්කරුවාණන් මෙසේ කීසේක, "මා ගැන මොසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද,අනාගත වක්තෘවරුන්ගේ ලියවිලවලද,ගීතිකා වලද ලියන ලද සියල්ල සම්පූර්ණ විය යුතුය.(ලූක් 24:44).ගීතිකා පොතෙහි ක්‍රිස්තුස් වහන්සේ ගැන ලියනලද පහත සඳහන් අනාවැකි ස්වල්පයක් සම්පූර්ණවීම ගැන සාකච්ඡා කරන්න.

| *අනාවැකිය* | *සම්පූර්ණවීම* |
|---|---|
| ගීතිකා 107:32-30 | මතෙව් 8:23-27- යේසුස් වහන්සේ සුළඟ සහ රැල්ල සන්සිඳවීම |
| ගීතිකා 69:8, | යොහාන් 1:11; 7:5. උන්වහන්සේගේ ජනතාව යේසුස් වහන්සේව පිළිනොගත්තෝය. |
| ගීතිකා 41:9; 55:12-14 | යොහාන් 13:18, 21 මිතුරෙකු විසින් යේසුස් වහන්සේ පාවාදෙන ලදී |
| ගීතිකා 69:20 | මාර්ක් 14:32-41 ගෙත්සෙමනේදී යේසුස් වහන්සේ තනිව දුක්වින්දසේක |
| ගීතිකා 22:7-8 | මතෙව් 27:39-43 යේසුස් වහන්සේව සමච්චලයට ලක්වුනි. |
| ගීතිකා 22:16 | මාර්ක් 15:25. යේසුස් වහන්සේව කුරුසියේ ඇණගසන ලදී. |
| ගීතිකා 22:18 | මතෙව් 27:35. ක්‍රිස්තුස් වහන්සේගේ ඇඳුම්වලට භේවායෝ දාදුදැම්මෝය. |
| ගීතිකා 22:1 | මතෙව් 27:46 යේසුස් වහන්සේ උන්වහන්සේව අත්හැරියේ මක්නිසාදැයි පියාණන් වහන්සේගෙන් ඇසූසේක. |
| ගීතිකා 69:21 | යොහාන් 19:28-30 යේසුස් වහන්සේගේ පිපාසයට, උන්වහන්සේට කාඩි දෙන ලදී |
| ගීතිකා 34:20 | යොහාන් 19:33–36. යේසුස් වහන්සේගේ එකම ඇටකටුවක් වත් බිඳුනේ නැත. |
| ගීතිකා 31:15 | ලූක් 23:46. යේසුස් වහන්සේ පියාණන් අතට ආත්මය භාරකොට, මැරුණ සේක. |
| ගීතිකා 16:10 | ක්‍රියා 2:31–32; 13:34–35. ගැලවුම් කරුවාණන්ගේ මාංශය කුණු නොවූ අතර, මළවුන්ගෙන් නැවත නැගිටිසේක. |

- උපත, ජීවිතය, මරණය සහ මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන උපතට පෙර අනාවැකි පළකරණු ලැබූ එකම පුද්ගලයා යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. ගැලවුම්කරුවාණන්ගේ ජීවිතය ගැන එවැනි සවිස්තර අනාවැකි පළකළේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (යේසුස් වහන්සේ පොරොන්දු වූ මෙසියස් වහන්සේ බවද, ලෝකයේ ගැලවුම්කරුවාණන් බවද මෙම අනාවැකි වලින් පැහැදිලි කරයි.) ඒවා ලැබූ අයට මෙම අනාවැකි ආශිර්වාදයක් වූයේ කෙසේද? උන්වහන්සේගේ උපතට පවා පෙර ගැලවුම්කරුවාණන් ගැන ඉගෙන ගැනීමටත් සාක්ෂි ලබා ගැනීමටත් අනාවැකි ජනතාවට උපකාර විය. [මොසායා 3:13 බලන්න]. උන්වහන්සේ පැමිණි විට, උන්වහන්සේව හඳුනා ගැනීමටද ඇතැම් ජනයාට මෙම අනාවැකි උපකාරී විය.

**2. "මක්නිසාද ස්වාමීන්වහන්සේ තට බොහෝසේ යහපත් කම් කළ සේක." (ගීතිකා 116:7).**

ගැලවුම්කරුවාණන්ගේ ජීවිතය හා දූතමෙහෙය ගැන අනාවැකි කීමට අමතරව, අහස පොළොව මැවීම; ගැලවුම්කරුවාණන්ගේ දයාව, කමාව, සහ දේව මාලිගා වැනි ආශිර්වාද වලටද බොහෝ ගීතිකා කෘතඥතාවය පළකරයි.

*අහස සහ පොළොව මැවීම.*

පහත අඳහන් ගීතිකා සාකච්ඡාකොට, අහසත් පොළොවත් මැවීම ගැන ස්වාමීන්වහන්සේට කෘතඥතාවය ප්‍රකාශකරන්න.

ගීතිකා 19:1
ගීතිකා 104:5–7, 14, 24
ගීතිකා 136:3–9

- අහසත් පොළොවත් මැවීම දෙවියන්වහන්සේගේ බලය සහ ප්‍රේමය ගැන සාක්ෂි දරන්නේ කෙසේද? (ඇල්මා 30:44; මොසෙස් 6:63 බලන්න.) මැවිල්ලේ දීමනාවට අපට කෘතඥතාවය පෙන්වීමට හැකිවන්නේ කෙසේද?

*ගැලවුම්කරුවාණන්ගේ දයාව, කමාව සහ ප්‍රේමය.*

ගැලවුම්කරුවාණන්ගේ දයාව, කමාව සහ ප්‍රේමයට කෘතඥතාවය ප්‍රකාශකරන පහත සඳහන් ගීතිකා සමහරක් සාකච්ඡාකරන්න.

ගීතිකා 23 (යොමුකිරීමේ ක්‍රියාකාරිත්වයට මෙම ගීතිකා භාවිතාකළා නම් එය සාකච්ඡා කිරීම ඔබට අවශ්‍ය නොවනවා ඇත.)
ගීතිකා 51 (24 වෙනි පාඩමේ මෙම ගීතිකාව ඔබ සාකච්ඡා කළා නම්, එය සාකච්ඡා කිරීම ඔබට අවශ්‍ය නොවනවා ඇත.)
ගීතිකා 59:16.
ගීතිකා 78:38.
ගීතිකා 86:5, 13.
ගීතිකා 100:4–5.
ගීතිකා 103:2–4, 8–11, 17–18.

- මෙම ගීතිකාවලින් ස්වාමීන්වහන්සේ ගැන අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද? ස්වාමීන්වහන්සේගේ දයාව, කමාව, ප්‍රේමය ගැන දැනගැනීමට ඔවුන්ට හැකිවූයේ කෙසේද කියා කීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.

- ගීතිකා 51, කමාව සඳහා දාවිත්ගේ ආයාචනාව ගැන ඔබගේ සිතෙහි පහළවන හැඟීම් මොනවාද? පසුතැවීම සහ කමාව ගැන මෙම ගීතිකාව අපට කුමක් උගන්වන්නේද? (2,7 සහ 12 යන පදවල පළවෙනි වචන ගැන සැලකිලිමත්වෙන්න. පසුතැවිල්ල ගැන වැදගත් අංග මෙම වචන විස්තර කරයි. 17 වෙනි පදය ගැනද සැලකිලිමත්වෙන්න, එය වනාහී සත්‍යවශයෙන්ම පසුතැවිලි වීමට අපගේ හදවතෙහි තිබියයුතු ස්වභාවය එය විස්තර කරයි.)

*ශුද්ධ ලියවිලි.*

ශුද්ධ ලියවිලි සඳහා ස්වාමීන් වහන්සේට කෘතඥතාවය ප්‍රකාශකරන පහත සඳහන් ගීතිකා සාකච්ඡාකරන්න.

ගීතිකා 19:7–11.
ගීතිකා 119.

- ශුද්ධ වූ ලියවිලි විස්තර කිරීමට ගීතිකා 19:7–10 දාවිත් භාවිතා කරන වචන මොනවාද? (නීතිය, සාක්ෂිය, ව්‍යවස්ථාව, පණත් සහ විනිශ්චය යන්න ශුද්ධ වූ ලියවිලි වල සමාන වචන වලට අඩංගුවේ, සම්පූර්ණ, ස්ථිර, හරි දෙය, පවිත්‍ර, සත්‍ය සහ ධර්මිෂ්ඨ යන වචන ශුද්ධ ලියවිලි විස්තර කිරීමට යොදන නාම විශේෂණ වේ. රත්තරන් වලට වඩා වටින පැණිවලට වඩා පැණිරස බවටද ශුද්ධ ලියවිලි විස්තර කරන ලදී.)

- ගීතිකා 19:7–11 වාර්ථාකර තිබෙන පරිදි ශුද්ධ වූ ලියවිලි අපගේ ජීවිතවලට ගෙනෙන ආශිර්වාද මොනවාද? මෙම ආශිර්වාද රටහුණු ලෑල්ලේ ලැයිස්තුගත කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

  අ. ඒවා අපගේ ආත්ම හරවයි (7 වන පදය)
  ආ. ඒවා නුවණ නැත්තන් ඥානවන්තකරන්නේය. (7 වන පදය)
  ඇ. ඒවා අපගේ සිත ප්‍රීතිමත්කරවන්නේය. (8 වන පදය)
  ඈ. ඒවා අපගේ ඇස් පාදන්නේය (8 වන පදය).
  ඉ. ඒවා අපට අවවාද ලබා දෙයි (11 වන පදය).

- මෙයින් හෝ වෙනත් ක්‍රමයකින් ශුද්ධ වූ ලියවිලි ඔබගේ ජීවිතයට ආශිර්වාද කළේ කෙසේද?
- ගීතකාකාරයා ස්වාමීන් වහන්සේට හඬ නැගුවේය, "ඔබගේ ව්‍යවස්ථාවට මම කොපමණ ප්‍රේම කරම්ද! දවස මුලුල්ලේම එය මාගේ භාවනාවයි" (ගීතාවලිය 119:97; 15–16, 33–35, 40, 47–50, 72,-92, 104, 174) යන පදද බලන්න). ශුද්ධ වූ ලියවිලි වලට එවැනි ප්‍රේමයක් වර්ධනය කර ගැනීමට අපට හැකි වන්නේ කෙසේද?
- ශුද්ධ ලියවිලි "[අපගේ] පාදයට පහනක්ය, [අපගේ] මාවතට එලියක් වන්නේ කෙසේද? (ගීතාවලිය 119:105).

දේවමාලිගාව.

දේවමාලිගාව ගැන පහත සඳහන් ගීතිකා සමහරක් සාකච්ඡා කරන්න. පංති සාමාජිකයින් මෙම ගීතිකා කියවන විට, දේව මාලිගා පිංතූර එකක් හෝ එයට වැඩිය පෙන්වීමට ඔබට උවමනා වෙනවා ඇතः

ගීතිකා 5:7
ගීතිකා 15:1–3
ගීතිකා 24
ගීතිකා 27:4
ගීතිකා 65:4
ගීතිකා 84:1–2, 4,10–12
ගීතිකා 122
ගීතිකා 134

- මෙම ගීතිකා වලින් දේවමාළිගා ගැන අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද? දේවමාළිගාවට යෑමට සූදානම් වීම ගැන අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද?

"අහෝ! දෙවියන් වහන්ස ඔබගේ ගෘහයට අපි ප්‍රේම කරමු." (ගීතිකා අංක 247), පංති සාමාජිකයින් ගායනා කිරීම හෝ වචන කියවීමට ඔබට උවමනා වෙනවා ඇත; නැතහොත් "දේවමාළිගාව බැලීමට මම කැමති වෙමි," *(ළමා ගී පොත* 95) ප්‍රාථමිකයේ ළමුන් සමහරෙක් පංතියට පැමිණ ගායනා කිරීමට ආරාධනා කරන්න.

3. **"ස්වාමීන් විසින් මට කළා වූ සියලු යහපත් කම් ගැන උන්වහන්සේට කුමක් දෙම්ද?" (ගීතාවලිය 116:12.)**

- ගීතිකා 116:12, දාවිත් ස්වාමීන්වහන්සේගෙන් මෙසේ ඇසුවේය, "ස්වාමීන් විසින් මට කළාවූ සියලු යහපත් කම් ගැන මම උන්වහන්සේට කුමක් දෙම්ද?" පහත සඳහන් දාවිත්ගේ එක් එක් ප්‍රකාශයක් ලයිස්තුගත කිරීමට ඔබට වුවමනාවෙනවා ඇත.

  අ. "මම ගැලවීමේ කුසලානය ගන්නෙමි" (116:13)
  ආ. "මම ස්වාමීන් ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි." (116:13)
  ඇ. "අහෝ ස්වාමීනී, සැබැවින්ම මම ඔබගේ මෙහෙකරු වෙමි" (116:16)
  ඈ. "මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි" (116:17)
  ඉ. "එසේය, ස්වාමීන්ගේ මුළු සෙනග ඉදිරියෙහි මාගේ භාර උන්වහන්සේට ඉෂ්ට කරන්නෙමි, ස්වාමීන්ගේ ගෘහ මළු වලදීත්" (116:18–19)

- ස්වාමින්වහන්සේට කෘතඥතාවය පෙන්වීමේදී දාවිත්ගේ පිළිතුරු වලට යොමු වීමට අපට හැකිවන්නේ කෙසේද?

4. **"ස්වාමීන් කෙරෙහි විශ්වාස තබන්න" (ගීතිකා 4:5)**

- "ස්වාමීන් කෙරෙහි විශ්වාස තබන්න" යන්න ගීතාවලියේ එක් සාමාන්‍ය අවවාදයකි. (ගීතාවලිය 4:5; 5:11; 9:10; 18:2; 56:11; 62:8; 118:8–9). ස්වාමීන්වහන්සේ කෙරෙහි අපගේ විශ්වාසය තබන්නේ කෙසේද?

අවසානය.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය දූතමෙහෙය ගැන ගීතාවලිය බලවත් සාක්ෂිදරයි. උන්වහන්සේ සහ අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ අපට දෙන ලද මහත් වූ ආශිර්වාද අපට ඒවා මතක් කර දෙයි. එම ආශිර්වාද වලට අපගේ කෘතඥතාවය ප්‍රකාශ කළ හැකි මාර්ග ඒවා අපට යෝජනා කරයි.

ගීතාවලිය පොතේ පණිවුඩය සාරාංශගත කිරීමට (ගීතාවලියේ 150) වන අන්තිම ගීතිකාව කියවීම පිණිස පංති සාමාජිකයින්ට ආරාධනා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත. ප්‍රශංසාවේ හා ස්තුති කිරීමේ ඔබගේම සාක්ෂිය එකතුකරන්න.

**ඉගැන්වීමේ අමතර අදහස්.**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. පසු-දවස් වල ගීතිකා පරණ ගිවිසුමේ ගීතිකා මගින් පොළඹවන ලදී**

පසුදවස් වල ගීතිකා වලට සමාන වන පරිදි ගීතිකා පොත අපට පෙනෙන බව පහදා දෙන්න. පරණ ගිවිසුමේ ගීතිකාවක් මගින් පොළඹවනු ලැබූ පසු දවස් වල ගීතිකාවක් පංති සාමාජිකයින් ලවා ගායනා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත. එම ගීතිකා සමහරක් නම් "ස්වාමින් වහන්සේ මගේ එඬේරාය" (ගීතිකා අංක 108; ගීතාවලිය 23), "ස්වාමින් වහන්සේ මගේ ආලෝකය වේ" (ගීතිකා අංක 89; ගීතාවලිය 27:1), "ඔබ කොපමණ ශ්‍රේෂ්ඨද" (ගීතිකා අංක 86; ගීතාවලිය 8:3–9; 9:1–2). "සියලු බලධාරී ස්වාමින් වහන්සේට ප්‍රශංසා කරන්න" (ගීතිකා අංක 72; ගීතාවලිය 23:6; 150).

**2. ගීතිකා ගායනා කිරීමේ ආශිර්වාද**

- පසු-දවස්වල අපගේ ගීතිකා වල ප්‍රධාන මාතෘකා සමහරක් මෙනවාද? (ඇතුලත්වන/අදාල) උත්තර මේවාය, ගැලවුම්කරුවාණන්, සභාවේ සාමාජිකයින් වශයෙන් අපගේ වගකීම්, අවසානය දකවා විඳදරා ගැනීම, නිවස සහ පවුල, ප්‍රේමය, ධර්මදූත කටයුතු, යාච්ඥාව, පූජකවරය, අනාගතවක්තෘවරු, නැවත පිහිටුවීම, ශුභාරංචිය, සක්‍රමේන්තුව, සේවය, පරීක්ෂාවන් දරා ගැනීම, සහ සයෝනය. ගීතිකා ගැයීමෙන් අප ආශිර්වාද ලබන්නේ කෙසේද? (ඩී සහ සී 25:12 බලන්න.)

ගීතිකා ගැයීමෙන් අපට ආශිර්වාද ලැබෙන පහත සඳහන් සමහර මාර්ග සාකච්ඡා කරන්න.

අ. ගීතිකා අපගේ ආත්ම ඔසවාතබයි.
ආ. වඩාත් ධර්මිෂ්ඨව ජීවත්වීමට ගීතිකා අපව පොළොඹවයි.
ඇ. ගීතිකා අපගේ ආශිර්වාද මතක්කර දෙයි.
ඈ. ස්වාමින් වහන්සේට ප්‍රශංසා ගැයීමට ගීතිකා අපට අවස්ථාවක් සලස්වා දෙයි.
ඉ. සාක්ෂි දැරීමට ගීතිකා අපට මාර්ගය සලස්වයි.
ඊ. ස්වාමින් වහන්සේ වෙතට නැවත කැපවීමට ගීතිකා අපට උපකාර කරයි.
උ. ආත්මයේ හැඟීම් ඇතිවීමට ගීතිකා අපට උපකාර කරයි.
ඌ. අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ සමග වඩාත් එකඟත්වයකට පැමිණීමට ගීතිකා අපට පිහිට වෙයි.
එ. ශුභාරංචිය ඉගෙනගැනීමටත් ඉගැන්වීමටත් ගීතිකා අපට උපකාර වේ.

පළමු සභාපතිත්වය මෙසේ කීවේය:

"අනුහාව සම්පන්න ගීතිකා අපගේ සභාරැස්වීම් වල වැදගත් කොටසකි. ස්වාමින් වහන්සේගේ ආත්මයට ගීතිකා ආරාධනය කරන අතර, ගෞරවනීය හැඟීමක් ඇති කරයි. සාමාජිකයන් වශයෙන් අපව එකමුතු කරයි, තවද ස්වාමින් වහන්සේට අපගේ ප්‍රශංසා පූජාකිරීමට මාර්ගය සලස්වයි.

"සමහර ශ්‍රේෂ්ඨ දේශන, දේශනා කර ඇත්තේ ගීතිකා ගායනය මගින්ය. පසුතැවීමටද, යහපත කිරීමටද, සාක්ෂි හා අත්දැකීම් ගොඩනගා ගැනීමටද, වෙහෙස වූවන් සැනසීමටද, දුකට පත්

අය අස්වැසීමටද, අවසානය දක්වා විඳදරා ගැනීමට අප පෙළඹවීමටද ගීතිකා පිහිට වෙයි" (ඃඨඞීඞීශ්‍රී, ඕීx 34832).

- "ස්වාමීන් වහන්සේට ප්‍රීති නාද පවත්වමින්" ගායනා කිරීමට සමහර ගීතිකා කියයි (ගීතාවලිය 98:4; 100:1; ද 66:1; 95:1-2 බලන්න). අපගේ සභාරැස්වීම් වලදී සහ නිවාස වලදී ගීතිකා ගැයීම ප්‍රීතිමත් හා අර්ථවත් බව ස්ථිර කර ගැනීමට, වඩාත් හොඳට ප්‍රයෝජන ගැනීමට අපට හැකිවන්නේ කෙසේද?
- අන්තිම රාත්‍රි භෝජනයේදී, යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ප්‍රේරිතවරුන් ගීතිකාවක් ගායනා කළහ (මතෙව් 26:30). ඔවුන්ගේ ඉදිරියෙහි තිබුන කටයුතු සම්පූර්ණ කිරීම පිණිස යේසුස් වහන්සේට සහ උන්වහන්සේගේ ප්‍රේරිතවරුන්ට ගීතිකාවක් ගැයීම උපකාර වූ අන්දම ගැන ඔබ සිතන්නේ කෙසේද?

**3. ගීතිකාවල නැවත නැවත කීමේ සමානාත්වය.**

දාවිත් සහ අනිකුත් හෙබ්‍රෙව් කිවිවරුන් භාවිතා කළ කාව්‍යමය තාක්ෂණ අවබෝධ කරගැනීම මගින් ඔබගේ ගීතිකා අධ්‍යනය සාරවත් වීමට හැකිය. මෙයින් එක තාක්ෂණයක් නම් සමානත්වයයි. සමානත්වයේ එක සාමාන්‍ය ගුණාංගයක් නම් එක් සිතුවිල්ලක් වෙනස් වචන වලින් නැවත නැවත කීමය. එවැනි නැවත කීම අදහසේ අර්ථය විස්තරවීම හෝ වේගවත් වන්නේය. මෙවැනි සමානත්වයක එක් නිදර්ෂණයක් නම් ගීතාවලිය 102:1–2 ය. එහි එකම සිතුවිල්ල පස් වතාවක් වෙනස් අන්දමින් ප්‍රකාශකර තිබේ. ("මාගේ යාච්ඥාව ඇසුව මැනව, "මාගේ යාච්ඥාව ඔබ වෙතට පැමිණේවා," "ඔබගේ මුහුණ මා කෙරෙන් සඟවා නොගත මැනව," "මා අඬගසන දවසේ ඉක්මණින් මට උත්තර දුන මැනව").නැවත නැවත කීමෙන් පණිවිඩය වේගවත් වන අන්දම පෙන්වා දෙන්න.

# සාලමොන් රජ: ඥානවන්ත මිනිසා, අඥානවන්ත මිනිසා

# 26
වෙනි පාඩම.

*1 රාජාවලිය 3:5–11.*

**අරමුණ**

ඔවුගේ ආශිර්වාද ඥානවන්තව භාවිතා කරමින්ද, සුදුසු ආකාරයෙන් දේවමාළිගාවට ඇතුල්වීම පිණිස පංති සාමාජිකයින් දිරිගැන්වීමටය.

**සූදානම.**

1. යාච්ඥාවෙන් පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යනය කරන්න.

   අ. 1 රාජාවලිය 3:5-28. සාලමොන් ඔහුගේ පියා වූ දාවිත්ට පසු රජ විය, තවද ස්වාමින් වහන්සේව අනුගමණය කළේය. ස්වාමින් වහන්සේ සාලමොන්ට පෙනුනේය, එවිට නුවණ ඇති සිතකින් ඔහුට ආශිර්වාද කරන ලෙස ඉල්ලුවේය (3:5-9). ඥානය, ධනය සහ ගෞරවයෙන් ස්වාමින් වහන්සේ සාලමොන්ට ආශිර්වාද කළ සේක (3:10-15). ස්ත්‍රීන් දෙදෙනෙකු දරුවකු රැගෙන සාලමොන් වෙතට පැමිණියෝය. ඔහු දරුවාගේ මව වූ තැනැත්තිය කවුද කියා ඥානවන්තව තීරණය කළේය (3:16-28).

   ආ. 1 රාජාවලිය 5–6; 7:1–12. විශාල දේවමාළිගා ගොඩනැගීමට සාලමොන් මග පෙන්වයි (5-6). ඔහු ඔහුටම මාළිගාවක් තනවා ගත්තේය (7:1-12).

   ඇ. 1 රාජාවලිය 8:22–66; 9:1–9. සාලමොන් දේවමාළිගාව කැපකොට ඉශ්‍රායෙල් වරුන්ට ආත්මිකව සහ ලෞකිකව සමෘධිමත් කිරීමට ස්වාමින් වහන්සේගෙන් ඉල්ලුවේය. (8:22-53). ජනතාව දින 14 නමස්කාර කළහ (8:54–66). ස්වාමින් වහන්සේ නැවත සාලමොන්ට දර්ශනය විය. ඉශ්‍රායෙල්වරු උන්වහන්සේට සේවය කරනවා නම් ඔවුන්ට ආශිර්වාද කරන බවටත්, වෙනත් දෙවිවරුන්ට හැරෙනවා නම් ඔවුන්ට ශාප කරන බවටත් පොරොන්දු වූ සේක (9:1–9).

   ඈ. 1 රාජාවලිය 10–11 සාලමොන්ගේ ධනය හා ඥානය නිසා ඔහුගේ කීර්තිය වැඩෙයි. (10:1–13, 24–25). ඔහු අධිකව ධනවත් වෙය (10:14–23, 26). ඉශ්‍රායෙල්වරුන් නොවූ බොහෝ ස්ත්‍රීන් ඔහු විවාහකරගත් අතර වෙනත් බොරු දෙවිවරුන් වන්දනා කිරීමට ඔවුහු ඔහුව පෙළඹුවහ (11:1–10). ස්වාමින් වහන්සේ සාලමොන්ට විරුද්ධව විරුද්ධකාරයන් නගාසිටෙව්සේක (11:11–25). සාලමොන්ගේ දුෂ්ඨකම් නිසා ඉශ්‍රායෙල් රාජධානිය බෙදීයන බවට අනාගතවක්තෘවරයෙකු කලින් කීවේය (11:26–40).

2. අමතර කියවීම්: 1 රාජාවලිය 2:1–12; 4:29–34; 7:13–51; 1. ලේකම් 29; දහම සහ ගිවිසුම 46.

3. පැරණි කාළයේ භාවිතා කළ දේවමාළිගා පිංතූරය තිබේ නම්, පාඩමට එය භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත (62300; ශුභාරංචි චිත්‍ර පිංතූර කට්ටලය 118).

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.**

පාඩම පටන්ගන්නා විට පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

වැඩිහිටි ඩැලින් එච්. ඕක්ස් විසින් කරන ලද පහත සඳහන් ප්‍රකාශය කියවන්න නැතහොත් පංති සාමාජිකයෙකු ලවා කියවන්න.

"සාතන් අපට පහර දෙන්නේ අපගේ දුර්වල තැන් වලදී යැයි අපි සාමාන්‍ය වශයෙන් සිතන්නෙමු....පහසුවෙන් පහරදිය හැක්කේ අපගේ දුර්වලකම් නිසා පමණක් නොවේ. අප ශක්තමත් යයි සිතන ස්ථාන වලදී—එනම් අපගේ ශක්තිය ගැන උඩගු වන එම අවස්ථා වලදීම අපට පහර දීමට සාතන්ට හැකිය. අපගේ ශ්‍රේෂ්ඨ හැකියාවන් සහ අප සතු ආත්මික දීමනා තුලින් ඔහු අපට ලඟාවෙයි.අප පරීක්ෂාකාරී නොවන්නේ නම්, අපගේ ශක්තිය තුලින්

අප නොමගට යොදවා, එසේම අපගේ දුර්වල කම් තමාගේ ප්‍රයෝජනය පිණිස සලසා අපගේ ආත්මික වැටීම සාතන්ට සැලැස්වීමට හැකිය."("Our Strengths Can Become Our Downfall," *Ensign*, ඔක්තෝ 1994,12).

- අපගේ වැටීම සැලැස්විය හැකි ශක්තීන් සමහරක් මොනවාද?

මෙම පාඩම සාලමොන් රජු ගැන බව පහදා දෙන්න. දෙවියන් වහන්සේගෙන් අගනා දීමනා ලත් නමුත් අවසානයේදී එම දීමනා ධර්මිෂ්ඨ ලෙස භාවිතා කළ මිනිසෙකි ඔහු. සාලමොන් ක්‍රමයෙන් පිරිහීම පෙන්වන සිද්ධීන් වෙතට යොමුවීම පිණිස පංති සාමාජිකයින්ට යෝජනා කරන්න. ඔහුගේ වැරදි දෙස බලා ඔහු විනිශ්චය කිරීමට නොව, ඔහුගේ වැරදි වලින් අප ඉගෙනගත යුතු බව අවධාරණය කරන්න.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ අදාළකර ගැනීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ආත්මික ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

දාවිත්ගේ මරණයට ස්වල්ප මොහොතකට පෙර, ශාදෝක් පූජකයා සහ නාතාන් අනාගතවක්තෘ සාලමොන්ව අලුත් රජකොට ආලේප කළහ. දාවිත්ගේ සහ බැත්ෂෙබාගේ පුත් වූ සාලමොන්ට පහත සඳහන් උපදෙස් ඔහුගේ පියාගෙන් ලැබුනේය: "එබැවින් නුඹ බලවත්,....පුරුෂයෙකු මෙන් සිටිමින්; නුඹේ දෙවි වූ ස්වාමින් වහන්සේගේ මාර්ග වල හැසිරෙමින්, උන් වහන්සේගේ පනත්ද, ආඥාද, විනිශ්වයන්ද, ශික්ෂාද, රක්ෂා කරමින් උන් වහන්සේගේ නියමය පවත්වා ගනිමින්..... නුඹ කරන සියල්ලෙහිදී නුඹ සමෘධිමත් වන පිණිසය" (1 රාජාවලිය 2:2-3).

**1. ඥානයෙන්, ධනයෙන් සහ ගෞරවයෙන් ස්වාමින් වහන්සේ සාලමොන්ට ආශිර්වාද කරන සේක.**

1 රාජාවලිය 3:5–28 උගන්වා සාකච්ඡා කරන්න.

- සාලමොන් රජ වූ විගසම ස්වාමින් වහන්සේ ස්වප්නයකින් සාලමොන්ට පෙනුණු සේක, "මා විසින් නුඹට දිය යුතු දෙය ඉල්ලාපන් යැයි කී සේක." (1 රාජාවලිය 3:5) සාලමොන් කුමක් ඉල්ලුවේද? (1 රාජාවලිය 3:9 බලන්න.) "නුවණැති සිතක්" යන්නෙහි අර්ථය කුමක්ද? (1 රාජාවලිය 3:28; 4:29 බලන්න.) එම ආශිර්වාදය පිණිස විශේෂ අවශ්‍යතාවයක් සාලමොන්ට හැඟුනේ කුමක් නිසාද? (1 රාජාවලිය 3:7-8 බලන්න.) "දෙවියන් වහන්සේගේ ප්‍රඥාව" අපට තිබීමෙන් නිවසේ, වැඩ කරන ස්ථානයේ, පාසැලේ, සභාවේ අපගේ වගකීම් වලට උපකාර වන්නේ කෙසේද? මෙම ඥානය අපට ලබා ගත හැකි වන්නේ කෙසේද?
- නුවණැති සිතක් ඉල්ලීම ගැන ස්වාමින් වහන්සේ සාලමොන් කෙරෙහි ප්‍රසන්න වූයේ කුමක් නිසාද? (1 රාජාවලිය 3:11–12 බලන්න. ආත්මාර්ථකාමී අරමුණක් ඇති දීමනාවකට වඩා අන්‍යයන්ට සේවය කිරීමට උපකාර වන දීමනාවක් සාලමොන් ඉල්ලුවේය.) අප සොයන ආත්මික දීමනා සමහරක් මොනවාද? (ඕසහසී 46:13–26.) ආත්මික දීමනා ස්වාමීන්වහන්සේ දෙන්නේ කුමන කොන්දේසි මතද? (1 රාජාවලිය 3:14; ඕ සහ සී 46:8–12.) අන්‍යයන්ට සේවය කිරීමට මෙම දීමනා භාවිතා කිරීමට අපට හැකිවන්නේ කෙසේද?
- ස්වාමින් වහන්සේ සාලමොන්ට දුන් අමතර ආශිර්වාද මොනවාද? (1 රාජාවලිය 3:13–14 බලන්න.) අන්‍යයන්ට සේවය කිරීම පිණිස මෙම ආශිර්වාද භාවිතා කරන්නේ කෙසේද?
- සාලමොන් රජුගේ විනිශ්චය අවශ්‍ය වූ පළවෙනි සිද්ධිය කුමක්ද?(1 රාජාවලිය 3:16-22 බලන්න.)ප්‍රශ්නය සාලමොන් විසඳුවේ කෙසේද?(1 රාජාවලිය 3:23–38 බලන්න.) ස්වාමින් වහන්සේ සාලමොන්ට ප්‍රඥාවෙන් ආශිර්වාද කර තිබෙන බව ඔහුගේ විසඳුමෙන් පෙන්වූයේ කෙසේද?

**2. විශිෂ්ඨ දේව මාළිගාව ගොඩනැගීමටද, ඔහු වෙනුවෙන් මාළිගාවක් තැනීමටද සාලමොන් රජු මග පෙන්වයි.**

1 රාජාවලිය 5–6; 7:1–12 උගන්වා සාකච්ඡා කරන්න.

- ස්වාමින් වහන්සේ විසින් අණකරනු ලැබ, දේව මාළිගාවක් තැනීමට සාලමොන් මග පෙන්වූයේය. 1 රාජාවලිය 5:1–6, 17–18; 6:15–36, දේව මාළිගාවේ විසිතුරු තත්වය කෙරෙහි අවධාරණය කිරීම පිණිස කෙටියෙන් නැවත බැලීමට ඔබට උවමනා වෙනවා ඇත.) දේවමාළිගාව ගොඩනැගීමට එවැනි සියුම් උපකරණ, සාලමෙන් භාවිතා කළේ ඔබ සිතන අන්දමට කුමක් හෙයින්ද?

- දේවමාළිගාව තනන විට ගොඩනැගිලි කරුවෝ එයට ගරුබුහුමන් දැක්වූයේ කෙසේද? (1 රාජාවලිය 6:7.)

- දේවමාළිගාව සුදුසු අන්දමට ගොඩනැගීම සිථිර කර ගැනීම පිණිස, ඔහුගේ ප්‍රඥාව, ධනය සහ ගෞරවය සාලමොන් භාවිතා කළේ කෙසේද? (1 රාජාවලිය 5:1–12 බලන්න. මෙම ශක්තිය නිසා, ගොඩනැගිලි උපකරණ ලබා ගැනීමටද, දක්ෂ කුලී කරුවන් බඳවාගෙන දේවමාළිගාව තැනීමට ඔහුට හැකි විය.)

- දේවමාළිගාව සම්බන්ධව ස්වාමින් වහන්සේ සාලමොන්ට දුන් පොරොන්දුව කුමක්ද? (1 රාජාවලිය 6:11–13 බලන්න.) ස්වාමින් වහන්සේගේ අද අපට දී තිබෙන ඒ හා සමාන පොරොන්දුව කුමක්ද? (ඩී සහ සී 97:15–17 බලන්න.)

- ඔහු උදෙසාද සාලමොන් නිවසක් තැනෙව්වේය. ස්වාමින් වහන්සේගේ ගෘහයේ ප්‍රමාණය සමාන කරන විට ඔහුගේ ගහයෙහි ප්‍රමාණය කෙතරම්ද? (1 රාජාවලිය 6:2–3; 7:2, 6–7 බලන්න.) ධනය මෙසේ භාවිතා කරන විට සාලමොන්ගේ ක්‍රමක්ක්‍රමයෙන් පිරිහීම පෙන්වන්නේ කෙසේද?

**3. සාලමොන් දේවමාළිගාව කැපකරයි.**

1 රාජාවලිය 8:22–66; 9:1–9 උගන්වා සාකච්ඡා කරන්න.

- අවුරුදු හතක්ම තනා නිම කළ පසු දේව මාළිගාව කැපකරන ලදී. කැපකිරීමේ යාච්ඥාවේදී, සාලමොන් යාච්ඥා කළ සමහර දේවල් මොනවාද? (1 රාජාවලිය 8:22–53 බලන්න.)

  පංති සාමාජිකයින්ගේ පිළිතුරු රට හුණුලැල්ලේ ලැයිස්තුගත කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත. පහත සඳහන් පිළිතුරු අඩංගු විය හැකිය.

  අ. යාච්ඥා වලට පිළිතුරු (1 රාජාවලිය 8:28–30, 49–52)
  ආ. කමාව (1 රාජාවලිය 8:33–39)
  ඇ. වැස්ස (1 රාජාවලිය 8:35–36)
  ඈ. සාගතය හා රෝග වලදී, උපකාර (1 රාජාවලිය 8:37)
  ඉ. යුද්ධයේදී උපකාර (1 රාජාවලිය 8:44–45)

- බොහෝ අසීරු ප්‍රශ්න වලදී ඔහුගේ ජනතාවට උපකාර කිරීම පිණිස, ඔහුගේ කැපකිරීමේ යාච්ඥාවේදී සාලමොන් ස්වාමින් වහන්සේට යාච්ඥා කළේය. අප මහත් සේ පීඩා විඳින විට දේවමාළිගාවට පැමිණීම අපට උපකාර වන්නේ කෙසේද?

  සභාපති එස්රා ටැෆ්ට් බෙන්සන් මෙසේ කීවේය. "මෙම ලස්සන දේවමාළිගා තුල සමාදානය තුලින්, ජීවිතයේ අසීරු ප්‍රශ්න වලට සමහර විට අපට විසඳුම් ලැබේ. ආත්මයාණන්ගේ පෙළඹවීමේ යටතේ ඇතැම්විට පවිත්‍ර ඥානය අප වෙතට ගලා එන්නේය. දේවමාළිගා පෞද්ගලික එළිදරව්වල ස්ථානයකි. ප්‍රශ්නයකින් හෝ අසීරු දෙයකින් මම පීඩා විඳින විට, පිළිතුරු සඳහා හදවතෙහි යාච්ඥාවක් සමග ස්වාමින් වහන්සේගේ ගෘහයට ගියේය. පැහැදිලි අමතක නොවන මාර්ග වලින් මෙම පිළිතුරු පැමිණියේය" ("What I Hope You Will Teach Your Children about the Temple," *Ensign*, අගෝ. 1985,8).

- අභක්තිකයින්ට ස්වාමින් වහන්සේ වෙතට මග පෙන්වීමට දේවමාළිගාව උපකාර වන පිණිස සාලමොන් යාච්ඥා කළේය (1 රාජාවලිය 8:41-43). දේවමාළිගාවක් මෙය කරන්නේ කෙසේද? (දේවමාළිගා ගැන ඔවුන්ගේ උනන්දුව නිසා ඔවුන් හෝ අන්‍යයන් සභාව ගැන උනන්දු වූ ආකාරයේ නිදර්ශන බෙදා ගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.)

- සාලමොන් කැපකිරීමේ යාච්ඥාව පිදුවාට පසු, ජනතාවට ඔහු මෙසේ අවවාද කළේය, "අපගේ දෙවි වූ ස්වාමින් වහන්සේ වෙත—-නුඹලාගේ සිත්…සම්පූර්ණව තිබේවා" (1 රාජාවලිය 8:61). "ස්වාමින් වහන්සේ වෙත සම්පූර්ණව" සිත් තිබීම යන්නෙහි අර්ථය ඔබ සිතන අන්දමට

කුමක්ද? පගේ සිත් සම්පූර්ණ කරගැනීම පිණිස, දේව මාළිගාවට පැමිණීම උපකාර වන්නේ කෙසේද?

- අපගේ ජීවිත වල දේවමාළිගාවේ බලපෑම ශක්තිමත්ව තබාගැනීමට අපට කුමක් කළ හැකිද? (පිළිතුරු මේවා විය හැක: හැකි සෑම තැනකදීම නිතර පැමිණීම, වළංගු සහතිකයක් තබා ගැනීම, අපගේ නිවාස වල දේවමාළිගා පිංතූරයක් පෙනෙන්ට තැබීම.)

- දේවමාළිගාව කැපකළාට පසු ජනතාව කුමක් කළෝද? (1 රාජාවලිය 8:62–66 බලන්න.) දේවමාළිගාව කැපකිරීමෙන් හා දින 14ක් වන්දනා කිරීමෙන් පසු ජනතාව ඔවුන්ගේ නිවෙස්වලට හැරීගියාට පසු ඔවුන්ගේ ආකල්පය කුමක් වූයේද? (1 රාජාවලිය 8:66 බලන්න.) දේවමාළිගාවෙන් නැවත ඔබ ගෙදර පැමිණි පසු ඔබට කෙසේ හැඟෙන්නේද?

- දේවමාළිගාව කැපකළාට පසු, ස්වාමීන් වහන්සේ සාලමොන් වෙතට පැමිණ, උන්වහන්සේ දුන් පණිවුඩය කුමක්ද? (1 රාජාවලිය 9:3–9 බලන්න, 1 රාජාවලිය 6:11–13 ද බලන්න. දේවමාළිගාව තනන විට ඒ හා සමාන ප්‍රකාශයක් ස්වාමීන් වහන්සේ දුන් බව මතකතබා ගන්න.) ඔහුගේ ගිවිසුම් ගැන සාලමොන්ට මතක් කිරීමට අවශ්‍ය වූයේ ඔබ සිතන අන්දමට කුමක් හෙයින්ද? අපගේ ගිවිසුම් ගැන ස්වාමීන් වහන්සේ අපට මතක් කරන්නේ කෙසේද?

**4. සාලමොන් අධික ලෙස ධනවත් වී, පිළිම වන්දනාවට ඔහුව පොළඹවන ඉශ්‍රායෙල් නොවූ බොහෝ ස්ත්‍රීන්ව විවාහ කරගත්තේය.**

1 රාජාවලිය 10–11 උගන්වා සාකච්ඡා කරන්න.

- දේවමාළිගාව තැනුවාට පසු සාලමොන්ගේ ධනය සහ ගෞරවය වැඩිවූයේ කෙසේද? (1 රාජාවලිය 10:1–15, 24–25 බලන්න.)-මෙම ආශිර්වාද සාලමොන් වැරදිලෙස පාවිච්චි කළේ කෙසේද (1 රාජාවලිය 10:16–23, 26–29. දෙවියන් වහන්සේගේ රාජධාණිය ගොඩනැගීම වෙනුවට ඔහු ඔහුගේ රාජධානිය ගොඩනැගු බව පෙන්වා දෙන්න.)-ප්‍රඥාව, ධනය සහ ගෞරවය කෙසේ භාවිත කළ යුතුද? (යාකොබ් 2:18-=19 බලන්න.)

- සාලමොන් භාර්යාවන් තෝරාගත් ආකාරය මගින් ඔහු දෙවියන් වහන්සේ වෙතින් ඉවතට හැරුණු බව පෙන්වන්නේ කෙසේද? (1 රාජාවලිය 11:1–2 බලන්න. ගිවිසුමෙන් පිට ඔහු විවාහ විය.) සාලමොන්ගේ ඉශ්‍රායෙල් නොවූ (අන්‍ය ජාතික) භාර්යාවන් ඔහුට අනුබල දුන්නේ කුමක් කිරීමටද? (1 රාජාවලිය 11:3–8 "ඔහුගේ පියා වූ දාවිත්ගේ හද මෙන් සාලමොන්ගේ හද වෙනස්වූ" බව ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ 4වෙනි පදය කියන අතර, "දාවිත් වූ තම පියා මෙන් සාලමොන් ස්වාමීන් වහන්සේ අභියස දුෂ්ඨ වූ දේවල් කළ බව" 6 වෙනි පදය කියන බව සිහි තබා ගන්න.

- සාලමොන් ගිවිසුම් කඩා ඉවතට හැරුණු විට ස්වාමීන් වහන්සේ කුමක් කළ සේක්ද? (1 රාජාවලිය 11:9–14, 23–25, 33–36.)

- ප්‍රඥාව, ධනය හා ගෞරවය සාලමොන්ගේ වැටීමට දායක වීම ගැන ඔබ කුමක් සිතන්නේද? මෙම ශක්තීන් අද ජනතාවගේ වැටීමට දායක වන බව ඔබ දකින්නේ කෙසේද? අපගේ හැකියාවන් අපගේ වැටීමට ඉඩ නොසලස්වන බව ස්ථිරකර ගැනීමට අපට හැකිවන්නේ කෙසේද? (බලන්න 1 රාජාවලිය 8:61; ධී සහ සී 88:67.)

  වැඩිහිටි ඩැලින් එච්. ඕක්ස් මෙසේ කීවේය:

  "අපගේ හැකියාවන් මගින් අපගේ වැටීම අප වලක්වාගන්නේ....කෙසේද? අප පුහුණු කළ ගත යුතු ගුණාංගය නිහතමානීකමය. නිහතමානීකම ශ්‍රේෂ්ඨ ආරක්ෂාවකි. නිහතමානී කම උඩඟු වීම වළක්වයි. නිහතමානීකම සියලුම ඉගැන්වීම් වලට, විශේෂයෙන්ම ආත්මික දේවල් වලට පොළඹවයි. අනාගතවක්තෘ මොරෝනි මගින්, නිහතමානී කමේ කාර්‍යභාරය වෙතට මෙම අගනා දර්ශනය ස්වාමීන් වහන්සේ අපට දුන් සේක: 'මිනිසුන්ට මා දුර්වලකම් දෙන්නේ ඔවුන් නිහතමානී වීමටය; මා ඉදිරියේ නිහතමානී වන සියලු දෙනාටම මාගේ අනුග්‍රහය ප්‍රමාණවත්ය; මක්නිසාද මා ඉදිරියේ ඔවුන් ඔවුන්ව නිහතමානී කරන්නේ නම්, දුර්වල දේවල් ඔවුන් වෙතට හක්තිමත් වීමට මම සලස්වන්නෙමි' (ඊතර් 12:27).

"දෙවියන් වහන්සේ ඉදිරියෙහි මිනිසුන් සහ සත්‍රීන් නිහතමානී වන්නේ නම්, ඔවුන්ව විනාශ කිරීමට විරුද්ධකාරයා ඔහුගේ ප්‍රයෝජනයට යොමුකරගන්නා, ඔවුන්ගේ එම ශක්ති දුර්වල වීමෙන් වළක්වා ගැනීමට උන්වහන්සේ ඔවුන්ට උපකාර කරන සේක...

".... අප නිහතමානී සහ ඉගැන්විය හැකි අය නම්, දෙවියන් වහන්සේගේ පණිත් වලට, නායකයින් ගේ උපදෙස් වලට උන්වහන්සේගේ ආත්මයාණන් ගේ පෙළඹවීම් වලට අප සවන් දෙන්නේ නම්, අපගේ ආත්මික දීමනාවන්, අපගේ නිපුනත්වයන්, සහ අපගේ අනෙකුත් සියලුම හැකියාවන් ධර්මිෂ්ඨ අන්දමට භාවිතා කිරීමට අපට මගපෙන්වීම් ලබාගත හැකිය. අපගේ හැකියාවන් මගින් අපගේ වැටීම සලස්වන සාතන්ගේ උත්සාහයන් වළක්වාලීමට අපට මගපෙන්වීම් ලබාගත හැකිය.

"මේ සියල්ලෙහිදී, ස්වාමින් වහන්සේගේ මගපෙන්වීම සහ පොරොන්දුව කෙරෙහි විශ්වාසය තැබීමට අප සිහි තබාගත යුතුයඃ 'නුඹ නිහතමානී වෙයන්; ස්වාමි වූ නුඹගේ දෙවියන් වහන්සේ, නුඹව අතින් අල්ලා මගපෙන්වමින්, නුඹගේ යාච්ඤා වලට පිළිතුරු දෙන සේක' (ඩී සහ සී 112:10)" ("Our Strengths Can Become Our Downfall," *Ensign*, ඔක්තෝ. 1994, 19 ).

---

**අවසානය.**

ස්වාමින් වහන්සේ ඔබට දෙන ලද ආත්මික සහ ලෞකික ආශිර්වාදවලටද දේවමාළිගාවටද ඔබගේ කෘතඥතාවය ප්‍රකාශ කරන්න. ඔවුන්ගේ ආශිර්වාද ඥානවන්තව භාවිතා කරමින්, සුදුසු පරිදි දේවමාළිගාවට ඇතුල්වීම පිණිස ස්වාමින් වහන්සේ ඉදිරියේ නිහතමානී වීමට පංති සාමාජිකයන් දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1. "ඔහුගේ හෘදය තමාගේ සහෝදරයන් කෙරේ උඩගු නොවීම (ද්විතිය කථාව 17:20)**

- ද්විතිය කථාව 17:14–20 පංති සාමාජිකයෙකු ලවා ශබ්දනගා කියවන්න. සාලමොන්ගේ ජීවිතය සහ ඔහුගේ රාජධානියේ ජනතාවගේ ජීවිත මෙම ශුද්ධ වූ ලියවිල්ලට යොමුවීමෙන් කෙසේ වෙනස්වූයේද?

**2. දේවමාළිගා සඳහා කැපකිරීමේ යාච්ඤාවන්**

පංති සාමාජිකයන්ගෙන් කෙනෙකු දේවමාළිගාවක් කැපකිරීමේදී පැමිණ සිටියා නම්, ඔවුන්ගේ අත්දැකීම් ගැන එක්කෙනෙකුට හෝ දෙදෙනෙකුට කීමට සලස්වන්න. පසු දවස්වල දේවමාළිගාවක් කැපකිරීමේ යාච්ඤාවක දර්ශන දෙකක් හෝ තුනක් බෙදා ගැනීමට සූදානම් වීම පිණිස පංති සාමාජිකයෙකුට කීමට ඔබට වුවමනා වෙනවා ඇත. කර්ට්ලන්ඩ් දේවමාළිගාවට කැපකිරීමට පිදුව යාච්ඤාව දහම සහ ගිවිසුමේ 109 අඩංගු වේ.

- කැපකිරීමේ යාච්ඤාව අපගේ පුද්ගලික ජීවිත වලට බලපෑ යුතු වන්නේ කෙසේද?

  සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් මෙසේ කීවේය, "ස්වාමින් වහන්සේට අප ගෘහයක් කැප කරන විට, අප ඇත්ත වශයෙන්ම කරන්නේ ගිවිසුමක් සමග, ස්වාමීන් වහන්සේට සේවය කිරීමට අපම කැපවීමය, එනම් එම ගෘහය භාවිතා කිරීම උන්වහන්සේ බලාපොරොත්තු වන අන්දමට, අප එම ගෘහය භාවිතා කිරීමටය. (*Church News* 22 ජන. 1972,3).

27

වෙනි පාඩම.

# දුෂ්ට සහ ධර්මිෂ්ඨ නායකයින්ගේ බලපෑම

*1 රාජාවලිය 12–14; 2 ලේකම් 17; 20*

**අරමුණ**

පංති සාමාජිකාවන්ට යහපත් ගුණාංග දියුණුකරගෙන අන් අයව ධාර්මිකව ජීවත්වීමට පෙළඹවීමට දිරිගැන්වීමය.

**සූදානම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න:

අ. 1 රාජාවලිය 12:1–20. රෙහොබොවම්, ඔහුගේ පියා වන සාලමොන් වෙනුවට ඉශ්‍රායෙල් ගෝත්‍ර දොළස මත රජ විය. ඔවුන්ගේ විය ගහ තව වඩා බර කිරීමට සොයමින්, ඔහුගේ ජනතාවට සේවය කිරීම පිණිස වැඩිමහල්ලන්ගේ උපදෙස් ප්‍රතික්ෂේප කළේය. (12:1–15). ගෝත්‍ර දශය කැරළි ගැසූ බැවින් රාජධානිය බෙදුනේය (12:16–19; ගෝත්‍ර දශය ඉශ්‍රායෙල් රාජධානියේ පටබැඳි නම තබා ගත් අතර, යුදා සහ බෙන්ජමින් ගෝත්‍ර රොහොබොවම්ගේ පාලනයට යටත්ව යුදා රාජධානිය යයි නම් කළේය.) සාලමොන්ගේ රාජ්‍යයෙහි පළමුව කළමණාකරුවෙක්ව සිටි යෙරොබොම්ව ඉශ්‍රායෙල්වරු රජ කමට තෝරා ගත්හ (12:20).

ආ. 1 රාජාවලිය 12:25–33; 13:33–34; 14:14–16, 21–24. යෙරෝබොවම් ඔහුගේ ජනතාව රූප වන්දනාවට මගපෙන්වමින් ලෙවීවරුන් නොවූ අය පූජකයින් කළේය. (12:25–33; 13;33–34; උස් හෙල් පිටත් අමු ගස් යටත් යන්නෙහි විස්තරයට දෙවැනි ඉගැන්වීමේ අමතර අදහස බලන්න).-යෙරොබොම්ගේ පවුල විනාශ වන බවත් ඉශ්‍රායෙල් විසුරුවන බවත් අනාගතවක්තෘ කෙනෙක් කලින් කීවේය (14:14-16). යුදා රාජ්‍ය දේව රූප වන්දනාවට යෙරොබොම් මගපෙන්වූයේය (14:21–24).

ඇ. 2 ලේකම් 17:1–10; 20:1–30. රොහොබොම්ගේ මුණුබුරෙකු වූ යෙහෝෂාපාට් යුදා රාජ්‍යයෙහි ධර්මිෂ්ඨව රජ කරමින්, උස් හෙල් පිටත් අමු ගස් යටත් විනාශ කරමින්, ස්වාමීන් වහන්සේගේ ව්‍යවස්ථා පොතෙන් යුදාව පුරා ඉගැන්වීමට දෙව්වරු යැව්වේය (17:1–10). යුදාහි සතුරන් ඔවුන්ට විරුද්ධව පැමිණි විට, යෙහෝෂාපාට් සහ ඔහුගේ ජනතාව නිරාහාරව යාච්ඤා කළෝය. යුද්ධය ඔවුන්ගේ නොව උන්වහන්සේගේ බව ස්වාමීන් වහන්සේ ඔවුන්ට කී සේක. ඔවුන්ගේ පහර දෙන්නන් ඔවුන් අතරම යුද්ධ කොට එකිනෙකා විනාශ කළහ (20:1–30).

2. අමතර කියවීම්: 1 රාජාවලිය 11:26–40; 2 රාජාවලිය 17:20–23.

3. යොමු කිරීමේ ක්‍රියාකාරීත්වය ඔබ භාවිතා කරනවා නම්, කෑලි වලට ඉරීමට හැකි පරණ රෙදි කෑල්ලක් හෝ රෙදි කෑල්ලක හැඩයට කපන ලද විශාල කඩදාසි කෑල්ලක් ලබා ගන්න.

**යෝජිත පාඩම වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.**

පාඩම පටන් ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) ඔබට භාවිතා කිරීමට වුවමනා වෙනවා ඇත.

පරණ රෙදි කෑල්ලක හෝ රෙදි කෑල්ලක හැඩයට කපන ලද කඩදාසි කෑල්ලක් ගෙන කෑලි 12 කට ඉරන්න. සාලමොන්ගේ ජීවිතයේ අවසානයේදී, සාලමොන්ගේ කාලයේ බදු සහ කුලීකරුවන් මත කළමනාකරුවන් දොළොස්දෙනාගෙන් එක්කෙනෙකු වන යොරොබොම්, ඉශ්‍රායෙල් ජාතීන් බොහෝ දෙනෙකු ලබා ගන්නා බවට, අනාගතවක්තෘ අහියා අනාවැකි පළකළ බව පහදා දෙන්න. මෙය පෙන්වා දීම පිණිස, අහියා තමා ඇඳගෙන සිටිය අලුත් සළුව අල්ලා කෑලි දොළොසකට ඉරා, යෙරොබොම්ට කෑලි 10 දුන්නේය. (1 රාජාවලිය 11:29–32; පාද සටහන් 32, අ පරණ ගිවිසුමේ ග්‍රීක පරිවර්තනයේ සෙප්ටුවජින්ට් අනුව, ගෝත්‍ර එකක් නොව දෙකක් දාවිත්ගෙන් පැවත එන්නන්ගේ රාජ්‍ය පාලනයට ඉතිරි කළ බව පහදා දෙන්න).

ගැලවුම්කරුවාණන් මෙසේ ඉගැන්වූ සේක එනම්, "තමාටම විරුද්ධව භේදවුණා වූ හැම රාජ්‍යයම පාළු වන්නේය" (මතෙව් 12:25). සාලමොන්ගේ මරණයෙන් පසු ඉශ්‍රායෙල් රාජ්‍යයට මෙය සිදුවූ බව පහදා දෙන්න. බෙදන ලද ඉශ්‍රායෙල් රාජ්‍යයෙහි දුෂ්ඨ හා ධර්මිෂ්ඨ නායකයන්ගේ බලපෑම ගැන මෙම පාඩමෙන් කියැවේ.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා සහ අදාල කරගැනීම.**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට දිනපතා ජීවිතයට ඒවා අදාල වන අන්දම ගැන සාකච්ඡා කරන්න. ආත්මික ප්‍රතිපත්ති වලට සම්බන්ද අත්දැකීම් බෙදා ගැනීමට පංති සාමාජිකයින් දිරිගන්වන්න.

**1. ඉශ්‍රායෙල් රාජධානිය බෙදන ලදී. මක්නිසාද පළමුවෙන්ම රොහොබොම්ගේ දැඩි නායකත්වය නිසාය.**

1 රාජාවලිය 12:1–20 උගන්වා සාකච්ඡා කරන්න.

පහත සඳහන් ප්‍රකාශ රටහුණු ලෑල්ලේ ලිවීමට ඔබට වුවමනා වෙනවා ඇත.

*යහපත් නායකයා:*
1. *සේවය දෙයි.*

- සාලමොන් මැරුණට පසු, ඔහුගේ පුත් රෙහොබොම් ඉශ්‍රාලේ රජ බවට පත්වෙයි. පියාගේ පාලන ක්‍රම රෙහොබොම් ලවා කරවීමට, ඉශ්‍රායෙල් වරුන්ට උවමනා වූ වෙනස්කම් මොනවාද? (1 රාජාවලිය 12:3–4 බලන්න.) සාර්ථකව පාලනය කිරීම පිණිස වැඩිහිටි මිනිසුන් රෙහොබොම්ට දුන් උපදෙස් මොනවාද? (1 රාජාවලිය 12:6–7; 2 ලේකම් 10:7 බලන්න.) අපට සේවය කරන යහපත් නායකයෙකුගෙන් වඩා ශුභවාදී බලපෑමක් අපට ලැබෙන්නේ කුමක් නිසාද? නිවසේදී, සභාවේදී, පාසැලේදී සහ වැඩකරන ස්ථානයේදී, මෙම උපදෙස් අදාල කරගැනීමට අපට හැකිවන්නේ කෙසේද? (ඩී සහ සී 121:41–46 බලන්න.) දෙමව්පියන් හෝ වෙනත් නායකයින් මෙම උපදේශය සාර්ථකව අදාල කර ගැනීමෙන් ඔබ දුටු නිදර්ශන සමහරක් මොනවාද?
- වැඩිමහල් මිනිසුන්ගේ අදහස් ප්‍රතික්ෂේප කළාට පසු, ඔහු තරුණ කාලයේ දැනහැඳින සිටි තරුණ මිනිසුන් වෙතට රෙහොබොම් හැරුනේය. ඔවුන්ගේ අවවාද මොනවාද? (1 රාජාවලිය 12:8–11 බලන්න.) ඔහුගේ අවවාද අනුගමණය කළ රෙහොබොම්ගේ තීරණයේ ප්‍රතිඵල මොනවාද? 1 රාජාවලිය 12:12–17 බලන්න. "ඉශ්‍රායෙල්වරු ඔවුන්ගේ කූඩාරම් වලට පිටත්ව ගියෝය" යන වාක්‍ය කණ්ඩය යොමුවන්නේ රෙහොබොම්ගේ රාජධානිය වෙතින් වෙන්වී ගියගෝත්‍ර දශයටය.) වැඩිමහලු මිනිසුන්ගේ උපදෙස් රෙහොබොම් අනුගමණය කළා නම් එහි ප්‍රතිඵල වෙනස්වන්නට තිබුනේ කෙසේද? (1 රාජාවලිය 12:7 බලන්න.)
- බදු සහ කුලීකරුවන් මත සිටි සාලමොන්ගේ කළමනාකරුවන් 12 දෙනාගෙන් එක්කෙනෙකි යෙරොබොම්. සාලමොන්ගේ පාලනයේ අවසාන කාලයේදී, ඉශ්‍රායෙල් ගෝත්‍ර බොහෝමයක් මත යෙරොබොම් රජ වන බව අනාගතවක්තෘ අහීයා අනාවැකි පළකළේය. (1රාජාවලිය 11:29–31; ක්‍රියාකාරීත්වයට යොමුකිරීම බලන්න). .අනාවැකිය සම්පූර්ණ වූයේ කෙසේද? (1 රාජාවලිය 12:20 බලන්න; 20වී අධෝලිපියන් ඇතුලත්ය. යුදා සහ බෙන්ජමින් ගෝත්‍ර රෙහොබොම් සමග, දකුණ රාජධානිය නොහොත් යුදා රාජධානියෙහි නැවතුනේය. අනිත් ගෝත්‍ර දශය යෙරොබොම් අනුගමණය කරමින් උතුරු රාජ්‍යයෙහි හෝ ඉශ්‍රායෙල් රාජ්‍යයෙහි නැවතුනේය.)

**2. යෙරොබොම් සහ රෙහොබොම් ඔවුන්ගේ රාජධානි දේවරූප වන්දනා වෙතට මග පෙන්වූහ.**

1 රාජාවලිය 12:25–33; 13:33–34; 14:14–16, 21–24 උගන්වා සාකච්ඡා කරන්න.

හුණුලෑල්ලේ ඔබ ලියන ලද ප්‍රකාශ වලට එකතු කිරීම ඔබට උවමනා වෙනවා ඇත.

*යහපත් නායකයා.:*
*සේවය දෙයි,*
2. *විශ්වාස කරමින් ස්වාමින් වහන්සේට කීකරු වෙයි.*

- යෙරොබොම් ස්වාමින් වහන්සේගේ මාර්ගයෙහි ගමන් කරනවා නම් ඔහුට "ස්ථිර ගෘහයක්" (ආරක්ෂිත රාජධානියක්) දෙන බවට අනාගතවක්තෘ අහීයා මගින් ස්වාමින් වහන්සේ ඔහුට

පොරොන්දු වූ සේක. (1රාජාවලිය 11:38). යෙරොබොම් එම ආශිර්වාදය අහිමි කර ගත්තේ කෙසේද? (1රාජාවලිය 12:25-33 බලන්න.) යෙරොබොම් රන් වස්සන්ද උස් තැන්ද සාදා බොරු පූජකවරුන් පත් කළේ කුමක් නිසාද? (1රාජාවලිය 12:26–33; 13:33–34 බලන්න.)

- ඔහුගේ ජනතාව නමස්කාර කිරීමට යේරුසලමට ගියහොත්, ඔවුන් රෙහොබොම් වෙතට ආපසු යතැයි ඔහු බිය වූ බව පහදා දෙන්න. ඔහුගේ ජනතාව පාලනය කරමින්, පක්ෂපාතව තබා ගැනීමේ උත්සාහයක් වශයෙන්, රන් වස්සන් සාදා බෙතෙල් සහ දාන් යන උතුරු රාජධානියේ නගර දෙකක තබා, නමස්කාර කිරීම පිණිස ජනතාවට එම නගර දෙකට යෑමට ආරාධනා කළේය. එසේ කිරීමෙන් පැරදීමේ බිය නිසා ස්වාමින් වහන්සේගේ පොරොන්දුව කෙරෙහි ඔහුගේ විශ්වාසය ප්‍රතික්ෂේප කළේය. ඥානවන්ත නායකයා ස්වාමින් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන අතර, පෞද්ගලික විනිශ්චයේ බිය මත පහත් තීරණ නොගන්නා බව පහදා දෙන්න.

- ඔහුගේ පුත්‍රයා අසනීප වූ විට, යොරොබොම් අනාගතවක්තෘ අහීයාගේ පිහිට සෙව්වේය. යෙරොබොම්ගේ ගෘහය(පවුල) සහ රාජධානිය ගැන අහීයාගේ අනාවැකිය කුමක්ද? (1 රාජාවලිය 14:14–16 බලන්න. 2 රාජාවලිය 17:20–23 මෙම අනාවැකිය සම්පූර්ණ වේ.)

- යෙරොබොම් මෙන්ම රෙහොබොම්ද, ජනතාව දේවරූප වන්දනාවට මගපෙන්වමින් දෙවියන් වහන්සේට අකීකරු වූයේය (1 රාජාවලිය 14:21–24). මෙම රජවරු දෙදෙනාගේ දුෂ්ඨ නායකත්වය නිසා දිගුකාලීන ප්‍රතිඵල ඇති විය. රාජධානි දෙකම විසිරී යෑම හෝ අවුරුදු ගණනාවකට පසු (ඉශ්‍රායෙල්වරුන් අෂූර්වරුන් මගින්ද, යුදාවරුන් බැබිලෝනිවරු මගින්ද) වහල්භාවයට රැගෙන ගියෝය. මක් නිසාද ඔවුන්ගේ දුෂ්ඨ සම්ප්‍රදාය පවත්වාගෙන යෑම නිසාය. බොහෝ ජනතාවක් කෙරෙහි එක් දුෂ්ඨ නායකයෙකුට මෙවැනි ගැඹුරු ප්‍රතිඵලයක් ඇති කිරීමට හැකිවන්නේ කෙසේද?

  ඉශ්‍රායෙල් හා යුදාහි ජනතාවගේ දුෂ්ඨ නායකයින් කළ දේවල් අප අනුගමනය කිරීම අවශ්‍ය නොවන බව පහදා දීමට ඔබට උවමනා වෙනවා ඇත. දෙවියන් වහන්සේ අපට තෝරාගැනීමේ නිදහස දී තිබේ. එම බලය භාවිතා කරමින්, නායකයින් දුෂ්ඨ දේ තෝරාගත්තත්, අපට යහපත තෝරාගත හැකිය (හීලමන් 14:30–31).

3. **යෙහෝෂපාට් ස්වාමීන් වහන්සේ සහ උන් වහන්සේගේ අනාගතවක්තෘවරුන්ව අනුගමණය කිරීමට යුදා රාජ්‍යයට මග පෙන්වයි.**

2 ලේකම් 17:1–10; 20:1–30 උගන්වා සාකච්ඡා කරන්න.

රටහුණු ලෑල්ලේ ලැයිස්තුවට නැවතත් එකතු කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

*යහපත් නායකයා.*

1. *සේවය දෙයි.*
2. *විශ්වාස කරමින් ස්වාමින් වහන්සේට කීකරු වෙයි.*
3. *දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල තිබේ.*
4. *ශුද්ධ ලියවිලි වලින් උගන්වයි.*
5. *අනාගතවක්තෘවරුන්ව අනුගමණය කරයි.*

- රෙහොබොම්ගෙන් පරම්පරා තුනකට පසු, ඔහුගේ දෙමුණුපුරෙක් වන යෙහෝෂපාට් යුදා රාජ්‍යයෙහි රජකම් කළේය. යෙහෝෂපාට් ඔහුගේ පුදගලික ධර්මිෂ්ඨකම විදහා දැක්වූයේ කෙසේද? (2 ලේකම් 17:3–4, 6 බලන්න.) අපගේ පුද්ගලික නමස්කාරය, අන්‍යයන්ට මගපෙන්වීමේ හැකියාවට බලපාන්නේ කෙසේද?

- "යුදාහි උස් තැන්ද අෂේරා කණුද" යෙහෝෂපාට් පහකළේය. (2 ලේකම් 17:6). ජනතාව කුමක් ඉගෙන ගත්තේද කියා ඔබ සිතන්නෙහිද? (2 ලේකම් 20:12–13, "මුළු යුදාහි ඔවුන්ගේ කුඩා අයද, ඔවුන්ගේ භාර්යාවන්ද ඔවුන්ගේ දරුවන්ද ස්වාමින් වහන්සේ ඉදිරියෙහි සිටගත්" බව සිහි තබාගන්න. වඩාත් භක්තියෙන් දෙවියන් වහන්සේට නමස්කාර කිරීම පිණිස අපගේ නිවෙස වලින් සහ අපගේ පුද්ගලික ජීවිත වලින් අප කුමක් ඉවත් කළ යුතුද?

- "ස්වාමින් වහන්සේගේ ව්‍යවස්ථා පොතෙන්" මුළු රාජධානියටම ඉගැන්වීම පිණිස යෙහෝෂාපාට් ලෙවිවරුන් යැව්වේය (2 ලේකම් 17:19). ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වූ දේවල් යුදා ජනතාවට කෙසේ බලපෑවාද කියා ඔබ සිතන්නෙහිද? පුද්ගලිකව සහ පවුලක් වශයෙන් ශුද්ධ ලියවිලි අධ්‍යනය කිරීම ඔබට උපකාර වූයේ කෙසේද? නිවසේදී ශුද්ධ ලියවිලි අධ්‍යනය කිරීමෙන් අපගේ පවුල් වලට සහ සමස්ථයක් වශයෙන් සභාවටද බලපාන්නේ කෙසේද?

  සභාපති එස්රා ටැෆ් බෙන්සන් මෙසේ ඉගැන්වූවේය; "අපගේ ස්ටේකවල ක්‍රියාකාරීත්ව මට්ටම වැඩි කිරීමට බොහෝ විට අපි විශාල උත්සාහයක් දරනවා. සක්‍රමේන්තු රැස්වීම් වලට පැමිණෙන අයගේ ප්‍රතිශතය වැඩි කිරීමට අපි උනන්දුවෙන් වැඩ කරනවා. ධර්මදූත සේවයට අපගේ තරුණ මිනිසුන්ගේ ප්‍රතිශතය ඉහල නැංවීමට මහන්සි ගන්නවා. දේවමාළිගාවේ විවාහ වන අයගේ සංඛ්‍යාව වැඩිකිරීමට අපි උත්සාහ කරනවා. මෙම සියලු උත්සාහයන් ප්‍රශංසා ලැබිය යුතු අතර රාජ්‍යයේ වැඩීමට වැදගත්ය. නමුත් පුද්ගලික සාමාජිකයින් සහ පවුල් නිරන්තරයෙන්ම ස්ථිර වශයෙන් ශුද්ධ වූ ලියවිලි කියන විට, මෙම අනෙකුත් ක්‍රියාකාරකම් ඉබේටම සිදුවෙයි. සාක්ෂිය වර්ධනයවෙයි. කැපවීම ශක්තිමත් වෙයි. පවුල් ආරක්ෂා වෙයි. පුද්ගලික එළිදරව් ගලා එයි." (*The Teachings of Ezra Taft Benson* [1988], 44).

- 2 ලේකම් 20 කියන අන්දමට යුදා ජනතාවට අවුල් සහිත භයානක කාලයක් ඇතිවන්නේය, මක්නිසාද ජාතීන් තුනක් ඔවුන් මත යුද්ධය ප්‍රකාශ කළ බැවින්ය. සංඛ්‍යා වෙන් බොහෝ අඩු වූ යොහෝෂපාට් රජුට සහ ඔහුගේ ජනතාවට ප්‍රතිඵල බලාපොරොත්තු රහිත විය. පිහිට ලබාගැනීමට යෝහෝෂපාට් කුමක් කළේද? (2 ලේකම් 20:3–13 බලන්න.) ඔහුගේ මෙම ඉල්ලීමට ස්වාමින් වහන්සේගේ පිළිතුර වූයේ කුමක්ද? (2 ලේකම් 20:14–17 බලන්න. මෙම පිළිතුර පැමිණියේ අනාගතවක්තෘ යහසීයෙල් මගින් බව සටහන්කර ගන්න). ඔහුගේ ජනතාවට යෙහෝෂපාට් දුන් උපදේශය කුමක්ද? (2 ලේකම් 20:20 බලන්න.) යුදාවේ පැරණි ජනතාව මෙන් පසු දවස්වල ශුද්ධවන්තයින් වන අප, සංඛ්‍යාවෙන් අද අඩුවන්නේ කෙසේද? යෙහෝෂපාට්ගේ උපදේශය අපට අදාලවන්නේ කෙසේද?

- යුද්ධය දෙවියන් වහන්සේගේ බව අනාගතවක්තෘ යහසීයෙල්ගේ ස්ථිර කිරීම සිහිපත් කරමින් යුද්ධ කිරීමට වඩා දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම පිණිස යෙහෝෂපාට් ගායකයින් පත්කළේය. ඔවුන් ගායනා කිරීමට පටන්ගත් කල, ඔවුන්ගේ ප්‍රහාරකයින් ඔවුන් අතරම යුද්ධ කරමින් එකිනෙකා විනාශ කිරීමට සැලැස්වීමෙන් ස්වාමින් වහන්සේ ඔවුන්ව ආරක්ෂා කරගත් සේක (2 ලේකම් 20:21-24). ජීවමාන අනාගතවක්තෘවරුන්ගේ වචන අප සිහිපත් කරමින් කීකරුවන විට අපව ආරක්ෂා කර ගන්නේ කෙසේද?

- යෙරොබොම් සහ රෙහොබොම් ඔවුන්ගේ ජනතාව දේවරූප වන්දනා කිරීමට මග පෙන්වන අතර එයට විරුද්ධ වන ආකාරයෙන් යුදාජනතාවට ඔවුන්ම ස්වාමින් වහන්සේ ඉදිරියේ යටහත් වීමට යෙහෝෂපාට් ඔවුන්ට අනුබල දුන්නේය.(2 ලේකම් 20:3-4). ධර්මිෂ්ඨ නායකයින්ගේ බලපෑමෙන් ඔබට පෙනෙන නිදර්ශන මොනවාද? අප සේවය කරන අයට ධර්මිෂ්ඨව ජීවත් වීමට උපකාර කිරීමට හැකිවන්නේ කෙසේද?

---

**අවසානය.**

ජනතාව දුෂ්ඨකමට හෝ ධර්මිෂ්ඨකමට මගපෙන්වීමට නායකයින්ට ඇති බලය ගැන සාක්ෂිදරන්න. අපගේ සභාවේ කැඳවීම් වලදී, අපගේ සමාජයේදී, වැඩකරන ස්ථානයේදී හා නිවසේදීද මගපෙන්වීමේදී අපගේ වගකීම ගැන පංති සාමාජිකයින්ට මතක්කරන්න. සේවය දීමෙන්, ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් හා කීකරුකමින්ද, උන්වහන්සේ තුල ඇදහීමෙන්ද, ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීමෙන්, හා අනාගතවක්තෘවරුන්ව අනුගමණය කිරීමෙන් යහපත් නායකයින් වීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතාකිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

1. **අශුභවාදී ලෞකික පීඩනය පරාජය කිරීම.**

- අශුභවාදී ලෞකික මිතුරන්ගේ අඥාන උපදෙස් රෙහොබොම් අනුගමණය කළ නිසා ඉශ්‍රායෙල් රාජධානිය බෙදුනේය (1 රාජාවලිය 12:9–16). අපගේ මිතුරන්ගේ අඥාන අවවාද අනුගමණය කිරීමේ පරීක්ෂා විරුද්ධ වීමට අපට හැකිවන්නේ කෙසේද?

වැඩිහිටි මැල්කම් එස්. ජෙප්සන් මෙසේ කීවේය:

"යම් වේලාවක.... ඔබලා බොහෝ දෙනෙකුට නුඹලාගේ 'මිතුරන්' එක්කෙනෙකු හෝ වැඩිදෙනෙකු ඔබ වෙතට පැමිණ ඔබ නොකල යුතු යැයි ඔබ දන්නා දෙයක් කිරීමට ඔබව පොළඹවයි....

"මිතුරන් යයි කියන ඔවුන් ඔබට කියන දෙය, කිසිදිනක කිසිවෙකු දැන නොගන්නේය. 'ඒ ඇරත්, එය කිරීමෙන් කුමන වෙනසක් ඇතිවෙයිද?'

"....වැරදි මාර්ගයෙහි යන ඔබගේ මිතුරන්ට විරුද්ධවීම ඔබ කළ යුතු නොවේ. ඇත්ත වශයෙන්ම ඔවුන්ව ඔබ අත්හරින්නටත් උවමනා නැත. උපකාර ලැබීමට ඔවුන් සූදානම් වූ විට, ඔවුන්ට උපකාර කරමින් ඔවුන් ගැන සැලකිලිමත් වන කල්‍යාන මිත්‍රයෙකු වීමට ඔබට හැකි වේ. ඔවුන්ට කථාකරමින්, ඔවුන්ව ඔසවා තබමින්, ඔවුන්ට ඔබගේ සාක්ෂිය දැරීමෙන්, ආදර්ශය මගින් ඔවුන්ට මග පෙන්වන්න.

ස්වාමීන් වන න්සේගේ මාර්ගයත් අතර තෝරා ගැනීමට සලස්වා ඔබගේ ස්වර්ගික පියාණන්වහන්සේව කිසිදා අප්‍රසන්නතාවයට පත් නොකරන්න.

"එය එසේ වුවහොත් ස්වාමීන් වහන්සේගේ මාර්ගය තෝරාගෙන, අලුත් මිතුරන් කෙරෙහි යොමුවන්න." (in Conference Report, අප්‍රේ.1990,59; හෝ *Ensign,* මැයි 1990,45).

2. **උස් හෙල් පිටත් සියලු අමු ගස් යටත් හි අර්ථය**

යෙරොබොම් සහ රෙහොබොම් විසින් පොළඹවන ලද බොරු නමස්කාරය, පහත සඳහන් විස්තරය එය පහදා දීමට උපකාර වන්නේය.

උස් හෙල්(1 රාජාවලිය 12:31): කඳු මුදුනේ ගොඩනැගූ අල්තාර ජනතාව දේවරූප වන්දනා කිරීමට පටන්ගත් විට, මෙම අල්තාර අපවිත්‍ර කොට ඒවා දේවරූප වන්දනා කිරීමට ඔවුහු භාවිතා කළෝය.

අෂේරා කණු (1 රාජාවලිය 14:15): මිත්‍යාදෘෂ්ටි දේවතාවන් අදහන සමහර විට ජනතාව දුරාචාරයේ හැසිරෙන ස්ථානද වෙයි.

3. **"තවද…මනුෂ්‍යයන්ගේ අතින් සෑදුවා වූ, දෙවිවරුන්ට සේවය කරනවා ඇත. (ද්විතිය කථාව 4:28)**

- යෙරොබොම් රන් වස්සන් උස් හෙල් පිටත්, සියලු අමු ගස් යටත් තබා, මිනිසුන් නමස්කාර කරන විට අවුරුදු 500ට කලින් මෝසෙස් දුන් අනතුරු ඇඟවීම ඔහු සහ ඔහුගේ ජනතාව නොසලකා හැරියෝය (විතිය කථාව 4:25–28). මොනතරම් විනාශයකට ඔවුන්ව මගපාදන්නේද? බොරු දේවරූප වෙනුවට ස්වාමීන්වහන්සේ වෙතට ඔවුන් හැරෙන්නේ නම් දී තිබෙන පොරොන්දු මොනවාද? (ද්විතිය කථාව 4;29–31 බලන්න.)

4. **නායකත්වය පිළිබඳ ද්‍රව්‍ය පාඩම.**

එක හා සමාන ලී කොට හෝ වෙනත් සමූහ දෙකක් පංතියට රැගෙන එන්න. පහත සඳහන් පැහැදිලි කිරීමට සහභාගීවීම සඳහා පංති සාමාජිකයන් දෙදෙනෙකුට ආරාධනා කරන්න. සහභාගිවූ එක් එක් අයට ලී කොට සමූහය බැගින් දෙන්න. එක් පංති සාමාජිකයෙක් නායකයා වශයෙන්ද, අනිත් පංති සාමාජිලයා අනුගාමිකයා වශයෙන්ද, පත්කරන්න. පංති සාමාජිකයන් දෙදෙනා එක් එක්කෙනාගේ ලී සමූහය නොපෙනෙන පරිදි එකිනෙකාට පිටුපස හරවා සිටීමට සලස්වන්න. ලී කොට සමූහයෙන් නායකයාට ඉක්මනට යමක් සෑදීමට සලස්වා, තනාගත් ඒ දෙයට සමාන එකක් ගොඩනැගීමට අනුගාමිකයාට මගපෙන්වීම් ලබා දෙන්න. අනුගාමිකයා මගපෙන්වීම් අනුගමණය

කරන විට ප්‍රශ්න නොඇසිය යුතුය. ව්‍යාපෘතිය සම්පූර්ණ වන තෙක් සහභාගීවන අය අනිත් අයගේ ලීකොට දෙස බැලිය යුතු නොවේ.

අනුගාමිකයා එය සාදා අවසන්වූවාට පසු, නායකයන් පැහැදිලි මගපෙන්වීම් දීමත්, අනුගාමිකයා සැලකිලිමත්ව ඒවට සවන්දීමේ ඇති වැදගත්කම ගැන සාකච්ඡා කරන්න. නායකයා සෑදූ එකට සමානව අනුගාමිකයා තැනුවා නම්, සහභාගී වූ දදෙනාටම ප්‍රශංසාකර, ඔවුන් සාර්ථක වූයේ කුමක් හෙයින්ද කියා අනිත් පංති සාමාජිකයින්ට විස්තර කිරීමට කියන්න. පැහැදිලි කිරීම වෙනස්වූ දේවල් තැනුවා නම්, පහත සඳහන් ප්‍රශ්න අසන්න.

- නායකයාගේ වගකීම් වඩාත් පැහැදලිව ප්‍රකාශකිරීමට තිබුනාද? අනුගාමිකයා වඩා සැලකිලිමත්ව සවන්දීමට තිබුනාද? නායකයා එය තනන විට අනුගාමිකයාට බලාසිටීමට ඉඩදුන්නා නම්, එය කෙසේ උපකාර වන්නට තිබුනාද?
- මෙම පැහැදිලි කිරීමෙන් ඉගෙන ගත් දෙය, අපගේ සභාවේ කැඳවීම්වලදී සහ අපගේ නිවසේදී අදාළකර ගැනීම අපට හැකිවන්නේ කෙසේද?

# 28
වෙනි පාඩම.

# "ගින්නෙන් පසු සියුම් නිශ්චලතාවේ හඬක් විය."

*1 රාජාවලිය 17–19.*

---

**අරමුණ**

ඔවුන්ගේ ජීවිතයේ ප්‍රමුඛ ස්ථානයේ දෙවියන්වහන්සේව තබමින්,ජීවමාන අනාගතවක්තෘන්ගේ වචන කෙරෙහිද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ හීන් හඬ කෙරෙන් මගපෙන්වීම් ලබාගැනීම පිණිස පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය.

---

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.

   අ. 1 රාජාවලිය 17. වැසිනොලැබීමට එලියා ස්වර්ගයෙහි මුද්‍රාතබා, අහබ් සහ යෙසෙබෙල් වෙතින් පළා ගොස් වනාන්තරයේදී මහා හාස්කමින් පෝෂණය විය (17:1-6) .ස්වාමින්වහන්සේ එලියාව වැන්දඹුවක් වෙතට යවන සේක. ඇය ඔහුට කෑම සහ වතුර දෙන්නේය (17:7–16). එලියා වැනදඹුවගේ පුත්‍රයා මරණයෙන් ඔසවයි (17:17–24).

   ආ. 1 රාජාවලිය 18. අවුරුදු දෙකකටත් වඩා වූ සාගතයෙන් පසු, එලියාට අහබ්ව මුණගැසී, ඔවුන්ගේ දවන පූජා දැවීමට ස්වර්ගයෙන් ගිනි එවීමට බාල්ගේ පූජකවරුන්ට අභියෝග කළේය (18:1–2, 17–24) .බාල්ගේ පූජකයන්ගේ උත්සාහයන් නිෂ්පල විය. නමුත් ඔහු සූදානම් කළ පූජාව දැවීමට එලියා ස්වාමින් වහන්සේට යාච්ඤාකළ විට උන්වහන්සේ ගිනි එවූසේක (18:25-40). සාගතය අවසාන කිරීමට එලියා යාච්ඤා කළේය, ස්වාමින්වහන්සේ වැස්ස එවූසේක.

   ඇ. 1 රාජාවලිය 19. එලියා මැරීමට යෙසෙබෙල් උත්සාහදරයි (19:1–2). එලියා වනාන්තරයට පළා ගිය අතර දේවදූතයෙකු එලියාට කන්ට දුන්නේය. (19:3–8). එලියා හොරෙබ් වෙතට යයි, එහිදී ශුද්ධාත්මයාණන් විසින් ඔහු සනසවා, දෙවියන්වහන්සේගේ කටයුතු වල පැවතීමට උපදෙස් දුන්නේය. (19:9–19).

2. බාල්ගේ පූජකවරුන් සමග එලියාගේ මුණගැසීම ගැන කෙටි වාර්ථාවක් දීමට පංති සාමාජිකයෙකුට සූදානම් වීමට කියන්න. 1 රාජාවලිය 18:17–40).

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.**

පාඩම පටන්ගන්නා විට පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

වැඩිහිටි තෝමස්. එස්. මෝසන් විසින් කියන ලද පහත සඳහන් කථාන්තරය බෙදාගන්නඃ

"දිළිඳුකමින් උපත ලබා ඇදහීමෙන් පෝෂණය වූ, ෆජොසේ ගාෂියාෘ ධර්මදූත කැඳවීමකට සූදානම් වූයේය. ඔහුගේ පැවරීම ලැබුණු දිනයේද මා එහි සිටියා, මෙවැනි ප්‍රකාශයක් දකින්ට තිබුනිඃ 'පවුල පෝෂණය කිරීමේදී වැඩි බරක් උසුලන ඔහු, ඔහුගේ පවුල වෙනුවෙන් මහත් පරිත්‍යාගයකින් යුතුව ඔහු සේවය කරනවා ඇත. ඔහුට එක් දෙයක් සතුය....වටිනා මුද්දර එකතු කිරීමකි—ඔහුගේ ධර්මදූත සේවයට මුදල් අවශ්‍ය වුවහොත්, එය විකිණීමට ඔහු කැමතිය.'

"සභාපති ෆස්පෙන්සර් ඩබ්ලුව්‍ය කිම්බල් එම ප්‍රකාශය කියවන විට උනන්දුවෙන් සවන්දී, අනතුරුව මෙසේ පිළිතුරු දුන්නේයඃ 'ඔහුගේ මුද්දර එකතුව විකුණන්න සලස්වන්න. එම පරිත්‍යාගය ඔහුට ආශිර්වාදයක් වෙනවා ඇත.'"

ස්වාමින්වහන්සේට සේවය කිරීම පිණිස ඔවුන් සතු සියල්ලම බාරදීමට ඔවුන්ට සිදු වුවහොත් ඔවුන් ප්‍රතික්‍රියාකරන අන්දම ගැන සිතීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න. ඉන් අනතුරුව කථාව කියාගෙන යන්නඃ

"ඇසක් ගසා, සිනාසෙමින්, මෙම ආදර අනාගතවක්තෘවරයා මෙහෙම කීවා, 'හැම මාසයකම සභාවේ මූලස්ථානයට, ලෝකයේ හැම තැනකින්ම ලියුම් දහස් ගණනක් අපට ලැබෙනවා. මෙම සියලුම මුද්දර එකතුකරලා ජෝසෙගේ දූතමෙහෙයේ අවසානයේදී අපි ඒවා එයාට දෙන්න වගබලාගන්නවා. මැන්සිකෝවේ ඕනෑම තරුණ මිනිසෙකුට මෙන්, වියදමක් නැතිව ඉතාම හොඳ මුද්දර එකතුවක් ඔහුට ලැබෙනවා.'" (in Conference Report, ඔක්, 1978, 83; හෝ *Ensign,* නොවැ. 1978, 56.)

අපගේ ජීවිත වලදී දෙවියන් වහන්සේගේ දේවල් වලට ප්‍රමුඛ ස්ථානය දෙන විට, අප පරිත්‍යාග කරන සියලුම දේවලට වඩා වැඩි ප්‍රතිඵල අපට ලැබෙන බව පහදාදෙන්න. මෙම පාඩම පුද්ගලයන් දෙදෙනෙකු ගැන කියයි—එලියා සහ වැන්දඹුවක් වූ ශාරෙපත්‍ය—ඔවුහු බොහෝ ආශිර්වාද ලැබුවෝය, මක් නිසාද එය කිරීමට බොහෝ අසීරු වුවත්, දෙවියන්වහන්සේව අනුගමණය කිරීමට ඔවුහු කැමතිවූහ.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම හා ඒවා අදාළ කරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ආත්මික ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදා ගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

යෙරොබොම් ඉශ්‍රායෙල් රාජ්‍ය රූප වන්දනාව වෙතට මග පෙන්වූ පසු, ඔහු සහ ඔහුගෙන් පැවත එන අය විනාශවන ලදී, රූප වන්දනා කළ තවත් රජවරු කිහිප දෙනෙක් ඔවුන්ව අනුගමණය කළහ. පළමුව සිටි සියලු ඉශ්‍රායෙල් රජවරුන්ට වඩා, "ඉශ්‍රායෙල්හි ස්වාමි වූ දෙවියන්වහන්සේව කෝප කරවීමට බොහෝ දේවල් කළේ අහබ් රජුය" (1 රාජාවලිය 16:33). ඔහු යෙසෙබෙල් විවාහකර ගත්තේය, ඔහු ඇය මෙන්ම බාල්ට නමස්කාර කළේය. තවද ඔහු සමග එකතු වී ඔහුගේ බොරු දෙවිවරුන්ට නමස්කාර කිරීමට ඔහුගේ ජනතාව දිරිගැන්වූයේය. අනාගතවක්තෘ එලියා අහබ් සහ ඔහුගේ රාජ්‍යයට අනතුරු ඇඟවීම් ලබා දුන්නේය.

1. **එලියා ස්වර්ගයට මුදුාකොට, හාස්කමින් පෝෂ්‍ය කරන ලදුව, වැන්දඹුවකගේ පුත්‍රයා මරණයෙන් එසෙව්වේය.**

1 රාජාවලිය 17 උගන්වා සාකච්ඡා කරන්න.

- අහබ් සහ ඔහුගේ ජනතාවගේ දුෂ්ඨකම් නිසා එලියා මෙසේ ප්‍රකාශ කළේය; *"මාගේ වචනය මෙන් මිස, මේ අවුරුදු වල පිනිවත් වැස්සවත් නොවන්නේය"* (1 රාජාවලිය 17:1; ඉතාලි අකුරු එකතුකර ඇත). එවැනි ප්‍රකාශ කිරීමට එලියාට හැකිවූයේ කෙසේද? (ඒ හා සමාන බලයක් දුන් හීලමන්ගේ පුත්‍රයාට, එලියාව සමාන කිරීමට ඔබට උවමනා වෙනවා ඇත. නිෆායිගේ වචන අනුව සියල්ල කිරීමට ඉඩදුන් ස්වාමින් වහන්සේගේ කරුණු හීලමන් පොතේ 10:4–5 සඳහන්වේ).
- රාජධානියේ වැසි නොලැබීමට එලියා ප්‍රකාශ කළාට පසු, ඉන් පළායෑමට ස්වාමින්වහන්සේ එලියාට අණ කළසේක. ස්වාමින් වහන්සේගේ අණට එලියා ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (1 රාජාවලිය 17:2–5 බලන්න.) එලියාගේ ප්‍රතිචාරයෙන් අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද?

  වැඩිහිටි ගෝර්ඩන් බී. හින්ක්ලි මෙලෙස පැවසුවේය:

  "දේශය මත නියගය සහ සාගතය පැමිණෙන බවට එලියා අහබ් රජුට අනතුරු ඇඟවීම සම්බන්දව අනාගතවක්තෘ එලියා කළ සරල ප්‍රකාශයෙන් මට ශක්තිය ලබාගත හැකිය. නමුත් අහබ් එයට සමච්චල් කළේය. කෙරිත් නම් ඔය ලඟ සැඟවීසිටීමට ස්වාමින් වහන්සේ එලියාට කීසේක. එහිදී එම ඔයෙන් වතුර බීමටද, කපුටන් විසින් ඔහුට කෑම දෙන බවද කී සේක. සරල චමත්කාර ජනක ප්‍රකාශයක් ශුද්ධ ලියවිලි වාර්ථා කරයි: 'ඔහු ගොස් ස්වාමින්වහන්සේගේ වචන පරිදි එය කළේය.'(1 රාජාවලිය 17:5.)

  "එහිදී තර්ක කිරීමක් නැත. නිදහසට කරුණු කීවේ නැත. සැක ඇතිවන ලෙස කථාකළේද නැත. එලියා ගොස් ස්වාමින් වහන්සේගේ වචන අනුව එය කළේය.'සමච්චල් කළ, තර්කකළ, ප්‍රශ්න කළ අය මත වැටුණු භයානක විපත්තියෙන් ඔහු ගැලවුනේය" (in Conference Report, ඔක්. 1971, 159; හෝ *Ensign*, දෙසැ. 1971, 123–24).

- නියඟය පටන්ගත් විට එලියා වනාන්තරයේ ජීවත්වූයේ කෙසේද? (1 රාජාවලිය 17:4, 6 බලන්න.) ශාරීරිකව හෝ ආත්මිකව, ස්වාමින්වහන්සේ ඔබව පෝෂණය කළ විට ඔබට ඇතිවූ අත්දැකීම් මොනවාද?

- වනාන්තරයෙහි ඔය සිඳුනාට පසු, එලියාට උපකාර කිරීම පිණිස, ස්වාමින්වහන්සේ සූදානම්කළේ කවරෙක්ද? (1 රාජාවලිය 17:7–13 බලන්න.) අවශ්‍යතාවයන් ඇති අයට ස්වාමින්වහන්සේ උපකාරකරන අන්දම ගැන මෙයින් අපට ඉගෙනගැනීමට හැකි කුමක්ද? (වෙනත් පුද්ගලයින්ගේ සේවය මගින් අවශ්‍යතාවයන් ඇති අයට බොහෝවිට ස්වාමින් වහන්සේ උපකාර කරන බව පහදා දෙන්න.) වෙනත් පුද්ගලයින්ගේ සේවය මගින් අවශ්‍යතාවයන් ඇති අයට ස්වාමින්වහන්සේ උපකාර කරන බව ඔබ දැක තිබෙන්නේ කෙසේද? අවශ්‍යතාවයන් ඇති අයට උපකාර කිරීමට අපට හැකිවන්නේ කෙසේද?

  වැඩිහිටි ජෙෆ්රි ආර්. හොලන්ඩ් මෙසේ කීවේයඃ "කොපමණ සුළු ක්‍රියාවක් උනත් අප එක් එක්කෙනාට යමක් කරන්ට පුලුවන් බව මම දනිමි. අවංක දසයෙන් කොටසක් අපට දෙන්ට පුලුවන. නිරාහාර පිදුම් කැමැත්තෙන්ම අපට දෙන්ට පුලුවන. උපකාර කිරීමට හැකි වෙනත් ක්‍රම ගැන අපට සෙවිල්ලෙන් ඉන්ට පුළුවන. සුදුසු දේවල් හා අවශ්‍යතාවයන් ඇති පුද්ගලයන්ට දෙන්ට මුදල් නැත්නම් අපගේ වේලාව විඩංගු කරන්න පුළුවන. අපට වේලාවක් නැත්නම්, අපගේ ආදර්ශය ඔවුන්ට දෙන්න පුළුවන. කුලාවක තෙල් ඉවර නොවී, දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබාගෙන, අපගේ කෑමවේල අපට බෙදාගන්න පුළුවන. (in Conference Report හි, අප්‍රි, 1996, 41; හෝ *Ensign*, මැයි. 1996, 31).

- එලියා බීමට වතුර ටිකක් ඉල්ලූ විට වැන්දඹුව එයට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (1 රාජාවලිය 17:10–11 බලන්න. අකමැත්තක් නොදක්වා ඇය ගියාය.) එලියා වැන්දඹුවගෙන් කෑම ඉල්ලූ විට ඇය කීවේ කුමක්ද? (1 රාජාවලිය 17:11–12 බලනන.) එලියා ඇයට පොරොන්දු වූයේ කුමක්ද? (1 රාජාවලිය 17:13–4 බලන්න). ඉන් පසු වැන්දඹුව කුමක් කළේද? (1 රාජාවලිය 17:15 බලන්න.) වැන්දඹුව ගේ ප්‍රතිචාරය තුලින් අපට කුමක් ඉගෙනගැනීමට හැකිද?

- වැන්දඹුවගෙන් එලියා කෑම ඉල්ලූවිට ඇයගේ ප්‍රතිචාරය වූයේ "ඇදහීමේ ප්‍රකාශයයි, …එම අවස්ථාවේ හැටියට ශුද්ධ වූ ලියවිලි වල මම දන්නා තරමට වෙනත් නොමැති තරම් ශ්‍රේෂ්ඨ යැයි, වැඩිහිටි හොලන්ඩ් කීවේය....සමහර විට ඇයගේ ඇදහීමේ වටිනාකම ගැන ඇය නොදැන සිටින්නට ඇත…පළමුවෙන්ම සෑදූ රොටිය ඈ එලියාට ගෙන ගියාය. ඇත්තවශයෙන්ම රොටි මදිවුවහොත් අවම වශයෙන් ඇය සහ ඇයගේ පුතා ප්‍රේමයේ පවිත්‍ර ක්‍රියාවක් නිසා මරණයට පත්වේ යැයි විශ්වාස කළාය" (Conference Report හි අප්‍රි, 39 හෝ *Ensign*, මැයි 1996, 29).

- වැන්දඹුවට ඉතා ස්වල්පයක් තිබියදීත් එලියාට කන්ට දීමට, ස්වාමින්වහන්සේ ඇයට අණ කළේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? වැන්දඹුවගේ කීකරුකමට ඇයට ලැබුනු ආශිර්වාදය කුමක්ද? (1 රාජාවලිය 17:16 බලන්න.) දෙවියන්වහන්සේ අපට කියන අසීරු දෙවල් සමහරක් මොනවාද? දෙවියන්වහන්සේව ප්‍රමුඛ ස්ථානයේ තබමින්, උන්වහන්සේ අපට කියන අසීරු දේවල් පවා අප කරනවා නම්, අපට ආශිර්වාද ලැබන්නේ කුමන මාර්ග වලින්ද?

  සභාපති එස්රා ටැෆ්. බෙන්සන් මෙලෙස ඉගැන්වූයේය.

  "අප දෙවියන්වහන්සේව ප්‍රමුඛ ස්ථානයේ තබන විට අනිකුත් සියලුම දේවල් ඒවායේ සුදුසු ස්ථානයට පැමිණේ. නැතහොත් අපගේ ජීවිත වලින් පහව යයි. අප කැමති හෝ ප්‍රේම කරන දේවල්, අප කාලය විඩංගු කරන දේවල්, අප කරන්නට තෝරා ගන්නා දේවල්, අපගේ ප්‍රමුකත්වය අනුව පාලනය වන්නේ ස්වාමින් වහන්සේට අපගේ ඇති ආදරය නිසාය.....

- "උන්වහන්සේව ප්‍රමුඛ ස්ථානයෙහි තැබීමේ ප්‍රතිපල වශයෙන්, මෙම ජීවිතයේදී හා සදාකාල ජීවිතයේදී සාමය නෙළාගැනීමෙන් මතු පැමිණෙන ජීවිතයේදී ප්‍රීතියේ සම්පූර්ණත්වය ලබා ගැනීමට දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරනු ලබත්වා" (Conference Report, හි අප්‍රි, 1988,3, 6; හෝ *Ensign*, මැයි. 1988, 4, 6).

- වැනදඹුවගේ පුතා අසනීප වී මරණයට පත්වූ විට, එලියා කුමක් කළේද? (1 රාජාවලිය 17:17–22 බලන්න.) වැන්දඹුවගේ පුතා නැවත ජීවත් කරවීමට, එලියාට හැකවූයේ කුමණ බලයකින්ද? පූජකවරයේ බලය තුලින් ඔබගේ ජීවිතයට ආශිර්වාද ලැබුනේ කෙසේද?

**2. බාල්ගේ පූජකවරුන්ට එලියා අභියෝග කරමින් වැස්ස ලබා ගැනීමට ස්වර්ගය විවෘත කළේය.**

1 රාජාවලිය 18 උගන්වා සාකච්ඡා කරන්න.

- සාගතයේ තුන්වැනි අවුරුද්දේ, ස්වාමින්වහන්සේ එලියාට මෙසේ අණකළ සේක, "නුඹ ගොස් අහබ්ට [පෙනීයන්න], මම භූමිය පිටට වැස්ස එවන්නෙමි (1 රාජාවලිය 18:1). අහබ් එලියාව දුටු විට ප්‍රතික්‍රියා කළේ කෙසේද? (1 රාජාවලිය 18:17 බලන්න. සාගතය ගැන අහබ් එලියාට දොස් පැවරූ බව පෙන්වා දෙන්න.) සාගතයේ සත්‍ය කරුණ කුමක්ද? (1 රාජාවලිය 18:18 බලන්න.)
- එලියාගේ ඉල්ලම පරිදි, ඉශ්‍රායෙල්වරු සියලුම දෙනාද, බොරු පූජකවරු 850 ද කමේල් කන්දට අහබ් රැස්කෙරෙව්වේය. (1 රාජාවලිය 18:19–20). එලියා කථාකරනවා ඇසීමට ජනතාව රැස්වූ විට, ඔහු ඔවුන්ගෙන් මෙසේ ඇසුවේය, "නුඹලා කොපමණ කල් කල්පනා දෙකක් අතරේ හිරවී සිටිනවාද?" (1 රාජාවලිය 18:21). කල්පනා දෙකක් අතරේ හිරවී සිටිනවා යන්නෙහි අදහස ඔබ සිතන අන්දමට කුමක්ද? සමහර විට කල්පනා දෙකක් අතර අප හිරවී සිටින්නේ කෙසේද? (මතෙව් 6:24 බලන්න. ධන කුවේරයා යනු ලෞකික දේවල් බව පහදා දෙන්න.)

  වැඩිහිටි නීල්. ඒ. මැකස්වල් මෙසේ කීවේයඃ "නොයෙක් අනාගතවක්තෘවරුන්ගේ පොළඹවන වචන නම්...... තෝරා ගැනීමට අපට බල කිරීම, තීරණ ගැනීමට සහ හිර නොවී සිටීමටය…එලියාගේ පණිවුඩයේ විශාල සම්බන්දතාවයක් දැන් අපට තිබෙනවා, මක් නිසාද අන්තිමට සියලු දෙනාම ලෞකික දෙවිවරුන් හෝ සදාකාලික දෙවියන්වහන්සේ යන දෙදෙනා අතරින් තෝරාගතයුතුවේ." (*That My Family Should Partake* [1974], 22).

බාල්ගේ පූජකවරුන් සමග එලියාගේ මුණගැසීම ගැන කෙටි වාර්ථාවක් දීමට පැවරුම් කරන ලද පංති සාමාජිකයාට සලස්වන්න (1 රාජාවලිය 18:17–40).

- බාල්ගේ පූජකවරුන්ට අභියෝගකිරීමේ එලියාගේ අරමුණ කුමක්ද? (1 රාජාවලිය 18:36–37 බලන්න.) දෙවියන්වහන්සේගේ බලය පෙන්වීම කෙරෙහි ජනතාව ප්‍රතික්‍රියා කළේ කෙසේද? (1 රාජාවලිය 18:38–39 බලන්න.) ස්වාමින්වහන්සේ සහ උන්වහන්සේගේ බලය පිළිගැනීම නිසා ඔවුන් ආශිර්වාද ලැබුවේ කෙසේද? (1 රාජාවලිය 18:45 බලන්න.) ස්වාමින් වහන්සේ සහ උන්වහන්සේගේ බලය වඩාත් සම්පූර්ණයෙන් පිළිගැනීමට අපට හැකිවන්නේ කෙසේද? (1 තෙසලෝනික 5:16–18; ඇල්මා 34:38; මොරෝනයි 7:33–39 බලන්න.)

**3. ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් එලියාව සනසා දෙවියන්වහන්සේගේ වැඩකටයුතු නොකඩවා කරගෙන යෑමට උපදෙස් දෙන ලදී.**

1 රාජාවලිය 19 උගන්වා සාකච්ඡා කරන්න.

එලියා බාල්ගේ පූජකවරුන් පරාජය කළ නිසා යෙසෙබෙල් කෝපවී ඔහුව මැරීමට සෙව්වේය. එලියා කාන්තාරයට පළාගොස් ස්වාමින්වහන්සේට මෙසේ කියමන් මොරගැසුවේය, "ඉතින් ඇති, දැන් ස්වාමින්වහන්ස මාගේ ප්‍රාණය ගනු මැනව" (1 රාජාවලිය 19:4). දේවදූතයෙකු මගින් කෑම සහ වතුර එවමින් ස්වාමින්වහන්සේ එලියාට ආශිර්වාද කළ සේක. අනාගතවක්තෘවරුන් පවා බලාපොරොත්තු රහිත අත්දැකීම් ලබන අතර, දෙවියන්වහන්සේට පමණක් සැලැස්විය හැකි සැනසීම හා මගපෙන්වීම අවශ්‍යවන බව පෙන්වා දීමට ඔබට උවමනාවෙනවා ඇත.

- එලියා අධෛර්‍යය වූයේ කුමක් නිසාද? (1 රාජාවලිය 19:10, 14 බලන්න. දෙවියන් වහන්සේගේ විශිෂ්ඨ බලය පෙන්වීම කෙරෙහි ජනතාවගේ ප්‍රතිචාරය තිබියදීත් සත්‍යවූ දෙවියන්වහන්සේට නමස්කාර කරන, ඉතිරිව සිටින එකම ඉශ්‍රායෙල්වරයා ඔහු පමණක් යයි එලියාට හැඟුනේය.) සමාදානය ලබා ගැනීමට ඔහු කළේ කුමක්ද? (1 රාජාවලිය 19:4, 8 බලන්න. ඔහු නිරාහාරව යාච්ඤා කළේය.) අප අධෛර්‍යයමත්ව, දොම්නසින් හෝ බලාපොරොත්තු රහිත හැඟීම් ඇතිවෙන විට, අපට උපකාර වීමට එලියාගේ අත්දැකීම් වලින් අපට ඉගෙනගැනීමට හැකිවන්නේ කුමක්ද?
- හොරෙබ් කන්දේදී දෙවියන්වහන්සේ එලියාව සැනසුවේ කෙසේද? (1 රාජාවලිය 19:9–13 බලන්න.) දෙවියන්වහන්සේ අප සමග කථාබහ කරන අන්දම ගැන මෙයින් අපට ඉගෙනගත හැකි වන්නේ කුමක්ද? දෙවියන්වහන්සේගේ විශිෂ්ඨ බලය පෙන්වමින් හඬනගා කථාකරනවාට වඩා, බොහෝ අවස්ථාවලදී දෙවියන්වහන්සේ අප සමග ශුද්ධාත්මයාණන් වහන්සේගේ සියුම්

නිශ්චලතාවයේ හඬකින් අප සමග කථාබහ කරන්නේ ඔබ සිතන හැටියට කුමක් හෙයින්ද? ශුද්ධාත්මයාණන්ගේ සියුම් හඬ හඳුනා ගැනීමට අපට හැකිවන්නේ කෙසේද?

දෙවියන්වහන්සේ සමග කථාබහ කරන්නේ කෙසේදැයි සභාපති හින්ක්ලිගෙන් ප්‍රවෘත්ති වාර්ථාකරුවෙකු ඇසූ විට, අනාගතවක්තෘ මෙසේ පිළිතුරු දුන්නේය, "රාජාවලියේ පළවෙනි පොතෙහි සඳහන්වන පරිදි එලියාගේ අත්දැකීමට සමාන පිලිවෙතක් යයි කීම මම හිතන හැටියට විස්තර කිරීමේ හොඳම මාර්ගයයි. එලියා ස්වාමින්වහන්සේට කථාකළේය. තවද එහි සුලඟක් විය, මහත්වූ සුලඟක් විය. නමුත් ස්වාමින් වහන්සේ සුළඟෙහි නොවූ සේක. තවද එහි භූමිකම්පාවක් විය, එහෙත් ස්වාමින්වහන්සේ භූමිකම්පාවේ නොවූ සේක. තවද එහි ගින්නක් විය, ස්වාමින්වහන්සේ ගින්නෙහිද නොවූ සේක. ගින්නෙන් පසු සියුම් නිශ්චලතාවේ හඬක් විය, එය, මම විස්තර කරන ආත්මයාණන්ගේ සියුම් හඬය" (Conference Report හි ඔක්, 1996, 71; හෝ *Ensign*, නොවැ. 1996, 51).

සභාපති එස්රා ටැෆ්ට් බෙන්සන් මෙලෙස ඉගැන්වූයේය: ආත්මයාණන්වහන්සේගේ සියුම් හඬට සවන්දීමට ඔබ කාලය මිඩංගු කරනවාද? බොහෝවිටදී යාච්ඥාවට පිළිතුරු ලැබෙන්නේ සියුම් හඬ මගිනි, එය හඳුනාගන්නේ අපගේ ගැඹුරු ඇතුලාන්තයේ හැඟීම් මගින්ය. මම කියන්නේ ඔබ කාලය මිඩංගු කරමින් යාච්ඥාකර ඇහුම්කම් දෙන විට, ඔබ ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔබට දැනගන්නට පුළුවන." (Conference Report, හි ඔක්. 1977, 46; හෝ *Ensign*, නොවැ. 1977, 32).

- සැනසිලිකාරයාණන් වහන්සේ වෙනවා පමණක් නොව ශුද්දාත්මයාණන්වහන්සේ ගුරුවරයෙකුද වන්නේය. (යොහාන් 14:26; 2 නීෆායි 32:5). දෙවියන්වහන්සේ.... ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් එලියාට දුන් උපදෙස් මොනවාද? (1 රාජාවලිය 19:15–16 බලන්න). අප අධෛර්‍යයවූ විට ස්වාමින්වහන්සේට සේවයකිරීම අපට උපකාරවන්නේ කෙසේද?
- බාල්ට නමස්කාර කිරීමට තෝරාගත් ඉශ්‍රායෙල්වරුන් තවමත් සිටිනබව ස්වාමින්වහන්සේ එලියාට කියමින් ඔහු සැනසූ එක් ක්‍රමයක (1 රාජාවලිය 19:18). පසු දවස්වල අනෙකුත් ශුද්ධවන්තයින් සමග මිත්‍රත්වය මගින් අපට සැනසීම ලබාගැනීමට හැකිවන්නේ කෙසේද? ඔබ හුදකලා නොවන බව දැනගැනීමට එය ඔබට බලපාන්නේ කෙසේද? අන්‍යයන්ට හුදකලාවේ හැඟීම් ඇතිවන විට ඔවුන්ට උපකාර කිරීමට ඔබට කුමක් කළහැකිද?

---

අවසානය.

දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රමුකත්වය අප තබමින්, ශුද්ධාත්මයාණන්ගේ සියුම් හඬට අප සවන් දෙමින් කීකරු වෙන විට, අපව සනසමින් මගපෙන්වන බවට සාක්ෂි දරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහසක්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙය ඔබට භාවිතා කිරීමට උවමනා වෙනවා ඇත.

**එලියාගේ ආත්මය.**

පසු දවස්වල ශුද්ධවන්තයෝ බොහෝවිට එලියාගේ ආත්මය ගැන කථාකරති. "පියවරුන්ගේ සිත් දරුවන් වෙතටත් දරුවන්ගේ සිත් පියවරුන් වෙතටත් හැරවීමට" අප කරන වැඩකටයුතු වලට මෙම වාක්‍යය කණ්ඩය යොමු වේ (ඩී සහ සී 110:15). පවුල් ඉතිහාසය සෙවීම හා ජීවත් වන අයට සහ මළ අයට දේවමාලිගා වැඩකටයුතු කිරීම මෙම වැඩකටයුතු වලට අඩංගුවේ. මෙයට අප එලියාගේ ආත්මය යයි කියනු ලැබේ. මක් නිසාද පූජකවරයේ මුද්‍රා කිරීමේ බලයේ යතුරු ජෝසෆ් ස්මිත් වෙත එලියා නැවත පිහිටුවේය (ඩී සහ සී 110:13–16). පවුල් සදාකාලයට එක්රැස් කිරීම පිණිස මෙම බලයෙන් මුද්‍රාකිරීමේ නියෝග ඉටුකළ හැකිය.

ජෝසෆ් ස්මිත් මෙසේ කීවේය:

"එලියාගේ ආත්මය, බලය, හා කැඳවීම නම්, එළිදරව් නියෝග හා දේවකාව්‍ය කෙරෙහි යතුරු ඉසිලීමේ බලය ඔබට තිබීමය, මෙල්කසෙදෙක් පූජකවරයේ සහ පොළොවේ දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි සම්පූර්ණත්වයේ බලය සහ දීමනාවන්ය, තවද පියවරුන්ගේ සිත් දරුවන් වෙතටත්,

දරුවන්ගේ සිත් පියවරුන් වෙතටත් හැරවීමට ස්වර්ගයේ සිටින අය පවාද…දෙවියන්වහන්සේගේ රාජ්‍යයට අයත් සියලුම නියෝග ඉටුකිරීම ලබාගැනීම සහ ලැබීමට ඇති බලයයි.

"මෙම විෂය ඔබ අවබෝධ කරගැනීම මම කැමති වෙමි. මක්නිසාද එය වැදගත්ය; ඔබ මෙය ලබනවා නම් එය එලියාගේ ආත්මය වේ. එනම් අපගේ මළාවූ අය ඉදිරියට ඒමට මුද්‍රාතැබීම; පොළොවේ සිටින අය පොළොවේ සිටින අය සමග මුද්‍ර තැබීමට, එලියාගේ බලය අපට මෙයට අවශ්‍ය වේ. මෙම එලියාගේ බලය සහ යෙහෝවඃ වහන්සේගේ රාජ්‍යයෙහි යතුරු වේ." (*Teachings of the Prophet Joseph Smith*, sel. Joseph Fielding Smith [1976], 337–38).

# 29 "එලියාගේ බලය. . . ඔහු ගත්තේය."

වෙනි පාඩම.

*2 ිසීදීකඥශ්‍රී 2; 5–6 2 රාජාවලිය 2; 5–6*

---

**අරමුණ**

එක් අනාගතවක්තෘවරයෙකුගෙන් තවත් කෙනෙකුට අධිකාරී බලය යන ආකාරය අවබෝධකර ගැනීමටද, අනාගතවක්තෘවරුන්ගේ වචන වලට කීකරු වීමට දිරිගැන්වීමටද, දෙවියන්වහන්සේගේ බලය අන් සියලුම බලයට වඩා ශ්‍රේෂ්ඨ බව ඔවුන්ට ස්ථිර කර ගැනීමට පංති සාමාජිකයින්ට පිහිට වීමටය.

---

**සූදානම**

1. පහත සහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඥාවෙන් අධ්‍යයනය කරන්න.
   - අ. 2 රාජාවලිය 2:1–18. අළුත් අනාගතවක්තෘ වීමට එලියා එලීෂාව සූදානම් කරයි (2:1–10). එලියා ස්වර්ගයට ගන්න ලදී. එලීෂා එලියාගේ අධිකාරිය බලය රැගෙන අනාගතවක්තෘ වෙයි (2:11-15). ඔවුන් එසේ නොකළ යුතුයයි, එලිෂාගේ උපදෙස් නොතකා මිනිසුන් පණස් දෙනෙක් දින තුනක් එලියාව සෙව්වෝය. (2:16–18).
   - ආ. 2 රාජාවලිය 5. එලිෂා නාමන්ගේ කුෂ්ඨ රෝගය සුව කරයි (5:1–14). නාමන් ස්වාමින් වහන්සේට ප්‍රශංසා කරමින්, එලිෂාට තෑග්ගක් පිරිනැමූ නමුත් එලිෂා එය ප්‍රතික්ෂේපකළේය. (5:15–19).
   - ඇ. 2 රාජාවලිය 6:8–18. සිරියවරුන් සමග යුද්ධයකදී එලිෂා ඊශ්‍රායෙල් රජුට මග පෙන්වූයේ. (6:8–10). එලිෂාව අල්ලා ගැනීමට සිරියාවේ රජු ඔහුගේ මිනිසුන්ට අණ කළ අතර, හමුදාව දෝතාන් නගරය වට ලෑවේය (6:11-14). අභීත, එලිෂා යාච්ඥාකළ අතර අශ්වයන්ගෙන්ද ගිනිරථ වලින්ද පිරි කන්දක් ස්වාමින් වහන්සේ පෙන්වාදී සිරියා හමුදාවට අන්ධවීමට පහර දුන්නේය 6:15–18).
2. යොමුකිරීමේ ක්‍රියාකාරීත්වය ඔබ භාවිතා කරනවා නම්, අධිකාරී බලය මෙන් භාවිතාකිරීමට රෙදි කෑල්ලක් ගෙන එන්න.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.

පාඩම පටන්ගැන්මේදී පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතාකිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

ඔබගේ උරහිස වටා (නැතහොත් පංති සාමාජිකයෙකුගේ උරහිස වටා) රෙද්දෙන් වසන්න. අනාගතවක්තෘ එලියා සළුවක් වැළඳගෙන සිටි බව පහදා දෙන්න. එම සළුව පෙනුන ආකාරය නියත වශයෙන්ම අප නොදන්නා නමුත් එය රෙද්දෙන් සෑදූ ලෝගුවක් බව පෙනෙන්ට තිබේ. එලියාගෙන් එලිෂාට සළුව භාරදීම, අනාගතවක්තෘ අධිකාරී බලය එලිෂාට භාරදීමේ සංකේතයකි.

වර්තමානයේදී අප "සළුව" ගැන කථාකරන්නේ අනාගතවක්තෘවරයාට අධිකාරී බලය ලැබී එයම පත්කොට වෙන්කිරීම වශයෙනි. අද අනාගතවක්තෘවරයා ලෝගුවක් හෝ රෙදි කෑල්ලක් පැළඳ නොසිටියත්, පූජකවරයේ යතුරු දෙවියන්වහන්සේ ඔහුට දානය කරන සේක. පොළොවේ සභාවේ නායකයා වශයෙන් දෙවින්වහන්සේගේ නාමයෙන් ක්‍රියාකිරීමට මෙම යතුරු ඔහුට බලය ලබා දෙයි. අනාගතවක්තෘකෙනෙකු මරණයට පත් වූ විට, මෙම අධිකාරී බලය අළුත් අනාගතවක්තෘවරයාට දෙනු ලැබේ.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම හා අදාළකිරීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

1. **අනාගතවක්තෘ වශයෙන් එලිෂා, එලියාගෙන් පසුව පත්වෙයි.**

2 රාජාවලිය 2:1–18 උගන්වා සාකච්ඡා කරන්න.

- එලියා සහ එලිෂා අතර පැවති සම්බන්ධතාවය කුමක්ද? (2 රාජාවලිය 2:2–10 බලන්න.) එලිෂා එලියා සමග සිටීමට එසේ අදහස් කරගත්තේ ඔබ සිතන හැටියට කුමක් හෙයින්ද? එලියාව ස්වර්ගයට ගත්තාට පසු එලිෂා කළේ කුමක්ද? (2 රාජාවලිය 2:11-13 බලන්න. ක්‍රියාකාරීත්වයට යොමු වීම ඔබ භාවිතා කළේ නැත්නම්, එලියාගේ සළුව කුමක්ද, එය නියෝජනය කරන්නේ කුමක්ද කියා විස්තර කිරීමට එයට යොමුවන්න.)

- අනාගතවක්තෘගේ අධිකාරී බලය අද තිබෙන්නේ කාටද? (සභාවේ වර්තමාන සභාපතිටය.) අනාගතවක්තෘ මරණයට පත් වූ විට මෙම අධිකාරී බලය පවරන්නේ කෙසේද?

  සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් මෙසේ විස්තර කළේය.

  "සභාවේ සභාපතිවරයාගේ පදවියට හිමිකාරයා තේරීමේදී රහසක් නොමැත. ස්වාමින් වහන්සේ බොහෝ කළකට පෙර මෙය විසඳූ සේක. බොහෝ කලක් ප්‍රේරිතවරයෙක්ව සිටි ජේෂ්ඨ ප්‍රේරිතවරයා සභාවේ මුලසුන දරණ නිළධාරියා බවට ඉබේටම පත්වන්නේය. පළමු සභාපතිත්වයක් නොමැති විට, දොළොස්දෙනාගේ සභාව මුලසුන දරණ මණ්ඩලය මෙන් ක්‍රියාකරමින් ඔහුව අනුමත කරනු ලබයි. සභාපතිවරයා තෝරනු නොලබන්නේය. නමුත් සභාවේ (මණ්ඩලයේ) ඔහුගේ සහෝදරයන් සහ සභාවේ සාමාජිකයන් මගින් ඔහුව අනුමත කරනු ලබන්නේය. (*Doctrines of Salvation*, සකස්. බෲස් ආර්. මැකොන්කි, 3 වෙළුම [1954–56], 3:156).

  සභාපති හෝවඩ්. ඩබ්ලුව්. හන්ටර්ගේ මරණයෙන් පසු සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලිව, අනාගතවක්තෘවරයා සහ සභාවේ සභාපති වශයෙන් නියම කොට එයට වෙන්කිරීමේ පිළිවෙත ගැන ඔහු පහදා දුන්නේය.

  "සභාපති හන්ටර්ගේ ඇවෑමෙන් පළමු සභාපතිත්වය විසුරුවා හැරියේය. ඔහුගේ උපදේශකයෙකු වශයෙන් සේවය කළ සහෝදර මොන්සන් සහ මම දොළොස්දෙනාගේ සණපූර්ණයේ අපගේ ස්ථාන ගත් අතර එය සභාවේ මුලසුන දරණ අධිකාරිය බවට පත්විය.

  "[දින ස්වල්පයකට පසු] ජීවත්වන නියම කරන ලද සියළුම ප්‍රේරිතයන්, දේවමාළිගාවේ උඩුමහලේ එක්රැස්ව නිරාහාර ආත්මයෙන් යාච්ඤා කරති. මෙහිදී අපි පූජනීය ගීතිකාවක් ගායනය කර එක්ව යාච්ඤා කර, ස්වාමින්වහන්සේ රාත්‍රී භෝජනයේ සක්‍රමේන්තුවට අපි සහභාගීවී අපගේ ගිවිසුම් වල පූජනීය සංකේතයද අපගේ දිව්‍යමය මිදුම්කරුවාණන් වන උන්වහන්සේ සමග අපගේ සම්බන්දයද අලුත් කරමින් අපි යාච්ඤා කළෙමු. පසුගිය පරම්පරා ගණනක් තුලින් මනාව ස්ථාපනය කළ නියමය අනුව සභාපතිත්වය හඳුනාගන්නවා (සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් කලින් කරන ලද ප්‍රකාශයක මෙම නියමය පැහැදිලි කළා.)එ හි ඡන්ද ව්‍යාපාර නැත, තරඟ කිරීමක් නැත, නිලය උදෙසා ආශාවක් නැත. එය නිශ්චල සාමකාමී, සරල පූජනීය දෙයකි. ස්වාමින්වහන්සේ උන්වහන්සේම ස්ථාපිත කරන ලද නිදර්ශනයක් අනුව එය කරන ලදී" (Conference Report හි අප්‍රේ. 1995, 92; හෝ *Ensign*, මැයි 1995, 69).

  ගැලවුම්කරුවාණන් අතීතයේදී කළ පරිදිම, පසු දවස්වල ප්‍රේරිතයන් එක් එක්කෙනාට පූජකවරයේ යතුරු දුන්සේක. කෙසේවෙතත්, මුළු සභාව වෙනුවෙන්ම, ජීවමාන ජේෂ්ඨ ප්‍රේරිතයා වන සභාවේ සභාපතිට පමණක් යතුරු භාවිතා කිරීමට හැකිය. (නැතහොත් අන්‍යයන්ට භාවිතා කිරීමට හැකි බව පහදා දීමට ඔබට උවමනා වෙනවා ඇත. (ඩී 132:7 බලන්න.)

- යෝර්දාන ගඟේ ජලය දැතට බෙදී යෑමේ එලියාගේ භාස්කමේ ආත්මය එලිෂා කෙරෙහි පිහිටුවා තිබෙනවා දුටු විට ජනතාව ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (2 රාජාවලිය 2:14–15 බලන්න.) අළුතෙන් නිමකරන ලද සභාවේ සභාපතිවරයා ක්ෂණිකව අප පිළිගෙන අනුමත කිරීමේ වැදගත්කම කුමක්ද? (ඩී සහ සී 43:2–3, 7 බලන්න.)

- එලියා ස්වර්ගයට ගත් වහාම, ඔහු සෙවීමට ශක්තිමත් මිනිසුන් 50ක් යැවීමට ජනතාවට අවශ්‍ය විය. ජනතාවට එලීෂා කුමක් කීවේද? (2 රාජාවලිය 2:16 බලන්න.) එලිෂාගේ පිළිතුරට ජනතාව

ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (2 රාජාවලිය 2:17 බලන්න.) ජනතාවට යෑමට එලිෂා අවසර දෙනතෙක් ඔවුහු ආයාචනා කළෝය.)

- එලියා සොයාගැනීමට නොහැකිව මිනිසුන් 50 දෙනා ආපසු පැමිණි විට, එලිෂා ජනතාවට කීවේ කුමක්ද? (2 රාජාවලිය 2:18 බලන්න.) මිනිසුන් 50 දෙනාගේ අත්දැකීම් වලින් අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද? අපට ඇසෙන පළවෙනි වතාවේම, අනාගතවක්තෘගේ අප අනුගමණය කළ යුතුය. අනාගතවක්තෘවරයාගේ උපදෙස් අනුගමණය කිරීමට පෙර එය නැවත අපට පවසනවා නම් අප බලා සිටින්නේ මන්ද? මෑත අවුරුදු වලදී සභා නායකයින් අපට දී තිබෙන උපදෙස් මොනවාද? මෙම උපදෙස් ඔබ අනුගමණය කරන විට, ඔබට ආශිර්වාද ලැබෙන්නේ කෙසේද?

**2. නාමන්ගේ කුෂ්ඨ රෝගය එලිෂා සුව කරයි.**

2 රාජාවලිය 5. උගන්වා සාකච්ඡා කරන්න.

- නාමන් කවරෙකුද, ඔහුගේ පීඩාව කුමක්ද? (2 රාජාවලිය 5:1 බලන්න.) ඔහු එලිෂා වෙතට ගියේ කුමකටද? (2 රාජාවලිය 5:2–9 බලන්න.) සුවවීම පිණිස එලිෂාගේ පණිවුඩකරුවා නාමන්ට කීවේ කුමක් කිරීමටද? (2 රාජාවලිය 5:10 බලන්න.) පළමු වතාවට, එලිෂාගේ උපදෙස් අනුගමණය කිරීම නාමන් ප්‍රතික්ෂේප කළේ කුමක් නිසාද? (2 රාජාවලිය 511–12.)
- නාමන්ගේ මෙහෙකරුවන් එලිෂා ඔහුට කී දෙය කිරීමට නාමන්ට ඒත්තු ගැන්වූයේ කෙසේද? (2 රාජාවලිය 5:13 බලන්න.) නාමන් හත් වතාවක් යෝර්දාන් ගඟේ ගිලුණු පසු ඔහුට කුමක් වූයේද? (2 රාජාවලිය 5:14 බලන්න.)
- අප අකමැති වුවත් අපට නොතේරුනත්, එය ඉතා සුළු සරල කරුණක් වුවත්…අනාගතවක්තෘගේ උපදෙස් අනුගමණය කිරීම ගැන නාමන්ගේ කථාන්තරයෙන් අපට කුමක් ඉගෙන ගැනීමට හැකිවේද? අනාගතවක්තෘ හෝ වෙනත් සභා නායකයින් අපට කිරීමට කියන, සුළු, සරල සමහර දේවල් මොනවාද? සමහර විට මෙම දේවල් කිරීමට ඇතැම් විට අපට අපහසු කුමක් හෙයින්ද? සභා නායකයින්ගේ උපදෙස් අනුගමණය කිරීමට අපගේ කැමැත්ත දියුණුකර ගැනීමට අපට හැකිවන්නේ කෙසේද?

  වැඩිහිටි රෙක්ස්. ඩී. පිනිගාර් මෙසේ ඇසුවේය, "අපගේ ජීවිත වනස් කිරීමට හැකි, අපගේ පීඩා සුවකිරීමට හැකි සුළු දේවල් මගහරිමින් ලොකු වැදගත් දේවල් කිරීමට බැලීමෙන් සමහර විට අපිත් නාමන් වගේ නොවන්නේද?" (Conference Report හි, ඔක්. 1994, 106; හෝ *Ensign*, නොවැ. 1994, 80.)

- නාමන්ගේ කථාන්තරය කීවාට පසු, වැඩිහිටි ගෝර්ඩන් බී. හින්ක්ලි මෙසේ කීවේයඃ "ශුභාරංචියේ මාර්ගය සරල මාර්ගයකි. සමහර අවශ්‍ය දේවල් අපට පෙනෙන්නේ පහසුවෙන් තේරුම් ගත හැකි අනවශ්‍ය දේවල් හැටියටය. ඒවා පැහැර හරින්නට එපා. ඔබම යටහත් වී කීකරු වන්න. එහි ප්‍රතිඵල දැකීමට පුදුම වෙයි. අත්දැකීම් තෘප්තිමත් වන බව මට පොරොන්දු වෙන්න පුළුවන." (Conference Report, හි, ඔක් 1976, 143; හෝ *Ensign,* නොවැ. 1976, 96).
- ඔහුගේ සුව වීමෙන් නාමන් ඉගෙන ගත්තේ කුමක්ද? (2 රාජාවලිය 5:15 බලන්න.) සරල දේවල් කෙරෙහි කීකරු වීමෙන් ඔබගේ සාක්ෂිය ශක්තිමත් වූයේ කෙසේද?
- නාමන් සුවඋනාට පසු එලිෂාට දීමට ඔහු උත්සාහ කළේ කුමක්ද? (2 රාජාවලිය 5:15 බලන්න.) නාමන්ගේ පඬුරු එලිෂා ප්‍රතික්ෂේප කළේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? ලෞකික දේවල් වලට සැලකිළිමත් නොවී සේවය කිරීම වැදගත් වන්නේ කුමක් නිසාද?

**3. සිරියවරුන් සමග යුද්ධයකදී ඉශ්‍රායෙල්වරුන්ට එලිෂා මගපෙන්වයි.**

2 රාජාවලිය 6:8–18 උගන්වා සාකච්ඡා කරන්න.

- සිරියාට විරුද්ධව යුද්ධයේදී ඉශ්‍රායෙල් රජුට එලිෂා උපකාර කළේ කෙසේද? (2 රාජාවලිය 6:8–10 බලන්න.) එලිෂා කරන දෙය ගැන සිරියාවේ රජු දැනගත් විට ඔහු කුමක් කළේද? (2 රාජාවලිය 6:11–14 බලන්න.)

- සිරියවරුන්ගේ අශ්වයින් සහ රථ නුවර වටලා තිබෙනවා එලිෂාගේ මෙහෙකරුවා දුටු විට ඔහු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (2 රාජාවලිය 6:15 බලන්න.) එලිෂා කෙසේ ප්‍රතිචාර දැක්වූයේද? (2 රාජාවලිය 6:16 බලන්න.) එලිෂා ඔහුගේ මෙහෙකරුට මෙසේ කීවිට, ඔහු අදහස් කළේ කුමක්ද, "ඔවුන් සමග සිටින්නන්ට වඩා අප සමග සිටින්නෝ බොහෝය?" (2 රාජාවලිය 6:16.) එලිෂාගේ ප්‍රකාශය අද තවමත් සත්‍යයක් බව ඔබට පෙනෙන්නේ කෙසේද?

- ලෞකික දුෂ්ඨකම් වලට විරුද්ධව අප අසරන බව විශ්වාස කිරීම සඳහා අප සමහරුන්ට මගපෙන්වන වර්ථමාන අවස්ථාවන් මොනවාද? "ඔවුන් සමග සිටින්නන්ට වඩා අප සමග සිටින්නෝ බොහෝය"යන්නෙහි විශ්වාසය තැබීම දුෂ්ඨකම් වලට විරුද්ධව සටනේදී අපට උපකාරවන්නේ කෙසේද?

- වැඩිහිටි ඩැලින් එච්. ඕක්ස් මෙසේ පැවසුවේය: "පිරිමි ළමයෙක් වශයෙන් මෙම චමත්කාර කථාන්තරය මම කියවන විට, මම එලිෂාගේ තරුණ මෙහෙකරුවා යයි සිතේ. දෙවියන්වහන්සේට සේවය කරන විට,ක වදා හෝ දුෂ්ඨ බලපෑම් වලින් මා වටලනවා නම්, ස්වාමින්වහන්සේ මගේ ඇස් ඇරලා, ස්වාමින්වහන්සේට අප සේවය කරන විට, අප සමග සිටින සියලුම දෙනා නිතරම අපගේ විරුද්ධවාදීන්ට වඩා බලවත් බව තේරුම් ගැනීමට මම ඇදහීම දෙන බව මම සිතමි." (Conference Report හි, ඔක්. 1992, 54; හෝ *Ensign*, නොවැ. 1992, 39).

- අප සියලුම ජනතාවට ශුභාරංචිය ගෙනයනවිට "ඔවුන් සමග සිටින්නන්ට වඩා අප සමග සිටින්නෝ බොහෝය" යන්නෙහි විශ්වාසය තැබීම අපට උපකාර වන්නේ කෙසේද? (ඩී සහ සී 84:87–88 බලන්න.)

  සභාපති ගෝර්ඩන්. බී. හින්ක්ලි මෙසේ කීවේය: "සියලු ජාතීන්, සජාතීන්, භාෂාවන් හා ජනතාවට තවමත් ශුභාරංචිය අප ගෙනගිහින් නැත. නමුත් අපි බොහෝ ඉදිරියට ගමන් කරල තිබේ. යෑමට අවසර ලැබූ සෑම තැනකටම අපි ගිහින් තිබේ. දෙවියන්වහන්සේ අපට මගපෙන්වන බැවින් උන්වහන්සේගේ බලය සහ උන්වහන්සේගේ දිව්‍යමය කැමැත්ත අනුව දොරවල් විවෘතවේවි. ඒ ගැන මට විශ්වාසය. ඒ ගැන මට සහතිකය." (Conference Report, ඔක්තෝ. 1995,93; හෝ *Ensign*, නොවැ. 1995, 70–71) .

- එලිෂාගේ මෙහෙකරුවා වෙනුවෙන් ඔහුගේ යාච්ඥාව කුමක්ද? (2 රාජාවලිය 6:17 බලන්න.) දෙවියන්වහන්සේ එවන ලද අශ්වයින් සහ ගිනිරථ වලින් පිරි කන්ද, පළමුවෙන් මෙහෙකරුවා නොදුටුවේ මන්ද? අපගේම ජීවිත හා ලෝකය ගැන අපගේ ඇස් වඩා සම්පූර්ණයෙන් දෙවියන්වහන්සේගේ බලය කෙරෙහි විවෘතවීමට අපට කළ හැකිවන්නේ කුමක්ද?

---

**අවසානය.**

සභාවේ සභාපතිවරයා දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයෙකු බවට සාක්ෂිදරන්න. අළුත් සභා නායකයින් අනුමත කිරීමට හා අනාගතවක්තෘවරයාගේ උපදෙස් අනුගමණය කිරීමට පංති සාමාජිකයින් දිරිගන්වන්න. දෙවියන්වහන්සේගේ බලය සෑම බලයකටම වඩා ශ්‍රේෂ්ඨ බවට සාක්ෂිදරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්.**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1. එලිෂාගේ හාස්කම්.**

එලිෂා ජනතාවට අනුකම්පාව පෙන්වමින්ද ඔහු එලියාගේ අධිකාරිය බලය ලත් පදවියට හිමිකාරයා බවට තවත් දුරට සාක්ෂි දෙමින්, බොහෝ මහත් හාස්කම් ඉටුකළේය. ඔහු යෝර්දාන් ගඟේ ජලය දැනට බෙදීයන්ට සැලැස්වූ අතර යෙරිකෝ ජලය සුවපත් කළේය.තවද වැන්දඹුවකගේ තෙල් කුළාව වැඩිකළේය. පිරිමි ළමයෙකු මරණයෙන් ඔසවා තැබුවේය. වස කැවුණු ජනයාව සුවපත් කළේය. බඩගිනි ඇති අයට කන්ට දුන්නේය. නාමන්ගේ කුෂ්ඨ රෝගය සුව කළේය. පොරවක් පාවෙන්ට සැලැස්සුවේය, තවද යුද්ධයේදී රජවරුන්ට මගපෙන්වූයේය. 2 රාජාවලියේ 2:6 සඳහන් මෙම හාස්කමේ සමහරක් ඔබට නැවත බැලීමට වුවමනාවෙනවා ඇත.

- එලිෂාගේ මෙන් අපේ කාලයේදීත් හාස්කම් සිදුවීම එපමණම දුරට සිදුවෙනවාදැයි ඔබ සිතන්නෙහිද? එතරම් විශිෂ්ඨ හාස්කම් පමණක් කෙරෙහි යොමුවීමේ භයානක කම කුමක්ද? අපගේ ජීවිත වල සිදුවන සුළු හාස්කම් මොනවාද?

2. **නාමන්ට එලිෂා ගැන තරුණ ඉශ්‍රායෙල් ගැහැණු ළමයෙකු කියයි**

- එලිෂා සහ ඔහුගේ සුවකිරීමේ බලය ගැන නාමන් දැනගත්තේ කෙසේද? (2 රාජාවලිය 5:2–4 බලන්න. සිරියාවරුන් සමුදා වශයෙන් පිටත්ව ගිය විටක, ඔවුන් ඉශ්‍රායෙල් දේශයෙන් කුඩා දැරියක් අල්ලාගෙන ඇවිත් තිබුනේය. ඈ නාමන්ගේ භාර්යාවට සේවය කළාය. ඈ වනාහී ඇගේ ස්වාමි දුවට කථාකොට ඔබගේ ස්වාමියාව සුවකරන්න හැකි අනාගතවක්තෘවරයෙක් ඉශ්‍රායෙල් වල ඉන්න බව කීවාය.) මෙම තරුණ ඉශ්‍රායෙල් ගැහැණු ළමයා අපට ආදර්ශයක් වන්නේ කෙසේද? (අපගේ වයස, අවස්ථාවන් හෝ සභාවේ කැඳවීම් නොතකා ජනතාව අනාගතවක්තෘවරයා—සහ ස්වාමින්වහන්සේ වෙතට මගපෙන්වමින් බොහෝම යහපතක් අපට කළ හැකිය.)

# “ස්වාමින්ගේ ගෘහයට පැමිණෙන්න.” 30

වෙනි පාඩම.

*2 ඥඪීදූදීඞීධීඹීඹුශ්‍රී 29–30; 32; 34 2 ලේකම් 29–30, 32; 34*

**අරමුණ**

දේවමාළිගා කටයුතු සහ ශුද්ධ වූ ලියවිලි අධ්‍යයනය කිරීමෙන් ලැබෙන පොරොන්දු ආශිර්වාද ලබා ගැනීම පිණිස එක් එක් පංති සාමාජිකයෙකු පෙළඹවීමටය.

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.

   අ. 2 ලේකම් 29–30. යුදාවේ රජ හෙසකියා දේවමාළිගාවේ දොරවල් විවෘත කොට, නමස්කාර කිරීම පිණිස එය පිරිසිදු කොට පවිත්‍ර කිරීමට පූජකවරුන්ට සහ ලෙවිවරුන්ට උපදෙස් දුන්නේය (29:1-19). දේවමාළිගාව පිරිසිදු කළාට පසු, හෙසකියා සහ ඔහුගේ ජනතාව ස්වාමින්වහන්සේට නමස්කාර කරමින් ප්‍රශංසා කළෝය (29:20–36). යෙරුසලමේ ස්වාමින්වහන්ගේ ගෘහයට පැමිණීමට සියළුම ඉශ්‍රායෙල්වරුන්ට හෙසකියා ආරාධනා කරයි (30:1–9). සමහරු ආරාධනාව කෙරෙහි සිනාසෙමින් සමච්චල් කළ අතර ඉශ්‍රායෙල් ඇදහලිවන්තයෝ, යෙරුසලමට පැමිණ ස්වාමින්වහන්සේට නමසකාර කරති (30:10–27).

   ආ. 2 ලේකම් 32:1–23. අෂූර්හි රජ වූ සෙනකිරිබ් යුදාව වටලමින් ස්වාමින්වහන්සේට නින්දාකරමින් විරුද්ධව කථා කළේය (32:1–19). යෙසායා සහ හෙසකියා උදව් ඉල්ලා යාච්ඤා කළ විට ස්වාමින්වහන්සේගේ දේවදූතයෙකු අෂූර් හමුදාවේ බොහෝ දෙනෙක් විනාශ කළේය .(32:20–23).

   ඇ. 2 ලේකම් 34. හෙසකියාගේ පුත්‍රයා සහ මුණුපුරා දුෂ්ඨකමින් පාලනය කළෝය. හෙසකියාගේ දෙමුණුපුරෙක් වූ යොශියා යුදාහි රජකමට පත්විය. රාජධානියේ තිබූ දේව රූප විනාශකොට යොශියා දේවමාළිගාව අළුතවැඩියා කළේය (34:1–13). ව්‍යවස්ථා පොත දේවමාළිගාවේ තිබී සොයාගෙන යොශියාට කියවනු ලැබ, ව්‍යවස්ථාවෙන් ජනතාව කෙතරම් බැහැරව ගොස් තිබේද යන්න ගැන ඔහු දැනගත් විට ඔහු වැළපුනේය (34:14–21). හුල්දා නම් ප්‍රෝපේතවරිය යුදාවට මතු පැමිණෙන විපත්තිය ගැන කියමින්, යොශියා එය නොදකින බවට අනාවැකි කියයි (34:22–28). ස්වාමින්වහන්සේට සේවය කිරීමට යොශියා සහ ඔහුගේ ජනතාව ගිවිසුම් තබති (34:29–33).

2. අමතර කියවීම් :2 ලේකම් 31:33; 2 රාජාවලිය 18–19, 22–23; යෙසායා 37:10–20, 33–38.

3. පහත සඳහන් පිංතූර සුලබව ඇත්නම්, පාඩමට ඒවා භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇතඃ අතීතයේ භාවිතා කළ දේවමාළිගාව (62300) සහ පසු දවස්වල ශුද්ධවන්තයන්ගේ දේවමාළිගාවක පිංතූරයක්.

**යෝජිත පාඩම් වැඩි දියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොම කිරීම.**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබේම එකක්) භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

අෂූර්වරුන් යෙරුසලමට විරුද්ධව පහර දීමේදී එය ආරක්ෂා කිරීමට උපකාර වන පිණිස, හෙසකියා රජු ගීහොන්හි උල්පත් වල ජලය නගරයේ බිත්ති තුල ශීලෝම් පොකුණට හැරවූ බව පහදා දෙන්න. (2 ලේකම් 32:2–4, 30); හිරිගල් තුලින් අඩි 1770 ක් පමණ උමගක් හාරා එසේ කරන ලදී. අෂූර්වරුන්ට වතුර පහසුවෙන් ලබා ගැනීම වැලැක්වීමට නුවර පිටත තිබෙන උල්පත් වැසීමට හෙසකියා අණකළේය. නුවර ඇතුලේ මෙම වතුර නොමැතිව අෂූර්වරුන්ගේ වටලෑමේදී, යෙරුසලම් ජනතාවට ජීවත් විය නොහැක.

අෂූර්වරුන් සමග යුද්ධයේදී හෙසකියාගේ ජනතාවට ශාරීරික ජීවනයට ගිහෝන්හි උල්පත් වල ජලය වැදගත් සේම සාතන් සමග අපගේ යුද්ධ වලදී, අපගේ ආත්මික ජීවනයට, ජීවන ජලය අපට අවශ්‍ය බව පෙන්වා දෙන්න.

- ජීවන ජලය නම් කුමක්ද? (යොහාන් 4:10–14 බලන්න.)

  වැඩිහිටි බෲස් ආර්. මැකොන්කි මෙසේ පැහැදිලි කළේය, ජීවන ජලය නම් "සදාකාල ජීවනයේ වචනයි, ගැලවීමේ පණිවුඩයයි, දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ රාජ්‍යය ගැන සත්‍යයි, එය ශුභාරංචියේ දහමයි" (*Doctrinal New Testament Commentary*, 3 වෙළුම, [1966–73], 1:151).

- අපගේ ජීවිත තුලට ජීවන ජලය ගලා ඒමට ස්වාමින්වහන්සේ වෙතට උමගක් විවෘත කිරීමට අපට හැකිවන්නේ කෙසේද?

බලය සහ අවබොධය ලබා ගැනීමටත්, ස්වාමින්වහන්සේ වෙතින් උපදෙස් ලබාගෙන සමාදානය සහ ප්‍රීතියේ හැඟීම්ද ජීවන ජලය ලබාගැනීමේ එක් මාර්ගයක් නම් ස්වාමින්වහන්සේගේ ගෘහය වූ දේවමාලිගාවට යෑම බව පහදා දෙන්න.

හෙසකියාගේ කාලයේදී ඉශ්‍රායෙල්වරුන්ගේ ආරක්ෂාවට වැදගත් වූයේ දේවමාලිගාවේ නමස්කාර කිරීම මෙන්ම, අද අපගේ ආරක්ෂාවටද එය වැදගත් විය හැකිබව පෙන්වා දෙන්න.

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡා කිරීම හා අදාල කිරීම.**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස්, ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට එය අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ආත්මික ප්‍රතිපත්ති වලට සම්බන්ධ, අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. ස්වාමින්වහන්සේගේ ගෘහය පවිත්‍ර කිරීමට හෙසකියා නියෝග කළේය.**

2 ලේකම් 29–30 උගන්වා සාකච්ඡා කරන්න.

- හෙසකියාගේ පියාවන අහාස් දුෂ්ඨ රජෙකු වූ අතර, දේවමාලිගාවේ පූජනීය වස්තු අපවිත්‍ර කොට "[එහි] දොරවල්ද වසා තැබුවේය" (2 ලේකම් 28:24). ක්‍රිපූ: 715 දී හෙසකියා යුදාහි (දකුණු රාජ්‍ය) රජ බවට පත්වූ විට, ඔහු පළමුවෙන්ම කළ දෙය නම් දේවමාලිගාවේ දොරවල් විවෘත කොට, එය පිරිසිදු කිරීමට හා පවිත්‍ර කිරීමට පූජකවරුන්ට හා ලෙවීවරුන්ට නියෝග කිරීමය (2 ලේකම්, 29:3–5). හෙසකියා කියන පරිදි දේවමාලිගාව පවිත්‍ර කිරීමට අවශ්‍ය වූයේ කුමක් නිසාද? (2 ලේකම් 29:6–7 බලන්න.) ස්වාමින්වහන්සේගේ වාසස්ථානයෙන් (අපගේ) මුහුණු ඉවතට හැරවී(මෙන්) අපද වැරදිකරුවන් බව හැඟෙන්නේ කෙසේද? දේවමාලිගාවට ඔවුන් නිග්‍රහ කළ නිසා යුදාහි ජනතාවට කුමක් වූයේද? (2 ලේකම් 29:8–9 බලන්න).

- දේවමාලිගාව පවිත්‍ර කොට නැවතත් නමස්කාර කිරීම පිණිස සූදානම් කිරීමෙන් හෙසකියා බලාපොරොත්තු වූයේ කුමක්ද? (2 ලේකම් 29:10 බලන්න.) දේවමාලිගාවෙන් අපවිත්‍ර දේවල් ඉවත් කිරීමේ වැදගත්කම කුමක්ද? (ඩී සහ සී 97:15–17 බලන්න.) අපවිත්‍ර දේවල් දේවමාලිගාවට ඇතුල් නොවීමට සහතික කර ගැනීමේ අපගේ වගකීම කුමක්ද? (ඩී සහ සී 109:20–21 බලන්න. අප දේවමාලිගාවට යන විට අපගේ පවිත්‍රකම ගැන අප සහතික කරගත යුතුය.)

- දේවමාලිගාව පවිත්‍ර කළාට පසු හෙසකියා සහ යෙරූසලමේ ඔහුගේ ජනතාව කුමක් කළේද? (2 ලේකම් 29:20–21, 29–31, 36 බලන්න.) පාස්කුව පැවැත්වීම පිණිස ස්වාමින් වහන්සේගේ ගෘහයට පැමිණීමට හෙසකියා ආරාධනා කළේ කාටද? (2 ලේකම් 30:1–6 බලන්න.) මෙම ආරාධනාව පිළිගත්තේ කෙසේද? (2 ලේකම් 30:10–11 බලන්න.)

- දේවමාලිගාවට පැමිණීමට අකමැති වූ නිසා ඉශ්‍රායෙල් ජනතාව ප්‍රතික්ෂේප කළේ කුමණ ආශිර්වාදයක්ද? (2 ලේකම් 30:6–9 බලන්න. හෙසකියා රජකමට පත්වන විට, ඉශ්‍රායෙල් රාජධානියේ බොහෝ කොටසක් (උතුරු රාජධානිය) අෂූර්වරුන් විසින් වහල්බවට ගෙන තිබූ බව පහදා දෙන්න. "ස්වාමින්වහන්සේ වෙතට නැවත හැරී ආවොත්," වහල් කමින් මුදවා ගැනීමට හැකිවේ යැයි, ඉතිරි ඉශ්‍රායෙල්වරුන්ට හෙසකියා පොරොන්දු වූයේය. ඒ වෙනුවට ඉශ්‍රායෙල් ජනතාවගෙන් බොහෝ දෙනෙක් හෙසකියාගේ ආරාධනය ප්‍රතික්ෂේප කළහ. අවුරුදු

ගණනාවකට පසු ජනතාවගේ දුෂ්ඨකම් නිසා ඉශ්‍රායෙල් රාජධානියේ ඉතිරි කොටසද වහල් බවට පත් විය. ඉ2 රාජාවලිය 18:10–12ඊ. වහල්බවට පත්වූ ඉශ්‍රායෙල්වරුන් නැතිවූ දශ ගෝත්‍ර බවට පත්වූහ.)

2. **අෂූර්වරුන් යුදා රාජධානිය වටලති. යෙසායා සහ හෙසකියා උපකාර ඉල්ලා යාච්ඥා කළ විට, ස්වාමින්වහන්සේගේ දේවදූතයෙකු අෂූර් හමුදාවේ බොහෝ දෙනෙකු විනාශකළේය.**

2 ලේකම් 32:1–23 උගන්වා සාකච්ඡා කරන්න.

- ඉශ්‍රායෙල් රාජධානිය වහල්කමට ගත් පසු, අෂූර්වරුන් යුදාව රාජධානියට පහර දීමට පටන් ගත්තේය (2 ලේකම් 32:1). සෙනකෙරිබ්ගේ හමුදාව යෙරුසලමට පහර දීමට සූදානම් කරන බව හෙසකියා දුටු විට ඔහු කළේ කුමක්ද? (2 ලේකම් 32:2–5 බලන්න.) හෙසකියා යුද්දයට සූදානම් වූ පසු ලඟදී සිදුවන්නට යන ප්‍රහාරය ගැන ඔහුගේ ජනතාවට ඔහු කීවේ කුමක්ද? (2 ලේකම් 32:6–8 බලන්න.) අපගේ උත්සාහයන් කෙරෙහි විශ්වාසය තැබීම හා ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම යන දෙක අතර සුදුසු සම්බන්ධතාවය ගැන හෙසකියාගෙන් අපට ඉගෙන ගැනීමට හැකි කුමක්ද?
- ඉශ්‍රායෙල්හි ජනතාවට කථාකිරීමට සෙහකෙරිබ් ඔහුගේ මෙහෙකරුවන් යැව්වේය. මෙහෙකරුවෝ කුමක් කීවෝද? (2 ලේකම් 32:9–17 බලන්න.) ඔවුන් මේවා කීවේ කුමක් නිසාද? (2 ලේකම් 32:18 බලන්න.) දෙවියන්වහන්සේට කළ නොහැකි බව හෝ උන්වහන්සේ අපට උදව් නොකරන බව අපට ඒත්තු ගැන්වීමට සාතන් උත්සාහ කරන ක්‍රම මොනවාද?
- හෙසකියා සහ අනාගතවක්තෘ යෙසායා,සෙනකෙරිබ්ගේ වචන වලට ප්‍රතික්‍රියා කළේ කෙසේද? (2 ලේකම් 32:20; යෙසායා 37:14-20 බලන්න.)යෙසෙකියාගේ හා යෙසායාගේ යාච්ඥාවලට ස්වාමින්වහන්සේ පිළිතුරු දුන්නේ කෙසේද?(2 ලේකම් 32:21-22; යෙසායා 37:33-38 බලන්න.)
- දේවමාලිගාවේ නමස්කාර කිරීමෙන් ඔවුන් දැක්වූ ඔවුන්ගේ ධර්මිෂ්ට කම නිසා හෙසකියා සහ ඔහුගේ ජනතාවට සවාමින්වහන්සේගෙන් ආරක්ෂාව ලැබුනේය.දේවමාලිගාවට පැමිණීම මගින් අපට ආරක්ෂාව ලැබෙන්නේ කෙසේද?(ඩී සහ සී 169:24-28 බලන්න.) දේවමාලිගාවේ යෝග්‍යත්වයට පැමිණීමට අපගේ ජීවිත තුල ප්‍රමුකත්වය දීමට අපට කුමක් කළ හැකිද?

  සභාපති හෝවඩ්. ඩබ්ලුව් හන්ටර් මෙලෙස දිරිගැන්වූයේය:

  "අපි දේවමාළිගාවට යන ජනතාවක් වෙමු. අවස්ථාවන් ලැබෙන විට පෞද්ගලිකව දේවමාළිගාවට නිතර පැමිණෙන්න. ඔබගේ නිවසෙහි ළමයින්ට පෙණෙන පරිදි දේවමාළිගාවක පිංතූරයක් තබන්න. ස්වාමින්වහන්සේගේ ගෘහයෙහි අරමුණ ගැන ඔවුන්ට උගන්වන්න. ඔවුන්ගේ මුල්ම අවුරුදු වලදී යෑමට සලස්වා එම ආශිර්වාදයට සුදුස්සකු වන අන්දමට පැවතීමට කියන්න.

  "දේවමාලිගාවට ඇති දුර ප්‍රමාණය නිතර එහි යෑමට ඉඩප්‍රස්තාවක් නොමැති නම්, පවුල් ඉතිහාසය නම් දේවමාලිගාවේ පමණක් ඉටුකරන පූජනීය නියෝග උදෙසා සූදානම් කරන්න. දේවමාලිගා වැඩකටයුතු කිරීමට මෙම පර්යේෂණ වැදගත්වන අතර, මෙම වැඩකටයුතු කරන අයට ස්ථිර වශයෙන්ම ආශිර්වාද ලැබෙයි" (Conference Report හි, ඔක්තෝ. 1994, 8; හෝ *Ensign*, නොවැ. 1994, 8).

3. **යොෂියා සහ ඔහුගේ ජනතාව ස්වාමින්වහන්සේට සේවය කිරීමට ගිවිසුම් තබති.**

2 ලේකම් 34 උගන්වා සාකච්ඡා කරන්න.

හෙසකියාගේ පුත් මනස්සේ සහ ඔහුගේ මුණුපුරා ඔහුගෙන් පසු රජකමට පත්වෙයි (2 රාජාවලිය 33). දේවමාලිගාවේ දේව රූප තබමින්, ජනතාවට පාපය කෙරෙහි මගපෙන්වමින්, මනස්සේ අධර්මිෂ්ඨ කමින් යුදාහි රජ කළේය. කෙසේ වෙතත්, ඔහුගේ මරණයට පෙර මනස්සේ ඔහුවම යටහත් කරගෙන පසුතැවිලි විය. මනස්සේගේ පුත් ආමෝන්ද, ඔහුගේ පියා සෑදූ දේවරූප වන්දනා කරමින් අධර්මිෂ්ඨව පාලනය කළේය. ආමොන් පසුතැවිලි වූයේ නැත. ඔහුගේ සෙවකයන් විසින් ඔහුව මරණයට පත්කරන ලදී. ආමොන්ගෙ පුත් යොෂියා අවුරුදු අටක් වයස්ගතවූ විට යුදාහි රජකමට පත්විය. ඔහුගේ පියාගේ සහ සීයාගේ දුෂ්ඨ මාර්ග ප්‍රතික්ෂේප කරමින්, ඔහු ධර්මිෂ්ඨ රජෙකු බවට පත් විය.

- යොෂියා රජු කුමණ ආකාරයේ පුද්ගලයක්ද? (2 ලේකම් 34:1–2; 2 රාජාවලිය 23:25 බලන්න. 2 ලේකම් 34:2 සඳහන් දාවිත්, දාවිත් රජුය, ඔහු වනාහී යොෂියාගේ මුතුන් මිත්තෙකු වන අතර ඔහුගේ සත්‍යවූ පියා නොවේය.)

- රජෙකු වශයෙන් ඔහුගේ පාලනයේ මුල් අවදියේ යොෂියා කළ යහපත් දේවල් මොනවාද? (2 ලේකම් 34:3–8 බලන්න. සත්‍යවූ දෙවියන්වහන්සේ ඔහු සෙව්වේය. රාජධානිය තුල දේවරූප විනාශ කළේය. දේවමාලිගාව අලුත් වැඩියා කිරීමට ජනයාව යැව්වේය. මෙම වැදගත් වෙනස කිරීම් පටන්ගන්නා විට යොෂියාගේ වයස අවුරුදු 15 හෝ 16 පමණක් වූ බව පෙන්වා දෙන්න.)

- දේවමාලිගාව අළුත්වැඩියා කරන විට උත්තම පූජක වූ හිල්කියා සොයාගත් වැදගත්ම සොයාගැනීම කුමක්ද? (2 ලේකම් 34:14. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථා පොත නැතහොත් ශුද්ධ වූ ලියවිලි ඔහු සොයාගත්තේය. මේ කාලය වන විට යුදා ඉතිහාසයේ ලියන ලද ව්‍යවස්ථාව පැහැදිලිවම විනාශවී තිබුන අතර ඇත්ත වශයෙන්ම දැන නොදැන සිටියේය. ව්‍යවස්ථා පොත ඔහුට කියවූ අතර යොෂියා ප්‍රතික්‍රියා කළේ කෙසේද? (2 ලේකම් 34:19 බලන්න. වැලපීම හෝ මහත් කණගාටුව පෙන්වීමට තමාගේ වස්ත්‍ර පැලීම හෝ ඉරීම ඉශ්‍රායල්හි පැරණි සිරිතක් බව සිහි තබා ගන්න.) ව්‍යවස්ථා පොතෙහි අඩංගු දේවල් ඇසූ විට යොෂියා එතරම් සිත්තැවුලට පත් වූයේ කුමක් නිසාද? (2 ලේකම් 34:21 බලන්න.)

- දෙවියන්වහන්සේගේ වචනය රක්ෂා කිරීමටත්, ශුද්ධ වූ ලියවිලි ඉගැන්වූ දේවල් ජනතාව අපොහොසත් වූ බැවින්, හුල්දා ප්‍රොපේතවරිය යුදාට සිදුවන්නේ කුමක්ද කියා කීවේද? (2 ලේකම් 34:22–25 බලන්න.) ශුද්ධ වූ ලියවිලි කියවා එහි ඉගැන්වීම් අදාළකර ගැනීම අප නොසලකා හරිනවා නම් අපට කුමක් වන්නේද?

අපගේ ශුද්ධ වූ ලියවිලි පොත් අතරින් එකක් වන මොර්මන්ගේ පොත නොසලකා හැරීමේ භයානක කම ගැන එස්රා ටැෆ්. බෙන්සන් විස්තර කළේය.

"පූජනීය දේවල් සුළු කොට නොසැලකීමට, 1829දී ස්වාමින්වහන්සේ ශුද්ධවන්තයින්ට අනතුරු ඇඟවූ සේක (ඩී සහ සී 6:12 බලන්න). ඇත්ත වශයෙන්ම, මෝර්මන්ගේ පොත පූජනීය දෙයකි. එනමුත් බොහෝ අය එය සුළු කොට සලකති. නොහොත් වෙනත් වචන වලින් කියනවා නම් සැහැල්ලු කොට ගනියි. සුලු වැදගත් කමක් ඇති දෙයක් මෙන් සලකති.

"1832 මුල් ධර්මදූතයන් සමහර දෙනෙක් ධර්මදූත සේවයේ කටයුතු නිමවී ආපසු පැමිණි විට මෝර්මන්ගේ පොත සුලු කොට සැලකීම නිසා ස්වාමින්වහන්සේ ඔවුනට තරවටු කළ සේක. එම ආකල්පයේ ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන්ගේ සිත් අන්ධ වූ බව උන්වහන්සේ කීසේක. මෙම පූජනීය පොත සුලු කොට සැලකීමෙන් ඔවුන්ට ආලෝකය අහිමි උනා පමණක් නොව මුළු සභාවමද, සයෝනයේ සියළුම දරුවන් පවාද නින්දාවට පැමිණෙව්වේය. ඔවුන් පසුතැවිලි වී අළුත් ගිවිසුම, වන මෝර්මන්ගේ පොත පවා සිහිපත් කරන තෙක් ඔවුන් මෙම නින්දාවේම පවතින්නේ යැයි ස්වාමින්වහන්සේ ඉන් පසු කීසේක (ඩී සහ සී 84:54–57)…

"මෝර්මන්ගේ පොත සුළුවෙන් සැලකීම නිසා මුල් ශුද්ධවන්තයන්ට තරවටු කළා නම් අපද එසේම කළහොත් අපිට එම නින්දාව අඩුවන්නේද?" (Conference Report, හි ඔක්තෝ. 1986, 3–4; හෝ *Ensign*, නොවැ. 1986, 4–5).

- යොෂියාට සිදුවන දෙය ගැන හුල්දා කීවේ කුමක්ද? (2 ලේකම් 34:26, 28 බලන්න .මෙම පොරොන්දුව ඉටුවීම ගැන 2 ලේකම් 35:20–24 විස්තර කරයි.) ස්වාමින්වහන්සේ යොෂියාට මෙම පොරොන්දුව දුන්නේ කුමක් නිසාද? 2 ලේකම් 34:27 බලන්න.)

- ශුද්ධ වූ ලියවිලි වල උපදෙස් අනුව ඔවුන් ක්‍රියා නොකළ නිසා, ඔහුගේ ජනතාව නින්දාවට පත්වන බව දැනගත් පසු, සියලුම ජනතාවට දේවමළිගාවට එන්ට සලසවා ඔවුන්ට ශුද්ධ ලියවිලි කියෙව්වේය (2 ලේකම් 34:29–30). ඔහු මෙය කළේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? (ඔවුන් ඒවා නොදන්නවා නම් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ජනතාවට අනුගමණය කළ නොහැකිය.) දෙමව්පියන් යොෂියාගේ ආදර්ශය අනුගමණය කරමින් ඔවුන්ගේ දරුවන්ට ශුභාරංචියේ ව්‍යවස්ථාව ඉගැන්වීමට හැකිවන්නේ කෙසේද? (ඩී සහ සී 68:25, 28 බලන්න.)

- ශුද්ධ වූ ලියවිලි මත අප තබන වටිනාකම අපට පෙන්විය හැකි වන්නේ කෙසේද? ඉශ්‍රායෙල්වරුන්ට වඩා අපට බොහෝ ලියවිලි තිබෙන බවත්, එම ශුද්ධ ලියවිලි වලට අපට පහසුවෙන් ලඟාවීමට හැකි බවත් පෙන්වා දෙන්න. මෙම ආශිර්වාද නිසා අපට තිබෙන වගකීම කුමක්ද?

  සභාපති ස්පෙන්සර්. ඩබ්ලිව් කිම්බල් මෙසේ කීවේය: "මෙම දේවල් ස්වාමින්වහන්සේ අපට දෙන විට අපට ඒවා සුළු කොට සැලකිය නොහැකිය, මක්නිසාද යමෙකුට බොහෝ දේවල් භාර දෙන ලද්දේද, ඔහුගෙන් වඩා ඉල්ලනු ලබන්නේය. (ලූක් 12:48.) මේවාට ලඟාවීම අදහස නම් ඒවාට ඇති වගකීම වේ. ස්වාමින්වහන්සේගේ අණ පරිදි අප ශුද්ධ වූ ලියවිලි අධ්‍යයනය කළ යුතුය (3 නිෆා. 23:1–5 බලන්න); අපගේ ජීවිත පාලනය කිරීමට ඒවාට අප ඉඩදිය යුතුය" ("How Rare a Possession—the Scriptures!" *Ensign*, සැප්. 1976, 5).

- යොෂියා හා ඔහුගේ ජනතාව දේවමාළිගාවේ සිටින විට ස්වාමින්වහන්සේ සමග ඔච්චු ගිවිසුමක් ඇතිකර ගත්තෝය. ඔවුන් ගිවිසුම් කළේ කුමක් කිරීමටද? (2 ලේකම් 34:31–33 බලන්න.) දේවමාළිගාවේදී අප ස්වාමින්වහන්සේ සමග පූජනීය ගිවිසුම් තබන අතර, ඒවා ඉෂ්ඨවීමේදී අපට ලෞකික ආශිර්වාද සහ සදාකාල උතුම් වීම ලැබෙන බව පහදා දෙන්න. දේවමාළිගාවේදී පූජණීය ගිවිසුම් තැබීමට අපට සූදානම් වීමට හැකිවන්නේ කෙසේද? මෙම ගිවිසුම් අප තැබුවාට පසු, හැකි බොහෝ අවස්ථා වලදී දේවමාළිගාවට අප ආපසු පැමිණීමේ වැදගත්කම කුමක්ද?

---

**අවසානය.**

අවසානයේදී යුදා රාජධානියේ ජනයා බොහෝ දුෂ්ඨ බවට පැමිණි නිසා ඔවුන්ව වහල් බවට පත්වීමට ස්වාමින් වහන්සේ සැලැස්වූ බව පහදා දෙන්න (2 ලේකම් 36:14–21). කෙසේ වෙතත්, හෙසකියා සහ යොෂියාගේ පාලන කාලයේදී, දේවමාළිගාවට සහ ශුද්ධ වූ ලියවිලි කෙරෙහි ඔවුන්ව යොමු කරමින් ජනතාව හරවමින් ශක්තිමත් කිරීමට සෙව්වේය. ස්වාමින්වහන්සේගේ අණට කීකරු වීමට අප යොමු වෙමින්, දේවමාළිගාවට ඇතුල්වීමට අප සුදුස්සන් වන විට, ආත්මික ශක්තියෙන් හා ප්‍රීතියෙන් අපට ආශිර්වාද ලැබෙන බවට සාක්ෂි දරන්න. සුදුසු අන්දමින් ජීවත්වෙමින්ද හැකි පමණ අවස්ථාවලදී පැමිණ දේවමාළිගාවට පැමිණීමේ ආශිර්වාද භුක්ති විඳීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1 "ස්වාමින්වහන්සේ සමග අවසර පතක්"**

සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලිගේ කථාවක පහත සඳහන් පාඨ ගැන දැනුමක් ඇති කරගෙන පංතිය සමග බෙදා ගැනීමට සූදානම් වීම පිණිස, පාඩම ඉගැන්වීමට සතියකට කලින් පංති සාමාජිකයෙකුට කියන්න.

"ඔබ ඉදිරියෙහි අවරපත් දෙකක් මම ඔසවා තබමි. මෙවැනි අවසරපත් ගැන ඔබලා බොහෝ දෙනෙකු දන්නවා ඇත.

"පළමුවැන්න බැංකු අවසරපතකි. වෙළඳ බඩු ණයට ලබාගෙන, මා ගත් බඩු වලට වෙන වෙලාවක ගෙවීමට එය මට අවසරය දෙයි. එය වටිනා දෙයක් වන අතර ආරක්ෂා කර ගත යුතු දෙයකි. එය සොරකම් කළහොත් හෝ වංචා ලෙස භාවිතා කළහොත්, එය මට විශාල පාඩුවක් සහ සමහර විට බොහෝ ලැජ්ජාශීලී දෙයක් වෙනවා ඇත. මගේ බැංකුවෙන් එය මම ගන්නා විට මා ගවිසුමකට ඇතුලත්ව, පොරොන්දු වීමෙන් හා එකඟත්වයෙන් මම බැඳී සිටිමි. මම අවසරපත නිකුත්කිරීමේදී, එහි කොන්දේසි වලට යටත් වීමට එකඟ වෙමි.

"එය නිකුත් කරන ලද්දේ එක අවුරුද්දකට පමණි. එය ලබා දෙන වරප්‍රසාද මා භුක්ති විඳීමට නම් අවුරුදු පතා එය නැවත නිකුත් කළ යුතුය. ඇත්ත වශයෙන්ම එය මගේ නොවේ. එහි අයිතිය බැංකුව සතුවේ. පොරොන්දුවේ මගේ කොටස් ඉටු කිරීමට මා අපොහොසත් වුවහොත් එම අවසර පත බැංකුව නවත්වා ඔවුන් සතු කරගන්නවා ඇත.

"මා ළඟ තිබෙන අනිත් අවසර පත්‍රයට අප කියන්නේ දේවමාලිගා නිර්දේශය කියාය. එය නියෝජනය කරන්නේ ස්වාමින්වහන්සේ සමග අවසර පතකි, එයින් මට උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ දීමනා බොහෝමයක් ලබා ගැනීමට හැකි වේ. බැංකු අවසරපත ලෞකික දේවල් ගැන සැලකිලිමත් වන අතර, නිර්දේශය දෙවියන්වහන්සේගේ දේවල් සමගය.

"දේවමාලිගා නිර්දේශයක් ලබා ගැනීමට, එය ලබන්නා ඔහුගේ සුදුසුකම් පෙන්විය යුතු අතර එම සුදුසුකම් රඳා පවතින්නේ ඔහුගේ පුද්ගලික සුදුසුකම් මතය. වරක් එය ලැබූ විට එය සදාකාලයටම නොවේ, අවුරුදු පතා එය නැවත නිකුත්කළ යුතුය. තව දුරටත් එය උසුලන තැනැත්තා, එහි යෝග්‍යතාවයට විරුද්ධව යමක් කළ විට එම වරප්‍රසාදය ඔහුට අහිමි වෙයි.

"දේවමාලිගා නිර්දේශයක යෝග්‍යතාවය මුදල් වල වටිනාකම මත පදනම් නොවේ. එහි ඒ සම්බන්ධව කිසිවක් නැත. නිතර පුද්ගලික පැවැත්ම යමෙකුගේ ජීවිතයේ යහපත් කම මත පදනම් වෙයි. මුදල් ප්‍රශ්න නොව සදාකාල දේවල් කෙරෙහි එය සැලකිලිමත්ය.

"මුදල් ණයට ගැනීම පිණිස බැංකු අවසරපත විවෘත වෙයි. ස්වාමින්වහන්සේගේ ගෘහයට ඇතුල්වීමට දේවමාලිගා නිර්දේශය දොර විවෘත කරයි. ශුද්ධ වූ ස්ථානයට ඇතුල් වී පූජනීය හා දිව්‍යමය කටයුතු කිරීමට එය අදාල වේ….

"…මට සහ ඔබලා බොහොම දෙනෙකුට තිබෙන මෙම නිර්දේශය අනගි සහ පුදුමාකාර දෙයකි. විශේෂයෙන්ම විශිෂ්ඨ වරප්‍රසාදයකට එය යමෙකු සුදුස්සෙකු කරයි.—එහි බිත්ති වල සඳහන් පරිදි, ගෘහයට ඇතුල්වීමේ වරප්‍රසාද, 'ස්වාමින්වහන්සේට ශුද්ධ වූ— ස්වාමින්වහන්සේගේ ගෘහය,' ගෘහයේ සේවය පිණිස සුදුසු ආකාරයෙන් ජීවත් වෙන්න. ඕනෑම අපවිත්‍ර හෝ කෙලෙසන බලපෑම් හා පුද්ගලයින්ගේ ස්වාමින්වහන්සේගේ ගෘහය ආරක්ෂා කිරීමට ඔබගේ කොටස කරන්න. එහි අලංකාරය භුක්තිවිඳින්න. එහිදී කථා කරන චමත්කාර දේවල්ද, එහි මෙහෙය වන නියෝග වල ආශිර්වාදය සහ අලංකාරය ගැන ප්‍රීති වෙන්න.

"තවමත් දේවමාලිගයට නොගිය ඉඅයාට මම යෝජනා කරනනේ මළවුන් උදෙසා බව්තීස්මය කිරීමේ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්නය. ඊට පසු එම පූජනීය අත්දැකීම ඔබගේ ජීවිත වලට ප්‍රධාන ආධාරය කරගෙන, සෑම වෙලාවකම, සෑම අවස්ථාවකම ඔබගේ ජීවිතය පවත්වා ගැනීමට එය උපකාර කරගෙන, එනම් සුදුසු කාලයේදී, විශේෂයෙන් තමාටම පමණක් සතු ස්වාමින්වහන්සේ සමග අවසර පතක් ලබා, එනම් උන්වහන්සේගේ ශුද්ධ වූ ගෘහයට ඇතුල් වීමේ නිර්දේශයයි, එය වනාහී එහ ඇති සියලුම ආශිර්වාද වරප්‍රසාද භුක්තිවිදීමටය" (in Conference Report, අප්‍රේ. 1990, 65, 69; හෝ *Ensign*, මැයි 1990, 49, 52).

**2. දේවමාලිගාවල අරමුණු.**

පසු දවස්වල දේවමාළිගා ස්වල්පයක පිංතූර ගේන්න (හැකිනම්, විවිධ ගෘහ නිර්මාණ ශිල්පිය නිදර්ශන වලින් යුත් පිංතූර). මෙම දේවමාළිගා පිටතින් විවිධ අන්දමට පෙනෙන නමුත්, මෙම දේවමාළිගා ඇතුලෙහි ඉටුකරන නියෝග සහ තබන ගිවිසුම් එකම සමාන බව පහදා දෙන්න.

පැරණි ඉශ්‍රායෙලයේ දේවමාලිගා වල සමහර ක්‍රියා පසු දවස්වල දේවමාළිගා වල කරනවාට වඩා වෙනස් වූ නමුත් (ආදර්ශයක් වශයෙන්, සතුන් පූජා කිරීම හෝ ඉටිපන්දම් පත්තු කිරීම හෝ සුවඳ දුම් ඇල්ලීම දෙවමාලිගා තුල නොකරයි), පැරණි දේවමාලිගා හා පසු දවස්වල දේවමාලිගා වල අරමුණු එක සමානයඃ එනම් ස්වාමින්වහන්සේගේ අභිමුඛයට යෑමට සහ උන්වහන්සේමෙන් වීමට බව පහදා දෙන්න.

"පැරණි දේවමාළිගා", පරණ ගිවිසුමේ වීඩියෝ ඉදිරිපත් කිරීමේ (53224), මිනිත්තු නමයක කොටස පෙන්වීමට ඔබට උවමනා වෙනවා ඇත, එය වනාහී මෝසෙස්ගේ දේවමාලිගාවේ සිදුකළ සමහර ක්‍රියාකාරකම්ය.

**3. ශුද්ධ වූ ලියවිලි අධ්‍යානය කිරීම**

- ශුද්ධ වූ ලියවිලි අප අධ්‍යයනය කිරීමේදී සමහර විට අපහසු කම් ඇතිවන්නේ කුමක් නිසාද?

පංති සාමාජිකයින්ගේ පිළිතුරු රට හුණු ලැල්ලේ එක කොටසක ලැයිස්තුගත කරන්න. පසුව එම අපහසුකම් ජය ගැනීමේ මාර්ග සාකච්ඡාකරන්න. නිදර්ශනයක් වශයෙන්, අප කියවන දෙය

තේරුම් ගැනීමට නොහැකි නම්, තේරුම් ගැනීම සඳහා අපට යාච්ඥා කළ හැකි අතර අප කියවන ශුද්ධ ලියවිලි ගැන අනාගතවක්තෘන් සහ ප්‍රේරිතවරුන් කියා තිබෙන්නේ කුමක්ද යන්න ගැන අධ්‍යනය කළ හැකිය. රාත්‍රී කාලයේදී ශුද්ධ වූ ලියවිලි කියවන විට අපට නිදිමත දැනෙනවා නම්, එය කියවීමට දවසේ වෙනත් වේලාවක් අපට සොයාගත හැකිය. මෙම විසඳුම් රට හුණු ලෑල්ලේ වෙනත් කොටසක ලැයිස්තුගත කරන්න.

ඔවුන් ශුද්ධ වූ ලියවිලි අධ්‍යනය කිරීමේදී වඩාත් කැපවීමට පංති සාමාජකයින්ට අභියෝග කරන්න.

# 31
වෙනි පාඩම.

# “ප්‍රඥාව සොයාගන්නා මනුෂ්‍යයා වාසනාවන්තය”

*හිතෝපදේශය සහ දේශනාකාරයා.*

---

**අරමුණ**

හිතෝපදේශයේ සහ දේශනාකාරයාගේ පොත්වල අඩංගු ප්‍රඥාවන්ත උපදෙස් අදාළකර ගනිමින් වඩාත් ක්‍රිස්තුස් හා සමාන වීමට පංති සාමාජිකයින්ව පෙළඹවීමටය.

---

**සූදානම**

1. පාඩමේ කටුසටහනේ සාකච්ඡා කර තිබෙන ශුද්ධ වූ ලියවිලි සහ, හිතෝපදේශය සහ දේශනාකාරයා යන පොත් ඔබට හැකි තරම් යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.

2. ක්‍රියාකාරීත්වයට යොමු වීමේ පළමු වැන්න ඔබ භාවිතා කරනවා නම්, පංතිය පටන් ගැනීමට පෙර, පහත සඳහන් වාක්‍යය, දැන්වීමක හෝ රටහුණු ලෑල්ලේ ලියන්නඃ

   අ. ____________ විනාශයට පෙර යයි.
   ආ. ____________ සුදුසු මාර්ගයෙහි පුහුණු කරවන්න.
   ඇ. සෑම දේටම ____________ තවද අහසින් යට තිබෙන සෑම කාරණා ____________ ඇත.
   ඈ. නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි ____________
   ඉ. ____________ කෝපය පහවෙයි.
   ඊ. තමාගේ සිතෙන් ____________ ලෙසම ඔහු වන්නේය.

   ක්‍රියාකාරීත්වයට යොමු කිරීමේ දෙවැන්න ඔබ භාවිතා කරනවා නම්, හිතෝපදේශයෙන් හෝ දේශනාකාරයා පොතෙන් ඔවුන් ප්‍රිය කරන කොටසක් බෙදාගැනීමෙන් එය ඔවුන්ට වැදගත් වන්නේ මක්නිසාද යයි කීමට සූදානම් වීම සඳහා පංති සාමාජිකයින් එක්කෙනෙකුට හෝ දෙදෙනෙකුට කියන්න.

3. *පරණ ගිවිසුමේ වීඩියෝ ඉදිරිපත් කිරීම* (53224) තිබෙනවා නම් “ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසය”, මිනිත්තු පහක කාණ්ඩය, පාඩමේ කොටසක් මෙන් පෙන්වීමට ඔබට වුවමනා වෙනවා ඇත.

---

**යෝජිත පාඩම**
**වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් එක් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත. පංතියට ඉතාම හොඳට ගැලපෙන ක්‍රියාකාරීත්වයක් තෝරාගන්න.

1. දැන්වීමේ හෝ රටහුණු ලෑල්ලේ ඔබ ලියන ලද වාක්‍ය වෙතට පංති සාමාජිකයින් යොමුකරවන්න (ඉහත තිබෙන “සූදානම”බලන්න). හිතෝපදේශයේ සහ දේශනාකාරයාගේ පොත්වල මේවා ප්‍රසිද්ධ වාක්‍ය බව පහදා දෙමින්, හිස්තැන් පිරවීමට පංති සාමාජිකයින්ට කියන්න. අවශ්‍ය නම්, ශුද්ධ ලියවිලිවල ඔවුන් නොදන්නා වචන සොයා ගැනීමට පහත සඳහන් සටහන් පංති සාමාජිකයින්ට දෙන්න.

   අ. හිතෝපදේශය 16:18 (උඩඟුකම)
   ආ. හිතෝපදේශය 22:6 (දරුවෙකු)
   ඇ. දේශනාකාරයා 3:1 (ප්‍රස්තාවක්ද, කාලයක්ද)
   ඈ. හිතෝපදේශය 3:5 (විශ්වාසකරපන්න.)
   ඉ. හිතෝපදේශය 15:1 (මෘදු උත්තරයක්.)
   ඊ. හිතෝපදේශය 23:7 (ගණන් ගන්නා)

2. හිතෝපදේශය හෝ දේශනාකාරයාගේ පොතෙන් තමන් ප්‍රිය කරන කොටසක් බෙදාගනිමින්, එය ඔවුන්ට වැදගත් වන්නේ කුමක් නිසාද කියා පැවසීමට පැවරුම් දෙන ලද පංති සාමාජිකයින් එක්කෙනෙකුට හෝ දෙදෙනෙකුට කියන්න.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ අදාළකර ගැනීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළකිරීම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදා ගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න. සෑම ප්‍රශ්නයක්ම ඇසීමට හෝ පාඩමේ සෑම කරුණක්ම ආවරණය කිරීමට අපහසු නිසා, පංති සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් ඉතාම හොඳට සපිරෙන පරිදි, ඒවා යාච්ඤාවෙන් තෝරා ගන්න. පංති සාමාජිකයින්ගේ අවස්ථාවන්ට ගැලපෙන අන්දමට සමහර ප්‍රශ්න තෝරාගැනීමට ඔබට අවශ්‍යවෙනවා ඇත.

ධර්මිශ්ඨව ජීවත්වීම ගැන උපදෙස් දෙන කෙටි කියමන්ය හිතෝපදේශය. සාලමොන් "හිතෝපදේශ තුන්දාහක් කථාකළ බව" පරණ ගිවිසුම වාර්ථා කරයි (1 රාජාවලිය 4:32). මෙයින් සමහර ප්‍රඥාවන්ත කියමන් හිතෝපදේශ පොතෙහි අඩංගු වෙයි. සාලමොන් සහ මෙම පොතෙහි වෙනත් කතෘවරුන් අනාගතවක්තෘවරුන් නොවූවත්, ඔවුන් ලියූ බොහෝ දේවල් ස්වාමින්වහන්සේ විසින් පොළඹවනු ලැබූ සේක. සත්‍යවූ ප්‍රඥාව ස්වාමින්වහන්සේගෙන් පැමිණෙන බව ඔවුන්ගේ ලියවිලි වලින් සාමාන්‍යයෙන් පිළිබිඹු වන විශ්වාසයකි.

දේශනාකාරයාගේ පොතෙහිද ප්‍රඥාවන්ත කියමන් අඩංගුවන අතර, එහි කතෘ සාලමොන් බව සමහර ජනයා විශ්වාස කරති. දෙවියන්වහන්සේ තුලින් පමණක් ජීවිතය අර්ථවත් වන බව දේශනාකාරයාගේ පණිවුඩයයි.

මෙම පාඩම කොටස් හතකට බෙදන අතර හිතෝපදේශයේ සහ දේශනාකාරයාගේ පොත්වල වැදගත් මාතෘකා කෙරෙහි යොමුවෙයි. ඔබගේ පුද්ගලික අධ්‍යයනයේදී, පංතියේදී සාකච්ඡා කිරීමට ඔබ කැමති වෙනත් මාතෘකා ඔබට සම්බවෙනවා ඇත.

1. ප්‍රඥාව.

හිතෝපදේශය සහ දේශනාකාරයාගේ පොත් වල පහත සඳහන් කොටස් උගන්වා සාකච්ඡා කරන්න.

- හිතෝපදේශය සහ දේශනාකාරයාගේ පොත් ප්‍රඥාවේ වැදගත්කම ගැන විශේෂයෙන් අවදාරණය කරයි. උගත්කම සහ ප්‍රඥාවන්තකම යන දෙක අතරේ තිබෙන වෙනස්කම් මොනවාද? (හිතෝපදේශ 1:7; 9:9–10; 2 නීෆායි 9:28–29. බයිබල් භාෂාව අනුව, ස්වාමින්වහන්සේ කෙරෙහි බිය වීම යනු උන්වහන්සේට ගෞරවය දැක්වීම හා කීකරුවීමය, යන්න පෙන්වා දෙන්න. ප්‍රඥාව යනු ඥානයට වඩා වැඩි දෙයකි; එය වනාහී ඥානය සුදුසු ලෙස යෙදවීමයයි පහදා දෙන්න. ඉශ්‍රායෙල්වරුන්ට, ප්‍රඥාවේ අදහස යනු දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට කීකරුවීමය.)
- දෙවියන්වහන්සේ කෙරෙහි ඥානය ලබාගැනීමට, හිතෝපදේශ 2:2–6 අපට කුමක් ඉගෙනගැනීමට හැකිද? මෙම ඥානය ලබා ගැනීමට උනන්දුව අවශ්‍ය වන්නේ ඔබ සිතන හැටියට කුමක් නිසාද?
- ප්‍රඥාවේ අගය ලෞකික වස්තු වල අගයට සමාන කරන්නේ කෙසේද? (හිතෝපදේශය 3:13–18; දේශනාකාරයා 7:12 බලන්න. හිතෝපදේශයේ 3:15–18 ඈ සහ ඇගේ යොමුවන්නේ ප්‍රඥාවට බව සිහිතබාගන්න.) ප්‍රඥාව සතුට හා සමාදානය ගෙන එන්නේ කෙසේද?
- ප්‍රඥාව තියෙන්නන්ට එය "ජීවන වෘක්ෂයක්" යයි හිතෝපදේශ 3:18 කියයි. ප්‍රඥාවේ අගය ගැන මෙම සංකේතය අපට උගන්වන්නේ කුමක්ද? (1 නීෆායි 11:8–11; 21–25, ජීවන වෘක්ෂය දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ සංකේතය බව සිහිතබා ගන්න.)
- හිතෝපදේශ 9:9-1-0 සහ 15:31–33 ලැයිස්තුගතකර තිබෙන්නේ, ප්‍රඥාවන්ත ජනයාගේ කුමන ගුණාංගද? ප්‍රඥාව ලබා ගැනීමට මෙම ගුණාංග අවශ්‍යවන්නේ කුමක් නිසාද?

**2. ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න.**

හිතෝපදේශය 3:5–7 උගන්වා සාකච්ඡා කරන්න.

- හිතෝපදේශය 3:5–7 දී තිබෙන උපදේශය කුමක්ද? ස්වාමින්වහන්සේ අපගේ මාර්ග වලට මගපෙන්වන්නේ කෙසේද? ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට ඔබට ඉගැන්වූ අත්දැකීම් මොනවාද?

- දෙවියන්වහන්සේ පිළිගැනීම යන්නෙහි අදහස කුමක්ද? (හිතෝපදේශය 3:6; ඇල්මා 34:38; ඩී සහ සී 59:21 බලන්න.) උන්වහන්සේව අප පිළිගන්නා විට, අපට ආශිර්වාද ලැබෙන්නේ කෙසේද?

**3. අප කථාකරන වචන**

හිතෝපදේශයෙන් ගත් පහත සඳහන් කොටස් උගන්වා සාකච්ඡා කරන්න.

- ස්වාමින්වහන්සේ ද්වේෂකරන කාරණා හතක් හිතෝපදේශයේ 6:16-19 ලැයිස්තුගත කර තිබේ. මේවායින් තුනක්— බොරු කීම, බොරු සාක්ෂිදැරීම, භේද පැතිරවීම— අප කථාකරන වචන වලට අදාළ වේ. අප කථා කරන වචන වලට ස්වාමින්වහන්සේ එතරම් සැලකීමක් දක්වන්නේ කුමක් නිසාද? (හිතෝපදේශය 16:27–28; 18:8, 25:18 මතෙව් 12:36–37 බලන්න.) බොරු කීම, ඕපාදූප කීම, හෝ අන්‍යයන් ගැන අශුභවාදීව කථාකිරීමෙන් ජයගැනීමට අපට හැකි වන්නේ කෙසේද?

- "ප්‍රිය වචන මී වදයක් මෙන්, ආත්මයට මිහිරිය" යයි හිතෝපදේශ 16:24 කියයි. මෙය සත්‍යයක් වන්නේ කෙසේද? කරුණාවන්ත වචන කථා කිරීමේ ප්‍රතිඵල මොනවාද? (හිතෝපදේශය 12:25; 15:1; 16:24 බලන්න.) අන්‍යයන්ගේ කරුණාවන්ත වචන ඔබට උපකාරවූයේ කෙසේද?

- කළහකාරී තත්වයක් උද්ගතවූ විට මෘදු වචන කථාකිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මොනවාද? (හිතෝපදේශ 15:1 බලන්න.)

  වැඩිහිටි ගෝර්ඩන්. බී. හින්ක්ලි මෙසේ කීවේය: "අපි සෙමින් කථාකරන විට ප්‍රශ්න ඇතිවන්නේ කලාතුරකිනි. උස් හඬින් කථා කළ විට ගිනි ඇවිළී කුඩා ගිනි පුපුරු අවුල් වියවුල් සහිත මහා කන්දක් වෙයි" (in Conference Report, අප්‍රේ.. 1971, 82; හෝ *Ensign,* ජූනි 1971, 72).

කරුණාවන්ත ලෙස කථා කිරීමේ වැදගත්කම වැඩි කිරීම පිණිස "කරුණාවන්ත වචන අපි නිතර කථාකරමු"

**4. උඩඟුකම.**

හිතෝපදේශය 8:13; 13:10; 16:18–19.

- ස්වාමින්වහන්සේ උඩඟුකම කෙරෙහි ද්වේෂකරන බව හිතෝපදේශයේ 8:13 කියයි. උඩඟුකම එතරම් දරුණු පාපයක් වන්නේ කෙසේද?

  සභාපති එස්රා ටැෆ්. බෙන්සන් මෙසේ කීවේය.

  "උඩඟුකමේ මුල වෛරයයි— දෙවියන්වහන්සේ වෙත වෛරය හා අපගේ අසල්වැසියන් වෙත වෛරයයි. වෛරය යනු, ඊර්ෂ්‍යාව, සතුරුකම, හෝ විරුද්ධත්වඥාවටියන්ය. එය අප කෙරෙහි පාලනය කිරීමට සාතන් කැමති බලයයි.

  "උඩඟුකම ස්වභාවයෙන්ම තරඟකාරී වේ. දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධ අප කැමැත්ත තැබීම, දෙවියන්වහන්සේ වෙතට අපේ උඩඟුකම යොමු කරන විට 'ඔබගේ කැමැත්ත නොව මගේ කැමැත්ත' කිරීමේ ආත්මය වේ. පාවුල් කී පරිදි, 'මක්නිසාද සියල්ලෝ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කාරණා නොව, තම තමුන්ගේ කාරණා සොයන්නෝය.'(පිලිප්පි 2:21.)

  "දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධව අපේ කැමැත්තට ඉඩදෙනවා නම් තන්හාව, ඉන්ද්‍රියන් පිනවීම හා රාගය පාලනයකින් තොරව සිදු වෙයි. (ඇල්මා 38:12; 3 නීෆායි 12:30 බලන්න).

  "දෙවියන්වහන්සේගේ අධිකාරීබලයෙන්, ඔවුන්ගේ ජීවිත වලට දෙන මගපෙන්වීම් උඩඟු වූ අයට පිළිගන්න බැරිය" (හේලමන් 12:6 බලන්න). දෙවියන්වහන්සේගේ අති මහත් ඥානයට විරුද්ධව ඔවුන්ගේ සත්‍යයේ අදහස්ද, දෙවියන්වහන්සේගේ පූජකවරයේ බලයට විරුද්ධව ඔවුන්ගේ හැකියාවන්ද, උන්වහන්සේගේ ප්‍රබල ක්‍රියාවලට විරුද්ධව ඔවුන්ගේ ක්‍රියා ඉටුකිරීමට වෙහෙසෙයි.

"දෙවියන්වහන්සේට විරුද්ධ අපගේ වෛරය නොයෙක් ආකාරයෙන් විය හැකිය, කැරළි ගැසීම, සිතෙහි තදගතිය, මුරණ්ඩුකම, පසුතැවිලි නොවීම, උඩගුවීම, පහසුවෙන් අමනාපවීම සහ සලකුණු සෙවීම යනාදිය වේ. දෙවියන්වහන්සේ ඔවුන් සමග එකඟ වීම උඩගු අයගේ ප්‍රාර්ථනාව දෙවියන්වහන්සේ සමග එකඟවීමට, ඔවුන්ගේ අදහස් වෙනස්කිරීමට ඔවුන් උනන්දු වෙන්නේ නැත….

"උඩගුකමේ සත්‍ය අර්ථය නම් විනාශකාරී පාපයයි. එය අභිවෘධිය සීමාකරනවා නැත්නම් නවත්වනවා (ඇල්මා 12:10–11 බලන්න). උඩගු අයට ඉගැන්වීම පහසු නැහැ (1 නීෆායි 15:3, 7-11 බලන්න). සත්‍ය පිළිගැනීමට ඔවුන් ඔවුන්ගේ සිත් වෙනස්කරන්නේ නැහැ. එහෙම කළොත් ඔවුන් සිතන්නේ ඔවුන් වැරදි කාරයන් කියාය." (in Conference Report, 1989, 3–5; හෝ *Ensign,* මැයි 1989, 4, 6).

- උඩගුකම තරඟයට හා විනාශයට මගපෙන්වන බව හිතෝපදේශය 13:10 සහ 16:18 උගන්වයි. උඩගුකම මෙය කරන්නේ කෙසේද? උඩගුකම අපගේ පවුල්වලට බලපාන්නේ කෙසේද?

  සභාපති එස්රා ටැෆ්. බෙන්සන් මෙසේ කීවේය:

  "උඩගුකමේ තවත් අංගයක් නම් කලහකිරීමය. තර්ක කිරීම, සටන් කිරීම, අධර්මිෂ්ඨ ආධිපත්‍යය, පරම්පරා පරතරය, දික්කසාදය, පුරුෂයාට හෝ භාර්‍යයාවට නින්දා කිරීම, කැරළි ගැසීම සහ බාධාකිරීම් සියල්ල උඩගුකමේ මෙම වර්ගයට අඩංගු වේ.

  "අපගේ පවුල්වල වියවුල් මගින් ස්වාමීන්වහන්සේගේ ආත්මය පලවා හරිනු ලබයි. අපගේ පවුලේ බොහෝ සාමාජිකයින්ද එමගින් පලවා හරිනු ලබයි….

  "දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ සේවකයන් සමගද, සැමියා සහ බිරිය අතරද, දෙමව්පියන් සහ ළමයි අතරද, අපගේ සියළු සම්බන්ධකම් කෙරෙහි උඩගුකම විරුද්ධ ලෙස බලපායි".... (in Conference Report, තුළිනි. අප්‍රේ. 1989, 5 හෝ *Ensign,* මැය 1989, 6).

- උඩගුකම ජයගැනීමට අපට හැකිවන්නේ කෙසේද? (හිතෝපදේශය 16:19 බලන්න.) අපගේ පවුල් සාමාජිකයන් හා දෙවියන්වහන්සේ සමග අපගේ සම්බන්ධතාවය තුල වඩාත් නිහතමානී වීමට අපට කුමක් කළ හැකිද?

### 5. මිත්‍රත්වය

හිතෝපදේශය සහ දේශනාකාරයාගේ පොතෙන් පහත සඳහන් කොටස් උගන්වා සාකච්ඡා කරන්න.

- අධර්මිෂ්ඨ මිතුරන් ගැන අපට අනතුරු ඇඟවීම් කර තිබෙන්නේ කුමක් නිසාද? (හිතෝපදේශය 13:20; 22:24–25 බලන්න.)
- යහපත් මිතුරන්ගේ සමහර ගුණාංග මොනවාද? (හිතෝපදේශය 17:17; 27:9 බලන්න.) අපහසු අවස්ථා වලදී යහපත් මිතුරන් ඔබට උපකාර කළේ කෙසේද?
- යහපත් මිතුරන් ලබා ගැනීමට අපට කුමක් කළ හැකිද? (හිතෝපදේශය 18:24 බලන්න. යහපත් මිතුරන් ලබා ගැනීම සඳහා අපද යහපත් මිතුරන් වීම අවශ්‍ය බව පෙන්වා දෙන්න.
- අපගේ අඥාන තෝරාගැනීම්වලදී සත්‍යවූ මිතුරන් ප්‍රතික්‍රියාකරන්නේ කෙසේද? (දේශනාකාරයා 4:9–10 බලන්න.)

  වැඩිහිටි මාවින් ජේ. ඇශ්ටන් මෙසේ කීවේය:

  "යමෙකු මෙසේ කියා තිබේ, 'මා සිටින ආකාරයෙන්ම මා පිළිගැනීමට කැමති පුද්ගලයා මිත්‍රයෙකි. වචනයේ එක් තේරුමක් මෙන් මෙය පිළිගෙන, ඒ එක්කම මම යෝජනා කරන්නේ පුද්ගලයෙකු අපට හමුවූ ආකාරයෙන්ම තැබුවහොත්, සත්‍යවූ මිතුරෙකුට වඩා අපි පහත් බවය.

  'මගේ මිතුරෙකුවීම ගැන ඔබට ස්තුතියි' "යන කියමනෙන් ලැබෙන ප්‍රතිඵලයට වඩා උතුම් දෙයක් අප කිසිවෙකුට ලැබිය නොහැක. උපකාර අවශ්‍ය අය අප වෙතට ආපසු පැමිණ අප සමග සිටින විට, එය මිත්‍රත්වය ක්‍රියාවෙහි යෙදවීමයි. අපගේ ජීවිත මගින්, දුර්වල අය ශක්තිමත් කිරීමත් ශක්තිමත් අය වඩාත් ශක්තිමත් කිරීමත්, සත්‍යවූ මිත්‍රත්වය වේ. මිනිසෙකු ඔහුගේ මිත්‍රයන් මගින් විනිශ්චය කිරීමට හැකි නම්, ඔවුන්ගේ ආත්මිකභාවය තුලින් ඔහුවද මැනිය හැකිය….

"ඔව්, මා සිටින ආකාරයෙන්ම මා පිළිගැනීමට කැමති නමුත් මා ඔහු මුණගැසෙන අවස්ථාවේ සිටියාට වඩා යහපත කෙනෙකු කිරීමට කැමතිවන අතර හැකියාවක් ඇති පුද්ගලයා මිත්‍රයෙකි." (in Conference Report, ඔක්තෝ. 1972, 32, 35; හෝ *Ensign,* ජන. 1973, 41, 43).

- පවුලේ සාමාජිකයන් අතර මිත්‍රත්වය ශක්තිමත් කිරීමට අපට හැකි වන්නේ කෙසේද?
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බොහෝ විට ඔහුගේ අනුගාමිකයන්ට තම මිත්‍රයන් යයි කී සේක (ඩී සහ සී 88:62; 93:45). උන්වහන්සේ අපගේ මිත්‍රයා බව උන්වහන්සේ පෙන්වූයේ කෙසේද? (යොහාන් 1513 බලන්න.) අප උන්වහන්සේගේ මිත්‍රයන් බව, අප පෙන්වන්නේ කෙසේද? (යොහාන් 15:14 බලන්න.) උන්වහන්සේගේ මිත්‍රත්වය ඔබට හැඟුනේ කෙසේද?

### 6. දරුවන් ඇතිදැඩිකිරීම

හිතෝපදේශයේ පහත සඳහන් කොටස් උගන්වා සාකච්ඡා කරන්න.

- "දරුවකු සුදුසු මාර්ගයෙහි යන්න පුහුණු කරපන්න"යයි හිතෝපදේශ 22:6 කියයි. මෙම උපදේශය අනුගමණය කිරීමට දෙමව්පියන් කුමක් කළ යුතුද? (ඩී සහ සී 68:25–28 බලන්න.) ශුභාරංචියේ ප්‍රතිපත්ති සහ ඔවුන්ගේ සාක්ෂි වර්ධනය වීම පිණිස වඩාත් සාර්ථකව දරුවන්ට ඉගැන්වීමට අපට හැකිවන්නේ කෙසේද?

  වැඩිහිටි රිචඩ්. ජී. ස්කොට් මෙසේ කීවේයඃ "පුද්ගලික සතුට සහ තමාගේ ආශාවන් අතහැරීමට අපි කැමතිවිය යුතුය. පවුල කේන්ද්‍රකරගත් ක්‍රියාකාරකම් සහ ළමයාගේ ජීවිතයේ සියළුම දියුණුකරගැනීම්, ළමයාව දිරිගැන්වීමේ මූලික කාර්‍යභාර්ය, සභාව පාසැලට හෝ සමාජයට භාරනොකළ යුතුය. 'දරුවෙකු සුදුසු මාර්ගයෙහි යෑමට පුහුණු කරපන්න' ඉටුකිරීමට, කාලය, මහා උත්සාහයක්, සහ වැදගත් පුද්ගලික පරිත්‍යාගයක් උවමනා වෙනවා. වැඩක් මනාව නිමකිරීමට වඩා මහත් ප්‍රතිඵලයක්, සොයාගන්නේ කොහෙන්ද?" (in Conference Report, අප්‍රේ. 1993, 43; හෝ *Ensign,* මැයි 1993, 34).

- නීති, සීමාවන් සහ ප්‍රේමයේ ආත්මයෙන් හික්මවීම ළමයින්ට අවශ්‍ය වන්නේ කුමක් හෙයින්ද? (හිතෝපදේශය 19:18; 29:17 බලන්න.) දෙමව්පියන්ගේ ධර්මිෂ්ඨ උපදෙස් කෙරෙහි, දරුවන් ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද? (හිතෝපදේශය 6:20–23 බලන්න.) දෙමව්පියන් ඒවා නිවැරදි කළ යුත්තේ කෙසේද? (ඩී සහ සී 121:41–44 බලන්න.)

### 7. ප්‍රීතිමත් යහපත් ස්වභාවය.

හිතෝපදේශය 15:13 සහ 17:22 උගන්වා සාකච්ඡා කරන්න.

- ප්‍රීතිමත් හා ප්‍රියජනක ස්වභාවයක් වර්ධනය කිරීම වැදගත්වන්නේ කුමක් නිසාද? (හිතෝපදේශය 15:13; 17:22 බලන්න.)

  සභාපති හියු බී. බ්‍රවුන් මෙසේ කීවේයඃ "ඔබ සිනහ වෙනවාට මම කැමැත්තෙමි. කුමක් පැමිණියත් සියල්ලට පසු, සිනහ උපදවන ස්වභාවයක් අප තුල තිබිය යුතුයි. ලෝකයේ සිටින සියළුම ජනතාව සිතන පරිදි, අපි ඉතාමත් සතුටින් සිටින අය විය යුතුය. ලෝකයේ තිබෙන ඉතාම ශ්‍රේෂ්ඨ සහ ඉතාමත් ප්‍රීතිවිය යුතු පණිවුඩය අපට තිබේ. අනිත් පැත්තට අප ගිය විට සිනහවෙන් යුතුව යමෙකු අපට මුණගැසෙන බව මම සිතමි. (අප වැරදි ස්ථානයකට ගොස් යමෙකු අපට සමච්චල් කරන තෙක්) එබැවින් අපි ප්‍රීතියෙන් සිටිමු. නමුත් අපගේ ප්‍රීතිය අවංක වීමට සලස්වන්න—එය ඇතුලාන්තයෙන්ම ඒමට සලස්වන්න" (*The Abundant Life* [1965], 83).

- ඔසවාතැබීමේ සිනහමුසු ස්වභාවයක් අපගේ පවුල් වල ඇතිවීමට දිරිගැන්වීම පිණිස අපට කුමක් කළ හැකිද? (ඔවුන්ගේ පවුල්වල ප්‍රශ්න විසඳාගෙන එකිනෙකා කෙරෙහි ප්‍රේමය වර්ධනය වීමට සිනහමුසු අවස්ථාවන් උපකාර වූ අන්දම ගැන පංති සාමාජිකයින් ලවා කියවීම ඔබට වුවමනා වෙනවා ඇත.)

අවසානය.

ඔබ සාකච්ඡා කළ මාතෘකා ගැන ඔබගේ හැඟීම් බෙදාගන්න. හිතෝපදේශයේ සහ දේශනාකාරයාගේ පොත් වල සඳහන් උපදෙස් සිහිතබා ගැනීමට සහ අනුගමණය කිරීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න. මෙම පොත් දෙකෙන් එකක ඔවුන් ප්‍රියකරන කොටසක් කටපාඩම් කිරීමටද දිරිගැන්වීමට ඔබට උවමනා වෙනවා ඇත.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. හිතෝපදේශයෙන් ක්‍රියාකාරකම**

හිතෝපදේශයේ සඳහන් දේවල් ස්වල්පයක් වෙන වෙනම කොලකෑලි වල ලියා ඒවා භාජනයකට දමන්න. වාර අනුව භාජනයෙන් කොලකෑලි තෝරා, කොලකෑල්ලේ ලියා තිබෙන ශුද්ධ වූ ලියවිලි කොටස කියවා, අපගේ ජීවිත වලට එම කොටස බලපාන අන්දම ගැන විස්තර කිරීමට පංති සාමාජිකයින්ට සලස්වන්න.

**2. ශුද්ධවූ ලියවිලි අදාළකිරීම**

ශරීරයේ රූපයක් රටහුණු ලෑල්ලේ අඳින්න. පහත සඳහන් පද සොයාගෙන, ශරීරයේ එයට ගැලපෙන එක එක කොටස ලඟින් සටහන් ලිවීමට පංති සාමාජිකයින්ට සලස්වන්න. එක්ව පද කියවා අපගේ ජීවිත වලට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න.

අ. හිතෝපදේශය 2:2 (කන සහ සිත)
ආ. හිතෝපදේශය 3:5 (මුළු සිතින්)
ඇ. හිතෝපදේශය 3:7 (ඇස්)
ඈ. හිතෝපදේශය 3:27 (අත)
ඉ. හිතෝපදේශය 4:26–27 (පාද)
ඊ. හිතොපදේශය 8:7 (කට)
උ. හිතෝපදේශය 10:4 (හස්තය)
ඌ. හිතෝපදේශය 12:15 (දෑස්)

**3. "ගුණවත් ස්ත්‍රියක්" (හිතෝපදේශය 31:10)**

හිතෝපදේශය 31:10–31, නැවත බලා ගුණවත් ස්ත්‍රියකගේ ගුණාංග ලැයිස්තුගත කිරීමට පංති සාමාජිකයින්ට සලස්වන්න. ස්ත්‍රී, පුරුෂ අප සියළු දෙනාම මෙම ගුණාංග වැඩිදියුණු කරගැනීමට උත්සාහ දැරිය යුතු බව පෙන්වා දෙන්න. පංති සාමාජිකයින්ගේ පිළිතුරු රටහුණු ලෑල්ලේ ලිවීමට ඔබට වුවමනා වෙනවා ඇත. පිළිතුරු පහත සඳහන් ඒවා විය හැකිය.

| *පදය* | *ගුණාංගය* |
|---|---|
| 11 | විශ්වාස තැබීමට හැකිය. |
| 13 | කැමැත්තෙන් වැඩකටයුතු කරයි. |
| 20 | අනුකම්පාවෙන් යුක්තය. |
| 25 | ශක්තිමත්ය, ගෞරවණීයය. |
| 26 | ප්‍රඥාවන්තව සහ කරුණාවෙන් කථාකරයි. |
| 28 | කැපවූ බිරිඳක් සහ මවකි. |
| 30 | ස්වාමින්වහන්සේට කීකරුය. |

මෙවැනි ගුණාංග ඇති ඔවුන් දන්නා ආදර්ශමත් පුද්ගලයන් ගැන කථාකිරීමට පංති සාමාජිකයන් ස්වල්ප දෙනෙකුට ආරාධනා කරන්න.

# 32
වෙනි පාඩම

# "මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බව මම දනිමි."

*යෝබ් 1–2; 13; 19; 27; 42*

**අරමුණ**

ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන් විරුද්ධත්වයට මුහුණදීමටද, උන්වහන්සේ කෙරෙහි ඔවුන්ගේ සාක්ෂි ගොඩනගා ගැනීමටද, පෞද්ගලික අවංකභාවය පවත්වාගෙනයෑම පිණිස පංති සාමාජිකයින්ගේ ශක්තිය වැඩිදියුණු කරගැනීම පිණිස ඔවුන්ට උපකාර කිරීමටය.

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.

   අ. යෝබ් 1–2, සාධාරණ භක්තිමත් පුද්ගලයෙකු වූ යෝබ් දරුණු පරීක්ෂාවන් අත්දකියි. ඔහුගේ වස්තුව, දරුවන් සහ සෞඛ්‍යය අහිමි වූවත්, ස්වාමින්වහන්සේ කෙරෙහි ඇදහිලිවන්තව ඔහු සිටී.

   ආ. යෝබ් 13:13–16; 19:23–27 ස්වාමින්වහන්සේ කෙරෙහි හා, ගැලවුම්කරුවාණන් ගැන ඔහුගේ සාක්ෂිය තුලින් යෝබ් ශක්තිය ලබයි.

   ඇ. යෝබ් 27:2–6. ඔහුගේ පුද්ගලික ධර්මිෂ්ඨ භාවය හා අවංකකම තුලින් යෝබ් ශක්තිය ලබයි.

   ඈ. යෝබ් 42:10–17. යෝබ් ඇදහිල්ලෙන් පරීක්ෂාවන් විඳදරාගත් පසු, ස්වාමින්වහන්සේ ඔහුට ආශිර්වාද කරනසේක.

2. අමතර කියවීම්: යෝබ් පොතේ අනිකුත් පරිච්ඡේද; දහම සහ ගිවිසුම 121:1–10.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකම් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

පහත සඳහන් වෙනස්වූ වස්තූන් අතර ඇති සමානත්වය පංති සාමාජිකයින් සමග බෙදා ගන්න. (නැතහොත් එය බෙදාගැනීම පිණිස සූදානම් වීමට පංති සාමාජිකයෙකුට කියන්න):

"අසාමාන්‍ය වශයෙන් තද සාගතයට ඔරොත්තු දෙන ඉරිඟු සහ බෝංචි වර්ගයක් වවන උතුරු මැක්සිකෝවේ උෂ්ණ කාන්තාරයක ගොවියන් ගැන වැඩිහිටි ජෝසෆ් බී. වර්ත්ලින් වරක් කීවේය. වෙනත් පැලැටි වියලී මැරෙන තද දේශගුණයක මෙම වර්ගය ඉතා හොඳට වැවෙන්නේය. මෙයින් එක වර්ගයක් නම් කෑමට සුදුසු සුදු බෝංචි වෙයි. ඉතාම අඩු වැසි ඇති තැන්වල මෙම පැලැටිය දළුලමින් වැඩෙයි. එයට අවශ්‍ය තෙතමනය සොයාගැනීමට ගල් සහ වැලි සහිත පොළොවේ අඩි හයක් (සෙන්ටිමීටර් 180) පමණ ගැඹුරට එහි මුල් යවයි. අංශක 115 හෝ, සෙන්ටිග්‍රේඩ් අංශක 46 පමණ උෂ්ණත්වය ඇති වාර්ෂික වැසි එක් වතාවක් පමණක් ලැබෙන කාන්තාර දේශගුණයක එය එළදරයි. ඉතා සුළු වශයෙන් ජලය සැපයෙන, ජූලි මැද ඌෂ්ණය පවා තිබියදීත්, එහි අතු කොළ ආදිය විශිෂ්ඨ වූ කොළ පාටින් පවතියි.

- විරුද්ධත්වය විඳදරාගැනීමට පිහිට වන පිණිස මෙම වස්තූන් අතර ඇති සමානත්වයෙන් අපට ඉගෙනගැනීමට හැකිවන්නේ කුමක්ද?

වැඩිහිටි වර්ත්ලින් මෙසේ යෝජනා කළේය: "සමහර විට මෙම හයිය, ප්‍රබල පැලැටියේ ආදර්ශය මගින් සභාවේ සාමාජිකයින්ට ජලය ලබා ගත හැකිය. ශුභාරංචියේ ගැඹුරු පස තුලට අපගේ මුල යැවිය යුතුය. අපට මුහුණ දීමට තිබෙන නපුරු පරීක්ෂාවන් හෝ විවේචන නොතකා අප වැඩෙමින්, සරුවෙමින්, මල් එළදරමින්, බහුලව යහපත් එළදැරිය යුතුය. විරුද්ධත්වයේ ඌෂ්ණය මැද ශක්තිමත් වීමට අප ඉගෙනගත යුතුවේ. (in Conference Report, අප්‍රේ. 1989, 7; හෝ *Ensign*, මැයි 1989, 7).

මෙ පාඩම යෝබ් ගැන බව ගැන පහදාදෙන්න, දරුණු විරුද්ධත්වය දරාගැනීමට, ඇදහිල්ල සහ ධර්මිෂ්ඨකම උපයෝගී කරගත් මිනිසෙකි ඔහු.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා සහ අදාළ කිරීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට දිනපතා ජීවිතයට ඒවා අදාළ කර ගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදා ගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. ඉතා දුක්මුසු අන්දමට යෝබ්ව පරීක්ෂාකරන ලදී.**

යෝබ් 1–2 උගන්වා සාකච්ඡා කරන්න.

- යෝබ් මොන විදියේ මිනිසෙක්ද? පහත සඳහන් සමහර ගුණාංග රටහුණු ලෑල්ලේ ලැයිස්තුගත කිරීමට ඔබට උවමනා වෙනවා ඇත. එයට සම්බන්ධ සඳහන් කිරීම් බොහෝමයක් කියවීමේ පැවරුමෙහි නොමැති බැවින්, ඒවා කියවා බලා කුමණ ගුණාංගයක් විස්තර කරනු ලබන්නේද කියා කීමට, පුද්ගලිකවශවට් පංති සාමාජිකයින්ට කීමට ඔබට උවමනා වෙනවා ඇත.

  අ. ඔහු නිර්දෝෂ, අවංක වූ, දෙවියන්වහන්සේ කෙරෙහි හය ඇත්තා වූ, නපුරෙන්වැලකී සිටියා වූ මිනිසෙකි. (යෝබ් 1:1.)
  ආ. ඔහුට සම්පත් බොහෝ වූ නමුත්, ඔහු ඒවායේ ගැලී සිටියේ නැත (යෝබ් 1:3, 21).
  ඇ. ඔහු නිර්දෝෂීවූ, අවංක පුද්ගලයෙකි. (යෝබ් 2:3).
  ඈ. ඔහු දුබල අය බලවත් කළේය (යෝබ් 4:3–4).
  ඉ. ඔහු ස්වාමින්වහන්සේගේ අඩි පාරෙහි ගමන් කරමින්, ස්වාමින්වහන්සේගේ වචනය අගය කළේය (යෝබ් 23:10–12).
  ඊ. වැන්දඹුවට, දිළින්දාට, කොරාට, අන්ධයාට ඔහු අනුකම්පා කළේය (යෝබ් 29:12–16).
  උ. ඔහු ඔහුගේ සතුරන් ගැන සැලකිලිමත් වී ඔවුන්ට කමාව දුන්නේය (යෝබ් 31:29–30).

- යෝබ් අත්දුටු පරීක්ෂාවන් මොනවාද? මෙම පරීක්ෂාවන් සමහරක් රටහුණු ලෑල්ලේ ලිවීමට ඔබට වුවමනා වෙනවා ඇත. එයට සම්බන්ධ සඳහන් කිරීම් බොහෝමයක් කියවීමේ පැවරුමෙහි නොමැති බැවින්, ඒවා කියවා බලා කුමණ පරීක්ෂාවක් විස්තර කරනු ලබන්නේද කියා කීමට, පුද්ගලික පංති සාමාජිකයින්ට කීමට ඔබට උවමනා වෙනවා ඇත.

  අ. මෙහෙකරුවන්, වස්තුව සහ ආදායම නැතිවීම (යෝබ් 1:13–17).
  ආ. දරුවන් නැතිවීම (යෝබ් 1:18–19).
  ඇ. ශාරීරික ආබාධ සහ වේදනාව (යෝබ් 2:7; 7:5; 16:16).
  ඈ. ස්වප්න වලින් හයගැන්වීමෙන් නින්ද නොයෑම (යෝබ් 7:4, 13–14).
  ඉ. දරුණු චෝදනා සහ මිතුරන් සහ පවුලේ අයගෙන් උපකාර අහිමිවීම (යෝබ් 2:9; 4:1, 7–8; 11:1–6; 19:13–22).
  ඊ. මෙම පරීක්ෂාවන් තුලින් යෑමට ඔහුට සිදුවූයේ කුමක් නිසාද කියා වියවුල් වීම (යෝබ් 10:15).
  උ. ඔහුගේ වැටීම නිසා ප්‍රීති වූ අයගේ සමච්චලය (යෝබ් 16:10–11; 30:1, 8–10).
  ඌ. දෙවියන්වහන්සේ ඔහුව අමතක කරමින් හෝ ඔහුට සවන් නොදෙන්නේය යන හැඟීම (යොබ් 19:6–8; 23:3–4; ඔහු යන වචනය දෙවියන්වහන්සේට යොමුවන බව සිහිතබා ගන්න).

- අපගේ කාලයේ ජනතාව අත්දකින පරීක්ෂාවන් යෝබ්ගේ පරීක්ෂාවන් සමග සමාන වන්නේ කෙසේද? (පරීක්ෂාවන් එකසමානයː වස්තුව නැතිවීම, ළමයි නැතිවීම, හොඳ සෞඛ්‍යය තත්වය නැතිවීම, සහ මිතුරන්ගේ හා පවුලේ අයගේ මිත්‍රත්වය අහිමිවීම.)

- යෝබ්ගේ ධර්මිෂ්ඨකමේ කාරණාව සාතන් කියා සිටියේ කුමක් නිසාද? (යෝබ් 1:9–10 බලන්න.) ඔහුගේ වස්තුව සහ වෙනත් ආශිර්වාද පැහැරගත් විට යෝබ් ප්‍රතික්‍රියා කරන අන්දම ගැන සාතන් කලින් කීවේ කෙසේද? (යෝබ් 1:11; 2:4–5 බලන්න.) මෙය සිදුවූ විට යෝබ් ප්‍රතික්‍රියා කළේ කෙසේද? (යෝබ් 1:20–22; 2:10.)මෙම ප්‍රතික්‍රියාවන් මගින් අපට ඉගෙනගත හැකිදේ මොනවාද?

- මෙම පීඩා සියල්ලෙහිදී, යෝබ් "පව් කළේවත්, අඥානවන්තව දෙවියන්වහන්සේට දොස්තැබුවේවත් නැත" (යෝබ් 1:22). දුක, අවාසනාව හෝ විපත්ති පැමිණි විට, අඥානවන්තකමින් සමහර ජනයා

දෙවියන්වහන්සේට දොස් පවරන්නේ කෙසේද? (උන්වහන්සේ ඔවුන්ව තේරුම්ගන්නේවත් ඔවුන්ට ප්‍රේම කරන්නේවත් නැතැයි සිතමින්, උන්වහන්සේගේ ප්‍රඥාව හෝ දේවාරක්ෂාව ගැන ප්‍රශ්න කරමින් ඔවුහු උන්වහන්සේට දොස් පවරති. ඇතමුන් උන්වහන්සේ ජීවත්වන්නේද යන්න ගැන පවා ප්‍රශ්න කරති.)

### 2. යෝබ් දෙවියන්වහන්සේ තුල ශක්තිමත් වෙයි.

යෝබ් 13:13–16; 19:23–27 උගන්වා සාකච්ඡා කරන්න.

- ස්වාමීන්වහන්සේ කෙරෙහි යෝබ්ගේ විශ්වාසය, ඔහුගේ ආත්මික ශක්තියට අතිමහත් පිහිටක් විය (යෝබ් 13:13-16). ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසය යනු කුමක්ද? පරීක්ෂාවන් වලදී අපව දරාගැනීම පිණිස, ස්වාමින්වහන්සේ කෙරෙහි අපගේ විශ්වාසය වර්ධනය කිරීමට අපට හැකිවන්නේ කෙසේද? (රෝම 8:28; 2 නීෆායි 2:2, 11,24; ඩී සහ සී 58:2–4; 122:5–9 බලන්න.) ස්වාමින්වහන්සේ අපට ප්‍රෙමකරන බැවින්, අප ඇදහිලිවන්තව සිටින විට, සියල්ල අපගේ යහපත පිණිසත්, අපගේ වර්ධනය පිණිසත් ඉටුකරන බවට උන්වහන්සේ සහතික කළ බවට සාක්ෂි දරන්න.
- ඔහු මත වැටුණු පරීක්ෂාවන් යෝබ් පරිච්ඡේද 19 විස්තර කරමින්, පසුව ගැලවුම්කරුවාණන් ගැන සාක්ෂිදරයි. ගැලවුම් කරුවාණන් ගැන යෝබ්ගේ සාක්ෂිය, ඔහුගේ පරීක්ෂාවන් දරාගැනීම පිණිස ඔහුට උපකාර වූයේ කෙසේද? (යෝබ් 19:25–27 බලන්න.) ගැලවුම්කරුවාණන් ගැන සාක්ෂිය අපගේ විරුද්ධත්වයේදී අපට ශක්තිය ලබා දෙන්නේ කෙධේද?

"මගේ මිදුම්කරුවාණන් ජීවත්ව සිටින බව මම දනිමි" (ගීතිකා අංක 136) පංති සාමාජිකයින් ලවා ගායනය කිරීමට හෝ, තැටියක් වාදනය කිරීමට හෝ ඔබට වුවමනා වෙනවා ඇත.

### 3. යෝබ්ගේ පුද්ගලික ධර්මිෂ්ඨකම හා අවංකකම තුලින් ඔහු ශක්තිය ලබයි.

යෝබ් 27:2–6 උගන්වා සාකච්ඡා කරන්න.

- පීඩාවලදී යෝබ්ගේ අවංකකම තවත් ආත්මික ශක්තියක් විය (යෝබ් 27:2–6). අවංකකම යනු කුමක්ද? යෝබ්ගේ පරීක්ෂාවන් වලදී ඔහුගේ පුද්ගලික අවංකකම ඔහුව ශක්තමත් කළේ කෙසේද? පරීක්ෂාවන් ඇති කාල වලදී අපගේ පුද්ගලික අවංකකම අපට පිහිටවන්නේ කෙසේද? (අපගේ අවංකකම පවත්වාගෙන යැමේදී, අපගේ ජීවිත වල ගමන්මග ස්වාමින්වහන්සේට ප්‍රසන්න වන බව දැනගැනීමෙන් අපට ශක්තිය ලබාගැනීමට හැකිය.)

  වැඩිහිටි ජෝසප් බී. වර්ත්ලින් අවංකකම පහදා දෙන්නේ මෙසේය "ක්ෂණික ප්‍රතිඵල නොතකා, නිතරම හරි දෙය සහ යහපත් දේ කිරීමයි. අපගේ ආත්මයේ පතුලෙන්ම ධර්මිෂ්ඨ වීමය, අපගේ ක්‍රියාවලින් පමණක් නොව, වඩාත් වැදගත් අපගේ සිතුවිලි වලින් සහ අපගේ හදවත තුලින්ය. පුද්ගලික අවංකකම එතරම්ම විශ්වාසවන්තකමක් සහ නොපිරිහුණු තත්වයක් තිබෙන අතර විශ්වාසයට හෝ ගිවිසුමට බොරු කිරීමට අපට නොහැකිය." (Conference Report තුල, අප්‍රේ.. 1990, 38; හෝ *Ensign,* මැයි 1990, 30).

### 4. යෝබ් ඔහුගේ පරීක්ෂාවන් ඇදහිල්ලෙන් විදදරාගත් පසු ස්වාමින්වහන්සේ ඔහුට ආශිර්වාද කළ සේක.

යෝබ් 42:10–17 උගන්වා සාකච්ඡා කරන්න.

- යෝබ් ඇදහිලිවන්තව පරීක්ෂාවන් විඳදරාගත් පසු, ස්වාමින්වහන්සේ ඔහුට ආශිර්වාද කළේ කෙසේද? (යෝබ් 42:10–15; යාකොබ් 5:11 බලන්න.) ඇදහිලිවන්තව අප පරීක්ෂාවන් විඳදරාගත් විට, ස්වාමින්වහන්සේ අපට ආශිර්වාද කරන්නේ කෙසේද? (යෝබ් 23:10; 3 නීෆායි 15:9 බලන්න. පුද්ගලික අතදැකීම් බෙදා ගැනීමට පංති සාමාජිකයින්ව දිරිමත් කරන්න. "පෙර තිබුනු සියල්ලට වඩා දෙගුණයක් වැඩි කොට" ස්වාමින්වහන්සේ යෝබ්ට ආශිර්වාද කළත්, අප ඇදහිලිවන්තව දරාගන්නා විට, ස්වාමින්වහන්සේ අපට දෙන ආත්මිත ආශිර්වාද, ලෞකික ආශිර්වාද වලට වඩා බොහෝ වැඩි බව පහදා දීමට ඔබට උවමනා වෙනවා ඇත.)

වැඩිහිටි ඕර්සන්. එෆ්. විට්නි මෙසේ පැවසුවේය: "අප විඳින දුක්, හෝ අප අත්දකින පරීක්ෂාවන් කිසිවක් අපතේ යන්නේ නැහැ. එය අපේ අධ්‍යාපනය මෙහෙයවයි, ඉවසීම, ඇදහීම, ආරක්ෂාවීම, යටහත්වීම වැනි ගුණාංග වැඩි දියුණු කරගැනීමට ඉවහල් වෙයි. අපගේ සියළුම දුකද, සියළුම විඳදරාගැනීම්ද, ඉවසිලිවන්තව දරාගන්නා විට, අපගේ පැවැත්ම ගොඩනගමින්, සිත් පවිත්‍ර කරමින් අපගේ ආත්ම විකසිත වෙමින් අප වඩාත් මෘදු හා ප්‍රේමවන්ත වෙමින් දෙවියන්වහන්සේගේ දරුවන් යැයි කීමට අප වඩාත් සුදුස්සන් වෙයි...දුකෙන්ද දුක්විඳීමෙන්ද, වැඩ හා පීඩා වලින්ද, මෙහි පැමිණ ලබා ගැනීමට උවමනා අධ්‍යායපනය ලැබීමෙන්, ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණන් සහ මෑණියන් මෙන් වීමට අපට හැකි වෙයි. උපුටාගනු ලැබුවේ ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ, *Faith Precedes the Miracle, 98).*

අනාගතවක්තෘ ජෝසෆ්. ස්මිත් මෙසේ කීවේය: "මම, උස් කන්දකින් පහතට පෙරළීගෙන එන විශාල, තද ගලක් වගෙයි; මට ලැබෙන එකම පිරිපහදුව නම් යමක් සමග ගැටීමෙන් යම් කොනක් ඇතිල්ලීමෙන්ය....මෙහෙන් කොනක් සහ එහෙන් කොනක් තට්ටු කිරීමෙනි. එලෙස මම සර්වපරාක්‍රමයාණන්ගේ කොපුවෙහි මුවහත් කර තිබෙන ඒ ගසක් බවට පත්වන්නෙමි. (*Teachings of the Prophet Joseph Smith*, තෝරාගනු ලැබුවේ Joseph Fielding Smith [1976], 304).

---

අවසානය.

ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමෙන් අපගේ පරීක්ෂාවන් විඳදරාගැනීමට ශක්තිය ලබා ගැනීමටද, උන්වහන්සේ ගැන අපගේ සාක්ෂි ගොඩනැගීමද, අපගේ අවංකකම පවත්වාගෙන යෑමෙන් අපගේ ජීවිත උන්වහන්සේට ප්‍රසන්න බව දැනගැනීම ගැන විශේෂයෙන් අවධාරණය කරමින් ඔබ සාකච්ඡා කර යෝබ් පොත සාරාංශගත කරන්න. විරුද්ධත්වයක් තිබූ අවස්ථාවකදී ඔබට ලැබුනු ශකතිය ගැන පංති සාමාජිකයින් සමග කීමට ඔබට වුවමනා වෙනවා ඇත. විරුද්ධත්වය විඳදරා ගැනීමට උපකාර වීම පිණිස, මෙම පාඩමේ සාකච්ඡා කළ මූලධර්ම යොදවන ආකාරය ගැන සිතා බැලීමට පංති සාමාජිකයින්ට යෝජනා කරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. යෝබ්ගේ මිතුරන්**

- එලිපස් සහ බිල්දද් යන යෝබ්ගේ මිතුරන් දෙදෙනා ඔහුගේ දුක්විඳීම පහදා දුන්නේ කෙසේද? (යෝබ් 4:7–8; 8:6 බලන්න. යෝබ් කළ පාප වලට දෙවියන්වහන්සේ දඬුවමක් ලෙස යෝබ් දුක්විඳිනවා යයි ඔව්හු සිතුහ.) සියලු දුක්විඳීම් පැමිණෙන්නේ අපගේ පාප වලට දෙවියන්වහන්සේගේ දඬුවමක් යයි විශ්වාස කිරීමේ භයානකකම කුමක්ද?
- විරුද්ධත්වයෙන් දුක්විඳින ජනතාවට උපකාර කිරීම ගැන යෝබ්ගේ මිතුරන්ගේ වැරදි අදහස් වලින් අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද?

**2. විරුද්ධත්වයන් ඇති වූ විට ඇසිය යුතු ප්‍රශ්න**

වැඩිහිටි රිචඩ්. ජී. ස්කොට් මෙසේ පැවසුවේය: "ඔබ විරුද්ධත්වයකට මුහුණ දෙන විට, බොහෝ ප්‍රශ්න ඇසීමට ඔබට සිදු වෙනවා. සමහර ඒවා ප්‍රයෝජන වෙන අතර අනෙක් ඒවා එහෙම නැත. මට මෙය සිද්ධ වුනේ මොකද? කියා අසනවා ඇති. මම දැන් දුක්විඳින්නේ කුමක් නිසාද? මෙහෙම වෙන්න මම මොකද කළේ? මෙයින් කිසි ප්‍රයෝජනයක් ඔබට වෙන්නෙ නැහැ. දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධව ප්‍රශ්න ඇසීම ඇත්ත වශයෙන්ම හොඳ දෙයක් නොවේ. මම මොකද කරන්නේ? ඒ විදියට අහන්න. මේ අත්දැකීමෙන් මම මොනවද ඉගෙනගන්නේ? මම මොනවද වෙනස් කරන්නේ? මම කාටද උපකාර කරන්ට ඕන? පරීක්ෂාවන් තිබෙන කාළයේ මගේ ආශිර්වාද මතක්කරගන්නේ කොහොමද?" (Conference Report තුලින්, ඔක්තෝ. 1995, 18; හෝ *Ensign*, නොවැ. . 1995, 17).

### 3. විරුද්ධත්වය ඇති විට සදාකාල දර්ශනයක් පවත්වා ගැනීම

සභාපති ස්පෙන්සර් ඩබ්ලිව් කිම්බල් මෙසේ කීවේය:

"මැරෙන සුළු ජීවිතයේ වේදනාව, දුක, අසාර්ථක වීම, සහ කෙටි ජීවිතය සම්පූර්ණ ජීවිතයක් යයි අප සිතනවා නම් එය ඛේදජනක වෙනවා. නමුත් සදාකාලයටම මැරෙන සුළු ජීවිතයත් පසුකර එපිටට පැතිරෙමින්, මරණයෙන් පසු සදාකාල ජීවිතයේ අනාගතයට පවා පැතිරී යන බවට ජීවිතය දෙස බලනවා නම් මෙම සියළුම සිදුවීම් සුදුසු දර්ශනයකින් බැලිය හැකිය.

"…අසනීප මගින් ඉවසීම ගැන ඉගෙන ගැනීමටත්, මරණයෙන් අමරණීයත්වයට සහ මහිමයට පත්වීමේදී පරීක්ෂාවන්ට මුහුණදීමේ අපගේ ශක්තිය පරීක්ෂා කිරීමට අප මුහුණ නොපාන්නේද?

"අප යාච්ඤා කරන රෝගීන් සියළුම දෙනා සුවවන්නේ නම්, සියළුම ධර්මිෂ්ඨ මිනිසුන් ආරක්ෂා කොට අධර්මිෂ්ඨයන් විනාශ කරන්නේ නම්, පියාණන් වහන්සේගේ මුළු සැලැස්මම නිෂ්ප්‍රභවන්නේය. එපමණක් නොව ශුභාරංචියේ මූලික මූලධර්මය වන නිදහස් කැමැත්ත අවසාන වෙයි. කිසි මිනිසෙකු ඇදහීමෙන් පමණක්ම ජීවත් විය යුතු නොවේ" (*Faith Precedes the Miracle* [1975], 97).

### 4. අධර්මිෂ්ඨයාගේ සමෘධිමත් භාවය කෙටිය

- සමහර විට අධර්මිෂ්ඨයා සමෘධිමත් වන නමුත් ධර්මිෂ්ඨයා දුක් විඳියි. අධර්මිෂ්ඨයාගේ පෙනෙන්නට තිබෙන සමෘධිය ගැන යෝබ් පොතෙහි උගන්වන්නේ කුමක්ද? (යෝබ් 21:24 බලන්න). ෑ_

# ලෝකයා සමග ශුභාරංචිය බෙදාගැනීම 33

වෙනි පාඩම.

*යෝනා 1-4; මීකා 2; 4–7*

---

**අරමුණ**

පසු දවස්වල ඉශ්‍රායෙල්වරු වශයෙන් ඔවුන්ගේ වගකීම් ඉටුකරමින්, ලෝකයේ සියළුම ජනතාවට ප්‍රේම කරමින්, ශුභාරංචියේ ආශිර්වාද ඔවුන් සමග බෙදාගැනීමට පංති සාමාජිකයින් දිරිගැන්වීමටය.

---

**සූදානම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.

අ. යෝනා 1–2. නිනීවයේ ජනතාවට පසුතැවීම දේශනා කිරීමට, ස්වාමින්වහන්සේ යෝනාව කැඳවන සේක. යෝනා නැවක නැගී, දෙවියන්වහන්සේ වෙතින් පළා යන විට විශාල මත්ස්‍යයා විසින් ගිලිනු ලැබ, යාච්ඤා කළ විට, මත්ස්‍යයාගේ බඩෙන් ඔහුව මුදාහැරියේය.

ආ. යෝනා 3–4. නිනිවයේ වැටීම ගැන යෝනා අනාවැකි කී අතර නිනිවයේ ජනතාව පසුතැවිලි වූ නිසා ස්වාමින්වහන්සේ නගරය ඉතිරි කළ සේක (ජෝසෆ් ස්මිත්ගේ පරිවර්තනයේ යෝනා 3:9–10 විස්තර කරන්නේ, දෙවියන්වහන්සේ නොව ජනතාව පසුතැවිලි වූ බවය). සියළුම ජනතාවට ප්‍රේම කළ යුතු බව යෝනාට ඉගැන්වීමට, ස්වාමින්වහන්සේ ලබු වැලක් සහ පණුවෙකු භාවිතා කරන සේක.

ඇ. මීකා 2:12–13; 4:1–7, 11–13; 5:2–4, 7–8; 6:6–8; 7:18–20. පසු දවස් වලදී ඉශ්‍රායෙල් දූත මෙහෙය ගැන මීකා අනාවැකි පළකරයි.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ක්‍රියාකාරීත්වයට යොමු වීම

පාඩම පටන් ගැනීමට, පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

- පූර්ණ කාලීන දූතමෙහෙයක සේවය කිරීම සඳහා සභාවේ කොපමණ තරුණ මිනිසුන් ස්වාමින්වහන්සේට අවශ්‍ය වන්නේද? (සුදුසු හැකියාවන් ඇති සියළුම තරුණ මිනිසුන්). මෙම කැඳවීමට එක් එක් තරුණ මිනිසෙකු ප්‍රතිචාර දැක්වීමේ වැදගත්කම කුමක්ද? පූර්ණකාලීන දූතමෙහෙයේ සේවයට සුදුසු වෙන අය කවුද? (අවුරුදු 21 වැඩි සුදුසු තනිකඩ සහෝදරියන් හෝ අවස්ථාවන් ඇති වැඩිහිටි ජ්‍යේෂ්ඨ ජෝඩුය.)

ලෝකයේ සියළුම කොටස් වල ජනතාවට ශුභාරංචිය දේශනාකිරීමට හැකි ධර්මදූතයන් වඩා අවශ්‍ය බව 1979, සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් කීවේය. ඔහු මෙසේද ප්‍රකාශ කළේය. උන්වහන්සේ සිතන සියල්ලම කිරීමට ස්වාමින්වහන්සේට හැකියාව තිබෙන බව මම විශ්වාස කරමි. නමුත් අපට ඇතුල්වීමට නොහැකි ස්ථාන වල ස්වාමින්වහන්සේ දොරවල් විවෘත නොකරන කාරණය මට පෙනෙන්ට නැත." ("The Uttermost Parts of the Earth," *Ensign*, ජූලි 1979, 9).

අපගේ වගකීම් තේරුම්ගෙන සියළුම ජනතාවට ප්‍රේම කරමින් ශුභාරංචියේ ආශිර්වාද ඔවුන් සමග බෙදාගැනීමට, යෝනාගේ හා මීකාගේ ජීවිත සහ ලියවිලි අපට උපකාර වන අන්දම මෙම පාඩමෙන් සාකච්ඡා කරන්නේය.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ අදාළ කර ගැනීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, ඔවුන්ගේ දිනපතා ජීවිතයට ඒවා අදාළ කර ගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි මූලධර්ම වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින් දිරිගන්වන්න.

1. **නිනිවයේ දේශනාකිරීමට යෝනා කැඳවූ නමුත්, ඔහු පළායයි.**

යෝනා 1-2 උගන්වා සාකච්ඡා කරන්න.

- යෝනා නිනිවයට යැවීම ස්වාමීන්වහන්සේට අවශ්‍ය වූයේ කුමක් නිසාද? (යෝනා 1:2 බලන්න.) නිනිවයට දූතමෙහෙයේ කැඳවීම යෝනා භාරගැනීමට ප්‍රතික්ෂේප කළේ කුමක් නිසාද? (නිනිවයේ මහත් වූ නපුරුකම් සහ සාහසිකකම් විස්තර කරන නාහුම් 3:1–5 බලන්න. අෂූර්හි ප්‍රධාන නගරය වන නිනිවයේ ජනතාව ඉශ්‍රායෙල්වරුන්ගේ සතුරෝය.)
- යෝනා තර්ෂිෂ්ට ගියේ කුමක් නිසාද? (යෝනා 1:3 බලන්න.) සමහරවිට අපද ස්වාමීන්වහන්සේගේ අභිමුඛයෙන් ගැලවීමට හෝ, උන්වහන්සේගේ නියෝජිතයින් මගින් කැඳවීම් දුන් විට එයින් වැළකීමට උත්සාහ දරන්නේ කෙසේද? එවැනි උත්සාහවල ප්‍රතිඵල මොනවාද?
- යෝනාට දයාව පෙන්වා පසුතැවිලි වීමට ස්වාමීන්වහන්සේ උපකාර කළේ කෙසේද? (යෝනා 1:4–2: 10 බලන්න.) විශාල මත්ස්‍යයා තුල යෝනා සිටියදී ඔහු ඉගෙන ගත්තේ කුමක්ද? (යෝනා 2:1–9 බලන්න.) අප පසුතැවිලි වී උන්වහන්සේගේ මාර්ගය වෙතට හැරී ඒමට ස්වාමීන්වහන්සේ අපට උපකාර කරන්න් කෙසේද?
- ගැලවුම්කරුවාණන් පොළොවේ මෙහෙකරන කාලයේදී "අනාගතවක්තෘ යෝනාස් ෟයෝනාෟගේ ලකුණ" ගැන උන්වහන්සේ කථා කළ සේක (බලන්න මතෙව් 12:39). මෙම ලකුණේ අර්ථය කුමක්ද? (මතෙව් 12:39–41 බලන්න. යෝනා විශාල මත්ස්‍යයාගේ බඩෙහි දවස් තුනක් සහ රාත්‍රී තුනක් ගත කළාට පසු පණපිටින් ගොඩට ගෙනාවිය. ගැලවුම්කරුවාණන් දවස් තුනක් සහ රාත්‍රී තුනක් පොළොවේ වැළලීමෙන් පසු, මළවුන්ගෙන් නැවත නැගිට ඉදිරියට පැමිණේ.)
- සුදුසු වූ සහ හැකියාවන් ඇති සියළුම තරුණ මිනිසුන්ට පූර්ණකාලීන ධර්මදූත සේවයේ යෙදීමට උන්වහන්සේගේ අනාගතවක්තෘන් මගින් ස්වාමීන්වහන්සේ නැවත නැවතත් අණකළ සේක. ජ්‍යේෂ්ඨ හැකියාවන් ඇති ජෝඩු වලට පූර්ණ කාලීන ධර්මදූත සේවයේ යෙදීමට උන්වහන්සේ ඉදිරිපත්වන සේක. (ඉගැන්වීමේ අමතර අදහස් බලන්න.) හැකියාවන් ඇති තරුණ මිනිසුන් සහ ජ්‍යේෂ්ඨ ජෝඩු ධර්මදූත සේවය තෝරා නොගන්නා සමහර කරුණු මොනවාද? (කැපවීම හා ඇදහීම නොමැතිකම, නුසුදුසුකම, නිවසේ සහ පවුලේ සැපසම්පත් ඉවතලෑමට තිබෙන අකමැත්ත, ඔවුන්ගෙන් බලාපොරොත්තු වන දේවල් ගැන ඇති භය.) වඩාත් වික්‍රමාන්විතව ස්වාමීන්වහන්සේට කීකරු වෙමින් ශුභාරංචිය බෙදාගැනීමට උපකාර වන යෝනාගේ කථාන්තරයෙන් අපට ඉගෙනගැනීමට හැකිවන්නේ කුමක්ද?

2. **නිනිවයේ සෙනග පසුතැවිලි වෙමින් යෝනාගේ පණිවුඩයට ප්‍රතිචාර දැක්වූහ.**

යෝනා 3-4 උගන්වා සාකච්ඡා කරන්න.

- යෝනා පසුතැවිලි වූවාට පසු, නිනිවයේ ජනතාවට පසුතැවිල්ල දේශනාකිරීමට, ස්වාමීන්වහන්සේ ඔහුව නැවත කැඳවූ සේක. නිනිවායේ ජනයා යෝනාගේ පණිවුඩයට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (යෝනා 3:5–9 බලන්න. පැරණි කාලයේදී ජනයා, ඔවුන්ගේ නිහතමානී කම සහ පසුතැවිලි වීම පෙන්වීමට ඔවුන් ගෝනි රෙදි යැයි කියන හොරෝසු රෙදි පැළඳගෙන අළු උඩ වාඩි වී සිටියහ.) ජනතාවගේ වෙනස්වීම කෙරෙහි දෙවියන්වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (යෝනා 3:10 බලන්න.)
- නිනිවය හෙළාදමනු ලබන බවට යෝනා අනාවැකි කීවේය. (යෝනා 3:4). ස්වාමීන්වහන්සේ යොනා ජනතාවට කමාව දුන් පසු, යෝනා ප්‍රතිචාර දැකවූයේ කෙසේද? (යෝනා 4:1–3 බලන්න. ස්වාමීන්වහන්සේ ජනතාවට දයාවන්ත වූ නිසා යෝනා කෝපවිය.)
- ලබු වැලක් වවා සෙවනදී සනසා පසු එය මැරෙන්ට සැලැස්වීමෙන් ස්වාමීන්වහන්සේ යෝනාට ඉගැන්වූයේ කුමක්ද? (යෝනා 4:4–11 බලන්න. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සියළුම දරුවන්ට ප්‍රේම කරන සේක. උන්වහන්සේ යෝනාට දයාව දැක්වූවාක් මෙන්ම, නිනිවාහි පසුතැවිලි වූ ජනයාටද දයාව දැක්වීම උන්වහන්සේගේ අභිලාශය විය.) අන්‍යයන්ට ප්‍රේම කිරීම ගැන යෝනාගේ අත්දැකීමෙන් අපට කුමක් ඉගෙනගත හැකිද?

**3. පසු දවස් වල ඉශ්‍රායෙල්වරුන්ගේ දූතමෙහෙය ගැන මීකා අනාවැකි කියයි.**

මීකා පොතේ පහත සඳහන් කොටස් උගන්වා සාකච්ඡා කරන්න.

ඔවුන්ගේ දුස්ඨකම් ගැන පසුතැවිලි වී, ස්වාමින්වහන්සේ වෙතට හැරී ඒමට, අනාගතවක්තෘ මීකා ඉශ්‍රායෙල් ජනතාවට කීවේය. යාකොබ් (ඉශ්‍රායෙල්) සහ යුදාගේ විනාශය ගැන ඔහු අනාවැකි පළ කළේය. පසු දවස් වල ඉශ්‍රායෙල්වරුන් (යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව) ස්වාමින්වහන්සේගේ අරමුණ මහත් බලයකින් යුක්තව ඉටුකරන බව ගැනද ඔහු අනාවැකි පළ කළේය.

- මීකා පොතෙහි ස්වාමින්වහන්සේ දුන් පොරොන්දු මොනවාද? (ඉශ්‍රායෙල්වරුන්ගේ ඉතිරි වූ අය එකරැස් කරන බවද, ඔවුන් විශාල සමූහයක් වන බවද, උන්වහන්සේ ඔවුන්ට මගපෙන්වන බවටද) උන්වහන්සේ පොරොන්දු වූ සේක. මෙම පොරොන්දු අද ඉෂ්ඨ වෙමින් පවතින්නේ කෙසේද?
- පසු දවස් ගැන මීකාගේ ශ්‍රේෂ්ඨ අනාවැකි සමහරක් මීකා 4:1–7 වාර්තා කර තිබේ. පසු දවස් වල දේවමාළිගාව ගැන මීකාගේ අනාවැකිය කුමක්ද? (පද 1–2 බලන්න.) සහශ්‍රය ගැන ඔහුගේ අනාවැකිය කුමක්ද? (පද 3–7 බලන්න.) මෙම අනාවැකි අපට වැදගත් වන්නේ කුමක් නිසාද?
- පසු දවස් වල ඉශ්‍රායෙල්වරුන්ගේ ඉරණම ගැන මීකා 4:11–13 අපට ඉගෙන ගැනීමට හැකි වන්නේ කුමක්ද? (පුරාතනයේදී ධාන්‍ය පෑගීමට ලෝකයා බොහෝ විට භාවිතා කළේ හරකුන්ය. ඇට වලින් බොල් ඉවත් කිරීම පිණිස, ධාන්‍ය උඩ ඔවුහු ඇවිදිති. (බොල් හුළඟට ගසාගෙන ගොස් ඇට පමණක් ඉතිරිවේ. සයෝනයට විරුද්ධ වන ජාතීන් මිටි මෙන් රැස්කොට ඉශ්‍රායෙල්වරුන් විසින් පාගනු ලබන්නේය.) පසු දවස් වල ඉශ්‍රායෙල්වරුන් ලොව පුරා ධර්මදූත වැඩ කටයුතු කිරීමේ වගකීම, ඇට වෙතින් බොල් ඉවත් කිරීමට සමාන කළ හැකි වන්නේ කෙසේද? (ධී සහ සී 26:7; 33:5–7 බලන්න.)
- මීකා 5:2–4 මීකා අනාවැකි පළකරන්නේ කවුරු ගැනද? (මතෙව් 2:4–6 මෙය ඉටුවීම ගැන වාර්තාව, මෙම අනාවැකිය සමග සමාන කරන්න.)
- මීකා 5:7 ස්වාමින්වහන්සේගේ ජනතාව සමාන කර තිබෙන්නේ කුමකටද? ලෝකයේ ජනතාව කෙරෙහි සභාවේ සාමාජිකයින්ගේ බලපෑම තණ මත වැටෙන පිනි හෝ වැසි බිංදු වල රූපයකට සමාන කළ හැකි වන්නේ කෙසේද? මෙම වැහි බිංදු "මනුෂ්‍ය පුත්‍රයන්" ගැන පමා නොවන්නේය යන කියමන ගැන මීකා අදහස් කළේ ඔබ සිතන අන්දමට කුමක්ද? (පිනි සැදීම හෝ වැහි බිංදු වැටීම මැරෙන සුළු ජනයාට නැවැත්වීමට නොහැකි මෙන්ම, ලොව පුරා ස්වාමින්වහන්සේගේ ක්‍රියා වල වර්ධනය කිසිවෙකුට නැවැත්විය නොහැකිය.)
- මීකා 5:8 ස්වාමින්වහන්සේගේ ජනතාව සමාන කර ඇත්තේ කුමකටද? ස්වාමින්වහන්සේගේ ක්‍රියා වල ශක්තිය සහ බලය ගැන මෙම ප්‍රතිරූපය යෝජනා කරන්නේ කුමක්ද? (බැටළු රැලකට තරුණ සිංහයෙකුගේ බලය නැවැත්වීමට නොහැකි මෙන්ම ස්වාමින්වහන්සේගේ ක්‍රියාවලට බාධාකිරීමට මෙම පොළොවෙහි කිසිම බලයකට පුළුවන් කමක් නැත.)

  1842 අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් මෙසේ ප්‍රකාශ කළේය: "වැඩකටයුතු වර්ධනය වීම කිසිම අශුද්ධ හස්තයකට වැළැක්විය නොහැක; පීඩාවන් වේගවත් වේ, දාමරිකයන් සම්බන්දවේ, හමුදාවන් එක්රැස් වේ, කෙළසීමෙන් අපහාස කෙරේ, නමුත් දෙවියන් වහන්සේගේ සත්‍යය එඩිතරව, උදාර ලෙස, නිදහසේ, සෑම මහද්වීපයක්ම පසාරු කරගෙන, සෑම ප්‍රදේශයක්ම බැහැදකිමින්, සෑම රටක්ම පිසදාගෙන, සෑම කණකටම ශබ්ද කරමින්, දෙවියන්වහන්සේගේ අරමුණ ඉෂ්ඨ වී ක්‍රියාව අවසානයයි ශ්‍රේෂ්ඨ යෙහෝව වහන්සේ කියන තෙක් එය ඉදිරියටම යනවා ඇත." (*History of the Church,* 4:540).

- අපගෙන් බලාපොරොත්තු වන මෙම සියළුම දේවල් නිසා අපට යටපත්වීමේ හැඟීම පහල වන විට, මීකා 6:6–8 අපට පිහිටවීමට හැකි වන්නේ කෙසේද?
- පසු දවස්වලදී ස්වාමින්වහන්සේගේ ක්‍රියා ගැන අනාවැකි පළකළාට පසු, දෙවියන් වහන්සේගේ ස්වභාවය ගැන මීකා කුමණ නිගමනයකට පැමිණියේද? (මීකා 7:18–20 බලන්න.) නිනිවාහි ජනයා සමග ස්වාමින්වහන්සේ වැඩකටයුතු වලට අදාළ කළ හැකි වන්නේ මෙම පදවල කුමන වාක්‍ය ඛණ්ඩද? අප සමග ස්වාමින්වහන්සේගේ වැඩකටයුතු වලට අදාළ වන්නේ කුමන වාක්‍ය ඛණ්ඩද?

අවසානය.

ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ සියළුම දරුවන්ට ප්‍රේම කරන බවටද, උන්වහන්සේගේ ප්‍රේමය සහ ශුභාරංචියේ සත්‍යය සියළුම ජනතාව සමග බෙදාගැනීමේ මහඟු වගකීම, පසු දවස් වල ඉශ්‍රායෙල්වරුන් වශයෙන් අප සතු බවට සාක්ෂි දරන්න. යෝනා සහ මීකාගෙන් ඔවුන් ඉගෙන ගත් දේවල් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට කියන්න.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. සුදුසු, හැකයාවන් ඇති සෑම තරුණ මිනිසෙක්ම දූතමෙහෙයක සේවයට සූදානම් විය යුතුය**

සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න.

"මම වැඩියෙන් ධර්මදූතයන් ඉල්ලන විට, සාක්ෂිය නොමැති නැත්නම් නුසුදුසු ධර්මදූතයින් ඉල්ලන්නේ නැහැ. මම කියන්නේ ලෝකයේ සියළුම ශාඛාවල සහා කොට්ඨාශවල අපගේ ධර්මදූතයින් වඩා හොඳට පුහුණු කිරීමට කලින් පටන්ගැනීමටය. එය තවත් අභියෝගයක්..... දූතමෙහෙයකට යෑමේ අනගි වරප්‍රසාදය ගැන තරුණ ජනයා තේරුම් ගනීවි. හොඳ සෞඛ්‍ය තත්වයක, හොඳ මානසික තත්වයක, හොඳ ආත්මික තත්වයක සිටිය යුතු බවද, ස්වාමීන්වහන්සේට අංගුමාත්‍රයකින් වත් පාපය දෙස බැලීමට නොහැකි බව ඔවුන් දැනගන්නවා ඇත"....

"නිතර අසන ප්‍රශ්නයකි මෙයඃ හැම තරුණ මිනිසෙක්ම දූතමෙහෙයක් ඉටු කරන්නට ඕනෑ? එයට ස්වාමීන්වහන්සේ උත්තරය දී තිබෙනවා. එය නම් ඔව්, සෑම මිනිසෙක්ම දූතමෙහෙයක් ඉටු කළ යුතු වේ" ("When the World Will Be Converted," *Ensign,* ඔක්තෝ. 1974, 7–8).

2. ජෝඩු ධර්මදූතවරුන්ගේ අවශ්‍යතාවය

වැඩිහිටි ඩේවිඩ් බී. හෙයිට් ගේ පහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න.

"සහෝදරයන් වෙනුවෙන්, දූතමෙහෙයක සේවය ගැන දැඩි ලෙස සලකා බැලීමට විශ්‍රාම ගිය ජෝඩු වලට කැඳවීමකි මෙය. අපගේ අවශ්‍යතාවයන් සපුරාලීමට උපකාර පිණිස වැඩියෙන් ජෝඩු අපට අත්‍යාවශ වී ඇත...ජෝඩු ධර්මදූතවරුන්ට [අපගේ] ධර්මදූත සභාපතිවරුන්ගේ ඉල්ලීම අනුව සියයට 50 ටත් අඩු ප්‍රතිශතයක් සම්පූර්ණ කරනු ලබයි....

"සභාවට පූර්කාලීන සේවයට, තවත් බොහෝ ජෝඩු ඉදිරිපත් වේ යැයි, සහෝදරයින්ගේ අපේක්ෂාව වේ. අවශ්‍යතාවය අති මහත්ය. හැම අවුරුද්දකම සිය දහස් ගණන් අළුත් සාමාජිකයින් සභාවට සම්බන්ධ වෙනවා. අත්දැකීම් ඇති සාමාජිකයින්ගෙන් පෝෂණය කිරීමේ හා සැනසීමේ මිත්‍රත්වයේ වචනයක් ඇසීම ඔවුන්ට අවශ්‍ය වෙනවා.

"සමිඳුනි ඔබට අවැසි තැනට මම යමි" (ගීතිකාව, 1985, අංක 270) යන්න ඉරුදින ගයන ගීතිකාවට වඩා නිතර නිතර කියවෙන පදයක් විය යුතුය. ස්වාමීන්වහන්සේට අවශ්‍ය ස්ථානයක අප සේවය කරන විට, එය අපේම ස්වකීය ඇඳහිල්ලේ යාච්ඥාව විය යුතුය." ("Couple Missionaries: 'A Wonderful Resource,' " *Ensign,* පෙබ.. 1996, 7, 12).

# "ධර්මිෂ්ඨ කමින් මම නුඹ සරණපාවා ගන්නෙමි"

# 34 වෙනි පාඩම

*හොෂෙයා 1-3; 11; 13–14*

---

**අරමුණ**

අප පසුතැවිලි වී ස්වාමීන්වහන්සේ වෙතට නැවත හැරී ආ විට, උන්වහන්සේ ප්‍රේමයෙන් හා දයාවෙන් අපට කමාවන බව පංති සාමාජිකයින්ට තේරුම් ගැනීම පිණිස උපකාර වීමටය.

---

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.

   අ. හොෂෙයා 1–3. ඇදහිලිවන්ත ස්වාමිපුරුෂයා සහ පරදාර සේවනය කරන භාර්යාවගේ උපමාව භාවිතා කරමින්, ස්වාමීන්වහන්සේ සහ ඉශ්‍රායෙල් අතර ඇති සම්බන්ධතාවය හොෂෙයා විස්තර කරයි.

   ආ. හොෂෙයා 11; 13–14 උන්වහන්සේගේ ජනතාවට උන්වහන්සේගේ ප්‍රේමය නිසා, පසුතැවිලි වී උන්වහන්සේ වෙතට නැවත හැරී ඒමට, ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට නොකඩවා ආරාධනා කරන සේක.

2. අමතර කියවීම්: හොෂෙයාගේ ඉතිරි කොටස.

3. යොමු කිරීමේ ක්‍රියාකාරීත්වය ඔබ භාවිතා කරන්නේ නම්, පංතිය පටන්ගැනීමට පෙර, පහත සඳහන් එක එක් වාක්‍ය කණ්ඩයක් වෙන වෙනම කඩදාසි කැල්ලක ලියන්න. ඔබගේ පංතිය කුඩා නම්, එක් එක් පංති සාමාජිකයෙකුට, එක් කඩදාසියක් පමණක් සූදානම් කරන්න.

   "ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ ගණන මුහුදේ වැලි මෙන් වන්නේය" (හොෂෙයා 1:10)
   "ඔවුන් කෙරෙහි මාගේ කෝපය ජලය මෙන් වගුරවන්නෙමි" (හොෂෙයා 5:10)
   "ස්වාමීන්වහන්සේ…වර්ෂාව මෙන් අප ලඟට එනවා ඇත" (හොෂෙයා 6:3)
   "රාජාලියා මෙන් ස්වාමීන්වහන්සේ එන්නේය." (හොෂෙයා 8:1)
   "ඉශ්‍රායෙලය එල නොදරන මිදි වැලක්ය." (හොෂෙයා 10:1)
   "විනිශ්වයද කෙතේ ඕවිටිවල හටගන්නා විෂ පැලැටි මෙන් හට ගනී" (යොෂෙයා 10:4)
   "ඔව්හු.... දුම් කවුළුවෙන් යන දුම් මෙන් වන්නෝය" (හොෂෙයා 13:3)
   "පැටවුන් නැතිවුන වැලහින්නියක් මෙන් මම ඔවුන්ට විරුද්ධව එන්නෙමි" (හොෂෙයා 13:8)
   "මම වනාහී කොළ නොවේලෙන දේවදාර ගසක් මෙන්ය" (හොෂෙයා 14:8)

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු වීම**

පාඩම පටන්ගැනීමට, පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) ඔබට භාවිතා කිරීමට උවමනා වෙනවා ඇත.

ඔබ සූදානම් කළ කොළ පංති සාමාජිකයන් අතර බෙදන්න (ඉහත ඇති "සූදානම" බලන්න). මෙම එක එක් වාක්‍ය කණ්ඩයක්ම හොෂෙයා පොතේ උපමා බව පහදා දෙන්න. කඩදාසියක් ලැබුණු එක් එක් සාමාජිකයෙකුටම වාක්‍ය කණ්ඩය ශබ්දනගා කියවා, උපමාවට එක් තේරුමක් යෝජනා කිරීමට සලස්වන්න. නිදර්ශනයක් වශයෙන්, යමෙකු "සිංහයෙකු මෙන්ය" කීමෙන් එය ශක්තිය හෝ භයංකාර කම පෙන්වයි.

- හොෂෙයා සහ අනිකුත් අනාගතවක්තෘවරුන් උපමා පාවිච්චි කරන්නේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? (සංකීර්ණ හෝ නුපුරුදු අදහසක් වඩා සරල හුරුපුරුදු එකක් සමග උපමා කළ විට ඉගෙන ගන්නා ජනතාවට වඩාත් පහසුවෙන් තේරුම් ගැනීමට හැකි වේ. වචන ස්වල්පයකින් තොරතුරු බොහෝමයක් සපයා දීමටද උපමා උපකාර වෙයි.

මෙම කුඩා උපමා වලට අමතරව, රූපක හෝ සමාන කිරීම් යයි කියන සංකීර්ණ උපමාද හොෂෙයා භාවිතා කළේය. (සමාන යන වචනය ශුද්ධ වූ ලියවිලි වල භාවිතා කරනු ලැබේ) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ ජනතාව අතර සම්බන්ධතාවය තේරුම් ගැනීම පිණිස පිහිට වීමට හොෂෙයාගේ පොතෙහි බොහෝ උපමා අඩංගු වේ.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා සහ ඒවා අදාළ කිරීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළ වන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. ඇදහිලිවන්ත ස්වාමිපුරුෂයා සහ පරදාර සේවනය කරන භාර්‍යාවගේ උපමාව භාවිතා කරමින්, ස්වාමින් වහන්සේ සහ ඉශ්‍රායෙල් අතර ඇති සම්බන්ධතාවය හොෂෙයා විස්තර කරයි.**

හොෂෙයා 1–3 උගන්වා සාකච්ඡා කරන්න. යොමුවීමේ ක්‍රියාකාරීත්වය ඔබ භාවිතා නොකළේ නම්, සාකච්ඡාව පටන් ගැනීමට පෙර, උපමාවක් යනු කුමක්ද කියා පහදා දෙන්න.

ශුද්ධ වූ ලියවිලි වල බහුලව භාවිතා කරන එක් උපමාවක් නම්, ස්වාමින්වහන්සේ මනමාලයා (හෝ ස්වාමිපුරුෂයා) මෙන්ද, උන්වහන්සේගේ ගිවිසුමේ ජනතාව මනමාලිය (හෝ භාර්‍යාව) මෙන්ද විස්තර කිරීමය. හොෂෙයා 1–3 මෙම උපමාව බහුලව භාවිතා කරන අතර, ඉශ්‍රායෙල්වරුන්ගේ දේවරූප වන්දනා කිරීම වේශ්‍යාකමට උපමා කරයි. මෙම පරිච්ඡේදවලදී අනාගතවක්තෘ හොෂෙයා ස්වාමින්වහන්සේව ස්වාමිපුරුෂයා වශයෙන් නියෝජනය කරන අතර, ඉශ්‍රායෙල් භාර්‍යාව ලෙස ගොමෙර් නියෝජනය කරයි.

- හොෂෙයා පොතෙහි, ඉශ්‍රායෙලය අතර ස්වාමින්වහන්සේගේ සම්බන්ධතාවය (අද සභාව සමගද) උපමා කරනු ලබන්නේ ස්වාමිපුරුෂයා සහ භාර්‍යාව අතර ඇති සම්බන්ධතාවයයි. ස්වාමින්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන පොරොන්දුව සහ කැපවීමේ මට්ටම ගැන මෙම උපමාව අපට උගන්වන්නේ කුමක්ද?
- "වේශ්‍යාකමේ භාර්‍යාව" මෙන් විස්තර කරන, පැරණි ඉශ්‍රායෙලය ගොමෙර්ට උපමා කරන්නේ කුමණ ක්‍රම වලින්ද? (හොෂෙයා 1:2–3; 2:5; 13 බලන්න. ගොමෙර් ඇයගේ ප්‍රේමවන්තයන් වෙනුවෙන් තම ස්වාමිපුරුෂයා අත් හැරියාය; ඉශ්‍රායෙලය ස්වාමින්වහන්සේ අමතක කොට දුෂ්ඨ බවට පත් විය.)
- ඉශ්‍රායෙල්වරුන්ගේ "ප්‍රේමවන්තයින්" කවුද නැතහොත් මොනවාද—ස්වාමින්වහන්සේ වෙතින් ජනතාවට ඉවත යෑමට සලස්වන දේවල්ය. (වෙනත් දෙවිවරු, ලෞකික දේවල් සහ ලෞකික පුරුදු.) ස්වාමින්වහන්සේ අනුගමණය කිරීමේ අපගේ කැපවීමෙන් අපව ඉවතට හරවන්නේ කුමන දේවල්ද?
- පරදාර සේවනයේ යෙදෙන භාර්‍යාව කෑම සහ ඇඳුම් උදෙසා ප්‍රශංසාව දෙන්නේ කාටද? (හොශෙයා 2:5 බලන්න) ඉශ්‍රායෙල්වරුන් ජීවත්වෙන සමෘධිමත් දේශය ගැන ප්‍රශංසාව හිමිවන්නේ කාටද? (හොෂෙයා 2:5, 12; ඔවුන්ගේ බොරු දෙවිවරුන්ට සහ දේවරූප වලටය.) අද ජනතාවට ලැබෙන ආශිර්වාද වලට, ඔවුන්ගේ බොරු දෙවිවරුන්ට ජනයා ප්‍රශංසා කරන්නේ කෙසේද?
- කෑම, බීම සහ වෙනත් වස්තුව අපට සපයන්නේ—ඇයගේ පේ‍රමවන්තයින් නොව, ඔහු බව සැමියා ඔහුගේ භාර්‍යාවට—මතක්කරන්නේ කෙස්ද? (හොෂෙයා 2:8–9 බලන්න.) ලෞකික හා ආත්මික ආශිර්වාද ස්වාමින්වහන්සේ ඔබට සපයන්නේ කුමන මාර්ග වලින්ද? ස්වාමින්වහන්සේ අපට දෙන ආශිර්වාද අප අගයකොට සලකන්නේ කෙසේද?
- හොෂෙයා 2:6–13 ඔහුගේ අභක්තික භාර්‍යාව කෙරෙහි ස්වාමිපුරුෂයාගේ ආකල්පය කුමක්ද? 14–23 යන පදවල ආකල්පය වෙනස්වන්නේ කෙසේද? (භාර්‍යාව අභක්තිකයෙකු වුවත්, ස්වාමිපුරුෂයා ඇයට තවමත් ආදරය කරන බැවින්, ඇය ඔහු වෙතට නැවත හැරී ඒම ඔහුට උවමනා වූ බව පෙන්වා දෙන්න. ඒ අන්දමින් නොමග ගිය අයට ස්වාමීන්වහන්සේ තවදුරටත් ආදරයකරන අතර, ඔවුන් නැවතත් උන්වහන්සේ වෙතට හැරීම එතුමාගේ අපේක්ෂාව වේ.)

වැඩිහිටි හෙන්රි. බී. අයරින් මෙසේ පැහැදිලි කළේය: "මෙය ආදර කථාවකි. ප්‍රේමයෙන් බැඳී, විවාහ ගිවිසුමේ ස්ථිර ආදරයේ කථාන්තරයක් මේක. ගිවිසුම් තැබීමට මම ආශිර්වාද ලැබූ, ස්වාමින්වහන්සේ, මට සහ ඔබට ප්‍රේම කරනවා, එහි ස්ථිරතාවය ගැන මම මගේ මුළු හදවතින්ම නොකඩවා පුදුම වෙමින්, ජය ගැනීමට වියදම් කරමි" (Covenants and Sacrifice ඉසහාවේ විවිධ අදහස් ඇති ලිපි සංග්‍රහයක අධ්‍යාපන සංස්ථාවේදී කළ කථාවකි, 15 අගෝ. 1995], 2).

- ඔහු වෙතට ඇය නැවත හැරී එන්නේ නම් ස්වාමිපුරුෂයා තම භාර්යාවට දුන් පොරොන්දු මොනවාද? (හොෂෙයා 2:19 බලන්න.) උන්වහන්සේගේ ජනතාව පසුතැවිලි වී උන්වහන්සේ වෙතට නැවත හැරී එන්නේ නම් ස්වාමින්වහන්සේ ඔවුන්ට දුන් පොරොන්දු මොනවාද? (හොෂෙයා 2:20, 23 බලන්න.) මෙම පොරොන්දු වැදගත් වන්නේ කුමක් නිසාද?
- හොෂෙයා 3:1-2, ඇයගේ ප්‍රේමවන්තයාගෙන් ඔහුගේ භාර්යාව ඔහු මිලයට ගත්තේය (මිළදී ගැනීමට හෝ විකිණීමට හැකි දේපළක් මෙන් ස්ත්‍රී සැලකීමට පරණ ගිවිසුමේ සිරිතක් බව පහදා දීමට ඔබට උවමනා වෙනවා ඇත. ඇය මිලදී ගත්පසු භාර්යාවගෙන් ස්වාමිපුරුෂයාට අවශ්‍යවන්නේ කුමක්ද? (හොෂෙයා 3:3 බලන්න.) ඔහු ඇයට පොරොන්දුවූයේ කුමක්ද? යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප එක් එක්කෙනෙකු "මිලයට ගත්තේ" කුමන අදහසක් ඇතුවද? (1 පේත්‍රුස් 1:18–19 බලන්න.) ඒ වෙනුවට ක්‍රිස්තුස් වහන්සේට අපගෙන් අවශ්‍යවන්නේ කුමක්ද?

**2. උන්වහන්සේගේ ජනතාවට උන්වහන්සේගේ ප්‍රේමය නිසා, ඉශ්‍රායෙල්වරුන්ට පසුතැවිලි වී උන්වහන්සේ වෙතට නැවත හැරී ඒමට, ස්වාමින්වහන්සේ නොකඩවා ආරාධනා කරන සේක.**

හොෂෙයා 11; 13–14 උගන්වා සාකච්ඡා කරන්න.

හොෂෙයා මුළු පොතේම, ඉශ්‍රායෙල්වරුන්ගේ මහත් වූ පාපය නිසා, ස්වාමින්වහන්සේ ඔවුන්ට තරවටු කරනසේක. හොෂෙයා මුළු පොතේම, ඉශ්‍රායෙල්වරුන්ගේ දුෂ්ඨකම් නිසා වහල්භාවයට හා විනාශයට පත්වීම ගැන ස්වාමින්වහන්සේ විස්තර කළාට පසු, පසුතැවිලි වී උන්වහන්සේ වෙතට නැවත හැරී ඒමට, උන්වහන්සේ ඔවුන්ට නැවතත් ආරාධනා කරන සේක.

- ස්වාමින්වහන්සේ සහ උන්වහන්සේගේ ජනයා අතර සම්බන්ධතාවය විස්තර කිරීමට, ශුද්ධ ලියවිලි වල බොහෝ විට ස්වාමියා හා සතෙකු තුල ඇති සම්බන්ධතාවය තවත් උපමාවක් කර ගනියි. හොෂෙයා 11:4 මෙම උපමාව කෙටියෙන් භාවිතා කරයි. උන්වහන්සේගේ ජනතාව කෙරෙහි ස්වාමින්වහන්සේගේ හැඟීම් ගැන මෙම සම කිරීම මගින් අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද? (හොෂෙයා 11:7–9 ද බලන්න. ජෝසෆ් ස්මිත්ගේ 8 වෙනි පදයේ පරිවර්තනය මෙසේ කියයි: "මගේ හදවත මා කෙරෙහි හැරෙනවා වෙනුවට, මගේ හදවත නුඹලා කෙරෙහි හැරී ඇත.")
- මිසරයේදී ඔවුන්ගේ මුතුන්මිත්තන් ගලවාගත් අන්දම ගැන, බොහෝ අවස්ථාවලදී ඉශ්‍රායෙල්වරුන්ට ස්වාමින්වහන්සේ කීසේක (හොෂෙයා 11:1; 12:9, 13; 13:4–5). මෙම සිද්ධිය එහි උපමාවක් වන්නේ කෙසේද? (හොෂෙයා 13:14 බලන්න. ඉශ්‍රායෙල්වරුන්ගේ දරුවන් මිසරයේ බැඳුම් වලින් ගලවාගත් ආකාරයටම—- ඔවුන්වද උන්වහන්සේ වෙතට එන සියළුම ජනතාවද—- පාපයෙන් සහ මරණින්, උන්වහන්සේ ගලවා ගන්නා සේක.)
- ස්වාමින්වහන්සේ වෙතට නැවත හැරී අවුත්, ගැලවීම ලබා ගැනීම පිණිස ඉශ්‍රායෙල්වරුන්ට කළ යුතු අවශ්‍ය දෙය කුමක්ද? (හොෂෙයා 12:6; 14:2–3 බලන්න. ඔවුන්ගේ පාප උදෙසා පසුතැවිලි වී, ඔවුන් නමස්කාර කළ අනෙකුත් දෙවිවරුන් අතහැර දැමීම ඔවුන්ට අවශ්‍ය වේ.) ඔවුන් පසුතැවිලි වූයේ නම්, ස්වාමින්වහන්සේ කුමක් කිරීමට පොරොන්දු වූයේද? (හොෂෙයා 14:4–7 බලන්න.) අපගේ පාපවලට අප පසුතැවිලි වන්නේ නම් ස්වාමින්වහන්සේ අපට කිරීමට පොරොන්දු වන්නේ කුමක්ද?
- අප කෙරෙහි ස්වාමින්වහන්සේගේ හැඟීම් තේරුම් ගැනීමට හොෂෙයාගේ පොතේ උපමා අපට උපකාර වන්නේ කෙසේද?

---

අවසානය.

උන්වහන්සේගේ පණත් රක්ෂාකරන අයට ස්වාමින්වහන්සේගේ ආශිර්වාද වෙන්කර තිබෙන අතර, උන්වහන්සේගේ ප්‍රේමය ස්ථිර බවත් සියළු දෙනා වෙතටම දිගුකර තිබෙන බවට සාක්ෂිදරන්න.

පාපය මගින් උන්වහන්සේගෙන් ඉවතට අප හැරී සිටියත්, ස්වාමින්වහන්සේ අපට ප්‍රේම කරන අතර, අප පසුතැවිලිවී උන්වහන්සේ වෙතට නැවත හැරී ඒම උන්වහන්සේට අවශ්‍යවී තිබේ. ස්වාමින්වහන්සේට ඇදහිලිවන්තව සිටීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්.**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1. "මම පූජාවට නොව දයාවට කැමැත්තෙමි" (හොෂෙයා 6:6)**

හොෂෙයා 6:6 සවාමින්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට මෙසේ කියන සේක, "මම පූජාවට නොව කරුණාවට කැමැත්තෙමි; දවන පූජාවලට වඩා දෙවියන්වහන්සේ හැඳින ගැනීමටත් කැමැත්තෙමි." පොළොවේ උන්වහන්සේගේ මෙහෙයේදී, ඵරිසිවරුන්ගේ විවේචනයට පිළිතුරු වශයෙන් ක්‍රිස්තුස් වහන්සේ මෙම පදයට දෙවරක් යොමු වූ සේක. (මතෙව් 9:13; 12:7.) (මතෙව් 9:10–13; 12:1–8), මෙම සඳහන් කිරීම් දෙකේ සම්බන්ධය පරීක්ෂා කිරීමෙන් පසු, මෙම පදයෙහි අර්ථය සාකච්ඡා කරන්න.

**2. "අනේ ඉශ්‍රායෙල් නුඹ ලානුඹලාම විනාශ කර ගත්හ." (හොෂෙයා 13:9)**

හොෂෙයාගේ මෙහෙය තුලදී, අෂූර්වරු විසින් උතුරු රාජධානියට (ඉශ්‍රායෙල්) පහර දී, එහි ප්‍රතිඵලය වශයෙන් රාජධානිය විනාශ කොට ජනතාව වහල් බවට ගත්තේය. ඇත්ත වශයෙන් ඉශ්‍රායෙල් විනාශයට අෂූර්වරුන් වගකිය යුතුය. නමුත් ස්වාමින්වහන්සේ මෙසේ කීසේක, "අනේ ඉශ්‍රායෙල්, නුඹ නුඹලාම විනාශ කර ගත්හ" (හොෂෙයා 13:9).

- ඉශ්‍රායෙල් තමුන්ම විනාශ කර ගත්තේ කුමන අදහසකින්ද? ඔවුන්ගේ ජාතිය විනාශ වූවාට පසු ගැලවීම උදෙසා ඉශ්‍රායෙල්ගේ එකම බලාපොරොත්තුව කුමක්ද? (හොෂෙයා 13:9–10; 14:1.) යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අනුගමණය කිරීමෙන්, ලෞකික හා ආත්මික විනාශයෙන් අපව ආරක්ෂා වන්නේ කෙසේද?

**3. පසුතැවීම**

*පවුල් නිවාස සැන්දෑ වීඩියෝ අතිරේකයේ* (5x736) මිනිත්තු හයක කොටසක් වන "පසුතැවීම: තව පරක්කු නැත" යන්න තිබේ නම්, එය නුඹට පෙන්වීමට වුවමනා වෙනවා ඇත.

# දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන්ට උන්වහන්සේගේ රහස් එළිදරව් කරනසේක

35
වෙනි පාඩම

*ආමෝස් 3:7–9; යොවෙල් 2–3*

**අරමුණ** 

පසු දවස් වලදී ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ රහස් උන්වහන්සේගේ අනාගතවක්තෘ- වරුන්ට එළිදරව්කරන අතර උනවහන්සේගේ ආත්මය සියළු ජනතාව මත වගුරුවන බව පංති සාමාජිකයින්ට ඉගැන්වීමටය.

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඥාවෙන් කියවන්නඃ

   අ. ආමෝස් 3:6–7. ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ මෙහෙකරුවන් වූ අනාගත වක්තෘවරුන්ට, උන්වහන්සේගේ රහස් එළිදරව් කරන බව ආමොස් උගන්වයි.

   ආ. ආමෝස් 7:10–17; 8:11–13; 9:8–15. ආමෝස් අනාගතවක්තෘවරෙයෙකු වීමට දෙවියන් වහන්සේගෙන් කැඳවීම ලබයි (7:10–15). ඉශ්‍රායෙල් වහල්භාවය සහ විසිරීම ගැන අනාවැකි පළ කරයි (7:16–17; 9:8–10). ස්වාමීන්වහන්සේගේ වචනය ඇසීමේ පිපාසයක් එහි ඇතිවන බවට අනාවැකි පළ කරයි (8:11–13). අන්තිම පසු දවස් වලදී ඉශ්‍රායෙලය මහත් සහ සමෘධිමත් ජනතාවක් මෙන් පිහිටුවන බවට ඔහු අනාවැකි පළ කරයි (9:11–15).

   ඇ. යොවෙල් 2; 3:16–17). අන්තිම පසු දවස්වල යුද්ධ හා විපත්ති ගැන යොවෙල් අනාවැකි පළ කරයි (2:1–11). ජනතාවට පසුතැවිලි වීමට ඔහු කියයි (2:12–14; ජෝසෆ් ස්මිත්ගේ 13 සහ 14 යන පදවල, ස්වාමීන්වහන්සේ නොව, ජනතාව පසුතැවිලි වීම පහදා දෙන බව සිහිතබා ගන්න). පසු දවස් වලදී ස්වාමීන්වහන්සේ ජනතාවට ආශිර්වාද කරන අතර උන්වහන්සේගේ ආත්මය ඔවුන් පිට වගුරවන බවට යොවෙල් එළිදරව් පළ කරයි (2:15–32; 3:16–17).

2. අමතර කියවීම්ඃ ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:41; දහම සහ ගිවිසුම 1:14–28, 37–38.

3. ක්‍රියාකාරීත්වයට යොමු වීමේ දෙවැන්න ඔබ භාවිතා කරනවා නම්, ගීතිකා කිරීමට සංගීතය සම්බන්ද කරගැනීම පිණිස පිළියෙල කිරීමට ඔබට උවමනා වෙනවා ඇත. මෑතකදී අනාගතවක්තෘකෙනෙකු දුන් උපදෙස් පංති සාමාජිකයෙකු ලවා කෙටියෙන් බෙදාගැනීමට ආරාධනා කිරීමටද ඔබට වුවමනා වෙනවා ඇත.

4. හැකිනම් ජීවමාන අනාගතවක්තෘගේ පිංතූරයක් ලබාගන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම**

පාඩම පටන්ගැනීමට, පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනාවෙනවා ඇත. පංතියට ඉතාම සුදුසු ක්‍රියාකාරීත්වය තෝරාගන්න.

1. පහත සඳහන් කථාන්තරය පංති සාමාජිකයින් සමග බෙදාගන්නඃ

   "මම තරුණ බිරිඳක් සහ මවක්ව සිටින විට මගේ සැමියා ගුවන් හමුදාවේ සේවය කළේය. නව් යෝක්හි දූපතෙහි හමුදා නිවාස සංකීර්ණයක අපි ජීවත්වුනෙමු. අපේ තරුණ ළමයි බලාගන්නා අතර රටේ නොයෙක් ස්ථාන වලින් පැමිණි අසල්වැසියන් නිතර මම බැහැදැක්කෙමි. දිනක් අසල්වැසියෙකු සමග අපගේ විශ්වාසය ගැන කථාකරන විට, පසු දවස් වල ශුද්ධවනතයින්ගෙන් යුත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ තිබෙන වෙනස්කම් ගැන ඇයට කුතුහලයක් ඇති විය.

"නැවත පිහිටුවීම ගැන කෙටියෙන් මා ඇයට කී අතර, නැවත පිහිටුවන ලද යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ ජීවමාන අනාගතවක්තෘකෙනෙකු අද සිටින බව ඇයට කීවෙමි. ඇත්ත වශයෙන්ම මෙය ඇයගේ උනන්දුව අවදිකරවූ අතර, අනාගතවක්තෘ කීවේ කුමක්ද කියා දැනගැනීමට ඇයට අවශ්‍ය විය. දහම සහ ගිවිසුමද, නවීන එළිදරව් ගැනද ඇයට කීමට මා පටන්ගත් විට, ඇ මෙසේ කීවාය. 'නමුත් මෑතකදී ඔහු කීවේ කුමක්ද?' මහා සම්මන්ත්‍රණය හා අනාගතවක්තෘවරයාගේ පණිවුඩයක් සමග මාසික සඟරාවක් සභාවේ තිබෙන බව මම ඇයට කීවෙමි. එවිට, ඇය සත්‍යවශයෙන්ම උනන්දු වූ අතර, අළුත්ම පණිවුඩය මා කියවූයේ නැති බව කීමට මට ලැජ්ජා සිතුනි. අපගේ කථාව අවසන් කරමින් ඇය මෙසේ කීවාය, "ඔබට ජීවමාන අවාගතවක්තෘකෙනෙකු සිටින බව ඔබ පිළිගන්නා අතර, ඔහු කී දෙය ඔබ දන්නේ නැද්ද"? ජෙනට් හේල්ස් බෙකැම්, "Sustaining the Living Prophets," *Ensign,* මැයි 1996, 84).

- ජීවමාන අනාගතවක්තෘවරයා මෑතකදී කුමක් කීවේද කියා යමෙකු ඇසූ විට, ප්‍රශ්නයට පිළිතුර දීමට ඔබට හැකිවේද?

  ජීවමාන අනාගතවක්තෘවරයාට සවන්දෙමින් අනුගමණය කිරීමේ වැදගත්කම මෙම පාඩමෙන් අවධාරණය කරන බව පහදා දෙන්න.

2. "අනාගතවක්තෘ වෙනුවෙන් අහෝ දෙවිඳුනි ඔබට අපි තුති පුදමු." (ගීතිකා අංක 19) යන ගීතිකාව ගායනා කිරීමට පංති සාමාජිකයින්ට කියන්න. අපගේ ජීවමාන අනාගතවක්තෘවරයාගේ උපදෙස් අප අධ්‍යනය කිරීම වැදගත් බව පහදා දෙන්න. මෑතකදී ඔහු දුන් උපදෙස් සමහරක් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න. නැතහොත් අනාගතවක්තෘවරයා මෑතකදී දුන් යම් උපදෙසක්, කෙටියෙන් නැවත බැලීමට පැවරුමක් දුන් පංති සාමාජිකයෙකුට ආරාධනා කරන්න.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ අදාළකරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළකරගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

යෙරුසලමේ දකුණු කරයේ කුඩා නගරයක් වූ තෙකෝවාහි එඬේරෙකි ආමෝස්. ක්‍රි:පූ 800 සිට 750 දක්වා, ඉශ්‍රායෙල් රාජධානියේ ජනතාවට ඔහු මෙහෙකළේය. ජනතාවෙන් බොහෝ කොටසක් ඇදහිල්ලෙන් වැටී ගිය අය වේ. ඔවූහු වස්තුවට ආශාකළ අතර දිළිඳුන්ව පීඩා කළෝය. ඔවුන් ඉතා දැඩි වූ අතර සාගතයට හෝ වසගතයට පවා ඔවුන්ව නිහතමානී කිරීමට නොහැකි විය. ආමෝස් ජනතාවගේ පව් ගැන ඔවුන්ගේම මූණට කී විට, වඩාත් දරුණු දඬුවම් ගැන ඔහු අනාවැකි පළකළේය. කෙසේවෙතත්, "ස්වාමීන්වහන්සේ සොයපල්ලා එවිට නුඹලා ජීවත්වන්නහුය" (ආමෝස් 5:6) යයි අවවාදකරමින්, පසුතැවිලි වන යම් අයෙකු පවිත්‍ර කිරීමට දෙවියන්වහන්සේ මහත් සේ ආශාවන බව ඔවුන්ට ඔහු පැහැදිලි කළේය. පසු දවස් ගැනද ආමෝස් අනාවැකි කීවේය.

අනාගතවක්තෘ යොවෙල් යුදා රාජධානියේ ජනතාවට මෙහෙකළේය. ඔහු ජීවත් වූ කාලය නියම වශයෙන්ම අප නොදන්නා නමුත්, ඔහුගේ අනාවැකි අපට විශේෂයෙන්ම වැදගත් වන්නේය. මක්නිසාද එයින් බොහෝමයක් පසු දවස් ගැන සම්බන්ධ නිසාය. පසු දවස් වලදී, හමුදාවෙන් සහ දෙවියන්වහන්සේගේ විනිශ්චයෙන් පැමිණෙන විනාශය සංකේතවත් කිරීමට, ගිල දමන පළඟැටි සමූහයකගේ බලවත් නිරූපණයක් යොවෙල් භාවිතා කළේය. ස්වාමීන් වහන්සේ "මාංශමය වූ සියල්ලන් කෙරෙහි [උන්වහන්සේගේ] ආත්මය වගුරුවන්නේය" යන්න කලින් දැකීමෙන්, පසු දවස් වල මහත් ආශිර්වාද ගැනද යොවෙල් අනාවැකි කීවේය (යොවෙල් 2:28).

1. **උන්වහන්සේගේ මෙහෙකරුවන් වූ අනාගතවක්තෘන්ට උන්වහන්සේගේ රහස් ස්වාමීන් වහන්සේ එළිදරව් කරන බව ආමෝස් උගන්වයි.**

ආමෝස් 3:6–7 උගන්වා සාකච්ඡා කරන්න.

- ස්වාමීන්වහන්සේගේ වචනය අද අපට ඇසෙන්නේ කෙසේද? අනාගතවක්තෘන්ගේ වැදගත්කම ගැන අනාගතවක්තෘ ආමෝස් ඉගැන්වූයේ කුමක්ද? (ආමෝස් 3:7 බලන්න.) ආමෝස් 3:6–7, පාද සටහන් 6ඕ සහ 7 බලන්න; ජෝසෆ් ස්මිත්ගේ පරිවර්තනයෙහි වෙනස්

කළ වචන දෙක මොනවාද? (ජෝසප් ස්මිත්ගේ පරිවර්තනයේ 6 පදයේ කළේය යන වචනය වෙනුවට දැනගත්තේය කියාද, 7 පදයේ තෙක් යන වචනය වෙනුවට නමුත් යන වචනය යොදා ඇත.) එම ඡේදයේ අර්ථය මෙම වෙනස් කිරීම පැහැදිලි කළේ කෙසේද? අපගේ ප්‍රයෝජනය පිණිස සවාමින්වහන්සේගේ රහස් අනාගතවක්තෘන්ට දැන්වීම ජෝසප් ස්මිත්ගේ පරිවර්තනයට නිදසුනකි.

- අනාගතවක්තෘන්ගේ පණිවුඩ වලට අප ගරු කළ යුතු බවට දහම සහ ගිවිසුම 1:37–38 අපට උගන්වන්නේ කුමක්ද? (ජීවමාන අනාගතවක්තෘවරයෙකුගේ පිංතූරයක් පෙන්වන්න.) දහම සහ ගිවිසුම 21:4–5 වාර්ථා කර තිබෙන පරිදි, සභාව සංවිධානය කළ දිනයේදී, ස්වාමින්වහන්සේ අපට දුන් උපදේශය සහ ආඥාව කුමක්ද? ශුද්ධවරයින් මෙය කළහොත්, උන්වහන්සේ පොරොන්දු වූ ආශිර්වාද මොනවාද? (ඩී සහ සී 21:6 බලන්න.) අනාගත වක්තෘවරුන්ගේ උපදෙස්වලට ඔබ කීකරු වන විට, ඔබේම ස්වකීය ජීවිතය තුල මෙම පොරොන්දුව ඉටුවීම ඔබට පෙනෙන්නේ කෙසේද?

**2. පැරණි සහ පසු දවස් වල ඉශ්‍රායෙල් ගැන ආමෝස් අනාවැකි කීවේය.**

ආමෝස් 7:10–17; 8:11–13; 9:8–15 උගන්වා සාකච්ඡා කරන්න.

- ඉශ්‍රායෙල් රාජධානියෙහි පූජකයෙකු වූ අමශියා, ආමෝස්ට දේශය අතහැර යෑමට කීවේ කුමක් නිසාද? (ආමෝස් 7:10–17 බලන්න. ජනතාවට හා ඔවුන්ගේ රජුට නපුරක් සිදුවන බවට ආමෝස් අනාවැකි පළ කළේය. ඔවුන් කරන නපුරු දේවල් ගැන සත්‍ය ඇසීමට, අමශියා සහ ඔහුගේ ජනතාවට අවශ්‍ය නොවීය.) අනාගතවක්තෘ ආමෝස් ගැන 14 වෙනි පදයේ සිට 17 දක්වා අපට උගන්වන්නේ කුමක්ද? (ඔහුට අවංකකම සහ ධෛර්‍යය තිබුනේය. ස්වාමින් වහන්සේ ඔහුට කීදෙය කීමට ඔහුට වෙනස් කිරීමට නොහැකිවූ අතර, ඔවුන් පසුතැවිලි නොවන්නේ නම්, ජනතාවට නපුරක් පැමිණෙන බවට ඔහු නොකඩවා අනාවැකි පළ කළේය.)

- සෑම වකවානුවකම, අනාගතවක්තෘන්ගේ පණිවුඩ බොහෝ ජනයා ප්‍රතික්ෂේප කළේ හෝ නොසලකා හැරියේ කුමක් නිසාද? අනාගතවක්තෘන්ගේ උපදෙස් ඉශ්‍රායෙල් ප්‍රතික්ෂේප කළ හොත් එහි ප්‍රතිඵලය වශයෙන් ආමෝස් පළ කළ අනාවැකි කුමක්ද? (ආමෝස් 8:11–13 බලන්න.ප්‍රතිඵලය වන්නේ ආත්මික සාගතය හෝ ඇදහිල්ලෙන් වැටී යෑමය.) අනාගත වක්තෘන්ගේ උපදෙස් අප ප්‍රතික්ෂේප කළහොත් පෞද්ගලිකව අපගේ ප්‍රතිඵල මොනවාද?

  පරණ ගිවිසුමේ අන්තිම අනාගතවක්තෘ වූ මලාකීගේ කාලයෙන් පසු, ආමෝස්ගේ අනාවැකියක් වූ ආත්මික පිපාසය ඉශ්‍රායෙල් දරුවන් අතර ඉටු විය.යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මාර්ගය පිළියෙල කිරීමට යොහාන් බව්තීස්තට කැඳවීම ලැබී හරියටම අවුරුදු 400 පසුවූ විට මෙම කාලපරිච්ඡේදය අවසාන විය. ආමොස්ගේ අනාවැකියකට අදාළ වන මහත් වූ ඇදහිල්ලෙන් වැටීයාම, එනම් ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේරිතයින්ගේ මරණයෙන් පසු, සියවස් ගණනාවක ආත්මික අන්ධකාරය, අනාගතවක්තෘ ජෝසප් ස්මිත් ශුභාරංචිය නැවත පිහිටුවීම මගින් එය අවසන් විය.

- ස්වාමින්වහන්සේගේ වචනය නැතිවීම, සාගතයකට සමාන කිරීමට හැකි වන්නේ කුමන මාර්ග වලින්ද? ස්වාමින්වහන්සේගේ වචනය සොයමින් ජනතාව අද "මුහුදෙන් මුහුදට" යෑම ගැන ඔබට පෙනෙන සාක්ෂි මොනවාද? නැවත පිහිටවනු ලැබූ ශුභාරංචියේ ආශිර්වාද තිබීම උත්සවයකට සමාන කළ හැකිවන්නේ කෙසේද?

- අපේක්ෂාවේ කුමන පණිවුඩයකින් ආමෝස්ගේ පොත අවසන්වන්නේද? (ආමෝස් 9:8–15 බලන්න. ඉශ්‍රායෙල් දරුවන් සම්පූර්ණයෙන්ම විනාශ නොවන්නේය. සියළු ජාතීන් අතර ඔවුන්ව විසුරුවා හරිනුලබන්නේය. අන්තිම දවස් වලදී, ඔවුන්ව ශ්‍රේෂ්ඨ වූද සමෘධිමත් වූද ජනතාවක් ලෙසට නැවත පිහිටවනු ලබන්නේය. ඉශ්‍රායෙල් ගෘහයේ එක් එක් සාමාජිකයෙකු ගැනම සැලකිළිමත් වන බව 9 වෙනි පදයේ අවසානයේ ස්වාමින්වහන්සේ පැහැදිලි කරන බව සිහි තබාගන්න.)

**3. පසු දවස් වලදී, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ජනතාවට ආශිර්වාද කරමින්, උන්වහන්සේගේ ආත්මය ඔවුන් මත වගුරුවන බවට යොවෙල් අනාවැකි පළ කරයි.**

යොවෙල් 2; 3:16–17 උගන්වා සාකච්ඡා කරන්න.

දෙවෙනි ඊමට පෙර පසු දවස් වලදී ඇතිවන සිද්ධීන් සමහරක් අනාගතවක්තෘ යොවෙල් විස්තර කළේය. ජනතාවගේ දුෂ්ඨකම් නිසා මහත් විනාශයක් කරමින් විශාල හමුදාවක් ඉදිරියට ගමන් කරන බව ඔහු විස්තර කළේය. (යොවෙල් 2:1–11).පසුතැවිලිවී ස්වාමින්වහන්සේ වෙතට හැරීමට ඔහු ඉශ්‍රායෙල්ට කීවේය. දෙවියන්වහන්සේ ඔවුන් මධ්‍යයෙහි සිටින බවට ඔහු පොරොන්දු වූ අතර, ප්‍රතිඵලයක් වශයෙන් ඉශ්‍රායෙල් මුදවා විජයග්‍රාහී වන බව ඔහු විස්තර කළේය. (යොවෙල් 2:12–32).

- *යොවෙල් 2:12–32 සහ යොවෙල් 3:16*–17 හුණු ලෑල්ලේ ලියන්න. මෙම කොටස් නැවත බලා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සොයාගැනීමට පංති සාමාජිකයින්ට කියන්නඃ පසු දවස් වල ජීවත්වෙන අයට ස්වාමින්වහන්සේ දෙන ලද ආරාධනා මොනවාද?

  ආරාධනා යන වචනය හුණු ලෑල්ලේ ලියන්න. පංති සාමාජිකයින් වාක්‍ය ඛණ්ඩ සඳහන් කරන විට, එක් එක් ආරාධනාවක ප්‍රධාන වචනය ලියන්න. මෙම වාක්‍යඛණ්ඩ ඔවුන්ගේ ශුද්ධ වූ ලියවිලි වල ලකුණු කිරීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න. සඳහන් කළ හැකි සමහර ආරාධනා පහත දැක්වේඃ

  *ආරාධනා*

  අ. "නුඹලාගේ මුළු සිතින්ම මා වෙතට හැරී වරෙල්ලා" (යොවෙල් 2:12).
  ආ. "සිත් ඉරාගනිල්ලා" (යොවෙල් 2:13 හිත මැඩපවත්වාගෙන හෝ නිහතමානීව, යනු එහි අර්තයයි).
  ඇ. "නුඹලාගේ දෙවි වූ ස්වාමින්වහන්සේ වෙතට හැරියල්ලා" (යොවෙල් 2:13).
  ඈ. "ශුද්ධ වූ සභාවක් පවත්වාපල්ලා" (යොවෙල් 2:16).
  ඉ. "එම්බා දේශය, භය නොවී, ප්‍රීති සන්තෝෂ වෙයන්න" (යොවෙල් 2:21).

- අපගේ මුළු හදවත් වලින්ම ස්වාමින්වහන්සේ වෙතට හැරීමේ මෙම ආරාධනා යෝජනා කරන්නේ කුමක්ද? ස්වාමින්වහන්සේගේ පොරොන්දු ආශිර්වාද වලට සුදුස්සන් වීම සඳහා අප පවිත්‍ර වීම පිණිස අපට කුමක් කළ හැකිද?

- යොවෙල් 2:12–32 සහ යොවෙල් 3:16–17 නැවතත් බලා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සොයාගැනීමට පංති සාමාජිකයින්ට කියන්න. පසු දවස් වලදී, උන්වහන්සේව අනුගමණය කරන අයට ස්වාමින්වහන්සේ පොරොන්දු වී තිබෙන්නේ කුමන ආශිර්වාදයන්ද?

  ආශිර්වාද යන වචනය රටහුණු ලෑල්ලේ ලියන්න. පංති සාමාජිකයින් වාක්‍යඛණ්ඩ සඨහන් කරන විට, එක් එක් ආශිර්වාදයක ප්‍රධාන වචනය රටහුණු ලෑල්ලේ ලියන්න. ඔවුන්ගේ ශුද්ධ වූ ලියවිලි වල මෙම වාක්‍යඛණ්ඩ ලකුණු කිරීමට පංති සාමාජිකයින්ටද වුවමනා වෙනවා ඇත. සඳහන් කිරීමට හැකි සමහර ආශිර්වාද පහත දැක්වේඃ

  *ආශිර්වාද*

  අ. "උන්වහන්සේ දයාවන්ත වූ අනුකම්පාවෙන් පූර්ණවූ, ඉවසිලිවන්තවූ, ඉතා කරුණාවන්තවූ, කෙනෙක්ය, උන්වහන්සේ නුඹගේ විපත්තිය ඉවතට හරවනසේක" (ජෝසෆ් ස්මිත් පරිවර්තනය, යොවෙල් 2:13; බලන්න පාද සටහන් 13ඕ).
  ආ. ස්වාමින්වහන්සේ "උන්වහන්සේගේ සෙනගට අනුකම්පා කළ සේක" (යොවෙල් 2:18).
  ඇ. ස්වාමින්වහන්සේ උතුරු සමුදාව (1–11 පද වල විස්තර කරන ලදී.) නිසරු පාළු දේශයකට ඇත්කරන සේක. (යොවෙල් 2:20).
  ඈ. "නුඹලා වනාහී කෑම කා තෘප්තියට පැමිණෙන්නෝය" (යොවෙල් 2:26).
  ඉ. "මා ඉශ්‍රායෙල් අතරේ සිටමි…මාගේ සෙනග කිසි කලෙකත් ලජ්ජාවට නොපැමිණෙන්නෝය" (යොවෙල් 2:27).
  ඊ. "මාංසමය වූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරවන්නෙමි" (යොවෙල් 2:28; 29 පදයද බලන්න).

උ. යෞවනයෝද මහල්ලෝද අනාගත වාක්‍ය කියන්නෝය, ස්වප්න දකින්නෝය, දර්ශන පෙනෙනවා ඇත (යොවෙල් 2:28).

ඌ. "ස්වාමින්වහන්සේගේ නම කියා යාච්ඤා කරන කවුරු නමුත් ගැලවෙනවා ඇත" (යොවෙල් 2:32).

එ. "ස්වාමින්වහන්සේ සියොන්හි සිට ගර්ජනා කොට, යෙරුසලමේ සිට තමන්ගේ සිත පවත්වන සේක" (යොවෙල් 3:16).

ඒ. "ස්වාමින්වහන්සේ තමන්ගේ සෙනගගේ රක්ෂා ස්ථානයක් වන්නේය" (යොවෙල් 3:16).

ඔ. "ස්වාමින්වහන්සේ...ඉශ්‍රායෙල් පුත්‍රයන්ට බලකොටුවක්ව සිටින සේක" (යොවෙල් 3:16).

ඕ. "මෙසේ ස්වාමින්වහන්සේ වන මා මාගේ ශුද්ධ කන්ද වන සියොන්හි වසන නුඹලාගේ දෙවියන්වහන්සේ බව නුඹලා දැනගන්නහුය" (යොවෙල් 3:17).

- උන්වහන්සේගේ ගිවිසුමේ ජනතාවට ස්වාමින්වහන්සේගේ බැඳීම ගැන, උන්වහන්සේගේ ශුද්ධවරයන් වෙනුවෙන් උන්වහන්සේගේ බලය ගැන උන්වහන්සේගේ දයාව සහ ප්‍රේමය ගැන, අන්තිම දවස් වලදී අපගේ අවස්ථාවන් ගැන මෙම ආශිර්වාද අපට උගන්වන්නේ කුමක්ද?

- පසු දවස් වලදී සියළුම ජනතාව මත ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ ආත්මය වගුරුවන බවට යොවෙල්ගේ ප්‍රකාශය (යොවෙල් 2:28–29) සාගතය ගැන ආමෝස් කළ විස්තරය සම්පූර්ණයෙන්ම විරුද්ධය (ආමෝස් 8:11–12). යොවෙල්ගේ අනාවැකිය මොරෝනි දේවදූතයා ජෝසප් ස්මිත්ට උපුටාදක්වමින්, එය තවම ඉටු නොවූ බවත් ලඟදීම එය ඉටු වන බවත් ඔහුට කීවේය (ජෝසප් ස්මිත්— ඉතිහාසය 1:41). අද තරුණ හා වැඩිහිටි අයගේ ජීවිත තුල මෙම වැගිරීම ගැන ඔබ දැක ඇති නිදසුන් මොනවාද?

---

**අවසානය.**

බොහෝ අනාවැකි ඉටුවෙමින් පවතින, අපට මගපෙන්වීමට ජීවමාන අනාගතවකතෘවරයෙකු සිටින මෙම පසු දවස්වල ජීවත් වීම විශාල ආශිර්වාදයක් බව අවධාරණය කරන්න. ජීවමාන අනාගතවක්තෘවරයාගේ වචන යාච්ඤාවෙන් අධ්‍යයනය කරමින් ඔවුන්ගේ ජීවිත වලට එම උපදෙස් අදාළ කරගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. සයොන්හි පහසු ගෙන නොසැලකිල්ලෙන් සිටීම**

- "සියොන්හි පහසුගෙන නොසැලකිල්ලෙන් සිටීම" ගැන ආමෝස් අනතුරු ඇඟෙව්වේය (ආමෝස් 6:1). සියොන්හි පහසුගෙන නොසැලකිල්ලෙන් සිටීම යන්නෙහි අර්ථය කුමක්ද? (2 නිෆායි 28:19–24, 27, 29–30 බලන්න.) සියොන්හි පහසුගෙන අද අප නොසැලකිල්ලෙන් සිටින්නේ කුමන මාර්ග මගින්ද? මෙයින් ආරක්ෂා වීමට අපට හැකිවන්නේ කෙසේද?

**2. "මාංසමය වූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරවන්නේය" (යොවෙල් 2:28).**

- ගමනාගමනය සහ මාර්ග සම්බන්ධව සියළුම අභිනව නිපදවීම් ඇතිවූයේ ශුභාරංචිය නැවත පිහිටුවීමෙන් පසුවය. යොවෙල් 2:28–29, යොවෙල්ගේ අනාවැකිය ඉටුවීමට මෙම සංවර්ධනය උපකාර වූයේ කෙසේද? අපේ කාලයේදී ස්වාමින්වහන්සේගේ ක්‍රියා වැඩිදුරට ගෙන යෑමට මෙම සංවර්ධනය උපකාරකරන්නේ කෙසේද?

  ස්වාමින්වහන්සේගේ ක්‍රියා ඉටුකිරීම පිණිස මෙම නිපදවීම් විශාලලෙස ප්‍රයොජනවත්වන බව පංති සාමාජිකයින්ට තේරුම් ගැනීම පිණිස වැඩිහිටි ජෝසප් ස්මිත්ගේ පහත සඳහන් ප්‍රකාශය කියවීමට ඔබට වුවමනා වෙනවා ඇත.

  "ශුභාරංචිය නැවත පිහිටුවුයේ නැතිනම්, ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් යේසුස් සභාව සංවිධානය නොකළේ නම්, ගුවන්විදුලිය නැත, අහස් යානා නැත, පුදුමාකාර බෙහෙත් වර්ග, රසායන ද්‍රව්‍ය, විදුලි බලය යනාදී ලෝකයාට ප්‍රයෝජනවත් වෙනත් බොහෝ දේවල්ද නිපදවීමක් නොවන බව මම විශ්වාස කරමි. .එම තත්වය උඩ මෙම ආශිර්වාද

වැළකීයන්නට ඉඩ තිබුනි, මක්නිසාද කාලවල සම්පූර්ණකමේ නියමය අනුව, ශුභාරංචිය නැවත පිහිටුවීම හා සභාව සංවිධානය කිරීම එහි කේන්ද්‍ර ස්ථානය වන අතර ස්වාමීන්වහන්සේගේ ආත්මය ලොව පුරා පැතිරෙන්නේ එය තුලින්ය. ස්වාමීන්වහන්සේගේ පෙළඹවීම මිනිසුන්ගේ සිත්තුලට ගොස් ග්‍රහණය කරමින්, ඔවුන් නොදන්නා නමුත්, ස්වාමීන්වහන්සේ විසින් ඔවුන්ට මගපෙන්වනලදී, මේ ආකාරයෙන් උන්වහන්සේගේ සේවයට, උන්වහන්සේගේ අරමුණු වලට හා උන්වහන්සේගේ ධර්මිෂ්ඨ කමට යථා කාලයේදී පොළොවේ අති ශ්‍රේෂ්ඨයන්ට උන්වහන්සේ මේවා ගෙන එනසේක.

"…පැරණි කාලයේ ජීවත් වූ මිනිසුන්ට වඩා අද ජීවත්වන මිනිසුන්ට විශිෂ්ඨ දැනීමක් තිබුන නිසා හෝ අහම්බෙන් මෙම නිපදවීම් ඇතිවූයේ යයි මම මොහොතකටවත් සිතන්නේ නම් නැහැ. නියම කාලය පැමිණි නිසාත්, ස්වාමීන්වහන්සේගේ කැමැත්ත නිසාත්, ස්වාමීන්වහන්සේගේ ආත්මය මාංසමය වූ සියල්ලන් කෙරෙහි වැගුරූ නිසාත් මේවා පැමිණ ඇත, තවද පැමිණෙන්නේය" (Conference Report තුලින්, ඔක්තෝ. 1926, 117).

# සයෝනයේ තේජස රක්ෂා ස්ථානයක් වන්නේය

36
වෙනි පාඩම

*යෙසායා 1–6*

---

**අරමුණ**

ශුද්ධ වූ ස්ථාන වල සිටිමින් ලෝකයේ දුෂ්ඨකම් වලින් වැළකීමටද, යෙසායාගේ සේවය කිරීමට කැමැත්ත තුලින් ශක්තිය ලබා ගැනීමට උපකාරවීම පිණිස පංති සාමාජිකයින් දිරිගැන්වීමටය.

---

**සූදානම**

1. පාඩමේ සාකච්ඡා කර තිබෙන යෙසායා 1–6 යේ කොටස් යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.
2. අමතර කියවීම්: 2 නීෆායි 11.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

ශුද්ධ වූ ලියවිලි වල මුළුල්ලේම බොහෝ විටදී එකම අදහස ස්වාමින්වහන්සේ සමහර විට නැවත නැවතත් කියන බව පහදා දෙන්න. අන්තිම දවස්වලදී පරීක්ෂාවන් විඳදරාගැනීම පිණිස උපකාර වීමට ස්වාමින්වහන්සේ අපට දී තිබෙන උපදෙස්, පංති සාමාජිකයින්ට සොයාගැනීමට පහත දැක්වෙන සඳහන්කිරීම් රටහුණු ලෑල්ලේ ලියන්න.

දහම සහ ගිවිසුම 45:32
දහම සහ ගිවිසුම 87:8
දහම සහ ගිවිසුම 101:22

මෙය රටහුණු ලෑල්ලේ ලියන්න *"ශුද්ධ වූ ස්ථාන වල සිටගන්න, නොසෙල්වෙන්න."*

- මෙම වාක්‍යඛණ්ඩයේ අදහස ඔබ සිතන අන්දමට කුමක්ද? (සියළුම කාලවලදී සුදුසුව සිටීම, නිතර ශුද්ධ වූ ස්ථාන වල සිටීමේ ආශාව, අශුද්ධ ස්ථාන වලට නොයෑමට තෝරා ගැනීම, සත්‍ය හා ශුද්ධවන්තභාවය රැකීමෙන් දෙවියන් වහන්සේ ඔබට මගපෙන්වීම කෙරෙහි විශ්වාසය තැබීම, යනාදිය පිළිතුරු වලට අඩංගු විය හැකිය.)

ශුද්ධ වූ ස්ථානවල සිටගැනීමට ස්වාමින්වහන්සේ අපට අණකිරීම සහ එම ශුද්ධ වූ ස්ථාන මොනවාද යන්න පංති සාමාජිකයින්ට සොයාගැනීමට මෙම පාඩමෙන් හැකිවන බව පහදා දෙන්න.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීමට සහ ඒවා අදාළකරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට එදිනෙදා ජීවිතයට ඒවා අදාළකරගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ආත්මික ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිමත්කරන්න.

"යෙසායාගේ වදන් විශිෂ්ඨ වන්නේය" යෙසායාගේ අනාවැකි සොයාබැලීමට නීෆායිවරුන්ට පණතක් දෙමින් ගැලවුම්කරුවාණන් ප්‍රකාශ කළ සේක (3 නීෆායි 23:1). අලුත් ගිවිසුමේ මෝර්මන්ගේ පොත, සහ ගිවිසුමේ, වෙනත් අනාගතවක්තෘන්ගේ වචන වලට වඩා යෙසායාගේ අනාවැකි බොහෝ විට උපුටාදක්වන ලදී. ගැලවුම්කරුවාණන්ගේ පොළොවේ දූතමෙහෙය ගැනද, ඉශ්‍රායෙල්ගේ දුෂ්ඨකම් නිසා සිදුවන විනාශය ගැනද, පසු දවස් වල ඉශ්‍රායෙල්ගේ දූතමෙහෙය සහ ඉරණම යන බොහෝ දේවල් ගැනද ඔහු අනාවැකි පළකළේය.

1. **අන්තිම දවස් වල ලෝකයේ තත්වය ගැන යෙසායා විස්තර කරයි.**

- ඔහුගේ කාලය වන, මහත් දුෂ්ඨකමේ කාලයටද, අපගේ කාලය වන දෙකටම, යෙසායාගේ බොහෝ අනතුරු ඇඟවීම් සහ අනාවැකි අදාළ වෙයි. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි වල විස්තර කර තිබෙන තත්වය, අද ලෝකයේ පෙනෙන්ට තිබෙන්නේ කෙසේද? (සඳහන් කිරීම් රටහුණු ලෑල්ලේ ලිවීමටද පංති සාමාජිකයින් ඒවා සොයාගැනීමද ඔබට වුවමනා වෙනවා ඇත.)

  අ. යෙසායා 1:3–5 (ස්වාමින්වහන්සේට විරුද්ධව කැරළි ගැසීම)
  ආ. යෙසායා 1:11–15 (අර්ථයක් හෝ ඇදහීමක් නොමැති ආගමික උත්සව)
  ඇ. යෙසායා 2:7–8 (ස්වාමින්වහන්සේ වෙනුවට, ලෞකික දේවල්වලට සහ හමුදා රැකවරණයට නමස්කාර කිරීම; අශ්වයින් සහ රථ පැරණි කාලයේ යුද්ධ උපකරණ මෙන් භාවිත කළ බව සිහිතබාගන්න.)
  ඈ. යෙසායා 2:11–12 (උඩඟුකම)
  ඉ. යෙසායා 3:5 (වැඩිහිටියන්ට ගරු නොකිරීම හා අනිත් ජනතාව හෙළාදැකීම)
  ඊ. යෙසායා 3:9 (පාපයට ලැජ්ජා නැතිකම)
  උ. යෙසායා 3:14–15 (අසරණයන්ගෙන් ප්‍රයෝජන ගෙන ඔවුන්ව නොසලකාහැරීම)
  ඌ. යෙසායා 3:16–24 (ධර්මිෂ්ඨකම හා යහපත් පැවැත්ම වෙනුවට බාහිර ශාරීරික ඔපය කෙරෙහි සැලකිලිමත් වීම)
  එ. යෙසායා 5:8 (වඩ වඩාත් ලෞකික දේවල් ලබාගැනීමේ කෑදර ආශාව)
  ඒ. යෙසායා 5:11–12 (ස්වාමින්වහන්සේ සහ උන්වහන්සේගේ ක්‍රියාව නොසලකා, නිතර ලෞකික විනෝදය සෙවීම)
  ඔ. යෙසායා 5:20 (නපුරට යහපතය කියාද යහපතට නපුරය කියාද කීම)
  ඕ. යෙසායා 5:21 (දෙවියන්වහන්සේ වෙනුවට, තමන් කෙරෙහිම විශ්වාසය තැබීම)
  ක. යෙසායා 5:24 (දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ වචනය සුළු කිරීම)

- මෙම අනාවැකි අද ඉටුවේගන යන්නේ කෙසේද? (මෙම සමහර අනාවැකි වැඩිදුර සාකච්ඡා කිරීම පිණිස, ඉගැන්වීමේ අමතර අදහස් බලන්න.)

2. **ශුද්ධස්ථානයෙහි සිටීමට යෙසායා ඇදහිලිවන්තයින්ට උපදෙස් දෙයි.**

- යෙසායා විසින් සඳහන් කර තිබෙන ලෞකික තත්වයන්ගෙන් ආරක්ෂාව සලස්වන්නේ කුමන ස්ථානද?යෙසායා 4:5–6 සඳහන් ශුද්ධ ස්ථාන තුන මොනවාද?

  අ. සියොන් කන්දෙහි ජීවත් වන සෑම ස්ථානයක්ම (නිවෙස්)
  ආ. රැස්වීම් (ස්ටේක, කොට්ඨාශ, සහ ශාඛා; (ඩී සහ සී 115:5–6)
  ඇ. දේවස්ථානය (දේවමාළිගාව)

- ලෝකයේ දුෂ්ඨකම් වලින් ආරක්ෂාව සලසා දෙන නිවාස ශුද්ධස්ථානයක් වන්නේ කෙසේද? ස්ටේක, කොට්ඨාශ සහ ශාඛා ශුද්ධ සහ ආරක්ෂා ස්ථාන වන්නේ කෙසේද? දේවමාළිගාව ශුද්ධ සහ ආරක්ෂා ස්ථානයක් වන්නේ කෙසේද? ලෝකයේ දුෂ්ඨකම් වලට එරෙහිව මෙම ශුද්ධ ස්ථාන ඔබට ආරක්ෂා සහිත ස්ථානයක් වීමට සලස්වන්නේ කෙසේද?

  ශුද්ධ ස්ථානයේ සිටගන්න යන්න රටහුණු ලෑල්ලේ ලිවීමටත්, එයට යටින් 1. නිවාසඃ 2. ස්ටේක, කොට්ඨාශ සහ ශාඛාද; 3. දේවමාළිගා, යන්න ලිවීමට ඔබට වුවමනා වෙනවා ඇත. එක් එක් මාතෘකාව යටින් පංති සාමාජිකයින්ගේ අදහස් ලැයිස්තුගත කරන්න.

- මෙම ශුද්ධ ස්ථාන අප ආරක්ෂා කරගන්නා අන්දම විස්තර කිරීමට, යෙසායා 4:5–6 භාවිතා කරන ප්‍රකාශ මොනවාද?

  අ. "දවාලයේ දී ග්‍රීෂ්මයෙන් මුවාවීමට සෙවණක්"
  ආ. "රක්ෂා ස්ථානයක්"
  ඇ. "කුණාටුවෙන් සහ වර්ෂාවෙන් (සැඟවෙන ස්ථානයක් හෝ රක්ෂාවරණයක්)

- යෙසායාගේ ලියවිලි බොහෝමයක් මෝර්මන්ගේ පොතෙහි අඩංගුවී ඇත. යෙසායා 4:5 ට එකතුකර ඇති වචන සොයාගැනීම පිණිස, 2 නීෆායි 14:5 පංති සාමාජිකයින්ට කියවීමට

සලස්වන්න. (සයෝනය යන වචන එකතු කර ඇත.) මෙම පදය අප තේරුම්ගැනීමේදී එයට මෙම වචන එකතු කරන්නේ කුමක්ද?

- අන්තිම දවස් වල දේවමාළිගා ගැන යෙසායා 2:2–3 අඩංගු වී ඇති අනාවැකිය කුමක්ද? (දේවමාළිගාවවූ දෙවියන්වහන්සේගේ ගෘහයට බොහෝ ජනයා පැමිණෙන අතර, උන්වහන්සේගේ පණත් ඉගෙනගෙන, උන්වහන්සේගේ මාවත් වල ගමන් කිරීමට ඔව්හූ ආශාවූහ.) දේවමාළිගාව "ස්වාමින්වහන්සේගේ කන්ද" වශයෙන් යෙසායා විස්තර කළේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? (ස්වාමින්වහන්සේ සමග කථාකිරීමට සහ උන්වහන්සේගෙන් උපදෙස් ලබා ගැනීම පිණිස පැරණි අනාගතවක්තෘවරුන් කඳු මුදුන් වලට ගියහ. එහිදී උන්වහන්සේ ඔවුන්ට එළිදරව් දුන් සේක. එවැනිම අත්දැකීම් අදත් දේවමාළිගාවේදී අපට ලබා ගැනීමට හැකිය.)

### 3. පසු දවස් වල්දී ඉශ්‍රායෙල් එක්රැස්වීම යෙසායා විස්තර කරයි.

පසු දවස්වල ඉශ්‍රායෙල් එක්රැස්වීම, යෙසායා 5:26–29 යෙසායා විස්තර කරයි. ඔසවන ලද කොඩිය නම් පසු දවස් වල ශුද්ධවරයන්ගෙන් යුත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවය. ෂූ ගානාවා යනු සිව්රු හඬලනවා නැතහොත් කැඳවනවා වනාහි පොළොවේ ජාතීන්ට සභාවට එක්රැස් වීම පිණිස ආරාධනාවයි. මෙම එක්රැස් වීම වේගවත්ද බලවත්ද වන්නේය.

- ජාතීන් සභාවට එක්රැස් වීමේ අනාවැකිය අද ඉටු වෙමින් පවතින්නේ කෙසේද? (ලොව පුරා ධර්මදූතවරුන් යමින්, ශුභාරංචිය උගන්වමින්, සත්‍යය වෙතට ජනතාව එක්රැස් කරති.) මෙම අනාවැකිය ඉටුකිරීම පිණිස උපකාරී වීමට, අප එක් එක්කෙනාට කළ හැකි වන්නේ කුමක්ද?

### 4. අනාගතවක්තෘවරයෙකු වීම පිණිස ඔහුගේ කැඳවීමට යෙසායා කැමැත්තෙන්ම ප්‍රතිචාර දැක්වූයේය.

ස්වාමින්වහන්සේ යෙසාව දර්ශනයක් මගින් අනාගතවක්තෘකෙනෙකු බවට කැඳවූ අතර, ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ තේජසින් යෙසායා දුටුවේය. යෙසායා 6 මෙම දර්ශනය වාර්තාගතකර තිබේ.

- ස්වාමින්වහන්සේගේ තේජස යෙසායා විස්තර කළේ කෙසේද? (යෙසායා 6:1–4 බලන්න.) යෙසායා ස්වාමින්වහන්සේව දුටු විට, ඔහුගේ ප්‍රතිචාරය කුමක් වූයේද? යෙසායා 6:5 බලන්න. ස්වාමින්වහන්සේගේ අභිමුඛයෙහි සිටීමට යෙසායා නුසුදුසු බව ඔහුට හැඟුනේය.) උන්වහන්සේ අභියස යෙසායා පවිත්‍ර බවට සංකේතයක් වශයෙන් ස්වාමින්වහන්සේ පෙන්වූයේ කුමක්ද? (යෙසායා 6:6–7 බලන්න.) අනාගතවක්තෘවරයෙකු වීමට ස්වාමින්වහන්සේ යෙසායා කැඳවූ විට ඔහු ප්‍රතිචාරය දැක්වූයේ කෙසේද? (යෙසායා 6:8 බලන්න.)
- උන්වහන්සේගේ දරුවන්ට ගැලවීම ලබාදීම පිණිස අපගේ ස්වර්ගයේ වැඩ සිටින පියාණන්වහන්සේගේ සැලැස්ම ගෙනයෑමට ගැලවුම්කරුවාණන් වගකීම භාරගත් විට උන්වහන්සේ භාවිතා කළ එම වචනම, යෙසායා කැඳවීම භාරගත් විටදී භාවිතාකළේය (ආබ්‍රහම් 3:27). එයට සමාන වචන වලින් අපිද ස්වාමින්වහන්සේට පිළිතුරු දීමට අවශ්‍ය සමහර අවස්ථාවන් මොනවාද? (දූතමෙහෙයේ සේවයට අප කැඳවූ විට, සභාවේ සේවය කිරීමට අපට කී විට, අපහසු පරීක්ෂාවන් විඳදරා ගැනීමට අපට කී අවස්ථාවක යනාදිය පිළිතුරු වලට අඩංගු විය හැකිය.)
- 2 සිට 6 දක්වා පරිච්ඡේද ඇතුලත්ව යෙසායාගේ බොහෝ පරිච්ඡේද මෝර්මන්ගේ පොතෙහි වාර්තාගත වී තිබේ. ඔහුග් වාර්තාවල යෙසායාගේ ලිවීම් ඇතුලත්කිරීම ගැන අනාගතවක්තෘ නීෆායි ඉදිරිපත් කළ කරුණු මොනවාද? (2 නීෆායි 11:8 බලන්න.)
- ඔබට ප්‍රීතිය ලබා දෙන්නේ යෙසායාගේ මෙම පරිච්ඡේද වල කුමන පණිවුඩද? මෙම පරිච්ඡේද වල ඔබට කැමති යයි හැඟෙන ඉතාම වැදගත් පණිවුඩ මොනවාද?

---

අවසානය.

පසු දවස්වල බොහෝ දේවල් යෙසායාගේ වචන අපට උගන්වයි. ශුද්ධවූ ස්ථාන වල සිටීම සහ ලෝකයේ නපුරුකම් වලින් වැළකීමට, යෙසායාගේ උපදෙස් අධ්‍යයනය කිරීමෙන් අපට ඉගෙන ගැනීමට හැකිය .ඔහුගේ ආදර්ශය අනුගමණය කිරීමෙන්, ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණන්වහන්සේට, වඩාත් හොඳ මෙහෙකරුවන් වීමට අපට හැකි වේ.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**යෙසායා 1–6 යෙසායාගේ අනාවැකි තවදුරටත් සාකච්ඡා කිරීම**

*කිය වීමට සැලැස්වීම*

- යෙසායා 1:11, 16–17, අනුව ඉශ්‍රායෙල්වරුන්ගේ පූජාවන් ස්වාමීන්වහන්සේට පිළිගැනීමට නොහැකි වූයේ කුමක් නිසාද? (ඉශ්‍රායෙල්වරුන් බාහිරව ආගමාණුකූල වූවත්, හදවත් ඇතුලාන්තයෙන් ඔවුහු දෙවියන්වහන්සේගෙන් බොහෝ ඈත්ව සිටියහ. (මතෙව් 5:23–24; ද මොරොනි 7:6–9 බලන්න.) සමහර ජනයා හදවත ඇතුලාන්තයෙන් දෙවියන්වහන්සේගෙන් ඈත්ව සිටියත්, බාහිරව ආගමානුකූලව සිටීමට වෑයම් කරන්නේ කුමක් නිසාද? මෙවැනි කපටිකම් නිසා දෙවියන්වහන්සේ අමනාප වන්නේ කුමක් නිසාද?

*කමාව දීමේ ආශිර්වාදය.*

- පසුතැවිලි වන අයට ස්වාමීන්වහන්සේ සම්පූර්ණ කමාව ලබාදෙන අන්දම අපට තේරුම් ගැනීම පිණිස උපකාර කිරීමට, අලංකාර සංකල්ප දෙකක් යෙසායා ඉදිරිපත් කළේය. "නුඹලාගේ පව් රතුපාට මෙන් තිබෙන නමුත්, ඒවා හිම මෙන් සුදු වන්නේය; ඒවා ලක්ෂා මෙන් රතුව තිබෙන නමුත් සුදු හිමමෙන් සුදු වන්නේය." (යෙසායා 1:18 ). අප පව් කර ස්වාමීන්වහන්සේගෙන් ඈත්ව සිටීමේ හැඟීම් ඇතිවූ විට මෙම සංකල්ප අපට උපකාර වන්නේ කෙසේද? (ඩීසහගී 58:42 බලන්න.)

*පෙනුමෙන් ලෞකිකභාවයෙන් වැළකීම*

- යෙසායා 3:16–24, අනාවැකිය සහාවේ අද සාමාජිකයින්ට "මිනිසුන්ට මෙන් කාන්තාවන්ටද" යොමුවන බව ජෝසෆ් ස්මිත් කීවේය (Answers to Gospel Questions, සම්පා. ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් කණි. 5 වෙළු. [1957–66], 5: 174). අපගේ ආත්මික සමෘධියට අපගේ ඇඳුමේ ආකාරය විදහාදක්වන්නේ නැතහොත් බලපාන්නේ කෙසේද? විනීතව ඇඳීම යන්නෙහි අර්ථය කුමක්ද? අපගේ ඇඳුම සහ පෞද්ගලික පෙනීම ගැන වඩාත් සැලකිලිමත් වීමේ භයංකාරකම කුමක්ද? (ඇල්මා 31:27–28 බලන්න.) පෙනීමෙන් ලෞකික භාවයෙන් වැළකී සිටීම පිණිස අපගේ ළමයින්ට ඉගැන්වීමට අපට හැකිවන්නේ කෙසේද?

*නපුරට යහපත කියාද යහපතට නපුරය කියාද කීම*

- නපුරත් යහපතත් අතර වෙනස දැනගැනීමේ ඉායෙල්ගේ හැකියාව හීනවූයේ කුමක් නිසාද? (යෙසායා 5:20 බලන්න.) ජනතාව අද නපුරට යහපත කියාද යහපතට නපුරය කියාද, කියන්නේ කුමන ආකාර වලින්ද? (2 නීෆායි 32:5; ඩීසහගී 45:57 බලන්න.)

*"තමාම තමා ප්‍රඥාවන්තයයි සිතීම"*

- "තුමූ ප්‍රඥාවන්තයෝ යයි සිතන්නාවූද තුමූ නුවණැත්තෝ යයි කල්පනා කරන්නාවූ අයට" එසේ නොකිරීමට යෙසායා අනතුරු ඇඟවීමෙන්, ඔහු අදහස් කළේ කුමක්ද? (යෙසායා 5:21). මෙම ප්‍රශ්ණය ඇති කරන කරුණු මොනවාද? එය භයංකාර කුමක් නිසාද? එයින් වැළකීසිටීමට අපට හැකිවන්නේ කෙසේද?

*"උන්වහන්සේගේ අත තවමත් දිගු කොට ඇත"*

- යෙසායා 5:25, 9:12, 9:17, 9:21, සහ 10:4 යෙසායා අවධාරණය කරන්නේ කුමන පණිවි-ඩයක්ද? මෙම පණිවිඩය වැදගත්වන්නේ කුමක් නිසාද? මෙම පණිවිඩයේ සත්‍යය දැනගැනීමට ඔබ පැමිණියේ කෙසේද?

# “ඔබ පුදුම දේවල් කර ඇත” 37

වෙනි පාඩම

*යෙසායා 22; 24–26; 28–30*

---

**අරමුණ**

උන්වහන්සේ කළ සමහර පුදුම දේවල් අවබෝධ කර ගැනීම තුලින් ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණීම පිණිස පංති සාමාජිකයින්ට උපකාර කිරීමටය.

---

**සූදානම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්නː

අ. යෙසායා 22:22 ස්වර්ගීය පියාණන්වහන්සේගේ අභියසට, ගැලවුම්කරුවාණන් දොර විවෘතකරන සේක.

ආ. යෙසායා 24:21–22 ආත්ම බන්ධනාගාරයෙහි සිටින අයට ගැලවුම්කරුවාණෝ දයාව පෙන්වන සේක.

ඇ. යෙසායා 25:1–4; 32:1–2 ගැලවුම්කරුවාණන් ශක්තියක් සහ බලකොටුවක් වන්නේය.

ඈ. යෙසායා 25:6–9 ගැලවුම්කරුවාණන් මංගල්‍යයක් සූදානම් කොට “තිරය” නැතිකරන සේක.

ඉ. යෙසායා 25:8 ගැලවුම්කරුවාණන් අපගේ කඳුළු පිසදමන සේක.

ඊ. යෙසායා 26:19. ගැලවුම්කරුවාණන් මළවුන්ගෙන් නැවත නැගිටීම ගෙන එනසේක.

උ. යෙසායා 28:16. ගැලවුම්කරුවාණන් අපගේ සවිමත් අත්තිවාරම වන්නේය.

ඌ. යෙසායා 29:4, 9–14, 18, 24. ගැලවුම්කරුවාණන් ශුභාරංචිය පොළොවේ නැවත පිහිටුවන සේක.

එ. යෙසායා 30:19–21 ගැලවුම්කරුවාණන් අපගේ පරීක්ෂාවන් දන්නා අතර අපගේ මාර්ග පෙන්වන සේක.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු කිරීම**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

පවුලේ සාමාජිකයෙකු හෝ මිතුරෙකු ඔබට කළ අපූරු දෙයක් ගැන පංති සාමාජිකයින්ට කියන්න. ඔවුන්ට අපරූ දේවල් කළ ජනයා ගැන කථා කිරීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න. එම ජනයා කෙරෙහි ඔවුන්ගේ හැඟීම් කෙටියෙන් විස්තර කිරීමට ඔවුන්ට කියන්න. ගැලවුම්කරුවාණන් කළ අපූරු දේවල් සමහරක් මෙම පාඩමේ අවධාරණය කරන බව පහදා දෙනන.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළකර ගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, එදිනෙදා ජීවිතයට ඒවා අදාළකර ගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

අනාගතවක්තෘ යෙසායා සංඥා භාෂාවෙන් ඔහුගේ බොහෝමයක් ඉගැන්වීම් කළ බව පහදා දෙන්න. මෙම භාෂාව කෙළින්ම උගන්වන්නේ නැති නිසා, ඒවා උගන්වන සත්‍යය සොයා ගැනීමට යෙසායාගේ වචන අප පරීක්ෂා කරමින් මෙනෙහි කළ යුතුය.

යෙසායාගේ ඉතාම අලංකාර සහ ගැඹුරු සංඥා භාෂා සමහරක්, මෙම පාඩමේ යොමුව වන ගැලවුම්කරුවාණන් ගැනය. “උන්වහන්සේගේ නාමය අපූර්වය” (යෙසායා 9:6) රටහුණු ලෑල්ලේ ලිවීමට ඔබට උවමනා වෙනවා ඇත. ගැලවුම්කරුවාණන් ගැන පහත සඳහන් අනාවැකි ඔබ සාකච්ඡා කරන විට ඒවා එක එක රටහුණු ලෑල්ලේ සාරාංශගත කරන්න.

**1. ස්වර්ගීය පියාණන් වහන්සේගේ අභියසට ගැලවුම්කරුවාණන් දොර විවෘත කරන සේක.**

යෙසායා 22:22 සාකච්ඡා කරන්න.

- "දාවිත්ගේ වංශයේ යතුරු" මෙසියස්වහන්සේට තිබෙන බව යෙසායා 22:22 කියයි. ස්වර්ගීය පියාණන්වහන්සේගේ අභියසට, කෙනෙකු ඇතුල් කිරීමට හෝ පිටමන් කිරීමේ බලය ගැලවුම්කරුවාණන්ට තිබෙන බව සංඥා ක්‍රමයෙන් කියමනකි මෙය. (එළිදරව් 3:7–8 2 නීෆායි 9:41 ද බලන්න.) මෙම දොර අප වෙනුවෙන් විවෘත කිරීමට ගැලවුම්කරුවාණන් කළේ කුමක්ද?ඇතුලත් වීමට අප කළ යුත්තේ කුමක්ද? (2 නීෆායි 9:45 බලන්න.)

**2. ආත්ම බන්ධනාගාරයේ සිටින අයට ගැලවුම්කරුවාණන් දයාව පෙන්වන සේක.**

යෙසායා 24:21–22 සාකච්ඡා කරන්න.

- යෙසායා 24:21–22 සඳහන් කරන්නේ කුමන බන්ධනාගාරයක්ද? (මළාවූ සමහර මැරෙන සුළු ජීවිතයේ අය ගියාවූ මළවුන්ගෙන් නැවත නැගිටින තෙක් බලා සිටින ස්ථානය වන, ආත්ම බන්ධනාගාරයයි.) මළාවූ සමහර මැරෙන සුළු ජීවිතයේ ආත්ම, ආත්ම බන්ධනාගාරයේ සිටින්නේ කුමක් නිසාද? (ඩී සහ සී 138:32 බලන්න. ඔවුන් සමහර දෙනෙක්, පොළොවේදී ශුභාරංචිය ලබාගත්තේ නැත, අන්‍යයන් ඔවුන්ගේ සාක්ෂියෙහි ස්ථිරව නොසිටියෝය.)
- ආත්ම බන්ධනාගාරයෙහි සිටින අයට ගැලවුම්කරුවාණන් කළේ කුමක්ද? (යෙසායා 42:5–7; ඩී සහ සී 138:29–37 බලන්න.) ඔවුන්ට ශුභාරංචිය ඉගැන්වීමට ධර්මිෂ්ඨ ආත්ම උන්වහන්සේ සංවිධානය කළ සේක. ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය හා දයාව මෙමගින් පැහැදිලිවූයේ කෙසේද? (යෙසායා 49:9–10 බලන්න.)

**3. ගැලවුම්කරුවාණන් ශක්තියක් හා බලකොටුවක්ය.**

යෙසායා 25:1–4; 32:1–2 සාකච්ඡා කරන්න.

- චණ්ඩමාරුත, කුණාටු, කාන්තාර, හා අපගේ ජීවිත වල ග්‍රීෂ්මයෙන් ගැලවුම්කරුවාණන් අපව ශක්තිමත් කළ බව යෙසායා ලීවේය. එවැනි අභියෝග වලට අප මුහුණ දෙන විට, ගැලවුම්කරුවාණන් අපට පිහිට වන අන්දම ගැන පහත සඳහන් සංකල්ප අපට උගන්වන්නේ මොනවාද?

  අ. කුණාටුවේදී උන්වහන්සේ රක්ෂා ස්ථානයකි. (යෙසායා 25:4)
  ආ. ග්‍රීෂ්මයේදී උන්වහන්සේ සෙවණක්ය (යෙසායා 25:4).
  ඇ. උන්වහන්සේ සුළඟෙන් මුවාවෙන ස්ථානයකි. (යෙසායා 32:2)
  ඈ. උන්වහන්සේ කුණාටුවෙන් ආවරණයක්ය. (යෙසායා 32:2).
  ඉ. උන්වහන්සේ වියළි ප්‍රදේශයක ජල ගංගාවකි. (යෙසායා 32:2)
  ඊ. උන්වහන්සේ විඩාවූ (පිපාසිත) දේශයක මහ පර්වතයක සෙවණක්ය. (යෙසායා 32:2).

**4. ගැලවුම්කරුවාණන් මංගල්‍යයක් සූදානම් කොට "තිරය" නැතිකරන්නේය.**

යෙසායා 25:6–9 සාකච්ඡා කරන්න.

- යෙසායා 25:6–7 එක් අර්ථකතනයක් නම් කන්ද දේවමාළිගාවේ සංකේතයකි (යෙසායා 2:2 ද; ඩී සහ සී 58:8–9 බලන්න). යෙසායා 25:6 සඳහන් කරන මංගල්‍යය කුමක්ද? (ක්‍රිස්තුස් වහන්සේගේ වචන වල සහ ඉගැන්වීම් වල මංගල්‍යයයි.) දේවමාළිගාවට පැමිණීම මංගල්‍යයක් මෙන් වන්නේ කෙසේද?
- තිරය යනු සිනිඳු වස්තුවකි. ජනතාව සත්‍යය වශයෙන්ම ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණීම සමහර විටදී වළක්වන අවිශ්වාසයේ සංකේතයකි එය (මොසෙස් 7:26). පොළොව වසා ඇති "තිරය" නැතිකරන්නේ කෙසේද? (යෙසායා 25:7–9 බලන්න.)

**5. ගැලවුම්කරුවාණන් අපගේ කඳුළු පිසදමන සේක.**

යෙසායා 25:8 සාකච්ඡා කරන්න.

- ඔබ ආදරය කරනයෙකු අඬන විට ඔබ කරන්නේ කුමක්ද? ගැලවුම්කරුවාණන් "[අපගේ] කඳුළු පිසදමන්නේ කෙසේද?"(දෙමව්පියෙක් ළමයාගේ මුහුණෙන් කඳුළු පිසදාන චිත්‍රයක් සිතෙහි ඇඳගැනීමට පංති සාමාජිකයින්ට යෝජනා කරන්න. මෙම ක්‍රියාවෙහි සමීපතාවයේ අදහසක් තිබේ. එකිනෙකා කෙරෙහි ගැඹුරෙන් ප්‍රේම කරන හා විශ්වාස කරන ජනයා විසින් පමණක් බෙදාගන්නා එය මුදු මොළොක් සංඥාවකි.)
- එළිදරව් 21:4 සඳහන් වන ආකාරයට කඳුළු වලට හේතුවන අවස්ථා මොනවාද? මෙම අවස්ථා හේතු කොට ගෙන ඇතිවන කඳුළු ගැලවුම්කරුවාණන් පිසදමන්නේ කෙසේද?

### 6. මළවුන්ගෙන් නැවත නැගිටීම ගැලවුම්කරුවාණන් ගෙන එන්නේය.

යෙසායා 26:19 සාකච්ඡා කරන්න.

- මෙසියස්වහන්සේ පැමිණ, උන්වහන්සේ මරණයට පත්වී, නැවත මළවුන්ගෙන් නැගිටින බවට යෙසායා අනාවැකි පළ කළේය. (යෙසායා 25:8). මළවුන්ගෙන් නැවත නැගිටින වෙනත් අය කවුද? (යෙසායා 26:19; 1 කොරොන්ති 15:20–22; ඇල්මා 11:43-44 බලන්න. මෙම පොළොවෙහි ජීවත් වූ, දෙවියන්වහන්සේගේ දරුවන් සියළුම දෙනා මළවුන්ගෙන් නැවත නැගිටින්නෝය.) අප මළවුන්ගෙන් නැවත නැගිටි විට අපට කුමක් හැඟෙන්නේද ගැන යෙසායා 26:19 යෝජනා කරන්නේ කුමක්ද? (ධ් සහ ගි 138:12–16, 50 ද බලන්න.)

  අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් මෙසේ කීවේය: "මළවුන්ගෙන් නැගිටීමට හඬ ශබ්දය කැඳවන විට…මගේ හදවතෙහි පළමුවන ප්‍රීතිය කුමක් වන්නේද? මගේ පියා, මගේ මව, මගේ සහෝදරයා, මගේ සහෝදරිය මුණගැසීමය; ඔවුන් මාලඟට පැමිණි විට, මම ඔවුන්ද ඔවුහු මාවද වැළඳගන්නෝය. (*Teachings of the Prophet Joseph Smith,* තෝරා. Joseph Fielding Smith [1976], 295–96).

### 7. ගැලවුම්කරුවාණන් අපගේ සවිමත් අත්තිවාරම වේ.

යෙසායා 28:16 සාකච්ඡා කරන්න.

- "පරීක්ෂා කරන ලද ගලක්" යන්නට ගැලවුම්කාරයාණන් යොමු කිරීමෙන්, එය ගැන යෙසායා අපට කියන්නේ කුමක්ද? (මොසෙස් 7:53 බලන්න.) ගැලවුම්කරුවාණන් අපගේ සවිමත් අත්තිවාරම වන්නේ කෙසේද? (හේලමන් 5:12 බලන්න.) මෙම අත්තිවාරම උඩ ගොඩනැගීමට අපට කුමක් කළ හැකිද? මෙම අත්තිවාරම උඩ අප ගොඩනගන්නේ නම්, ස්වාමින්වහන්සේ අපට දෙන පොරොන්දුව කුමක්ද? (ධ් සහ ගි 50:44 බලන්න.)

### 8. ගැලවුම්කරුවාණන් ශුභාරංචිය පොළොවේ නැවත පිහිටුවන සේක.

යෙසායා 29:4, 9–14, 18, 24 සාකච්ඡා කරන්න.

- පසු දවස්වල ශුභාරංචිය නැවත පිහිටුවීම ගැන යෙසායා කලින් දුටුවේ කුමක්ද? (යෙසායා 29:4, 9–14 බලන්න. ආත්මික අන්ධකාරය ඇති අවස්ථාවක එය පැමිණෙන බව ඔහු කලින් දුටුවේය. මෝර්මන්ගේ පොතද ඉදිරියට එන බව ඔහු කලින් දුටුවේය.)

  යෙසායාගේ සමහර අනාවැකි ඉටුවී තිබෙන අන්දම බැලීමට, යෙසායා 29 පහත සඳහන් පද, මෝර්මන්ගේ පොතෙහි, අනගි මුතුඇටෙහි, සහ දහම සහ ගිවිසුමේ අනුරූප කොටස් සමග සමාන කරන්න:

| | |
|---|---|
| අ. යෙසායා 29:4 | මොරෝනි 10:27 |
| ආ. යෙසායා 29:9–10, 13 | ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:18–19 |
| ඇ. යෙසායා 29:11–12 | ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:63–65 |
| ඈ. යෙසායා 29:14 | දහම සහ ගිවිසුම 4:1; 6:1 |

- මිනිසුන් මුවෙන් ස්වාමීන්වහන්සේට සමීපවුවද, ඔවුන්ගේ හදවත් උන්වහන්සේගෙන් ඉතා ඈත බව යෙසායා කීවේය (යෙසායා 29:13). අපගේ සිතිවලින්ද, ක්‍රියාවලින් සහ අපගේ වචනවලින්ද අපි ස්වාමීන්වහන්සේට සමීප බව අප ස්ථිරකර ගන්නේ කෙසේද?

- ආත්මිකව බිහිරි සහ අන්ධ අයට පෙනීම සහ ඇසීම ලබාගැනීමට මෝර්මන්ගේ පොත උපකාර වන බව යෙසායා කීවේය (යෙසායා 29:18; 24). මෙම අනාවැකිය ඉෂ්ඨවූයේ කෙසේද? වඩා හොඳට ආත්මිකව පෙනීමට සහ ඇසීමට මෝර්මන්ගේ පොත ඔබට උපකාර වූයේ කෙසේද?

**9. ගැලවුම්කරුවාණන් අපගේ පරීක්ෂාවන් දරාගන්නා අතර අපගේ මාර්ගයට මගපෙන්වයි.**

යෙසායා 30:19–21 සාකච්ඡා කරන්න.

- යෙසායා 30:19–21 විපත ගැන උගන්වන්නේ කුමක්ද?විපතක් පැමිණි විට ගැලවුම් කරුවාණන් අපට කරන දේවල් ගැන මෙම පද උගන්වන්නේ කුමක්ද? (ඇල්මා 37:37 ද බලන්න.)

---

අවසානය.

උන්වහන්සේ අපට කළ පුදුමාකාර දේවල් ගැන කෘතඥතාවය ප්‍රකාශ කරමින්, ගැලවුම් කරුවාණන් ගැන ඔබගේ සාක්ෂියදරන්න. රටහුණු ලෑල්ලේ ලැයිස්තුගත කරන ලද දේවල් නැවත බලා, ඒවා ගැන ඔවුන් සිතන විට ඔවුන්ට කෙසේ හැඟෙන්නේද යන්න ප්‍රකාශ කිරීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න. ප්‍රතික්‍රියා වශයෙන් අපට කුමක් කළ හැකිද යන්න සාකච්ඡා කරන්න. (යෝජනා සමහරකට යෙසායා 35:3–4 බලන්න.) "මවිතව මම නැගිට සිටිමි" යන ගීතිකාව පංති සාමාජිකයින් ලවා ගායනා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත. (ගීතිකා අංක 193).

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. යෙසායාගේ සමහර සංකල්ප නියෝජනය කරන උපකරණ**

මෙම සංකල්ප ඔබ සාකච්ඡා කරන විට, යතුරක්, ගලක්, හෝ කාන්තාරයේදී සෙවණක් දෙන පිංතූරයක් වැනි නොයෙක් උපකරණ හෝ යෙසායාගේ සමහර සංකල්ප නියෝජනය කරන පිංතූර පෙන්වන්න.

**2. හැන්ඩෙල් ගේ මෙසියස් යන සංගීත.**

"අපට ළදරුවෙක් උපන්නේය" ජෝර්ජ් ෆ්‍රීඩෙරික් හැන්ඩෙල්ගේ *මෙසියස්*, යෙසායා 9:6 සංගීතමය පරිවර්තයේ තැටිය ගායනා කරන්න.

**3. "ස්වාමියාගේ හස්තයේ ස්පර්ශය"**

*පවුල් නිවාස සැන්දෑවේ වීඩියෝ අතිරේකය* 2 (53277) ඇත්නම්, පාඩමේ කොටසක් මෙන්, මිනිත්තු 18 ක කොටසක් වන "ස්වාමියාගේ හස්තයේ ස්පර්ශය" පෙන්වීමට ඔබට උවමනා වෙනවා ඇත.

# "මා හැර වෙන ගැලවුම්කාරයෙක් නැත"

**38** වෙනි පාඩම.

*යෙසායා 40–49*

---

**අරමුණ**

ඔවුන් උදෙසා තමාට ඉටුකිරීමට තිබෙන වැඩ වලදී තම ජනතාව කෙරෙහි උන්වහන්සේගේ කැපවීමේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අසමසම කෙනෙකු බව පංති සාමාජිකයින්ට අවබෝධ කිරීම පිණිස උපකාරවීමට.

---

**සූදානම**

1. මෙම පාඩමෙහි සාකච්ඡා කරන ලද යෙසායා 40–49 එම කොටස් යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.

2. ක්‍රියාකාරීත්වයට යොමු වීම ඔබ භාවිතා කරනවා නම්, පංතිය පටන්ගැනීමට පෙර, පහත සඳහන් උපුටාගැනීම් දැන්වීම් පත්‍රයක හෝ රටහුණු ලෑල්ලේ ලියන්න.

   අ. "ක්‍රිස්තුස් ගැන නුඹලා කුමක් සිතන්නවුද?" (මතෙව් 22:42).
   ආ. "නුඹලා කුමන විදියේ මිනිසුන් විය යුතුද?" (3 නීෆයි 27:27).
   ඇ. "මනුෂ්‍ය පුත්‍රයා කවරෙක්ද කියා මනුෂ්‍යයෝ කියද්දැයි…නමුත් නුඹලා මා කවුරුය කියා කියනවාද?" (මතෙව් 16:13; 15).).
   ඈ. "ස්වාමින්වහන්සේගේ පක්ෂයට සිටින්නේ කවරෙක්ද?" (නික්මයාම 32:26).
   ඉ. "නුඹලා උන්වහන්සේගේ රූපය නුඹලාගේ මුහුණෙහි ලැබුවහුද?" (ඇල්මා 5:14)

3. *පවුල් නිවාස සැන්දෑවේ වීඩියෝ අතිරේකය* (ජාත්‍යන්තර) (5x736) ඇත් නම්, පාඩමේ කොටසක් මෙන් මිනිත්තු පහක කොටසක් වන "නුඹලා මා කවුරුදැයි කියා කියනවාද" පෙන්වීමට ඔබට උවමනා වෙනවා ඇත.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

දැන්වීම් පත්‍රයේ හෝ රටහුණු ලෑල්ලේ ඔබ ලියන ලද උපුටාගැනීම් වෙතට පංති සාමාජිකයින්ව යොමු කරන්න. (ඉහත සඳහන් "සූදානම" බලන්න.) ඉන් පසු පහත සඳහන් ප්‍රශ්න අසන්න.

- මෙම උපුටාගැනීම් වල පොදුවේ ඇත්තේ කුමක්ද? (ගැලවුම්කරුවාණන් ගැන අපගේ සාක්ෂිය සහ,උන්වහන්සේගේ ගෝලයින් වීමට අපගේ පොරොන්දු අගට කිරීමට අපට උපකාර කරන මෙම සියළු ප්‍රශ්ණ ශුද්ධ වූ ලියවිලි වලින්ය.)ශුද්ධ වූ ලියවිලි වල මෙවැනි බොහෝ ප්‍රශ්ණ තිබෙන්නේ ඔබ සිතන හැටියට කුමක් නිසාද?

මිැලවුම්කරුවාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය අවධාරණය කරන ශුද්ධ වූ ලියවිලි ප්‍රශ්ණ කෙරෙහි පාඩමේ මෙම කොටස් යොමුවන බව පහදා දෙන්න.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළකරගැනීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, එදිනෙදා ජීවිතයට ඒවා අදාළවන අනදම ගැන සාකච්ඡා කරන්න.ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ පුද්ගලික අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිමත් කරන්න.

**1. ගැලවුම්කරුවාණන් අසමසම කෙනෙකු බව යෙසායා උගනවයි.**

- යෙසායා මගින්, එක් ප්‍රශ්ණයක් වෙනස් වූ ආකාර වලින් ස්වාමින්වහන්සේ නැවත නැවතත් ඇසූ සේක.පහත සඳහන් එක් එක් පදයකින් කුමන ප්‍රශ්ණයක් අසන ලද්දේද?

අ. යෙසායා 40:18 ("එහෙයින් නුඹලා දෙවියන්වහන්සේ කාට සමකරන්නහුද")
ආ. යෙසායා 44:8 ("මා හැර වෙන දෙවිකෙනෙක් ඇද්ද")
ඇ. යෙසායා 46:5 ("අප ඒකාකාර වන සේ නුඹලා මා සමකරන්නෙත් එකහා සම කරන්නෙත් සදෘශ කරන්නෙත් කාටද?")

- ඉහත සඳහන් ප්‍රශ්න වල සමානත්වය කුමක්ද? (උන්වහන්සේ අපට සම කළ හැකි සෑම පුද්ගලයෙකුට හෝ සෑම දෙයකටම වඩා ගැලවුම්කරුවාණන් ශ්‍රේෂ්ඨ බව මෙම සියල්ලම අපට උගන්වයි.)මෙම ප්‍රශ්ණ වලට ඔබ පිළිතුරු දෙන්නේ කෙසේද? යෙසායා පොතෙහි ඒවාට පිළිතුරු දී තිබෙන්නේ කෙසේද? (පහත සඳහන් ලැයිස්තු ගතකර තිබෙන පද බලන්න, රිදියෙන් සහ රණින් ඔවුන්ම සාදාගත් බොරු දෙවිවරුන් අදහන රූපවන්දනා කරන ජනතාවට එහි සෑම එකකම ස්වාමින්වහන්සේ කථා කරන බව සිහි තබාගන්න.)

  අ. යෙසායා 43:11 ("මා හැර වෙන ගැලවුම්කාරයෙක් නැත".)
  ආ. යෙසායා 44:6 ("මා හැර වෙන දෙවි කෙනෙක් නැත".)
  ඇ. යෙසායා 45:5 ("මා හැර වෙන දෙවි කෙනෙක් නැත"; 6, 14, 18, 21–22 යන පදද බලන්න.)
  ඈ. යෙසායා 46:9 ("මම දෙවියන්වහන්සේය, මා සමාන කෙනෙක් නැත".)

- බොහෝ විටදී යෙසායා පොතෙහි මෙම ප්‍රශ්ණ සහ පිළිතුරු නැවත නැවතත් සඳහන් කරන්නේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? මෙම ප්‍රශ්ණ සහ පිළිතුරු වල අපගේ කාලයට සම්බන්ධ වන්නේ කෙසේද?

**2. ගැලවුම්කරුවාණන්ගේ අසමසම ගුණාංග යෙසායා විස්තර කරයි.**

- උන්වහන්සේ කෙරෙහි ඇදහීම පිණිස, "[දෙවියන්වහන්සේගේ] පැවැත්ම, සම්පූර්ණත්වය සහ ගුණාංග ගැන නිවැරදි අදහසක්" අපට අවශ්‍ය වන බව අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් ඉගැන්වූයේය. (*Lectures on Faith* [1985], 38). ගැලවුම්කරුවාණන්ගේ පැවැත්ම සහ ගුණාංග ගැන බොහෝ අලංකාර විස්තර යෙසායා දෙයි. පහත ලයිස්තුගත කර තිබෙන කොටස් සමහරක් කියවීමට පංති සාමාජිකයින්ට සලස්වා, පහත සඳහන් ප්‍රශ්ණ සාකච්ඡා කරන්නඃ ගැලවුම්කරුවාණන්ගේ කුමන ගුණාංගයක් එම කොටසෙහි සඳහන් කර තිබේද? ගැලවුම්කරු-වාණන් කෙරෙහි අපගේ ඇදහීම වර්ධනය කරගැනීමට මෙම ගුණාංගය දැනගැනීම අපට උපකාර වන්නේ කෙසේද? මෙම ගුණාංග රටහුණු ලෑල්ලේ ලැයිස්තුගත කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

  අ. යෙසායා 40:13–14 (උන්වහන්සේට කිසිවෙකු උපදෙස් දෙන්නේවත් මගපෙන්වන්නේ වත් නැත.)
  ආ. යෙසායා 40:28–31 (කිසි දිනෙක උන්වහන්සේ වෙහෙසට පත් නොවන සේක, උනවහන්සේ අපව ශක්තිමත් කරන සේක.)
  ඇ. යෙසායා 40:12, 21–22, 26; 45:12, 18 (උන්වහන්සේ සැලසුම්කොට විශ්වාසය මැවූ අතර එහි සෑම කොටසක්ම දන්නාසේක.)
  ඈ. යෙසායා 41:17–18 (අපට කරදර තිබෙන විට උන්වහන්සේ අපට සවන්දී, බහුලව අපට ආශිර්වාද කරන සේක.)
  ඉ. යෙසායා 42:1, 4 (උන්වහන්සේගේ අරමුණු ඉටුවන තෙක් උන්වහන්සේ දුර්වල හෝ අධෛර්‍ය්‍ය නොවන සේක.)
  ඊ. යෙසායා 42:16 (නැතිවූවා වූ උන්වහන්සේගේ ජනතාවට මාර්ග සමතලා කොට එළිය ලබා දෙන සේක.)
  උ. යෙසායා 43:1–4 (උන්වහන්සේගේ ජනතාවගේ පරීක්ෂා වලදී උන්වහන්සේ ඔවුන්ට උපකාර කරන සේක.)
  ඌ.යෙසායා 43:25–26; 44:21–23 (උන්වහන්සේ අපගේ පාප මකා දමා, නැවත ඒවා සිහි නොකරන සේක.)
  එ. යෙසායා 44:2–4 (වියළි පොළොවට ජලය මෙන්, උන්වහන්සේ අපගේ පවුල් මත උන්වහන්සේගේ ආත්මය වගුරුවන සේක.)
  ඒ. යෙසායා 46:3–4 (උපතේ සිට මහළු වයස දක්වාම උන්වහන්සේගේ ජනතාව උන්වහන්සේ උසුලාගෙන යන සේක.)

ඔ. යෙසායා 49:14–16 උන්වහන්සේ කිසිදිනෙක අපව අමතක නොකරන සේක. උන්වහන්සේගේ අතුල් වල අපව "කොටා" තිබේ.)

ගැලවුම්කරුවාණන්ගේ මෙම එක් ගුණාංගයක් ඔවුන්ගේ සාක්ෂි ශක්තිමත් කළ, අත්දැකීම් බෙදාගැනීම පිණිස පති සාමාජිකයින්ට ආරාධනා කරන්න.

**3. අපගේ කැපවීම නිසා ලෝකයා (බබිලෝනිය) ගැලවුම්කරුවාණන් සමග තරග කරයි.**

- යෙසායා 47 යොමුවන්නේ කාටද? (යෙසායා 47 සහ 1 වෙනි පදය බලන්න. පැරණි ලෝකයේ බලවත් නගරයක් වූ බබිලෝනිය ඔවුන්ගේ දුෂ්ඨකම් නිසා විනාශ විය. ලෝකයාගේ දුෂ්ඨකම් වලට බබිලෝනිය සංකේතය මෙන් බොහෝ විට ශුද්ධ වූ ලියවිලිවල භාවිතා කරනු ලැබේ.)
- දුෂ්ඨකම් නිසා බබිලෝනිය විනාශ වන බවට පරිච්ඡේද 47 හි යෙසායා අනතුරු ඇඟෙව්වේය. ලෝකයේ සහ එහි දුෂ්ඨකම් වල විනාශවීම, මෙම අනතුරු ඇඟවීම්වල ප්‍රතිඵලයක් බවට යොදාගැනීමටද හැකි වේ. ලෝකයේ දුෂ්ඨ මාර්ග සෙවීමේ ප්‍රතිඵලය ගැන පහත සඳහන් කොටස් උගනවන්නේ කුමක්ද?

  අ. යෙසායා 47:1; 5 (ලෝකය ධූලි බවට පත්කොට නිෂ්ෂබ්දතාවය සහ අන්ධකාරය රැගෙන එන්නේය.)
  ආ. යෙසායා 47:7–9 (පරාජය නොකළ හැකියයි ලෝකයා සිතුවාට, එය ඉතාමත් අගනා දේවල් අහිමි කොට, ස්වාමිපුරුෂයා සහ දරුවන් නැතිවූ ආකාරයට සංකේතවත්වන සේ විනාශ කරනු ලබන්නේය.)
  ඇ. යෙසායා 47:10–11 (දෙවියන්වහන්සේට වඩා ලොකයා උතුම් බව ප්‍රකාශ කරන නිසා ඔවුන් බලවත් ශෝකයට පැමිණෙනු ඇත.)

- යෙසායා 47:8, 10, හි ගැලවුම්කරුවාණන් තමා ගැනම කළ ප්‍රකාශය, බබිලෝනියාව (ලෝකයා) ටද එසේම බව සමකිරීමට තිබෙන අයිතිවාසිකම කුමක්ද? ("තවත් කෙනෙක් නැතුව මමම සිටිමියි") ගැලවුම්කරුවාණන් පිරිනමන දේවල් සමග සංසන්දනය කරන විට ලෝකයාට පිරිනැමිය හැකිවන්නේ කුමක්ද? බොහෝ ජනයා ගැලවුම්කරුවාණන් වෙනුවට, ඔවුන්ගේ කැපවීම ලෝකයාට දෙන්නේ කුමක් නිසාද? ගැලවුම්කරුවාණන් පිරිනමන දේවල් අන්‍යයන්ට පෙනීමට උපකාර කිරීමට අපට හැකිවන්නේ කෙසේද?
- යෙසායා 48:17–18, හි ලෝකයට වඩා ස්වාමින්වහන්සේව සොයන අයට උතුම් ආශිර්වාද උන්වහන්සේ පොරොන්දු වූ සේක. ඔබගේ මුළු හදවතින් ගැලවුම්කරුවාණන් අනුගමණය කිරීම පිණිස මෙම පොරොන්දු ඔබට අඟවන්නේ කෙසේද?

**4. පසු දවස් වල ඉශ්‍රායෙල් දූතමෙහෙය යෙසායා විස්තර කරයි.**

- පසු දවස් වල ඉශ්‍රායෙල් දූතමෙහෙය ගැන බොහෝ අනාවැකි යෙසායා 49 අඩංගුවේ. අප එක් එක්කෙනෙකුට කරන්නට තිබෙන ස්වාමින්වහන්සේගේ වැඩ කොටසේ වැදගත්කම ගැන තේරුම් ගැනීමට මෙම අනාවැකි අපට උපකාර වේ. පහත ලයිස්තුගත කර තිබෙන කොටස් සමහරක් කියවා, පහත සඳහන් ප්‍රශ්න සාකච්ඡා කිරීමට පංති සාමාජිකයින්ට සලස්වන්නː මෙම පසු දවස්වලදී අපගේ වගකීම් ගැන මේ කොටස අපට උගන්වන්නේ කුමක්ද? (ගැලවුම්කරුවාණන්ගේ වැඩකටයුතු සහ උන්වහන්සේගේ සේවකයන් වන, ඉශ්‍රායෙල් ගෘහය යන දෙකටම බොහෝ අනාවැකි අදාළවන බව සිහිතබාගන්න ෟයෙසායා 49:3ෟ.)

  අ. උපතේ පටන් මාගේ නම සඳහන් කළ සේක." (පසු දවස් වල්දී ස්වාමින්වහන්සේගේ වැඩකටයුතු ඉටුකිරීම පිණිස උපතේදී පටන් අපව කැඳවූ සේක; යෙරෙමියා 1:5 ද බලන්න.)
  ආ. යෙසායා 49:2. "උන්වහන්සේ මාගේ මුඛය තියුණු කඩුවක් මෙන් කළ සේක." (මෙයින් යෝජනා කෙරන්නේ ස්වාමීන්වහන්සේගේ වචනය වන—සත්‍යයේ බලවත් වචනය කථාකිරීමය; ඩීසගසී 6:2ද බලන්න.)
  ඇ. යෙසායා 49:2 "තමන්ගේ අත් සෙවණෙහි මා සැඟවූසේක." (ස්වාමින්වහන්සේ අපව ආරක්ෂා කොට, අපගේ උතුම් වගකීම් උදෙසා අපව සූදානම් කළ සේක; ඩී සහ සී 86:9 ද බලන්න.)

ඇ. යෙසායා 49:2. "උන්වහන්සේ.... මා මුවහත්කර තිබෙන ඊ ගසක් මෙන් කළ සේක." (මුවහත් කරන ලද ඊ ගස කෙලින්ම නිවැරදිව පියාඹයි. (උන්වහන්සේ අප යවන සෑම තැනකදීම, නොබියව නිවැරදි දෙය කිරීමට ස්වාමින්වහන්සේ අපව පිරිපහදුකොට සූදානම් කළ සේක.)

ඉ. යෙසායා 49:6. "නුඹ පොළොවේ කෙළවර දක්වා මාගේ ගැළවීම වේවා." (ඉශ්‍රායෙල් ඉතිරිවූවන්ව නගාසිටුවා තවද නැවත පිහිටුවා අන්‍යජාතිකයින්ට ආලෝකයක් වීමට, ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ මෙහෙකරුවන්ට කී සේක. මෙම ක්‍රමයෙන් පොළොවේ කෙළවර දක්වා ගැලවීම ලබාදීමට අපට උපකාර කළ හැකිය; ඕ සහ සී 86:8–11 ද බලන්න.)

---

**අවසානය.**

ගැලවුම්කරුවාණන්ට අපගේ ප්‍රේමය වඩාත් වර්ධනය කිරීමටත්, අපට කිරීමට උන්වහන්සේට අවශ්‍ය වැඩකටයුතු කරෙහි වඩා වැඩි අවබෝධයක් ලබාගැනීමට යෙසායාගේ ලියවිලි අපට උපකාර වන බවට සාක්ෂිදරන්න. "කොතරම් ඔබ උතුම්ද"(ගීතිකා අංක 86) "නැතහොත් පදනම කොතරම් සවිමත්ද" (ගීතිකා අංක 85) ගායනා කිරීමට පංති සාමාජිකයින්ට හෝ කුඩා කණ්ඩායමකට ආරාධනා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. යෙසායා භාවිතා කළ සංකේත**

- දුෂ්ඨකමට සහ ආත්මික අඥානකමට, අන්ධභාවය සංකේතයක් වශයෙන් යෙසායා නැවත නැවතත් භාවිතා කළේය (යෙසායා 29:10, 18; 32:3; 42:6–7, 16–18; 43:8; 44:9). ගැලවුම්කරුවාණන් ලෝකයේ ආලෝකය යයි උන්වහන්සේ නිතර ප්‍රකාශකළ බව, ඔබ මෙම පද මෙනෙහිකරන විට සිහිතබාගන්න (යොහාන් 8:12). ලෝකයේ ආලෝකය වෙතට අපගේ ආත්මික නෙත් වඩාත් සම්පූර්ණව විවෘතකරගැනීමට අපට හැකිවන්නේ කෙසේද?

- ජලය ගැන අදහස් යෙසායා නැවත නැවතත් භාවිතා කළේය (යෙසායා 12:3; 32:2; 41:17–18; 43:19–20; 44:3–4; 48:18, 21; 49:10). උන්වහන්සේ ජීවනදායක වතුරේ උල්පත බවට ගැලවුම්කරුවාණන්ගේ ඉගැන්වීම් මෙම කොටස් අවබෝධ කර ගැනීමට ඔබට පිහිට වන්නේ කෙසේද? (යොහාන් 4:7–14 බලන්න.)

**2. ස්වාමින්වහන්සේ ගැන බලා සිටීම**

- "ස්වාමින්වහන්සේ ගැන බලා සිටීම" යන්නෙහි අර්ථය කුමක්ද?(යෙසායා 40:31). උන්වහන්සේ ගැන බලා සිටින්නන්ගේ ශක්තිය ස්වාමින්වහන්සේ නැවත ප්‍රාණවත් කරන්නේ කුමන මාර්ග වලින්ද? (යෙසායා 41:10 බලන්න.) ස්වාමින්වහන්සේ පුද්ගලයෙකුගේ ආත්මික හෝ ශාරීරික ශක්තිය නැවත ප්‍රාණවත් කිරීමේ අත්දැකීමක් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.

**3. "නමුත් නුඹ මට යාච්ඥා නොකෙළෙහිය"**

- ස්වාමින්වහන්සේ අපව අමතක කර ඇතැයි ඇතැම් විට අප සමහරෙකුට හැඟෙන්නේ කුමක් නිසාද? ස්වාමින්වහන්සේ අපෙන් ඈත්වී ඇතැයි අපට හැඟෙයි නම්, එයට කාරණාව කුමක්ද? (යෙසායා 43:22–26; මොසායා 5:13 බලන්න.) උන්වහන්සේ වෙතට නැවත සමීප වීමට අපට කළ හැකිවන්නේ කුමක්ද?

  සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් මෙසේ කීවේය: "දේවත්වය සමග මගේ සම්බන්ධතාවය ක්‍රමවත් නොවන වෙලාවට මට දැනෙනවා දිව්‍යමය කණ් සවන්දෙන්නෙ නැති බව, දිව්‍ය කට හඬක් කථා නොකරන බව, මම බොහෝම දුරින් බව.ශුද්ධ වූ ලියවිලි වල මම ඇලී ගැලී සිටිය හොත් දුර ප්‍රමාණය අඩුවෙලා, ආත්මිකභාවයට නැවතත් මම පත්වෙමි." (*The Teachings of Spencer W. Kimball*, මුද්‍ර. එඩ්වඩ් එල්. කිම්බල් [1982], 135).

# "පාද කදු පිට කොපමණ අලංකාරද" 39

වෙනි පාඩම.

*යෙසායා 50–53*

**අරමුණ** යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දි ගෙවීම ගැන පංති සාමාජිකයින්ගේ සාක්ෂිය ශක්තිමත් කිරීමටය.

**සූදානම**

1. මෙම පාඩමේ සාකච්ඡා කර තිබෙන යෙසායා 50–53 කොටස් යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න ඒවා .ගැලවුම්කරුවාණන්ගේ වන්දි ගෙවීමේ පරිත්‍යාගය වටා ලියා ඇත.
2. අමතර කියවීම්: මොසායා 14–15
3. ක්‍රියාකාරීත්වයට යොමුවීම ඔබ භාවිතාකරනවා නම්, ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය සහ පරිත්‍යාගය ගැන ඔවුන් ප්‍රිය කරන ගීතිකාවක් තෝරාගැනීමට පංති සාමාජිකයින් දෙදෙනෙකුට හෝ තුන්දෙනෙකුට පැවරුම් කර, ගීතිකාවේ පණිවුඩය ඔවුන්ට බලපෑ ආකාරය පංතියට කීමට සූදානම් වීම පිණිස ඔවුන්ට කියන්න. ගැලවුම්කරුවාණන් ගැන ඔබගේම ප්‍රියතම ගීතිකාවක් ගැන කීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

උන්වහන්සේගේ වන්දි ගෙවීමේ පරිත්‍යාගය තුලින් ගැලවුම්කරුවාණන් අපට දැක්වූ ප්‍රේමය අවබෝධ කරගැනීමට, සභාවේ ගීතිකා බොහෝමයක් අපට උපකාර වන බව පහදාදෙන්න. ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය සහ පරිත්‍යාගය ගැන ඔවුන් ප්‍රිය කරන ගීතිකාවක් කීමට පැවරුම් දෙන ලද එක් එක් පංති සාමාජිකයෙකුටම ආරාධනා කරනන. ස්වාමින්වහන්සේගේ ආත්මය පංතියට ආරාදනා කිරීම පිණිස සංගීතය උපකාර කරන බැවින්, සාකච්ඡා කරන ලද එක් ගීතිකාවක් පංති සාමාජිකයින් ලවා ගායනා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

ගැලවුම්කරුවාණන්ගේ ජීවිතය සහ දූතමෙහෙය ගැන යෙසායාගේ අනාවැකි සමහරක් මෙම පාඩමේදී සාකච්ඡා කරන බව පහදා දෙන්න.

**ශුද්ධ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළකරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

1. **ශුභ ආරංචි ගෙනෙන පණිවුඩකරුවන් ගැන යෙසායා කථාකරයි.**

- යෙසායා 52:7 හි, උතුම් පණිවුඩයක් රැගෙන එන ජනතාව ගැන යෙසායා කාව්‍යමය ආකාරයෙන් විස්තර කරයි. පණිවුඩ කරුවන්ගේ පාද ගැන යෙසායා සඳහන් කළේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? (පැරණි ලෝකයේ විද්‍යුත් සංනිවේදන නොමැති වූ නිසා, වැදගත් පණිවුඩ බොහෝ විට රැගෙන ගියේ දුවන්නන් පයින් ගමන් කිරීමෙන්ය. පණිවුඩකරුවන්ගේ පාද, පණිවුඩකරුවන්ටම සංකේතයක් මෙන් යෙසායා භාවිතා කළේය. මෙම පණිවුඩකරුවන් ගැන යෙසායාට හැඟුණේ කෙසේද?)
- භාරදෙන ලද පණිවුඩය යෙසායා විස්තර කළේ කෙසේද? (එය ශුභාරංචියේ යහපත් ආරංචියේ පණිවුඩයකි, සාමයේ සහ ගැලවීමේ පණිවුඩයකි.) යෙසායා විසින් විස්තර කරන ලද පණිවුඩකරුවන්ට අනාගතවකතෘවරුන් හා ස්වාමින්වහන්සේ තමාම ඇතුලත්වන බව මෝර්මන්ගේ පොතෙහි අනාගතවක්තෘවරයෙකු වන අබිනාදි පහදා දුන්නේය (මොසායා

15:13–18). මෙම පණිවුඩකරුවන් රැගෙන ආ, සාමයේ හා ගැලවීමේ උතුම් පණිවුඩය කුමක්ද? (2 නීෆායි 2:6–8 බලන්න.)

- ශුභාරංචියේ පණිවුඩය ලෝකයට ගෙනෙන වෙනත් අය කවුද? ශුභාරංචි පණිවුඩය බෙදාගැනීමේදී ඔවුන් ලත් අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට කීමට ඔබට උවමනා වෙනවා ඇත. ඔවුන්ට පණිවුඩය රැගෙන ආ අය ගැන පංති සාමාජිකයින්ට කුමක් හැඟෙනවාදැයි කීමටද ඔබට වුවමනා වෙනවා ඇත.

2. **ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමේ පරිත්‍යාගය ගැන යෙසායා අනාවැකි පළකරයි.**

ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමේ පරිත්‍යාගය සහ එමගින් අපට සැලසෙන ආශිර්වාද ගැන පහත සඳහන් අනාවැකි සාකච්ඡා කරන්න.

- යෙසායා 50:5–7 අප වෙනුවෙන් උන්වහන්සේගේ මහත් පරිත්‍යාගය කෙරෙහි ගැලවුම් රුවාණන්ගේ ආකල්පය ගැන මෙම කොටස උගන්වන්නේ කුමක්ද? උන්වහන්සේ මහත් වූ වේදනාවට මුහුණදීමේදී ගැලවුම්කරුවාණන්ගේ ආකල්පය ගැන, මතෙව් 26:39 සහ පිලිප්පි 2:8 උගන්වන්නේ කුමක්ද?
- යෙසායා 51:6. මෙම පදයේ කුමණ සංසන්දනයක් පෙනවා තිබෙනවාද? වන්දි ගෙවීමේ ප්‍රතිඵල කොපමණ කාලයක් පවතින්නේද? (මොසායා 16:9; ඇල්මා 34:10, 14 ද බලන්න.)
- යෙසායා 51:22. ගැලවුම්කරුවාණන් කවුරුන් උදෙසා ආයාචනා කළ සේක්ද? උන්වහන්සේ අපගේ මැදහත්කාරයාණන් වීමට වන්දි ගෙවීම සැලැස්වූයේ කෙසේද? (ඩී සහ සී 45:3–5 බලන්න.) යේසුස් වහන්සේ අප වෙනුවෙන් බොන ලද "වැනෙන්ට සලස්වන කුසලානය" කුමක්ද? (ඩී සහ සී 19:15–20 බලන්න.) වන්දි ගෙවීම මගින් පිරිනමන සම්පූර්ණ ආශිර්වාද ලබාගැනීමට අප කුමක් කළ යුතුද?
- යෙසායා 52:3. "මිළ නැතුව මුදවාගැනීම" යන්නෙහි අදහස කුමක්ද? (2 නීෆායි 26:27–28; යෙසායා 55:1–3 බලන්න.)
- යෙසායා 53:2–4. ගැලවුම්කරුවාණන්ගේ ජීවිතය ගැන මෙම පද අපට කියන්නේ කුමක්ද? අපගේ කනස්සල්ල සහ දුක උන්වහන්සේට තේරුම් ගැනීමට හැකිවන්නේ කුමක් නිසාද? (ඇල්මා 7:11–13; හෙබ්‍රෙව් 2:16–18; 4:15 බලන්න.) නුඹගේ කනස්සල්ල සහ දුක උන්වහන්සේට තේරුණ බව ඔබට හැඟෙන්නේ කෙසේද?
- යෙසායා 53:5. තුවාල වීමෙන්, අතුල් පහර වලින්, කසයෙන් තැළීමෙන් වේදනා විඳීමට ගැලවුම්කරුවාණන් කැමති වූයේ කුමක් නිසාද?(1 නීෆායි 19:9 බලන්න.)
- යෙසායා 53:6–7 උන්වහන්සේට හිංසාකොට, පීඩාකොට, අපගේ අයුතුකම් දරාගැනීමට සැලසුන විටදී, ගැලවුම්කරුවාණන්ගේ චරිතයේ කුමණ ගුණාංග විදහා දැක්වූයේද? ස්වර්ගීය පියාණන් වහන්සේගේ කැමැත්තට යටත් නොවී, සමහර විට අපි "[අපගේ] මාර්ග වලට හැරෙන්නේ" කෙසේද? ස්වර්ගීය පියාණන් වහන්සේගේ කැමැත්තට යටත් වීමට, ගැලවුම්කරුවාණන්ගේ ආදර්ශය අපට උපකාර වියහැකි වන්නේ කෙසේද?
- යෙසායා 53:10. "උන්වහන්සේ පොඩිකරන්ට ස්වාමින්වහන්සේ කැමතිවූ සේක" මෙසේ කීමෙන් යෙසායා අදහස් කළේ කුමක්ද? ස්වර්ගීය පියාණන් වහන්සේගේ අපට ඇති ප්‍රේමය ගැන මෙම කොටසින් අපි ඉගෙනගන්නේ කුමක්ද? (යොහාන් 3:16–17 ද බලන්න.)
- යෙසායා 53:8–11. නොවා රජුගේ නපුරු පූජකවරුන්ට ඔහු කථාකරන විට, මෙම පද ගැන ප්‍රබල විස්තර ප්‍රකාශයක්, මෝර්මන්ගේ පොතේ අනාගතවක්තෘවරයෙකු වන අබිනාදි දුන් බව පහදාදෙන්න (මොසායා 15:10–13). අබිනාදිට අනුව, ගැලවුම්කරුවාණන්ගේ වංශය වන්නේ කවුරුන්ද? (මොසායා 5:7–8 ද බලන්න.)
- යෙසායා 53:12. යුද්ධයෙන් පසු, ජයගත් හමුදාවේ නායකයා ඔහුගේ අනුගාමිකයන් අතර කෙල්ලය බෙදාගනියි. පාපයත් මරණයත් ජයගත් ක්‍රිස්තුස් වහන්සේ අප සමග බෙදාගැනීමට කැමති ඵල මොනවාද? (රෝම 8:16–17; 2 තිමෝති 4:7–8 බලන්න.)

**3. අපගේ වගකීම් සමහරක් යෙසායා විස්තර කරයි.**

- යෙසායා 51 සහ 52 වාර්තාකර තිබෙන පරිදි, ගැලවුම්කරුවාණන්ගේ වන්දි ගෙවීම පිළිගත් අය වශයෙන් අපගේ වගකීම් මොනවාද?

  අ. යෙසායා 51:1, 4, 7. ස්වාමින්වහන්සේට ඇහුම්කන්දී කීකරු වෙන්න; මනුෂ්‍යයන්ගේ නින්දා කිරීම් වලට භය නොවන්න.

  ආ. යෙසායා 51:12–13. මැවුම්කරුවාණන් වූ ස්වාමින්වහන්සේ සිහිතබා ගන්න; සාතන්ට භය නොවන්න.

  ඇ. යෙසායා 52:1–2. පිබිදී පූජකවරයේ ශක්තිය පැළඳගන්න (ධ් සහ සී 113:7–8 බලන්න.) ධර්මිෂ්ඨකමේ අලංකාර වස්ත්‍ර පැළඳගනන. (එළිදරව් 19:7–8 බලන්න.) "නුඹගේ බෙල්ලෙහි බැඳීම් නුඹම බුරුල් කර ගන්න" (ධ් සහ සී 113:9–10 බලන්න).

  ඈ. යෙසායා 52:11. ලෝකයේ දුෂ්ඨකම් වලින් ඉවතට යන්න. අපවිත්‍ර දෙයකට අත නොගසන්න; පවිත්‍රව සිටින්න.

- මෙම එක් එක් වගකීමක් වඩා හොඳට සම්පූර්ණ කිරීමට අපට හැකිවන්නේ කෙසේද?

---

අවසානය.

කඳු පිට අලකාර පාද තබන පණිවුඩකරුවෙකු මෙන් අනාගතවක්තෘ අබිනාදි ගැලවුම්කරුවාණන්ව විස්තර කරන මොසායා 15:18 නැවත බලන්න. උන්වහන්සේගේ පාද අලංකාර වීමේ එක් කරුණක් නම්, උන්වහන්සේගේ ප්‍රේමයේ වන්දි ගෙවීමේ ලකුණු වන ඇණ සලකුණ තිබෙන බව පහදාදෙන්න. ගැලවුම්කරුවාණන්ට ඔබගේ ප්‍රේමය සහ, උන්වහන්සේගේ වන්දි ගෙවීමේ ආශිර්වාද ලැබීමට සුදුස්සෙකු වීමේ ආශාව යෙසායාගේ ඉගැන්වීම් වලින් ශක්තිමත් වන අන්දම ගැන සාක්ෂිදරන්න. එසේම පංති සාමාජිකයින්ගේ සාක්ෂිද ශක්තිමත් වූ අන්දම බෙදාගැනීමට ඔවුන්ට කියන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

**1. ආලෝකයේ ගමන් කිරීම**

යෙසායා 5:10–11 නැවත බලා යෙසායා මෙම පදවල දී තිබෙන තෝරාගැනීම පෙන්වා දෙන්න. අප ස්වාමින්වහන්සේට භය ඇතිව, උන්වහන්සේගේ මෙහෙකරුවන්ගේ හඬට කීකරු වී, උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්නේ නම්, අපට මගපෙන්වීමට උන්වහන්සේගේ ආලෝකය තිබෙන අතර අපි අන්ධකාරයෙහි නොහැසිරෙන්නෙමු (යොහාන් 8:12; 12:46). ගිනි පුපුරු වලට සමකර තිබෙන ස්වකීය ආලෝකයේ අප හැසිරෙනවා නම් "අප දුකෙන් වැතිරී සිටින" බවට ස්වාමින්වහන්සේ අනතුරු අඟවන සේක.

**2. ධර්මදූත කටයුතු**

*පවුල් නිවාස සැන්දෑව වීඩියෝ අතිරේකය* 2 (ජාත්‍යන්තර) (5x736) තිබේ නම් "ධර්මදූත වැඩකටයුතු; අපගේ විශාලතම වගකීමයි," යන මිනිත්තු පහක කොටස, පාඩමේ කොටසක් මෙන් පෙන්වීමට ඔබට වුවමනා වෙනවා ඇත.

# 40
වෙනි පාඩම

# "නුඹේ කූඩාරම තිබෙන ස්ථානය විශාලකරපන්න"

*යෙසායා 54–56; 63–65.*

---

**අරමුණ** සියොන්හි ස්ටේක ශක්තිමත්කරමින්, දෙවෙනි ඊමට සහ සහශ්‍රයට සූදානම්වීම පිණිස පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය.

---

**සූදානම**

1. පාඩමේ සාකච්ඡා කර තිබෙන යෙසායා 54–56 සහ 63–65 කොටස් යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. ක්‍රියාකාරීත්වයට යොමුවීම ඔබ භාවිතා කරනවා නම්, කූඩාරම් ඉනි රැගෙන එන්න.
3. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම (62187; ශුභාරංචි චිත්‍ර පිංතූර කට්ටලය 239) තිබේනම් එය පාඩමට භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.


---

**යෝජිත පාඩම වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමු වීම**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

පහත පෙන්වා දී තිබෙන පරිදි කූඩාරමක පිංතූරයක් රටහුණු ලෑල්ලේ අඳින්න.ඉන් පසු කූඩාරම් ස්ටේකයක් පෙන්වා, පහත සඳහන් ප්‍රශ්න අසන්න.



- මෙම කූඩාරමට ඉනි අවශ්‍යවන්නේ කුමක් නිසාද? කූඩාරම ඉනි මගින් උසුලා නොසිටින්නේ නම් කුමක් වන්නේද?
- යෙසායා 54:2 සඳහන් කර තිබෙන කූඩාරම නියෝජනය කරන්නේ කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව.) කූඩාරමේ ඉනි නියෝජනය කරන්නේ කුමක්ද?

  සභාපති එස්රා ටැෆ්. බෙන්සන් මෙසේ කීවේය:

  "ස්ටේක් යන වචනය සංකේතයකි. ඉනි බොහෝමයකට ලනු වලින් බැඳලා තදට පොළොවට සවිකර තිබෙන විශාල කූඩාරමක චිත්‍රයක් මනසෙහි ඇඳගන්න.

  "පොළොව වට කරගෙන තිබෙන විශාල කූඩාරමකට පසු දවස් වල සයෝනය අනාගතවක්තෘවරු සමාන කරති. එම කූඩාරම ලනු වලින් බඳින ලද ඉනි වලට සවිකර තිබේ.

එම ඉනි වනාහී ලෝකය පුරා පැතිරී තිබෙන භූගෝලීය සංවිධානවේ. දැනට, සයොන්හි විවිධ ස්ටේක වලට ඉශ්‍රායෙලය එක්රැස්වන්නේය." ("Strengthen Thy Stakes," *Ensign*, ජන. 1991, 2).

පසු දවස් වල ශුද්ධවන්තයින්ගෙන් යුත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ පළමුවෙනි ස්ටේක 1834 දී කර්ට්ලන්ඩ්, ඔහියෝ, ක්ලේ කවුන්ටි සහ මිසූරි යන ස්ථාන වල සංවිධානය කළ බව පංතියට කියන්න. සභාව වැඩෙන විට, ස්වාමින්වහන්සේගේ අණ පරිදි වැඩි වැඩියෙන් ස්ටේක එකතුකරන ලදී (ඩී සහ සී 101:20–21). අද ලොව පුරා ස්ටේක සියගණන් පිහිටුවා ඇත.

සයොන්හි ස්ටේක අපට ශක්තිමත් කිරීමට හැකි අන්දම ගැන මෙම පාඩමෙහි සාකච්ඡා කරන බව පහදාදෙන්න. දෙවෙනි ඊම සහ සහශ්‍රය ගැන යෙසායාගේ බලගතු ඉගැන්වීම් ගැනද සාකච්ඡා කරන්නේය.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරිම සහ ඒවා අදාළකරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. "ලණු දික්කර, නුඹගේ ස්ටේක ශක්තිමත්කරපන්න." (යෙසායා 54:2).**

- "නුඹේ කූඩාරම තිබෙන ස්ථානය විශාල කරපන්න?" (යෙසායා 54:2). ඔබ සිතන හැටියට මෙම වාක්‍ය ඛණ්ඩයෙහි තේරුම කුමක්ද? (ලෝකය ආවරණය කළ හැකි අන්දමට බොහෝ ජනයා සමග සභාවේ සාමාජිකයින් ශුභාරංචිය බෙදාගැනීම ස්වාමින්වහන්සේට අවශ්‍ය වන්නේය. පසු දවස් වලදී, සභාව වේගයෙන් වැඩෙමින්, ලොව පුරා බොහෝ සත්‍යය වෙතට හැරී එන බවට යෙසායා අනාවැකි පළ කළේය [යෙසායා 54:3].)
- කූඩාරම හෝ සභාව පිළිබඳ යෙසායා 54:3 දී තිබෙන වෙනත් උපදෙස් මොනවාද? මෙම උපදෙස් අනුගමණය කිරීමට අපට හැකිවන්නේ කෙසේද? පහත පෙන්වා දී තිබෙන ආකාරයට සාකච්ඡාව රටහුණු ලැල්ලේ, සාරාංශගත කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

| යෙසායාගේ උපදෙස් | අපට කළ හැකි දේ |
|---|---|
| කූඩාරම් වල තිර දිගහැර ලණු දික්කරන්න. | පූර්ණකාලීන ධර්මදූතයන් මෙන් සේවය කරන්න; මිතුරන් සහ අසල්වැසියන් සමග ශුභාරංචිය බෙදාගන්න. |
| කූඩාරම් ඉනි ශක්තිමත් කරන්න. | අපගේ ප්‍රාදේශික ස්ටේක ශක්තිමත් කරන්න. |

- අප ජීවත්වෙන ස්ටේකය ශක්තිමත් කිරීමට අපට කුමක් කළ හැකිද? (පහත සඳහන් දේවල් පිළිතුරුවලට අඩංගු විය හැකිය :පුද්ගලික ආත්ම ශක්තිය වර්ධනය කරගන්න, පවුලේ අයට සහ මිතුරන්ට එසේම කිරීමට අනුබල දෙන්න, අපගේ සාමාජිකයින්ට සහ සාමාජිකයින් නොවන අසල්වැසියන්ට සේවය කරන්න, සභාවේ සේවය කිරීමට පූජකවර නායකයින්ගෙන් ලැබෙන කැඳවීම් භාරගන්න.)
- ජනතාවගේ ජීවිත වලට ස්ටේක ආශිර්වාදකරන්නේ කෙසේද? (ඩී සහ සී 115:5–6 බලන්න.) සියෝනයේ ස්ටේක අපට ආරක්ෂාවේ සහ බලකොටු ස්ථාන වන්නේ කෙසේද?

**2. "මහත් අනුකම්පාව තුලින් මම නුඹනැවත කැඳවාගන්නෙමි" (යෙසායා 54:7).**

- අවුරුදු ගණනාවක්ම ඉශ්‍රායෙලය විසිරී සිටිය මුත්, පසු දවස් වලදී සත්‍යයේ සභාවට ඇයව එකරැස් කරන බවට ස්වාමින්වහන්සේ පොරොන්දු වූ සේක (යෙසායා 54:4–10). යෙසායා 54:4–10 ස්වාමිනවහන්සේ ගැන අපට කුමක් ඉගෙනගත හැකිද? උන්වහන්සේ ධර්මිෂ්ඨ මෙහෙකරුවන්ට ස්වාමින්වහන්සේ පොරොන්දු වන විශේෂිත ආශිර්වාද මොනවාද? (යෙසායා 54:13–14, 17 බලන්න.) මෙම පොරොන්දු වැදගත්වන්නේ කුමක් නිසාද?

- ශුද්ධවන්තයින් සමග එක්රැස් වී ආරක්ෂාව සෙවීම පිණිස ආරාධනාකරන්නේ කාටද? (ස්වර්ගීය පියාණන් වහන්සේගේ සියළුම දරුවන්ට.) ශුභාරංචිය තුල ආරක්ෂාව සෙවීමට උන්වහන්සේ වෙතට පැමිණීම පිණිස ස්වාමින්වහන්සේට අවශ්‍ය ජනකොටස් යෙසායා විස්තර කරන පහත සඳහන් කොටස් නැවත බලන්නः

  අ. යෙසායා 55:1–3 (පිපාසය ඇති සියළුම දෙනා.) මෙම පද සඳහන් කරන්නේ කුමණ අන්දමේ පිපාසයක්ද? ලෞකික දේවල් වලට මුදල් යොදවමින් සහ වෙහෙස වෙමින්, ආත්මික පිපාසය තෘප්තිමත් කිරීමට වෙහෙස දැරීමෙන් සිදුවන්නේ කුමක්ද? අපගේ ආත්මික පිපාසය සත්‍ය වශයෙන්ම තෘප්තිමත් කිරීමට හැකිවන්නේ කෙසේද? (2 නීෆායි 9:50–51; 3 නීෆායි 20:8 බලන්න.)

  ආ. යෙසායා 55:6–7. (දුෂ්ඨකම් කොට පසුතැවිලි වෙන අය) පසුතැවිලිවෙන අයට දිගුකොට ඇති ආශිර්වාදය කුමක්ද?

  ඇ. යෙසායා 56:3, 5–8 (ස්වාමින්වහන්සේව නොහඳුණන විදේශිකයන්.) ස්වාමින්වහන්සේ විසින් පිළිගැනීම පිණිස විදේශියන් කුමක් කළ යුතුද?

- ස්වාමින්වහන්සේගේ දයාව ගැන මෙම කොටස් උගනවන්නේ කුමක්ද? ස්වර්ගීය පියාණන් වහන්සේගේ සියළුම දරුවන් වෙත අප බැලිය යුතු අන්දම ගැන ඒවා උගන්වන්නේ කුමක්ද?

- වැස්ස සහ හිම බීජ සරුකරන්නාක් මෙන් දෙවියන්වහන්සේගේ වචනයට අපගේ ආත්ම පෝෂණය කිරීමට හැකි බවට යෙසායා ලීවේය (යෙසායා 55:10–13). දෙවියන්වහන්සේගේ වචනය අපගේ ආත්ම පෝෂණය කරන්නේ කෙසේද? (ඇල්මා 32:28, 41 බලන්න.)

**3. සහශ්‍රය සමාදානයේ සහ ප්‍රීතියේ කාලයක් වන්නේය.**

- දුෂ්කරතාවයන්, පරීක්ෂාවන් සහ වේදනා ලෝකයේ තිබුනත්, අවසානයේදී අයහපතින් යහපත ජයගෙන, ධර්මිෂ්ඨයින්ට අනාගතය ප්‍රීතියෙන් පූර්ණ වන බව යෙසායාගේ ලියවිලි පුරාම, ඔහු සාක්ෂිදැරුවේය. දුෂ්ඨයින්ට දඬුවමත්, ධර්මිෂ්ඨයින්ට මහත් වූ ප්‍රීතියත් ගෙන එන ගැලවුම්කරුවාණන්ගේ දෙවෙනි ඊම ගැන යෙසායා මහත් උනන්දුවෙන් යාච්ඤා කළේය (යෙසායා 64). බලාපොරොත්තුවේ හා ප්‍රීතියේ කුමන පණිවුඩයක් යෙසායා 64:1–4 අඩංගුවන්නේද? ස්වාමින්වහන්සේට සේවය කරමින් අවසානය දක්වා විඳදරාගැනීමේ ඔබගේ ආශාව මෙම පණිවුඩයෙන් වැඩිවන්නේ කෙසේද?

- ගැලවුම්කරුවාණන්ගේ දෙවෙනි ඊමට පෙරටුවෙන් පැමිණෙන අවුරුදු දහසේ කාල පරාසයේ සාමදානයේ සහශ්‍රය ගැන, යෙසායාගේ අවසාන පරිච්ඡේද වල වාර්තාව අලංකාර චිත්‍රයක් ඉදිරිපත් කරයි. යෙසායා 65:17–25 වාර්තාකර තිබෙන පරිදි, සහශ්‍රය තුල කුමණ තත්වයක් පවතියිද? (මෙම තත්ව රටහුණු ලෑල්ලේ සාරාංශගත කිරීමට ඔබට උවමනා වෙනවා ඇත; (යෙසායා 11:6–9 ද බලන්න.)

  අ. අළුත් අහසක්ද, අළුත් පොළොවක්ද ස්වාමින්වහන්සේ මවන සේක (යෙසායා 65:17).

  ආ. එහි මහත් ප්‍රීතියක් වන අතර ස්වාමින්වහන්සේගේ ජනතාවට කිසි දිනක වැළපෙන්නේ නැත (යෙසායා 65:18–19).

  ඇ. බාල වයසේදී ජනයා නොමැරෙන අතර අවුරුදු 100 වයස් වන තුරු ජීවත්වන්නෝය (යෙසායා 65:20).

  ඈ. ඔවුන්ගේ ස්වකීය වෙහෙසීමේ ඵල ඔවුහු භුක්තිවිඳින්නෝය (යෙසායා 65:21–23).

  ඉ. සැණෙකින්ම යාච්ඤාවලට උත්තර ලැබෙන්නේය (යෙසායා 65:24).

  ඊ. සතුන් අතර වෛරයක් නොවන්නේය (යෙසායා 65:25).

- ස්වාමින්වහන්සේගේ අසීමිත යහපත සහ ප්‍රේමය ගැන යෙසායා 63:7–9 උගන්වන්නේ කුමක්ද? (අපට ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය පෙන්වන වචන සහ වාක්‍ය ඛණ්ඩ මෙම පද වලින් යෝජනා කිරීමට පංති සාමාජිකයින්ට කියන්න. මේවා රටහුණු ලෑල්ලේ ලිවීමට ඔබට වුවමනා වෙනවා ඇත.) "උන්වහන්සේගේ ආදරකරුණා සමූහය" ගැලවුම්කරුවාණන් ඔබට පෙන්වූ මාර්ග මොනවාද?

අවසානය.

සයෝන්හි ස්ටේක ශක්තිමත් කරමින්, ලෝකයා සමග ශුභාරංචිය බෙදාගන්නා විට සදාකාලික සම්පත් බලාපොරොත්තු විය හැකිය. ගැලවුම්කරුවාණන්ගේ දෙවෙනි ඊම සහ, සහශ්‍රය තුලදී පවතින සමාදානය සහ ප්‍රීතිය වෙත අපට බලා සිටීමට හැකිවේ. ස්වාමින්වහන්සේට සේවය කිරීම වරප්‍රසාදයක් බවත්, උන්වහන්සේගේ ගොලයින්ට උන්වහන්සේ ආශිර්වාද කරන බවත් සිහිතබාගැනීමට යෙසායාගේ අනාවැකි අපව දිරිමත්කරයි.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

1. **නිරාහාරව සිටීමේ සත්‍යවූ නීතිය** (2යසායා 58:3–12)

- නිරාහාරව සිටීම ගැන යෙසායා 58 අපට කුමක් ඉගෙනගැනීමට හැකිද? සත්‍යවූ නිරාහාරව සිටීමේ ද්‍රව්‍ය මොනවාද? (යෙසායා 58:3–7 බලන්න.)

සත්‍යවූ නිරාහාරයේ එක් ද්‍රව්‍ය (අංග) නම් ත්‍යාගශීලී නිරාහාර පිදුම් දීමය. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් මෙසේ කීවේය, "අපි ධනවත් නම්, අප බොහෝ දෙනෙකු මෙන්, මම සිතමි. අපි ඉතාමත් ත්‍යාගශීලී විය යුතුය…නිරාහාරව සිටි කෑම වේල් දෙකෙන් ඉතිරි කල මුදලට වඩා වැඩිය දෙනවානම් හොඳයි, සමහර විට අපට පුළුවන්කමක් තිබෙනවා නම් —දස ගුණයකටත් වඩා දෙන්න" (Conference Report තුලින්, අප්‍රේ. 1974, 184).

- නිරාහාර නීතිය රැකීමෙන් යෙසායා 58 පොරොන්දු වී තිබෙන ආශිර්වාද මොනවාද?

  අ. පරීක්ෂාවෙන් වැළකී සිටීමට අපි වඩාත් ශක්තිමත් වන්නෙමු (යෙසායා 58:6).
  ආ. අපගේ බර සැහැල්ලුවන්නේය (යෙසායා 58:6).
  ඇ. අපගේ ශාරීරික සහ ආත්මික සුවය වැඩිදියුණු වීම (යෙසායා 58:8).
  ඈ. අප යටහත්පහත් බවට පත්වී ස්වාමින්වහන්සේ සමග කථාබහ කිරීමට සූදානම් කිරීම (යෙසායා 58:9).
  ඉ. අප දිළිඳුන්ට හා අසරණ අයට උපකාර කිරීම (යෙසායා 58:10).
  ඊ. ස්වාමින්වහන්සේ නිතරම අපට මගපෙන්වන සේක (යෙසායා 58:11).
  උ. වියළි කාලයේදී අපේ ප්‍රාණය තෘප්තියට පමුණුවන අතර "දිය සිඳී නොයන වතුර ඇති උල්පතක්" මෙන් කරයි (යෙසායා 58:11).

නිරාහාර නීතිය රැකීමෙන් ලැබෙන ආශිර්වාද පෙන්වීමට ශුද්ධ ලියවිලි, සභාවේ ඉතිහාසය, සහ පුද්ගලික අත්දැකීම් වලින් නිදර්ශණ බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.

- නිරාහාර නීතිය වඩාත් උනන්දුවෙන් රැකීමට අපට හැකි වන්නේ කෙසේද?

2. **ගැලවුම්කරුවාණන්ගේ දූතමෙහෙයේ විස්තරය**

- ගැලවුම්කරුවාණන්ගේ කැඳවීමේ හා දූතමෙහෙයේ ප්‍රකාශයකි යෙසායා 61:1–3 නාසරෙත්හි උන්වහන්සේගේ දූතමෙහෙයේ මුල් අවදියේදී, මෙම පද උපුටාදක්වමින් ජනතාවට මෙසේ කී සේක, "අද නුඹලා අසා සිටියදී මේ ලියවිල්ල සම්පූර්ණ විය" (ලූක් 4:14–21). යේසුස් වහන්සේගේ පැවැත්ම සහ මෙහෙය ගැන මෙම පදවලින් උගන්වන්නේ කුමක්ද?

3. **ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊම** (යෙසායා 63:1–6)

- යෙසායා 63:1–6. ගැලවුම්කරුවාණන්ගේ දෙවෙනි ඊම, යෙසායා විස්තර කරන ලදී. ගැලවුම්කරුවාණන් උන්වහන්සේගේ තේජසින් පැමිණෙන විට, උන්වහන්සේගේ ලෝගුවේ පාට කුමක් වන්නේද? (යෙසායා 63:2; එළිදරව් 19:11–13; ධී සහ සී 133:46–48 බලන්න.) රත පාට සංකේතවත් කරන්නේ කුමක්ද? (අපගේ පාප උදෙසා ගෙත්සෙමෙනේ සහ කුරුසිය මත වැගුරූ උන්වහන්සේගේ ලේය.)

41

වෙනි පාඩම

# "අද දින මම නුඹව...යකඩ කුළුණක් කළෙමි"

*යෙරෙමියා 1–2; 15; 20; 26; 36–38.*

---

**අරමුණ**

විරුද්ධත්වය හා විපත්ති තිබෙන අවස්ථාවලදී ඇදහිලිවන්තව සිටීම පිණිස පංති සාමාජිකයින්ව දිරිමත් කිරීමටය.

---

**සූදානම**

1. පාඩමේ සාකච්ඡා කර තිබෙන යෙරෙමියා පොතෙහි කොටස් යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. යෙරෙමියාගේ අවට සිටිය සියළු දෙනාගේම විරුද්ධත්වයට මුහුණ දීම පිණිස ඔහුව දිරිගැන්වීමට සහ කැපවීම කෙරෙහි මෙම පාඩම යොමු වෙයි.
2. ක්‍රියාකාරීත්වයට යොමුවීම ඔබ භාවිතා කරන්නේ නම්, යකඩ කුරක් පංතියට රැගෙන එන්න.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොම වීම**

පාඩම පටන්ගැනීමට, පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

යකඩ කුර පෙන්වා එය කැඩීමට උත්සාහ කිරීම පිණිස පංති සාමාජිකයෙකුට ආරාධනා කරන්න. ඉන්පසු පහත සඳහන් ප්‍රශ්ණ අසන්න.

- මෙම කරුණු පුද්ගලයෙකුගේ ගුණාංග පෙන්වන්නේ නම්, ඔහු හෝ ඇය ගැන එය යෝජනා කරන්නේ කුමක්ද?
- යෙරෙමියා 1:17–19 කියවීමට පංති සාමාජිකයින්ට කියන්න. යෙරෙමියා විස්තරකිරීමට, ස්වාමින්වහන්සේ 18 වෙනි පදයේ භාවිත කළ වාක්‍ය ඛණ්ඩ මොනවාද? යෙරෙමියා කුමණ පුද්ගලයෙක් හැටියට මෙම පද යෝජනා කරන්නේද? ස්වාමින්වහන්සේ දුන් කැඳවීමක් හෝ පැවරුමක් ඉටු කිරීමට ඔබ පිටත්වන විට, මෙම වචන හවිතා කරමින් ඔබව විස්තර කරන්නේ නම්, ඔබට කෙසේ හැඟෙන්නේද?

රජවරු, කුමාරවරු සහ සියළුම ජනතාව, යෙරෙමියාගේ දූතමෙහෙයට විරුද්ධ වූ නමුත් ඔහු අභීතව ස්වාමින්වහන්සේ අණ කළ පරිදි කළ බව පහදා දෙන්න. විරුද්ධත්වය ඇති අවස්ථා වලදී නොනෙමෙන්නට හෝ නොකැඩෙන්නට මහත් ශක්තියක් තිබුන යෙරෙමියා "යකඩ කුළුණක්" මෙන් බව පහදා දෙමින් යකඩ පොල්ලට යොමු කරන්න.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළකර ගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

යොශියාගේ සිට ශෙදෙකියා දක්වා රජවරු පස් දෙනෙකුගේ රාජ්‍ය පාලන කාලයේදී යෙරෙමියා මෙහෙකළේය (ක්‍රිːපූඃ 626 සිට 586 දක්වා) රූපවන්දනා කිරීමෙන් සහ දුෂ්චරිතයෙන් ජනතාව හරවා ගැනීමට, යොශියා සමග ඔහු ප්‍රයත්න දැරුවේය. නමුත් යොශියාට පසුව සිටි රජවරු අධර්මිෂ්ඨ කමින් පාලනය කළ අතර, ජනතාව සම්පූර්ණයෙන්ම ඇදහිල්ලෙන් වැටී ගියෝය. මෙම ජනතාවට අනතුරු ඇඟවීමේ හඬක් එසවීම හා ඔවුන්ගේ දුෂ්ඨකම් හෙළාදැකීම, සියළුම ශුද්ධ වූ ලියවිලි අතර ඉතාමත් ශක්තිමත් ඒවා විය. යුදාව බබිලෝනියන්වරුන් විසින් යටත්කර ගැනීමට පෙර අනතුරු ඇඟවීමේ අන්තිම හඬ ඔහුගෙන් විය.

යෙරෙමියාගේ ජීවිතය දුකෙන් පිරි එකක් වූ නමුත්, පරීක්ෂාවට ඔහුගේ ප්‍රතිචාරය අපව පෙළඹවීමට සහ ඉගැන්වීමට හැකිය. යුදා රාජධානියට විරුද්ධව අනාවැකි පළකළ බැවින් ඔහුට තළා සිරගත කරන ලදී. ඔහුගේ ජීවිතය නිතර තර්ජනයට භාජනය විය. නමුත් සියළුම විපත් හා විරුද්ධකම් වලදී, යෙරෙමියා "යකඩ කුළුණක්" මෙන් සිටියේය (යෙරෙමියා 1:18). ඔහුගේ ජීවිතයේ දුකට සහ නිෂ්ඵලභාවයට, අනාගතවක්තෘවරයාගේ ප්‍රතිචාර දක්වන පුද්ගලික, ඇදහීම වර්ධනය කරන වාර්තාව යෙරෙමියාගේ පොත සපයාදෙයි.

**1. අනාගතවක්තෘවරයෙකු වීමට දෙවියන් වහන්සේ යෙරෙමියාව කැඳවන සේක.**

යෙරෙමියා 1:4–10 වාර්තා වූ, අනාගතවක්තෘවරයෙකු වීමට යෙරෙමියාගේ කැඳවීම ගැන විස්තරය නැවත බලන්න.

- පූර්වයේ පටන් වූ දහම ගැන යෙරෙමියාගේ කැඳවීමෙන් අපට උගන්වන්නේ කුමක්ද? (යෙරෙමියා 1:5 බලන්න.) අනාගතවක්තෘවරයෙකු වීමට ඔහුව පූර්වයේ පටන් නියම කර තිබෙන්නේ, මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතයේදී බව යෙරෙමියාට දැනගැනීමට එය උපකාරවූ බව ඔබ සිතන අන්දමට කෙසේද?

  අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් මෙසේ කීවේය, "ලෝකයේ වැසියන්ට මෙහෙකිරීමට කැඳවීම් ලබන සෑම මිනිසෙක්ම, මෙම ලෝකය ඇතිවීමට පෙර ස්වර්ගයේ මහා සම්මන්ත්‍රණයේදී එම අරමුණ උදෙසාම නියම කරන ලදී" *(සභාවේ ඉතිහාසය,* 6:364).

- ඔහුගේ කැඳවීම ඉටුකිරීමට ඔහු නොසෑහේ යයි යෙරෙමියාට හැඟුණු විට ස්වාමින් වහන්සේ කුමක් කළ සේක්ද? (යෙරෙමියා 1:6–10 බලන්න.) ඔබට නොසෑහේ යයි හැඟුණු විට ස්වාමින්වහන්සේ විසින් ඔබව සනසන ලද්දේ කෙසේද?

**2. බොහෝ ජනයා යෙරෙමියාට විරුද්ධ වී ඔහුගේ දූතමෙහෙය ඉටුකිරීම වැළැක්වීමට උත්සාහදැරූහ.**

ස්වාමින්වහන්සේ ඔහුට දුන් දූතමෙහෙය ඉටුකිරීමේදී යෙරෙමියා මුහුණුදුන් විරුද්ධතාවයන් සාකච්ඡා කිරීම පිණිස පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි භාවිතා කරන්නඃ

අ. යෙරෙමියා 20:1–6 පෂ්හූර් නම් දේවමාළිගාවේ ප්‍රධාන පූජකයා, යෙරෙමියාගේ අනාවැකි ගැන අසතුටට පත් වී, යෙරෙමියාට ගසා දඬුකඳේ ගැසුවේය. පෂ්හූර් ඔහුගේ පවුල, සහ ඔහුගේ මිතුරන් බබිලෝනියා වහල් කමට ගෙනයන බවද, ඔවුන් බබිලෝනියේදී මරණයට පත්වන බවට යෙරෙමියා අනාවැකි කීවේය.

ආ. යෙරෙමියා 26:7–15 පූජකවරුන් ඇතුළු දේශයේ බොහෝ ජනයා, යෙරෙමියා සහ ඔහුගේ පණිවුඩයට විරුද්ධ වූහ (26:7–11). කෙසේවෙතත්, ස්වාමින්වහන්සේ ඔහුට දීමට අණ කළ පණිවුඩය ධෛර්යයවන්තව යෙරෙමියා ප්‍රකාශ කළේය (26:12–15).ෙ යෙරෙමියාගේ අසල්වැසියන් සහ ඥාතීන් පවා ඔහුට විරුද්ධ වූහ (11:19–21; 12:6). යෙරෙමියා අනාතෝත් නගරයෙන් බව සිහිතබාගන්න).

ඇ. යෙරෙමියා 36:1–6, 20–32. යෙරෙමියාගේ අනාවැකි වල වචන ලියා ජනතාවට කියෙව්වේය (36:1–6). මෙම වචන රජු පිච්චුව නිසා, ඒවා නැවතත් වාර්තාකිරීමට ස්වාමින් වහන්සේ යෙරෙමියාට අණ කළ සේක (36:20–32).

ඈ. යෙරෙමියා 37:12–15; 38:4–13. බොරු චෝදනාකොට යෙරෙමියා හිරගෙට දැම්මේය (37:12–15). පොළොව යට පිහිටි දඟගෙට ඔහුව දැමූ විට, ඔහු මඩේ එරුණේය (38:4–6). ශෙදෙකියාගේ අණ පරිදි, යෙරෙමියා දඟගෙයින් මුදවාගෙන, නැවත සිරගෙට දැමීය (38:7–13).

- එවැනි විරුද්ධත්වයක් තිබියදී ඒවා විඳදරාගැනීම ගැන යෙරෙමියාගේ හැඟීම් යෙරෙමියා 20:14–18 එළිදරව්කරන්නේ කුමක්ද? විරුද්ධත්ව අප අත්දකින විට අපට උපකාරවීම පිණිස යෙරෙමියාගෙන් අපට කුමක් ඉගෙනගත හැකිද? (ඔහුට හිංසාකළත් අධෛර්යයට පත්වුනත්, යෙරෙමියා ස්වාමින්වහන්සේට කීකරුව ඔහුගේ කැඳවීම නොනවත්වා ඉටුකරගෙන යෑම, පිළිතුරු වලට අඩංගු විය හැකිය; (26:12–15.)

- යෙරෙමියා 2:13 හි, ස්වාමින්වහන්සේ කියන පරිදි උන්වහන්සේගේ ජනතාව කළ නපුරු දේවල් දෙක මොනවාද? (ජීවන වතුර උල්පත වන, උන්වහන්සේව ඔවුහු අතහැරියෝය. ජීවන වතුර නාල්ලන්නාවූ බිඳුණු කටාරම් ඔවුන්ම තනාගත්තෝය. එනම් ලෞකික දේවල් තුල සම්පූර්ණත්වය සහ ආරක්ෂාව ඔවුහු සෙවූහ.) මෙම ගුණාංග ඇති ජනයාට යෙරෙමියාගේ වචන පිළිගැනීමේ අපහසුතාවය කුමක්ද? යෙරෙමියා මෙන්, ඔවුන්ට විරුද්ධත්වයට ප්‍රතිචාර දැක්වීමට නොහැකි කුමක් නිසාද? ගැලවුම්කරුවාණන්ගේ ජීවන වතුර නාල්ලන්නාවූ "බිඳුණු කටාරම්" අපිද සමහර විට නිර්මාණය කරන්නේ කෙසේද?

  වැඩිහිටි මැරියන් ඩී. හැන්ක්ස් මෙලෙස කීවේයඃ

  "ලෞකික දේවල් ලබාගැනීම පිණිස අපගේ කාලයෙන් වැඩි කොටසක් මිඩංගු කිරීමට අපි උත්සාහගන්නෙමු. අපට අවශ්‍ය දේවල් නැතහොත් උවමනාවට වඩා අවශ්‍ය දේවල් ලබා ගැනීමට අපගේ කාලයත් ශ්‍රමයත් අපි යොදවන්නෙමු. විනෝදය, හෝ සංග්‍රහ නැතහොත් සමාගම් හෝ නාගරික ජනයාගේ ශුභසිද්ධිය වෙනුවෙන් වැඩි දායකත්වයක් ලබාදීමට හඹායන්නෙමු. ඇත්ත වශයෙන්ම ජනතාවට විනෝදය අවශ්‍ය වේ, ඉලක්ක ඉටුකර ගැනීම අවශ්‍ය වේ, දායකවීම අවශ්‍ය වේ; නමුත් මේ සියල්ල ක්‍රිස්තුස් වහන්සේගේ මිත්‍රත්වයට කැපකරන්නේ නම්, මිලය ඉතාමත් අගනේය.

  "මක්නිසාද 'මගේ ජනතාව නපුරු වූ දේවල් දෙකක් කළෝය' යයි ස්වාමින්වහන්සේ ඉශ්‍රායෙලට කී සේක; ජීවන වතුර උල්පත වන මා ඔවුන් අත්හැර, වතුර නොඅල්ලන කටාරම්, එනම් බිඳුණු කටාරම් තැනුවේය.' (යෙරෙ. 2:13.)

  "අපගේ ජීවිත තුල දෙවියන්වහන්සේගේ ස්ථානය ගැනීමට ඒ වෙනුවට අප නිර්මාණය කරන දේවල් වල, ඇත්තවශයෙන්ම වතුර නොඅල්ලන්නේය. ජීවන වතුර අප ප්‍රතික්ෂේප කරන්නේ කුමන ප්‍රමාණයකින්ද, ඒ අනුව අපට ලැබිය හැකි ප්‍රීතිය අපට අහිමිවන්නේය" (Conference Report,. 1972, 127; හෝ *Ensign,* ජූලි 1972, 105).

යෙරෙමියා 39–40 වාර්තාකර තිබෙන පරිදි බබිලෝනිවරු යෙරූසලම විනාශ කිරීමේ යෙරෙමියාගේ අනාවැකි ඉෂ්ඨවිය. වටලන අවස්ථාවේ යෙරෙමියා සිරගත වී සිටිය නමුත්, පසුව බබිලෝනිවරු ඔහුව නිදහස් කොට ඉතිරිවූ යුදෙව්වරුන්ට ඔහු සමග යුදා දේශයේ නැවතීමට ඉඩ දුන්නෝය. ඔවුන් උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීමට, නැවතුන අයගේ නායකයා වන යොහානන් යෙරෙමියාට කී අතර එයට කීකරු වීමට පොරොන්දු විය (යෙරෙමියා 42:1–6). ජනතාවට යුදා දේශයේ රැඳී සිටීමටත් ඒ අනුව ඔවුන් කරන්නේ නම්, ඔවුන්ට ආශිර්වාද කිරීමට පොරොන්දු වන බව යෙරෙමියා මගින් ස්වාමින්වහන්සේ කී සේක (යෙරෙමියා 42:9–22). නමුත් යොහානන් ජනතාවට මිසරයට මගපෙන්වා, අනතුරුව බොහෝ දෙනෙක් ඔවුන්ගේ දුෂ්ඨකමෙහිම නොනවත්වා හැසිරුනෝය (යෙරෙමියා 43–44).

### 3. දෙවියන්වහන්සේගේ වචනයට ඔහු ඇළුම් කළ බැවින් යෙරෙමියා විරුද්ධත්වයේදී ශක්තිමත්වූයේය.

විරුද්ධත්වය තිබූ අවස්ථා වලදී යෙරෙමියාට ශක්තිමත්ව සිටීමට දෙවියන්වහන්සේගේ වචනය උපකාර වූ අන්දම පෙන්වන, පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කරන්න.

- යෙරෙමියා 1:9 වාර්තාකර තිබෙන පරිදි යෙරෙමියාගේ මුඛයට ස්වාමින්වහන්සේ තැබුවේ කුමක්ද? යෙරෙමියා 15:16 වාර්තාකර තිබෙන පරිදි ස්වාමින්වහන්සේගේ වචන වලට යෙරෙමියා කුමක් කළේද? (ඔහු ඒවා කැවේය. දෙවියන්වහන්සේගේ වචනය ඔහුගේ කොටසක් වූ බව කාව්‍යමය භාෂාවේ අදහස වේ.) ස්වාමින්වහන්සේගේ වචන ගැන යෙරෙමියාට හැඟුණේ කෙසේද?

- යෙරෙමියා කළ පරිදි ස්වාමින්වහන්සේගේ වචන "කෑමට" අපට හැකිවන්නේ කෙසේද? (ශුද්ධ ලියවිලි සහ පසු-දවස්වල අනාගතවක්තෘවරුන්ගේ උපදෙස් අධ්‍යනය කිරීමෙන්ය.) "ක්‍රිස්තුස්වහන්සේගේ වදනින් පිනැවෙන්න." යයි මෝර්මන්ගේ පොතෙහි (2 නීෆායි 32:3) අනාගතවක්තෘ නීෆායි කීවිය. ස්වාමින්වහන්සේගේ වදනින් පිනැවීමෙන් අප ශක්තිමත් වන්නේ කෙසේද?

- යෙරෙමියා 20:9, ස්වාමින්වහන්සේගේ වචනය ඔහු තුල තිබීම යෙරෙමියා විස්තර කරන්නේ කෙසේද? ස්වාමින්වහන්සේගේ වචනය මාගේ ඇටතුලේ වැසී ඇවිලෙන ගින්නක් යන්නෙහි අදහස ඔබ සිතන හැටියට කුමක්ද? ස්වාමින්වහන්සේගේ වචනය ඉගැන්වීමෙන් වැළකීමට යෙරෙමියාට නොහැකි වූයේ ඔබ සිතන හැටියට කුමක් නිසාද?

---

අවසානය. යෙරෙමියාගේ නිදර්ශන හා විරුද්ධත්වය ඇති අවස්ථා වලදී ඇදහිලිවන්තව සිටීමේ අවශ්‍යතාවය ගැන ඔබගේ හැඟීම් ප්‍රකාශ කරන්න. ස්වාමින්වහන්සේගේ වැඩ කටයුතු කරන විට්දී, මෙම වචන ඔවුන්ගේ ඇට තුලේ වැසී ඇවිලෙන ගින්නක් මෙන් වෙන තෙක් ඔවුන්ව ශක්තිමත් කරමින් ස්වාමින්වහන්සේගේ වචන සෙවීමට සහ මෙනෙහි කිරීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න. ක්‍රියාකාරීත්වයට යොමු වීම ඔබ භාවිතා කළේ නම්, ස්වාමින්වහන්සේ වෙනුවෙන් යෙරෙමියා යකඩ කුළුණක් වූ අන්දමට පංති සාමාජිකයින්ටද එලෙස වීමට යකඩ පොල්ල පෙන්වා අභියෝග කරන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

1. **"කුම්භකාරයාගේ අතේ තිබෙන…මැටි" (යෙරෙමියා 18:6)**

- යෙරෙමියා 18:1-4, වාර්ථාකර තිබෙන පරිදි යෙරෙමියා, කුම්භකාරයා වෙතට ගිය ගමනේ විස්තරය නැවත කියවන්න. යෙරෙමියාගේ අත්දැකීම් තුලින් ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ ජනතාවට ඉගැන්වූයේ කුමක්ද? (යෙරෙමියා 18:5–10 බලන්න. ඔවුන් පසුතැවිලි වෙනවා නම්, නරක් වූ මැටි භාජනය කුමභකාරයා නැවත සෑදුවා මෙන්, වඩා හොඳට ඔවුන්ව සාදන බව ස්වාමින්වහන්සේ පෙන්වූ සේක. ඔවුන් පසුතැවිලි නොවන්නේ නම්, ඔවුන්ව විනාශ කිරීමට උන්වහන්සේට බලය තිබෙන බවද, උන්වහන්සේ ඔවුන්ට මතක් කළ සේක.)
- මෙම උපමාව අද අපට අදාළවන්නේ කෙසේද? ස්වාමින්වහන්සේගේ අතෙහි වඩා හොඳ මැටි වීමට අපට හැකි වන්නේ කෙසේද? (නිහතමානීවීමෙන්—කීකරුවීමෙන්, පසුතැවිලි වීමෙන්, ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන් සහ උන්වහන්සේගේ කැමැත්ත සෙවීමෙන්ය. උන්වහන්සේගේ අරමුණු ඉටුකර ගැනීම පිණිස ස්වාමින්වහන්සේගේ ජනතාව හැඩගස්වා සූදානම් කළ අන්දම ගැන අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.) ස්වාමින්වහන්සේ විසින් අපව හැඩගැසීම අප ප්‍රතික්ෂේප කරනවා නම් කුමක් වන්නේද?

"යෙරෙමියා 18:1–10 යේ සඳහන් උපමාව පහත සඳහන් නිදර්ශන, සභාපති හීබර්.සී. කිම්බල් ඉදිරිපත් කළේය."

"ස්වාමීන්වහන්සේගේ හස්තයේ සිටිමින්, උන්වහන්සේගේ පණත්වලට කීකරුවන [අය] සියල්ලෝ ගෞරවයේ භාජන වන අතර, දෙවියන්වහන්සේ ඔවුන්ව පිළිගන්නාසේක" (*History of the Church*, 4:478).

"සකස් කොට හැඩගැස්වූ පසු විනාශ වූ බොහෝ භාජන ඇත. කුමක් හෙයින්ද? කුම්භකාරයා ඔවුන්ට දුන් හැඩය ගැන තෘප්තිමත් නොවී, ඔවුන්ට ප්‍රියකරන, ඔවුන්ගේම හැඩයකට ඔවුන් වහාම සකස් කර ගත්තෝය; දෙවියන්වහන්සේගේ සැලැස්ම අවබෝධ කරගැනීමෙන් ඔවුන් ඉක්මවාගොස් ඇති බැවින්, ඔවුන් ඔවුන්ගේම ස්වකීය කැමැත්තේ බලයෙන්, ඔවුන්වන විනාශයට පත්වෙති. ‍මෙම ජනතාව්‍යට බොහෝ විශාල අන්දමේ සකස් කිරීම් සහ හැඩගැස්වීම් තුලින් යෑමට තිබේ…ඔපදමා පිලිස්සීමට තිබේ; පිලිස්සීමේදී පවා සමහර භාජන පුපුරනවා ඇත." (ස්ටැන්ලි බී. කිම්බල් තුලින්, *Heber C. Kimball: Mormon Patriarch and Pioneer* [1981], 270).

**2. මෝර්මන්ගේ පොතේ අනාගතවක්තෘ ලීහයිගේ එම කාලයේදීම යෙරෙමියා දේශනා කළේය**

ලීහයි යෙරුසලම හැර යන කාලයේදීම අනාගතවක්තෘ යෙරෙමියා ජනතාවට උගන්වමින් අනතුරු ඇඟෙව්වේය. යෙරෙමියා සහ ලීහයි දෙදෙනාම යෙරුසලම විනාශ වන බවට අනාවැකි කීහ.

- ලීහයි සහ ඔහුගේ පවුල යෙරුසලම හැරයන විට යෙරෙමියා සිටියේ කොහේද? (යෙරෙමියා 37:15–16; 1 නීෆායි 7:14 බලන්න.)
- යෙරෙමියා උපදෙස් දෙමින් යුදාහි රජු ශෙදෙකියා සමග බොහෝ කලක් ගතකළ නමුත් යෙරෙමියා විසින් දෙනලද, ස්වාමින්වහන්සේගේ වචන වලට කීකරු වීමට ශෙදෙකියා ප්‍රතික්ෂේප කළේය. ඔහුගේ අකීකරුකමේ ප්‍රතිඵලයක් වශයෙන් ශෙදෙකියාට කුමක් වූයේද? (යෙරෙමියා 39:4–7 බලන්න.)
- ශෙදෙකියාගේ එක පුතෙකු බබිලෝනිවරුන් විසින් නොමරණ ලද බව මෝර්මන්ගේ පොතෙන් අපි දනිමු. ඔහුගේ නම කුමක්ද? (හේලමන් 8:20–21 බලන්න. ඔහු ගියේ කොහාටද? (ඔම්නි 1:15 බලන්න.)

# "මම ඒක ඔවුන්ගේ සිත් වල ලියමි" 42

වෙනි පාඩම

*යෙරෙමියා 16; 23; 29; 31*

**අරමුණ**

දෙවියන්වහන්සේගේ පසු දවස්වල මහා කර්තව්‍යයට සහභාගී වී, උන්වහන්සේගේ ව්‍යවස්ථාව ඔවුන්ගේ සිත්වල ලියා තැබීමට පංති සාමාජිකයින්ව දිරිමත් කිරීමටය.

**සූදානම**

1. යෙරෙමියා 16; 23; 29; සහ 31 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.
2. අමතර කියවීම්: යෙරෙමියා 3–9; 13; 30; 32:37–42; 33; 35.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පාඩම පටන්ගැනීමට, පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

- පරණ ගිවිසුමේ යම් කථාන්තරයකට හෝ සිද්ධියක් බැලීමට හෝ සහභාගී වීමට ඔබට හැකිවූවා නම්, ඔබ තෝරා ගන්නේ කොයි එකක්ද? (පංති සාමාජිකයින්ගේ ප්‍රතිචාර රටහුණු ලෑල්ලේ ලිවීමට ඔබට වුවමනා වෙනවා ඇත.)
- මෙම සිද්ධිය බැලීමට හෝ සහභාගී වීමට ඔබ කැමති වූයේ කුමක් නිසාද?
- අද සභාවේ සිදුවන දේවල්, ඔබ තෝරා ගත් සමහර සිද්ධීන් සමග සංසන්දනය කළ හැකි වේද?

ඔහුගේ කාලයේ ජනතාවට බලාපොරොත්තුවේ පණිවුඩ ස්වල්පයක් පමණක් දීමට යෙරෙමියාට තිබූ නමුත්, පසු දවස් වල ඉශ්‍රායෙල් එක්රැස්වීම බලාපොරොත්තුවේ කාලයක් වන බව ඔහු කලින් දුටුවේය. අද අප සහභාගී වන පසු දවස්වල ශ්‍රේෂ්ඨ රැස්වීම ගැන යෙරෙමියාගේ අනාවැකි මෙම පාඩමෙන් සාකච්ඡා කරනු ලබයි.

**ශුද්ධ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළ කරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට, දිනපතා ජීවිතයට ඒවා අදාළ කරගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. පසු දවස් වලදී ඉශ්‍රායෙල් එක්රැස් වීම යෙරෙමියා කලින් දකී.**

ඉශ්‍රායෙලය මිසරයෙන් නික්මයෑම ගැන කථාන්තරය ක්‍රියාකාරීත්වයට යොමුවීමේ සඳහන් කර නැත්නම්, එය පරණ ගිවිසුමේ ඉතාමත් හාස්කමක එක් සිද්ධියක් බව පහදා දෙන්න. යෙරෙමියාගේ පොතේද, පරණ ගිවිසුමේ වෙනත් පොත් වලද, එසේම මොර්මන්ගේ පොතේද එය සඳහන් වෙයි.

- නික්මයෑමේ වැදගත්කම ගැන මොසෙස්ට හැඟුණේ කෙසේද? (ද්විතීය කථාව 4:32–35 බලන්න.) මිසරයෙන් ඉශ්‍රායෙල්ගේ නික්මයෑමේ කොටසක් වීමට හැකිවූවා නම්, ඔබ සිතන්නේ කුමක් හැටියටද?
- පරම්පරා ගණනකට පසු, ස්වාමින්වහන්සේ කී පරිදි පසු දවස්වල සිද්ධිය, එම මහා නික්මයෑම මෙන් වන බව යෙරෙමියා දර්ශනයකින් දුටුවේය (යෙරෙමියා 16:14–16; 23:3–8). යෙරෙමියා 16:15 සහ 23:3 විස්තර කර තිබෙන්නේ කුමණ සිද්ධියක්ද? (ඉශ්‍රායෙලය එක්රැස්වීම සහ සභාවේ වර්ධනයයි.) යෙරෙමියා 23:4 කථාකරන සඳහන් කරන ලද එඬේරුන් කවරෙක්ද? (පූජකවර නායකයින් සහ සභාවේ වෙනත් නායකයින්.) යෙරෙමියා 23:5–6 කථාකරන ලද රජ කවරෙක්ද? (යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.) මෙම සිද්ධීන් නික්මයෑම හා ශ්‍රේෂ්ඨ වන්නේ ඔබ සිතන හැටියට කුමක් නිසාද?

- යෙරෙමියා 16:16 විස්තර කරන මසුන් අල්ලන්නන් හා දඩයක්කාරයන් සභාවේ ධර්මදූතයන් බව වැඩිහිටි ලී ග්‍රෑන්ඩ් රිචඩ්ස් පවසයි (Conference Report තුලින්, අප්‍රේ.. 1971, 143; හෝ *Ensign*, ජූනි 1971, 98–99). ධර්මදූතයින් සමග මසුන් අල්ලන්නන්ට හා දඩයක්කාරයන්ට පොදුවේ තිබෙන්නේ කුමක්ද? (මතෙව් 4:18–19 බලන්න.) වඩාත් සාර්ථක ධර්මදූතයින් වීමට අපට හැකි වන්නේ කෙසේද?

2. **දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ව්‍යවස්ථාව උන්වහන්සේගේ ජනයාගේ සිත්වල ලියන සේක.**

- වනාන්තරය තුල ඔවුන්ගේ ගමනේදී, ඔවුන් උදෙසා එළිදරව් ලබාගැනීම පිණිස ඉශ්‍රායෙල් දරුවන් මොසෙස් කෙරෙහි විශ්වාසය තැබුවෝය. ගණන් කථාවේ 11:29. කොපමණ දැඩි ආශාවක් මෝසෙස් ප්‍රකාශ කළේද? (දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ජනතාව ඉගෙනගෙන, ඔවුන්ම ආත්මයාණන්වහන්සේට සවන් දීමට ඉගෙන ගැනීම මෝසෙස්ට අවශ්‍ය විය.)

- යෙරෙමියා 31:31–34 වාර්ථාකර තිබෙන පරිදි, පසු දවස් වලදී කිරීමට ස්වාමින්වහන්සේ පොරොන්දු වූයේ කුමක්ද? (එසෙකියෙල් 11:17–20; 36:24–28; 2 කොරින්ති 3:2–3 ද බලන්න.) අපගේ සිත් වල දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ලියා තැබීම යන්නෙහි අදහස කුමක්ද? දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව අප සිත් වල ලියා තැබීම පිණිස අප කුමක් කළ යුතුද?

- දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව අප සිත් වල ලියා තිබෙන විට අපගේ පැවැත්මට එය බලපාන්නේ කෙසේද? විශේෂිතවූ ආඥාවලට කීකරු වීම පිණිස මෙය අපට උපකාරවන අන්දම සාකච්ඡා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත, එනම්:

  අ. අපගේ අසල්වැසියන්ට ප්‍රේම කිරීම.
  ආ. අපගේ දෙමව්පියන්ට ගෞරව කිරීම.
  ඇ. පිරිසිදු චරිතයකින් යුක්තවීම.
  ඈ. සබත් දින ශුද්ධව තබාගැනීම.
  ඉ. සුදුසු චිත්‍රපටි, රූපවාහිනී වැඩසටහන්, පොත් හා සඟරා තෝරාගැනීම.
  ඊ. විනීත ඇඳුම් ඇඳීම.
  උ. සුදුසු සංගීත තෝරාගැනීම.

- බොහෝ ජනතාවක් සාර්ථකව පාලනය කරන අන්දම ගැන ජෝසෆ් ස්මිත්ගෙන් අසන ලදී. "නිවැරදි මූලධර්ම ඔවුන්ට මම උගන්වන අතර ඔවුන් ඔවුන්වම පාලනය කරගනිති" යයි ඔහු කීවේය (උපුටා ගැනීම ජෝන් ටේලර් විසිනි, *Journal of Discourses*, හි 10:57–58). දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව අපගේ සිත්වල ලියා තැබීම යන්නට මෙම ප්‍රකාශය සම්බන්ධ වන්නේ කෙසේද?

- යුදා ජනතාව වහල්කමින් බබිලෝනියට ගෙන ගොස් අවුරුදු 70 කට පසු ඔවුන්ගේ හිමි දේශයට නැවත පැමිණ, දෙවියන්වහන්සේ සමග එකමුතුකමින් නැවත ජීවත් වන්නෝය (යෙරෙමියා 29:10–14; මෙම අනාවැකිය සම්පූර්ණවීම ගැන 47 වෙනි පාඩමේ සාකච්ඡා කරන ලදී). යෙරෙමියා 29:12–14, අනුව ස්වාමින්වහන්සේ වෙතට සමීපවීමට අපට කුමක් කළ හැකිද? දෙවියන්වහන්සේ වෙතට සමීපවීමට අප උත්සහ කරන විට අප තුල තිබිය යුතු ආකල්පය ගැන, කැඳවීම, යාච්ඥාකිරීම, සෙවීම සහ සොයාබැලීම යන වචන අපට අඟවන්නේ කුමක්ද? දෙවියන්වහන්සේ වෙතට සමීපවීමට ඔවුන් සෙවූ විට ඔවුන් ලත් අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.

---

**අවසානය.** යෙරෙමියා සහ වෙනත් බොහෝ අනාගතවක්තෘවරුන් ප්‍රීති වෙමින් බලා සිටි කාලයක අප ජීවත්වන බවට සාක්ෂිදරන්න. ඉශ්‍රායෙල් එක්රැස්වීමට සහභාගී වෙමින්, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ඔවුන්ගේ සිත්වල ලියාතැබීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

### 1. දැන් පසුතැවිලි වීමේ කාලයයි

පසුතැවිලිවන්නාට ස්වාමීන්වහන්සේගේ දයාව නිතර දිගු කොට ඇත.කෙසේ වෙතත්, පසුතැවිලිවීම කල්දමන අයට, පසුතැවිලි වීම ඉතාමත් අපහසු දෙයක් වෙනු ඇත.

සභාපති ජෝසෆ් එෆ්. ස්මිත් මෙලෙස ඉගැන්නුවේයඃ "පරණ වැරදි වලට හෝ පාපවලට පසුතැවිලි නොවී සමාව නොලැබූ මිනිසාට, නපුරෙන් වැළකීමට අපහසු බැවින්, මේ ලෝකයේ ඔහුගේ තත්වය බලාපොරොත්තු රහිත වන්නේය; පරණ පාපවලට පසුතැවිලි වීමෙන් ඔහු වැළකී සිටිය නිසා, සෑම අවස්ථාවක්ම අපරික්ෂාකාරීව මගහැරිය ඔහු ඉතාම අවාසනාවන්තයෙකි. එබැවින්, අපගේ ගමන් මගෙහි, දිනපතාම, දිව්‍යමය දයාව සහ කමාව සෙවීමට පුරුදු පුහුණුවන විට නපුරෙන් වැළකී සිටීමට අපට බලය දෙනු ලැබේ." (*Gospel Doctrine,* 5 වෙනි සංස්. .[1939], 374).

- ස්වාමීන්වහන්සේගේ වචනයට සවන් දෙමින් අප්‍රමාදව පසුතැවීමේ වැදගත්කම ගැන පහත සඳහන් කොටස් අපට උගන්වන්නේ කුමක්ද?

  යෙරෙමියා 5:1–5, 21–25
  යෙරෙමියා 6:10–17
  යෙරෙමියා 7:23–28
  යෙරෙමියා 8:6–12, 20
  යෙරෙමියා 13:11, 23
  යෙරෙමියා 17:23

### 2. අනාගතවක්තෘන්ගේ වචන වලට ඇහුම්කන්දීම

- ජනතාව ඔහුගේ වචන වලට ඇහුම්කන් නොදුන් බව බොහෝ විට යෙරෙමියා වාර්ථා කළේය (යෙරෙමියා 7:13; 25:3–4; 26:2–5; 32:33). වඩාත් උනන්දුවෙන් අප අනුගමණය කිරීමට අවශ්‍ය වන්නේ, පසු දවස් වල අනාගතවක්තෘවරුන්ගේ කුමණ වචනද?

### 3. පසුගිය පරම්පරාවල පාපය නැවත නැවත කීම

- ඔහුගේ කාලයේ යුදෙව්වන් කරන පාප, පසුගිය පරම්පරා දරුණු ලෙස දඬුවම් විඳින ලද එම පාපම බවට යෙරෙමියා ඔවුන්ට අනතුරු ඇඟෙව්වේය (යෙරෙමියා 11:1–12). විශේෂයෙන්ම එම පාප පැහැදිලිව ලියවිලිවල ඇතුලත් කර තිබුනත්, යෙරෙමියාගේ පරම්පරාවේ අය, ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේ පාපවලින් පාඩම් ඉගෙන නොගත්තේ, ඔබ සිතන හැටියට කුමක් නිසාද? දෙවියන්වහන්සේගේ ගිවිසුම් ජනතාව වන ඉහත පරම්පරා ඉගෙන ගත් පාඩම් වලින් වඩා සම්පූර්ණ ප්‍රයෝජන අපට ලබාගැනීමට හැකි වන්නේ කෙසේද?

### 4. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමේ වැදගත්කම

- යෙරෙමියා 17:5–8, මිනිසා කෙරෙහි විශ්වාස කරන ජනයා සහ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන ජනයා අතර තිබෙන සමානකම් මොනවාද? මෙම සමාන කිරීම් ඉතාම නිවැරදි බව ඔබ දකින්නේ කෙසේද? දෙවියන්වහන්සේ කෙරෙහි අපගේ විශ්වාසය අපට කෙසේ දැක්විය හැකිද?

### 5. බොරු අනාගතවක්තවරු

- ඔහුට ඇසීමට උවමනා දේවල් අනාගතවක්තෘවරුන් කීමට අවශ්‍ය වන රජෙකි ශෙදෙකියා. එහ ප්‍රතිඵලයක් වශයෙන්, යෙරුසලම නොවැටෙන බවට බොහෝ බොරු අනාගතවක්තෘවරු පොරොන්දු වූහ (යෙරෙමියා 28:1–4; 37:19). අද බොහෝ අනාගතවක්තවරු "බැටළු වේශයෙන්" පැමිණෙති (මතෙව් 7:15). අද අප නිතර බොරු අනාගතවක්තෘවරුන් සිටීමේ සාක්ෂි මොනවාද? අද බොරු අනාගතවක්තෘවරුන්ගේ සමහර පණිවුඩ මොනවාද? බොරු අනාගතවක්තෘන් මගින් නොමග යෑමෙන් අපට වැළකීමට හැකි කෙසේද?

# 43
වෙනි පාඩම

# ඉශ්‍රායෙල් එඬේරුන්

*එසකියෙල් 18; 34; 37*

**අරමුණ**

"ඉශ්‍රායෙල් එඬේරවරු" වශයෙන් ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය (එසකියෙල් 34:2).

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.

   අ. එසකියෙල් 34. රැළ පෝෂණය නොකරන එඬේරුන්ට ස්වාමින්වහන්සේ තරවටු කරන සේක. උන්වහන්සේ නැතිවූ සියළුම බැටළුවන් සොයාගන්නා ඔවුන්ගේ එඬේරා වන සේක.
   ආ. එසකියෙල් 18:21–32. දුෂ්ඨ අය පසුතැවිලි වූ විට ගැලවෙන අතර, දුෂ්ඨ කමට හැරෙන ධර්මිෂ්ඨයන් නෙරපා දමන බව එසකියෙල් උගන්වයි.
   ඇ. එසකියෙල් 37:1–14. වියළි බොහෝ ඇට කටු වලට ජීවනය ලබා ගෙන දර්ශනයක් එසකියෙල් දකියි.
   ඈ. එසකියෙල් 37:15–28. යුදාගේ ලීය සහ යෝසෙප්ගේ ලීය, ස්වාමින්ගේ අතෙහි එකක් වන බවට එසකියෙල් අනාවැකි කියයි.

2. අමතර කියවීම්: එසකියෙල් 2.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

පහත සඳහන් ප්‍රශ්න කියවන්න (නැත්නම් රටහුණු ලැල්ලේ ලියන්න.)

- එඬේරා ගොපල්ලා (කුලීකාරයා) ගෙන් වෙනස්වන්නේ කෙසේද?

සභාපති එස්රා ටැෆ්. බෙන්සන්ගේ පහත සඳහන් උපුටාගැනීමෙන් මෙම ප්‍රශ්න වලට පිළිතුරු සඳහා සවන්දීමට පංති සාමාජිකයින්ට කියන්න (පංති සාමාජිකයෙකු ලවා උපුටාගැනීම කියවීමට ඔබට උවමනා වෙනවා ඇත.)

"යේසුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ එඬේරුන් ඔවුන්ගේ බැටළුවන් ආරක්ෂාකිරීම ගැන ප්‍රසිද්ධියක් ඉසුළුවේය. නවීන ගොපල්ලන් මෙන් නොව, එඬේරා නිතරම ඔහුගේ රැළට පෙරටුව ගමන් කළේය. ඔවුන්ට ඔහු මගපෙන්වූයේය. එක් එක් බැටළුවෙකු එඬේරා දැන සිටි අතර, සාමාන්‍යයෙන් එක් එක්කෙනාට නමක්ද තබන ලදී. බැටළුවෝ ඔහුගේ හඬ දැන ඔහු කෙරෙහි විශ්වාසය තබමින් නාඳුණන කෙනෙකු පසුපස නොගියෝය. එලෙස, කථා කළ විට, බැටළුවෝ ඔහු වෙතට පැමිණෙති. (යොහාන් 10:14, 16 බලන්න.)

"රාත්‍රී කාලයේදී ඔවුන්ගේ බැටළුවන්, ගාල යයි නම්කරන බැටළු ගාලට රැගෙන එති. බැටළු ගාල උස් තාප්ප වලින් වටකරන අතර, කැලෑ සතුන්ගෙන් හා හොරුන් උඩට නැගීම වළක්වාලීමට තාප්ප උඩ කටු අතුරන ලදී.

"කෙසේ වෙතත්, සමහර විට, කුසගින්නෙන් පෙළෙන කැලෑ සතෙකු රිංගා තාප්පයට උඩින් බැටළු පැටවුන් මැදට පැන ඔවුන්ව භය කිරීමට හැකි වේ. එවැනි අවස්ථාවක බැටළු පැටවුනට ආදරය කරන—-සැබෑ එඬේරාත්—මුදලට සහ රාජකාරියට පමණක් වැඩ කරන– - කුලී කාරයාත් අතර වෙනස පෙන්නුම් කරයි.

"සැබෑ එඬේරා ඔහුගේ බැටළුවන් වෙනුවෙන් ජීවිතය දීමට කැමති වෙයි. ඔහු බැටළුවන් අතරට ගොස් තමාගේ බැටළුවන්ගේ ශුභසිද්ධිය උදෙසා සටනට යයි. කුලීකාරයා, අනික් අතට,

බැටළුවන්ට වඩා ඔහුගේම පුද්ගලික ආරක්ෂාව අගය කරමින් අනතුරින් වැළකී පළායයි." (Conference Report තුලින්, අප්‍රේ.. 1983, 61; හෝ *Ensign*, මැයි 1983, 43).

උපුටාගැනීම කියෙව්වාට පසු, එඬේරා සහ ගොපල්ලා (හෝ කුලීකාරයා) අතර වෙනස සාරාංශගත කිරීමට පංති සාමාජිකයින්ට කියන්න. අවශ්‍ය නම් පහත සඳහන් ප්‍රශ්න භාවිතා කරන්න. පිළිතුරු රටහුණු ලෑල්ලේ ලැයිස්තුගත කරන්නः

- බැටළුවන් සම්බන්ධව එඬේරා ගමන් කරන්නේ කොහේද? ගොපල්ලා ගමන් කරන්නේ කොහේද? (එඬේරා බැටළුවන්ට පෙරටුවෙන් යමින් ඔවුන්ට මගපෙන්වයි; ගොපල්ලා බැටළුවන් දක්කාගෙන පිටුපසින් යන බව උපුටාගැනීමෙන් අදහස් කරයි.)
- එක් එක් බැටළුවෙකු සමග එඬේරාගේ සම්බන්ධකම කුමක්ද? එක් එක් බැටළුවෙකු සමග ගොපල්ලාගේ සම්බන්ධකම කුමක්ද?
- බැටළුවන් අනතුරට පත් වූ විට එඬේරා ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? ගොපල්ලා ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

ආත්මික එඬේරවරුන් වශයෙන් අපගේ වගකීම් පාඩමේ මෙම කොටසේ සාකච්ඡා කරන බව පහදා දෙන්න.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළකරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, එදිනෙදා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ පුද්ගලික අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

ක්‍රිःපූः 597 දී බබිලෝනියේ නෙබුකද්නේශර් රජු යුදා රාජ්‍යයේ බොහෝ ජනයා වහල් කමට රැගෙන ගියේය. අවුරුදු පහකට පසු, අනාගතවක්තෘ කෙනෙකු වශයෙන්, ස්වාමීන්වහන්සේ කැඳවූ එසකියෙල් මෙම වහළුන් අතර විය. ක්‍රිःපූः 587 බබිලෝනිවරු යෙරුසලම විනාශකොට තවත් බොහෝ අය වහල්කමට රැගෙන ගියෝය. ක්‍රිःපූः 570 වන තෙක් රටින් නෙරපන ලද ඔහුගේ ජනතාවට එසකියෙල් මෙහෙ කළේය.

එසකියෙල්ගේ ලියවිලි වල අඩංගු වන තදින් දොස්නැගීම සහ තේජවන්ත පොරොන්දු යුදාහි පැරණි රාජධානියට පමණක් නොව, අද සභාවේ සාමාජිකයන් ඇතුළු සියළුම ඉශ්‍රායෙලට අදාළ වේ. යෙරුසලම විනාශ වූවත්, ඉශ්‍රායෙලය එක්රැස්ව නැවත පිහිටුවන දවස එසකියෙල් කලින් දුටුවේය. වියලි ඇටකටු සහිත මිටියාවත ගැන ඔහුගේ දර්ශනය සහ යුදාගේ ලීය සහ යෝසෙප්ගේ ලීය ගැන ඔහුගේ අනාවැකි මෙම සිද්ධිය සංකේතවත් කරයි.

**1. ඉශ්‍රායෙල් එඬේරුන්**

එසකියෙල් 34 කියවා සාකච්ඡා කරන්න. රැළ පෝෂණය නොකළ ඉශ්‍රායෙල් තමුන්ම පෝෂ්‍ය කරන එඬේරුන්ට, මෙම පරිච්ඡේදයෙහි ස්වාමීන්වහන්සේ දොස්තබන සේක. තමන්ම යහපත් එඬේරා බවද පසු දවස් වලදී උන්වහන්සේගේ රැළ එක් රැස්කොට සහශ්‍රයට මගපෙන්වන බව උන්වහන්සේ විස්තර කළ සේක.

- එසකියෙල් 34 සඳහන් කරන "ඉශ්‍රායෙල් එඬේරුන්" කවරෙක්ද? (එසකියෙල්ගේ දවස් වල සිටි ආගමික නායකයින්ය.) ස්වාමීන් වහන්සේ ඔවුන් සමග අමනාප වූයේ කුමක් නිසාද? (එසකියෙල් 34:2–4 බලන්න.) එඬේරුන් බැටළුවන්ව නොසලකා හැරිය විට, ඔවුන්ට කුමක් වන්නේද? (එසකියෙල් 34:5–6 බලන්න.)
- ඉශ්‍රායෙල් එඬේරුන් වශයෙන් අප එක් එක්කෙනා සැලකිය හැකි වන්නේ කුමන මාර්ග වලින්ද? (සභා සාමාජිකයින්, අසල්වැසියන්, නිවාස ගුරුවරුන් සහ බැහැදැක උගන්වන ගුරුවරියන්, සහ ගණපූර්ණයේ සහ පංති සාමාජිකයින්ද, අපගේ පවුලේ සාමාජිකයින්මෙන් එකිනෙකා රැකබලා ගනිමින් ශක්තිමත් කිරීමය.)

  වැඩිහිටි බෲස් ආර්. මැකොන්කි මෙසේ කීවේයः "ස්වාමීන්වහන්සේගේ කුමන දරුවෙකුට හෝ, ආත්මික හෝ ලෞකික ශුභසිද්ධිය කෙරෙහි වගකීම් ඇති යමෙකු සභාවේ කුමන නිලයක සේවය කළත්, ඔහු එම බැටළුවන්ගේ එඬේරෙකි. ස්වාමීන්වහන්සේගේ බැටළුවන්ගේ ආරක්ෂිත

(ගැලවීම) ගැන එඬේරුන් උන්වහන්සේට වගකිව යුතුය" (*Mormon Doctrine, 2* වෙනි සංස.. [1966], 710).

- බැටළුවන් පෝෂ්‍ය නොකර, තමුන්ම පෝෂ්‍ය කරන සමහර එඬේරුන් සමග ස්වාමින්වහන්සේ අසතුටට පත්වූ සේක (එසකියෙල් 34:2–3, 8). මෙම වැරැද්දම අදත් අප සමහරෙක් කරන්නේ කෙසේද?

- එසකියෙල් 34:11–16 අනුව, සැබෑ එඬේරුන් ඔවුන්ගේ බැටළුවන්ට කුමක් කරන්නේද? (මෙම ක්‍රියාපද සිහි තබා ගන්න. සොයාබලනවා, සොයනවා, භාරදෙනවා, රැස්කරනවා, පෝෂ්‍ය කරනවා, එකමුතු කිරීම සහ ශක්තිමත් කරනවා.) අන්‍යයන් නොමග යෑම හෝ විසිරී යෑම වැළක්වීම පිණිස අපට පිහිට වීමට හැකිවන්නේ කෙසේද? නොමග ගිය අය රැස්කිරීම පිණිස පිහිට වීමට අපට හැකිවන්නේ කෙසේද? මෙම දේවල් කළ සැබෑ එඬේරුන් මගින් ඔබ ආශිර්වාද ලැබුවේ කෙසේද?

  සභාපති එස්රා ටැෆ්. බෙන්සන් මෙසේ කීවේය: "වඩාත් මහන්සි වී නැවත කැපවීමෙන් වැඩ කිරීමට අපි ඔබලාට කියන්නෙමු….රැකබලාගැනීමට, පෝෂ්‍ය කිරීමට, ආරක්ෂා කිරීමට රැළ ගැන සැලකිලිමත් වීමට අපට ඔබගෙන් අවශ්‍ය වෙනවා, මේ සිද්ධීන් අතරතුරදී සමහරු තාවකාලිකව නැති වූ විට, ඔවුන්ව සොයාගැනීමට අපි ඔබට අභියෝග කරන්නෙමු (Conference Report තුලින්, අප්‍රේ.. 1983, 64; හෝ *Ensign,* මැයි 1983, 45).

- ස්වාමින්වහන්සේ අපට එඬේරෙකු මෙන් වන්නේ කෙසේද? (එසකියෙල් 34:11–16; ගීතාවලිය 23; යෙසායා 40:11; යොහාන් 10:11–15.) මෙම ශුද්ධ වූ ලියවිලි වල විස්තර කරන ලද එක් එක් දෙයක්ම ස්වාමින්වහන්සේ අපට කර තිබෙන අන්දම සාකච්ඡා කරීමට ඔබට උවමනා වෙනවා ඇත.ආත්මයාණන්වහන්සේගේ පෙළඹීම මගින් ගැලවුම්කරුවාණන් ගැන ඔබගේ සාක්ෂිදරන්න.

**2. පසුතැවීම සහ කමාව**

එසකියෙල් 18:21–32 උගන්වා සාකච්ඡා කරන්න

- පසුතැවීම සහ කමාව ගැන මෙම කොටස උගන්වන්නේ කුමක්ද? (එසකියෙල් 18:21–22, 27–28.) "අළුත් සිතක්ද, අළුත් ආත්මයක්ද....සාදාගනිල්ලා" යන්නෙහි අදහස කුමක්ද? (එසකියෙල් 18:31) පාපයෙන් හැරී ඒමත්, හදවතෙහි වෙනස් වීමත් දෙකම පසුතැවීමට අඩංගු වන බව තේරුම්ගැනීම වැදගත් වන්නේ කුමක් නිසාද? හදවතේ මෙම වෙනස්වීම අත්දැකීමට අපට හැකිවන්නේ කෙසේද? (ඇල්මා 5:7–14 බලන්න.)

- ධර්මිෂ්ඨකමින් හැරී ගොස් පසුතැවිලි නොවන ජනතාව ගැන මෙම කොටස උගන්වන්නේ කුමක්ද? (එසකියෙල් 18:24, 26.)

- දුෂ්ඨයාට දඬුවම් කරන විට ස්වාමින්වහන්සේගේ හැඟීම් ගැන මෙම කොටස උගන්වන්නේ කුමක්ද? (එසකියෙල් 18:23, 32 බලන්න.)

- ස්වාමින්වහන්සේගේ සාධාරණය සහ දයාව ගැන මෙම කොටස උගන්වන්නේ කෙසේද? (එසකියෙල් 18:25, 29–32.) ස්වාමින්වහන්සේ සාධාරණ සහ දයාවන්ත බව දැනගැනීමේ වැදගත්කම කුමක්ද?

**3. එසකියෙල්ගේ දර්ශනය වූ ඇට වලින් පිරි සමහුමිය.**

එසකියෙල් 37:1–14 උගන්වා සාකච්ඡා කරන්න. ඉශ්‍රායෙල් දරුවන්ගේ මළවුන්ගෙන් නැවත නැගිටීම සහ ඔවුන්ගේ පොරොන්දු දේශයෙහි නැවත පිහිටුවීම යන දෙකම, එසකියෙල් දුටු ඇට වලින් පිරි සමහුමියේ දර්ශනයෙන් එය සංකේතවත් කරන බව පහදා දෙන්න.

- මළවුන්ගෙන් නැවත නැගිටීම එසකියෙල්ගේ දර්ශනයෙන් සංකේතවත් කරන්නේ කෙසේද? (ඇට එකට එකතු විය, මාංසයෙන් සහ සමින් වැසුනේය, ජීවනය දෙන ලද්දේය; එසකියෙල් 37:1–10 බලන්න; ඇල්මා 11:42–44; 40:23 ද බලන්න.)

- ඉශ්‍රායෙල් දරුවන් ඔහුගෙන් පොරොන්දු දේශයෙහි නැවත පිහිටුවීම, එසකියෙල්ගේ දර්ශනයෙන් සංකේතවත් කරන්නේ කෙසේද? (එසකියෙල්ගේ 37:11–14 බලන්න. මළවුන්ගෙන් නැවත නැගිටීම මෙම නැවත පිහිටුවීම සංකේතවත් කිරීමට භාවිතා කරන ලදී.)

- (එසකියෙල් 37:11). ඉශ්‍රායෙල් "බලාපොරොත්තුව" නැවත අළුත් කිරීම විස්තර කරන උපමිතියක් (වෙනස් වූ වස්තූන් අතර ඇති සමානත්වය) වශයෙන්ද එසකියෙල්ගේ දර්ශනය කියවීමට හැකිය. එසකියෙල් දුටු "මහා සමූදාවක්" වූ ඇට මෙන් ඉශ්‍රායෙල්ගේ බලාපාරොත්තුව මැරී ඇති නමුත්, ප්‍රමාණවත් භාවයට හා ජීවනයට නැවත ඒවා ගෙන ඒමට ගැලවුම්කරුවාණන්ට හැකි වේ. ගැලවුම්කරුවාණන් ඔබගේ බලාපොරොත්තුව නැවත අළුත් කළේ කෙසේද? (ඔබ මෙම ප්‍රශ්නය සාකච්ඡා කරන විට මොරෝනි 7:41 කියවීමට ඔබට වුවමනා වෙනවා ඇත.)

- "ස්වාමින්වහන්සේගේ වචනය අසාපල්ලා"යයි එසකියෙල් කී විට, එසකියෙල්ගේ දර්ශනයේ ඇට ජීවත්වීමට පටන්ගත්තේය (එසකියෙල් 37:4). ස්වාමින්වහන්සේගේ වචනය අපට ජීවනය දෙන්නේ කෙසේද?

### 4. යුදාගේ ලීය සහ යෝසෙප්ගේ ලීය

එසකියෙල් 37:15–28 උගන්වා සාකච්ඡා කරන්න. යුදාගේ ලීය සහ යෝසෙප්ගේ ලීය ගැන එසකියෙල්ගේ අනාවැකිය අර්ථ දෙකකින් සමන්විත බව පහදා දෙන්න. යුදාගේ සහ යෝසෙප්ගේ (ඉශ්‍රායෙල්) ශුද්ධවූ ලියවිලි වාර්ථා පසු දවස් වලදී සම්බන්ධ කිරීම ගැන යොමුවෙයි. යුදා රාජධානිය සහ යෝසෙප් (ඉශ්‍රායෙල්) පසු දවස් වලදී නැවත එකතු වන බවටද යොමුවෙයි.

- එසකියෙල් 37:15–20 අනාවැකිය සම්පූර්ණ වූයේ කෙසේද? (1 නීෆායි 5:14; 2 නීෆායි 3:12; ඩී සහ සී 27:5 බලන්න. මෙම පද වල ලීය යන වචනය යොමුවන්නේ එසකියෙල්ගේ දවස් වල පොදුවේ භාවිතා කළ ලියන ලද ලී පුවරුවකට බව පහදා දෙන්න. යුදාගේ ලීය බයිබලය සංකේතවත් කරන අතර, යෝසෙප්ගේ ලීය මෝර්මන්ගේ පොත සංකේතවත් කරයි.)

  වැඩිහිටි බොයිඩ් කේ. පැකර් මෙසේ කීවේයː "ලීය හෝ යුදාගේ වාර්ථා—පරණ ගිවිසුම සහ අළුත් ගිවිසුම—ලීය හෝ එප්‍රායිම්ගේ වාර්ථා—මෝර්මන්ගේ පොත, එනම් යේසුස් වහන්සේගේ තවත් ගිවිසුමක්—දැන් එකට ගෙතී ඇත. කෙසේද එකක් ඔබ උනන්දුවෙන් අධ්‍යනය කරන විට ඔබ අනිත් එකට යොමුවෙයි. එකකින් ඔබ ඉගෙනගන්නා විට අනෙක් එක මගින් ඔබට අවබෝධය ලබා දෙයි. ඇත්ත වශයෙන්ම එවා අපගේ අතෙහි එකක් වෙයි. එසකියෙල්ගේ අනාවැකිය දැන් සම්පූර්ණ වී ඇත (Conference Report තුලින්, ඔක්තෝ. 1982, 75; හෝ *Ensign*, නොවැ. 1982, 53).

- බයිබලයට අමතරව මෝර්මන්ගේ පොතෙන් පැමිණි ආශිර්වාද මොනවාද? (1 නීෆායි 13:39–40; 2 නීෆායි 3:12 බලන්න.) බයිබලය වඩාත් හොඳට තේරුම් ගැනීමට මෝර්මන්ගේ පොත ඔබට උපකාර වූයේ කෙසේද? යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන බයිබලයේ ඔබගේ සාක්ෂිය එය වැඩියෙන් ශක්තිමත් කළේ කෙසේද?

- ලී දෙක එකට තැබුවාට පසු සිදුවන දෙය ගැන එසකියෙල් කීවේ කුමක්ද?

  අ. ඉශ්‍රායෙල් දරුවන් එකට රැස්කොට, ගැලවුම්කරුවාණන් රජ වශයෙන් එක් රාජ්‍යයක් කිරීම (එසකියෙල් 37:21–22).
  ආ. ජනතාව පිරිසිදු කිරීම සහ පවිත්‍ර කිරීම (එසකියෙල් 37:23).
  ඇ. ස්වාමින්වහන්සේගේ පණත් ජනතාව පිළිපදින්නෝය (එසකියෙල් 37:24).
  ඈ. ජනතාව පොරොන්දු දේශයේ වාසය කරන්නෝය (එසකියෙල් 37:25).

- එසකියෙල් 37:26–28, ස්වාමින්වහන්සේ පොරොන්දු වූ වෙනත් ආශිර්වාද මොනවාද? (දේවමාළිගාව යන අර්ථය ඇති ස්වාමින්වහන්සේගේ රක්ෂාස්ථානය, හෝ මණ්ඩපය, නැවත පිහිටුවීම එක් වැදගත් ආශිර්වාදයකි. දේවමාළිගා ආශිර්වාද විස්තර සහිතව ඊලඟ පාඩමේ සාකච්ඡා කරන්නේය.)

අවසානය.

අප එක් එක්කෙනාට ගැලවුම්කරුවාණන්ගේ මහත් වූ ප්‍රේමය සහ සැලකිල්ල ගැන අවබෝධ කරගැනීමට එසකියෙල්ගේ ඉගැන්වීම් උපකාර වෙයි. උන්වහන්සේ අපගේ එඬේරාණන්ය. සමාව දීමට උන්වහන්සේ මහත් ආශාවෙන් සිටී. මළවුන්ගෙන් නැවත අපට නැගිටීමට උන්වහන්සේ සැලැස්වූ සේක. පසු දවස්වල ඉශ්‍රායෙල්ගේ රැස්වීම් වල උන්වහන්සේ මගපෙන්වයි. උන්වහන්සේගේ තවත් සාක්ෂියක් වශයෙන් මෝර්මන්ගේ පොත උන්වහන්සේ ඉදිරියට ගෙනආ සේක. මෙම සත්‍යයන් පිළිබඳ ඔවුන්ගේ සාක්ෂි බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1. යහපත් එඬේරෙකු වීමට ඉගෙන ගැනීම**

එඬේරුන් වශයෙන් අපගේ වගකීම් සාකච්ඡා කරන අතර, සභාපති ජේම්ස් ඊ. ෆවුස්ට්ගේ පහත සඳහන් කථාන්තරය කියවීමට හෝ කීමට ඔබට වුවමනා වෙනවා ඇත.

"මම කුඩා පිරිමි ළමයෙකුව සිටින විට, කාන්තාරයේ තනිවූ බැටළු පැටවෙක් මගේ පියාට හමුවිය. උගේ අම්මා අයිති බැටළු රැළ ඈතට ගිය අතර කෙසේ හෝ මෙම බැටළු පැටවා අම්මාගෙන් මග හැරෙන්ට ඇත. ඌව නැති වූ බව එඬේරා නොදැන සිටින්නට ඇත. කාන්තාරයේ තනිව ජීවත් වීමට ඌට නොහැකි නිසා, මගේ පියා ඌව ගෙදර ගෙන ආවේය. බැටළු පැටවා එහි දමා ආවානම් සත්‍යවශයෙන්ම වෘකයෙකුට ගොදුරක් වීමෙන් හෝ සාගින්නේ ඔහු මැරෙන්ට ඉඩ තිබුනි, මක්නිසාද තවමත් කිරි බීමට අවශ්‍ය ළදරු වයසේ සිටි බැවින්ය....මගේ පියා බැටළු පැටවා මට දුන් නිසා, මම උගේ එඬේරා බවට පත්වුනෙමි.

"සති කිහිපයක්ම එළකිරි රත් කොට ළදරුවන් කිරි බොන බෝතලයකට දමා බැටළු පැටවාට මම පෙව්වෙමි. අපි ඉක්මණටම මිතුරන් වූයෙමු…ඌ වැඩෙන්ට පටන්ගත්තේය. මගේ බැටළු පැටවා සහ මම තණ කොල පිට්ටනියේ සෙලලම් කරන්නෙමු. සමහර විට අපි තණකොල මත හාන්සි වී, උගේ සුමුදු, ලොම් සහිත පැත්තේ මගේ හිස තබා, නිල් අහස සහ රැළි මෙන් උස්ව නැගෙන වළාකුල් දෙස බලා සිටිමි. දවල් කාලයේදී මම ඌව වසා තැබුවේ නැත. ඌ පැනලා යන්නේ නැත. ඌ තණකොල කැමට ඉක්මණින් පටන්ගත්තේය. බැටළුවන්ගේ 'බෑ' ගාන හඬින් හැකි තරම් හොඳට අණුකරණය කරමින් පිට්ටනියේ ඕනෑම තැනක සිට මගේ බැටළු පැටවාට මට කථා කළ හැකිය…

"එක් රාත්‍රියක දරුණු දරුණු කුණාටුවක් පැමිණියේය. වෙනදා මා කරන අන්දමට, එම රාත්‍රියේදී මගේ බැටළු පැටවා පිදුරු මඩුවේ දැමීමට මට අමතක විය. මම ඇඳට ගියෙමි. මගේ කුඩා මිතුරා කුණාටුවට භය වී බෑ යන හඬින් කෑගසනවා මට ඇසුනි. මගේ සුරතලාට පිහිට විය යුතු බව මම දැන සිටියෙමි. නමුත් මට ආරක්ෂාවෙන්, උණුසුම්ව නොතෙමී ඇඳේ සිටීමට උවමනා විය. මට එය කළ යුතුව තිබුනත් මා නැගිට්ටේ නැත. පසුදා උදෑසන මගේ බැටළු පැටවා බැලීමට යන විට ඌ මැරී සිටියේය. බල්ලෙකුට ඌ බෑ කියා අඬනවා ඇසී ඌව මරා දමා තිබුනි. මගේ හදවත දුකින් පෙළුනේය. මම යහපත් එඬේරෙකු නොවූ අතර, මගේ පියා මට පැවරූ භාරකාරත්වය මම නොසලකා හැරියෙමි. මගේ පියා මෙසේ කීවේය, 'පුතා එක බැටළු පැටවෙකු රැක බලා ගැනීමට මගේ විශ්වාසය ඔබ කෙරෙහි තබන්ට බැරිද?' මගේ ලොම් සහිත මිතුරා නැති වීමටත් වඩා පියාගේ ප්‍රකාශය වඩාත් වේදනා සහිත විය. නැවත මම එම තත්වයෙහි, එනම් එඬේරෙකු වශයෙන් මගේ භාරකාරත්වය නැවත කිසි දිනක නොසලකා හැරීමෙන් වළකින බවට, කුඩා පිරිමි ළමයෙකු වශයෙන් මම එදින අදිටන් කරගතිමි.

"ඉන්පසු අවුරුදු ගණනක් යෑමට පෙර නිවාස ගුරුවරයෙකුට කණිෂ්ඨ සහකරුවෙකු වීමට මට කැඳවීම ලැබුනි. සීතල කුණාටු දවස් වලදී සැපපහසු කමින් ගෙදර නැවතීමට මට උවමනා වෙයි. මගේ කුඩා බැටළු පැටවා බෑ කියන හඬ මගේ මනසේ කණින් මට ඇසෙයි. එවිට මම යහපත් එඬේරෙකු වීමට අවශ්‍ය බවත්, මගේ ජ්‍යේෂ්ඨ සහකාරයා සමග යෑමට අවශ්‍ය බවත් මම දැනගත්තෙමි. මෙම සියළු අවුරුදු වලදී, මගේ වගකීම පැහැර හැරීමට ආශාව ඇති වූ විට,

අවුරුදු ගණනාවකට පෙර එම රාත්‍රියේදී, යහපත් එඬේරෙකු වීමට නොහැකි වීම ගැන දුක මට සිහිපත් වෙයි.” (In Conference Report, තුලින්, අප්‍රේ.. 1995, 62–63; හෝ *Ensign*, මැයි 1995, 46).

**2. මුරකාරයන් අනතුරු ඇඟවීමේ හඬ එසවීම**

- එසකියෙල්ව අනාගතවක්තෘවරයෙකු වීමට කැඳවීමේදී ස්වාමින්වහන්සේ මෙසේ කීසේක, “ඉශ්‍රායෙල් වංශයට මම නුඹ මුරකාරයෙකු කළෙමි” (එසකියෙල් 3:17). අනාගතවක්තෘවරයෙකු වශයෙන් එසකියෙල්ගේ වගකීම් මුරකාරයෙකුගේ මෙන් වන්නේ කෙසේද? (එසකියෙල් 3:17–21; 33:1–9. බලන්න. එසකියෙල්ගේ දවස්වලදී, කණුව මත සිටි මුරකරු සතුරු හමුදා වලින් පැමිණෙන අනතුරු ජනතාවට ඇඟෙව්වේය. ආත්මිකව ඔවුන්ට අනතුරු කරන සතුරන් ගැන එසකියෙල් තම ජනතාවට අනතුරු ඇඟෙව්වේය.)
- පසු දවස් වල අපගේ මුරකාරයන් කවුද? මෙම මුරකාරයන් සිටීමේ වැදගත් කම කුමක්ද? අප මුරකාරයන් වීමේ වැදගත්කම කුමක්ද? (ඩී සහ සී 88:81 බලන්න. ශුභාරංචිය නොදන්නා අයට එය ඉගැන්වීම අපගේ වගකීමේ කොටසකි.)

අනාගතවක්තෘවරුන්ගේ අනතුරු ඇඟවීම් වලට සවන්දීම.....සහ ශුභාරංචිය උගන්වමින් අපගේ අසල්වැසියන්ට අනතුරු ඇඟවීමේ වැදගත්කම ඉගැන්වීමට—1976 අයිඩාහෝහි ටෙටෝන් බැම්ම කඩාවැටීමට හේතුවූ විනාශකාරී ජල ගැල්ම ගැන වැඩිහිටි බොයිඩ් කේ. පැකර් කීවේය. වේගයෙන් ගලා යන ජලගැල්මේ මාවතේ 7,800 ජනයා සිටියහ. මිටියාවත පහලට ජලය වේගයෙන් ගලා යමින් නිවාස 790 විනාශ කළ අතර, තවත් නිවාස 800ක් සහා, පාසැල් සහ ව්‍යාපාරික ස්ථාන වලට බොහෝ හානි සිදු විය. ජලයේ ප්‍රමාණය, එහි වේගය, සහ ප්‍රදේශයේ ජනගහනය සලකා බලන විට, මිනිසුන් 5,300 ක් පමණ ජීවිතක්ෂයට පත්වෙන්ට ඇතැයි එක් විශේෂඥයෙක් ගණන් බලා තිබුනේය. විශ්වාස කළ නොහැකි අන්දමට, 6 දෙනෙක් පමණක් ගිලුනෝය.

වැඩිහිටි පැකර් මෙසේ ඇසුවේය:

“එතරම් දරුණු විනාශයකදී, එතරම් සුළු ප්‍රමාණයක ජීවිත නැතිවූයේ කෙසේද?....මක්නිසාද ඔවුන්ට අනතුරු අඟවන ලදී! දිගු කලක් ඔවුන්ට නොතිබුන නමුත්, ඔවුන්ට අනතුරු අඟවන ලදී. අනතුරු ඇඟවීම ලැබූ සෑම කෙනෙක්ම තම අසල්වැසියාට අනතුරු ඇඟෙව්වේය…

“ගිලීමැරුණු හයදෙනා ගැන කුමක්ද? එයින් එක් අයෙකු හරියටම බැම්ම යට සිටිය නිසා අවස්ථාවක් නොවීය. ඔවුන් දෙදෙනෙකු, අන්තිම අවස්ථාව වන තෙක් අනතුරු ඇඟවීම ගැන විශ්වාස නොකළෝය. දෙදෙනාම ඔවුන්ගේ රථය තුල පසුව හමුවූ අතර, අනතුරු ඇඟවීමට ඔවුහු සවන් නොදුන්නෝය. ඔවුන්ගෙන් තුන්දෙනෙකු තමන්ට අයිති උපකරණ ගැනීමට ගිය අතර ඔවුන්ගේ ජීවිත නැති විය.

“නමුත් එය අතිවිශාල ක්‍රමාණුකුල හාස්කමකි. පසු දවස් වල ශුද්ධවන්තයන් වශයෙන් අනතුරු ඇඟවීම් වලට සවන්දීමට අප ඉගෙනගන්නෙමු….

“ලෝකයේ සිදුවීම් වල විශාල සමානත්වයක් මට දැන් පෙනෙනවා, එනම් දුෂ්ඨකමේ සහ නපුරුකමේ ගොඩගලන රැල්ලක් ලෝකයේ තිබේ. එය අප අවට ගිලාබසිමින් වඩවඩාත් ගැඹුරට යයි. අපගේ ජීවිත අනතුරෙහිය. අපගේ වස්තුව අනතුරේය. අපගේ නිවාස අනතුරේය, එනමුත්, අනතුරු ඇඟවීම් ලැබූ සෑම මිනිසෙක්ම, තම අසල්වැසියාට අනතුරු ඇඟවීම් ගැන අවබෝධයක් නැතිව, අපගේ දිනපතා වැඩකටයුතු වල යෙදෙන්නෙමු….

“අනාගතවක්තෘකෙනෙකු මගින් අනතුරු ඇඟවීම් [අපට දෙන ලදී] [අපි] අනතුරු ඇඟවීමට සවන්දෙන්නෙමුද, නැතහොත් [අපි] අනතුරු ඇඟවීම ඔවුන්ට නොවේ යයි සිතූ අයිඩානෝ හය දෙනා මෙන් [අපි] වන්නෙමුද?” (*That All May Be Edified* [1982], 220–21, 223).

# 44
වෙනි පාඩම

# "ගංගාව ගලන කොතනක නමුත් ඉන්න සියල්ලන් ජීවත්ව සිටිනවා ඇත"

*එසකියෙල් 43–44; 47*

**අරමුණ**

දේවමාළිගාවෙන් සලසාදෙන, ජීවනදායක, සුවවීමේ බලයට සහභාගීවීමට පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය.

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්නඃ

   අ. එසකියෙල් 43ඃ1–12; 44ඃ6–9, 23. යෙරුසලමේ දේවමාළිගාව ගැන දර්ශනයක් එසකියෙල්ට පෙන්වන ලදී.
   ආ. එසකියෙල් 47ඃ1, 6–12. කාන්තාරයට ජීවනය දෙමින් ගොළුමුහුද සුව කරමින් දේවමාළිගාවෙන් ගංගාවක් ගලාබසිනවා එසකියෙල් දකියි.
   ඇ. එසකියෙල් 47ඃ2–5. ගංගාවේ ගැඹුර එසකියෙල් මණින අතර, ජලයේ බැස ඇවිදින එක් එක් අවස්ථාවකම, ජලය ගැඹුරු වන බව සොයාගන්නේය.

2. පංතිය පටන්ගැනීමට පෙර, 209 වෙනි පිටුවේ තිබෙන සිතියම දැන්වීමක හෝ රටහුණු ලෑල්ලේ අඳින්න.

3. අමතර කියවීම්ඃ එසකියෙල් 40–42; යොාවෙල් 3ඃ18; සෙකරියා 14ඃ8; එළිදරව් 22ඃ1–3; 1 නීෆායි 8ඃ10–11; 11ඃ25; දහම සහ ගිවිසුම 97ඃ8–20.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පාඩම පටන්ගැනීමට, පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

යින්ගෙන් අසන්නඃ

- ක්‍රීඩාවක් හෝ වෙනත් විනෝද උත්සවයක් බලා සිටින විට, ඔබට කිසි දිනක උනන්දුවක් ඇතිවී තිබෙනවාද?
- නැගිට ඔල්වරසන් හඬදෙමින් කෑගැසීමට එවැනි සිද්ධීන් කිසිදිනක ඔබව උනන්දුකර තිබෙනවාද?
- උද්යෝගය පෙරදැරිකොට ගෙන ප්‍රීතිය හා කෘතඥතාවය ප්‍රකාශ කළ බවට හෝ කරන බවට පූජනීය සිද්ධීන් ගැන ඔබට සිතන්ට පුළුවන්ද? එවැනි සමහර සිද්ධීන් මෙහි අඩංගු වේඃ

   අ. පොළොව මැවීම (යෝබ් 38ඃ4–7).
   ආ. යේසුස් වහන්සේ විජයග්‍රාහිව යෙරූසලමට ඇතුල්වීම (යොහාන් 12ඃ12–16).
   ඇ. යේසුස් වහන්සේගේ දෙවෙනි ඊම සහ මළවුන්ගෙන් නැවත නැගිටීම (1 තෙසලෝනික 4ඃ16).

- ක්‍රීඩා හෝ වෙනත් විනෝද උත්සව සිදිධීන් කෙරෙහි උනන්දුව, මෙම පූජනීය සිද්ධීන් තුලින් ඇතිවෙන ප්‍රීතියට සමාන කළ හැකි වන්නේ කෙසේද? (ක්‍රීඩා හෝ වෙනත් විනෝද උත්සව වලින් ලැබෙන උනන්දුව තාවකාලික වන අතර, පූජනීය සිද්ධීන් ආශ්‍රිත ප්‍රීතිය සදාකාලිකය.)
- සහභාගිවෙන අය සිටගැනීමෙන්, කෑගසමින් සහ අත් වනමින්, ඔවුන්ගේ ප්‍රීතිය සහ කෘතඥතාවය පෙන්වන සභාවේ පූජනීය සිද්ධිය කුමක්ද? (දේවමාළිගාවක් කැපකිරීමේදී, හෝසන්නා කෑගැසීම යයි කියන ප්‍රීතියේ මහත් ප්‍රකාශයට සෙනග සහභාගීවෙති.)

"යමෙකුගේ ශක්තියේ සම්පූර්ණ සීමාව යොදවමින් මුළු ආත්මයෙන් දෙන එකකි හෝසන්නා කගැසීම. සභාව නැගිට එක්සත්ව, 'හෝසන්නා,හෝසන්නා, දෙවියන් වහන්සේට සහ බැටළු පැටවාණන්ට හෝසන්නා, ආමේන් සහ ආමේන්,'යන වචන තුන්වරක් නැවත නැවත කියමින් කෑගසති. සාමාන්‍යයෙන්, අත් ඔසවා සුදු ලේන්සු තාලයකට වනමින් මෙය පවත්වයි. 'බැටළු පැටවා' යන වචනය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නිහතමානී බවට සහ වන්දිගෙවීමට සම්බන්ධ වේ" (ඩැනියෙල් එච්. ලුඩ්ලෝ, සංස්. *Encyclopedia of Mormonism,5 වෙනි ග්‍රන්.* [1992], 2:659).

දේවමාළිගාව ගෙන එන ප්‍රීතියේ, බොහෝ මාර්ග වලින් සමහරක් අවබෝධ කරගැනීමට මෙම පාඩම පංති සාමාජිකයින්ට පිහිට වන බව පහදා දෙන්න.

---

**ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළ කරගැනීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, එදිනෙදා ජීවිතයට ඒවා අදාළවන අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. යෙරූසලමේ දේවමාළිගාව ගැන දර්ශනයක් එසකියෙල්ට පෙන්වන ලදී.**

එසකියෙල් 43:1–12; 44:6–9, 23.උගන්වා සාකච්ඡා කරන්න.

- එසකියෙල් 43:1–12; 44:6–9, 23. පංති සාමාජිකයින් ලවා කියවන්න. මෙම පද වලින් දේවමාළිගාව ගැන අපට කුමක් ඉගෙනගැනීමට හැකිද?


  පංති සාමාජිකයින්ගේ පිළිතුරු රටහුණු ලෑල්ලේ ලියා, ඒවායේ අදහස සාකච්ඡා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

  අ. ස්වාමින්වහන්සේගේ තේජසින් දේවමාළිගාව පිරී තිබේ (එසකියෙල් 43:2, 4–5).
  ආ. මෙම පොළොවෙහි තිබෙන දේවමාළිගාව "[ස්වාමින්වහන්සේගේ] සිංහාසනයේ ස්ථානයයි" (එසකියෙල් 43:7).
  ඇ. "මාගේ පාද පතුල්වල ස්ථාන"යයි කියමින් ස්වාමින්වහන්සේ දේවමාළිගාව තුල ඇවිදින සේක (එසකියෙල් 43:7).
  ඈ. උන්වහන්සේගේ ජනයා "අතරේ වාසය කරන"ස්වාමින්වහන්සේගේ ස්ථානය දේවමාළිගාව වෙයි (එසකියෙල් 43:7).
  ඉ. ස්වාමින්වහන්සේගේ ව්‍යවස්ථා ගැන දේවමාළිගාවේදී අපි ඉගෙනගන්නෙමු (එසකියෙල් 43:11).
  ඊ. දේවමාළිගාව තුල අප ඉටුකිරීමට ස්වාමින්වහන්සේට උවමනා නියෝග තිබේ (එසකියෙල් 43:11).
  උ. දේවමාළිගාව වට කරන පොළොවේ මුළු සීමාවම "ඉතා ශුද්ධය" (එසකියෙල් 43:12).
  ඌ. සුදුස්සන් වූ අය පමණක් දේවමාළිගාවට ඇතුල්විය යුතුය (එසකියෙල් 44:6–9).
  එ. ශුද්ධ සහ අශුද්ධ දේ කෙලෙසීම අතරද, පවිත්‍ර සහ අපවිත්‍ර යන්නෙහි අතර වෙනසද දේවමාළිගාවේදී අපි ඉගෙනගන්නෙමු (එසකියෙල් 44:23).

**2. කාන්තාරයට ජීවනයලබා දෙන ගොළු මුහුද සුවකරන ගංගාවක් දේවමාළිගාවෙන් ගලාබසිනවා එසකියෙල් දකියි.**

එසකියෙල් 47:1, 6–12 උගන්වා සාකච්ඡා කරන්න.

- යෙරූසලමේ දේවමාළිගාවේ නැගෙනහිර දොරටුවෙන් කුමක් පැමිණෙනවා එසකියෙල් දකින්නේද? (බලන්න එසකියෙල් 47:1.) වතුර ගියේ කොතනටද? (බලන්න එසකියෙල් 47:8. යෙරූසලමෙන් නැගෙනහිර තිබෙන යුදා වනාන්තරය සහ ගොළු මුහුද සිතියමේ පෙන්වන්න.)




- යුදා වනාන්තරය නිසරු කාන්තාරයකි, තවද ගොළු මුහුදේ අධික ලුණු මිශ්‍ර ජලය සත්ව ජීවිතය පෝෂ්‍ය නොකරයි. යුදා වනාන්තරයට හා ගොළු මුහුදට දේවමාළිගාවෙන් ගංගාවක් ගලායෑම නිසා, එසකියෙල්ගේ දර්සනය අනුව කුමන වෙනස්කම් සිදුවන්නේද? (එසකියෙල් 47:6–12 බලන්න.)

- දේවමාළිගාව ගැන එසකියෙල්ගේ දර්ශනයට සමාන දර්ශනයකින් දෙවියන්වහන්සේගේ සිංහාසනය ආදරවන්ත යොහාන්ටද පෙන්වන ලදී (එළිදරව් 22:1–3. එසකියෙල් 43:7, "මගේ සිංහාසනයේ ස්ථාන" යයි දේවමාළිගාවට ස්වාමීන්වහන්සේ කියන බව සිහිතබාගන්න.) යොහාන්ගේ දර්ශනයෙහි දෙවියන්වහන්සේගේ සිංහාසනයෙන් ගලාගියේ කුමක්ද? (එළිදරව් 22:1 බලන්න.) "ජීවනයේ වතුර" යනු කුමක්ද? (ශුභාරංචියේ ධර්මය; 30 වෙනි පාඩමේ ක්‍රියාකාරීත්වයට යොමුවීම බලන්න.) ජීවනයේ වතුර අප නොගන්නේ නම්, අප යුදා වනාන්තරය සහ ගොළු මුහුද මෙන් වන්නේ කෙසේද?

- දේවමාළිගාවේ සුලබව තිබෙන ජීවනයේ වතුර විවාහ පවුල්,? අපගේ මුතුන්මිත්තන්,? සභාව? සුව කරමින් ජීවනය ලබා දෙන්නේ කෙසේද? ආත්මික ජීවිතය හා සුව කිරීම ගෙන දෙන දේවමාළිගාවෙන් ගලාඑන වෙනත් දේවල් මොනවාද? (සත්‍ය, ප්‍රඥාව, එළිදරව් සහ ගිවිසුම් යනාදිය පිළිතුරු වලට අඩංගු වේ.)

- එසකියෙල් 47:12 එසකියෙල්ගේ දර්ශනයෙහි ගඟ අද්දර වැවෙන ගස් විස්තර කරයි. ගඟේ ජලයත් සමග ගස් වල පොදුවේ ඇත්තේ කුමක්ද? (සුව කිරීම හා ජීවනදායක බලය ඒවාට තිබුනි.)

- යොහාන්ගේ දර්ශනයෙහි ගඟ අද්දර වැවුණේ කුමක්ද? (එළිදරව් 22:2 බලන්න.) අනාගතවක්තෘවරුන්ගේ ශුද්ධ වූ ලියවිලි වල ජීවන වෘක්ෂය පෙන්වන වෙනත් තැන් මොනවාද? (1 නීෆායි 8:10–11; 11:25 බලන්න.) ලීහායි සහ නීෆායිගේ ස්වප්න වලදී ජීවන වෘක්ෂය නියෝජනය කළේ කුමක්ද? (1 නීෆායි 11:25 බලන්න.)

- දෙවියන්වහන්සේගේ ප්‍රේමය සුවය සහ ජීවනය දෙන්නේ කෙසේද? දෙවියන්වහන්සේගේ ප්‍රේමය සුව කරන ආත්මික හා ශාරීරික තුවාල මොනවාද?

**3. ගඟෙහි ගැඹුර එසකියෙල් මනියි.**

එසකියෙල් 47:2–5 උගන්වා සාකච්ඡා කරන්න.

- එසකියෙල් පළමු වතාවේ එගොඩට යන විට ගඟ කොපමණ ගැඹුරුද? (එසකියෙල් 47:2–3 බලන්න.) එසකියෙල් දෙවෙනි, තුන්වෙනි සහ හතරවෙනි වතාවල එගොඩට යන විට එය කොතරම් ගැඹුරුද? (එසකියෙල් 47:4–5 බලන්න.) දේවමාළිගාව ගැන කුමණ සත්‍යයක් මෙම පද යෝජනා කරන්නේද? (අප නිතර එයට පැමිණෙන විට අපගේ ජීවිත තුල දේවමාළිගාවේ බලය වැඩිදියුණු වෙයි.)

- බොහෝ සංකේත මගින් පුදුමාකාර සත්‍යයන් දේවමාළිගාවේදී උගන්වනු ලැබේ. මෙම සත්‍යය නැතහොත් දේවමාළිගා නියෝග ගැන අපගේ අවබෝධය පළමුවතාවට "වළලුකර තෙක් පමණක් ගැඹුරුය," එබැවින් අප කුමක් කළයුතුද? (එසකියෙල් 47:2–5 බලන්න. අප නැවත නැවතත් "ගඟ" තුලට බැස ගමන් කළ යුතුය—වෙනත් වචන වලින් නම් හැකි සෑම අවස්ථාවකම දේවමාළිගාවට පැමිණිය යුතුය.)

---

අවසානය.

"ස්තුති දීමේ ස්ථානයක්"යයි දේවමාළිගාවට ස්වාමින්වහන්සේ කී බව පංති සාමාජිකයින්ට කියන්න (ඩී සහ සී 97:13). දේවමාළිගාව නිසා ඔබට ලැබුන ආශිරවාද ගැන ඔබගේ ස්තුතිය ප්‍රකාශ කරන, අතර දේවමාළිගාව කෙරෙහි ඔවුන්ගේ කෘතඥතාවයේ හැඟීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න. එසකියෙල්ගේ දර්ශනයෙහි, යුදා වනාන්තරය සහ ගොළු මුහුද දේවමාළිගාවේ වතුරෙන් සුවකළාක් මෙන්ම, අප එයට සහභාගී වන්නේ නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචියෙන් අපව සුව කොට පවිත්‍ර කිරීමට හැකිය.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1. "ඔබගේ ගෘහයෙහි වාසයට මම පෙම් කරමි" (ගීතාවලිය 26:8).**

දේවමාළිගාවට පැමිණීමෙන් ලැබෙන ආශිර්වාද ගීතාවලියේ බොහෝ තැන්වල සඳහන් වන අතර දේවමාළිගාවට ප්‍රේම කිරීම සහ ස්තුතිදීමේ හැඟීම් ප්‍රකාශ කරයි. පහත සඳහන් ගීතිකා ඔබ සාකච්ඡා කරන විට, දේවමාළිගාව කෙරෙහි කෘතඥතාවයේ හැඟීම් ප්‍රකාශ කිරීමට පංති සාමාජිකයින් සමහර දෙනෙකුට කීමට ඔබට වුවමනා වෙනවා ඇතː

ගීතාවලිය 24:3–4
ගීතාවලිය 26:6–8
ගීතාවලිය 27:1, 4–6
ගීතාවලිය 65:4
ගීතාවලිය 84
ගීතාවලිය 122
ගීතාවලිය 134

**2. "[අපගේ] සාමාජිකත්වයේ උතුම් සංකේතය"**

සභාපති හෝවඩ් ඩබ්ලිව්. හන්ටර් මෙසේ කීවේයː "ඔබගේ සාමාජිකත්වයේ උතුම් සංකේතයක් වශයෙන් ස්වාමින් වහන්සේගේ දේවමාළිගාව කෙරෙහි බැලීමට, පසු දවස් වල ශුද්ධවරයින්ට මම ආරාධනා කරමි. දේවමාළිගාවට ඇතුල්වීම පිණිස, සභාවේ සෑම සාමාජිකයෙකුම සුදුස්සන් වීම, මාගේ හදවතෙහි දැඩි ආශාව වේ. සුදුසුකම් ලත් සභාවේ සෑම සාමාජිකයෙක්ම—-වලංගු—දේවමාළිගා නිර්දේශයක් තමා ලඟ තබාගැනීම ස්වාමින්වහන්සේට ප්‍රසන්න දෙයකි. දේවමාළිගා නිර්දේශයක් පිණිස සුදුසුකම් ලැබීමට, අප කළ යුතු හා නොකළයුතු දේවල් පුද්ගලයින් හෝ පවුල් වශයෙන් ප්‍රීතිය ලබාගැනීමට ස්ථිර කරන එම දේවල්මය. (Conference Report තුලින්, ඔක්තෝ, 1994, 8; හෝ *Ensign,* නොවැ. 1994, 8).

- දේවමාළිගාව සභාවේ "[අපගේ] සාමාජිකත්වයේ උතුම් සංකේතයක්" කිරීමට අපට හැකිවන්නේ කෙසේද? මේ ආකාරයෙන් දේවමාළිගාව දෙස බැලීම, අපගේ ජීවිතයේ දර්ශනය සහ ස්වාමින්වහන්සේගේ වැඩකටයුතු කෙරෙහි අපගේ කැපවීමට බලපාන්නේ කෙසේද?

# 45

වෙනි පාඩම.

# “මා නැතිවුණොත්, නැතිවුණාවේ”

*දානියෙල් 1; 3; 6; එස්තර් 3–5; 7–8*

**අරමුණ**

ශුභාරංචියේ ප්‍රමිතිය අනුව ජීවත් වීමට පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය.

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.

   අ. දානියෙල් 1. දානියෙල් සහ ඔහුගේ මිතුරෝ නෙබුකද්නේශර් රජුගේ කෑම කා ඔවුන්ව අපිරිසිඳු වන නිසා ඒවා ප්‍රතික්ෂේප කළෝය. (1:1–16; යහපත් සෞඛ්‍යය තත්වයෙන් හා ඥානයෙන් දානියෙල්ට සහ ඔහුගේ මිතුරන්ට ස්වාමින්වහන්සේ ආශිර්වාදකරන සේක (1:17–21).

   ආ. දානියෙල් 3. ෂද්‍රක්ද, මේෂක්ද, අබේද්-නෙගෝද නෙබුකද්නේශර්ගේ රූපවන්දනා කිරීම ප්‍රතික්ෂේප කළෝය. (3:1–12). නෙබුකද්නේශර් රජු ඔවුන්ව ඇවිලෙන ගිනි උඳුනකට හෙළු අතර, ස්වාමින්වහන්සේ ඔවුන්ව මරණයෙන් ගලවාගත් සේක (3:13–30).

   ඇ. දානියෙල් 6. කවුරු හෝ තිස් දවසක් යන තුරු ඔබගෙන් මිස, කිසි මනුෂ්‍යයෙකුගෙන් වත්, දෙවිකෙනෙකුගෙන් වත් කිසියම් අයදුමක් කළොත්, ඔහු සිංහ ගුහාවේ දමන බවට පනතක් අත්සන් කිරීමට දාරියුස් රජුව ඔහුගේ මිනිස්සු පෙළඹවූහ (6:1–9). රජුගේ පණත නොතකා, දානියෙල් දෙවියන්වහන්සේට යාච්ඤා කළේය (6:10–13). පණතට අකීකරුවීමේ දඬුවමක් වශයෙන්, දානියෙල්ව සිංහ ගුහාවකට දමනු ලැබුවේය (6:14–17). දානියෙල්ව ආරක්ෂා කිරීමට දෙවියන්වහන්සේ දේවදූතයෙකු එවන සේක (6:18-23).

   ඈ. එස්තර් 3–5; 7–8. මොර්දෙකයි හාමාන්ට නැමී වැඳීම ප්‍රතික්ෂේප කළේය (3:1–4). රාජ්‍යයෙහි සියළුම යුදෙව්වන් මරණයට පත්කිරීම පිණිස පණතක් සූදානම් කොට ඉදිරිපත් කිරීමට හාමාන් අහෂ්වේරෝෂ් රජුව පෙළඹුවේය (3:5–14). ඇයගේ ජනතාව මැරීමට හාමන්ගේ සැලසුම දැනගත් එස්තර්, ඇයගේ ජීවිතය පරදුවට තබා පිහිට පතා රජු වෙතට ගියාය (4:1–17). රජු එස්තර්ව පිළිගෙන හාමන් සමග මංගල්‍යයට ඒමේ ඉල්ලීම ඇයට ලබා දෙයි (5:1–8). යුදෙව්වන් මැරීමේ හාමන්ගේ කුමන්ත්‍රණය මංගල්‍යයේදී එස්තර් එළිදරව්කරයි (7:1–6). රජු හාමන්ව එල්ලයි (7:7–10). රජු මොර්දෙකයිට ගෞරවකොට හාන්ගේ පණත අවලංගු කර එස්තර්ගේ ඉල්ලීම ඉෂ්ඨ කරයි (8:1–17).

2. **අමතර කියවීම්: දානියෙල් 5; එස්තර් 1–2; 6; 9–10**

3. ක්‍රියාකාරීත්වයට යොමුවීම ඔබ භාවිතා කරන්නේ නම්, ඔවුන් හෝ ඔවුන් අඳුනන යමෙකු ධෛර්‍යය පෙන්වීම පිණිස ස්වාමින්වහන්සේට කීකරු වූ අවස්ථාවක් ගැන කෙටියෙන් කීම පිණිස පංති සාමාජිකයින් දෙදෙනෙකුට සූදානම් වීම පිණිස කියන්න.

4. පහත සඳහන් පිංතූර තිබේ නම්, පාඩමට භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත: රජුගේ මස් සහිත ආහාර සහ මුදික පානය ප්‍රතික්ෂේප කිරීම (62094; ශුභාරංචි චිත්‍ර පිංතූර කට්ටලය 114); ගිනි උඳුනේ සිටින මිනිසුන් තුන්දෙනා (62093; ශුභාරංචි චිත්‍ර පිංතූර කට්ටලය 116); සහ දානියෙල් සිංහ ගුහාවේ සිටීම (62096; ශුභාරංචි චිත්‍ර පිංතූර කට්ටලය 117).

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

ඔවුන් හෝ ඔවුන් අඳුනන යමෙකු ධෛර්‍යය පෙන්වීම පිණිස ස්වාමින්වහන්සේට කීකරු වූ අවස්ථාවක් කෙටියෙන් කීමට පැවරුම් දුන් පංති සාමාජිකයින්ට කියන්න.

පංති සාමාජිකයින් ඔවුන්ගේ අත්දැකීම් බෙදාගත් පසු, මෙම පාඩම, ස්වාමින්වහන්සේට කීකරු වෙමින් මහත් ධෛර්‍යයක් පෙන්වූ, පරණ ගිවිසුමේ මිනිසුන් හය දෙනෙකු ගැන බව පහදා දෙන්න.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා කිරීම සහ ඒවා අදාළ කර ගැනීම

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, එදිනෙදා ජීවිතයට ඒවා අදාළ කර ගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න.

**1. දානියෙල් සහ ඔහුගේ මිතුරන් නෙබුකද්නේශර් රජුගේ කෑම කෑමට ප්‍රතික්ෂේප කරති; යහපත් සෞඛ්‍ය තත්වයෙන් සහ ඥානයෙන් ඔවුන්ට ආශිර්වාද කරන ලදී.**

දානියෙල් 1 උගන්වා සාකච්ඡා කරන්න.

දානියෙල් තරුණ පිරිමි ළමයෙකුව සිටි කාලයේ යෙරුසලමේ සිට බබිලෝනියට වහල්කම සඳහා ගෙනයනු ලැබුවේය. ඔහු සහ තවත් ඔහුගේ මිතුරන් වන ෂද්‍රක්ද, මේෂක්ද, අබේද්-නෙගෝද ඇතුළු ප්‍රඥාවන්ත, දක්ෂ හෙබ්‍රෙව් තරුණයන්—නෙබුකද්නේශර් රජුගේ—- මාළිගාවේදී පුහුණු කරනු ලැබුවේය.

- රජුගේ මස් සහිත ආහාර සහ මුද්‍රික පාන් ඔවුන්ට දුන් විට දානියෙල් සහ ඔවුන්ගේ මිතුරන් යෝජනා කළේ කුමක්ද? (දානියෙල් 1:8–14 බලන්න.) ස්වාමින්වහන්සේගේ සෞඛ්‍යයේ නීතියට කීකරු වීමෙන් ඔවුන්ට ලැබුනු ආශිර්වාද මොනවාද? (දානියෙල් 1:15, 17, 20 බලන්න.) ප්‍රඥාවේ වචනයට අප කීකරු වන්නේ නම්, ස්වාමින්වහන්සේ අපට දී තිබෙන පොරොන්දු වලට සමාන, ඔවුන්ට ලැබුනු ආශිර්වාද මොනවාද? (ධී සහ සී 89:18-20 බලන්න.)

  වැඩිහිටි බොයිඩ්. කේ. පැකර් මෙලෙස ඉගැන්වූයේය: "එළිදරව් වලට සම්බන්ධ, ප්‍රඥාවේ වචනයේ මූලික අරමුණ…මම දැනගත්තෙමි. සෞඛ්‍යය තත්වයට බාධා පැමිණෙන තේ, කෝපි, මත්පැන්, දුම්කොළ, වේදනා නාශක ඖෂධ යනාදියෙන් වැළකීසිටීමට ඔබට කුඩා කාලයේ පටන්ම අපි උගන්වන්නෙමු…මත්පැන් වලට ඇබ්බැහි වීම නිසා ශාරීරික හා මානසික දුර්වලත්වයෙන් සිටින අයට සරල කථාවකටවත් සවන්දීමට නොහැකි නම්, ඉතාම සියුම් හැඟීම් ස්පර්ශ කරන ආත්මික පෙළඹවීම් වලට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට හැකි වන්නේ කෙසේද? සෞඛ්‍යයේ නීතියට ප්‍රඥාවේ වචනයේ වටිනාකම මෙන්ම, ශාරීරික තත්වයට වඩා ආත්මික තත්වයට එය ඉතාමත් වැඩියෙන් වටින්නේය." (Conference Report තුලින්, ඔක්තෝ. 1979, 28–29; හෝ *Ensign,* නොවැ. 1979, 20).

- අප නොකළ යුතු දෙයක් කිරීමට අපගේ හැඟීම් වල පීඩනයේදී, අප ප්‍රතිචාර දැක්විය යුතු අන්දම ගැන මෙම පාඩමෙන් අපට කුමක් ඉගැන්විය හැකිද? (දානියෙල් 1:5, 8 බලන්න.) ස්වාමින්වහන්සේගේ පණත් වලට කීකරුවීම පිණිස ධෛර්‍යය අවශ්‍ය වන අද පවතින අවස්ථාවන් මොනවාද? එවැනි අවස්ථාවන් වලදී කීකරු වීමට අවශ්‍ය ධෛර්‍යය අප වැඩිදියුණු කර ගන්නේ කෙසේද?

**2. ස්වාමින්වහන්සේ ෂද්‍රක්ද, මේෂක්ද, අබේද්- නෙගෝවද ගිනි උදුනෙන් ගලවාගත් සේක.**

දානියෙල් 3 උගන්වා සාකච්ඡා කරන්න.

- නෙබුකද්නේෂර් රජතුමාගේ රූපයට වන්දනා නොකරන ඕනෑම කෙනෙක්ව ගිනි උදුනට දමන බවට නියෝගයක් පැනවීය (දානියෙල් 3:1–6). මෙම නියෝගයට ෂද්‍රක්ද, මේෂක් සහ අබේද්-නේගෝ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න දානියෙල් 3:12.) ඔවුන්, ඔහුගේ දේවරූප වලට වන්දනා නොකරන බව නෙබුකද්නේශර් දැනගත් විට ඔහු කුමක් කළේද? (දානියෙල් 3:13–15, 19–20 බලන්න.)

- ඔවුන්ව ගිනි උදුනට හෙළීම පිණිස රජු ඔවුන්ට තර්ජනය කළ විට ෂද්‍රක්ද, මේෂක්ද, අබේද්-නෙගෝ කීවේ කුමක්ද? (දානියෙල් 3:16–18.බලන්න.)

  වැඩිහිටි නීල්. ඒ. මැක්ස්වෙල් මෙසේ කීවේය: "මෙම ජීවිතයේදී අත්දකින ප්‍රශ්න වලින් නිතර අප ගලවාගනු ෟනොෘලබන නමුත්, සදාකාල මරණයෙන් අප ගලවාගනු ලබන්නේය! ඒ අතර, ශතවර්ෂ ගණනාවකට පෙර, වීර මිනිසුන් තුන්දෙනෙකු කියන ලද එම වචන තුනම කීමට අන්තිම බලාපොරොත්තුව ඉඩ සලස්වා දෙයි. උන්වහන්සේගේ කැමැත්ත නම්, ගිනි උදුනෙන්

දෙවියන්වහන්සේ ඔවුන්ව ගලවන බව ඔවුහු දැන සිටියහ. නමුත් එසේ නොකළත්, කෙසේවෙතත් ඔවුන් උන්වහන්සේට නොනවත්වා සේවය කරන බව ඔවුහු කීහ." (Conference Report තුලින්, ඔක්තෝ. 1994, 45; හෝ *Ensign,* නොවැ. 1994, 35).

- ස්වාමින්වහන්සේගේ පනත් වලට කීකරුවීම පිළිබඳ ෂද්‍රක්ද, මේෂක්ද, අබේද්-නෙගෝගේද ප්‍රතිචාර වලින් අපට කුමක් ඉගෙනීමට හැකිද? (උන්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කරගත්තත් නොගත්තත්, ස්වාමින්වහන්සේට කීකරු වීමට ෂද්‍රක්ද, මේෂක්ද, අබේද්-නෙගෝද කැමති වූහ. ඒ වෙනුවට, බලාපොරොත්තු ආශිර්වාදය බලාපොරොත්තු වෙලාවට දෙවියන්වහන්සේ දුන්නත් නොදුන්නත්, අපගේ කීකරුකම එම නියමය මත රඳා නොපැවැත්විය යුතුය.) යම් කිසි ආශිර්වාදයක් ඒ වෙනුවට අපි බලාපොරොත්තු වීමේදී පමණක් ස්වාමින්වහන්සේට කීකරුවීමේ අනතුරු මොනවාද?
- ෂද්‍රක්, මේෂක් සහ අබේද්-නෙගෝ ගිනි උඳුනට හෙළු විට සිදු වූයේ කුමක්ද? (දානියෙල් 3:21–27 බලන්න.) ඔවුන් සමග ගිනි උඳුනේ සිටියේ කවුද? (දානියෙල් 3:25 බලන්න.) අපගේ පරීක්ෂාවලදී අප උන්වහන්සේ වෙතට හැරෙන විට ගැලවුම්කරුවාණන් අපට උපකාර කරන්නේ කෙසේද?
- ෂද්‍රාක්, මේෂක් සහ අබේද්-නොගෝගේ ධෛර්යය නෙබුකද්නේශර් කෙරෙහි බලපෑවේ කෙසේද? (දානියෙල් 3:28–30 බලන්න.) සභාව වෙතට අපගේ අසල්වැසියන්ගේ ආකල්පයට අපගේ ක්‍රියා බලපාන්නේ කෙසේද?

**3. රජුගේ නියමය නොතකා දානියෙල් යාච්ඤා කළ බැවින් ඔහුව සිංහ ගුහාවට දමන ලදී. දානියෙල් ආරක්ෂාකිරීමට ස්වාමීන්වහන්සේ දේවදූතයෙක් යවනසේක.**

**දානියෙල් 6 උගන්වා සාකච්ඡා කරන්න.**

බෙබුකද්නේශර් රජුගේ පුත් බෙල්ෂෙශර් ඔහුගෙන් පසු රජ වූවේය. බෙල්ෂෙශර් මැරුවාට පසු, "මේදිය දාරියුස් තෙම රාජ්‍යය ලැබුවේය" (දානියෙල් 5:31), තවද දානියෙල් මහත් ප්‍රසිද්ධ තනතුරකට උසස් විය. (මේදිය දාරියුස් රජු වනාහී, දේවමාළිගාව නැවත සෑදීමේදී යුදෙව්වරුන් ආයාචනා කළ, සයිරස්ගෙන් පසු පර්සියා අධිරාජ්‍ය පාලනය කළ එම දාරියුස් රජු නොවන බව සිහි තබා ගන්න. එස්රා 4–6; 47 වෙනි පාඩම බලන්න.)

- රජ්ජුරුවන්ගේ දිසාපතින් සහ කුමාරවරුන්ට දානියෙල්ගේ වැරදි සෙවීමට උවමනා වූයේ කුමක් නිසාද? (දානියෙල් 6:1–5 බලන්න. රජතුමා දානියෙල්ට වැඩියෙන් කැමති නිසා, ඔහුට රජතුමා වැඩි බලයක් දේවිදැයි සිතා කරදර වෙමින් ඔවුහු ඊර්ෂ්‍යාා කළහ.) මෙම මිනිසුන් රජතුමාට ඒත්තු ගැන්වූයේ කුමණ පනතක් අත්සන් කිරීමටද? (දානියෙල් 6:6–9 බලන්න. දානියෙල් දිනපතා යාච්ඤා කරන බව දැනගෙන, කවුරු නමුත් 30 දවසක් යනතුරු මනුෂ්‍යයෙකුට හෝ දෙවි කෙනෙකුට හෝ කිසියම් අයැදුමක් නොකරන මෙන් රාජ්‍ය පනතක් පනවා, එය අත්සන් කිරීමට දාරියුස් රජු පෙළඹවූහ. රාජ්‍ය පනතට අකීකරු වන අය සිංහ ගුහාවට හෙළනු ලබන්නේය.)
- රජුගේ පනතට දානියෙල ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (දානියෙල් 6:10 බලන්න.) යාච්ඤාවේ වැදගත්කම ගැන දානියෙල් ගෙන් අපට කුමක් ඉගෙන ගැනීමට හැකිද? (යාච්ඤාව දානියෙල්ට බොහෝ වැදගත් වූ අතර, ඔහුගේ ජීවිතයට තර්ජන එල්ලවූවත්, ඔහු නොකඩවා යාච්ඤා කළේය.) අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේට යාච්ඤා කිරීමේ වරප්‍රසාදය කෙරෙහි අප තබන අගය ගැන මෙනෙහි කිරීම පිණිස පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.
- දානියෙල් යාච්ඤා කරමින් සිටින බව ඔහුගේ මිනිසුන් වාර්ථා කළ විට දාරියුස් රජුට කුමක් හැඟුනේද? (දානියෙල් 6:12–15 බලන්න.) රජතුමා දෙවියන් කෙරෙහි ඔහුගේ විශ්වාසය පෙන්නුම් කලේ කෙසේද? (දානියෙල් 6:16, 18 බලන්න.)
- සිංහ ගුහාව තුලදී ස්වාමින්වහන්සේ දානියෙල්ට ආශිර්වාද කළේ කෙසේද? (දානියෙල් 6:19–23 බලන්න.) දාරියුස් රජු සහ ඔහුගේ රාජධානියේ ජනයා මත දානියෙල්ගේ ඇදහීම සහ ධෛර්යය බලපෑවේ කෙසේද? (දානියෙල් 6:24–28 බලන්න.)

වැඩිහිටි එල්.ටොම්.පෙරී මෙසේ කීවේය: "දානියෙල්ගේ සේවය රජතුමාට ප්‍රයෝජන වූවා පමණක් නොව, ස්වාමින්වහන්සේ කෙරෙහි දානියෙල්ගේ විශ්වාසය නිසා මුලු දේශයටම එය බලපෑවේය. දානියෙල් නමස්කාර කළ දෙවියන්වහන්සේට, එනම් සත්‍යයේ ජීවමාන දෙවියන්වහන්සේට රාජධානියේ සියළුම ජනතාව නමස්කාර කළයුතු බවට නිවේදනයක් රජතුමා යැව්වේය. තමා ජීවත් වන "ලෝකයේ" සේවය කරන බොහෝ දෙනාට බලපාන, එක් ධර්මිෂ්ඨ මිනිසෙකුගේ සේවයේ බලය කොපමණ ප්‍රබල වූයේද! අප ජීවත්වන 'ලෝකයේ' අපගේම පුද්ගලික ක්‍රම වලින් සේවය පවත්වාගෙන යනවා නම්, අපගේ සේවයේ ප්‍රතිඵල මොනතරම් සාර්ථකවන්නේද!" (Conference Report තුලින්, අප්‍රේ. 1988, 16; හෝ *Ensign*, මැයි 1988, 15).

**4. ඇයගේ ජීවිතය පරදුවට තබමින් එස්තර් ඇයගේ ජනතාව ගලවාගන්නාය.**

එස්තර් 3–5; 7–8 උගන්වා සාකච්ඡා කරන්න.

දානියෙල්ගේ කාලයට පසු ජීවත් වූ යුදෙව් ස්ත්‍රියකි එස්තර්ගේ දෙමව්පියන් මැරුණාට පසු ඇයගේ ඥාති සොහොයුරෙකු වූ මොර්දෙකයි ඇයව හදාවඩා ගත්තේය. එස්තර් ඉතාම ලස්සන බැවින්, පර්සියාවේ සහ මෙදියාවේ රජුවන අහෂ්වේරොෂ්, ඇයගේ ලස්සන කෙරෙහි ඉතා ප්‍රසන්නව ඇය ඔහුගේ බිසව කරගත්තේය.

- අහෂ්වේරොෂ් රජු හාමාන්ව උසස්කොට, ඔහුගේ උත්තම අධිපති තනතුර දුන්නේය. (එස්තර් 3:1) හාමාන්ට නැමී වැඳීමට, මෝර්දෙකයිට සහ ඔහුගේ අනිත් මෙහෙකරුවන්ට රජතුමා අණ කළ විට, ඔහු ධෛර්‍යය පෙන්වූයේ කෙසේද? (එස්තර් 3:2–4 බලන්න.) හාමාන්ගේ ප්‍රතික්‍රියාව කුමක්ද? (එස්තර් 3:5–14 බලන්න.) "එක්තරා සෙනගක්"— රාජධානියේ සියළුම යුදෙව්වරු විනාශ කිරීම පිණිස අණ කිරීමට, කෝපයට පත් ඔහු රජතුමාව පෙළඹවූවේය.)
- යුදෙව්වන් අතර දුක් වීම දැනගත් එසතර් කාරණය දැනගැනීමට පණිවුඩකරුවෙකු යැවීය (එස්තර් 4:1–6). මෝර්දෙකයි එස්තර්ගෙන් ඇසුවේ කුමක්ද? (එස්තර් 4:7–9 බලන්න.) ඇතුලට ගොස් රජතුමා සමග කථා කිරීම එස්තර්ට අනතුරුදායක වූයේ කුමක් නිසාද? (එස්තර් 4:10–11 බලන්න. අනාරාධිතව ඔහු වෙතට පැමිණෙන ඕනෑම කෙනෙකු මරණයට පත්කිරීමට නීතියෙන් රජුට අවසර තිබුනේය.)
- රජතුමා වෙතට ලගාවීමේ ඇයගේ ප්‍රශ්නය මොර්දෙකයි දැනගත් විට, ඔහු එස්තර්ට යැවූ පණිවුඩය කුමක්ද? (එස්තර් 4:13–14 බලන්න.) "මෙවැනි කාලයක රාජධානියට පැමිණීමට" ලැබුණු අවස්ථාව ගැන එස්තර් සිතන විට ඇයට ඇතිවූ හැඟීම් ඔබ සිතන හැටියට කෙසේද? (එස්තර් 4:14). අපගේ ජීවිත වලට අරමුණක් තිබීමේ සහතිකය අපි ලබාගන්නේ කෙසේද? මෙම සහතිකය අපට උපකාර වන්නේ කෙසේද?
- රජුවෙතට යෑමට එස්තර් සූදානම්වන විට ඇයගේ මෙහෙකාරියන්ට සහ ප්‍රදේශයේ යුදෙව්වරුන්ට ඇය කීවේ කුමක්ද? (එස්තර් 4:16 බලන්න.) බොහෝ ජනයා එක්සත්ව නිරාහාරයෙන් යාච්ඤා කිරීම අපට උපකාර වන්නේ කෙසේද?
- රජු වෙතට පැමිණීමේ ඇයගේ අදහස ප්‍රකාශ කරමින් එස්තර් මෙසේ කීවේය, "මා නැතිවුණොත්, නැතිවුණාවේ" (එස්තර් 4:16). ෂද්‍රක්, මේෂක් සහ අබේද්-නෙගෝ, ගිනි උඳුනට ඔවුන් හෙළා දැකීමට පෙර, ඔවුන් කළ ප්‍රකාශය මෙම කීමට සමාන වන්නේ කෙසේද? (දානියෙල් 3:17–18 බලන්න.) ඇයගේ ජනතාවටත් දෙවියන්වහන්සේටත් එස්තර්ගේ ශක්තිය මෙම ප්‍රකාශයෙන් දැක්වූයේ කෙසේද?
- එස්තර් රජු වෙතට පැමිණිකළ, ඔහු ඇයව පිළිගෙන, ඇය ඉල්ලන ඕනෑම දෙයක් ඉටු කරන බව ඔහු කීවේය (එස්තර් 5:1–3). ඔහු සහ හාමාන් මංගල්‍යයකට පැමිණෙන මෙන් ඉල්ලුවාය (එස්තර් 5:4–8). මංගල්‍යයේ දෙවෙනි දිනයේදී, රජතුමාගෙන් එස්තර් කුමක් ඇසුවේද? (එස්තර් 7:3–4 බලන්න.) විනාශ කිරීමට හාමාන් කුමන්ත්‍රණය කරන ජනතාව යුදෙව්වන් බව දැනගත් රජතුමා කුමක් කළේද? (එස්තර් 7:5–10 බලන්න.)
- හාමාන් එල්ලන ලදී. නමුත් යුදෙව්වන් මැරීමේ පනත රාජධානිය පුරා යවන ලදී. රජතුමාට කිරීමට එස්තර් කුමක් කීවේද? (එස්තර් 8:5–6 බලන්න.) එස්තර්ගේ ධෛර්‍යය සහ ඇදහීම නිසා

යුදෙව්වන් කුමන ආශිර්වාද ලැබුවේද? (එස්තර් 8:16–17 බලන්න.) අන්‍යයන්ගේ ධෛර්‍යය සහ ඇදහීම නිසා ඔබ ලැබූ ආශිර්වාද මොනවාද?

- එස්තර්ගේ මෙන් ධෛර්‍යය අවශ්‍ය අද අපට මුහුණ දීමට තිබෙන අභියෝග මොනවාද? අපහසු ප්‍රතිඵල වලට අප මුහුණපා සිටියත් හරිදෙය කිරීමට අප උත්සහදරන විට අපට ලැබෙන ආශිර්වාද මොනවාද?

---

අවසානය.

සත්‍ය උදෙසා නැගීසිටීමට අප දිරිගන්නා විට ස්වාමින්වහන්සේ අපට ආශිර්වාද කරන බවට සාක්ෂිදරන්න. දානියෙල්, ෂද්‍රක්, මේෂක්, අබේද්- නෙගෝ, එස්තර් සහ මොර්දෙකයි යන අයගේ ආදර්ශ අනුගමණය කිරීමට පංති සාමාජිකයින්ව දිරිගන්වහන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1. ධෛර්‍යවන්ත කීකරුකමේ අවසාන ආශිර්වාද?**

- දානියෙල්, ෂද්‍රක්, මේෂක්, අබේද්- නෙගෝ එස්තර් සහ මොර්දෙකයි යන අයට පොදුවේ තිබුනේ කුමක්ද? (එසේ කළ විට ජීවිතය අවදානම් තත්වයක තිබුනත්, හරි දෙය කිරීමට ඔවුන් සියළු දෙනාටම ධෛර්‍යය තිබුනේය.) හරි යයි දන්නා දෙය වෙනුවෙන් නැගී සිටීමට හෝ නොනැගී සිටීමට තීරණය කිරීමේදී ඔබට මුහුණ දීමට තිබුන අවස්ථාවන් මොනවාද?

පනත් තැබීමට අප වෙහෙසදරන විට, ස්වාමින්වහන්සේ අපට ආශිර්වාද කරන බවට සාක්ෂි දරන්න. කෙසේ වෙතත්, අපට ලැබෙන ආශිර්වාද එකෙනෙහිම අපට නොපෙණෙනු ඇත. මෙය පැහැදිලි කිරීම පිණිස, පහත සඳහන් ජනතාව පරීක්ෂාවන් විඳදරා ගැනීම ගැන සාකච්ඡා කිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත:

අ. සාරාට අවුරුදු 90 වයස වන තෙක් දරුවන් ලැබීමට නොහැකි විය (උත්පත්ති 17:15–17; 21:1–2).
ආ. තමාගේ සහෝදරයින් විසින් යෝසෙප්ව විකුණනු ලැබුවාට පසු නොකළ වරදකට ඔහුව සිරගත කරනු ලැබීය (උත්පත්ති 37:27–28; 39:7–20).
ඇ. ගැලවුම්කරුවාණන් මිතුරෙකු විසින් පාවා දෙනු ලැබ, නීති විරෝධිව පරීක්ෂා කරනු ලැබ, කුරුසියේ ඇණ ගසනු ලැබුවේය (යොහාන් 18–19).
ඈ. තම සහෝදරයින් විසින් නීෆායිට තලා පසුව ලණු වලින් බඳිනු ලැබුවේය (1 නීෆායි 3:28; 18:10–11).
ඉ. ස්ත්‍රීන් සහ දරුවන් ඔවුන්ගේ විශ්වාසය නිසා දවනවා බලා සිටීමට ඇල්මාට සහ ඇමුලෙක්ට බල කරන ලදී (ඇල්මා 14:8–11)
ඊ. ජෝසෆ් ස්මිත් සිරගත කොට, භක්තිය උදෙසා මරණු ලැබුවේය (ඩී සහ සී 135).

- මෙවැනි පරීක්ෂා විඳීමට මෙම ජනතාවට ස්වාමින්වහන්සේ සලස්වන්නේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? මෙම පරීක්ෂා විඳදරා ගැනීමට ඔවුන්ට හැකි වූයේ ඔබ සිතන හැටියට කුමක් නිසාද? ඔවුන්ගේ ආදර්ශ වලින් අපට කුමක් ඉගෙනගැනීමට හැකි වේද?

**2. සත්‍යය උදෙසා නැගී සිටීම**

හරි යයි ඔවුන් දන්නා දෙය වෙනුවෙන් නැගී සිටීමේ විවිධ අවස්ථාවන් රඟපෑමට පංති සාමාජිකයින්ට සලස්වන්න. පංති සාමාජිකයින්ට අදාළ වන අවස්ථාවන් ගැන සිතන්න. පහත සඳහන් යෝජනා උපකාර විය හැකිය:

අ. මිතුරෙකු යමෙක් හෙළාදකිමින්, ඔබටද එසේ කිරීමට දිරිගන්වයි.
කු ඔබට ආරාධනා කරයි.
ඇ. ඉරුදින සභාවේ රැස්වීම් වලට පසුව, භෝජනාගාරයකට යෑමට ඔබට යමෙක් කථා කරයි.
ඈ. ප්‍රඥාවේ වචනයට විරුද්ධ වන මත් පැන් හෝ වෙනත් ද්‍රව්‍යයක් යමෙක් ඔබට පිළිගන්වයි.

# "කිසිකලක, නැති නොවෙන්නා වූ රාජ්‍යයක්"

# 46 වෙනි පාඩම

*දානියෙල් 2*

---

| | |
|---|---|
| **අරමුණ** | යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පිහිටු වන ලද සභාව ගැන පංති සාමාජිකයින්ගේ සාක්ෂි ශක්තිමත් කිරීමට සහ, පොළොවෙහි දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට උපකාර වීම පිණිස ඔවුන්ව දිරිගැන්වීමටය. |

---

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඥාවෙන් අධ්‍යයනය කරන්න

   අ. දානියෙල් 2:1–23. නෙබුකද්නේශර් රජ ස්වප්නයක් දැක, එහි විස්තරය සහ අර්ථය පහදා දීමට ඔහුගේ උපදේශකවරුන්ට කීවේය (2:1–13). දානියෙල් ඔහුගේ මිතුරන් සමග යාච්ඥා කරන අතර, ස්වප්නය සහ එහි අර්තකථනය දෙවියන්වහන්සේ ඔහුට එළදරව් කරන සේක. (2:14–23).

   ආ. දානියෙල් 2:24–49 පොළොවේ මහත් රාජධානිවල නැගීම සහ බැසීමද, පසු දවස් වලදී, දෙවියන්වහන්සේගේ රාජධානිය අනිකුත් සියළුම රාජධානි පරාජය කිරීම නෙබුකද්නේශර් රජුගේ ස්වප්නයෙන් මතු පැමිණෙන්ට තිබෙන දෙය කීම දානියෙල් එළිදරව් කළේය.

2. අමතර කියවීම්: දහම සහ ගිවිසුම 65.

3. සභාවේ සත්‍යතාවය ගැන කෙටි සාක්ෂිදැරීමට සූදානම් වන ලෙස පංති සාමාජිකයින් දෙදෙනකුට හෝ තන්දෙනෙකුට ආරාධනා කරන්න.

4. ක්‍රියාකාරීත්වයට යොමු කිරීම ඔබ භාවිතා කරන්නේ නම්, පාඩම පටන් ගැනීමට පෙර, මෙම පිටුවේ පහත ඇති සිතියම දැන්වීමක හෝ රටහුණු ලෑල්ලේ හෝ අඳින්න.

5. "නෙබුකද්නේශර්ගේ ස්වප්නය" රූපසටහන ඔබ භාවිතා කරන්නේ නම් (218 වෙනි පිටුව බලනන) පංතිය පටන් ගැනීමට පෙර සිතියමක හෝ රටහුණු ලෑල්ලේ අඳින්න. රූප සටහන පංතියේදී සාකච්ඡා කරන තෙක්, පුද්ගලික රාජධානි වල නම් නොලියන්න.

6. දානියෙල් නෙබුකද්නේශර්ගේ ස්වප්නයේ අර්ත පහදා දීම (62531; ශුභාරංචි චිත්‍ර පිංතූර කට්ටලය 115) ඇත්නම්, පාඩම්දී එය භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

| | |
|---|---|
| ක්‍රියාකාරීත්වයට යොමු වීම. | පංතිය පටන්ගැනීමට, පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.<br><br>දැන්වීමේ හෝ රටහුණු ලෑල්ලේ ඔබ ඇඳ තිබෙන සිතියම වෙතට පංති සාමාජිකයින්ව යොමු වීමට මගපෙන්වන්න. |

| | 6 අප්‍රේල් 1830 | 1880 | 1930 | 1980 | 1995 | 2000 |
|---|---|---|---|---|---|---|
| | 6 | 133,628 | 670,017 | 4,639,822 | 9,340,898 | ඉක්මවා 11,000,000 |
| | 1 | 10 | 16 | 44 | 88 | 100 |
| | 0 | 23 | 104 | 1,218 | 2,150 | 2,581 |
| | 0 | 10 | 30 | 188 | 307 | 334 |
| | 0 | 1 | 7 | 19 | 47 | 102 |

- මෙම අංක නියෝජනය කරන්නේ, ඔබ සිතන හැටියට කුමක්ද?

මෙම ප්‍රශ්නයට පිළිතුරු යෝජනා කිරීමට පංති සාමාජිකයින්ට මිනිත්තු ස්වල්පයක් දෙන්න. ඉන් පසු පහත පෙන්වා දී තිබෙන පරිදි සිතියම සම්පූර්ණ කරන්න.

| | 6 අප්‍රේල් 1830 | 1880 | 1930 | 1980 | 1995 | 2000 |
|---|---|---|---|---|---|---|
| සභාවේ සාමාජිකයින් | 6 | 133,628 | 670,017 | 4,639,822 | 9,340,898 | ඉක්මවීා 11,000,000 |
| මෝර්මන්ගේ පොත, ප්‍රකාශනය කරන ලද භාෂා | 1 | 10 | 16 | 44 | 88 | 100 |
| ස්ටේක | 0 | 23 | 104 | 1,218 | 2,150 | 2,581 |
| ධර්මදූත පලාත්. | 0 | 10 | 30 | 188 | 307 | 334 |
| ක්‍රියාකාරී දේවමාළිගා | 0 | 1 | 7 | 19 | 47 | 102 |

සභාවේ වේගවත් වැඩීම ගැන විස්තරයක් කිරීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න. දානියෙල් නැමැති පරණි අනාගතවක්තෘවරයෙකු කලින් දුටු පොළොවේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය— යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ විජයග්‍රහණය මෙම පාඩමෙන් කියන බව පහදා දෙන්න.

---

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා සහ ඒවා අදාළ කරගැනීම

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, එදිනෙදා ජීවිතයට ඒවා අදාළ කරගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ආත්මික ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. නෙබුකද්නේශර් රජුගේ ස්වප්නයෙහි අර්ථකතනය දෙන එළිදරව්වක් දානියෙල්ට ලැබුනේය.**

දානියෙල් 2:1–23 උගන්වා සාකච්ඡා කරන්න.

එක් රාත්‍රියක නෙඹුකද්නේශර් රජු කැලඹිලි සහිත ස්වප්නයක් දුටුවේය. ඔහුට එය අමතක බව කියමින් උපදේශකවරුන් පරීක්ෂා කරමින් එහි අර්ථය එළිදරව් කිරීමට ඔවුන්ට අණ කළේය. (දානියෙල් 2:2–5)ස්වප්නය විස්තර කිරීමට ඔවුන්ට නොහැකි යයි ඔවුන් කී විට, දානියෙල් සහ ඔහුගේ මිතුරන්ද ඇතුලුව බබිලෝනියේ සිටින සියළුම ප්‍රඥාවන්ත මිනිසුන් මැරීමට නෙබුකද්නේශර් අණ කළේය (දානියෙල් 2:10-13).

- රජුගේ ස්වප්නයෙහි අර්ථය පැහැදිලි කිරීමට දානියෙල් සූදානම්වූයේ කෙසේද? (දානියෙල් 2:17–18 බලන්න. ඔහු සමග යාච්ඤා කිරීමට ඔහුගේ මිතුරන්ට ඔහු කීවේය.) පවුලේ සාමාජිකයින්ගේ සහ මිතුරන්ගේ යාච්ඤා ඔබට පිහිටවූයේ කෙසේද?

- දානියෙල් සහ ඔහුගේ මිතුරන්ගේ යාච්ඤා වලට පිළිතුරු ලැබුනේ කෙසේද? (දානියෙල් 2:19, 27–28 බලන්න.) රජුගේ ස්වප්නයේ දර්ශනයක් ලැබුනු වහාම දානියෙල් කුමක් කළේද? (දානියෙල් 2:20–23 බලන්න.) දෙවියන්වහන්සේ වෙතට ඔහුගේ හැඟීම් ගැන ඔහුගේ වචන වලින් එළදරව්වූයේ කුමක්ද? ස්වාමින්වහන්සේට කෘතඥතාවය පෙන්වීමේ වැදගත්කම කුමක්ද? අපගේ කෘතඥතාවය උන්වහන්සේට පෙන්වීමට අපට හැකිවන්නේ කෙසේද?


- දානියෙල් සහ නෙබුකද්නේශර් ඔවුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමේදී ඔවුන් යොමු වූ හේතු සංසන්දනය කරන්න (දානියෙල් 2:2, 19–23, 28 බලන්න.) අපහසු ප්‍රශ්න විසඳීමේදී හෝ තීරණ ගැනීමේදී, අවශ්‍ය උපකාර ගැනීමට අද ජනතාව යොමුවන වැරදි හේතු මොනවාද? එවැනි අවස්ථාවලදී දෙවියන්වහන්සේගේ මගපෙන්වීම බොහෝ ජනයාට වළක්වන්නේ කුමක්ද?

**2. දානියෙල් නෙබුකද්නේශර්ගේ ස්වප්නය විස්තර කර අර්ථය පහදා දෙයි.**

දානියෙල් 2:24–49 උගන්වා සාකච්ඡා කරන්න.

- රජ ඔහුගේ ස්වප්නයෙහි දුටු මහත් රූපය දානියෙල් විස්තර කරන්නේ කෙසේද? (දානියෙල් 2:31–33 බලන්න. නෙබුකද්නේශර්ගේ ස්වප්නය දානියෙල් පැහැදිලි කිරීම පිංතූරයට හෝ ඔබ ඇන්ද පහත සඳහන් රූපය වෙතට යොමු කරන්න.)

නෙබුකද්නේශර්ගේ ස්වප්නය (දානියෙල් 2:31–45)




- රූපයේ විවිධ කොටස් නිරූපනය කළේ කුමක්ද? (දානියෙල් 2:36–43 බලනන. කොටස් නියෝජනය කළේ නොයෙක් රාජධානි ඒවා එකක් අනෙකට වඩා ලෝක බලයෙන් සාර්ථක වීමය.)

  සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් අර්ථකතනය ඔබ නැවත බලන විට රාජධානි වල නම් රූපසටහනේ ලියන්න.

  අ. නෙබුකද්නේශර් සහ ඔහුගේ රාජධානිය වන බබිලෝනිය රන්වන් හිසෙන් නියෝජනය කළේය.

ආ. කෝරෙෂ්ගේ රාජධානි වන මේදියා හා පර්සියාව රිදීමය ලයෙන් සහ අත් වලින් නියෝජනය කළේය.

ඇ. පිලිප් සහ ඇලෙක්සැන්ඩර්ද, ග්‍රීකවරුන් හෝ මෙසදෝනියාවේ රාජධානි පිත්තල පාට බඩෙන් සහ කලවයෙන් නියෝජනය කළේය.

ඈ. රෝම අධිරාජ්‍යය යකඩ කෙණ්ඩා වලින් නියෝජනය කළේය.

ඉ. යුරෝපා ජාතීන් කණ්ඩායමක් යකඩ සහ මැටි පාද වලින් නියෝජනය කළේය (Conference Report තුලින්, අප්‍රේ. 1976, 10; හෝ *Ensign,* මැයි 1976, 8.)

- නෙබුකද්නේශර්ගේ ස්වප්නයෙහි පොළොවේ රාජධානි නියෝජනය කළ රූපය විනාශ කළේ කුමක්ද? (දානියෙල් 2:34–35 බලන්න.) "අතින් නොකැපූ…ගලක්" නියෝජනය කරන්නේ කුමක්ද? (දානියෙල් 2:44–45; ධී සහ සී 65:2 බලන්න.)

සභාපති කිම්බල් මෙසේ ඉගැන්වූයේය: "යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව 1830 නැවත පිහිටවනු ලැබුවේය…ස්වර්ගයේ වැඩ සිටින දෙවියන්වහන්සේ විසින් පිහිටුවන මෙම රාජ්‍යය කිසිදා විනාශ වන්නේ වත් අවලංගු වන්නේවත් නොවන අතර, අතින් නොකැපූ කන්දෙන් ගැලවී ආ ගල මහත් කන්දක් වී මුළු පොළොව එයින් පුරවනු ලබන්නේය." (Conference Report තුලින්, අප්‍රේ. 1976, 10; හෝ *Ensign,* මැයි 1976, 8–9).

- පසු දවස් වල සභාව ගැන දානියෙල් කී අනාවැකි මොනවාද? (දානියෙල් 2:34–35, 44 බලන්න.)

පහත සඳහන් අනාවැකි රටහුණු ලැල්ලේ ලැයිස්තුගත කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත. සභාව මෙසේ වන බවට දානියෙල් අනාවැකි පළකරයි:

අ. "අතින් නොකැපූ" එකක් වන්නේය" (දානියෙල් 2:34).
ආ. "මහත් කන්දක් වී, මුළු පොළොව එයින් [පිරුණේය]" (දානියෙල් 2:35).
ඇ. "කිසිකලක නැති නොවන" (දානියෙල් 2:44).
ඈ. "අන් සෙනඟකට [අත්හරිනු] නොලබන්නේය." (දානියෙල් 2:44).
ඉ. "ඵ්ක ඒ්‍ය සියළු රාජ්‍යවල් පොඩි කර නැතිකරන්නේය" (දානියෙල් 2:44).
ඊ. "සදා ඉවසා සිටීම" (දානියෙල් 2:44).

- "අතින් නොකැපූ" ගලක් යන්නෙහි අදහස කුමක්ද? (දානියෙල් 2:34 බලන්න. එය මිනිසා විසින් සාදන දෙයක් නොවන්නේය.) යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පිහිටුවනු ලැබූ සභාව, අතින් නොකැපූ ගලක් මෙන් වන්නේ කෙසේද?

වැඩිහිටි ජෝසෆ් බී. වර්ත්ලින් මෙසේ කීවේය; "අපගේ ස්වාමි වූ ගැලවුම්කරුවාණන් සභාවේ හිස මෙන් සිටිමින් ඔහුගේ මෙහෙකරුවන් මගින් පාලනය කරනු සේක. මෙය ස්වාමින්වහන්සේගේ සභාව වන අතර, එය මිනිසුන්ගේ සභාවක් නොවේ." (Conference Report තුලින්, ඔක්තෝ. 1993, 4; හෝ *Ensign,* නොවැ. 1993, 5).

- සභාව "මුළු පොළව පුරවමින්," "කිසි කලක නැති නොවෙන්නා වූ" දානියෙල්ගේ අනාවැකිය අද සම්පූර්ණ වෙමින් පවතින්නේ කෙසේද? (ක්‍රියාකාරීත්වයට යොමුවීමේ දෙවන සිතියමට යොමු වීමට ඔබට වුවමනා වෙනවා ඇත.)

සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි මෙලෙස සාක්ෂි දැරුවේයඃ "මෙම සභාව සත්‍යයයි. එයට විරුද්ධව හමන කිසිම කුණාටුවකට එය යටත් නොවන්නේය. එයට සරදම් කිරීමට නැගී සිටියත් සෑම විවේචකයෙක්ම අභිබවා කල් පවතින්නේය. සෑම පරම්පරාවකම උන්වහන්සේගේ පුත්‍රයින්ට සහ දූවරුන්ට ආශිර්වාද කිරීම පිණිස, දෙවි වූ අපගේ සදාකාලික පියාණන් වහන්සේ එය පිහිටවූසේක. ලෝකයේ ගැලවුම්කරුවාණන් වූ, ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ එහි හිස මෙන් සිටිමින්, උන්වහන්සේගේ නාමය එය දරයි. පූජකවරයේ බලය මගින් එය පාලනය කරමින් ඉදිරියට ගෙන යයි. ස්වාමින්වහන්සේගේ දේවත්වය ගැන තවත් සාක්ෂියක් එය ලෝකයට ඉදිරිපත් කරයි. භක්තිවන්ත වෙන්න, මගේ මිත්‍රයිනි, අවංක වෙන්න. මෙම දෙවෙනි ඊම කාලයේදී දෙවියන් වහන්සේ එළිදරව් කරන ලද ශ්‍රේෂ්ඨ දේවල් වලට පක්ෂපාත වෙන්න" ("Keep the Faith," *Ensign,* සැප්තැ. 1985, 6).

- අපගේ නිවෙස් වල, අපගේ සමාජයේ, ලොව පුරා දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට සහභාගී වීම පිණිස අපට කුමක් කළ හැකිද?

සභාවේ සත්‍යතාවය ගැන කෙටි සාක්ෂි දැරීමට පැවරුම් දෙන ලද පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.

---

අවසානය

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව, පොළොවේ දෙවියන්වහන්සේගේ රාජධානිය බවද, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ එය පාලනය කරන බවටද සාක්ෂිදරන්න. දෙවියන්වහන්සේගේ රාජ්‍ය පොළොවේ ගොඩනැගීමට සහභාගී වීම පිණිස පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

# 47
වෙනි පාඩම

# "අපි නැගිට ගොඩනගමු"

*එස්රා 1–8; නෙහෙමියා 1–2; 4; 6;8*

**අරමුණ** ස්වාමින්වහන්සේගේ ක්‍රියාවලට විරුද්ධවන අයට ක්‍රිස්තුස් වැනි ප්‍රේමය පෙන්වමින් සයෝනය ගොඩනැගීමට උපකාර වන පිණිස පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය.

**සූදානම**

1. පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි යාච්ඤාවෙන් කියවන්න.
   අ. එස්රා 1–6. යෙසායාගේ අනාවැකි වල කෝරෙෂ් ඔහුගේ නම දැක, ස්වාමින් වහන්සේගේ කැමැත්ත කිරීමේ ආශාවෙන් පූර්ණ විය. බබිලෝනියේ වහළුන් මෙන් සිටි යුදෙව්වන් ඔහු නිදහස්කොට, යෙරුසලමට ආපසු ගොස් දේවමාළිගාව නැවත ගොඩනැගීමට ඔවුන්ට ආරාධනා කළේය (එස්රා 1). සෙරුබ්බාබෙල් සහ යෙෂුවා, 50,000 වූ, ජනතාවට ආපසු යෙරුසලමට මගපෙන්වූ අතර දේවමාළිගාව නැවත ගොඩනැගීමට ඔවුහු පටන්ගත්හ (එස්රා 2–3). දේවමාළිගාව තැනීමට සමාරියයන් උපකාර කිරීමට ඉදිරිපත් වූ විට, එය ඔවුන් ප්‍රතික්ෂේප කළ නිසා එහි වැඩ නැවැත්වීමට උත්සාහදැරූ විට, නැවත ගොඩනැගීම නැවැත්විය (එස්රා 4). අවුරුදු ගණනකට පසු, අනාගතවක්තෘ හග්ගයි සහ සෙකරියා දේවමාළිගාව නිම කිරීමට යුදෙව්වන්ට උපදෙස් දුන්නෝය; සමාරියයන්ගේ විරුද්ධත්වය නොකඩවා පැවතුනි (එස්රා 5; හග්ගයි 1 ද බලන්න). කෝරෙෂ්ගේ පනත දාරියුෂ් අලුත් කොට දේවමාළිගාව නැවත ගොඩනැගීමට සැලැස්වූ, අතර එය නිම කොට ක්‍රි: පූ: 515 දී පමණ එය කැපකරන ලදී (එස්රා 6).
   ආ. එස්රා 7–8. දේවමාළිගාව කැපකොට අවුරුදු 50 කටත් පසු, යුදෙව්වන් තවත් කණ්ඩායමක් ආපසු යෙරුසලමට ගෙන යෑමට පර්සියාවේ රජු අර්තක්ෂ්ස්තා ගෙන් එස්රාට අවසර ලැබුනි. එස්රා සහ ඔහුගේ ජනතාව නිරාහාරව යාච්ඤා කළ අතර, ඔවුන්ගේ ගමනේදී ස්වාමින් වහන්සේ ඔවුන්ව ආරක්ෂා කරන සේක.
   ඇ. නෙහෙමියා 1–2; 4; 6 යෙරුසලමට ආපසු ගිය යුදෙව්වන්ට "බොහෝ පාඩු සහ නින්දා විඳීමට" සිදුවී තිබෙන බව දැනගත්තේය. නගරයේ පවුරු නැවත ගොඩනැගීමට යෙරුසලමට යෑම පිණිස අර්තක්ෂස්තා රජුගෙන් නෙහෙමියාට අවසර ලැබුනේය (නෙහෙමියා 1–2). පවුරු නැවත ගාඩනැගීම වැළැක්වීමට යුදෙව්වන්ගේ සතුරන් සෙවූහ. නෙහෙමියා කුලීකරුවන්ට මුරතබා, පවුර ගොඩනගා නිම කරන තෙක් වැඩ ඉදිරියට ගෙන ගියේය (නෙහෙමියා 4; 6).
   ඈ. නෙහෙමියා 8. යෙරුසලම වටා පවුරු නැවත ගොඩනැගුවාට පසු, එස්රා ශුද්ධ වූ ලියවිලි ජනතාවට ඇසෙන විට, ජනතාව වැළපෙමින්, එයට කීකරු වීමට කැමති වූහ.
2. ශුද්ධ වූ ලියවිලි පළවෙනි විස්තරය පටන්ගැනීමේදී දී තිබෙන ඓතිහාසික පසුබිම ගැන කෙටි සාරාංශයක් දීමට සූදානම් වීම පිණිස පංති සාමාජිකයෙකුට ආරාධනා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.
3. අතීතයේ භාවිතා කළ දේවමාළිගාවේ පිංතූරයක් තිබේ නම්, පාඩමට එය භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත (62300; ශුභාරංචි චිත්‍ර පිංතූර කට්ටලය 118).

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

**ක්‍රියාකාරීත්වයට යොමුවීම.** පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරීත්වයක් (හෝ ඔබගේම එකක්) භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

වැඩිහිටි ඩැලින් එච්. ඕක්ස් පහත සඳහන් උපුටා ගැනීම පංති සාමාජිකයෙකු ලවා කියවන්න.

"බොහෝ වෙනස් වූ අරමුණක් උදෙසා. . .සම්පූර්ණයෙන්ම වෙනස්වූ යුගයක, කථා කරන ලද විශේෂිත වූ ශුද්ධ වූ ලියවිලි පදයක්, ශුද්ධ වූ ආත්මයාණන්ගේ අර්ත පැහැදිලි කිරීමේ බලපෑම යටතේ, අද අපගේ පුද්ගලික අවශ්‍යතාවයකට ගැලපෙන පරිදි ඉතාමත් පුද්ගලික පණිවුඩයක් දෙන බව අපට සොයාගැනීමට හැකි වේ…අපගේ ස්වකීය අවස්ථාවන් උදෙසා ශුද්ධ වූ ලියවිලි වලට කැමැත්ත සොයන්නේ නම්, 'එය අපගේ ප්‍රයෝජනයට සහ ඉගෙනීමට විය හැකිය' (1 නීෆායි 19:23), ඉතා උසස් පුද්ගලික මාර්ග වලින් අපට ආශිර්වාද කිරීමට ස්වර්ගයේ වැඩ සිටින අපගේ ආදරවන්ත පියාණන් වහන්සේට ඒවා භාවිතා කිරීමට හැකි වේ." (*Studying the Scriptures* [සෝල්ට් ලේක් දේවස්ථානයේදී දෙන ලද භක්තිමත් දේශනය, 24 නොවැ. 1985]).

- යම් විටක ඔබ ශුද්ධ වූ ලියවිලි කියවන විට එම විශේෂිත වූ කොටස ඔබට සෘජුවම කථා කරන බව හැඟුණේද? (ඔවුන්ගේ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ට ආරාධනා කරන්න.) විශේෂයෙන්ම ඔබගේ ජීවිතයට මගපෙන්වීම ලබා දීමට ශුද්ධ වූ ලියවිලි පිහිට වූයේ කෙසේද?

මෙම පාඩමේ සඳහන් කරන ලද සිද්ධීන් ආරම්භ කරනු ලැබුවේ යම් මිනිසෙකු මගිනි, එනම් ඔහුගේ උපතට අවුරුදු 150 කට පෙර ලියන ලද ශුද්ධ වූ ලියවිලි කොටසක් පුද්ගලිකව ඔහුට කථා කළ අතර—ඇත්ත වශයෙන්ම එය ඔහුගේ නමින්ම සඳහන් වූ බව පහදාදෙන්න.

---

**ශුද්ධ ලියවිලි සාකච්ඡා සහ ඒවා අදාළ කිරීම**

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි කොටස් ඔබ උගන්වන විට, එදිනෙදා ජීවිතයට ඒවා අදාළ කරගන්නා අන්දම ගැන උගන්වන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

**1. දේවමාළිගාව නැවත ගොඩනැගීමට යෙරුසලම වෙතට ආපසු පැමිණීම පිණිස කෝරෙෂ් රජු යුදෙව්වරුන්ට අවසර දෙයි.**

එස්රා 1–6 උගන්වා සාකච්ඡා කරන්න.

පහත සඳහන් ඓතිහාසික තොරතුරු ගැන සාරාංශයක් ඉදිරිපත් කරන්න (නැතහොත් පැවරුම් දෙන ලද පංති සාමාජිකයෙකුට ඉදිරිපත් කිරීමට සලස්වන්න)ඃ

ක්‍රිඃපූඃ 721, ඉශ්‍රායෙල් රාජධානිය (උතුරු රාජධානිය හෝ ගෝත්‍ර දහය) අෂූර්වරුන් විසින් වහල් බවට ගත් විට, අෂූර් රාජධානිය ක්‍රි පූ 612 සිට ලෝකයේ ශ්‍රේෂ්ඨ රාජ්‍යයක්ව පැවතින. අෂූර් අධිරාජ්‍යය බබිලෝනිවරු විසින් විනාශ කරනු ලැබුවෝය. අෂූර්වරුන් විසින් යටත් කරගත් බොහෝ ප්‍රදේශ, නෙබුකද්නේශර් රජු යටතේ, බබිලෝනිවරු පාලනය කරන ලදී. බබිලෝනියාව යුදා රාජ්‍ය (දකුණු රාජ්‍ය) යටත්කර ගැනීම ක්‍රිඃපූඃ 605 සිට ක්‍රිඃපූඃ 587 දක්වා වූ අතර බොහෝ යුදෙව්වන් වහල්කමට ගෙන යෙරුසලම විනාශ කළෝය.

ක්‍රිඃපූඃ 562 දී නෙබුකද්නේශර් මැරුණාට පසු, බබිලෝනියාවේ බලය වේගයෙන් හීන වීමට පටන්ගත්තේය. ක්‍රිඃපූඃ 539 බබිලෝනිය වැටී මේදියන් සහ පර්සියන්වරුන්ට යටත්ව කෝරෙෂ්ගේ නායකත්වය යටතේ එක්සත් විය. යටත් කරගත් මිනිසුන්ට නෙබුකද්නේශර් මෙන් කෲර අන්දමට නොසැලකූ කෝරෙෂ් යහපත් පාලකයෙක් විය. යටත් කරගත් මිනිසුන්ට කරුණාවන්ත වීමෙන් හා ඔවුන්ගේ ආගම් වලට ගරු කිරීමෙන් කෝරෙෂ් පාලනය කළ ජනතාවගේ විශ්වාසය දිනාගත්තේය.

බබිලෝනියා යටත් කරගෙන සුළු කාලයකට පසු යෙරුසලමේ දේවමාළිගාව නැවත ගොඩනැගීම පිණිස කෝරෙෂ් පනතක් ඉදිරිපත් කළේය. යෙරුසලමේ දේවමාළිගාව නැවත ගොඩ නැගීමට අධිරාජ්‍යයෙහි සිටි යුදෙව්වරුන්ට ඔහු ආරාධනාකළ අතර, නෙබුකද්නේශර්ගේ කණ්ඩායමට දේවමාළිගාවෙන් සොරකම් කළ රන් හා රිදී භාජන ඔහු ආපසු දුන්නේය (2 ලේකම් 36:22–23; එස්රා 1:1–3, 7 බලන්න. බබිලෝනියෙ වහල් බවින් අවුරුදු 70 කට පසු, යුදෙව්වරුන් නැවත යෙරුසලමට පැමිණෙන බව, යෙරෙමියාගේ අනාවැකියේ මෙම පද වල සඳහන් වෙයි; යෙරෙමියා 25:11–12; 29:10.)

- යෙරුසලමේ නැවත දේවමාළිගාවක් ගොඩනැගිය යුතු බවට කෝරෙෂ් ප්‍රකාශ කළේ කුමක් නිසාද? (එස්රා 1:1–2 බලන්න.) ඔහු මෙය කිරීම ස්වාමින්වහන්සේට අවශ්‍ය බව කෝරෙෂ් දැනගත්තේ කෙසේද? එස්රා 1:2 වාර්තා කර තිබෙන කෝරෙෂ්ගේ වචන, යෙසායා 44:28

යෙසායාගේ අනාවැකියට යොමුවන අතර, කෝරෙෂ් නමින්ම සඳහන් කර තිබේ (යෙසායා 45:1–5 ද බලන්න; පරණ ගිවිසුමේ යෙසායාගේ පොතට කලින් කෝරෙෂ්ගේ කථාව සඳහන් වුවත්, කෝරෙෂ්ගේ උපතට අවුරුදු 150 කට පමණ පෙර යෙසායා ජීවත් වූ බව පහදා දෙන්න.) කෝරෙෂ් ඔහුගේ නම යෙසායාගේ අනාවැකි වල කියවූ විට, ස්වාමින්වහන්සේගේ ආත්මයාණන් විසින් ස්පර්ශ කරනු ලැබ, ලියන ලද දේවල් ඉටු කිරීමට ආශාවූ බව, පැරණි යුදෙව් ඓතිහාසිකයෙකු වන ෆ්ලේවියස් ජොසීෆුස් වාර්තා කළේය (*The Works of Flavius Josephus, Antiquities of the Jews,* පරිවර්. විලියම් විස්ටන් විසින් [දින රහිතය] පොත, 11 පරිච්. 1 වෙනි ඡේද. 1–2).

- ඔබ ශුද්ධ වූ ලියවිලි කියවන අතර, එහි වූ එක් අනාවැකියක් ඔබ කළ යුතු විශේෂිත දේවල් විස්තර කොට ඔබගේ නම එහි දී තිබෙනවා නම් ඔබට හැඟෙන්නේ කුමක්ද?

  සෙරුබ්බාබෙල් සහ යේෂුවා, පළමුවෙනි යුදෙව්වන් කණ්ඩායම යෙරුසලමට ආපසු ගෙන ගිය විට, සමාරියයන් ඔවුන්ට හමුවිය. සමාරියයන් ඉශ්‍රායෙල්වරුන්ගෙන් පැවත එන අය බවද, වහල් බවට ගන්නා විට ගැලවී ගොස්, දේශය හිමි කර ගැනීමට රජු යැවූ අෂූර්යන් හා බබිලෝනියන් ජනපදවාසීන් සමග හිර ගනුදෙනු කරගත් අය බව පහදා දීමට ඔබට උවමනා වෙනවා ඇත.

- ආපසු පැමිණි යුදෙව්වන්ගෙන් සමාරියයන් ඇසුවේ කුමක්ද? (එස්රා 4:1–2 බලන්න.) සමාරියයන්ගේ ඉල්ලීමට යුදෙව්වන් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (එස්රා 4:3 බලන්න. සමාරියයන් සත්‍ය වූ ඉශ්‍රායෙල්වරුන් නොවන බව ඔවුන්ට හැඟුණ නිසා දේවමාළිගාව නැවත ගොඩනැගීමේ සමාරියයන්ගේ උපකාරය යුදෙව්වරු ප්‍රතික්ෂේප කළෝය.) යුදෙව්වන් ඔවුන්ගේ උපකාරය ප්‍රතික්ෂේප කළ විට සමාරියයන් කුමක් කළේද? (එස්රා 4:4–7, 11–24.බලන්න. කෝරෙෂ්ට පසුව සිටි රජවරුන්ට පැමිණිලි කරමින්, දේවමාළිගාව නැවත ගොඩනැගීම නැවැත්වීමට ඔව්හු උත්සාහ කළහ.)

- එහි ප්‍රතිඵලයක් වශයෙන් දේවමාළිගාවේ වැඩකටයුතු නැවතුනේය. අවුරුදු ගණනකට පසු නැවත ඔවුන්ගේ වැඩ ඇරඹීමට යුදෙව්වන්ව පෙළඹවනු ලැබුවේ කුමක්ද? (එස්රා 5:1–2; හග්ගයි 1. බලන්න. අනාගතවක්තෘවරුන් වූ හග්ගයි සහ සෙකරියා පෙළඹවීමේ මගපෙන්වීම් සපයාදුන්නේය.) යෙරුසලමේ සිටි යුදෙව්වරුන්ට දේවමාළිගාව ගැන හග්ගයි මගින් ස්වාමින්වහන්සේ කීවේ කුමක්ද? (හග්ගයි 1:3–4, 7–8, බලන්න.) දේවමාළිගාව නැවත ගොඩනැගීමට බාධාවූයේ යුදෙව්වන් අතර වූ කුමන ආකල්පයක්ද? (බලන්න හග්ගයි 1:2.) දේවමාළිගාවේ විදිමත් නමස්කාරයට සහ සේවයට බාධාකරන්නේ අපගේ කුමන ආකල්පද?

- දේවමාළිගාව ගොඩනැගීමේ වැඩකටයුතු නැවත ඇරඹූ විට, සමාරියයන්වරු නැවතත් එය නැවැත්වීමට උත්සහ දැරුවෝය. නමුත් කෝරෙෂ් රජුගේ සහ දාරියුෂ් රජුගේ පනත පහදා දුන් විට, වැඩ කරගෙන යෑමට ඉඩදුන්හ. (එස්රා 5–6). දේවමාළිගාව සාදා නිම කළ පසු යුදෙව්වරු කුමක් කළේද? (එස්රා 6:15–22 බලන්න.)

**2. යුදෙව්වන් තවත් කණ්ඩායමක් ආපසු යෙරුසලමට එස්රා ගෙනගියේය.**

එස්රා 7–8 උගන්වා සාකච්ඡා කරන්න.

- යුදෙව්වන් නිදහස් කිරීමට කෝරෙෂ් රජුගේ හදවත ස්වාමින්වහන්සේ කලින් මොළොක් කළාක් මෙන්, එස්රාගේ යුදෙව් කණ්ඩායම යෙරුසලමට නැවත යෑම පිණිස අර්තක්ෂස්තා රජුගේ හදවතද උන්වහන්සේ මොළොක් කළ සේක (එස්රා 2:27–28; 11–26 යන පදද බලන්න.) පසු දවස්වලදී සභාව වෙතට රජයේ නායකයින්ගේ හදවත්, සවාමින්වහන්සේ මොළොක් කළ සමහර නිදර්ශන මොනවාද? (උදාහරණයක් ලෙස බලන්න, තෝමස් එස්. මොන්සන් Conference Report තුලින්, අප්‍රේ. 1989, 65–69; හෝ *Ensign,* මැයි 1989, 50–53.) සභාව වෙතට රජයේ නායකයින්ගේ හදවත් මොළොක් කිරීම පිණිස දිරිගැන්වීමට අපට කුමක් කළ හැකිද? (දේශයේ නීති වලට කීකරුවීම, යහපත කිරීම, මුළු ලොවටම ශුභාරංචිය ඉගැන්වීමට සූදානම් වීම, නායකයින්ගේ හදවත් මොළොක් කිරීම පිණිස ස්වාමින්වහන්සේට යාච්ඤා කිරීම පිළිතුරු වලට අඩංගු විය හැකිය. ධ් සහ ගි 58:21, 27; 98:4–6 බලන්න.)

- යෙරසලමට ඔහු ගෙන යන යුදෙව්වන් කණ්ඩායම ආරක්ෂා කිරීම ස්ථිර කරගැනීම පිණිස එස්රා කළේ කුමක්ද? (එස්රා 8:21–23, 31 බලන්න.) ඔබට, ඔබගේ පවුලට, හෝ ඔබ දන්නා වෙනත් අයට නිරාහාරය මගින් ආශිර්වාද ලැබුවේ කෙසේද?

**3. නෙහෙමියා යෙරූසලමට ගොස් නගරය ආරක්ෂා කිරීම පිණිස පවුරු නැවත ගොඩනැගීමට ජනතාවට මගපෙන්වයි.**

නෙහෙමියා 1–2; 4; 6 උගන්වා සාකච්ඡා කරන්න.පර්සියාවේ අර්තක්ෂස්තා රජුගේ පාත්‍රධාරිව සිටියේ නෙහෙමියා බව සඳහන් කිරීමට ඔබට උවමනා වෙනවා ඇත. රජතුමාගේ ආහාර පාන වල සුරක්ෂිත භාවය ස්ථිර කිරීම, නෙහෙමියාගෙන් ඉටුවීමේ මහත් විශ්වාසවන්ත සහ වගකීමේ තනතුරකි මෙය. පර්සියාවේ වැදගත් තනතුරක් නෙහෙමියා දැරුවත්, යෙරූසලමේ ඔහුගේ ජනතාවගේ දුක් පීඩා ඇසුණු විට, ඔහු ඔවුන් කෙරෙහි සැලකිලිමත් වෙමින්, ඔවුන්ට පිහිටවීමට ඔහු සෙව්වේය.

- යෙරූසලමේ ඔහුගේ ජනතාවගේ දුෂ්කරතාවයන් ඔහුට ඇසුණු විට නෙහෙමියා කුමක් කළේද? (නෙහෙමියා 1:4–11; 2:1–5 බලන්න.) නෙහෙමියාගේ ඉල්ලීමට අර්තක්ෂස්තා රජු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (නෙහෙමියා 2:6–8 බලන්න. නෙහෙමියාට යෑමට රජු අවසර දුන් අතර, රැකවලුන් සහ ආරක්ෂා පිරිසක්ද සපයා දී, නගරයේ පවුරු නැවත ගොඩනැගීමට, භාවිතා කිරීම පිණිස කැලයෙන් ලී දඬු ලබා ගැනීමට ඔහුට බලය පවරා දුන්නේය.) අන්‍යයන්ගේ දුක උදෙසා අප කනස්සල්ලට පත්වෙන විට අපට මගපෙන්වීම පිණිස නෙහෙමියාගෙන් අපට ඉගෙනීමට හැකිවන්නේ කුමක්ද?

- නගරය අවට පවුරු නැවත ගොඩනැගීමට යෙහෙමියා ජනතාව දිරිමත් කළේ කෙසේද? (නෙහෙමියා 2:17–18 බලන්න.) යහපත කිරීම පිණිස අන්‍යයන් පෙළඹවීමට, සත්‍ය ගැන සාක්ෂි දැරීම සහ ආත්මික අත්දැකීම් බෙදාගැනීමෙන් එවැනි බලයක් ඇතිවන්නේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? අන්‍යයන්ගේ සාක්ෂි සහ ආත්මික අත්දැකීම් ඔබව පෙළඹවූයේ කෙසේද?

- සෙරුබ්බාබෙල් සමග ආපසු පැමිණි යුදෙව්වන් සමග, සමාරියේ ආණ්ඩුකාරයා වූ සන්බලට් සහ ඔහුගේ ජනතාව සතුරන් වූහ. නගරයේ පවුරු නැවත ගොඩනැගීමේ සැලසුම් වලට සන්බලට් ප්‍රතික්‍රියා කළේ කෙසේද? (නෙහෙමියා 2:10, 19; 4:1–3, 7–8, 11 බලන්න.) පවුරු ගොඩනැගීම නැවැත්වීමේ මෙම උත්සාහයට යුදෙව්වරු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (නෙහෙමියා 4:9, 13–15 බලන්න.)

- වැඩකටයුතු නවත්වා ඔහු සමග මුණගැසීමට සන්බලට් ඔහුට කී විට, නෙහෙමියා කළේ කුමක්ද? (නෙහෙමියා 6:1–4 බලන්න.) ස්වාමින්වහන්සේගේ වැඩකටයුතු වලින් සහා සාමාජිකයින්ව වෙනතකට යොමු කිරීම පිණිස, අද සමහර ජනයා උත්සාහගන්නේ කෙසේද? එවැනි වෙනතකට යොමු කිරීම් වලදී අප කෙසේ ප්‍රතිචාර දැක්විය යුතුද?

  වැඩිහිටි මාර්වින් ජේ.ඇශ්ටන් මෙසේ උපදෙස් දුන්නේයː "අවුල් සහිත හිංසා කිරීමේ බොරු වාර්තා, යමෙකුට අපහාස කිරීමේ වක්‍ර යෝජනා, නුසුදුසු බොරු වර්ගකිරීම් මගින් අපව පෙළඹවීමට, යම් ජනයා සහ සංවිධාන උත්සහදරති. අපගේ තත්වය සහ සම්බන්ධවීම් අන්‍යයන් වැරදි ආකාරයෙන් ප්‍රකාශ කරමින් අද සමාජය ප්‍රීතිවන නිසා අප ඒ ගැන හිංසාවට, කැළඹීමට හෝ සිත් තැවුලට පත්වීම කොතරම් අඥානවන්තද? වියවුල් ඇති කිරීමට ප්‍රකාශ කරන අය නිසා අපගේ ප්‍රතිපත්ති හෝ ප්‍රමිතිය ඔවුන්ට වඩා අඩු නොවන්නේය. කාරණා ගෙනහැර දක්වමින්, මිත්‍රත්වලීලාවෙන් පොළඹවමින්, සත්‍යවූ කරුණු පෙන්වමින් අපගේ තත්වය ඔවුන්ට පහදාදීම අපගේ වගකීම වේ. කිසිම මිනිසෙකු හෝ සංවිධානයක් සමග තර්ක නොකර…අද පවතින හැසිරීමේ ප්‍රශ්න වලට යටත් නොවී, ශුභාරංචියේ සදාකාල ප්‍රතිපත්ති මත ස්ථිර පැවතීම අපගේ යුතුකමවේ. සවන්දී ඉගැන්වීම අපගේ යුතුකමකි. වාද විවාදවලින් වැළකී සිටීම පමණක් නොව, එවැනි දේවල් නැති කරදැමීමද අපගේ යුතුකම වේ (Conference Report තුලින්, අප්‍රේ. 1978, 10; හෝ *Ensign,* මැයි 1978, 8).

**4. ශුද්ධ වූ ලියවිලි එස්රා ජනතාවට කියෙව් විට ඔව්හු ප්‍රීතිප්‍රමෝද වූහ.**

නෙහෙමියා 8 උගන්වා සාකච්ඡා කරන්න.

- ජනතාව නගරයේ පවුරු ගොඩනගා නිමකළාට පසු, එස්රාගෙන් ඔවුන් ඉල්ලුවේ කුමක්ද? (නෙහෙමියා 8:1–2 බලන්න. බොහෝමයක් යුදෙව්වරු බොහෝ දිගු කාලයක් වහල්බවේ සිටිය නිසා ඔවුන් කිසි දිනක ශුද්ධ ලියවිලි අසා හෝ කියවා නැතිබව සිහිතබා ගන්න.)
- එස්රා ජනතාවට කොපමණ කල් එය කියෙව්වේද? (නෙහෙමියා 8:3, 17–18 බලන්න.) ජනතාව ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (නෙහෙමියා 8:3, 6, 9, 12 බලන්න.) අප ශුද්ධ වූ ලියවිලි කියවන විට අපට වඩාත් පරීක්ෂාකාරී විය හැකි වන්නේ කෙසේද? (ශුද්ධ වූ ලියවිලි වලට සුපරික්ෂාකාරීව සවන්දෙමින්, ශුද්ධ ලියවිලි කියවන විට ශුද්ධාත්මයාණන්ගෙන් පැමිණෙන සියුම් හඬට සුපරික්ෂාකාරීව සවන්දෙන අන්දම ගැන සාකච්ඡා කරන්න.) මෙම ජනතාවට ශුද්ධ වූ ලියවිලි වලින් ලැබුණු එවැනි උද්යෝගයක් අපට වැඩිදියුණු කරගැනීමට හැකිවන්නේ කෙසේද?
- ඔහුගේ ජනතාවට ශුද්ධ වූ ලියවිලි තේරුම් ගැනීමට උපකාරීවීම පිණිස එස්රා කුමක් කළේද? (නෙහෙමියා 8:8 බලන්න.) ශුද්ධ වූ ලියවිලි තෝරා ගැනීමේ ඔබගේ උත්සාහයට ඔබට උපකාර වූයේ කුමක්ද? එසේම ඔබගේ පවුලට ඒවා තේරුම් ගැනීමට උපකාර වූයේ කුමක්ද? (ඔබගේ පුද්ගලික සහ පවුලේ අයගේ ශුද්ධ වූ ලියවිලි අධ්‍යනය කිරීම දියුණු කරගැනීමට ඔවුන්ට ඇති විශේෂිත වූ දේවල් බෙදාගැනීමට පති සාමාජිකයින්ට ආරාධනා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.)
- ශුද්ධ වූ ලියවිලි ජනතාවට ඇසුණු විට ඔවුන් වැළපීමට පටන්ගත් විට එස්රා සහ අනෙකුත් නායකයින් කුමක් කීවේද? (නෙහෙමියා 8:9–11 බලන්න.) ඔබට ප්‍රීතිප්‍රමෝද වීමට ශුද්ධවූ ලියවිලි සැලැස්වූයේ කෙසේද?

---

අවසානය.

"නෙහෙමියාගේ උද්‍යෝගය, හැකියාව, පරාර්ථකාමී ස්වදේශානුරාගය, සහ පුද්ගලික අවංක භාවය නිසා අළුත් සමෘධිමත් යුදා රාජ්‍යයක් නැවත වරක් ගොඩනැගීමට හැකි විය. ශතවර්ශ එකහමාරක් විනාශයට පත්ව තිබූ, යෙරුසලමේ නැවත පිහිටුවීම පටන්ගත්තේය. ධර්මිෂ්ඨ, කැපවූ පූජකවරයෙකු එස්රා නෙහෙමියා සමග මෙම වැඩකටයුතු වලට සම්බන්ධ වී, යුදෙව් සමාජයක් යෙරුසලමේ නැවත පිහිටුවීමට දෙදෙනා එක්ව සමර්ථ වූහ." (*Old Testament Student Manual: 1 Kings–Malachi* [1982], 314).

යෙරුසලම නැවත ගොඩනැගීමට යුදෙව්වරුන්ට වගකීමක් තිබුණු ආකාරයටම, ලොව පුරා සයෝනය ගාඩනැගීමට පසු දවස්වල ශුද්ධවන්තයන්ට වගකීමක් තිබෙන බව පහදා දෙන්න. මෙය කිරීමට උපකාරවීම පිණිස, ශුද්ධ වූ ලියවිලි ඉගැන්වීම් අනුගමණය කිරීමත්, දේවමාළිගා වැඩකටයුතු වලට සහභාගී වීමත් අපට අවශ්‍ය වේ. ශුද්ධ වූ ලියවිලිවල සත්‍යතාවය සහ දේවමාළිගා වැඩකටයුතු වල වැදගත්කම ගැන සාක්ෂිදරන්න.

ස්වාමින්වහන්සේගේ වැඩකටයුතු නැවැත්වීමට සමහර ජනයා උත්සාහ කරන බව පංති සාමාජිකයන්ට මතක් කරන්න. ක්‍රිස්තුස් වැනි ප්‍රේමය අප ඔවුන්ට පෙන්විය යුතු අතර, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමේ අපගේ උත්සාහයන් වෙනතකට හැරවීමට ඔවුන්ට අප ඉඩ නොතැබිය යුතුය.

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

1. **"මේ වැඩේ මහත්ය, විශාලය, අප දුරස්ව සිටිමු" (නෙහෙමියා 4:19)**

යෙරුසලම වටා පවුර නැවත ගොඩනගන විට, පවුරේ එක් එක් කොටස් වල එකවරම වැඩ කිරීම පිණිස යුදෙව්වන් ඔවුන්ම වෙන්වී සිටියහ (නෙහෙමියා 3; 4:19). ඇතැම්විට ඔවුන් දුරස්ව සිටිය නමුත්, ඔවුන් වැඩ කළේ එම ඉලක්කයම උදෙසා බැවින්, එක්ව වැඩ කිරීමෙන් පවුර සම්පූර්ණ කිරීමට ඔවුන්ට හැකි විය. ලෝකය පුරා සභාව එක් එක් ඒකක වලට (එනම් පවුල් වශයෙන්, කොට්ඨාශ, ශාඛා, ස්ටේක, දිස්ත්‍රික්ක සහ ගණපූර්ණ වශයෙන්) බෙදා තිබෙන බව පංති සාමාජිකයින්ට මතක්කරන්න. සමහර විට එක් ඒකකයක් අනිත් ඒකක වලට වඩා බොහෝ දුර පිහිටා ඇත. නමුත් සියළුම ශුද්ධවරයන් එකම ඉලක්කයක් කරා වැඩ කරන අතර, එක් එක් පුද්ගලයෙකු සහ එක් එක් ඒකකයක් උද්‍යෝගයෙන් වැඩ කළහොත්, මුළු සභාවම නොනැවතී වර්ධනය වෙනවා ඇත.

2. **"දේවමාළිගා සදාකාල ගිවිසුම් උදෙසාය"**

*පවුල් නිවාස සැන්දෑ වීඩියෝ අතිරේකය (ජාත්‍යන්තර)* (5x408) තිබේ නම් "දේවමාළිගා සදාකාල ගිවිසුම් උදෙසාය" යන මිනිත්තු හයක කොටස, දේවමාළිගා වල වැදගත්කම කෙරෙහි සාකච්ඡාවේ කොටසක් වශයෙන් පෙන්වීමට ඔබට උවමනා වෙනවා ඇත.

48

වෙනි පාඩම

# "ස්වාමින් වහන්සේගේ මහත් වූ භයානක දවස"

*සෙකරියා 10-14; මලාකි*

**අරමුණ**

(1) ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ (1) දෙවෙනි ඊමට සූදානම් වීම, (2) අවංක දසයෙන් කොටසක් සහ ත්‍යාගශීලී පිඳුම් ගෙවීමට, සහ (3) පූජකවරයේ මුද්‍රා කිරීමේ බලය නිසා පැමිණෙන ආශිර්වාද අත්දැකීම යනාදිය කෙරෙහි පංති සාමාජිකයින්ව දිරිගැන්වීමටය.

**සූදානම**

1. මෙම පාඩමේ සාකච්ඡා කර තිබෙන සෙකරියා 10–14 සහ මලාකි වල කොටස්, යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. අමතර කියවම්ඃ දහම සහ ගිවිසුම 45.
3. පාඩමේ පළවෙනි කොටසේ සඳහන් සමහර ශුද්ධ වූ ලියවිලි වෙනම කොල කෑලි වල ලියා, පංති සාමාජිකයින්ට බෙදාදීමට ඔබට උවමනා වෙනවා ඇත.
4. ක්‍රියාකාරීත්වයට යොමු වීම ඔබ භාවිතා කරන්නේ නම්, දෙවෙනි ඊම (62562; ශුභාරංචි චිත්‍ර පිංතුර කට්ටලය 238) පිංතුරය ලබාගන්න.
5. අළුත් ගිවිසුමේ පංති සාමාජිකයින්ගේ අධ්‍යනය අත්පොත (31392) පංතියේ එක් එක් පුද්ගලයෙකුට පිටපත බැගින් ලබා ගන්න (ඉගෙනීමේ වාර්ෂික පටිපාටියේ ඇණවුම් කිරීමේ කොටසක් වශයෙන් මෙම අධ්‍යයනය අත්පොත් කොට්ඨාශය ඇණවුම් කළ යුතුය; සභා නායකත්වයේ සාමාජිකයෙකු මේවා ඉරුදින පාසැලේ සභාපතිත්වයට දිය යුතුවේ.)

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ක්‍රියාකාරීත්වයට යොමුවීම.

පාඩම පටන්ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ ඔබගේම එකක්) ඔබට භාවිතා කිරීමට වුවමනා වෙනවා ඇත.

දෙවෙනි ඊමේ පිංතුරය පෙන්වා, පහත සඳහන් ප්‍රශ්න අසන්නඃ

- *දෙවෙනි ඊම, අන්තිම දවස්, හෝ කාලයේ සංඥා යන වචන ඔබට ඇසෙන විට, ඔබට ඇතිවෙන හැඟීම් මොනවාද?* "මහත් වූ භයානක දවස" වශයෙන් දෙවෙනි ඊම ශුද්ධ වූ ලියවිලි සඳහන් කරයි (මලාකි 4:5). එම දෙකම වීමට හැකිවන්නේ කෙසේද?

  සභාපති එස්රා ටැෆ් බෙන්සන් මෙසේ කීවේය; "ඉතිරිව සිටින අයගේ ආත්මික තත්වය මත රඳාපවතිමින් [ගැලවුම්කරුවාණන්ගේ] ඊම තේජවන්ත සහ භයානක යන දෙකම වන්නේය" ("Prepare Yourself for the Great Day of the Lord," *New Era,* මැයි 1982, 49).

(1) සෙකරියා සහ මලාකි අන්තිම දවස් ගැන කළ අනාවැකි (2) දෙවෙනි ඊම උදෙසා අපගේ සූදානම යන්න මෙම පාඩමේ සාකච්ඡා වලට අඩංගු බව පහදාදෙන්න.

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා සහ ඒවා අදාලකරගැනීම.

පහත සඳහන් ශුද්ධ වූ ලියවිලි ඔබ උගන්වන විට එදිනෙදා ජීවිතයට ඒවා අදාළ කරගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලි ප්‍රතිපත්ති වලට සම්බන්ධ අත්දැකීම් බෙදාගැනීමට පංති සාමාජිකයින්ව දිරිගන්වන්න.

***1. සෙකරියා සහ මලාකි, අන්තිම දවස්වල බොහෝ සිද්ධීන් ගැන අනාවැකි පළ කරති.***

අන්තිම දවස් වල සිද්ධීන් විස්තර කරන, සෙකරියා සහ මලාකිගේ පහත සඳහන් සමහර අනාවැකි සාකච්ඡා කරන්න. ශුද්ධ වූ ලියවිලිවල සටහන් ලියන ලද කඩදාසි කෑලි ඔබ සූදානම්

කළා නම්, පංතිසාමාජිකයින්ට ඒවා බෙදා දෙන්න. එක් එක් කොටසක් කියවා එයින් උගන්වන දේ කීමට පංති සාමාජිකයින්ට සලස්වන්න. දෙවෙනි ඊමට අපට සූදානම් වීමට උපකාර කරන තොරතුරු එම කොටස දෙනවා නම්, එය අදාළකරගැනීමට හැකි වන අන්දම ගැන සාකච්ඡා කරන්න.

*දෙවෙනි ඊමට සූදානම්වීම පිණිස ඉෂ්ඨ වී ඇති අනාවැකි*

අ. මලාකි 3:1. ස්වාමීන්වහන්සේගේ ඊමට දූතයෙකු මාර්ගය සූදානම් කිරීමට එවන බවට මලාකි අනාවැකි පළ කළේය. ස්වාමීන්වහන්සේගේ මැරෙනසුළු ජීවිතයේ මෙහෙයට යොහාන් බව්තීස්ත මාර්ගය සූදානම් කළ අතර, දෙවෙනි ඊමට මාර්ගය සූදානම් කළ දූතයා ජොසෆ් ස්මිත්ය. (මතෙව් 11:10 බලන්න.)

ආ.මලාකි 4:5–6. පියවරුන්ගේ සිත් දරුවන් වෙතටත්, දරුවන්ගේ සිත් පියවරුන් වෙතටත් හැරවීම පිණිස, දෙවෙනි ඊමට පෙර අනාගතවක්තෘ එළියා ආපසු පැමිණෙන බවට මලාකි අනාවැකි පළකළේය. මුද්‍රා කිරීමේ බලය නැවත පිහිටුවීමේ යතුරු, කර්ට්ලන්ඩ් දේවමාළිගාවේදී එළියා පැමිණ ජෝසෆ් ස්මිත්ට දානය කිරීම මගින් මෙම අනාවැකිය ඉටුවිය. (ඩී සහ සී 110:13–16). *අදාළ කිරීමේ හැකියාව:* අපගේ මුතුන්මිත්තන්ගේ නම් සොයා ඔවුන් උදෙසා දේවමාළගාවේ නියෝග ඉටුකළ යුතුය (වැඩි විස්තර පසුව මෙම පාඩමේ සාකච්ඡා කර ඇත.)

- දෙවෙනි ඊම ගැන සමහර අනාවැකි, දැනටමත් සම්පූර්ණ වී ඇති බව දැනගැනීම උපකාර වන්නේ කෙසේද?

*ගැලවුම්කරුවාණන් පැමිණීමට පෙර ඉටුවීමට තිබෙන අනාවැකි*

අ. සෙකරියා 10:6–8 යුදා සහ යෝසෙප්ගේ ජනතාව එක්රැස්වන අතර එප්‍රායිම්වරු බලවත් ජනතාවක් වන්නෝය. ස්වාමීන්වහන්සේ, උන්වහන්සේගේ ජනතාවට "පිඹ" හෝ කැඳවා, ඔවුන්ව එක්රැස් කරනසේක. අදාළ කිරීමේ හැකියාව: අන්‍යයන් සමග ශුභාරංචිය බෙදාගැනීමෙන් මෙම එක්රැස්වීමට අපට ආධාරකළ හැකිය.

ආ.සෙකරියා 12:2–3, 8–9. යෙරුසලම තුල සහ අවට මහත් යුද්ධයක් ඇතිවන අතර, ස්වාමීන්වහන්සේ මැදිහත්වී යෙරුසලමේ සෙනග විනාශයෙන් ගලවාගන්නා සේක. අදාළ කිරීමේ හැකියාව: අවසාන දවස්වල දුෂ්කරතාවලින් උන්වහන්සේගේ ජනතාව ආරක්ෂා කරගැනීමට අප දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය යුතුය.

ඇ.සෙකරියා 14:8. ජීවමාන වතුර යෙරුසලමේ දේවමාළිගාවෙන් ගලා බසිමින් ගොළු මුහුද සහ යුදාහි වනාන්තර සුවකරනු ලබන්නේය. (එසකියෙල් 47:1, 8–9).

- භයානක සිද්ධීන් වන යුද්ධ, ස්වභාවික ආපදාවන්, සහ පැතිරී පවතින දුෂ්ඨකම්, අවසාන දවස්වල බොහෝ අනාවැකි වලට අඩංගුවේ. මෙම අනාවැකි අපට ඇසෙන විටද, ඒවා ඉටුවෙනවා අපට පෙනෙන විටද බලාපොරොත්තුව පවත්වාගැනීමට අපට හැකිවන්නේ කෙසේද? (ඩී සහ සී 38:28–30 බලන්න.)

*ගැලවුම්කරුවාණන් පැමිණි විට ඉෂ්ඨ වෙන්ට තිබෙන අනාවැකි*

අ. සෙකරියා 14:3–4. ගැලවුම්කරුවාණන් ඔලිව් කන්දේ සිටගත් විට කන්ද දෙකඩ වන්නේය (ඩී සහ සී 45:48ද බලන්න).

ආ.සෙකරියා 12:10; 13:6 මෙසියස්වහන්සේ මෙන් උන්වහන්සේව ප්‍රතික්ෂේප කළ ජනතාවක් වශයෙන්, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ යෙරුසලම ගලවාගැනීම දකින එම කාලයේ ජීවත් වන යුදෙව් ජනතාව ශෝක වන්නේය (ඩීසහ සී 45:51–53).

ඇ.සෙකරියා 13:2 බොරු දේවරූප, අශුද්ධ ආත්ම සහ බොරු අනාගතවක්තෘවරුන්ව විනාශ කරනු ලබන්නේය.

ඈ.සෙකරියා 14:5. පොළොවේ ජීවත්වන ධර්මිෂ්ඨ අය ගැලවුම්කරුවාණන් මුණගැසෙන්නෝය. මළාවූ ධර්මිෂ්ඨ අයද මළවුන්ගෙන් නැවත නැගිට උන්වහන්සේව මුණගැසෙන්නෝය. (ඩී සහ සී 88:96–98 ද බලන්න).

ඉ. සෙකරියා 14:9. ස්වාමීන්වහන්සේ මුළු පොළොවේම රජු බවට පත්වී සහශ්‍රයේදී පාලනය කරනසේක.

ඊ. සෙකරියා 14:12–13; මලාකි 3:13–18; 4:1–3. දුෂ්ඨයන් විනාශකොට, ධර්මිෂ්ඨයන් ඉතිරි කරන්නේය. (1 නීෆායි 22:15–17, 19 ද බලන්න).

- පසු දවස්, දෙවෙනි ඊම සහ සහශ්‍රය ගැන මෙම අනාවැකි ස්වාමින් වහන්සේ එළිදරව් කලේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (බලන්න ධ්‍යීසහයී 45:34–44.) ගැලවුම් කරුවාණන්ගේ දෙවෙනි ඊම සඳහා අපට සූදානම් විය හැකි වන්නේ කෙසේද? (ධ්‍යීසහයී 45:56–57 බලන්න.)

  සභාපති එස්රා ටැෆ්. බෙන්සන් මෙසේ කීවේය: "දෙවියන් වහන්සේගේ පනත් අප රකින විට, ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊම වෙත ප්‍රීතිමත් අපේක්ෂාවෙන් බලා සිටින අතර, අපගේ ආදරවන්තයින් සමග, උන්වහන්සේගේ අභියස සියළු සදාකාලයටම ජීවත් වීමට, අපගේ උත්සාහය තුලින් අප සුදුස්සන් වන බව දැනගන්නෙමු. මෙම ඉලක්කය වෙතට ලඟාවීමට ඇත්ත වශයෙන්ම කිසිම අපහසුතාවයක් නැත. මොහොතකටවත් එම උත්සාහය අපට නැවැත්වීමට නොහැක. ස්වාමින් වහන්සේගේ කැමැත්ත කිරීමට අප කැමති වීම—නැවත පිහිටුවන ලද ශුභාරංචිය පැතිරවීම, ලෝකයට සාක්ෂිදැරීම, අන්‍යයන් සමග ශුභාරංචිය බෙදා ගැනීම, අපගේ එදිනෙදා ජීවිතයේදී ඔප්පුකළ යුතුය" (*The Teachings of Ezra Taft Benson* [1988], 341).

- අධර්මිෂ්ඨ කමෙන් ධර්මිෂ්ඨ කම අවසානයේ ජය ගන්නා බව දැන ගැනීම ඔබට උපන්ාර වන්නේ කෙසේද?

**2. දසයෙන් කොටස සහ පිදුම් ගෙවන අයට පැමිණෙන ආශිර්වාද ගැන මලාකි උගන්වයි.**

මලාකි 3:8–12 උගන්වා සාකච්ඡා කරන්න.

- දසයෙන් කොටස සහ පිදුම් නොගෙවීමෙන් ජනතාව දෙවියන්වහන්සේගෙන් කොල්ලකන්නේ කෙසේද?

- සම්පූර්ණ දසයෙන් කොටස ගෙවීම යන්නෙහි අදහස කුමක්ද?

  පළමු සභාපතිත්වය මෙසේ ප්‍රකාශ කළේය: "අප දන්නා ඉතාම සරලම ප්‍රකාශය නම්, ස්වාමින්වහන්සේගේම ප්‍රකාශය වන, එනම් සභාවේ සාමාජිකයින් 'ඔවුන්ගේ වාර්ෂික පොළියෙන් හෝ ආදායමෙන් දසයෙන් එකක්,' ගෙවීම යනු එහි අදහස වෙයි. මෙයට වඩා වෙන කිසිම කෙනෙකුගේ ප්‍රකාශයක් යුක්ති සහගත නොවන්නේය" (පළමු සභාපතිත්වයේ ලිපිය, 19 මාර්. 1970; ධ්‍යීසහයී 119:1–4 ද බලන්න).

- දසයෙන් කොටස අප ගෙවනවා නම් ස්වාමින්වහන්සේ අපට පොරොන්දු වී තිබෙන ආශිර්වාද මොනවාද? (මලාකි 3:10–12 බලන්න.) ඔබ දසයෙන් කෙටස සහ පිදුම් ගෙවූ විටදී ස්වාමින්වහන්සේ ඔබට ආශිරවාද කළේ කෙසේද?

- දසයෙන් කොටස සහ පිදුම් ගෙවීමේ අපගේ අභිප්‍රාය විය යුත්තේ කුමක්ද?

  දසයෙන් කොටස ගෙවන අයට ස්වාමින්වහන්සේ දෙන ආශිර්වාද ගැන සඳහන් කළාට පසු, සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි මෙසේ කීවේය:

  "දැන් මාව වරදවා තේරුම් නොගන්න. ඔබ අවංකව දසයෙන් කොටස ගෙවනවා නම්, අලංකාර නිවසක්, රෝල්ස් රොයිස් වාහනයක් හෝ හවායි දූපතේ නිවාඩු නිකේතනයක්, ලබාගැනීමේ සිහන සැබෑ කරගැනීම ගැන මම මෙහිදී ඔබලාට නොකියමි. *අපගේ ආශාව අනුව නොව, අපගේ අවශ්‍යතාවය අනුව ස්වාමින්වහන්සේ ස්වර්ගයෙහි කවුළු විවෘත කරන සේක.* ධනවත් වීම පිණිස අප දසයෙන් කොටස ගෙවනවා නම්, අපි එය කරන්නේ වැරදි අදහසක් උදෙසාය. දසයෙන් කෙටසේ මූලික අරමුණ වන්නේ, උන්වහන්සේගේ වැඩකටයුතු වලට අවශ්‍ය මුදල් සභාවට ලබාගැනීම වේ (Conference Report තුලින්, අප්‍රේ. 1982, 60; හෝ *Ensign*, මැයි 1982, 40).

- දසයෙන් කොටස ගෙවීමේ නීතියට කීකරුවීම ඇතැම් විට අභියෝගයක් වන්නේ කුමක් නිසාද? එම අභියෝගය ජය ගැනීමට කුමක් කළ හැකිද?

**3. මුද්‍රාකිරීමේ බලයේ යතුරු නැවත පිහිටුවීම පිණිස එලියා නැවත පොළොවට පැමිණෙන බවට මලාකි අනාවැකි පළ කළේය.**

මලාකි 4:5–6 උගන්වා සාකච්ඡා කරන්න.

- ස්වාමින්වහන්සේගේ නැවත ඊමට පෙර, අනාගතවක්තෘ එලියා පොළොවට පැමිණෙන බවට මලාකි අනාවැකි කීවේය. (මලාකි 4:6). මෙම අනාවැකිය සම්පූර්ණ වූයේ කෙසේද? (ඩී සහ සී 110:13–16 බලන්න. කර්ට්ලන්ඩ් දේවමාළිගාවට එලියා පැමිණ මුද්‍රා තැබීමේ බලයේ යතුරු ජෝසෆ් ස්මිත් වෙත නැවත භාරදුන්නේය.) "පියවරුන්ගේ සිත් දරුවන් වෙතටත්, දරුවන්ගේ සිත් පියවරුන් වෙතටත් හැරවීම" යන්නෙහි අදහස කුමක්ද? (අපගේ සියළුම මුතුන්මිත්තන්ට—අපගේ "පියවරුන්—සහ අපගෙන් පැවතඑන සියල්ලන්ට—අපගේ "ළමයින්" —- සදාකාලයට මුද්‍රාකිරීම එහි අදහස වේ. පූජකවරයේ මුද්‍රාකිරීමේ බලය සහ දේවමාළිගා නියෝග නිසා ජීවත්වන හා මළාවූ අය සදාකාලයටම පවුල්වලට එකට බැඳීමට හැකි වේ.)
- ඔබ පවුල් ඉතිහාසය සහ දේවමාළිගා වැඩකටයුතු ඔවුන්ට කළ විට ඔබගේ මුතුන්මිත්තන්ට ඔබගේ සිත් හැරීම ගැන ඔබට කුමක් හැඟෙන්නේද? දේවමාළිගාවේ ගිවිසුම් පොරොන්දු, ඔබගේ දෙමව්පියන්, බිරිඳ හෝ සැමියා සහ දරුවන් කෙරෙහි ඔබගේ සිත් හරවන්නේ කෙසේද?
- මලාකි 4:5–6 පණිවුඩය (ලූක් 1:17; 3 නීෆායි 25:5–6; ඩී සහ සී 2:1–3; ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:37–39) යන එක් එක් ශ්‍රේෂ්ඨ කෘතියකම උගන්වනු ලැබේ. මෙම පණිවුඩය, නිතර නැවත නැවත සඳහන් කිරීමේ අදහස ඔබ සිතන අන්දමට කුමක්ද?

---

අවසානය.

පාඩමේදී සාකච්ඡා කිරීමට ඔබ තෝරාගත් දේවල් ගැන සාක්ෂිදරන්න. මෙම වර්ෂයේ අධ්‍යයන පාඨමාලාවේ අවසානය වශයෙන්, පරණ ගිවිසුමේ ඉගැන්වීම් වලට ඔබගේ කෘතඥතාවය ප්‍රකාශ කිරීමට ඔබට උවමනා වෙනවා ඇත.

පංති සාමාජිකයින්ගේ අළුත් ගිවිසුම අධ්‍යයනය කිරීමේ නියමු පොත (31392; "සූදානම" පිටු. 225 බලන්න). ලබන වර්ෂයේ අධ්‍යයන පාඨමාලාව අළුත් ගිවිසුම බව පහදා දෙන්න. ලබන සතියේ පාඩමට සූදානම් වීම පිණිස අධ්‍යනය නියමු පොත භාවිතා කිරීමට පටන් ගැනීමටත්, ඔවුන්ගේ පවුල් සමග අළුත් ගිවිසුම අධ්‍යයනය කිරීමටත් සාමාජිකයින්ව දිරිගන්වන්න.

---

**ඉගැන්වීමේ අමතර අදහස්**

පහත සඳහන් තොරතුරු අතිරේකය යෝජිත පාඩමේ කටුසටහනකි. පාඩමේ කොටසක් මෙන් මෙම අදහස් එකක් හෝ එයට වැඩියෙන් භාවිතා කිරීමට ඔබට වුවමනා වෙනවා ඇත.

**1. අනාවැකි පළකිරීම අනුව ගැලවුම්කරුවාණන් දර්ශනයවීම**

- අවම වශයෙන් පසු දවස්වලදී ගැලවුම්කරුවාණන් සත් වරක් දර්ශනය වන බව ශුද්ධ ලියවිල වල කලින් කියන ලදී. එයින් කීයක් ඔබට හඳුනාගැනීමට හැකි වේද?

මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට පහත සඳහන් තොරතුරු උපකාරී වෙයි:

අ. අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ට ප්‍රථම දර්ශනයේදී (ක්‍රියා 3:19–21; ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:15–17).

ආ.පසු-දවස්වලදී උන්වහන්සේගේ දේවමාළිගා වල (මලාකි 3:1; ඩී සහ සී 133:1–2).

ඇ.ආදම්-ඔන්දි-අහමන් තැනිතලාවේදී (ඩී සහ සී:116; දානියෙල් 7:13–14, 22; ඩී සහ සී 107:53–56, ද බලන්න. ආදම්-ඔන්දි-අහමන් පැරණි මුණගැසීමට සමාන ස්ථානයකදී මුණගැසෙන බව එය විස්තර කරයි).

ඈ.අර්මගෙදෝන් නම් ලොව පුරා පැවති යුද්ධයකදී යෙරුසලමේදීය (එසකියෙල් 38–39; සෙකරියා 12–14; එළිදරව් 11; ඩී සහ සී 45;47–53).

ඉ. නව යෙරුසලම් නගරයේ, මිසූරියේ, ඉන්ඩිපෙන්ඩන්ස් හි (3 නීෆායි 21:24–26).

ඊ. දෙවෙනි ඊමේදී ධර්මිෂ්ඨයින්ට (සෙකරියා 14:5; 1 තෙසලෝනික 4:16–17; ඩී සහ සී 88:96–98).

උ. දුෂ්ඨයින්ට (ඩී සහ සී 133:42–51).

2. දෙවන ඊම සිදුවන්නේ කවදාද?

සත්‍ය වශයෙන්ම උන්වහන්සේ නැවත පැමිණෙන බවද, කිසිම පුද්ගලයෙකු එම වෙලාව ස්ථිරව නොදන්නා බවද ස්වාමින්වහන්සේ පැහැදිලි කළ සේක (ධ් සහ සී 39:20–21; 49:7).

වැඩිහිටි රිචඩ් එල්. එවන්ස් මෙසේ කීවේය: "සහෝදරයන් සමහරෙකු…[සභාපති විල්ෆ්‍රඩ් වුඩ්රෆ්] වෙතට ගොස්…අන්තිමය කෙදිනක වේ දැයි ඔහුගෙන් විමසුවේය—ස්වාමියා පැමිණෙන්නේ කෙදිනකද? මා සිතන අන්දමට මේවා ඔහුගේ නියම වචන නොවන අතර, ඒවා දැක්වූ වාර්තා කළ පිළිතුරේ ආත්මයයි: 'එය හෙට සිදුවෙනවා මෙන් මම ජීවත් වෙමි—නමුත් මම තවමත් චෙරි ගස් පැළ කරමි!' මම සිතන අන්දමට, මෙම ප්‍රකාශය පිළිගෙන අපගේම ජීවිත වලට අදාළ කරගනිමින් එය හෙට සිදුවන මෙන් ජීවත් වෙමින්....චෙරි ගස් පැළකළ යුතුය! අපට කිසිවක් කළ නොහැකි දේවල් ගැන කරදර නොවී, අනාගතයේදී සිදුවන දේවල් ගැනද කරදර වෙමින් අපගේම පවුල්වලට හා මිතුරන්ට අපගේ වගකීම් අවස්ථාවන් පැහැර නොහැරිය යුතුවේ. මෙහිදී දැන්, කිරීමට අවශ්‍ය දේවල් අප පැහැර නොහැර හැකි සියළුම දෙයක්ම අප කළ යුතු වේ." (Conference Report තුලින්, අප්‍රේ. 1950, 105–6).

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ

පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

SINHALA

4 02355 70408 2

35570 408